

# උම්මග්ග ජාතකය

THE

# UMMAGGA JATAKA.

ORIGINALLY EDITED BY

THE LATE BATUVANTUDAVE

GOVERNMENT PUNDIT.

REVISED BY HIS PUPIL

HEMACHANDRA JAYAKODI (J. D. HELENIS)

PUBLISHED BY

ROBERT BATUVANTUDAVE.

FIFTH EDITION

# උම්මග්ග ජාතකය.

බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්‍ෂිත

**රාජකීය පණ්ඩිතුමන් විසින්**

සකස්කරණලදී.

එතුමන්ගේ ශිෂ්‍යවූ

**හේමචන්ද්‍ර ජයකොඩි (ජේ. ඩී. හෙළේනිස්)**

**ගලහිටියාවේ පාඨශාලාවේ ප්‍රධාන ගුරුවරයා විසින්**

ශුද්ධකොට ගැටපද ලියනලදී.

**රොබර්ට් බටුවන්තුඩාවේ විසින්**

පස්වෙනි වරට

ලඞ්කාභිනව විශ්‍රැත යන්ත්‍රාලයෙහි
අච්චුගස්වනලදී.

**1907.**

# උම්මග්ග ජාතකය.

**‘‘නමස්තස්මෛ භගවතේර්හතේ**
**සම්‍යක් සම්බුද්ධාය.’’**

එක් සමයෙක්හි ශාක්‍යසිංහවූ සමන්තභද්‍රවූ අසමසමවූ ත්‍රෛලොක්‍යතිලකවූ ත්‍රිභුවන චූඩාමාණික්‍යවූ කරුණානිධානවූ මෛත්‍රී නිවාසවූ ප්‍රඥාවට වලලහවූ සාගරයක්සේ අචින්ත්‍ය ගුණඇති මහ පොළවසේ නිශ්චල ගුණ ඇති මහමේරුවසේ උස්වූ ගුණ ඇති දෑරහමිණක්සේ නිර්මලවූ ගුණ ඇති මාගේ ස්වාමිදරුවූ සම්මා සම්බුදු රජානන්වහන්සේ, ක්ෂීරසාගරයෙන් නැගී තරඞ්ග මාලාවසේ සුධාධවල ප්‍රාකාරවලයෙන් පරික්ෂිප්තවූ, කනක රජතාදීන් ශොභනාවූ විසිතුරු සැදුම්ලද මාලිගා ගෙවල් හා දොරටු ආදියෙන් යුක්තවූ, සල් සපු නා පනා අඹ දෙඹ ආදිවූ ඵල පලලවයෙන් සඤ්ඡන්නතරුවරශතයෙන් ශොභනා විසිතුරු උද්‍යානයෙන් හා පස්පියුමෙන් සැදුම්ලද නිමල ජල සම්පූර්ණ පුෂ්කරණී ශතයෙන් ශොභනාවූ, නානාභරණ විභූෂිත නරනාරී ගණාකීර්ණවූ සැවැත්නම් නුවර නිසා, නදුන්වනයට අපහාසකරන්නාක් වැනිවූ සියලු සිරිසරින්සාරවූ චඞ්ක්‍රමණ පරිවෙණාදි විහාර ශතයෙන් ශොභනාවූ ජේතවන නම් උයන්හි, මෛත්‍රීකරුණා මුදිතොපෙක්ෂා සඞ්ඛ්‍යාත සතර ආර්‍ය්‍ය විහාරයෙන් දවස්යවනසේක්, තමන්වහන්සේගේ භවයෙන් සැහවි තුබූ ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය වදාළසේක.

**කෙසේදැයි යතහොත්**—එක් දවසක් හිරු හස්තපර්තගත වේලෙහි ශීලසමාධි ප්‍රඥාදි ගුණාඞ්ගසඞ්ගත ප්‍රවර භික්ෂු සඞ්ඝයා වහන්සේ, තමතමන්වහන්සේ වසන රාත්‍රිස්ථානයෙන් අවුත්, යුද්ධභූමියකට රැස්වන්නාවූ සුවිනිත යොධමුලක්සේද, මැණික් සන්නාහ සන්නද්ධ නානාලඞ්කාරයෙන් සැදුම්ලද ගදැත්මුලක්සේද, එකචර සිංහ සමූහයක්සේද, සඳවලාබදුවූ සුරක්තවරපවුල් පෙරව, ගන්ධදම පුෂ්පදමාවලම්බිත කනකරජතමණි තාරකයෙන් විචිත්‍රවිතාන ඇති, නානාප්‍රභාසමුදය සමුජ්වලිත අලඞ්කෘත ධර්ම සභායෙහි, ශක්‍රාගමනය බලමින් සුධර්මානාම් දිව්‍යසභායෙහි රැස්ව උන් දිව්‍යසමූහයාසේ, ධර්මරාජන්වූ ධර්මාධිපතිවූ ධර්මස්වාමිවූ තිලෝ ගුරු බුදුරජානන්වහන්සේ වඩනා පෙරමග බලබලා ධර්මාසනය පිරිවරා හිඳ බුදුන්ගේ නුවන පෙරුම් වර්ණනසේක් ‘‘ඇවැත්නි ‘‘බුදුහු ශීලස්කන්ධාදියෙහි පවත්නා මහත්වූ නුවන ගතියක්ඇති

“සේක; මුහුදුපිට ඉසි සුවඳ තෙලක්මෙන් දනයුතුවූ සියලු ධම්ම
“යන් කෙරෙහි පැතිර පවත්නාවූ නුවන ගතියක් ඇතිසේක;
“සියලු ධර්‍මයන් කෙරෙහි තුෂ්ටිබහුලව පවත්නා නුවන ගතියක්
“ඇතිසේක; සියලු ඥෙයමඩලයෙහි ජවන හංසගතියක්මෙන්
“දිවත්නාවූ නුවනගතියක් ඇතිසේක; අර්‍ථ ධම්ම නිරුක්ති ප්‍රති
“භානාදියෙන් දිරාගිය පරණලා පතෙක නොපැකිල යන්නාවූ
“දවසක් මුළුල්ලෙහි රත්කල යහුලක්මෙන් සියුම්ව දුවන්නාවූ
“නුවන ගතියක් ඇතිසේක; අතුල්තලයෙහි තුබූ දැරහම්ණක්සේ
“සියලු ධර්‍මයන් සර්‍වාකාරයෙන් විනිවිද දක්නාවූ නුවන ගතියක්
“ඇතිසේක; දෘෂ්ටිජාලානුගත අන්‍ය තීර්‍ථක ජනයන්ගේ ශාස්‍ව
“තොච්ඡෙදාදි වාද මර්‍දනය කරණසේක්, තමන්වහන්සේගේ
“අසාධාරණවූ විදුරු නුවනින් කූටදන්ත බ්‍රාහ්මණ වේරඤ්ජ බ්‍රාහ්ම
“ණාදිවූ අනෙක බ්‍රාහ්මණ ගනයන්ද, සභියපරිබ්‍රාජක බාහිය පරි
“බ්‍රාජකාදි පරිබ්‍රාජක සමූහයන්ද, අඞ්ගුලිමාල ආදිවූ චණ්ඩපරුෂ බො
“හෝ සොරුන්ද, ආලවකාදිවූ මනුෂ්‍ය මාංස භක්‍ෂණයෙහි දක්‍ෂවූ
“යක්‍ෂයන්ද, ඉසුරු මදයෙන් ප්‍රමාදව තුනුරුවන් කෙරෙහි ජනිත
“ප්‍රසාද විරහිතවූ ශක්‍රදෙවේන්‍ද්‍රයා ආදිවූ දෙවතාවන්ද ශාස්‍වත
“දෘෂ්ටිජාලානුබද්ධව අමාර්‍ගප්‍රතිපන්න බක බ්‍රහ්මාදිවූ බ්‍රහ්මයන්ද,
“තමන්වහන්සේගේ අසාධාරණවූ සර්‍වඥ මහිමයෙන් ඔවුන්ගේ
“මානමර්‍දනයකොට පාපනැමති විස විනාසකොට වදාලසේක.
“නවද මේ බුදුරජානන්වහන්සේ විසින් කායචාරාදියෙහි සම්‍යක්
“ප්‍රතිපත්තින් සිඩකොට, ස්වර්‍ගමොක්‍ෂ භාවය හා ප්‍රව්‍රජ්‍යාව
“සාධාදි බොහෝදෙනා සතර මග සතර ඵලයට පමුණුවන ලදහ.
“ඇමැත්නි මෙසේ බුදුහු උක්තප්‍රකාර මහනුවන ඇතිසේකැ”යි
බුදුන්ගේ ශිලසමාධ්‍යාදි අනෙකප්‍රකාර ගුණ වර්‍ණනා කොට
කොටදම්සභා මඩපයෙහි රැස්වහුන්සේක.

ඉක්බිති සනරාමර ලොකචූඩාමණිමරීචි මඤ්ජරී පුඤ්ජ පූජිත
චරණාම්බුජ ඇති ලොකස්වාමිවූ ලොකනායකවූ ජගදානන්‍ද ලොච
නවූ මාගේ ස්වාමිදරුවානන්වහන්සේ, දම්සභාමඩපයෙහි උපන්
කථාස්වරූපය ගඳකිළි පිරිවෙණෙහි වැඩඋන්සේක්, දිව්‍යකර්‍ණින්
අසාවදාරා වරරුචිරගන්‍ධකුටිවාසය මහාකරුණාවෙන් දුරුකොට
සමාපත්තීන් නැගී, ලාක්‍ෂාරසයෙන් තෙත්වූ මුරුත මල්කලඹක්
හා සමානවූ අඳනා සිවුර ත්‍රිමඩල ප්‍රතිච්ඡාදනයෙන් සංවිධාන
කොට හැඳ; සන්‍ධ්‍යා ඝන වලාවෙක ගසනලද සියරැලි විදුලියක්
සමානවූ පටිධාතුන්වහන්සේ ඊමත්තේ බැඳ; සතරන්දගැබක්
රත්පලසකින් වසන්නාක්හු මෙන්ද, අටලොස්රියන් රන් ඇගෑ
යකට පබලුදලක් දමන්නාක්හු මෙන්ද, චිත්‍රකූටපර්‍වතය බඳුවද
මල්දමකින් වටකරන්නාක්හු මෙන්ද, රත්ගල් මුදුනෙහි සුපක්‍ව
ලාක්‍ෂාරස වත්කරන්නාක්හු මෙන්ද, මෙරුමඳුරාදින් එකපැහැර

කම්පාකෙරෙමින් සුපක්ව විලිකුන් නුග ඵලයෙක පැහැබඳුවූ සුගත් මහා පාංශුකූල චීවරයපෙරව, සුප්පතිට්ඨිත පාදතාදිවූ දෙතිස්මහාපුරුෂ ලක්ෂණයන් කරණකොටගෙණ පිළිවෙළින් ගොතාතුබූ සූර්‍ය්‍යමඬලයන් දෙතිස් දෙනෙකුගේද, චක්‍රවර්ත්තීන් දෙතිස් දෙනෙකුගේද, මහාබ්‍රහ්මයන් දෙතිස් දෙනෙකුගේද, ශ්‍රීවිභූති අභිභවමින් අශිතිඅනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා කේතුමාලා ලඞ්කාරයෙන් විරාජමානව අනන්ත කාලයක් මුළුල්ලෙහි පුරණලද සුචරිතානු භාවයෙන් නෙමේ තමාට අරණලද දෙරඇති ගඳකිළි පිරිවෙණින්, මෙඝකූටයකින් පිටත්වන හිරුමඬලක්සේද, වලා පටලයකින් පිටත්වූ පුන්සඳ මඬලක්සේද, රත් ගල් ගුහායෙකින් කෙසරු සලා විදහානික්මෙන අභීත කෙසර සිංහරාජයෙකුසේද නික්ම තමන්වහන්සේ ජාතිජාතියෙහි බුද්ධාදි නුවනැත්තන් සම්පයට නුකුසිතව එළඹී කුසල මහිමයෙන් පොළව පලාගෙණ නැගී සත්බුමු මහපියුම් මතෙහි අටතුරාසියක් මගුල්ලකුණෙන් සැදුම්ලද ශ්‍රීපාද යුගලය තබ තබා වියදඹු පමණෙක හෙළන ලද්දූවූ නෙත්‍රකාන්තීන් මහිකාන්තාවට අමෘතාභිෂෙක දෙමින්; අනන්තවූ බුද්ධවිලාසයෙන් දම්සභා මඩපයට වැඩ, නීලපීතාදි සවණක් රැසින් සකල දම්සභාව එකපැහැර බබුලුවමින්, ඝන රන් මාලිගාවෙක දිලියෙන ඉඳුනිල්මිණි කවුළු සඟලක් වැනිද්‍යෙහෝ, නොහොත් රන් දගබක්සේ බබලන මුහුන නැමති පියුම් ගැබෙහි හැසිරෙණ බමරයුගලයක් හා සමානවූ, දිනු පුළුල් පස්පැ දිස්නා ඇස් සඟල විදහා, සත්රුවන් නැවක් මෙන්ද පිපි වැනිගිය රත්පියුම් වනයක්ද්‍යෙ, නොහොත් රන් දගබක් වටකොට පුදනලද මල්කලඹක් හා සදෘශවූ සඞ්ඝරාජයන් බලාවදාරා "මේ මහණපිරිස දමුනු ඉඳුරන් ඇත්තාහ; නිවුනාවූ චිත්තසන්තාන ඇත්තාහ; කයින් වචසින් මනසින් සන්හුන් ඉන්ද්‍රියයන් ඇත්තාහ; එහෙයින් මම් පලමුකොට කථාවක් නොකලෙම් නම්, මට පෙරටුකොට බැණනැගෙණ මහණෙක් නැතැ"යි සිතා වදාරා; අනල්ප කල්පකොටි ශතසහස්‍රයක් මුළුල්ලෙහි පුරණලද කායවාක් සුචරිතයෙන් එකසුගන්ධව තිබෙන මුඛපද්මය විදහා; "මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවරනම් කථාවකින් යුක්තව උනුද? නොපට නොදන්නා කථාවක් නොප සිත උපන් සැකයෙක් ඇත මට කියව, මම මාගේ අසාධාරණවූ බුදුනුවනැසින් පිරිසිඳ දැන කියම්" වදාරා, ධර්මයට මුබදි තුෂ්ණීම්භූතව වැඩඋන්සේක.

එවේලෙහි සඞ්ඝයාවහන්සේ "ස්වාමිනි බුදුන්විසින් නොකියන්ට වදළ රාජ කථා චොර කථාදිවූ දෙතිස් කථාවෙන් යුක්තව නූනාම්හ, බුදුන්ගේ සුවිශුද්ධ තීක්ෂණ ප්‍රඥ ගුණ රසාස්වාදයෙන් පිණ පිණා උන්නාමහ"යි කී කල්හි "මහණෙනි දූන්මතු

නොවෙයි, බුදුහු මහනුවනැත්තෝය; පූර්වයෙහිත් සසර සිටිනා "කල නුමූකල නුවනෙහි සිට; මෙම සර්වඥතාඥනය සිද්ධකරණ "පිණිස පාරමිධර්මයන් පුරා ඇවිදිනා කාලයෙහිත් නුවනැත්තෝ "වෙත්ද" යි වදරා, මුවෙන් නොබැණ වැඩඋන්කල්හි, එක්කෙනෙකුන් වහන්සේ විසින් හැමදෙනා වහන්සේගේ අනුමතියෙන් සිවුරු එකස්කොට පෙරව, ඇඳිලි බැඳසිට දන්වන්නාහු "බුදුන් මහා නුවන ඇතිසේ ප්‍රසන්න හෙයින් ඇහෙයි, පූර්ජන්මයෙහි නුමූකළ නුවනෙහි සිට පාරමි ධර්මයන් පුරණ "කල්හි, මහා නුවනඇති පරිදි භවයෙන් සැඟවී තිබෙයි, එහෙ "යින් සවාමිදරුවානෙනි අපට නොහැඟෙයි, වදාළහොත් යහප "තැ" යි ආරාධනා කළ කල්හි කඩතුරාවක් පහකොට විචිත්‍ර කර්මාන්තයක් දක්වන්නාක්හු මෙන්, අතීත කාලයෙහි ප්‍රවෘත්තවූ කථා සවරූපය ගෙණහැරදක්වා වදාළසේක.

**කෙසේදයත්**—යටගිය දවස මියුලු නුවර **වේදේහ නම්** රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යකරණ සමයෙහි, උන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරණ **සේනකය, පුක්කුසය, කාවින්දය, දේවින්දය** යන පඬිතවරු සතරදෙනෙක් වූහ. එසමයෙහි **වේදේහ** රජ්ජුරුවෝ පුරණලද පාරමිතා ඇති බුද්ධාඞ්කුරවූ මහ බෝසතානන්වහන්සේ මව්කුස පිළිසිඳගන්නා දවස් අලුයම් වේලෙහි මෙබඳු සීනයක් දුටහ. "සෙඹුවාලුව ඇතුළෙහි සතර "පවුර කොණ නාඹ තල්කඳසා ගිනිකඳ සතරෙක් පවුරෙහි තල "කකාවිටුව උසට නැගී දිලියෙන්නේය. ඒ ගිනිකඳ සතරට "මධ්‍යයෙහි කද්‍යෝපැණියෙකු සා ගිනිපුපුරක් නැගිලා, එම ඇසිල් "ලෙහි සතරකොණ සිටි ගිනිකඳ සතරෙහි ආලොක මැඩගෙණ, "බඹලොව් උසට මුළුලෙව්හි ආලොක පතුරුවමින් දිලිහුනේය. "යටත් පිරිසෙයිත් බිමහුනු සර්ෂපමාත්‍රයකුදු පෙණෙන්නේය. "සියලු දෙවි මිනිසුන් සහිත ලෝවැස්සෝ ගඳින් මලින් පූජාකො "රෙමින්, ඒ ගිනිදූල් ඇතුළේම වැද ඇවිදිනාහුය. එසේ ගිනි "දූල් ඇතුළෙහිම ඇවිදිනා උන්ගේ ඇඟින් රොමකූප මාත්‍රයකුදු "හුණු නොවන්නේය.

වේදේහරජ්ජුරුවෝ මේ සීනය දුටු වේලෙහි පටන් මරණ භයින් භයපත්ව, නොනිදාහිඳ පහන්කළහ. උදසනක්සේ සේනකාදි පඬිතවරු සතරදෙන රජගෙටගොස් රජ්ජුරුවන් වැඳ, රෑ දවස සුවසේ නිදිලත්සැටි විචාරා, රජ්ජුරුවන් විසින් "මට සුවයෙක්නම් කොයින්ද ? මෙබඳු සීනයක් දුටිමි" කී කල්හි පඬිතවරුන්සතරදෙනාගෙන් සේනකපඬිතයෝ දේවයන්වහන්ස නො "බව මැනව; මේ සොම මඞ්ගලසීනය එහෙයින් නුඹවහන්සේට "වැඩෙක් වන්නේය" යි කියා කවරකාරණයකින්ද" යි රජ්ජුරු

"එත් කී කල්හි "අප පණ්ඩිතවරුන් සතරදෙනාම අභිභවා, අප "ගේ නුවන යටකොට, අනික් නුඹවහන්සේට පස්වන පණ්ඩිත "කෙනෙක් උපදනාහ, අප සතරදෙනා මේ රාජභවනයෙහි සතර "කොණ නැගී ගිනිකඳ සතරක් වැන්නම්හ; මධ්‍යයෙහි නැගී "ගිනිකඳ මෙන් පස්වනු පණ්ඩිතයෝ උපදනාහ; සියලු දෙවිම්නි "සුන් සහිත ලෝකයෙහි අසමානවූ නුවනැත්තාහ; සියලු ගුණ යෙන් අසදෘශයහ"යි කියා දූන්වූහ. "දූන් කොයිද්ද"යි රජ්ජුරු "වන් කී කල්හි "දේවයන්වහන්ස අද උන්ගේ මව්කුස පිළිසිඳ "ගැන්ම හෝ මව්කුසින් බිහිවීම හෝ වන්නේය"යි තමන්ගේ ශාස්ත්‍ර බලයෙන් දිවඇසින් දුටු කෙනෙකුන් මෙන් සිනයෙහි අඹ රජ්ජුරුවන්ට කීහ.

රජ්ජුරුවෝ එදා පටන් ඒ වචනය සිහිකළහ. **මියුලුනුවර** වනා හි වාසල් සම්පයෙහි දකුණු යවමැදුම්ගමය, බටහිරි යවමැදුම් ගමය, උතුරු යවමැදුම්ගමය, නැගෙණහිරි යවමැදුම්ගමයයි නියම්ගම් සතරක් වූය— ඒ ගම් සතරින් නැගෙණහිරි යවමැදුම් ගම **සිරිවඩ්ඪන** නම් සිටානකෙනෙක් වූහ. උන්ගේ ඇඹනියෝ **සුමනානම්** දේවි කෙනෙක, මහබෝසතානන්වහන්සේ එදවස් රජ්ජුරුවන් සිනය දුටු වේලෙහිම තව්තිසා දෙව්ලොවින් චුතව, **සිරිවඩ්ඪන** සිටානන්ගේ සුමනානම් දේවින් කුස පිළිසිඳගත් සේක— අනිකුත් දිව්‍යපුත්‍රයෝ දසෙක් එම දෙව්ලොවින් චුත ව, නැගෙණහිරි යවමැදුම්ගම බාල, වැඩිමහලු සිටුවරුන්ගේ ගෙවල පිළිසිඳගත්හ.

**සුමනාදේවීන්** පිරිහුන් දසමසකින් අභිනව චන්ද්‍රරේඛාවසේද්‍රේ හෝ නොහොත් ඝනරන් පිළිමයක් බඳුවූ රන්වන් පුතනුකෙනෙකුන් වැදූහ. ඒ ඇසිල්ලෙහි සක්දෙවරජතෝ මිනිස්ලොව බලන්නාහු, මහබෝසතානන්වහන්සේ මව්කුසින් නික්මුණුබව දූන "මේ බුද්ධාඞ්කුරයන් දෙව්මිනිසුන් සහිත ලෝකයෙහි ප්‍රසිද්ධකොටලබනබව සුදුසුය"යි සිතා, උන්වහන්සේ මව්කුසින් බිහිවෙන වේලෙහි නොපෙණෙන ශරීර ඇතිව අවුත්, ඔබ අත රන්වන් සඳුන් ගැටයක් තබාලා, තමන් වසන ශක්‍රභවනයට ගියහ.

**මහබෝසතානෝ** ඒ ගත් සඳුන්ගැටය මිටින් ගත්සේක. මහබෝසතානන්වහන්සේ මව්කුසින් බිහිවෙන වේලෙහි මැනියන් දැට මද පිළිවේදනාවෙකුත් නොවී ධබරාවකින් වැහෙන දියත් තක් මෙන්ද, ධම්මාසනයකින් බස්නා පණ්ඩිරුවක් මෙන්ද, සුව යෙන් නික්මුණු සේක— මැනියන්දැ උන්වහන්සේ අනතුබු සඳුන් ගැටය දැක "පුතඩ තොප අත කිම්ද"යි කීදැය, "මැනියන් වහන්ස මහෞෂධයකැ"යි කියා, දිවසඳුන් ගැටය මැනියන්දැ අතනබා වදාළසේක. ඖෂධය මැනියන්දැ අතටදී "මැනියන්ව

හන්ස මේ ඖෂධය හැරගෙණ, යම් කිසි රෝගයකින් පීඩිතකෙනෙකුට දෙව්වමැනව"යි කියා මැනියන්දෑට වදාළ සේක.

මැනියන්දෑත් තුටුපහටුව, සිරිවඩ්ඪන සිටාණන්ට කීහ. ඒ සිටාණන්ට වනාහි සත් අවුරුද්දක් මුළුල්ලෙහි පහරණ ඉසරුජාවක් ඇත්තේය, තුමූ තුටුපහටුව "මේකුමාරයා මව්කුසින් බිහිවන්නේ මහෞෂධයක් අතින් ගෙණආය, උපන් ඇසිල්ලේම මැනියන් හා කථාකළේය; මෙබඳුවූ පිණැත්තවු විසින්, දුන් මේ බෙහෙද මහත්වූ ආනුභාව ඇත්තේය"යි සිතා, බෙහෙද අතටගෙණ, සඳුන්සණ මදක් නගා නළලී ගැල්වූහ. සත්අවුරුද්දක් පබඩයෙහි පහලී ඉසරුජාව නෙලුම්පතෙක නොඇලී රූරාගෙණ යන දියත් තක්සේ නැතිව ගියේය.

**සිටාණෝ** "මහානුභාව ඇති ඖෂධයකැ"යි සොම්නසට පැමිණියහ. මහබෝසතාණන්වහන්සේ මහෞෂධයක් අතින් ගේණ, මව්කුසින් බිහිවූ නියාව හැමතැනම ප්‍රසිඞවිය. කාසශ්වාසාදිවූ රෙගයෙන් පිඩිත කිසි මිනිස් කෙනෙක් ඇද්ද, ඒ සියල්ලෝම සිරිවඩ්ඪන සිටාණන්ගේ ගෙටගොස්, මහෞෂධය ඉල්වති; සිටාණෝ ඒ සඳුන්ගැටය සඳුන්සණගහා, කල්ක සුගක් ගෙණ, පැනැකලනා, හැමදෙනාටම දෙන්නාහ. දිව්‍යමයවූ ඖෂධය ශරීරයෙහි වැකිපමණින්ම, සියලු ව්‍යාධීහු සන්සිඳෙන්නාහ. සන්හුන්නාවූ රෝග ඇති මනුෂ්‍යයෝ "සිරිවඩ්ඪන සිටාණන්ගේ ගෙයි ඖෂධය මහත්වූ ආනුභාව ඇත්තේය"යි වණ්ණනාකෙරෙමින් යන්නාහ. මහබෝසතාණන්වහන්සේට නම් තබන දවස් පියාණෝ "මාගේ පුතනුවන්ට මුතුන්මිත්තන් ආදීන්ගේ නමින් ප්‍රයෝජන නැත, මහෞෂධ නාමයම වේවා"යි කියා, උන්වහන්සේට "මහෞෂධ කුමාරයෝය"යි නම් තැබූහ. තවද ඒ සිටාණන්ට "මාගේ පුතනුවෝ පින් ඇත්තෝය, එහෙයින් උදකලාව නූපදනාහ, මුන්හාසමග උපන් දරුවන් තවත් ඇත මැනව"යි මෙසේ වූ සිතෙක් ඇතිවිය. මෙසේ සිතා, තුමූ තමන්ගේ මිනිසුන් යවාගම ගෙයක් පාසා බලවා එකද උපන් කුමාරවරුන් දහසක් දුටුබවඅසා, සිටාණෝ හැමදෙනාටම කුමාර පළඳනාදී කිරීමවුන් යවූහ. මහබෝසතාණන්වහන්සේ හා සමග උපන්නන්ටත් සියලු මගුල් කළහ. කුමාරවරුන් දහස සරහා දවස දවස මහබෝසතාණන්වහන්සේ ලහට ගෙණෙන්නාහ; බෝසතාණන්වහන්සේ උන් හා එක්ව කෙළිමින්, සත්හැවිරිදි කල්හි ඝනරන් පිළිමයක් මෙන් මනාරූවූ සේක.* ඉක්බිති කුමාරවරුන් හා කැටිව ගම මැදදී කෙළනා උන්වහන්සේගේ කෙළිමඩුළු ඇතුන් අසුන් වැසි ආදිය ආකල්හි මැකෙන්නේය; අව් සුලං දූඩිවේලෙහි කුමාරවරු මිරිකෙන්නාන.

* අථස්ස ගාමමජ්ඣෙහි සද්ධිං කීළන්තස්ස හත්ථිආදිසු ආගච්ඡන්තෙසු කීළාමණ්ඩලං භිජ්ජන්ති—අටුවා.

එක්දවසක් උන් කෙළිමින් සිටියදී, නොකල් වැස්සෙක් නැගිය. වැසි නගන්නා දැක, ඇත් සමාන බලඇති මහබෝසතානන්වහන්සේ දිවමින් ගොස්, එක් ගේකට වන්සේක. සෙසුකුමාරවරු පසුපස්සේ දුවන්නාහු, ඔවුනොවුන් පය පැකිල වැටීගී, දනබිඳිම් ලේ ළිම් අදියට පැමිණියෝය. මහබෝසතානන්වහන්සේ "මෙතන කෙළිනට ගෙයක් කරවන බව සුදුසුය, එසේවූ කල්හි නොම්රිකෙම්හ"යි සිතා; ඒ කුමාරවරුන්ට "මේ ස්ථාන "යෙහි සුලංඅමන කල්හි වේවයි, වැසිවස්නා කල්හි වේවයි, අව් "පහරණ කල්හි වේවයි, නොම්රිකි ඉඳිනට සිටිනට වැදහෝන "ටයොග්‍යකොට ගෙයක්කරවම්හ; එකි එකී මස්සක් බැගින් ගෙ "ණෙව"යි වදාළසේක. උයින් වදාළ ලෙසම කළහ.

එ මසු දහස ගෙණ, බෝධිසත්‍වයන්වහන්සේ වඩු ආචාරියෙකු ගෙන්වා "මෙතන ගෙයක් කරයි" මසු දහස දුන්සේක. වඩුආචාරියාත් "යහපතැ"යි මසුදහස ගෙණ, බිම සමකරවා කණුගස්වා රැණ දික්කොට හෙළාලීය. බෙදනනියාව මහබෝසතානන්වහන්සේගේ සිත් නොගත්තේය. බෝසතානන්වහන්සේ වඩු ඇදුරාට රැණ ලන සැටිය වදාරණසේක් "මේ ලෙස රැණ නොලා, මනාකොට රැණ දික්කර"යි වදාළසේක. "ස්වාමිනි මේ මාගේ ශාස්ත්‍රය ඇති මට්ටම් රැණ එලිමි, මීට වඩා අනික් සැටියක් නොදනිමි"කිය. මෙපමණකුත් නොදත්තේ අප සිත්ගෙණ කෙසේ කෙරේදැ"යි වදරා * **"මෙසේ රැණ නොලා; ගෙය බෙද දිලම්"** රැණ ගෙන්වාගෙණ, තමන්වහන්සේ දික්කළසේක. විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් රැණ එලාලූ කල්හිමෙන් ගෙය බෙදිගියේය.

ඉක්බිති වඩුවා" මෙසේ රැණ එලාලියහෙයිදැ" යි විචාළසේක, "නොපිළිවන ස්වාමිනි"යි වඩුවා කීය. මාකී යැපිසේ ගෙය කළහෙයිදැ"යි වදාළසේක; "වදාළ ලෙසකට කළහෙමි"කිය.

**මහබෝසතානන්වහන්සේ** ඒ ශාලාවෙහි යම්පරිද්දකින් දුප්පතුන්වසන තැන එක් ස්ථානයක්විද, එසේම දුප්පත් ගැණුන් වදන තිඹිරිගෙය එක්තැනක, ආගන්තුක බමුණන් වසන තැන සෙසු ආගන්තුක මිනිසුන් වසන තැන, ආගන්තුක වෙළඳුන්ගේ බඩුතබන තැන, මෙපරිද්දෙන්ම සියලු ස්ථාන පිටතින් දොරකඩතබා, ශාලාව විධානකොට කරවූසේක. එහිම කෙළිමඩුලද විනිශ්චය ශාලාවද ධර්මසභාවද කරවූසේක. † කිපදවසකින් නිමියාවූ ශාලාවෙහි සිත්තරුන් ගෙන්වා තමන්වහන්සේ විධානකොට ඇලුම් කටයුතු සිත්තම් කැරවූසේක. ඒ ශාලාව නොමෝ සුධර්මාව හා සමානවීය. ඉක්බිති "මෙ පමණකින් මේ ගෙය හො

* ආහරසුත්තං—අටුවා.

† තත්ථේව විනිච්ඡයං තත්ථේව කීළාමණ්ඩලං තත්ථේව ධම්ම සභං කාරේසි.

බතේ නොවෙයි, පොකුණක් කරවන බව සුදුසුය"යි පොකුණක්කණවා, උළුවඩුවන් ගෙන්වා, තමන්වහන්සේ මිලදී විධාන කොට, දහසක් වක් ඇති මනහර පියගැට පන්තීන් යුක්තවූ සියක්තොට ඇති පොකුණක් කරවූසේක. ඒ පොකුණතොමෝ පස්පියුමෙන් සැදුම්ලද්දිය, නන්‍දානම් පොකුණ මෙන්විය. නැවත ඒ පොකුණුතෙර අඹ, දෙඹ, නා, පනා, සපු, දුනුකේ, ඇසළ, පුවඟු, ආදිවූ මල්පල්ලෙන් සැදී සිටිනා නොයෙක් ගස් රොපණය කරවූසේක. නදුන් උයන හා කරවූසේක. එම සාලාවන්සාම ධාර්මික මහණ බමුණන්වද, බැහැරින් අවුත් ඒ සාලාවෙ ලගනන්වද, එහි ලැග බැහැර යන්නන්වද, සෙසු දුප්පතුන් ආදීන්ටද, දන්වැට තැබ්බවූහ. ඒ මහතානන්වහන්සේගේ ක්‍රියාව තොමෝ සියලුතන්හි පතළාය. බොහෝ මිනිස්සු ඒ ස්වරූපය අසා එතනට එලඹෙන්නාහ. මහබෝසතානන්වහන්සේ සාලාවෙහි වැඩහිඳ, ආ කෙනෙකුන්ට කළම්නා යුක්ති අයුක්ති විචාරණසේක. මෙසේ මහබෝසතානන්වහන්සේ, බුදුන්ලොව පහළවූ කල්හි මෙන් පහළවූසේක.

එසමයෙහි **වේදේහ** රජ්ජුරුවෝ සිනදුටු සත් අවුරුද්දක් ගිය කල "පඬිතවරුන් සතරදෙනා අප * අභිභවා,පස්වැනි මහනුවන ඇති පණ්ඩිතකෙනෙක් උපදනාහ"යි † මටකීහ. "දැන් ඒ පණ්ඩිතයෝ කොයිද්ද"යි සිහිකොට "උන්වසනතැන් දනුව"යි සතරවාසලින් ඇමතියන් සතරදෙනෙකු යැවූහ. සෙසු වාසල් තුනින් නික්මුණාවූ අමාත්‍යයෝ තුන්දෙන මහබෝසතානන් නුදුටුහ. නැගෙණගිරි වාසලින් නික්මුණු අමාත්‍යතෙමේ නැගෙණගිරි යවමැදුම්ගමට ගොස්, බොධිසත්වයන්වහන්සේ විසින් කරවන ලද සාලාදිය දැක "නුවනැති කෙනෙකුන් මේ ගෙය තමන් හෝ "කළමැනව, අනුන්ලවා හෝ කරවූවමැනව, මේ ගෙය කවර "වඩුවෙකු විසින් කරණ ලද්ද"යි විචාළේය. මිනිස්සු කියන් "නෝ මේ ගෙය වඩුවෙකු තමා නුවන බලයකින් කළ දෙයක් නොවෙයි, **සිරිවඩ්ඪන** සිටානන්ගේ පුතනුවූ **මහෞෂධ** පණ්ඩිතයන්ගේ විධානයෙන් උන් කී සැටියේ කරණලද්ද"යි කීහ, "ඒ පණ්ඩිතයෝ කී හැවිරිද්දෙද්ද"යි විචාළේය, "පිරිහුණු සත්හැවිරිදි සේකැ"යි කිවුය.

ඇමති "රජ්ජුරුවන් සිනය දුටුද පටන් ‡ ගැණ සිනය දුටුනියාව සැරිමය, සේනක පණ්ඩිතයන්ට පස්වනු පහළවන පණ්ඩිතයෝනම් § මූමය''යි සනිටුහන්කොට, රජ්ජුරුවන්ට "දේවයන්වහන්ස නැගෙණගිරි යවමැදුම්ගම **සිරිවඩ්ඪන** සිටානන් පුතනුවෝ **මහෞෂධ** පණ්ඩිතකෙනෙක්, සත්හැවිරිදි වයස් ඇත්තාහු, මෙබඳු සාලාවක්ද, පොකුණක්ද, උයනක්ද, කරවූහ; මේ පණ්ඩි

* අමෙහ අභිභවිත්වා.
† මෙකථයිංසු.
‡ ගණෙත්වා.
§ අයමෙව

තයන්ගෙණෙම්ද නොගෙණෙම්දැයි * මෙහෙවර කරන්නෙකුයැවූහ. රජ්ජුරුවෝ එපවත් අසා සතුටු සිත්ඇතිව සේනක පණ්ඩිතයන් ගෙන්වා එපවත් උන්ට කියා, "කිමෙක්ද සබඳ සේනකපණ්ඩිතයෙනි, පණ්ඩිතයන් ගෙන්නමෝද්දැ"යි විචාළහ. ගුණමකුවූ ඒ සේනකයා "දේවයිනි ගෙවල්ආදිය කරවාපී පමණකින් පණ්ඩිත නම් නොවෙති. යම්කිසි කෙනෙක් ඒ කරවාපියන්නාහ, ඒ ඉතා සවල්පය"යි කිය. වේදේහරජ්ජුරුවෝ උන්ගේබස් අසා "මෙයින් එක්කාරණයෙකැ"යි මුවෙන් නොබිණූහ. "එමගම ගිද පඬිතයන්විමසව"යි මෙහෙවර කරන්නෙකු යවූහ.

එබස්අසා, ඇමති ඒ නියම්ගම වසන්නේ පණ්ඩිතයන්වහන්සේ පරීක්‍ෂාකෙළේය.—මේ මහෞෂධ පඬිතයන්වහන්සේමත් නෙයි විමසූ පැණයෙහි සංක්‍ෂෙපයෙන් කිබසී.

"මංසං ගොණොගණ්ඨිසුත්තං පුත්තං ගොළි රථේන ච
දණ්ඩො සීසං අහිචෙව කුක්කුටො මණි විජායනං
ඔදනං වාලුකංචාපි තළාකුය්‍යාන මඵ ගද්‍රභො මණි."

——◦——

**එහි පළමුවන මාංශ ප්‍රශනය කෙසේදයත්?** එක්දවසක් බෝධිසත්වයන්වහන්සේ කෙළිමඬලට වඩනා වේලෙහි, එක් උකුස්සෙක් අහානියේ මස්කොලොඹුවකින් මස්වැදූල්ලක් ගසාගෙණ ආකාශයට පැනනැංගේය. දහසක් කුමාරවරු ඒ දැක "මස්වැදූල්ල එළවම්හ"යි උකුස්සා ලුහුබැඳගෙණ දිවන්නාහ. උකුස්සාත් ඇත් මෑත් බලා පියාඹන්නේය. කුමාරවරු උඩ බලමින් උකුස්සා පසුපස්සෙහි දිවන්නාහු, කැබිලිති ගල් ආදියෙහි පැකිල පීඩාවන්නාහ. ඉක්බිති මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ "මේ මස්වැදූල්ල එළවාපියම්ද"යි ඒ කුමරුවන් විචාළසේක. "එළෙව්ව මැනව ස්වාමිනි"කීහ. "එසේවී නම් බලව"යි පඬිතයන්වහන්සේ උඩ නොබලාම පවනටබඳු වේගයෙන් දිව, උකුස්සාගේ ඡායාව මැඩගෙණ, අත්ලෙන් අත්ල ගසා, මහත්වූ නාද කළසේක. ඒ මහතානන්වහන්සේගේ ආනුභාවයෙන් ඒනාදය උකුස්සාගේලෙන්ඇනි පිටින් නැගෙන්නාසේ වූයේය. ඒ උකුසු භයපත්ව, මස්වැදූල්ල හෙළිය. මහබෝසතානන්වහන්සේ, ඔහු ඒ මස් වැදූල්ල හෙළන්නාවූ ඡායාව දැක "බිමවැටිය නොදෙමි"කියා අල්වාගත්සේක. ඒ ආශ්චය්‍ය්‍ය දැක, බොහෝදෙන ඔල්වරසන් දුන්නාහ. අත්පොළසන් දුන්නාහ. මහානාද කළාහ. ඒ අමාත්‍යයා එපවත් දැන රජ්ජුරුවන්ට "මහෞෂධ පඬිතයෝ මේ උපායෙන් උකුස්සා ගසාගත් මස් වැදූල්ලක් එළූහ, මේ අරුමය දේවයන්වහන්ස දන්නාසේක්ව"යි කැඩපත් යැවීය. රජ්ජුරුවෝ එපවත්අසා "සේනකපඬිතයෙනි කිමෙක්ද මහෞෂධපඬිතයන් ගෙන්වමෝද්දැ"යි

* අනෙම්මා ආනෙමිති.

විචාළහ. සේනකපණ්ඩිතයෝ "උන් මේනුවරට ආතැන් පටන්, අපි හිරුදුටු කද්‍යෝපැණියන්සේ නිෂ්ප්‍රභාවන්නම්හ. * රජ්ජුරුවෝ අප ඇතිබවත් නොදන්නාහ. එසේහෙයින් උන් මෙයට ගෙණඑනු නුදුන මැනව"යි සිතා; නමා ගුණමකුබැවින් "දේවයන්වහන්ස මෙපමණකින්ම පණ්ඩිතනම් නොවෙත්මය, මේ ඉතාම අල්ප දෙයකැ"යි කීහ. රජ්ජුරුවෝ මධ්‍යස්ථව "එහිමහිද විමසන්නේය"යි නැවත අසුන් යවූහ.————මාංස ප්‍රශනය නිමි.

———∘———

**නැවත ගොණ් ප්‍රශනය කෙසේදයත්?** යවමැදුම්ගම වසන පුරුෂයෙක් "වැසිදිය එළාලූකල සීසාමි" අසල්ගමකින් ගොන්ගෙයක් මිලයටගෙණ අවුත්, නමාගේ ගෙයිම ලගගවාදෙව නදවස් තණකවන පිණිස තණබිමට ගෙණගොස්, ගොනෙකුපිට ඉඳ තණ කවමින් විඩාව, ගොනු පිටින් බැස; ගසක්මුල හිඳ නිදන්ට වන. ඒ ඇසිල්ලෙහි එක් සොරෙක් ගොන් ගෙය ඇරගෙණ නැගී ගියේය. ඒ පුරුෂයා පිබිද නොස්, ගොන්ගෙය නොදැක, ඔබ මොබ බලා ඇවිදිනේ, ගොන් ගෙය ඇරගෙණ යන සොරු දැක, වහා දිවගොස් "මාගේ ගොන් කොයි ගෙණයයිද"යි ඇසීය. සොරාකියන නැනැත්තේ "මාගේගොන් මා කැමතිතැනකට ගෙණයෙමි"කිය. උන්දෙන්නාගේ කලහ අසා, බොහෝ දෙන රැස්ව ගියාහ. පණ්ඩිතයන්වහන්සේ උන් දෙන්නා ඩබරකොට ගෙණ, සාලාව දොරකඩින් යන්නවුන්ගේ කලහ ශබ්දය අසා, දෙන්නාම ගෙන්වා, ඔවුන් දෙන්නාගේ එනසැටි ගමන දැක "මේ සොරාය මේ ගොන් හිමි තැනැත්තේය"යි දන්නාසේකුදු "කුමක්හෙයින් ඩබරකරව්දැ"යි විචාළසේක. ගොන්ඇති තැනැත්තේ "පණ්ඩිතයන්වහන්ස "මම මේ ගොන් ගෙය අසවල් ගම, මෙනම් තැනැනතාවූ අතින් මිලදී, හැරගෙණ අවුත්, රෑ ගෙයි ලග්ගාලා උදෑසන තණබිමට තණ කවන්ට ගෙණගියෙමි; එතනදී මාගේ ප්‍රමාදයක් දැකලා මේතෙමේ ගොන්ගෙය ඇරගෙණ, පලාගියේය. ඒ මම ඔබ මොබ බලන්නෙම් ගොන් දෙන්නා බැඳගෙණයන මේ සොරාදැක, ලුහුබැඳ, අල්වාගතිමි. අසවල් ගම ඇත්තෝ; මේ ගොන් ගෙය ගත් නියාව දනිති"කීය. සොරා කියන්නේ "මේ මාගේ වදු වඩාගත් ගොන් ගෙයය, මේකා බොරුකියයි" කීය. ඉක්බිති පණ්ඩිතයන්වහන්සේ ඔවුන් දෙන්නාගේම බස් අසා "මම නොපට යුක්තිය දැහැමේන්ම විනිශ්වයකොට ලමි. මාගී යුක්තියෙහි සිටිව්දැ"යි විචාරා 'සිටුම්හ'යි කී කල්හි "බොහෝදෙනා ලගන්වා යුක්තිය පසිදිනාබව සුදුසුය"යි පළමුකොට සොරු කැඳවාලා "තෝ මේ ගොන් ගෙය කුමක් කවා පොවා වැඩීදැ"යි විචාළසේක.

* නිප්පභාභවිස්සාම.

සොරා කියන්නේ "උළුකැන් පොවා, තලමුරුවට හා උඳු කවනලද"යි කීය, ඉක්බිත්තෙන් ගොන්ඇති තැනැත්තවූ කැඳවා "තෝ කුමක් කවා පොවා ඇඩීද"යි විචාළකල්හි, ඒ කියන්නේ" ස්වාමිනි මා දුක්පත් තැනැත්තවුට උළුකැන් හා තල ආදිය කොයින්ද? තණම කවනලද"යි කීය පණ්ඩිතයන්වහන්සේ දෙන්නාගේ බස් අසා, සභාවෙහි උන්නවුන් ගිව්ස්වා, පුවනුකොල ගෙන්වාගෙණ, කොටා, පැන්මඩවා, ගොන් පෙවූසේක. ගොන් තණම නැගූහ‿ පඬිතයන්වහන්සේ බොහෝදෙනාට "මේ බලව" පෑ, "සොරෙහිද නොසොරෙහිද"යි විචාළසේක. "ඒතෙම සොරෙම්"යි කීය. "එසේවීනම් මෙතැන්පටන් සොරකම්නොකරව"යි අවවාදකොට "මෙබඳු නොකටයුත්තක් නොකරව"යි වදළසේක. බෝධිසත්වයන්වහන්සේගේ පුරුෂයෝ වනාහි, ඔහු එතනින් පිටිපස්සට ගෙණ, අතින් පයින් තළා දුර්වලකළහ. ඉක්බිති පණ්ඩිතයන්වහන්සේ ඔහු ගෙන්වා "මේ ජන්මයෙහිම මේසා දුකකට පැමිණියෙහිය. පරලොව වනාහි නරකාදියෙහි ඉපිද, බොහෝ දුක් අනුභවකරන්නෙහිය. මෙතැන්පටන් සොරකම් නොකරව"යි අවවාදකොට, පන්සිල් දුන්හ. අමාත්‍යයා එපවත් අසා, තත්වය පෙරපරිද්දෙන් රජ්ජුරුවන්ට කියා යැවීය. රජ්ජුරුවෝ සේනකයන් විචාරා "දේවයෙනි ගොන්යුක්තිනම්, යම්කිසි කෙනෙක් පසිඳපියති. තවද ඇම්බුණ මැනව"යි කිකල්හි රජ්ජුරුවෝ මධ්‍යස්ථව, පෙර පරිද්දෙන් අමාත්‍යයාට කියා යවූහ.

අමාත්‍යයා රජ්ජුරුවන්ට කියා යවන නියාවද, රජ්ජුරුවන් සේනකයන් විචාරණ නියාවද, සේනකයන් වලකන නියාවද, රජ්ජුරුවන් අමාත්‍යයාට කියා යවන නියාවද, හැම පැණෙහිම මෙම ලෙසයයි දතයුතුයි‿ ගොන් යුක්ති නිමි.

---

**තවද තුන්වැනිවූ ගැටහු පලඳනාවේ විනිශ්චය කෙසේදයත්?**

එක් දුක්පත් ගැණියක්, නිලපීතාදි නානාවර්ණ හුයින් ගැටගසා, කරණලද ගැටහුපලඳනාවක් කරින් ගලවා කඩමත්තේ තබා, පඬිතයන්වහන්සේ විසින් කරවනලද පොකුණෙන් නහනනට වන. අනික් ලදූරි බාල එකක් ඒ පලඳනාව දැක ලෝභ උපදවා, ඔසවාගෙණ "මැනියෙනි මේ පලඳනාව ඉතා හොබනේය. කවර කෙනෙකුන් විසින් කරණලද්දේද? මමත් මට මෙසේම පලඳනාවක්කෙරෙම් කරපැළඳ පමණබලාපියම්ද"යි විචාරා; වංකසිත්නැති ස්ත්‍රිය විසින් "යහපත යෙහෙලනියනි පමණ දූන පියව"යි කී කල්හි කර පැළඳගෙණ, නැගීගියාය. පලඳනාව ඇති තැනැත්ති දැකලා, වහා ගොඩනැගී, කඩ ඇඳගෙණ ලුහුබැඳගොස් "මාගේ පලඳනාව ඇරගෙණ කොයියේද"යි එකුරුතු පට ගත. අනික් තැනැත්ති "නොපගේ පලඳනාවක් මම නො

ගතිමි, මේ මා කරලන පලඳනාව"යි කීය. ඒ කලහඅසා, බොහෝ දෙන රැස්වූහ. පණ්ඩිතයන්වහන්සේ කුමාරවරුන් හා සමග කෙලනාසේක්, ඒ ගැණුන් දෙන්නා ඩබර කොට කොට සාලාවදෙරින් යන්නවුන්ගේ කලහ ශබ්දය අසා "කුමන අරගලෙක්ද"යි විචාරා, දෙන්නාගේ කලහ කාරණා අසා; දෙන්නාම ගෙන්වා, එන සැටියෙන්ම මෝ සෙරය මෝ පලඳනාව ඇනි තැනාත්තිය"යි දැන ඩබර කාරණා විචාරා "මාගේ යුක්තියෙහි සිටිවද"යි විචාරාංදෙන්නා "එසේය ස්වාමිනි සිටුම්හ"යි කී කල්හි, පළමුකොට සොරතැනැත්තිය "තෝ මේ පලඳනාව පලඳිහොයි, කවර සුවඳක් ගැල්වීද"යි විචාළසේක. ඕ "මම නිරන්තරයෙන් සර්වසංහාරක නම් සුවඳක් ගල්වමි"කිව. සර්වසංහාරක සුවඳනම්, සියලු සුවඳ එක්කොට කරණලදය. ඉක්බිති පලඳනාව ඇනි තැනැත්තිය විචාළ කල්හි, ඕ "ස්වාමිනි මා දුක්පත් තැනැත්තියට සර්ව සංහාරක නම් සුවඳ කොයින්ද ? නිරන්තරයෙන්ම පුවඟු මලෙහි සුවඳ කවමි" කිව. පණ්ඩිතයන් වහන්සේ පැන් තළියක් ගෙන්වාගෙණ, ඒ පලඳනාව පැන් තළියෙහි ලවා, ඔසද වටුවෙකු ගෙන්වා "මේ තළියෙහි පැන්සිඹ 'අසවල් සුවඳය'යි දැනැ"යි වදාළසේක. ඔසද වටුවා පැන් සිඹ, හුදු පුවඟු මලෙහි සුවඳ නියාව දැන; ගාථාවකින් * "සර්වසංහාරක සුවඳෙක් මෙහි කොයින්ද? පුවඟු මලෙහි සුවඳ අමන්තේය, මේ ලඳුරී බාල ධූර්ත ස්ත්‍රිය බොරුකිව; මැහැලි තැනැත්තිය කියේ සැබෑය"යි කීය.—මහබෝසතානන්වහන්සේ ඒ කාරණාව බොහෝදෙනාට හඟවා "තෝ සෙරෙහිද නොසෙරෙහිද"කියා සෙරනියාව ගිවිස්සූසේක.—එතැන්පටන් මහබෝසතානන්වහන්සේගේ පණ්ඩිතභාවය බොහෝදෙනාට ප්‍රසිද්ධවිය. ගැටහුපලඳනාවේ විනිශ්චය නිමි.

---

**සතරවනු හුවටෙහි විනිශ්චය කෙසේදයත්?** කපුසේනක් රක්නා එක් ස්ත්‍රියක් කපු රක්නී, තමා රක්නා සේනෙහි සවස පිපි කපු කඩාගෙණ, සකස්කොට කඩා පොළා වලූකොට සිත්හු කැට, වැටිකොට, ඒ හුවට ඉන තබාගෙණ ගමට එන්නී, මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ විසින් කණවනලද පොකුණෙන් 'නහමි' කඩ ගලවා ගොඩ තබා, කඩ මත්තේ හුවැටිය තබා, නහන්නට දියට බට. අනික් ස්ත්‍රියක් හුවැටිය දැක එහි ලොල්වූ සිත් ඇතිව ඒ අතට ගෙණ "අහ ! ඉතා යහපත හුයෙහි සිත, ඇත නැගනියෙනි තොප විසින්ම කටනාලදද"යි ආශ්චර්ය්‍යමත්ව බලන්නියකමෙන් ඉන තබාගෙණ, නැගී ගියාය. පෙර ගැටහු පලඳනායෙහි පරිද්දෙන්ම කලහ කොට කොට සාලාව සමීපයෙහි යන දෙ

* සබ්බසංහාරකො නත්ථි සුද්ධංපියංගු වායති
අලිකංභාසි ධුත්තායං සච්චමාහ මහල්ලිකා.

දෙනා ගෙන්වා, විචාරා තමන්වහන්සේ කී යුක්තියෙහි "සිටුම්හ"යි කී පසු බෝධිසත්වයන්වහන්සේ "තෝ මේ හුවැටිය කරන්නී කුමක් ඇතුළේ ලා කළාද"යි සොර තැත්තිය විචාළේය, සොරතැනැත්තී කියන්නී ස්වාමිනි කපුඇටක් ඇතුළේලා වටකෙළෙමි"කිව. ඇගේබස් අසා, හුවැටිය ඇති නැනැත්තිය "තෝ කුමක් ඇතුළේ ලා වටකළාදයි විචාළසේක. ඕ 'තිඹිරි ඇටක් ඇතුළේ ලා වටකළෙමි'යි කිව. දෙන්නාගේ බස් අසා, සභාවෙහි උන්නවුන් ගිවිස්වා හුවැටිය ගලවා, ඇතුළේ තුබූ තිඹිරිඇටය දක ඇසෙරබව ගිවිස්වූ සේක. බොහෝදෙනා යුක්තිය පසුත් නියාවට තුටුපහටුව දහස්ගණන් සාධුකාර පැවැත්වූහ.—හුවටෙහි විනිශ්චය නිමි.

———o———

**පස්වනු පුත්‍ර ප්‍රශනය කෙසේදයත්?** එක් ස්ත්‍රියක් පුතෙකු වඩාගෙණ පණ්ඩිතයන්වහන්සේගේ පොකුණට ගොස් ආදිකොට පුතු නහවා, තමාගේ කඩමත්තේ හිදුවා, තොමෝ ඉස්සෝද නහන්ට බට. ඇ නාන්නට බට ඇසිල්ලෙහි යකින්නියක් ඇගේ පුතු දක, කනු කැමතිව ගැණු වෙසක් ගෙණ, දරුවන් සමීපයට අවුත් "යෙහෙළිය මේ දරුවෝ ඉතා හොබනාහ. මූ තොපගේ දරුකෙනෙක්දැ"යි විචාරා, "එසේය යෙහෙළියනි" කී කල්හි 'මේ දරුවන් කිරිපොවම්දැ'යි කී කල්හි මැනියන් විසින් "යහපතැ"යි කී කල්හි ඕ දරුවන් වඩාගෙණ මදක් කිරි පොවා ලා, වඩාගෙණ පලා ගියාය. මැනියෝ තමන්ගේ දරුවන් ඇර ගෙණ යන්නිය දක, දිවගෙණ ගොස් "මාගේ පුතු කොයි ගෙණ යේදැ"යි අල්වාගත. යකිනි කියන්නි "තී කොයින් ලත් පුතෙක්ද? මූ මාගේ පුතනුවෝය"යි භයක් නැතුව කිව. ඔහු දෙනනා කලහ කෙරෙමින් සාලාව දොරකඩින් යන්නාහ. මහබෝසත්තානන්වහන්සේ කලහ ශබ්දය අසා, දෙන්නාම ගෙන්නා 'මේ කුමන ඩබරදැ'යි අසා, ඇස් නොමරණ බැවින්ද ඔලිඳැට දෙකක් සේ රත්ව තිබෙන බැවින්ද 'මේ යකින්නිය'යි දන 'මාකී යුක්ති යක සිටිව්දැ'යි විචාරා 'එසේය සිටුම්හ'යි කිකල්හි, බිමහිරක් අඳවා, හිරමැද දරුවන් හොවා, යකින්නියලවා දැතහා මැනියන්ලවා දෙපයගන්වා, "දෙන්නාම ඇදගනුවයි ඇදගත් එකෙකුටය පුතනුවෝය"යි වදාළසේක. දෙන්නාම දරුවන් ඇද ගත්හ. දරුවෝ දෙන්නා විසින් අදනුලබන්නාහු දුකටපැමිණි යහ. මැනියෝ ලය පැලුණු කලක් මෙන් ශොකයට පැමිණ, දරුවන් අතහැර, අඩමින් සිටියාය. බෝසතානන්වහන්සේ "දරුවන් කෙරෙහි වැදූවන්ගේ ලය මොලොක්ද නොහොත් නොවැදූවන්ගේ ලය මොලොක්දැ"යි බොහෝදෙනා විචාළසේක. බොහෝදෙනා පණ්ඩිතයන්වහන්ස වැදූවන්ගේ ලය වේද මොලොක්

වන්නේය"යි කීවාහුය. ~ ඒ අසා පණ්ඩිතයන්වහන්සේ "කිමෙක්ද දූන් දරුවන් වඩාගෙණ සිටිනැනැත්තිය මෑනියනැයි වැටහේද? හැරපියා සිටි නැනැත්තිය මෑනියනැයි වැටහේදැ"යි හැමදෙනාම විචාළසේක. හැමදෙනම "දරුවන් හැර සිටි නැනැත්තෝවෙත්ද.* පණ්ඩිතයන්වහන්ස මෑනියෝය" කීහ. "කිමෙක්ද තොපි හැම මේ දරු සෙර දනුද්දැ"යි විචාළසේක. හැමදෙනම "නොදනුම්හ පණ්ඩිතයන්වහන්සැ"යි කීකල්හි "එඹා මෝ යකිනියක, දරුවන් කන පිණිස ගතැ"යි වදාළසේක. "කෙසේ දත්සේක්ද පණ්ඩිතයන්වහන්සැ"යි කීහ. "ඇසිපිය නොමරණ බැවින්ද ඇස්දෙක රත්බැවින්ද ඡායාවක් නැතිබැවින්ද † කිසිකෙනෙකුන් කෙරෙහි සැකයක් නැති බැවින්ද දයාවක් නැති බැවින්දැයි මෙනෙක් කාරණයෙනැ"යි වදාළසේක. ඉක්බිති මෙලෙස වදාරා "තෝ කවරෙක්දැ"යි යකින්න විචාළසේක. "යකින්නකිම් ස්වාමින්" කීව. "කුමක් පිණිස මේ කුමරුවා ගත්හිදැ"යි වදාළසේක. 'කන පිණිසය ස්වාමින්' කීව "නුවණ නැත්තිය පෙරත් තෝ අකුසල්කොට යකින්නව උපන්නෙහිවෙද, දූන් වනාහි නැවතත් අකුසල් කරන්නෙහිද වි, අහ ! නුවණ නැත්තිය" කියා අවවාද කොට, ඉක්බිති ඈ පන්සිල් පිහිටුවා යවූසේක. කුමරුවාගේ මෑනියෝ "බොහෝ කලක් ජීවත්වුව මැනව ස්වාමිනි"යි මහබෝසතානන්වහන්සේට ස්තුතිකොට පුත නුවන් වඩාගෙණ නැගී ගියහ.

———o———

**සවනුවූ කාලගෝල ප්‍රශ්නය කෙසේදයත්?** මිටි හෙයින් ගෝලයයි කියාද, කලුපැ ඇතිහෙයින් කාළයයි කියාද ලබනලද නම්වූ එක් මිනිසෙක් වනාහි සත් අවුරුද්දක් ගෙයි කඹුට අඹුව කලද. ඕ නමින් දික්තල නම. ඒ පුරුෂයා එක් දවසක් තමාගේ අඹුව බණවා "සොඳුර දෙමව්පියන් බලාපියම්හ. කැවුම් පෙවුම් ඉදිකොට ලව"යි කියා ඈ විසින් "මව්පියන්ගෙන් කාරිය කිම්ද? නොබැණැ'යි ප්‍රතික්ෂෙපකරණලද්දේ, තුන්වර දක්වා කියා, තුන්වෙනි වාරයෙහි ගිවිස්වා, කැවුම් පිසවාගෙණ, පලාබත් ආදි මාර්ගොපකරණද කැවුම් ආදී දෙමව්පියන්ට ගෙණයායුතු පඬුරුද ඇරගෙණ; ඒ අඹුව හා සමග මගට පිළිපන්නේ, අතර මග, පැතිර දිය යන හොයක් දිටි. නොගැඹුරුවුවත් ගඟ දියට ඔහු දෙදෙනම බානාහ. එසේහෙයින් ඒ ගඟින් එතරට යාගත නොහෙන්නාහු ගංතෙර සිටියහ. එවේලෙහි දික්පිටියා යන නමක් ඇති එක් දුක්පත් පුරුෂයෙක් ඒ ගංතෙර ඇවිදිනේ, උන් දෙන්නා සිටි තැනට පැමිණියේය. ඉක්බිති ඔහු දූක 'යහලු, මේ ගඟ ගැඹුරු හෝ නැද්දැ'යි පිළිවිස්සහ. ඒතෙමේ "ඔහු දියට බාන්නාහ"යි දූන "මේ ඉතා ගැඹුරුය. කිඹුළන් හා දූත්මුවර

* ඉමංපනදරකාවොඊං     † ඡායාය අභාවෙනව.

ආදිවූ වණ්ඩ මනුෂ්‍යයන්ගෙන් ගහණය"යි කීය — එබස් අසා "සබඳ නෙපි කෙසේ එතරවව්දැ"යි විචාළහ. මේ ගහ කිඹුළුන් හා දූතිමුවර ආදිවූ වඬ් අය හා අප හා පුරුදුකම් ඇත. එහෙයින් අප නොකන්නාහ"යි කීය. "එසේවීනම් සබඳ අපත් එතර කරව"යි කිවුය. ඒ පුරුෂයාත් "යහපතැ"යි ගිවිස්සේය. ඔහු ගිවිසිකල දෙමහල්ලෝ කනබොනදෑ ඕහට දුන්හ. ඒ පුරුෂයා කරණලද ආහාරකෘත්‍ය ඇත්තේ "සබඳ කවුරුන් පළමුකොට ගෙණයෙම්දැ"යි විචාළේය. එබස් අසා කාළිගෝලියා "තොපගේ බැදෑනියන්දෑ පළමුකොට ගෙණයව. මා පසුව ගෙණ යව"යි කීය. ඒ පුරුෂයාත් 'යහපතැ' යි දික්තල කරහිඳුවාගෙණ සිය ලුම මාණ්ඩෝපකරණත් කැවුමුත් අරගෙණ ගහට බැස මදක්නැත් ගොස් කෙළිලෙලන් බැස හිඳ හිඳ ගියේය — කාලිගෝලියා ගංතෙර සිටියේ "මේ ඉතා ගැඹුරුය, මෙසේ උස්නැනැත්තවුට පවා මෙතෙක් දිය මාරුනොවන්නේය"යි සිතීය. දික්පිටියාද දික්තල ගහ මැදට ගෙණගොස් "සොඳුර මම තොප රක්‍ෂාකෙරෙමි. හැඳපැළඳ දෙවඟනක්සේ කැමති පරිද්දෙන් සැරසී දූසිදස්සන් විසින් පිරිවරණලදුව ඇවිදුව. තොපට මේ අහුටුම්ටියා කුමන පොෂ්‍යයක් නමා දිලියහෙන්නේද ? මාගේ බස් ගිවිසුව " යි කීය — ඕනොමෝ දික්පිටියා කී බස් අසාම සත්අවුරුද්දක් නමා නිසා ගෙයි කඹුලි නමාගේ සැමියා කෙරෙහි සොහ සිඳ, ඒ ඇසිල්ලෙහිම එකී දික්පිටියා කෙරෙහි පිළිබඳ සිත්ඇතිව "සාමිනි ඉදින් මා නොහරුනම්, මම තොප කිවා කෙරෙමි"යි ගිවිස්සීය. ඔහු දෙදෙනාම එතර ගොස් විශෙෂයෙන්ම සනතුෂටව කාලිගෝලියා හැරපියා "තෝ එසේ සිටුවයි" කියා ඔහු බලබලා සිටියදීම කැවුම් කකා යන්ට වන්හ — කාලිගෝලියාත් උන් දෙන්නාගේ ක්‍රියාව දූක "මුන්දෙන්නා එක්වගෙණ මා ඇරපියා සෙනී" ඇත් මැත් බලා දිවන්නේ, මදක් දියට බැස හයින් ගොඩට නැගී නැවත උන්දෙන්නා කෙරෙහි කෝපයෙන් 'මියෙම්වා රැකෙම්වා යී' ගහට පැන දියට බටුයේය. දිය මදනියාව දූන ගහින් එතරව දික්පිටියා කරා පැමිණ "කොල දුෂටවූ සොර මාගේ අඹුඩ් න් කොයිගෙණයේද"යි විචාළේය. දික්පිටියාද 'කොල අහුටුම්පිය තට අඹුවෝ කොයින්ද ? මේ මාගේ අඹුවය"යි * කියා කාලිගෝලියා කර අල්වාගෙණ දමාළිය. කාලිගෝලියාද ඒ දික්තල අත අල්වාගෙණ 'තෝ නොසිට කොයියේද ? සත්අවුරුද්දක් ගෙයි කඹුට ලත් මාගේ අඹුවේදැ"යි කියා දික්පිටියා හා සමග කලහ කෙරෙමින් ශාලාව සමිපයෙන් යන්නේය. බොහෝදෙන කලහ ශබ්දය අසා රැස්වූහ. මහබෝසතාණන්වහන්සේ "මේ කුමන අරගලෙක්දැ'යි විචාරා, උන් දෙන්නාම ගෙන්වා දෙන්නාගේ ඔවුනොවුන්ට කියන බස් අසා මාකී යුක්තියෙහි සිටුදැ"යි

* මමෙසා භරියාති

කියා 'සිටුම්හ'යි කී කල්හි පළමුකොට දික්පිටියා බණවා 'තෝ කිනම්ද'යි විචාළසේක. 'දික්පිටියා නම් ස්වාමිනි' කිය. "අඹුවන්ගේ නම කිම්ද"යි විචාළසේක. ඈගේ නම නොදන්නේ අනික් නමක් කිය. "තාගේ මෑනියෝ පියානෝ කිනම්මුද"යි යන්නා "මේ මේ නමැයි" කිය. "තාගේ අඹුවන්ගේ මෑනියෝ පියානෝ කිනම්මුද"යි විචාළසේක. ඒ නොදන්නා අනික් නමක් කිය — ඉක්බිත්තෙන් ඔහුගේ බස් සභායෙහි උන්නවුන් ගිවිස්වා, ඔහු එතනින් පිටත්කරවා, කාළගෝළයා ගෙන්වා, පෙර පරිද්දෙන්ම හැමදෙනාගේම නම් විචාළසේක. ඒ වූ පරිද්දෙන්ම දන්නේ නොවරදවාම කිය. ඔවුන් එතනින් පිටත්කරවා දික්තල ගෙන්වා "තෝ කිනම්ද"යි විචාළසේක. ඕ "මම් ස්වාමිනි දික්තල නම්" කිව. "තිගේ සැමියා කිනම්ද"යි විචාළසේක. ඕ සොර සැමියාගේ නම නොදන්නී අනික් නමක් කිව. "තිගේ මෑනියෝ පියානෝ කිනම්මුද"යි විචාළසේක. "ස්වාමිනි අසවල් නම්මුය"යි කිව. "තිගේ සැමියාගේ මව්පිය දෙන්න කිනම්මුද"යි විචාළසේක. ඕ නන්දෙඩන එකක් මෙන් අනිකක් කිව. මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ දික්පිටියා හා කාළගෝළයා දෙන්නා ගෙන්වාගෙණ "මැගේ බස් හා දික්පිටියාගේ බස් සමද කාළගෝළයාගේ බස් සමද"යි බොහෝදෙනා විචාළසේක — හැමදෙනම පණ්ඩිතයන්වහන්ස කාළගෝළයාගේ බස් හා සමය"යි කීහ. ඉක්බිති "මේ කාළගෝළයා මැගේ සැමියාය. දික්පිටියා සොර සැමියාය"යි කියා ඔහු විචාරා සොර සැමියා නියාව ගිවිසූසේක.

———o———

**සත්වනු රථ ප්‍රශනය කොසේදයත්**-එක් පුරුෂයෙක් රථයක ඉඳ මුහුණ සෝදන පිණිස නික්මුණේය. ඒ ඇසිල්ලෙහි සක්දෙව් මහරජනෝ මනුෂ්‍යලෝකය බලන්නාහු මහෞෂධ පඬිතයන්වහන්සේ දක "මේ මහෞෂධ බුඩාඞකුරයාගේ ප්‍රඥනුභාව ප්‍රකාශකරවම්" සිතා; මිනිස්වෙසින් අවුත් පුරුෂයා පදිමින්සිටි රථයෙහි පසුකඩ අල්වාගෙණ ගියාහුය. * රථයෙහි උන් පුරුෂයා "කුමඩනි කුමන කටයුත්තක්නිසා අවුද"යි විචාරා "තුඹදැ සම්පයෙහි සිටිනා නිසා ආම්"යි කී කල්හි 'යහපතැ'යි ගිවිස රථයෙන් බැස ශරිරකෘත්‍ය සපයන පිණිස ගියේය. ඒ ක්‍ෂණයෙහි ශක්‍රයෝ රථයට පැනනැගී වහ වහා රථය පදනාහ. රථය ඇති පුරුෂයා ශරිරකෘත්‍යයකොට නික්මුණේ, රථය හැරගෙණ යන්නාවූ සක්දෙවිරජහු දක යුහුව ගොස් "සිටුව සිටුව රථය කොයිගෙණයේද"යි කියා "තොපගේ රථය අනිකෙක්වන්නේය. මේ වනාහි මාගේ රථය වන්නේය"යි කී කල්හි, ඔහු හා සමග කලහකෙරෙමින් සාලාව දොරට පැමිණියේය. පඬිතයන්වහන්සේ "මේ කුමක්ද"යි බැණ එන්නාවූ දෙන්නාම දක කිසි භයක් නැති බැවින්

* පායාසි.

ද ඇස්නොමරණ බැවින්ද "මේ ශක්‍රයාය මේ රථ ස්වාමියාය"යි දත්සේක. එසේ වුවද කලහ කාරණා විචාරා "මාගේ යුක්තියක සිටුදැ"යි විචාරා 'සිටුම්හ'යි කී කල්හි "මම රථය පදවමි; නොපදෙන්නාම රථයපස්සෙන් ගනුව; රථයඇතිතැනැත්තෝ නොහරණෝය"යි කියා; තමන්දැගේ පුරුෂයෙකුට 'රථය පදුවයි' වදාළසේක. ඒ සුහුව රථය පදනටවන. ඔහු දෙන්නත් රථය පස්සෙන් අල්වාගෙණ යන්නාහ. රථය හිමි තැනැත්තේ මදතෙනක් ගොස් රථය පස්සෙන් දිවිය නොහෙන්නේ රථය හැරපියා සිටියේය. ශක්‍රයා රථය හා සමග දිවන්නේමය.* පඬිතයන්වහන්සේ රථය පැදිම් නවත්වා මිනිසුන්ට "මේ පුරුෂයා මදක් ගොස් රථය හැරපියා සිටියේය. මේ වනාහි රථයහා සමගම දිවීය, මොහුගේ ශරීරයෙහි ඩාබින්දුවකුත් පමණ නැත. ඇනිම්කුත් නැත්තේය. නොමරණලද ඇස් ඇත්තේය. මේ තෙමේ සක්දෙව්රජය"යි වදාළසේක. ඉක්බිත්තෙන් ඔහට "තෝ දිව්‍යරාජයෙහිදැ"යි විචාරා 'එසේය'යි කී කල්හි, කුමක්නිසා මේ මනුෂ්‍යලෝකයට අවුදැ'යි විචාරා නුඹවහන්සේගේ නුවණප්‍රකාශකිරීම පිණිසය පඬිතයන්වහන්සැ'යි කී කල්හි 'එසේවිනම් මෙබන්දක් මතු නොකරව'යි වදාරා අවවාද කළසේක. සක්දෙව්රජානෝත් තමන්ගේ ශක්‍රානුභාවය දක්වමින් ආකාශයෙහි සිට 'නුඹවහන්සේ විසින් රථයුක්තිය යහපත්කොට පසිඳිනාලදැ'යි පඬිතයන්වහන්සේට සතුතිකොට, තමන් වසන දිව්‍යලෝකයටම ගියාහුය. එදවස් වෛදේහ රජ්ජුරුවන් විසින් 'පණ්ඩිතයන්ගේ නුවණ පරීක්ෂා කරව'යි කියා නැගෙණහිරි යවමැදුම්ගම සිටුවනලද ඒ ඇමති තෙම රජ්ජුරුවන් සම්පයටගොස් "දේවයන්වහන්ස මහෞෂධ පඬිතයන්වහන්සේ විසින් රථයුක්තියක් මෙසේ පසිඳිනාලද, ඒ පඬිතයන් විසින් සක්දෙව් රජු පවා පරදවනලද, කුමක්හෙයින් පුරුෂ විශෙෂය නොදන්නාසේක්ද? දේවයන්වහන්සැ'යි කිය—

රජ්ජුරුවෝ සේනකපඬිතයන් "කිමෙක්ද පඬිතයෙනි, මහෞෂධ පඬිතයන් ගෙන්වාගනුමෝදැ'යි විචාළෙහ. "දෙවයන්වහන්ස, මෙපමණකින්ම පඬිතනොවන්නාහ, තවත් බැලුවමැනවයි, පරීක්ෂානොකොටපියා දන්නමෝදැ"යි කිය.

---

**අටවනු කිහිරි දණ්ඩෙන් විමසූ ප්‍රශනය කෙසේදයත් ?**

ඉක්බිත්තෙන් එක් දවසක් 'පඬිතයන් විමසම්හ'යි කිහිරි දඬක් ගෙන්වා එයින් වියතක්පමණ ගෙණ තත්තකාරයෙකු ගෙන්වා සකස්කොට ලියවා, නැගෙණහිරි යවමැදුම්ගම වසන පුරුෂයෝ නුවණැත්තෝල, මේ කිහිරිදඬෙහි මේ අගය මේ මුලය දනිත්වයි, ඉදින් නොදනිත් නම් දහසක් දඬය'යි කියායවූහ. ගම් වැස්සෝ රැස්ව, කිහිරිදඬෙහි අගමුල දැනගත නොහෙන්නාහු, සිරි

* සකෙකා රථෙන සඞ්ං ධාවතෙව.

වඩ්ඪනසිටානන්ට, "කිසිසේත් මහෞෂධපණ්ඩිතයෝ දනගන්නාහ උන් ගෙන්වාගෙණ විචාරව"යිකීවෝය. සිටානෝ ඒ පණ්ඩිතයන් කෙළිමඬලෙන් ගෙන්වා එපවත් කියා, "පුත, අපි හැම කිහිරිද ඬෙහි අග මුල දනගන්ට නොපොහොසතුම්හ. කිමෙක්ද පුත තෙපි පොහොසතුද"යිවිචාළහ. පියානන් කී බස් අසා පණ්ඩිතයන් වහන්සේ "රජ්ජුරවන්ට මේ කිහිරිදඬෙහි අගින්වෙව යි මුලින් වෙ වයි ප්‍රයෝජනයෙක් නැත. මා විමසනු පණිස එවනලද්දේ වන්නේය"යි සිතා, "ගෙණෙව කුඩාවරුනි, මම පොහොසත්මි"යි ගෙන්වාගෙණ, කිහිරිදඬ අනින් අල්වාගෙණ, මේ අගය මේ මුල යයි දන, බොහෝදෙන සිත්ගන්නා පිණිස පැන්නළියක් ගෙන්වා, කිහිරිදඬ මැදින් හුලනුවකින් බැඳ අග අල්වාගෙණ කිහිරි දඬ දියපිට තබාලූසේක. මුල බරබැවින් පළමුකොට දියේ ගැලිණ. ඉක්බිත්තෙන් "ගසෙහිනම් මුල බරවේද, නොහොත් අග බරවේදැ"යි බොහෝදෙන විචාළිසේක. හැමදෙනම පණ්ඩිතයන් වහන්ස, මුල බරවේදැ"යි කිහ. 'එසේහෙයින් කිහිරිදඬෙහි පළමු කොට ගැලුණුඅත මුලය'යි මේ සලකුණෙන් අගත් මුලත් වදාළ සේක. ගම්වැස්සෝද "මේ මුලය මේ අගය"යි රජ්ජුරු ‑ න්ට කියා යවූහ. රජ්ජුරුවෝ සතුටුව "මේ අග මුල කවරෙක් දන්නේදැ"යි විචාරා "සිරිවඩ්ඪන සිටානන් පුතනුවෝ මහෞෂධ පණ්ඩිතයෝ ය"යි අසා සතුටුව, "කිමෙක්ද සේනකය, මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වමෝදැ"යි විචාළහ ‑ ඉවසුව මැනව දේවයන්වහන්ස, අනික් උපායකිනුත් විමසම්හ"යි නැවතුහ.

———o———

**නවවැනිව ගැණු ඉසකින් හා පිරිමි ඉසකින් විමසූ ප්‍රශ්නය කෙසේදයත්** ? ඉක්බිත්තෙන්·එක්දවසක් ගැණියකගේද, පිරිමියකුගේද හිස් දෙකක් ගෙන්වා "මේ ගැණු හිසය මේ පිරිමි හිස යයි දනිත්වයි, නොදන්නාහුනම් දහසක් දඩ දෙන්නාහුය"යි නැගෙණහිරි යවමැදුම් ගම්වැස්සන්ට යැවූහ. ගම්වැස්සෝ විභාග නොදන්නාහු හිස්දෙක ගෙණ, බෝසතානන්වහන්සේ විචාළහ. උන්වහන්සේ හිස් දෙක දකලාම "මේ ගැණු හිසය මේ පිරිමිහිස ය"යි දන්සේක. පිරිමි හිස මැස්ම වක්නොව ඉදිවියන්නේය. ගැණු හිසමැස්ම වක්වන්නේය. බෝසතානන්වහන්සේ මේ සල කුණෙන්, මේ ගැණු හිසය මේ පිරිමි හිසය"යි ගම්වැස්සන්ට වදාළසේක. ගම්වැස්සෝ රජ්ජුරුවන්ට ඉස්දෙක නෝරායවූහ. රජ්ජුරුවෝ විචාළ නියාවද සේනකපණ්ඩිතයන් වැලකූ නියාවද පෙර සේමැයි.

———o———

**දසවැනිවූ සර්පයන් දෙන්නාගෙන් විමසූ ප්‍රශ්නය කෙසේද යත්?** නැවත එක්දවසක් නයෙකු හා සැපින්නකු ගෙන්වාගෙණ "මේ සර්පයාය, මේ සැපින්නයයි දනිත්වයි, නොදනනාහුනම් දඬ

සක් දඬය"යි නැගෙණහිරි යවමැදුම් ගම්වැස්සන්ට යවූහ. ගම්වැස්සෝ නොදන්නාහු පඬිතයන්වහන්සේ විචාළහ. පඬිතයන්වහන්සේ දැකලාම දැනගත්සේක. සර්පයාගේ නඟුට මහත්වන්නේය. සැපින්තගේ නඟුට සිහින්වන්නේය. සර්පයාගේ හිස මහත්වන්නේය. සැපින්නගේ හිස දික්වන්නේය. සර්පයාගේ ඇස් වටවන්නේය. මහත්වන්නේය. සැපින්නගේ ඇස් දික්ව කුඩාවන්නේය. සර්පයාගේ පෙණය හාත්පසින් සම්පූර්ණව තිබෙන්නේය. සැපින්නගේ පෙණය එක දිසාවකින් සැහැප්පුවා සේ අඬව තිබෙන්නේය. මේ සලකුණෙන් "මේ සර්පයාය, මෝ සැපින්නය"යි වදාළසේක. සෙස්ස යටකියන ලද්දවූ ක්‍රමයයි.

---

**එකොළොස්වන කුකුළාගෙන් විමසූ ප්‍රශ්නය කෙසේදයත්?**

ඉක්බිත්තෙන් එක් දවසක් "නැගෙණහිරි යවමැදුම් ගම්වැස්සෝ සර්වාංගයෙන් ධවලවූ, පය අං ඇති ඉස මොල්ලියක් ඇති, කාලත්‍රය නොයික්මවා හඬන්නාවූ ගොනෙකු එවත්වයි, ඉදින් නෝවී නම් දහසක් දඬය"යි කියා යවූහ. ඒ ගම්වැස්සෝ ප්‍රශ්නයෙහි විභාග නොදන්නාහු පණ්ඩිතයන්වහන්සේ විචාළහ. පණ්ඩිතයන්වහන්සේ "රජ්ජුරුවෝ තොප අතින් හැළි කුකුළෙකු ගෙන්වති"යි වදාළසේක. "කුකුළාව නාහි පය පොරකටු ඇතිබැවින් පය අං ඇත්තේ නම, ඉස මල්ඇති බැවින් ඉස මොල්ලියක් ඇත්තේ නම, හ්‍රස්ව දීර්ඝ ප්ලුත යන තුන්කාලයට උච්චාරණ ශුඩකොට හඬ නගණහෙයින් කාලත්‍රය නොඉක්මවා හඬන්නේනම, එසේ හෙයින් මෙබඳු කුකුළෙකු යව"යි වදාළසේක. ගම්වැස්සෝ එබඳු කුකුළෙකු යවූහ.

---

**දොළොස්වැනිවූ මැණිකින් විමසූ ප්‍රශ්නය කෙසේදයත් ?**

ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් කුසරජ්ජුරුවන්ට දුන් මැණිකනෙම අටතැනකින් වක්වූයේය. ඒ අටවක් මැණිකෙහි ශක්‍රයන් ඇවුණූ පුරාතන හුය දිරාගොස් කැඩීගියේය. පරණ හුය හැරපියා අලුත් හුයක් අවුනාලන්ට කිසිකෙනෙක් නොපොහොසත්හ. එක් දවසක් "මේ මැණිකෙහි පරණ දිරාගිය හුය ඇරපියා අලුත් ලනුවක් ලව"යි කියා යවමැදුම්ගම ඇත්තන්ට වේදේහ රජ්ජුරුවෝ යවූහ. ගම්වැස්සෝ පරණ හුය අරින්ටත් අලුත් හුය ලන්ටත් නොහැක්කාහුය. තමන්ට නොපිළිවන්වූ වාහු * මහෞෂධ පණ්ඩිතයන්වහන්සේට කීවාහුය. "පඬිතයන්වහන්සේ තෙපි නොසිතව, මී ටිකක් ගෙන්වාගනුව"යි කියා ගෙන්වාගෙණ, මැණිකෙහි දෙකෙළවර සිදුරෙහි මී බින්දු ගල්වා පලස් හුයින් ලනු

---

* නෙවපූරාණං නීහරිතුං නනවංපෙසෙතුං සක්ඛිංසු අස කොනානා පන පංඩිතස්ස ආචික්ඛිංසු,

වක් අඹරා ලනු අග මියෙහි ගාලා, මදක් මැණිකේ සිදුරට වද්දලා, කුහුඹුවන් නික්මෙණ කුහුඹු බිලයක තබාලූ සේක. කුහුඹුවෝ මියෙහි ගඳින් බිලයෙන් නික්ම, මැණිකෙහි දිරා ගිය පරණ හුය කාගෙණ පලස්හු අග ඩැගෙණ යටින් අද නාහු, අනික් ඇලයෙන් පිටත්කොටපිහුය. පණ්ඩිතයන්වහන්සේ මැණිකෙහි ලනුව ඇවිණිගියබැව් දැනගෙණ "රජ්ජුරුවන්ට දෙව"යි කියා ගම්වැස්සන්ට මැණික දුන්සේක. ගම්වැස්සෝ රජ්ජුරුවන්ට යවූහ. රජ්ජුරුවෝ ලනුව ඇවුණූ උපාය අසා සතුටුවූහ.

—◦—

**තෙලෙස්වන විජායන ප්‍රශනය කෙසේදයත්?** එක් දවසක් වනාහි රජ්ජුරුවන්ගේ මගුල්ගොනු, උදු බොහෝ කොට කවා බඩ මහත්කොට හං සකස්කොට සර්වාංගයෙහි තෙල් ගල්වා * කසා නාවා නැගෙණහිරි යවමැදුම්ගම ඇත්තන්ට "නොපි නුවණැත්තෝල, මේ රජ්ජුරුවන්ගේ මගුල්ගොනාය, පිහිටි දරුගැබ ඇත්තේය, මොහු වදවා පියා වස්සා සහිතකොට එවව, එසේ නොඑව්වොත් දහසක් දඩය"යි යවූහ. ගම්වැස්සෝ "මේ ගොනු දරුවන් වදන්ට නොපිළිවන, කුමක්කරමෝද්දෝහෝ"යි පණ්ඩිතයන්වහන්සේ විචාළහ. උන්වහන්සේ 'සමාන පැණයකින් විසඳිය යුතුය"යි සලකා, රජ්ජුරුවන් හා සමග කියන්ට එක් බුහුටි පුරුෂයෙක් කැඳවූහ. ඉක්බිත්තෙන් මහබෝසතානන්වහන්සේ එව, පින්වත් පුරුෂය, තෝ තාගේ ඉසකේ පිටමැද හෙළාගෙණ නොයෙක් පරිද්දෙන් මහ විලාප හඬහඬා රජගෙයි වාසලට යා. සෙස්සවුන් විචාරණ ලදුයෙහි කිසිවක් නොකියා මහරජ්ජුරුවන් විසින් ගෙන්වාගෙණ හඬන කාරණා විචාරණලද්දෙහි 'දේවයන්වහන්ස, මපියානෝ වදගතනොහි අදට විලිපහරණෝ සද් දවසය, මට පිළිසරණවූව මැනව, වදන උපායෙක් වදාළ මැනව"යි කියා,-රජ්ජුරුවන් විසින් 'කිමෙක්ද නත්දෙඩයිද? මේ කාරණයෙක් නොවෙයි, පිරිමින් වදන්නාහු නැතැ'යි කී කල්හි දේවයන්වහන්ස, එසේවිනම් නැගෙණහිරි යවමැදුම් ගම්වැස්සෝ කෙසේ මගුල්ගොනා වදවද්ද'යි විචාරව"යි, වදාළසේක. ඒ පුරුෂයාත් මහබෝසතානන් වදාළ වචනය පිළිගෙණ, වදාළ පරිද්දෙන්ම කෙළේය. රජ්ජුරුවෝ "සමාන ප්‍රශනය කාවිසින් සිතනලද්දද"යි විචාරා, මහෞෂධ පණ්ඩිතයන් විසිනැයි අසා, සතුටුවූහ.

—◦—

**තුදුස්වැනිව පැසිබතින් විමසූ ප්‍රශනය කෙසේද යත්?** එක් දවසක් 'පණ්ඩිතයන් විමසම්හ'යි කියා, නැගෙණහිරි යවමැදුම්

* හළිඳුදියා නහාපෙනවා

ගම්වැස්සෝ අපට අටකාරණයකින් සමන්විතවූ පැසිබත් පිස එවත්වයි,—පැසිබත කියන්නේ මේ අටකාරණයයි—සාලිනුත් නොපිසුව මැනව, දියෙනුත් නොපිසුව මැනව, සැළියෙනුත් නොපිසුව මැනව, ගින්නෙනුත් නොපිසුව මැනව, දර උදුනලාත් නොපිසුව මැනව; මෙසේවූ පැසිබත ගැණිය අතත් නොඑව්ව මැනව, පිරිමියෙකු අතත් නොඑව්ව මැනව, මගෙකත් නොඑව්ව මැනව—මේ අටකාරණයෙන් යුක්ත පැසිබත නොඑව්ව හොත් දහසක් දඩය"යි කියායවූහ. ගම්වැස්සෝ ඒ කාරණය නොදන්නාහු පණ්ඩිතයන්විචාළහ. උන්වහන්සේ "නොසිනව"යි කියා, නොසාල් නම් සුන්සාල, නොදිය නම් පිනිදිය ගෙණ, නොසැළිය නම් අනික් බදනක්ගෙණ, නො උදුන නම් අලුත් කණු ගසා, නොගිනි නම් පියවිගිනි හැර දඬෙන් හෙළූ ගිනි ගෙණ, නොදරනම් පරඬලාගෙණ, පැසිබත පිසවා සැළිය කලා අස් ඔබා, නොගැණු නොපිරිමියෙකු නම් නපුංසකයෙකු ඉසතබාලා, නොමගින්නම් මාවත පිය හසරකින් රජ්ජුරුවන්ට යව"යි යවූසේක. රජ්ජුරුවෝ ප්‍රශනය කාවිසින් විසඳනා ලදද"යි විචාරා "මහෞෂධපණ්ඩිතයන් විසිනැ"යි අසා සතුටුවූහ.

—:—

**පසලොස්වන වැලියොතින් විමසූ ප්‍රශනය කෙසේද යත්?** එක් දවසක් පණ්ඩිතයන්වහන්සේ විමසනු පිණිස, යවමැදුම් ගම්වැස්සන්ට අස්නක් යවූහ. ඒ කෙසේවූ අස්නෙක්ද යත්;— රජ්ජුරුවෝ ඕවිල්ලෙහි කෙලෙනා කැමැත්තෝය, *පරණ වැලියොත කැඩිගියේය. එක් වැලියොතක් අඹරා එවත්වයි, නොඑවූ නම් දහසක් දඩය"යි කියායවූහ. ඒගම්වැස්සෝ අඹියනොදන පණ්ඩිතයන්වහන්සේ විචාළහ, † පණ්ඩිතයන්වහන්සේ "මේ පැණයත් සමානපැණයකින්ම විසඳිය යුතුය"යි සිතා, "ගම්වැස් සෙනි, නොසිතව"යි අස්වසා, කිමෙහි බිණීමෙහි දක්‍ෂවූ පුරුෂයන් දෙතුන්දෙනෙකු බණවා, "යව, ගොස් රජ්ජුරුවන්ට කියව; දේවයන්වහන්ස, ගම්වැස්සෝ වැලියොතෙහි සීන වේවයි දළ වේවයි පමණ නොදන්නාහ. පරණ වැලියොතින් වියතක්පමණ රැණමාල්ලක් එව්ව මැනව, ඒ වැලිරැණ පොල්ල බලා, ඊ සීන දළ පමණින් වැලියොතක් අඹරන්නාහයි කියව, ඉදින් තොපට රජ්ජුරුවෝ අපගේ ගෙයිවැලියොතක්නම් කිසිකලෙකත් නොවූවිරියයි කියත්නම්, එසේකී රජ්ජුරුවන්ට, වැලි දේවයන්වහන්ස, ඉදින් එසේවිනම් යවමැදුම්ගම වැස්සෝ කෙසේ වැලියොතක් අඹරා එවද්දැයි කියාලව"යි කියා යවූසේක. ඒ පුරුෂයෝ මහ බෝසතානන්වහන්සේ වදාළ ලෙසම කළහ. රජ්ජුරුවෝද ඒ අසා "මේ සමාන පැණයකාවිසින් සිතනලදද"යි විචාරා "මහෞෂධපණ්ඩිතයන්වහන්සේ විසිනැ"යි අසා, සතුටුවූහ.

* රාජදෙලායකීළිතුකාමො. † අජානිත්‍වාපංඩිතංපුච්ඡිංසු.

**සොළොස්වැනිවූ පොකුණකින් විමසූ තටාක ප්‍රශ්නය කෙසේදයත්?** එක් දවසක් "රජ්ජුරුවෝ දියකෙළිනා කැමැත්තෝය, රක්ත, නීල, ශ්වේතාදි පස්පියුමෙන් ගැවසීගත් පොකුණක් එවත්වයි, එසේ නොඑවුනම් දහසක් දඬය'යි ගම්වැස්සන්ට කියා යවූහ. ඒ අර්ථය නොදැන පණ්ඩිතයන්වහන්සේට දැන්වූහ. උන්වහන්සේ "මෙයින් සමාන ප්‍රශ්නයකින් විසඳිය හැක්කැ"යි සිතා, "මුඛරිවූ මිනිසුන් කීපදෙනෙකුන් කැඳව"යි කියා ගෙණාකල්හි ඒ පුරුෂයන්ට මෙසේ කිවුය. "තොපි දියකෙළි, ඇස ඔලිඳැටසේ රත්කොට, නෙත් ඉසකේ ඇතිව, අඳනාලද තෙත් පිළි ඇතිව මඩවැකුණු ශරීර ඇතිව, වියදඬු කැවිටි බහන් කැටමුගුරු ගත් අත් ඇතිව, රජගෙයි වහසලට ගොස්, වාසලෙහි සිටිබැව් රජ්ජුරුවන්ට කියා යවා, රජ්ජුරුවන් විසින් 'එන්නේය'යි කියනලද අවකාශ ඇතිව රජගෙට වැද, 'දේවයන්වහන්ස, නුඹවහන්සේවිසින් එනාහි, යවමැදුම් "ගම්වැස්සෝ පොකුණක් එවත්ව'යි කියා යවනලද හෙයින් අපි නුඹවහන්සේට දියකෙළනට සුදුසුවූ පස්පියුමෙන් සැදුණු පොකුණක් ඇරගෙණ ආම්හ. ඒ පොකුණ, තමා වෙනෙහි වැසගත් බැවින් නුවර දැක අට්ටාල පවුරු පදනම් අගල හා වාසල් ආදිය බලා වෙව්ලා, භයින් බහන් කඩාගණ ගොස් වලට ගියාය. අපි කැට මුගුරු ආදීන් මරාද * නවතාගත නුහුනම්හ. නුඹවහන්සේ විසින් ගියදවස වලින් ලද පොකුණක් එව්ව මැනව, ඒ පොකුණ හා එක්කොට යොදා ගෙණෙම්හයි කියා, රජ්ජුරුවන් විසින් කිසිකලෙකත් මාවිසින් පොකුණක් නොගෙන්වනලද විරීය. කිසිවක්හට මා විසින් එක්කොට යොදා ගෙණෙන පිණිස පොකුණක් නොඑවනලද විරීය'යි කී කල්හි 'ඉදින් දේවයන්වහන්ස, එසේවීනම් නැගෙණහිරි යවමැදුම් ගම්වැස්සෝ කෙසේ පොකුණක් නුඹවහන්සේට එවද්දැ'යි කියව"යි කියා යවූසේක. උයිත් බෝසතානන්වහන්සේ වදාළ ලෙසම කළහ. රජ්ජුරුවෝ ඒ මිනිසුන් අතින් 'කවුරුන් විසින් විමසනා ලද්දැ'යි විචාරා 'පණ්ඩිතයන් විසිනැ'යි අසා, සතුටුවූහ.

---

**සතළොස් වැනිවූ උයනින් විමසූ ප්‍රශ්නය කෙසේදයත්?** නැවත එක් දවසක් "අපි උයන්කෙළි කෙළනා කැමැත්තම්හ. අපගේ උයන පරණව ගියේය, යවමැදුම් ගම්වැස්සෝ චම්පකාශෝක වකුල තිලකාදීන් සුපුෂ්පිත තරුවරාකීර්ණ අළුත් උයනක් එවත්ව"යි කියා යවූහ. පණ්ඩිතයන්වහන්සේ "මෙයින් සමාන පැණයකින් විසඳිය යුතුය"යි ගම්වැස්සන් අස්වසා, මුඛරි මිනිසුන් කීපදෙනෙකුන් යවා පෙර පොකුණට කියා යවූ පරිද්දෙන්ම කියා යවූසේක. එදවසුත් රජ්ජුරුවෝ සතුටුව සේනක

* ලෙඩවූ දණ්ඩාදිගිපොධෙනවාපි.

පණ්ඩිතයන්ට කියන්නාහු "පණ්ඩිතයන් ගෙන්වාගනුමෝද්ද"යි විචාළහ. එතෙමේ ලාභ මාත්සර්‍ය්‍ය නිසා "මෙපමණකින්ම පණ්ඩිතනම් නොවෙති, ඈම්මුණ මැනව"යි කීය.

ඒ සේනකයාගේ බස් අසා රජ්ජුරුවෝ "මහෞෂධ පණ්ඩිතයෝ තුමූ වැලිකෙළියෙහ්පටන් පසිදි මාංස ප්‍රශනය ආදිවූ ප්‍රශන සතළොසින්ම ජයගත්හ. මෙබඳු උන්ගේ දූඩ්වූ පැණ විසඳීමෙහිද අප විසින් යවන ලද්දුවූ ප්‍රශනවලට සමානවූ ප්‍රශන චින්තනයෙහිද උන්ගේ ප්‍රශන විසර්ජනය බුදුකෙනෙකුන්වහන්සේගේ ප්‍රශන විසර්ජනයක් හා සමානය, සේනකයා මෙබඳුවූ පණ්ඩියන් ගෙන්විය නොදෙයි, සේනකයාගෙන් මට කාරිය කිම්ද?යි, ඒ මහෞෂධ පණ්ඩියන් ගෙණෙමි"යි මහත්වූ හස්ත්‍යශ්වාදි පරිවාරයෙන් යුක්තව, පණ්ඩිතයන් වසන නැගෙණහිර යවමැදුම්ගමට යන්ට නික්මුණාහ. මඟුලසු නැගීගෙණ යන්නාවූ රජ්ජුරුවන්ගේ මඟුලසුගේ පය පැකිලි වළකවැටී බිඳිගියේය. රජ්ජුරුවෝ එතනසිට නැවත නුවරටවන්නාහ. ඉක්බිත්තෙන් අතරමගසිට ආ වේදේහරජ්ජුරුවන්සමීපයට සේනක පණ්ඩිතයෝ එළඹ, "දේවයන්වහන්ස, මහෞෂධ පණ්ඩිතයන් ගෙණෙන්ට යවමැදුම්ගමට වැඩිසේක්වේද්ද"යි විචාළහ. "එසේය පණ්ඩිතයෙනි"යි රජ්ජුරුවෝ කීහ. "දේවයන්වහන්ස, මා අවැඩකොට දත්සේක. තවත් ඈම්මුණ මැනව"යි කියද්දීත් ඉතා ඉක්මන්වගොස් ආදිමයන ගමනේ මඟුලසුගේ පය බිඳිගියේවේද්ද"යි කීහ. රජ්ජුරුවෝ සේනක පණ්ඩිතයන් කී බස් අසා, තුෂ්ණීම්භූතව, නැවත එක්දවසක් සේනකයන් හා සමග "සේනකපණ්ඩිතයෙනි, මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වමෝද්ද"යි විචාළහ. එසේවිනුම් දේවයන්වහන්ස, නුඹවහන්සේ නොගොස්, 'පඬිතයෙනි නොපගේ සමීපයට එන්නාවූ අපගේ මඟුලසුගේ පය බිඳීගියේය. අශුචිතරයෙකු හෝ ශ්‍රෙෂ්ඨතරයෙකු හෝ එව"යි මෙහෙවර කරන්නෙකු යව්ව මැනව, ඉදින් අශුචතරයෙකු එවත්නම් තුමූම එන්නාහ. ශ්‍රෙෂ්ඨතරයෙකු එවත්නම් පියානන් එවන්නාහ. මේ තෙමේ අපට ප්‍රශනයෙක් වන්නේමය"යි කීහ. රජ්ජුරුවෝ "යහපතැ"යි ගිවිස, සේනකයන් කීලෙසම කියා, මෙහෙවර කරන්නෙකු යැවූහ.

පඬිතයන්වහන්සේ මෙහෙවර කරන්නවුන්ගේ බස් අසා, රජ්ජුරුවෝ මාද මපියානන්වහන්සේද දක්නා කැමැත්තෝය"යි සිතා පියානන්වහන්සේ සමීපයට ගොස් වැඳලා "පියානන්වහන්ස, රජ්ජුරුවෝ නුඹවහන්සේද මාද දක්නා කැමැත්තෝය, නුඹවහන්සේ පළමුකොට, සිටුවරුන් දහසක් පිරිවරා වැඩිය මැනව, වඩනාසේක්ද සිසනින් නොගොස්, අළුත් හෙළ ඝිතෙල් පිරුණු සඳුන්කරඬුවක් හැරගෙණ වැඩිය මැනව, රජ්ජුරුවෝ නුඹවහන්සේ හා සමග පිළිසඳර කථාකොට සුදුසු අස්නක්බලා

හිඳුව"යි කියති, නුඹවහන්සේ එබඳු අස්නක් පරීක්‍ෂාකොට හුන මැනව, නුඹවහන්සේ කථාකොට කොට හුන්වෙලෙහි මම එම්, රජ්ජුරුවෝ මාහා සමග පිළිසඳර කථාකොට, පණ්ඩිතයෙනි සුදුසු අස්නක් බලා හිඳුව'යි කියති. ඉක්බිත්තෙන් මම නුඹවහන්සේගේ මූණ බලමි, ඒ සලකුණෙන් හුනස්නෙන් නැඟී "පුත මහෞෂධ පණ්ඩිතයෙනි මේ අස්නේ හිඳුවයි වදාළමැනව. එසේකල්හි එක් පැණයෙක් අපට වන්නේය"යි වදාළසේක.

සිටානෝ යහපතැයි ගිවිස, පුතනුවන්ද කී යැටියේම ගොස්, තමන් වාසල සිටිබව රජ්ජුරුවන්ට කියා යවා, එන්නේයයි කියා යවූකල්හි රජගෙට වැද රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටියහ; රජ්ජුරුවෝ සිටානන් හා සමග කථාකොට, "සිටානෙනි, තොප පුතනුවෝ මහෞෂධ පණ්ඩිතයෝ කොයිද"යි විචාළසේක. පස්සෙහි එති දේවයන්වහන්සැයි" කීහ. රජ්ජුරුවෝ එති යනු අසා සතුටු සිත් ඇතිව "තොපට සුදුසු අස්නක් බලා හිඳුව"යි කීහ. සිටානෝ තමන්ට සුදුසු අස්නක් බලා, එකත්පස්ව හුන්නාහ. මහබෝසතානන්වහන්සේද සර්වාලඞ්කාරයෙන් සැරහුනුසේක් කුමාරවරුන් දහස විසින් පිරිවරණලදුව සරහනලද උතුම් රථයක හිඳ නුවරට වදනාසේක්, අගල පිට තණ කන එක් කොටළුවෙකු දැක, ශක්තිසම්පන්න පුරුෂයන්ට "මේ කොටළුවා ලුහුබඳවාගෙණ යම් පරිද්දකින් ශබ්ද නොකෙරේද එපරිද්දෙන්ම ඔහුගේ මුඛය බන්ධනයකොට එක් පරක්කුවෙකින් කර තබා නොපෙන්නා ගෙණඑව"යි වදාළසේක. ඒ මානවකයෝ බොධිසත්වයන් වදාළ ලෙසම කළහ. බෝධිසත්වයන්වහන්සේ මහත් පිරිසින් යුක්තව ශක්‍රදේවේන්‍ද්‍ර ලීලායෙන් නුවරට වන්සේක.

බොහෝදෙන "සිරිවඩ්ඩන සිටානන් පුතනුවෝ මහෞෂධ පණ්ඩිතයෝනම් මූල, උපන්නාහු බෙහෙත් ගුළියක් අතින් ගෙණ උපන්නෝ මූල, විමසූ මෙතෙක් ප්‍රශ්නයන්ගේ අර්ථවිභාගය දක්නාලද්දේ හෙවත් පැණ විසඳුවෝ මූල"යි මහබෝසතානන්වහන්සේට ස්තුතිකරනනාහු තෘප්තියට නොපැමිණෙන්නාහ. පණ්ඩිතයන්වහන්සේ රජගෙයි වාසලට ගොස්, තමන්වහන්සේ ආපවන් දෙරටුපාලයා අත කියා යැවූසේක. රජ්ජුරුවෝ ඇසූ පමණින්ම තුටුපහටුව, "මපුතනුවෝ මහෞෂධ පණ්ඩිතයෝ වහා එත්ව"යි කීහ. බෝසතානෝ කුමරුන් දහස පිරිවරා පහයට නැඟ රජුවැඳ එකත්පසෙක සිටිසේක. රජ්ජුරුවෝ ඔහු දැක සොම්නසට පැමිණ මිහිරි කථාකොට පණ්ඩිතයෙනි, සුදුසු අස්නක් බලා හිඳුව"යි කීහ; පණ්ඩිතයන්වහන්සේ පියානන්ද මූණ බැලූසේක. ඉක්බිත්තෙන් උන්වහන්සේගේ පියානන් බැලූ සලකුණෙන් අස්නෙන් නැඟී පණ්ඩිතයෙනි, මේ අස්නේ හිඳුවයි කීහ. පණ්ඩිතයන්වහන්සේ ඒ අසම්න් පියානන් හුන් අස්නෙහි වැඩඋන්සේක.

පියානන් හස්තෙන් නගාපියා ඒ අස්නෙහි උන්නාවූ පණ්ඩිතයන් දැකලා, සේනක පුක්කුස කාවින්ද දේවින්ද යන පණ්ඩිතවරු සතරදෙනද සෙසු නුවණැත්තාහුද, අත්ලෙන් අත්ල ගසා මහත්කොට සිනාසී, "මේ නුවණ නැත්තහු නුවණැතැයි කියති, ඒතෙම පියානන් අස්නෙන් නගාපියා, තෙමේ ඒ අස්නෙහි උන්නේය, මොහු නුවණැතැයි කියන්ට යුක්ත නොවන්නේය"යි වෙහෙසූය; රජ්ජුරුවෝද දුම්මුඛවූහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණන්වහන්සේ දුම්මුඛව උන් රජ්ජුරුවන්වහන්සේට "කිමෙක්ද දේවයන්වහන්ස, කණස්සලු සේක්දැ"යි විචාළසේක. "එසේය පණ්ඩිතයෙනි කණස්සල්ලෙමි, නොපගේ ස්වරූප ඇසීමෙන් සිත්ගත, දැක මසිත් නොගතැ"යි කීහ. මාගේ ස්වරූප ඇසීමෙන් සිත්ගත්තේත් දැක්මෙන් සිත් නොගත්තේත් කුමක්නිසාදැ"යි විචාළසේක. පියානන් අස්නෙන් නගාහුන්සෙයිනැ'යි කීහ. "කිමෙක්ද දේවයන් වහන්ස, නුඹවහන්සේ ඇමතැත්හිම පුතුන්ට වඩා පියෝ උතුම කියන්සේක්දැ"යි විචාළසේක. රජ්ජුරුවෝ "එසේය පණ්ඩිතයෙනි"කීහ. ඉක්බිත්තෙන් මහබෝසතාණෝ රජ්ජුරුවන්ට "දේවයන්වහන්ස, නුඹවහන්සේ විසින් අපට අශ්වතරයෙකු හෝ ශ්‍රෙෂ්ඨතරයෙකු හෝ එවන්නේය'යි අසුන් යවහා ලද්දේය"යි කියා, උන් අස්නෙන් නැගී කොටළුවාගෙණ මානවකයන් මුණබලා 'නොපවිසින් ගත්තාලද කොටළුවා ගෙණෙව'යි ගෙන්වාගෙණ රජ්ජුරුවන්ගේ පාමුල හොවාලා "දේවයන්වහන්ස, මේ කොටළුවා කෙතෙක් අගිදැ"යි විචාළසේක. රජ්ජුරුවෝ "ඉදින් උපකාර ඇත්තේවිනම් අටමස්සක් අගනේය"යි කීහ. "මූනිසා සෛන්ධවකුලෙහි වෙළඹ බඩ උපන් අජානීය අශ්වයා කෙතෙක් අගිදැ"යි විචාළසේක. "පඬිතයෙනි, අගය නැතැ"යි කීහ. "දේවයන්වහන්ස, කුමක් හෙයින් එසේකියනසේක්ද? නුඹවහන්සේ විසින් දූන් ඇමතැත්හිම පුතුන්ට වඩා පියෝ උත්තමය'යි කියනලද වේද, ඉදින් ඒ සැබැවිනම් නුඹවහන්සේගේ වාදයෙහි අජානීය අශ්වයාට වඩා කොටළුවා උතුම්වන්නේය. කිංමක්ද දේවයන්වහන්ස, නුඹවහන්සේගේ පඬිතවරු මෙපමණකුත් දැනගන්ට අසමර්ථව, අත්ලෙන් අත්ලගසා සෙන්නාහුද? නුඹවහන්සේගේ පණ්ඩිතවරුන්ගේ නුවණ විශෙෂය ආශ්චර්‍ය්‍යය. නුඹවහන්සේ කොයින් මුන් අත්පත්ගා ලත්සේක්දැ"යි, පණ්ඩිතවරුන් සතරදෙනාටම පරිභව බැණ, රජ්ජුරුවන්ට ගද්‍ය ප්‍රශනයෙනි එම කාරණා ගාථාවකින් කියා, "දේවයන්වහන්ස, පුතනුවන්ටවඩා පියානෝ උතුම් නම් මපියානන් නුඹවහන්සේට වැඩපසස්නා පිණිස ගතමැනව,

ඉදින් පියන්ට වඩා පුත්‍රයෝ උත්තමයෝනම්, මා තුඹවහන්සේ සමීපයෙහි රඳවාගත මැනව”යි වදාළසේක. රජ්ජුරුවෝ සොම්නස්වූහ. සියලු රාජපර්ෂත් “පණ්ඩිතයන් විසින් ප්‍රශනය මනාකොට කියනලද්දැ”යි ඔල්වරහඬ ගසමින් සාධුකාර ශබ්ද පැවැත්වූහ. අසුරුසන්ද පිළිදහස්ගණන් ඉස නැටවීම්ද පැවැත්වූහ. සේනකාදි පණ්ඩිතවරු සතරදෙන දුම්මුඛවූහ.

මව්පියන් ගුණ දන්නට බෝධිසත්වයන් වහන්සේ හා සමාන කෙනෙක් නැත. වැලි මූන්වහන්සේ කුමක්නිසා පියානන්වහන්සේ අස්නෙන් නගා ඒ අස්නෙහි වැඩඋන් සේක්දයත් පියානන් දැට අවමානක් පිණිස නොවෙයි, රජ්ජුරුවන් විසින් අශ්වතරයෙකු හෝ එවන්නේය ශ්‍රෙෂ්ඨතරයෙකු හෝ එවන්නේය”යි අසුන් යවනලද හෙයින් ඒ පැණය විසඳන පිණිසත් තමන්වහන්සේත් නුවණැති බව අඟවන පිණිසත් සේනකාදි පණ්ඩිතවරුන් සතරදෙනාගේ නුවණින් බැබලීමත් නැතිකරණ පිණිසත්ය. රජ්ජුරුවෝ ගූඪ ප්‍රශනයාගේ විසර්ජනයෙහි සතුටුව සුවඳපැන් පිරූ රන් කෙණ්ඩිකාව අතින් ගෙණ “නැගෙණහිරි යවමැදුම් ගම පමුණුකොට අනුභවකරව”යි සිටානන් අත පැන්වත්කොට “සෙසු දසක් සිටුවරු සිරිවඩනා සිටානන්ම සම්මත වෙත්ව”යි කියා, මහබෝසතානන්ගේ මැනියන්දැට සිරිකන්’ තෝඩු නැලිවැල් පට්ටකාර පාසලඹ පාදජාලාදිවූ සියලු ස්ත්‍රී ආභරණ යවා, කොටළුපැණයෙහි පහන්ව, මහබෝසතානන්වහන්සේ දරුකොට වඩාගන්නා පිණිස මා සිටානන්ට “සිටානෙනි මහෞෂධ පණ්ඩිතයන් මට දරුකොට දෙව”යි කීහ.

සිටානෝ “දේවයන්වහන්ස දරුවෝ නවම ළදරුවෝය. අද දක්වාත් දරුවන් තුඩ කිරිසුවඳ අමයි, වැඩීගත් කල තුඹවහන්සේ සමීපයෙහි වසන්නේය”යි කීහ. “සිටානෙනි මෙවක් පටන් පණ්ඩිතයන් කෙරෙහි ආලය හරුව, මූ අද පටන් මපුතනුවෝය, මම මාගේ පුතනුවන් රක්නට පොහොසත්මි නෙපි යව”යි සිටානන් ගමට යන්ට සමුදුන්හ. සිටානෝ රජ්ජුරුවන් වැඳ පුතනුවන් මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ සිපගෙණ ළෙහි හොවාගෙණ ඉස සිඹ පුතනුවන්ට අවවාද දුන්හ. උන්වහන්සේ සිටානන් වැඳ, “පියානන්වහන්ස නොසිතුව මැනවැ”යි කියා පියානන් යවූසේක. රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ “ඇතුළතදී කව්ද? නොහොත් පිටතදී කව්දැ”යි විචාළහ. උන්වහන්සේ “මාගේ පරිවාර බොහෝය. මා විසින් පිටතදී බත් අනුභවකිරීම සුදුසුය”යි සිතා “පිටතදී අනුභව කෙරෙමි”වදාළසේක. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ පණ්ඩිතයන්වහන්සේට සුදුසු

ගෙයක්දී කුමාරවරුන් දහස ආදිකොට සියලු පරිවාරයට වියදම් දෙවා සියලු උපකරණ ගෙහිලා දෙවූහ. පණ්ඩිතයන්වහන්සේ එතැන් පටන් කොට රජ්ජුරුවන් සමීපයෙහි අනුශාසනා කෙරෙමින් සිටිසේක.

රජ්ජුරුවෝ පණ්ඩිතයන්වහන්සේ විමසනු කැමතිවූහ. එසේ කල්හි නුවර දකුණු වාසලට නුදුරුවූ තන්හි පොකුණුතෙර එක් තල්ගසක උඩ කවුඩුකැදැල්ලෙක මිණිරුවනෙක් වූයේය. ඒ මැණිකෙහි ඡායාව පොකුණෙහි පෙණෙන්නේය. "පොකුණෙහි මැණිකැ"යි රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ සේනකයන් කැඳවා "පොකුණෙහි මිණිරුවනෙක් පෙණේල, ඒ මැණික කෙසේ ගනුමෝද්ද"යි විචාරා සේනකයන් විසින් පැන් ඉසසවාපියා ගන්නාබව සුදුසුය"යි කී කල්හි "එසේවීනම් එලෙසම කරව"යි සේනකයන්ට භාරකළහ. සේනකයෝත් බොහෝ මිනිසුන් රැස් රවා පොකුණෙහි දියත් මඩත් අරවා බිමකැණ මැණික නුදුටුවාහ. නැවත පොකුණෙහි දිය පිරීගිය කල්හි මැණිකෙහි ඡායාව පෙණෙන්නේය. සේනකයෝ දියත් මඩත් අරවා බිමත් කණවා මැණික නුදුටුවාහුය.

ඉක්බින්නෙත් රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ කැඳවා "පොකුණෙහි මැණිකෙක් පෙණෙන්නේය. සේනකයෝ දියත් මඩත් අරවා බිම බිඳ මැණික නුදුටුවාහ. පොකුණෙහි දිය පිරීගියකල නැවත පෙණෙයි. මෙය ගන්ට පොහොසතුද්ද"යි විචාළසේක. උන්වහන්සේ 'දේවයන්වහන්ස ඒ බැරිනොවෙයි වැඩියමැනව. නුඹවහන්සේට මැණික පාමි"වදාළසේක. රජ්ජුරුවෝ "මැණික පාමි"යි කී බසින් සතුටුව "අද පණ්ඩිතයන්ගේ නුවණෙහි බලදකුම්හ"යි බොහෝදෙනා විසින් පිරිවරණලදුව පොකුණුතෙර සිට මැණික බලනසේක් "මේ මැණික පොකුණෙහිනොවෙයි, මේ තල්ගස උඩවිය යුතුය"යි දැන "දේවයන්වහන්ස පොකුණෙහි මැණික නැතැ"යි කියා "පෙණෙන්නේ මැණික නොවේද්ද"යි කී කල්හි පැන් තළියක් ගෙන්වා "බැලුව මැනව දේවයන්වහන්ස මේ මැණික පොකුණෙහි මතු පෙණෙන්නේ නොවෙයි, තළියෙහිත් පෙණෙන්නේය"යි කියා රජ්ජුරුවන් විසින් "පණ්ඩිතයෙනි මැණික කොයි වියයුතුද්ද"යි කීකල්හි "දේවයන්වහන්ස පොකුණෙහිත් තළියෙහිත් ඡායාවම පෙණෙන්නේය. මැණික පොකුණෙහි නොවෙයි, මැණික වනාහී මේ තල්ගස උඩ කවුඩු කැදැල්ලේය. මිනිසෙකු නංවා බාවාගන්න මැනව'යි වදාළසේක. රජ්ජුරුවෝ බෝධිසත්වයන්වහන්සේ වදාළ ලෙසම මිනිසෙකු නංවා මැණික බැවූහ. පණ්ඩිතයන්වහන්සේ ඒ මැණික තමන් අතට

ඇරගෙණ රජ්ජුරුවන් අත තුබූසේක. බොහෝදෙන පණ්ඩිතයන්වහන්සේට සාධුකාරදී සේනකපණ්ඩිතයන්ට බණන්නාහු "මැණික තල්ගසළඹ තිබෑද්දී සේනකයා දුන්නක් දමාගිය එකක්හු කලයෙහි අනගානාසේ ශක්තිමත් පුරුෂයන් ලවා පොකුණෙම බිඳවීය. නුවණැති වනොත් මහෞෂධ පණ්ඩිතයන්සේ වියයුතුය"යි මහබෝසතානන්වහන්සේට සතුති කළහ. රජ්ජුරුවෝ බෝධිසත්වයන්වහන්සේට සතුටුව තමන් කර පැළඳි රන් ලක්‍ෂයක් පුස්නා මුත්හරයදී කුමාරවරුන් දහසට මුතුපට දුන්නාහ. "රාජසේවයට එනවිට මේ පැළඳගෙණ එන්නේය"යි මහබෝසතානන්වහන්සේටද කුමාරවරුන් දහසටද සමමතකළහ.— මාංස ප්‍රශ්නය ආදිවූ පැණ දසනවය නිමි.

---

නැවත එක්දවසක් රජ්ජුරුවෝ පණ්ඩිතයන් හා සමග උයනට ගියාහ. එදවස් එක් බොහොඩෙක් තොරණ අග වසන්නේයි. ඒ තෙම රජ්ජුරුවන් දැක තොරණ අගින්බැස බිම වැදහොත්තේය. රජ්ජුරුවෝ ඒ බොහොඩාගේ ක්‍රියාව බලා "මහෞෂධ පණ්ඩිතයෙනි මේ බොහොඩා කුමක්කෙරේදැ"යි විචාළහ. 'දේවයන්වහන්ස නුඹවහන්සේ සේවය කරන්නේය"යි වදාළසේක. රජ්ජුරුවෝ "ඉදින් එසේවීනම් අපට කරණ සේවය සිස්නොවෙයි. ඕහට වස්තුවක් දෙව"යි කීහ. බෝසතානන්වහන්සේ "දේවයන්වහන්ස ඕහට වස්තුවෙන් ප්‍රයෝජන නැත. කෑයුතු දෙයක් ඇත්නම් පමණය"යි වදාළසේක. මේ තෙමේ කුමක් කන්නේදැ"යි රජ්ජුරුවෝ කීහ. "දේවයන්වහන්ස මස් අනුභවකරන්නේය"යි වදාළසේක. "කෙතෙක් දෙය ලැබියුතුදැ"යි විචාළහ. "දේවයන්වහන්ස වියටසමාරක් පමණ රත්රන් පුස්නා මසැ"යි වදාළසේක. රජ්ජුරුවෝ එක් පුරුෂයෙකුට "රජ්ජුරුවන් දෙන දෙය නම් වියට සමාරක් පමණ නුසුදුසුය"යි කියා මෝහට රන් දෙවියට සමාරක් අගනා මස් නිබඳව ගෙණහැරදෙව"යි කියා නියෝගකළහ. ඒ පුරුෂයාත් 'යහපතැ'යි කියා එතැන්පටන් කොට රජ්ජුරුවන් විධානකළ ලෙසටම මස් ගෙණහැර බොහොඩාට දෙන්නේය.

ඒ පුරුෂයා එක් දවසක් උපොසථ දිනයෙහි රාජසමමතගෙයින් පණිවා කළවුන් නැතිකල්හි නුවර මුළුල්ලෙහි මස් සොයා නොලැබ, එම දෙවියට සමාරක් පමණ රන් මැදින් විද අවුණා බොහොඩාගේ කරේ බැන්දේය. ඉක්බිත්තෙන් ඒ බොහොඩාට රත්රන් දෙවියට සමාර නිසා මානයෙක් උපන්නේය. එදවස් රජ්ජුරුවෝ නැවත උයනට ගියහ. ඒ බොහොඩතෙමේ රජ්ජුරුවන් එන්නවුන් දැක, වස්තුවනිසා උපන් මානය කරණකොටගෙණ

"වෛදේහයෙනි තෙපිම නොව මහත් වස්තු ඇත්තෝය. මමත් වස්තු ඇත්තෙමි"රජ්ජුරුවන් හා සමග තමා සමකරන්නේ තොරණඅගින් නොබැස තොරණ අගම හිඳ හිස සලමින් වැදහොත්තේය. රජ්ජුරුවෝ ඔහුගේ ක්‍රියාවදැක මහෞෂධ පණ්ඩිතයෙනි මේ තෙමේ පෙර දිටු පරිද්දෙන් අද නොබස්නේය. කවර කාරණයකින් ඒ තද මානය ඇතිවීදැ"යි ගාථාවකින් විචාළහ. පණ්ඩිතයන්වහන්සේ "පොහෝදවස් පණිවා නොකිරීම නිමිත්තකොටගෙණ මස් නොලබන්නාවූ රාජපුරුෂයා විසින් තමා කරබැඳි රන්රන් දෙවියට සමීර නිසා උපදනා මානය ඔහුට වියයුතුය"යි දැන, එම කාරණය ගාථාවකින් කියනසේක් "නොලත්විරූ අභිමාෂක සම්මතවූ වස්තුවක් ලදින් මේ තෙමේ මියුලූනුවර ගේකොට ඇත්තාවූ හෝ, නොහොත් දාන ප්‍රියවචන අර්ථචර්‍ය්‍යා සමානාත්මතා සංඛ්‍යාත සතර සංග්‍රහ වස්තුවෙන් ජනයා සිත් ගන්නාවූ වේදේහරජ, නොපි තොප පමණට වස්තු ඇත්තාහ. මමත් මා පමණට වස්තු ඇත්තෙමි. එසේහෙයින් තොපට මා අඩු කිමෙක්දැ"යි ඉක්ම සිතන්නේය. හෙළාදැක්කේය"යි මේ කකණ්ටක ප්‍රශ්නය විසඳ වදාළසේක. රජ්ජුරුවෝ කටුසු බොහොඩාට මස්ලන්ට නිය මකළ පුරුෂයා ගෙන්වා 'පණ්ඩිතයන් කීවා සැබෑදැ'යි විචාළහ. ඒවූ පරිද්දෙන්ම කීයේය. රජ්ජුරුවෝ "කිසිකෙනෙකුන් නොවිචාරම සියල්ල බුදුකෙනෙකුන්වහන්සේ විසින් දත් අදහසක් මෙන් පණ්ඩිතයන් විසින් බොහොඩාගේ අදහස දන්නාලදැ"යි වඩාලා පැහැද පණ්ඩිතයන්වහන්සේට සතර වාසලින් නිමන සුන්වත් අය දුන්හ. බොහොඩාට වනාහි රජ්ජුරුවෝ කිපී තමන් තුබූ වෘත්තිය අරවන්ට වන්හ. පණ්ඩිතයන්වහන්සේ වනාහි "තබාලූ වෘත්තිය හරවාපිම සුදුසු නොවන්නේය"යි වැලකූ සේකි.—කකණ්ටක ප්‍රශ්නය නිමි.

---

ඉක්බිත්තෙන් මියුලූනුවර වැසි පිංගුත්තරනම් ලදරුවෙක් තක්සලානුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි ශිල්ප උගන්නේ වහාම උගත. ඒ තෙමේ උගත් ශිල්ප වනපොත්දී "මම සමුගනිමි" ආචාරීන්ට කීය. ඒ ආචාරීන්ගේ කුලයෙහි වනාහි 'ඉදින් වැඩිවිය පැමිණි දියනිකෙනෙක් ඇත්නම් වැඩිමාලූ අත වැස්සානන්ට දියයුත්තාහ'යි පැවත එන වතෙක් ඇත. ඒ ආචාරීන්ගේ දෙවඟනක්හා සමානවූ විශිෂ්ට රූ ඇති එක් දියනිකෙනෙක් ඇත්තාහ. ඉක්බිත්තෙන් "ඒ දියනියන් පුත තොපට දෙමි උන් හැරගෙණ යව"යි ආචාරී කීහ. මානවකයා වනාහි පින් නැත්තේය කාලකණ්ණීය, කුමාරිකාතොමෝ මහ පින් ඇත්තීය. ඕහට ඒ කුමාරිකාව දැක සිත නොඇළුණේය, ඒ මානවකයා

කුමාරිකා නුරුස්නේම "ආචාරීන්ගේ බස මරුත්තු නොකරෙමි" කියා ඉවසිය, බමුණානෝ මානවකයාට තමන්ගේ දියනියන් දුන්නාහ. ඒ තෙමේ රාත්‍රිභාගයෙහි සකස්කොට අතුරණලද ශ්‍රීයහනෙහි සැතපින. කුමාරිකා අවුත් හැඳට නැගෙන්නාහාම, තතනමින් ඈඳින් බැස බිමහෙව වැදහොත්තේය. ඒ කුමාරිකාද හැඳින් බැස ඒ මානවකයා සමීපයට ගියාය. එතනින් නැගීසිට නැවත හැඳට පැනනැංගේය. නැවත ඒ කුමාරිකාද හැඳට නැංගාය. ඒතෙම නැවත ඇඳින් බටුයේය, කාලකණ්ණියා නම් ශ්‍රීකාන්තාවහා සමග අහසට පොළවසේ ලංනොවන්නේය. එසේ හෙයින් කුමාරිකා යහනෙහිම සැතපුනිය. ඒ කාලකණ්ණියා බිම වැදහොත්තේය. නැවත මෙසේ සතියක් දවස් යවා කුමාරිකාව කෙරෙහි සෙනහ නැතිවන් ආචාරීන්ගේ බස මරුත්තු කොට ගත නොහී හැරගෙණ ආචාරීන් වැඳ සමුගෙණ තමාගේ නුවරට නික්මුණේය. අතරමග පෙර පසු කථා පමණකුත් ඔවුනොවුන්හා නැත්තේය. නොකවැතිවම ඔහු දෙදෙන මියුලු නුවරට පැමිණියාහ. පිංගුත්තර නම් මානවකයා නුවර සමීපයෙහි පල ගත් දිඹුල්ගසක් දැක සාදුකින් පීඩිතවූයේ ගසට නැගීලා දිඹුල් කඩාගෙණ කන්ට වන. කුමාරිකාද සාදුකින් පෙළුනී 'මටත්දෙව'යි කිව, 'හැයි නිට අත් පා නැද්ද? තොමෝත් ගසට නැගී දිඹුල් කඩාගණ කා'යි කීය. සාදුකට වඩා දුකක්නැතිහෙයින් කුමාරිකාතොමෝම නැගී දිඹුල් කඩාගෙණ කන්ටවන. මානවකයාත් ඈ ගසට නැගි බව දැන, වහවහා ගසින් බැස ගසවට කටුගසාලා "කාලකණ්ණිය කෙරෙන් මිදිනිමි"කියාලා නුවරට නැගීගියේය. කුමාරිකා ගස මුල කටුහෙයින් බැසගන්ට නොපිළිවන්ව උඩම හුන්නීය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ එදවස් දවල් උයන් කෙළි කෙළ සරහනලද ඇතෙකුපිට හිඳ සවස්වෙලෙහි නුවරට වදනාහු, දිඹුල්ගස උන් කුමාරිකාව දැක, පිළිබඳ සිත් ඇතිව පුරුෂයන් ඇත්ත නැත්ත විචාරා යවූහ. කුමාරිකාත් "ස්වාමිනි මාගේ දෙමව්පියන් විසින් පාවාදෙනලද සමුණන්දෑ කෙනෙක් ඇත, * ඒ සමුණානෝ මා මේ ගසළඬ ඉඳුවා හැරපියා පලාගියෝය"යි කිව. විචාරන්ට ගිය අමාත්‍යයා එපවත් රජ්ජුරුවන්ට කීය. රජ්ජුරුවෝ ඒ අසා "හිමියන් නැති වස්තූ නම් රජ්ජුරුවන්ට පැමිණෙන්නේය"යි කියා කුමාරිකාව ගසින් බස්වා ඇතුපිට නංවාගෙණ මාලිගාවට ගොස් රුවන් රැසක් පිට සිටුවා අගමෙහෙසුන් කළහ. බිසව් රජ්ජුරුවන්ට ප්‍රියයෝය. මනවඬත්, දිඹුල්ගසදී දුටු බැවින් උදුම්බරාදේවීයයි ප්‍රසිද්ධවූහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ

* සොප නමං ඉධනිසීදපෙත්වා ජම්බුඛාදාපෙත්වා පලාතොති

උයන්කෙළියට යන පිණිස වාසල්කඩ ගම්වැස්සන් ලවා මාර්ගය ඉදිකරවූහ. පිංගුත්තරයාද රාජසම්මතයෙන් මෙහෙවර කරන්නේ කැසපට කවාගෙණ උදුල්ලකින් සසින්ට වන. මාර්ගය සරහා නොනිමනතුරු රජ්ජුරුවෝ උදුම්බරාදෙවීන් හා සමග උතුම් රථයකට නැඟී උයන්කෙළියට මහපෙරහරින් නික්මුණාහ. උදුම්බරාදෙවිද මග සසිමින් සිටි ඒ කාලකණ්ණියා දැක මෙබඳු සම්පත්තියක් ධරාගත නුහුනුයේ" මූයි උඹ දිසාව බලමින් සිනාසුනාහ. රජ්ජුරුවෝ බිසවුන් සිනාසෙන්නා දැක කිපී "කුමක් පිණිස සුනුහිඳ"යි විචාළහ. "දෙවයන්වහන්ස මේ මග සසිනා මිනිසා මා ආදියෙන් රක්ෂාකල මිනිසාය, මා දිඹුල්ගසට නංවා මුල කටුගසා ගියේ මොහුය. මමමූ බලා මෙබඳු ශ්‍රියක් ධරාගත නුහුනුයේ මේ කාලකණ්ණියායයි සිනාසිනිමි"යි කීව. රජ්ජුරුවෝ "තී කියන්නේ බොරුය, අනික් කිසි පුරුෂයෙකු දැකය තී සුනුයේ තී මරමි''යි කඩුව කොපුවෙන් ඇදගත්හ. බිසව් භයපත්ව ''දේවයෙනි යලි පණ්ඩිතවරුන් විචාළමැනවැ"යි කීහ. රජ්ජුරුවෝ 'මැකී බස් අදහවද්ද'යි සේනකයන් විචාළහ. සේනකයෝත් "නොඅදහමි දේවයන්වහන්ස, කවරෙක් නම් මෙබඳු ගැණියෙක් හැරපියා නැඟියේද්ද"යි කීහ. බිසව් සේනකයන්ගේ බස් අසා වඩාලාම භයවූහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ "සේනකයා කුමක් දනිද මහෞෂධ පණ්ඩිතයන් විචාරමි" සිතා, ගාථාවකින් පණ්ඩිතයන්වහන්සේ විචාරන්නාහු "මහෞෂධ පණ්ඩිතයෙනි ස්ත්‍රියක් නොමෝ අධිකරූ ඇත්තී වුවද ආචාර සීලයෙන්ද යුක්ත වුව, ඒ ස්ත්‍රිය පුරුෂයෙක් නොකමැත්තේල, තෙපි ඒ අදහව්ද"යි විචාළහ. එබස් අසා "දේවයිනි මම අදහමි, පුරුෂයා දෛව නැත්තේවීනම්, ශ්‍රීකාන්තාද කාලකණ්ණිද යන මොහු දෙදෙනා මූද එතර මෙතරසේ එක්නොවන්නාහ''යි වදාළසේක. රජ්ජුරුවෝ මහතානන් වදාළ කාරණය සිතට නගා සන්සුන් සිත් ඇතිව පණ්ඩිතයන්වහන්සේට සතුටුව "පණ්ඩිතයෙනි ඉදින් තෙපි මෙතන නැත්තාහු නම්, අද මේ නුවණනැති සේනකයාගේ බස්ගෙණ මෙබඳු * ගැණුරුවක් නොලද්දෙමි, දැන් තොප නිසාය, මේ බිසව් ලද්දෙය" † යි කියා පණ්ඩිතයන්වහන්සේට මස්සෙන් දහසක් පූජාකළහ. ඉක්බිත්තෙන් බිසව් රජ්ජුරුවන් වැඳ ‡ "දේවයන්වහන්ස පණ්ඩිතයන් නිසාය මා දිවිලද්දේ, මූන් මම මල්තනතුරෙහි තබන්නට වර ඉල්වමි"යි කීහ. රජ්ජුරුවෝ "යහපත දේවිනි තොප ඉල්ලූ වරය දෙමි ගනුව"යි කීහ. දේවයන්වහන්ස මම අදපටන් මාගේ මලනුවන්

* ඉත්ථිරතනං † තං නිස්සාය මයා එසා ලද්ධාති,
‡ තතොදෙවීපිරාජිනං වන්දිත්වා.

හැරපියා කිසිමිහිරි රසයක් අනුභව නොකරමි, මෙතැන්පටන් වේලකවත් නොවේලකවත් වාසල් දෙර හරවා පඬිතයන්ට මිහිරි රසයක් යවන්ට ලබන වරයක් ගනිමි”කීහ. “යහපත සොඳුර ඒ වර ගනුව”යි කියා රජ්ජුරුවෝ දුන්නාහ. ~~~ සිරි කාලකණ්ණි ප්‍රශ්නයනිමි.

---

එක්දවසක් රජ්ජුරුවෝ දහවල් මෙහෙනිමවා සදල්ලෙහි සක්මන්කරන්නාහු, සිව්මැදුරු කවුළුවෙන් එක් එළුවෙකු හා බල්ලෙකු මිත්‍රසන්ථවය කරන්නා දුටුහ. එළු වනාහි ඇත්හල ඇතුව ඉදිරියෙහි ලාලූ තණ නොකනතුරු කන්නේය. ඉක්බිත්තෙන් ඇත්හලයෝ ඔහු තණ කන්නා දැක මරා පලාපිහ. අඩගසාගෙණ යන්නාවූ ඔහු දැක, එක් ඇත්හලයෙක් ලුහුබැඳ ගොස්, දඬකින් පිට අවුරා පහරක් ගැසීය. ඒ තෙමේ පිට නමනමා වේදනාවෙන් වෙව්ලමින් ගොස්, රජගෙයි මහබිත්තක්කණ නිසා පිට පදනම වැදහොත්තේය. එදවස්ම රජ්ජුරුවන්ගේ මුළුතැන්ගෙයි ඇට හා මස් ආදිවූ දෙය කා වැඩි බල්ලෙක්, අරක්කැමියා බත් මාළු පිස වසුන්කොට නෙන් පිටත ඇඟ ඩාදිය සිදිමින් සිටියදී, මත්ස්‍යමාංසයෙහි ගන්ධය ඉවසාගතනොහී මුළුතැන්ගෙට වැද, වලන් වැසූ මලා ආදිය හෙළා මාංස අනුභවකෙළේය. අරක්කැමියා වලන්හුනු හඬ අසා ඇතුළුගෙට වැද මාලු කමින් සිටි බල්ලා දැක දෙර පියාලා කැට මුගුරු ආදින් තැළීය. ඒ තෙමේ තමා කෑ මාලු නගාපියා හඬාගෙණ දිවගත. අරක්කැමියා ඔහු දිවගත් බව දැක ලුහුබැඳ දඬකින් පිට අවුරා ගැසීය. එයින් පිට නමනමා, කෙතෙක් ගැසුවත් පයක් වක්කිරීම බල්ලන්ගේ ස්වභාවයක් හෙයින් එක් පයක්ම ඔසවාගෙණ එළුවා වැද හොත් තෙනටම ගියේය. ඉක්බිත්තෙන් එළුතෙමේ “සබඳ තෝ පිට නමනමා එන්නෙහි කිමෙක්ද, තා පිට රුජාවෙක් පහරීදැ”යි බල්ලා විචාළේය. හේ බල්ලාද “තොපිත් පිට නමාගෙණ වැද හොන්නෙහි කිමෙක්ද? තොප පිට රුජාවෙක් පහරීදැ”යි එළුවා අතින් විචාළේය. එළුවා තමාගේ ස්වරූප බල්ලාට කීය. බලු එළුවාට තමාගේ ස්වරූප කීය. ඉක්බිත්තෙන් එළුවා බල්ලාට “කිමෙක්ද තෝ නැවත මුළුතැන්ගෙට යන්ට පොහොසත්දැ”යි විචාළේය. බලු “නොපොහොසතිමි. ගියොත් මාගේ දිවි නැතැ” යි කීය. “තෝ වනාහි ඇත්හලට යන්ට පොහොසත්දැ”යි කීය. එළුවා “මා විසිනුත් ඇත්නලට යන්ට නොපිළිවන. ගියොත් මාගේ දිවි නැතැ”යි කීය. ඔහු දෙන්නා “කෙසේ අපි දෙනනා ජීවත්වමෝදැ”යි උපායෙක් සිතූහ. ඉක්බිත්තෙන් එළුවාතෙමේ “ඉදින් දෙන්නමෝ සමගිව ගතහෙමෝනම් එක් උපායක් ඇතැ”යි කියා බල්ලා විසින් ‘ඒසේවීනම් කියව’යි කී කල්හි “සබඳ තෝ මෙතැන් පටන් ඇත්නලටයා, බල්ලන් තණ

නොකනහෙයින් 'මේ තණ නොකයි' කියා ඇත්තලයෝ තා කෙරෙහි සැක නොකරෙති, තෝ සඟවා මට තණ කැරැල්ලක් ඩැහැගෙණවුත් මහබිතක්කණෙහි තබව; මමත් මුළුතැන්ගෙට යෙමි, එළුවත් මස් නොකනහෙයින් 'මේ මස් නොකයි' කියා අරක්කැමියා මා කෙරෙහි සැක නොකෙරෙයි; මමත් තට මස් කන්ට ඩැගෙණ එමි" කීය. "මේ උපාය නෙමේ අප දෙන්නා ජීවත්වීමට ඇතැ"යි දෙන්නම ගිවිස බලු ඇත්හලට ගොස් තණ කැරැල්ලක් ඩැගෙණ අවුත් මහබිතක්කණ පිට පදනම තබයි. එළුද මුළුතැන්ගෙට ගොස් මස් කැබැල්ලක් ඩැහැගෙණවුත් එහි තබයි. මේ උපායෙන් දෙන්නාම සැපසේ වෙසෙති.

රජ්ජුරුවෝ උන් දෙන්නාගේ මිත්‍රධර්මය දැක "මා විසිනුත් නුදුටුවිරූ කාරණයක් දක්නාලද, මොහු දෙන්න ඔවුනොවුන්ට පසමිතුරුවත් සමගව වාසයකෙරෙති, මේ කාරණය අල්වා පැණයක් කොට පඬිනවරුන් පස්දෙනා විචාරන්නෙමි, මේ පැණය නොදත් කෙනකුන් රටින් ඨවන්නෙමි; දත් කෙනෙකුන්ට මෙ බඳු පඬිත කෙනෙක් නැතැයි උපකාර කරන්නෙමි, අද වේලා මදව ගියේය, සෙට සේවයට ආකල විචාරන්නෙමියි සිතූහ. මෙසේ සිතා රජ්ජුරුවෝ අනික් දවස පඬිතවරුන් සේවයට අවුත් උන් කල්හි ප්‍රශ්න විචාරන්නාහු ගාථාවක් කියා "මේ සත්‍වලෝකයෙහි යම් සත්‍වකෙනෙකුන්ගේ විශ්වාසයෙක් කිසිකලෙකත් සත් පියවරකුත් පවා නොවූවිරූද, එසේ පසමිතුරුවූ දෙදෙනෙක් සබඳවූහ, සබඳවත් අදහාගෙණ හෙවත් මිත්‍රසන්‍ථවයකොට ඇවිදිනාහ, එයට කරුණු කිමෙක්දැ"යි කීහ. මෙසේද කියා නැවත මේ ගාථාවෙන් "අද පෙරවරු වේලෙහි ඉදින් මේ පැණය මට කියන්ට නොපොහොසත්හු වූනම් තොප හැමදෙනම රටින් නෙරපමි, නුවණ නැත්තවුන්ගෙන් මට ප්‍රයෝජන නැතැයි කීහ. සේනකයෝ මුල් හස්නෙහි හුන්හ, මහෞෂධ පඬිතයෝ කෙළවර හස්නෙහි වැඩහුන්සේක. උන්වහන්සේ ඒ පැණය පරීක්ෂාකෙරෙමින් අර්‍ථ නොදැක "මේ රජතෙම බොලඳ ගුණ ඇත්තේය, මේ පැණය සිතාගෙණ දැනගන්ට නොපොහොසත, ඔහු විසින් කිසිවක් දක්නාලදැ"යි සිතා "එක දවසකට අවසරලබන්නෙම් වීනම් මේ පැණය දැනගනිමි. සේනකයෝ කිසි උපායකින් අද එක දවසක් පමණ රඳවාපියති"යි සිතූසේක.

සේනකාදී පඬිතවරු සතරදෙනාද අඳුරු ගබඩාවකට වන්නවුන්මෙන් කිසිවක් නුදුටුවූහ. සේනකයෝ "මහෞෂධ පඬිතයන්ගේ ප්‍රවෘත්ති කිමෙක්දෝහෝ"යි මහබෝසතානන්වහන්සේ දෙස බැලූහ. සේනකයෝ බෝධිසත්‍වයන්වහන්සේ තමන් බැලූ ආකාරයෙන්ම උන්වහන්සේගේ සිත දැන "පඬිතයන්ට පැණය

නොවැටහුනුයේය. එසේහෙයින් එක් දවසකට අවසර ඉල්වන් නා කැමැත්තෝය. උත්ගේ මනදෙළ පුරම්" රජ්ජුරුවන් හා සමග විශ්වාසයෙන් මහත්කොට සිනාසී "දේවයන්වහන්ස අප ඇමදෙනා පැණය කියාගත නුහුනහොත් රටින් යවනසේක්ද ? අපි මේ පැණය කියන්ට නොපොහොසතුමෝ නොවම්හ, එතකු දුළුවන් මදක් ගැටමුසු පැණය, බොහෝදෙනාගේ මැදයෙහි කියන්ට නොපිළිවන, තනිව ඉඳ සිතා පසුව නුඹවහන්සේට කියම්හ, අපට අවසරයක් දුනමැනව"යි මහබෝසතානන් සලකා ගාථාවකින් කීහ—"මහජනයාගේ රැස්වීමෙහි ජනයාගේ දැඩි කෝලාහලයෙන් එකපැහැර අරගල කළ කල්හි විසිරුණු සිත් ඇතියමෝ හෙවත් නානාලම්බනයෙහි පැවති සිත් ඇතියමෝ, මේ පැණය කියන්ට නොපොහොසතුම්හ, ජන ප්‍රධානය විවේක යට ගියාවූ, එසේහෙයින් එකඟවූ සිත් ඇති පඬිතවරු පස්දෙන එකි එකි දෙන වෙන වෙන තනිව හිඳ පරීක්ෂාකොට ප්‍රශනාර්ථ යන් සිතා පසුව කියති" කීහ. රජ්ජුරුවෝ සේනකයන්ගේ බස් අසා නොසතුටුවූවද "යහපත සිතාපියා මේ පැණය කියනු හුනුහොත් රටින් යවන්නෙමි" හයගැන්වූ හුමය. සේනාකාදි පඬිතවරු සතරදෙන මාලිගාවෙන් බටහ. සේනකයෝ අනින් තුන්දෙනාට "රජ්ජුරුවෝ සියුම් පැණයක් විචාළහ, පැණය කියනුහුනුහොත් මහා අලාභවන්නේය, තෙපි තුන්දෙන සැප අහර අනුභවකොට මනාකොට පරීක්ෂාකාරී වව"යි කියා තමන් තමන්ගේ ගෙට ගියාහ.

මහෞෂධ පඬිතයෝද හුනස්නෙන් නැගී උදුම්බරාදේවීන් සමී පයට ගොස් "දේවීන්වහන්ස අද වේවයි ඊයේවේවයි රජ්ජුරුවෝ බොහෝකලක් කොතන සිටියෝදැ"යි විචාළසේක. "මලඩ සිව් මැදුරු කවුළුවෙන් පිටත බලමින් නඩයෙහි සක්මන්කළහ"යි බිසව් කීහ. ඉක්බිත්තෙන් පඬිතයන්වහන්සේ "රජ්ජුරුවන් වි සින් මේ දිසාවෙන් කිසිවක් දක්නාලද වන්නේය"යි සිතූසේක. ඒ ස්ථානයට ගොස් පිටත බලා එළුවාගේ හා බිල්ලාගේ ක්‍රියාව දැක "රජ්ජුරුවන් විසින් පැණයක් සලකනලදැ"යි සනිටුහන් කොට ගෙට වැඩිසේක් පුක්කුසාදිවූ අනින් තුන්දෙනත් ප්‍රශන යෙහි අර්ථ කල්පනාකොට කිසිවක් නොදැන සේනක පඬිතයන් සමීපයට ගියාහ. සේනකයෝ තොප විසින් පැණයෙහි අර්ථ දක් නාලදදැ"යි විචාළහ, 'නොදක්නාලදැ'යි කීහ. "මමත් අනේක ලෙස සලකා පැණයෙහි අර්ථ නුදුටිමි" කීහ. තුන්දෙනම නුඹව හන්සේ පැණයෙහි අර්ථ නොදක්නාකල අපි කෙසේ දනුමෝදැ"යි කීහ. මෙසේ සේනකාදි සතරදෙනම ප්‍රශනයෙහි අර්ථ නොදැන "රජ්ජුරුවන් සමීපයේදී 'එකදවසකට අවසරලදුමෝනම් සලකා

ප්‍රශ්නය විසඳම්හයි සිංහනාද පැළියා ආම්හ. පැණය නොකිකල්හි රජ්ජුරුවෝ කිපෙති, කුමක්කරමෝද්දැ"යි සිතා උකටලීව 'පණ්ඩිතයෙනි මේ පැණය අප විසින් හවුරුද්දෙක් හිඳ සිතුවත් දක්නට නොපිළිවන, එසේහෙයින් මහෞෂධ පණ්ඩිතයන් විසින් මේ පැණය ශතසහස්‍රගුණයෙන් සිතා නිම්වනු ලැබෙයි, ගර්වව නොයිඳ උන් සමීපයට යම්හ"යි උන් සතරදෙනා ගොසින් තමන් අවුත් සිටිබව කියා යවා 'එන්ට කියව'යි කී කල මාලිගාවට වැද සිහිකටයුතු සුවදුක් දෙඩා එකත්පස්ව සිටියාහු, "මහෞෂධ පණ්ඩිතයෙනි නුඹවහන්සේ විසින් පැණය සිතනලද්දැ"යි මහබෝසතානන් විචාළහ.

උන්වහන්සේ "මා පැණය නොසිතනකල මේ භුවනත්‍රයෙහි අනික් කවරෙක් සිතන්නේද ? එසේය පැණය සිතනලද්දැ"යි වදාළසේක. පණ්ඩිතවරු සතරදෙන "එසේවිනම් අපටත් වදාළ මැනව"යි කීහ. සියලු සතුන් කෙරෙහි පතළ කරුණායෙන් යුක්තවූ මහතානෝ "ඉදින් මම මුන් සතරදෙනාට පැණය නොකියෙම්නම් රජ්ජුරුවෝ 'මේ ජඩ කොල්ලන්ගෙන් කාරිය කිම්දැ'යි මුන් සතරදෙනාම රටින් නෙරණාහ; මෙවෙනි පණ්ඩිත රුවනක් නැතැයි මට සත්රුවනින් පූජාකරන්නාහ. එසේ වන්නාට ඒ මාගේ කරුණාවට තරම් නොවෙයි, මේ අඥනයෝ මා වැනි පණ්ඩිතකෙනෙකුන් ඇතිව ඉන්දදි නොනසිත්ව"යි උන් කෙරෙහි පතළ කරුණායෙන් "පැණය උන්ට කියමි" සිතා සේනකාදි පණ්ඩිතවරුන් මිටි අස්නෙහි හිඳුවා තමන්වහන්සේ දිසාවට සතරදෙන දෙහොත් මුදුනේ තබා වැඳගෙණ ඉඳිනා නියායෙන් සම්මතකොට රජ්ජුරුවන් දුටු නියාව නොහඟවා 'රජ්ජුරුවන් විචාළකල මේ ලෙස කියව'යි සතරදෙනාටම ගාථා සතරක් බැඳලා, ඒ ගාථාවල අර්ථ නුගන්වා පාළිය පමණක්ම උගන්වාලා යවූසේක. ඔහු සතරදෙනද "මහබෝසතානන්වහන්සේද අනික් දවස රාජසේවයට ගොස් රජ්ජුරුවන් දැක පණිවනලද අසුන් මත්තෙහි උන්නාහ.

රජ්ජුරුවෝ "සේනකයිනි පැණය දන්නාලද්දැ"යි සේනකපණ්ඩිතයන් විචාළහ. සේනකයෝත් "දේවයන්වහන්ස මා පැණය නොදක්නාකල අනික් කවරෙක් දකිද්දැ"යි වැඳුවත් ඉදිරියේ කොලොඹුලන්නාසේ බෝධිසත්වයන් මධ්‍යයෙහි තමන්ගේ වියත්කම අඟවා "එසේවිනම් කියව"යි රජ්ජුරුවන් කීකල්හි "ඇසුවමැනව දේවයන්වහන්සැ"යි කියා පණ්ඩිතයන්වහන්සේ උගන්වාලූ සැටියේම ගාථාව කීහ. එහි අර්ථ මෙසේ දතයුතු:—"ප්‍රසිද්ධ අමාත්‍ය පුත්‍රයන්ට එළුමස් ප්‍රියය මනවඩී, අමාත්‍ය පුත්‍රාදීහු බලුමස් අනුභව නොකරන්නාහ, එසේවූ එළුවා හා බල්ලා සමගි සංඛ්‍යාත විශ්වාසය වී." ගාථාව කී බවක්මුත් සේනකපණ්ඩිතයෝ අර්ථ නො

දන්නාහ. රජ්ජුරුවෝ වනාහි තමන්ට ප්‍රත්‍යක්‍ෂ විසින් අර්‍ථ දන්නාහු "සේනකයන් විසින් පැණය දක්නාලදය, පුක්කුසයන් විචාරමි"යි දෙවනුව උන් පුක්කුසයන් විචාළහ. ඒ පුක්කුසයෝ රජ්ජුරුවන්ට "කිමෙක්ද ? මම නොපණ්ඩිතයෙම්දැ"යි උගත් සැටියේ ගාථාව කීහ. එහි අර්‍ථ මෙසේ දතයුතු:—අස් පිට ආභරණ සුව පිණිස එළුවාගේ සම් නගන්නාහ, එසේ ආභරණ සුව කැමති ජනයෝ බල්ලන්ගේ සම අසු පිට නොවතුරන්නාහ, එසේද උවත් එළුවාගේ හා බල්ලාගේ හා සමගි සමාගම සංඛ්‍යාත විශ්වාසය වී." ඒ පුක්කුස පණ්ඩිතයා ගාථාවෙහි අර්‍ථ නොදන්නේමය. රජ්ජුරුවෝ තමන්ට අර්‍ථ ප්‍රගුණහෙයින් "මුන් විසිනුත් පැණය දක්නාලද්දැ"යි සිතා තුන්වැනිව හුන් කාවින්ද පණ්ඩිතයන් විචාළහ. එයින් තමන් උගත් ගාථාව කීය. ගාථාවෙහි අර්‍ථය මෙසේ දතයුතු:—"එළුතෙම ඇඹරීයිය අං ඇත්තේය, බල්ලාගේ හං නොම ඇත්තේය, එළු තණ කන්නේය, බලු මස් කන්නේය, එසේ උවත් එළුවාගේ හා බල්ලාගේ හා සමගි විශ්වාසය වී." රජ්ජුරුවෝ "මුන් විසිනුත් පැණය දන්නේය"යි සතරවැනිව හුන් දේවින්ද පණ්ඩිතයන් විචාළහ. උයින් තමන් උගත් ගාථාව කීහ. එහි අර්‍ථ මෙසේ දතයුතු:—"එළුතෙමේ තණ හා කොල කන්නේය, වැලි බලු තෙමේ තණකොල නොකන්නේය, වැලි කුමක් කන්නේද යත් බලුතෙමේ සාවුන් හා බළලුන් ගන්නේය එසේද උවත් එළුවා හා බල්ලා හා සමගි සමාගම සංඛ්‍යාත විශ්වාසය වී."

මේ සේනකාදී සතරදෙන තමන් තමන් උගත් ගාථා පමණක් කී කල්හි රජ්ජුරුවෝ තමන්ට අර්‍ථ ප්‍රකාශහෙයින් ගාථාවල අර්‍ථ උන් අතින් නොවිචාරා පස්වැනිව හුන් අසරණ සරණ කරුණානිධාන ජනමූර්ත්තිවූ මහෞෂධ පණ්ඩිතයන් අතින් "පණ්ඩිතයෙනි තෙපි පැණය දනිව්දැ"යි විචාළහ, "දේවයන්වහන්ස අවීචියෙහි පටන් භවාග්‍රය දක්වා මා විනා අනික් කවරෙක් මේ පැණය දනීදැ"යි සිංහනාද කළසේක. රජ්ජුරුවෝ "එසේවිනම් කියව"යි කීහ. "ඇසුව මැනව දේවයන්වහන්සැ"යි කියා එළුවාගේ හා බල්ලාගේ ක්‍රියාව තත්වූ පරිද්දෙන් දත්බව ප්‍රකාශකරණසේක් ගාථා දෙකකින් කීසේක. ඒ ගාථාවල අභිප්‍රාය නම් "පා අටෙක් ඇති, හෙවත් සතර පයෙහි අටකුරෙක් ඇති එළුතෙමේ මස් ගන්නා වේලෙහි කිසි කෙනෙකුන්ට නොපෙණී මේ බල්ලාට මස් ගෙණෙන්නේය, මේ බල්ලාද එළුවාට තණ ගෙණෙන්නේය, බල්ලාගේද එළුවාගේද යන මොවුන් දෙන්නාගේ ගෝචර පිණිස ඔවුනොවුන්ට මෙහෙවර කරණ පෙරළිය ජනප්‍රධානවූ වෛදේහ නම් රාජෝත්තම තෙම ප්‍රාසාදයෙහි සිටියේ ප්‍රත්‍යක්‍ෂකොට දිටීලැ"යි වදාළසේක. රජ්ජුරුවෝද මහබෝසතානන් නිසා සේන

කාදි පණ්ඩිතවරුන් සතරදෙන පැණය දත්බැව් නොදත "මෙබඳු පණ්ඩිතවරහු යම්බඳුවූ මාගේ කුලයෙහි වෙසෙද්ද එසේහෙයින් ඒකාන්තයෙන් මට වූයේ බොහෝ ලාභයකැ"යි කීහ. "මෙසේ පණ්ඩිතවරුන්ගේ ප්‍රශ්නව්‍යාකරණයෙහි සතුටුවූ මා විසින් උන්ට උපකාර කළමනාවේදැ"යි උපකාර කරන්නාහු "සුවිනිශ්චිත ප්‍රශ්න විසර්ජනය කරණකොටගෙණ වෙසෙසින්ම සතුටු සිත් ඇත්තෙමි, පණ්ඩිතවූ තොප හැමදෙනාට අජානීය අශ්වයන් යෙදූ එකි එකී රථයක්ද, වස්ත්‍රාභරණ ධන ධාන්‍යයෙන් සමෘද්ධවූ එකි එකී ගම්වරෙක්ද දෙමි" කියා මෙකී සියල්ල පණ්ඩිතවරුන් පස්දෙනාට දෙවූහ.~~~එළක ප්‍රශ්නය නිමි.

---

**උදුම්බරා දේවී** වනාහි සේනකාදි පණ්ඩිතවරු සතරදෙනාම මහෞෂධපණ්ඩිතයන් නිසා ප්‍රශ්නය දත්බවදැන "රජ්ජුරුවන්වහන්සේ විසින් මුංහා උදුහා වෙනසක් නොකරන්නක්හු මෙන් පස්දෙනාටම උපකාර සමයේ කළහ. මාගේ මලනුවන් මහෞෂධපණ්ඩිතයන්ට විශේෂකොට සත්කාර කරණබව සුදුසුම වේදැ"යි රජ්ජුරුවන් සමීපයට ගොස් "දේවයන්වහන්ස නුඹවහන්සේට පැණය කාවිසින් කියන ලදදැ"යි විචාළහ. "සොඳුර පණ්ඩිතවරුන් පස්දෙනා විසිනැ"යි කීහ. "දේවයිනි සේනකාදි පණ්ඩිතවරු සතරදෙන ඒ පැණය කානිසා දත්හයි සිතූසේක්දැ"යි විචාළහ. "සොඳුර නොදනිමි"කීහ. "දේවයන්වහන්ස ඒ සේනකාදි සතරදෙන කුමක් දනිද්ද මහෞෂධ පණ්ඩිතයෝ වනාහි මේ අඥනයෝ නොනසිත්ව'යි සිතා පැණය ඉගැන්වූහ. නුඹවහන්සේ හැමදෙනාටම සමසමයේ උපකාර කළසේක. ඒ අයුක්තිය, මහෞෂධ පණ්ඩිතයන්ට වැඩියක් උපකාර කරණබව සුදුසුය"යි කීහ. රජ්ජුරුවෝ "තමන් නිසා පැණය දත්බව නොකී වූය"යි මහෞෂධපඬිතයන්වහන්සේට සතුටුව වඩා උපකාරයක් කරණු කැමැත්තෝ "වනහාටය, මපුතුනුවන් එක් පැණයක් විචාරා ඒ පැණය කීකල මහත් සත්කාර කරන්නෙමි" සිතූහ.

මෙසේ සිතා ඊට සුදුසු පැණයක් සිතන්නාහු සිරිමඬ ප්‍රශ්නය සිතූහ. ඒ ප්‍රශ්න චින්තනයකොට එක් දවසක් පඬිනවරුන් පස්දෙනා සේවයට අවුත් පිළිසඳර කථායෙන් සුවසේ උන් කල්හි සේනකපඬිතයන්ට "සේනකපඬිතයෙනි පැණයක් විචාරමි" කීහ. "දේවයන්වහන්ස විචාළ මැනව"යි කීහ. රජ්ජුරුවෝ සිරිමන්ද ප්‍රශ්නයෙහි පළමුවන ගාථාවෙන් "නුවණ ඇති සම්පත් නැති හස්ත්‍යශ්වාදි පරිවාරසම්පත්ඇති නුවණනැති මුන් දෙන්නා අතුරෙන් නුවණැත්තෝ කවුරුන් උතුමැයි කියද්ද? සේනකයිනි එකෙක් පොළව හා සමාන නුවණඇත්තේය, දිළිඳුය, එකෙක් පරිවාරසම්පත් ඇත්තේය, අඥනය, මුන් දෙදෙනාගෙන් කවුරු උත්තමයයි තොපට වැටහේද ? මේ කාරණය කියා බලව"යි

කිහ. මේ පැණය වනාහි සේනකපණ්ඩිතයන්ගේ පරම්පරාවෙන් පැවත ආයේය. එසේහෙයින් ඒ සිරිමන්‍ද ප්‍රශනය වහාම රජ්ජුරුවන්ට කිහ. කෙසේදයත් "ජනප්‍රධානවූ රජ්ජුරුවෙනි ඒකාන්තයෙන් නුවණැත්තෝද නුවණ නැත්තෝද හස්ත්‍යශ්වාදි ශිල්පයෙන් යුක්තයෝද කිසි ශිල්පයක් නොදන්නාහුද ක්‍ෂත්‍රියබ්‍රාහ්මණාදි උතුම් ජාති ඇත්තාහුද යන සියල්ලෝම ජාතීන්ගෙන් හීන උවත් සම්පත් ඇති තැනැත්තවුට කී නොකී දෙයකොට සේවාව යටත් වන්නාහ. මේ කාරණය දැන මම කියමි නුවණැති තැනැත්තෝ සටත්මය සම්පත්ඇති තැනැත්තෝම උතුමැ"යි කිහ.

රජ්ජුරුවෝ සේනකයාගේ බස්අසා පුක්කුසාදි තුන්දෙන නොවිචාරා පස්දෙනාට කෙළවර උන් මහෞෂධ පණ්ඩිතයන්වහන්සේට "අලාමකවූ නුවණැති සියලු ධර්‍මයන් සර්‍වාකාරයෙන් දන්නාවූ මහෞෂධ පණ්ඩිතයෙනි තොප විචාරමි, නුවණැති පරිවාර සම්පත් නැති පරිවාර සම්පත්ඇති නුවණනැති මේ දෙදෙනා අතුරෙන් නුවණැත්තෝ කා උතුමැයි කියද්ද කියා බලව"යි කිහ. ඉක්බිත්තෙන් මෙසේ විචාළ රජ්ජුරුවන්ට "ඇසුව මැනව දේවයන්වහන්සැ"යි ගාථාවකින් ස්ථානාන්තරාදි කිසි ලාභයක් සම්පත්තියක් ලදින්ම මේ උතුමැයි සිතන්නාවූ අඥානතෙමේ, ප්‍රාණාතිපාතාදි පාපධර්‍මයන් කරන්නේය. එසේහෙයින් මේ ලොව බලන්නේ ඓශ්වර්‍ය්‍ය මදයෙන් ප්‍රමාදව කළාවූ පාපකර්‍ම බලයෙන් නරකාදියෙහි අනන්ත දුක්ඛයට භාග්‍යවන්නේයයි මෙසේ උපෙක්‍ෂා පූර්‍වාංගමවූ චින්තාවක් නැතිව පරලොව නොබලන්නේ දෙලොවෙහිම හෙවත් ඉසුරුමදයෙන් පව්කොට නරකාදියෙහි උපදනේ පරලොවද නැවත එයින් චුතව දිළිඳුකුලයෙහි නොයෙක් දුකට භාජනව උපදනේ මේ ලොවදැයි මෙසේ දෙලොවෙහිම නුවණ නැති තැනැත්තේ පරාජයක් ගන්නේය; හෙවත් විනාසයට පැමිණෙන්නේය; මේ කාරණය දැක මම නුවණැත්තේම උතුම, යසසින් යුක්තවූ නුවණ නැති තැනැත්තේ උතුම් නොවෙයි කියමැ"යි වදාළසේක.

මෙසේ බෝසතානන්වහන්සේ විසින් වදාළකල්හි රජ්ජුරුවෝ සේනකයන් මුහුණබලා "මහෞෂධ පණ්ඩිතයෝ නුවණැත්තාවූ උතුමැයි කියති කෙබඳුද ආචාරීනි"යි කීහ. සේනකයෝ "දේවයන්වහන්ස මහෞෂධ පණ්ඩිතයෝ ළදරුවෝය, අදදක්වාත් උන්ගේ මුඛය කිරිසුවඳ අමයි. මේ බාලදරුවෝ කුමක් දනිද්දැ"යි කියා ගාථාවකින් කාරණයක් දක්වන්නාහු, "මේ ශිල්පතෙමේ හෙවත් නුවණතෙමේ ධන ධාන්‍යාදිවූ භොගසම්පත් සිඬනොකරන්නේය, පුත්‍රදාරාදිවූ නෑයෝද රූපසම්පත්තියද, ධනධාන්‍යාදිවූ සම්පත් සිඬනොකරන්නාහ. ඊට දෘෂ්ටාන්ත කවරේදැයි යත

හොත්-කෙලතොලුවූ හෙවත් අනවරතයෙන් දෙකොළින් * බස්නාකෙළිධාරා ඇති රූපසම්පත්තියක් නැති හස්ත්‍යශ්වාදි පරිවාරයෙන් හා ධනධාන්‍යාදි සම්පත්තීන් යුක්තව සුව විඳිනා මේ ගෝරිමන්ද නම් සිටුහු ශ්‍රීකාන්තා සෙවුනිය. දේවයන්වහන්ස බලා වදාළමැනව. මේ කාරණය දැක නුවණැතිවත් දිළිඳු නැත්තේ උතුම්නොවෙයි නුවණ නැතිවත් ඉසුරුමත් නැත්තේ උතුමැයි මම කියමි"යි කීහ.

ඒ ගෝරිමන්ද සිටාණෝ වනාහි කෙසේවූ කෙනෙක්දයත්? ඒ මිථුලුනුවර අසූකෙළක් සම්පත් ඇති සිටානකෙනෙක. උන්ගේ බැලියයුතු රූපයකුත් නැත්තේය. පුත්‍රකෙනෙකුත් නැත්තේය. දියනිකෙනෙකුත් නැසියකෙනකුත් නැත්තාහ. කිසි ශිල්පයකුත් නොදන්නාහ. බැණනැගි කල්හි ඒ ගොරිමන්ද සිටානන්ගේ දෙකොළින් කෙලධාරාවත් වැගිරෙන්නේය. එසේ වැහෙන්නාවූ කෙලධාරාවත් දෙවඟනන් හා සමාන රූ ඇති සර්වාලංකාරයෙන් සැරහුනු ගෑණු දෙන්නෙක් සුපිපි නිලිපුල් කලබ් දෙකක් ගෙණ දැලයෙහි සිට, නිලිපුල්මලින් පිස මල් වීථියට දමන්නාහ. රාසොඩහුද රාහලට යන්නාහු නිලිපුලින් ප්‍රයොජනයක් ඇති කල්හි ඒ ගෝරිමන්ද සිටානන්ගේ ගෙදොරට ගොස් "ස්වාමිනි ගෝරිමන්ද සිටානන්වහන්සැ"යි කියන්නාහ, ඒ සිටාණෝ රාසොඩුන්ගේ බස් අසා සිව්මැදුරුකවුළුව සමීපයේම සිට 'කිමෙක්ද දරුවෙනි' කියන්නාහ. ඉක්බිත්තෙන් බැණනැංගාවූන්ගේ දෙකොළින් කෙලධාරා වැහෙන්නේය. නිලිපුල්මල් ගත් අත් ඇත්ව සැරහි දැලයෙහිසිටි ගෑණුදෙන්නා මලින්කෙල පිස මල් අතුරුවීථියට දමන්නාහ. රාසොඩහු ඒ මල්ගෙණ දියෙහි සලාපියා පැළඳගෙණ රාහලට වදනාහ. ඒ ගෝරිමන්ද සිටාණෝනම් මෙබඳු සම්පත් ඇත්තාහ. සේනකයෝ මේ දෘෂ්ටාන්තකොට රජ්ජුරුවන්ට කීහ.

සේනකයන් කී බස් අසා රජ්ජුරුවෝ "පුත මහෞෂධ පණ්ඩිතයෙනි" කීහ. මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ "දේවයන්වහන්ස සේනකයෝ කුමක් දනිද්ද බත්හුළු වැගිරගිය තැන අවුලාකන කපුටුවෙකු වැන්නේය. ඉසහෙන මුගුරු නොබලා දී බොනනාටවත් බල්ලෙකු වැන්නේය. මේලෝ විඳගන්නා සම්පත් බලයි, ඉසවැටෙන අපාදුක් නැමති මහමුගුරු නොබලයි, ඇසුවමැනව දේවයන්වහන්සැ"යි ගාථාවකින් කාරණයක් දක්වනසේක් "නුවණනැත්තේ සුවයක් ලදින් එහිම ඇලුනේ කුශලකර්මයෙහි පමාවන්නේය, ප්‍රමාද ප්‍රත්‍යයෙන් පව්කරන්නේය, ඥනිව්‍යසනාදීවූ අනේකප්‍රකාරවූ දුඃඛින් මඩනාලද්දේ විශෙෂයෙන්ම මුලාබවට පැමිණෙන්නේය, අමුතු අමුතුව චක්‍රාකාරයෙන් පවත්නාවූ සුවදුකින් පීඩිතවූයේ ග්‍රීෂ්මකාලයෙහි දියෙන් ගෙණහැර අව්වෙහිලූ

* දෙකොපුලින් යනු වරදයි.

මසෙකුමෙන් වෙව්ලන්නේය, මේ කාරණය දැක මම නුවණැත්තෝ උතුම, ඉසුරුමත් නැනැත්තෝ උතුම් නොවෙති කියමි" යි වදළසේක.

මහබෝසතානන්වහන්සේ වදළ කාරණය අසා රජ්ජුරුවෝ "කෙබඳුද ආචාරීනි" කිහ. සේනක පණ්ඩිතයෝ "දේවයන්වහන්ස මූ කුමක් දනිද මිනිස්සු සිටීත්වා හෙවත් මිනිසුන් තබා වල හටගත් ගසක් ඵලසම්පන්නාවීනම් එසේවූ ගසටම පක්‍ෂීහු එළඹෙන්නාහ"යි කියා ගාථාවකින් එම උපමාව දක්වන්නාහු "වල හටගත් මියුරු පක් ඇති වෘක්‍ෂයකට අනෙක ප්‍රකාරවූ ශාරිකා ශකුනාදි ලිහිණියෝ හාත්පසින් යම්සේ අවුත් රැස්වෙද්ද, එපරිද්දෙන්ම පොහොසත්වූ රත්රන් අමුරන් ආදි ධන සහිතවූ අවශෙෂ උපභොග පරිභොග වස්තු ඇති මෙබඳු පුරුෂයා බොහෝදෙන තමන්ට වැඩ පිණිස සෙවිනාහ; මේ කාරණය දැක මම නුවණැතිවත් දිළිඳු නැනැත්තේ උතුම් නොවෙයි නුවණ නැතිවත් ශ්‍රීමත් නැනැත්තේ උතුමැයි කියමි"යි කීහ.

සේනකයන් කී කාරණයඅසා රජ්ජුරුවෝ 'කිමෙක්ද පුත මහෞෂධපණ්ඩිතයෙනි' කිහ. "මේ සේනකපණ්ඩිතයෝ කුමක් දනිද්ද ඇසුව මැනව දේවයන්වහන්සැ" යි කාරණයක් දක්වන නැනැත්තෝ ගාථාවකින් "පවත්වනලද අණසක ඇති නුවණ නැත්තෝ උතුම් නොවෙති. කුමක් හෙයිනද යත් තාඩන බන්ධනාදි නොයෙක් දරුණුකමින් ජනයන්ට දුක් දී වස්තු ලබන්නේය, එසේවූ අඥනයා බලවත් පශ්චාත්තාප දුක්ඛයෙන් අභිභූතව හඬනන්නාවූම භයානකවූ නරකයට යමපල්ලෝ නොකමැතිසේම අදනාහ, හෙවත් නරකයෙහි බොහෝ දුකට පැමිණෙන්නේය, මේකාරණයද දැක මම දිළිඳු උවත් නුවණැත්තේම උතුම ඉසුරුමත් උවත් නුවණ නැත්තේ උතුම් නොවෙයි කියමි" වදළසේක.

නැවත රජ්ජුරුවන් විසින් "කිමෙක්ද සේනකයිනි" කී කල්හි ගාථාවකින් කාරණයක් දක්වන්නාහු; "ඇල හෝ කඳුරැලි ආදී කිසි ජලාශය කෙනෙක් නිමනව ගොස් ගඟට අඬා බසිද්ද, ඔහු හැමදෙනම තම්තමන්ගේ යථොක්තවූ, ගොය ඇල යනාදී නම් ගොත් හරණාහ, ඒ ඇල හෝ ආදීන්ගේ ප්‍රවෙශයට ආධාරභූයෙන් ගඟාතොම මහමුහුදට වදනා ලබන්හි ගඟාය යන ව්‍යවහාරය නැතිව ගොස් මුහුද හා එක්වීමෙන් මුහුදයයි යන ව්‍යවහාරයට යන්නේද එපරිද්දෙන් ලෝවැස්සෝ තුමූ සම්පත් ඇත්තාහුම පිහිටකොට ඇත්තාහ, හෙවත් මහා නුවණැත්තෝ ඉසුරුමත් නැනැත්තවුන් කරා පැමිණ මුහුදට වන් ගඟක් සේ

තේජස් නැතිහෙයින් ප්‍රසිඬව නෙපෙණෙත්නෝය, මේ කාරණය දැක මම නුවණැත්තෝ උතුම් නොවෙති, ඉසුරුමත් නැනැත්තෝ උතුමැයි කියම්"යි කීහ.

නැවත රජ්ජුරුවෝ "කිමෙක්ද මහෞෂධ පණ්ඩිතයෙනි" කීහ. පණ්ඩිතයන්වහන්සේ "ඇසුවමැනව දේවයන්වහන්සැයි කියා ගාථාවකින් කාරණයක් වදුරණසේක් "මහත්වූ සාගරයෙක් උපමාකෙරේදද? ඒ සාගරයට ගඟා යමුනා අචිරවතී ආදිවූ අනෙකප්‍රකාර ගංහෝ හැමකල්හිම වේනෙක් ගඟ මෙනෙක් හොය, යන ප්‍රමාණයක් නැතිව නොයෙක් දිගින් හඬා බසිද්ද සමුද සංඛ්‍යාත ඒ සාගරය තෙමේ අනවරතවූ සියදහස් ගණන් මහත්වූ රළවේග ඇත්තේ වෙරළ ඉක්මගනනොහි වෙරළම ගැසී බිඳේද, එපරිද්දෙන්ම නුවණ නැත්තහුගේ තෙපුල් නුවණැත්තවූ ඉක්ම නොපවත්නේය. කිසියම් අඥානඑයෙක්හි උපන් සැකයෙක් ඇත්නම් ඉසුරුමත්හුද දිළිඳු උවත් නුවණැත්තහුකරා පැමිණ නිශ්චයවන්නාහුය, මේ කාරණය දැක මම නුවණැත්තේ උතුම; ඉසුරුමත් නුවණනැත්තේ උතුම් නොවෙයි කියම්" වදාළසේක.

බෝසතානන්වහන්සේ වදාළ කාරණය අසා රජ්ජුරුවෝ 'කිමෙක්ද සේනකයිනි' කීහ. "ඇසුව මැනව දේවයන් වහන්සැ"යි ගාථාවකින් කාරණයක් දක්වනු පිණිස 'කායාදි සංයමයක් නැතිවත් යමෙක් පරිවාර සම්පත් ඇත්තේවිනම් එබඳු ඉසුරුමත් පුරුෂතෙම මහපිරිස පිරිවරා අධිකරණයෙහි හිඳ අනුන්ට මේ ලොවින් පරලොවින් වැඩක්වන කාරණයක් වත්, අවැඩක්වන කාරණයක්වත් කියන්නේවිනම්, තේජස්විහෙයින් සභාමධ්‍යයෙහි ඔහුගේ බසම නැගෙන්නේය, ඉසුරුමත් නැනැත්තේ හිමියන් නොහිම්කිරීම් ආදිවූ අවැඩට සුදුසු බසකුදු කියන්නේවිනම් සභාවට ඇදගිය යුතුබව ශ්‍රීකාන්තාම රක්නිය, ප්‍රඥතොමෝ එසේකොටලිය නොහෙන්නිය. මේ කාරණයද දැන මම නුවණැත්තෝ යටත්හුමය ශ්‍රීමත් ඇත්තෝම උතුමැයි කියම්"යි කීහ.

නැවත රජ්ජුරුවන් විසින් 'කිමෙක්ද පුත මහෞෂධ පණ්ඩිතයෙනි' කී කල්හි පණ්ඩිතයන්වහන්සේ "මේ කෙලනොලු සේනකයා කුමක් දනිද්ද"යි වදුරා ගාථාවකින් කාරණයක් වදුරණසේක් "මඳනුවණැති බාලතෙමේ අනුන් නිසාවත් තමා නිසාවත් බොරු බෙණෙයිනම් හේ සභාමැද නින්දුත් ලබයි. පරලොව අපායගාමිද වෙයි, මෙ කරුණත් බලා නුවණැත්තේ උතුම, නුවණනැති ඉසුරුමත් නැනැත්තේ උතුම් නොවෙයි මම කියම්"යි කීහ.

ඉක්බිත්තෙන් සේනක පණ්ඩිතයෝ ගාථාවකින් කාරණයක් දක්වන්නාහු ‘වී නැළියක් සාල් නැළියක් වෙල්හැල් නැළියක් පමණවත් නැති අකක් මස්සක් වස්තුවක් නැති එසේහෙයින් ඒ වේලෙන් වේලාවට දුකසේ ජීවත්වන්නාවූ පොළව සමානවූ නුවණැත්තේ සභාමධ්‍යයේ ඉඳ, ඉඳින් කාරණයකුදු කියාතම් ඔහුගේ ඒ වචනය සභාවට නොනැගෙන්නේය. යමෙක් නුවණැතිවත් ඉසුරුමත් නොවේනම් ශ්‍රීකාන්තා ඔහු භජනය නොකරන්නීය, යමෙක් නුවණ නැතිවත් ඉසුරුමත් වීනම් ශ්‍රී ඔහු සෙවුනීය, එසේහෙයින් ඉසුරුමත් නැනැත්තහු සම්මුඛයේ නුවණැත්තේ කඳෙපැණියෙක්මෙන් වැටහෙන්නේය. මේ කාරණයද දැක මම ප්‍රඥවන්ත නැත්තේ හීනය, ඉසුරුමත් නැත්තේ වඩීනයයි කියමි” කීහ.

නැවත රජ්ජුරුවන් විසින් ‘කිමෙක්ද! පුත මහෞෂධ පණ්ඩිතයෙනි’ කීකල්හි පණ්ඩිතයන්වහන්සේ ‘සේනකයා කුමක්දනීද මේලොව විඳගන්නා යසස බලයි, පරලොව අපායදුක් නොබලයි’ කියා ගාථාවකින් කාරණයක් දක්වනසේක්, “උදාරවූ නුවණැත්තේ අනුන්ගේ බිඳීම පිණිස වේයයි බොරුවක් නොකියන්නේය, සබවස රක්නාවූ හේතෙමේ මහපිරිස් මැද බොහෝ දෙනා විසින් ‘කී නියා යහපතැ’යි පිදියයුතු වන්නේය. පරලෙව්හිදු සුභාෂිත කාරණයෙන් සුගතියටම යන්නේය. මේ කාරණයද දැක මම නුවණැත්තෝම උතුම, නුවණ නැති ඉසුරුමත් තැනැත්තෝ උතුම් නොවෙති කියමි”වදාළසේක.

නැවත ‘කෙසේදැ’යි විචාළ රජ්ජුරුවන්ට සේනකයෝ ගාථාවකින් උත්තරයක් කියන්නෝ “මහරජ ඇසුව මැනව, ඇතුන් අසුන් ගව මහිෂාදි වස්තු හා මුතු මැණික් ආදිවූ රුවන්ද, මැණික්මය කුණ්ඩලාභරණ හා කණක කටක නූපුර යනාදි ආභරණයෝද ඉසුරු කුලයෙහි උපන්නාවූ දෙවඟනන් හා සමාන වරඟනෝද අවශෙෂ පරිවාර ජනයෝද යන සියල්ලම පොහොසත් තැනැත්තවුට උපභොග පරිභොග පිණිස වන්නාහ. නුවණ ඇතත් දුක්පත් තැනැත්තවුට එසේවන්නාහු නොවෙති. මේ කාරණයෙනුත් සම්පත් ඇත්තෝ උතුම්වෙති කියමි” කීහ.

ඉක්බිත්තෙන් පණ්ඩිතයන්වහන්සේ වදාරණසේක් ‘මේ නුවණ නැත් සේනකයා කුමක් දනීදැ’යි එක් කාරණයක් ගෙණහැර දක්වන්නෝ ගාථාවකින්, “නොසලකා කරණ ලද මේ ලොවින් පරලොවින් අනර්ථදායකවූ කටයුතුඇති * අඥනවූ තෙපුල් ඇති මද නුවණැත්තහු දිරාගිය සැවයක් නිරපෙක්ෂාකොට හැර පියා යන සර්පයෙකුමෙන් ශ්‍රී නොමෝ හරණීය. තවද ඊට කාරණා කිමෙක්ද යනහොත් ප්‍රථම කල්පයෙහි අකුසල් නම් කළුබව සුදු

* අසංවිහිතකම්මන්තංබාලං.

බව නොදන්නා මිනිසුන්ට ආයු බොහෝ සමයෙහි දිඹදිව වෙති යනම් රජකෙනෙක් ඇතිවූහ. උන්ගේ ශරීරයෙන් සඳුන් සුවඳ හමන්නේය. මුඛයෙන් මහනෙල්මල් සුවඳ හමන්නේය. ආකාශයෙහි පලඟ බැඳගෙණ ඉඳිනාට සමාණවූ සෑඩි ඇත්තාහ. කාමාවචර දෙවියෝ සතරදෙනෙක් නිරන්තරයෙන් රෑ දවල් ආරක්ෂා ඇතිව රැකවල්ගෙණ සිටිනාහ. අනන්ත ඇතුන් අසුන් ආදිවූ සිව්රඟ සෙනඟින් යුක්තව දසදහසක් යොදුන් දඹදිවට අගරජ කරන්නාහ. එසේවූ ඒ චේතිය රජ්ජුරුවන් කී බොරුවෙන් ශරීරයෙන් නික්මෙන චන්දන ගන්ධයද මුඛයෙන් නික්මෙන උත්පල ගන්ධයද නැතිව දුර්ගන්ධ හමන්නට වන. සතරදිග රැකවල්ගෙණ සිටිය දෙවියෝද ඔහු හැරපියා නැගී ගියාහ. ආකාශයෙහි පලක් බැඳ සිටිනට සමාණ සෑඞ් නැතිව බිමටම බටුවාහුය. කීවාවූ මුසාවාදය කාරණකොටගෙණ ජීවමාන ශරිරයෙන්ම පොළව විවරව අවිචියෙන් ගිනිදූල් අවුත් රත්පලසක් බඳුව වළඳිනා ලද්දේ නරකයෙහි උපන, සතරදිග දෙවියන් රැකවල්ගත් එබඳු ඔහුගේ සැපත පවා, නුවණ නැතිව අපායට යනකල පිටිවහල් නොවී මුහුද එතරට මෙනර සේද ආකාශයට පොළව සේද නොලඟවිය, එසේහෙයින් මේ කාරණයදැක මම නුවණැත්තෝ උතුම, නුවණ නැති. නැනැත්තෝ උතුම් නොවෙති කියමි” වදාළසේක.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ‘කිමෙක්ද සේනකයිනි’ කී කල්හි ‘කිමෙක්ද දේවයන්වහන්ස මේ බාලදරුවෝ කුමක් දනිද්ද! තවත් මා කියන කාරණයක් ඇසුවමැනව’යි ‘පණ්ඩිතයන්වහන්සේ කරබාවමි හෙවත් කියනලද උත්තරයක් ඇත්නම් නැතිකෙරෙම්’ සිතා ගාථාවකින් කාරණයක් දක්වන්නාහු, “දේවයන්වහන්ස නුවණින් තීරණය කටයුතුවූ කාරණයෙක්හි සැකළ පත්කල ‘සේනකාදි පණ්ඩිතවරුන් කැඳව’යි අපහැම කැඳවායවූ ඔබවහන්සේගේ සැකය දුරලන මෙසේවූ ප්‍රඥසම්පන්නාවූ අපි පණ්ඩිතවරු පස්දෙනම දෙහොත්මුදුනෙහි බැඳගෙණ ඔබවහන්සේට සම නොවෙමුව, අප ඔබවහන්සේ ‘දෙදෙව්ලොව දෙවියන් පිරිවරා ඔවුන්ගේ ආනුභාව මැඩපවත්නාවූ සක්දෙව් රජහුමෙන්, කීර්ති හා තේජසින් පරිවාර සම්පත්තීන් මැඩගෙණ පවත්නාසේක. ඉදින් නුවණැත්තවුන් උතුම් උවහොත් අප අනුශාසකව සිටි බැවින් ඔබවහන්සේ අපට යටත්උවමනාවේද, එසේද නොවනහෙයින් මේ කාරණයදැක මම නුවණැත්තෝ උතුම්නොවෙති, පරිවාරසම්පත් ඇති නැනැත්තෝ උතුමැයි කියමි” කීහ.

සේනකයන් විසින් කියනලද දූත් මේවූ කාරණයම අසා රජ්ජුරුවෝ “සේනකයන් විසින් ගෙණහැර දක්වනලද්දාවූ මේ කාරණය ඉතාම යහපත. මපුතනුවෝ මහෞෂධපණ්ඩිතයෝ මේ

සේනකයාගේ වාදය බිඳ අනික් කාරණයක් ගෙණහැර දක්වන්නට පෝසත්හුදෝහෝ"යි සිතා "මේ කිමෙක්ද පණ්ඩිතයෙනි" කීහ. සේනකයා තමන් විසින් මේ කාරණය ගෙණහැරදැක්වූ කල දැන්වනාහී මහබෝසතාණන්වහන්සේ විනා අනික් ඒ වාදය බිඳින්ට සමර්ථ කෙනෙක් මුළු දඹදිව නැත්තාහ. එසේ හෙයින් බෝධිසත්වයන්වහන්සේ තමන්වහන්සේගේ විදුරක් හා සමාන අසාධාරණවූ ප්‍රඥාප්‍රභාවයෙන් ඒ සේනකපණ්ඩිතයන්ගේ වාදය බිඳිනාසේක් "දේවයන්වහන්ස මේ නුවණ නැති සේනකයා කුමක්දනිද, මේලොව විඳගන්නාවූ යසස් බලයි. නුවණෙහි අරුම නොදන්නේය. නුවණෙහි අරුම ඇසුවමැනව දේවයන්වහන්සැ"යි කියා ගාථාවකින් කාරණා දක්වනසේක්, නුවණැත්තන් විසින්ම පසිඳවිය යුතුවූ එබඳු කටයුත්තක් උපන්කල්හි නුවණ නැති ඉසුරුමත් තැනැත්තේ නුවණ ඇත්තවූ ගැත්තෙකුමෙන් පවත්නේය, නුවණැත්තේ ප්‍රඥාවෙන් කටයුතුවූ සියුම්වූ යුක්ති ආදි යම් ගැටමුසු කාරණයක් සැක හැරකියාද එබඳු කාරණයෙහි නුවණ නැත්තේ අවලොකනය කොටගත නොහී ඒක්ෂණයෙහි කණ ගෙරිවල් වන්නාසේ මුළාබවට පැමිණෙන්නේය, මේ කාරණය දැක නුවණැත්තෝම උතුම, සම්පත්ඇති නුවණ නැත්තෝ උතුම් නොවෙති"යි කීහ. මෙරගල් මුදුනෙහි සත් රුවන් ගෙණහැර වගුරවන්නාක්හු මෙන්ද, ආකාශයෙහි පුන් සඳමඬල ඔසවා පානාක්හු මෙන්ද උත්තර ගෙණහැරදැක්වූසේක. මෙසේ මහබෝසතාණන්වහන්සේ විසින් නුවණෙහි අරුම වදාළකල්හි, ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ සේනක පණ්ඩිතයන්ට "කිමෙක්ද සේනකයිනි පෝසතුනම් උත්තරයක් කියව"යි කීහ.

සේනකයාත් කොටුවෙහි පටවාතිබූ වී කා නිමවා කොටුපත්ල අනගාපියා රැකෙන මාන සිතන එකක්හුමෙන් උගත් උගත් තරම නිමවාපියා මත්තෙහි වැටහෙන උත්තරයක් නැත්තේ, එසේහෙයින් කරබාගෙණ කොඳුර කොඳුරා සිනිවිද්ලේ හුන්නේය. ඉදින් ඒ සේනකයෝ අනික් උත්තරයක් ගෙණහැර කිවුනම් ගාථා දහසකින්වත් * මේ උම්මග්ගජාතකය නොනිමෙන්නේය, ඒ සේනකයන් කියහෙන උත්තරයක් නැති කල්හි ගැඹුරු මහවතුරක් එක පැහැර නමන්නාක්හු මෙන්ද ආකාශ ගංගාව පොළෝතලයට බහන්නක්හු මෙන්ද, මහබෝසතාණන්වහන්සේ මත්තේ ප්‍රඥා වර්ණනා කරණසේක් ගාථාවකින් "ඒකාන්තයෙන් බුදු පසේබුදු මහ රහතුන් ආදිවූ නුවණැත්තවුන් විසින් නුවණ උතුමැයි පසස්නාලද, යම් හෙයකින් නුවණ නැති මිනිස්සු සම්පතෙයි ඇලුනාහුමනම් එහෙයින් ශ්‍රීකාන්තාව උතුමැයි කියති, මේලොව පරලොව දන්නා නුවණින් වැඩිසිටියන්ට මේ යසස්

* ගාථාසහස්සෙනාපි.

නම් ගැරවිල් කුණක් හා සමානය. ප්‍රඥව අසදෘශවූ ස්වරූප ඇත්තීය, එසේහෙයින් මහා සාගරයට වෙරළ ඉක්මගත නොහෙන්නාසේ ශ්‍රීකාන්තාතොමෝ කිසිකලෙකත් ප්‍රඥවන්තයා ඉක්මගත නොහෙන්නිය, දේවයන්වහන්සැ” යි වදළසේක. .

ඒ අසා රජ්ජුරුවෝ මහබෝසතානන්වහන්සේගේ ප්‍රශ්න විසර්ජනයෙන් සතුටුව බුදුකෙනෙකුන් පරිද්දෙන් අපට විසඳූ කිහ, ඒ තොපගේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි සතුටුවූ මම, ගෙරි දහසක්ද නැගෙන්නට උතුම් හස්ත්‍යලංකාරයෙන් සරහනලද්දවූ සුශික්ෂිත හස්තිරාජයෙක්ද, අජානිය අසුන් යොදනලද රථාලංකාරයෙන් සරහනලද රථ දසයක්ද, ධන ධාන්‍යයෙන් සමෘඬවූ එකෙකි ගමින් අවුරුද්දකට ලක්‍ෂයක් බැගින් අය තිමන ගම් සොළසක්ද යන මෙකී වස්තූන් තොපට දෙම්” කියා සියලුල දෙවූහ. —සිරිමඟ ප්‍රශ්නය නිමි.

---

එතැන්පටන්කොට මහබෝසතානන්වහන්සේගේ යසස කිරිමුහුද රළ පරිද්දෙන් මහත්වූයේය. ඒ සියලුම සම්පත් බූනනියෝ උදුම්බරාදේවීම පිවාරත්. බෝසතානන්වහන්සේ සොළොස් හැවිරිදිවූකල “මාගේ මලනුවෝ වැඩිමාලුව ගත්හ, උන්ගේ යසයත් මහත, උන්ට සමාන කුලයකින් සරණපාවා දෙනබව සුදුසුය”යි සිතූහ. මෙසේ සිතා, එපවත් රජ්ජුරුවන්ට දැන්වූය; රජ්ජුරුවෝ අසා සොම්නස්ව “යහපත සොඳුර එපවත් උන්ට කියව”යි කීහ. දේවීත් මහබෝසතානන්වහන්සේට එපවත් දැන්වූය. එපවත් පණ්ඩිතයන්වහන්සේ විසින් ‘යහපතැ’යි ගිවිසිකල්හි “එසේවිනම් මල ඹබ සුදුසු තැනකින් කුමාරිකාවක් ගෙණමෝද”යි කීහ. මහබෝසතානන්වහන්සේ “ඉදින් මූන්වහන්සේලා විසින් ගෙන්වා, පාවාදෙනලද කුමාරිකාව කිසිසේත් මට අභිප්‍රාය නොවන්නිය; එහෙයින් මමම පළමුකොට සුදුසු එකක් පරීක්‍ෂාකෙරෙම්” සිතා “දේවීන්වහන්ස කීපදවසක් රජ්ජුරුවන්වහන්සේට මා අසවල් කාරියකට ගියයි නොකීව මැනව, එක් කුමාරිකාවක් පරීක්‍ෂාකොට මට අභිප්‍රාය එකක් ලදිම්නම්, නුඹවහන්සේට දන්වාලම්” කීහ. බිසවුන් විසින් “යහපත මල ඹබ එලෙසක් කරවයි” කීකල්හි, මහබෝසතානන්වහන්සේ බිසව් වැඳ තමන් තමන්වහන්සේගේ ගෙට ගොස්, ගිහ මිත්‍රයන්ට එපවත් කියා, එක්තරා වෙශයකින් සන්නාලි උපකරණ ගෙණ, උදකලාවම උතුරු වාසල්දෙරින් නික්ම උතුරුයවමැදුම්ගමට වැඩිසේක.

එසමයෙහි උතුරු යවමැදුම්ගම දුක්පත්ව සිටි පුරාතන සිටුකුලයෙක් විය, ඒ සිටුකුලයෙහි අමරාදේවී නම් එකම දුවනි කෙනෙක් බැලූවන්ට ප්‍රියකරවූ රූ ඇත්තාහ. සියලු ස්ත්‍රීලක්‍ෂණයෙන් සම්පන්නයහ, මහ පින් ඇත්තාහ. ඒ අමරාදේවී තුමූ එදවස්ම, හුළුකැන් පිස ගෙණ “පියානන් සානා තැනට යෙම්”

නික්ම, මහබෝසතාණන්වහන්සේ වඩනා මගට පිළිපන්හ. මහබෝසතාණන්වහන්සේ ඉදිරියට එන්නාවූ ඒ කුමාරිකාව දැක ස්ත්‍රීලක්‍ෂණයෙන් සමන්විතස්ත්‍රියෙක, ඉදින් ස්වාමින් නැත්තිනම් මෝ තොමෝ මට බිරින්දට සුදුසුය"යි සිතූසේක. ඒ අමරාදේවී මහබෝසතාණන්වහන්සේ දැකලාම * "ඉදින් මෙබඳු පුරුෂයකුගේ ගෙයි වූයෙම්නම්, කුටුම්බ සංස්ථාපනය කරන්ට හෙවත් වස්තු රැස් කරන්ට පිළිවනැ"යි සිතූහ. ඉක්බිත්තෙන් මහබෝසතාණන්වහන්සේ "මෑගේ සැමියන් ඇති නැති බව නොදනිමි, එපවත් හස්තමුද්‍රාවෙන් විචාරමි, ඉදින් මෝ නුවණැත්තීවීනම්, හස්තමුද්‍රාවෙන් විචාළා දැනගන්නිය"යි සිතා, දුරම සිට ඇඟිලි හකුළුවා මිටකළසේක. ඒ අමරාදේවීත් "මේ පුරුෂයා මාගෙන් සැමියන් ඇත්ත නැත්ත විචාරන්නේය"යි දැන අත්ල විදළූහ. මහබෝසතාණන්වහන්සේ සරණ නුහුනු බව දැන සමීපයට ගොස් "සොඳුර තොපි කිනම්මුද්ද"යි විචාළසේක. "ස්වාමිනි ගියදවස වේවයි දුන් වේවයි මතු දවස වේවයි සමස්ත ලෝකයෙහි යම් නමෙක් නැත්නම්, මම ඒ නමි" කීහ. "සොඳුර ලොව උපන් සතුන්ගෙන් නොමියන කෙනෙකුත් නැතිහෙයින් 'අමරා' නාමය නැත්තේය; තෙපි එ නම්මුද්ද"යි විචාළසේක. "එසේය ස්වාමිනි"යි කීහ. සොඳුර කවුරුන්ට කැඳ ගෙණයව්ද"යි විචාළසේක. 'පූර්ව දේවතාවන්ටය''යි කීහ, 'තොපගේ පියානන්ට කැඳ ගෙණයව්ද''යි විචාළේය. 'ස්වාමිනි එසේය' යි කීහ. 'තොපගේ පියානෝ කුමක් කෙරෙද්ද' යි විචාළසේක. එකක් දෙකක් කෙරෙති' කීහ. "එකක් දෙකක් කිරීම නම් සී සෑමය, සී සාදයි සොඳුර" වදාළසේක. 'ස්වාමිනි එසේය' යි කීහ. තොපගේ පියානෝ කොතනක සාද්ද' යි වදාළසේක. "යම් තෙනකට එකවරක් ගිය කෙනෙක් නොඑද්ද, එතනය" යි කීහ. එකවිටක ගිය කෙනෙකුන්ගේ පසුව නොයෙන තෙන සුසානය, සොඳුර සොහොනක් සමීපයෙහි සාද්ද''යි විචාළසේක. "එසේය ස්වාමිනි" කීහ. සොඳුර අදම එව්ද' යි විචාළසේක. "ඉදින් ආවහොත් නොඑමි" නාවොත් එමි" කීහ. "සොඳුර තොපගේ පියානෝ ගඟකින් එතරක සාති; එයට කාරණා කිමෙක්දැයි යනහොත් ගඟ දිය ආවොත් නොඑන නියාය, දිය නොආවොත් එනහෙයිනැ"යි වදාළසේක. 'එසේය ස්වාමිනි කීහ.

මෙසේ මෙපමණක් පෙර පසු කථාකොට අමරාදේවී තුමූ 'හුළු කැන් පුවමැනව ස්වාමිනි' පැවරූහ. බෝසතාණන්වහන්සේ "ආදියෙන් කී පෙරළත්න නොඉවසීම අවමඞ්ගල්‍යය"යි සිතා 'යහපත බොමි' වදාළසේක. අමරාදේවී කැඳසැළිය ඉසින් බාතුබූහ. මහබෝසතාණන්වහන්සේ "ඉදින් මණ්ඩය නොදෙව, අතට පැන් නොදම, කැඳ අතට දිනි නම්, මෙතනම හැරපයා

* දිස්සාව.

යෙමි" සිතූසේක. ඒ අමරාදේවී වනාහි මණ්ඩයෙන් පැන් ඇර ගෙණ අවුත් අතට දීලා, සිස්මණ්ඩය අත නොතබා බිම තබාලා, සැළියේ කැඳඅලලා හුළුකැන් මණ්ඩය පුරාලූහ. වැලින් ඒ කැඳෙහි හුළු මද වූයේය. ඉක්බිති බෝසතානන්වහන්සේ "කිමෙක්ද සොඳුර හුළුකැන් ඉතාම බොල්වනැයි වදාළසේක. පැන් "නො ලද්දේයයි ස්වාමිනි" කීහ. "තොපගේ කුඹුර පූදිනා අග දිය නොලදූයි සිතමි" වදාළසේක; අමරාදේවීත් 'එසේය ස්වාමිනි' කීහ. අමරාදේවී පියානන්ට හුළුකැන් තබා බෝසතානන්වහන් සේට හුළුකැන් පෙවූහ. උන්වහන්සේ හුළුකැන් අනුභවකොට අත කට සෝධා "සොඳුර තොපගේ ගෙට යම්හ, අපට මගකිය ව"යි වදාළසේක. අමරාදේවි 'යහපතැයි' කියා තමන්ගේ ගෙට මග කියන්නාහු "මේ මග ඔස්සේ ගොස් ඇතුළු ගමට වන්කල යම් තෙනක හස්සුණු තබා විකුණන සල්පිළද, ඉන් ඔබ්බට ගිය කල කැඳ තබාගෙණ විකුණන සල්පිල; ඉන් ඔබ්බට ගියකල පිපි සිටි කොබලිල ගසෙක් ඇත්තේය. ඒ ගස මුලට ගියකල යම් අතකින් අනුභවකරද්ද ඒ අත මග යන්ට කියමි, යම් අත කින් නොකද්ද ඒ අත යන්ට නොකියමි හෙවත් දකුණත මග වැ සියමැනව, ඒ මගය, හෙවත් යවමැදුම්ගම අපගේ දෙමව්පියන් ගේ ගෙට මගය, මා සඟවා කී මග දැන වදාළමැනව"යි කීහ. ඡන්නපථ ප්‍රශ්නය නිමි.

---

මෙසේ ඒ අමරාදේවී බෝධිසත්ත්වයන්වහන්සේට මග කියාලා, පියානන්ට හුළුකැන් ඇරගෙණ නැගී ගියහ. මහබෝසතානන් වහන්සේත් අමරාදේවීන් කී මගින් උන්ගේ ගෙට වැඩිසේක, ඉක් බිත්තෙන් අමරාදේවීන්ගේ මෑනියෝ පණ්ඩිතයන්වහන්සේ දැක හිඳිනට අස්නක් දීලා 'පුත කැඳ බොන පරිද්දෙන් හුළුකැන් අනට වඩාලම්ද'යි කීහ. මෑනියන්වහන්ස අපගේ නැගනියෝ අමරා දේවි කැඳින්නක් පෙවූහ"යි වදාළසේක. අමරාදේවීන්ගේ මෑනි යෝ "මාගේ දියනියන් නිසා ආ කෙනෙක් වනැ"යි සිතූහ. මහ බෝසතානන්වහන්සේ උන් දුක්පත් නියාව දන්නාහුද "මෑනි යන්වහන්ස මම සන්නාලියෙකිමි, ගෙත්තම් කටයුතුවූ කිසි වක් ඇද්ද"යි විචාළහ. "පුත ඈඳ විද්දයුතු කොට්ට මාවුලාආදිය ඇත, ඒ විද්ද ගෙණදිලන්ට සුදුසු මිළයෙක් නැතැ"යි කීහ. මෑනි යන්වහන්ස මිළයෙන් කාරියෙක් නැත, ගෙණෙව විදදිලම්" වදාළසේක. අමරාදේවීන්ගේ මෑනියෝ කඩරෙදි හැරගෙණ ගෙත්තම් කරණ පරිද්දෙන් දුන්හ. * මහබෝසතානන්වහන්සේ ගෙණ ගෙණා රෙදි හා උවමනා උවමනා දෙයද නිමවූසේක්මය. පිනැත්තන් කරණ දෙය සිතූලෙසටම සමෘඬ වන්නේය. ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයන්වහන්සේ අමරාදේවීන්ගේ මෑනි

---

* බොධිසත්තො ආහටාහටං නිඨපෙත්වෙව.

සන්ට 'මැනියෙනි වීපියක් පාසා අඩගාපියව'යි වදාළසේක. අමරාදේවින්ගේ මැනියෝ ගම මුළුල්ලේම අඩගෑහ. මහබෝසතානන්වහන්සේ ගම ඇත්නත් ගෙණගෙණා කඩින් සන්නාලි මේ වරකොට එකදවසින්ම මසු දහසක් ලත්සේක. අමරාදේවීන්ගේ මැනියෝද බෝධිසත්ත්වයන්වහන්සේටදවල් බත්පිස කවා 'පුත ඹබ රට සාල් කෙතෙක් ගරම්දැ"යි විචාළාහ. මැනියන්වහන්ස මේ ගෙයි යම් පමණෙක් කත්නම් එපමණින්ම බත් පිසුව මැනව'යි වදාළසේක. අමරාදේවීන්ගේ මැනියෝත් බොහෝවූ රසමසවුලෙන් යුක්තකොට බත්පිසූහ.* අමරාදේවින් ඉසින් දරමිටියක් හා හිනින් පලා හිනක් ඇරගෙණ වලින් අවුත්, ඉදිරියේ දොර දර මිටිය හෙළා පැලදොරින් ගෙට වන්නුය. උන්ගේ පියානෝ වනාහි ඇදිරිගෑසී ගියකල ගෙට ආහ. බෝධිසත්ත්වයන්වහන්සේට අනෙකප්‍රකාර අනගි රසයෙන් යුක්තවූ ආහාර අනුභවකරවූහ. අමරාදේවි මව්පිය දෙදෙන බත් කවා පසුව තුමූත් කා, මව්පිය දෙදෙනා පය සෝදවා තෙල් ගල්වා, මහබෝසතානන්වහන්සේ පය සෝදවා තෙල් ගැල්වූහ. පණ්ඩිතයන්වහන්සේ අමරාදේවින් විමසනසේක් කිපදවසක් † එහිම විසූසේක.

ඉක්බිත්තෙන් එක් දවසක් උන් විමසනසේක් "සොඳුර අමරාදේවිනි සාල් මනාවක් පමණ ඇරගෙණ, ඉන් මට කැඳත් බතුත් අවුලුපතුත් පිසව"යි වදාළසේක. අමරාදේවින් "එක සාල් මනාවෙන් මෙතෙක්දෑ කෙසේ පිසම්දැ"යි නොකියා 'යහපතැයි' වදාළ බස ගිවිස, ඒ සාල් මනාව පැස මුල් සාලින් බත්ද කඩසාලින් කැඳද සුන්සාලින් කැවුම්ද පිස, ඊට සුදුසුවූ අවුලුත් පිස, මහබෝසතානන්වහන්සේට අවුලු සහිත කැඳ දුන්හ. කැඳ කබලක් මුඛයට ගත් පමණකින්ම සියලු රසනහරවැල් පිණා සිටගත්තේය. පණ්ඩිතයන්වහන්සේ උන් විමසන පිණිසම ‡ "සොඳුර තොප පිසමන් නොදන්නාකල කුමක් පිණිස මාගේ සාල් නසාපූදැ"යි කියා කෙල හා සමග මුඛයට ගත් කැඳ කබල කාරා දමාපීසේක. අමරාදේවීන් නොකිපීම 'කැඳ යහපත් නොවීනම් කැවුම් කැවමැනව ස්වාමිනි' කියා අතට දුන්හ. කැවුම් මුඛයෙහි තිබූ පමණකින්ම රසනහරවැල් පිණාගියේය. එසේම කාරා දැමූසේක. ඊටත් නොකිපීම 'එසේවිනම් බත් අනුභවකළ මැනව'යි කියා බත් අත තිබූහ. එයින් ආලෝපයක් මුඛයෙහි තබන්නාම සියලු රසනහරවැල් පිණාගියේය. බෝධිසත්ත්වයන්වහන්සේ "තොප පිසමන් නොදන්නාකල මා දුකසේ සොයාගත් දෙය කුමට නැසූදැ"යි කිපි කෙනෙකුන්මෙන් තුන් වගයම එක්කොට අඹරාපියා, අමරාදේවින් ඉස පටන් ඇඟ මුළුල්ලෙහි ගල්වා දොර අවවෙහි සිටින්ට වදාළසේක. අමරාදේවීන් ඊට මදකුත් නොකිපී 'යහපත ස්වාමීනි'

* අමරාදේවීපි. † තයෝචවසි. ‡ විමංසනත්‍ථමෙව

දෙරඅව්වෙහි හුන්නාහ. මහබෝසතානන්වහන්සේ අමරාදේවීන් මත්නැතිබව දැන, 'සොඳුර මෙහි එව'යි වදාළසේක. ඔයින් දෙවිටක් නොකැඳවනතුරු එක බසින්ම සමීපයට අවුය. මහබෝසතානන්වහන්සේ නුවරින් එනසේක්ම මසුදහසක් හා එක්සීන් කඩක් බුලත්පයියෙහි ලා වැඩිසේක. උන්වහන්සේ ඒ කඩ මැන්කොට අමරාදේවීන් අත තබා "සොඳුර නොපගේ සෙහෙලනියන් සමග හොසින් නාපියා මේ කඩ ඇඳගෙණ එව"යි වදාළසේක. ඔයින් වදාළ ලෙසම කළහ. පණ්ඩිතයන්වහන්සේ සන්නාලිකමින් උපයාගත් මසුරන්ද නුවරසිට ගෙණා මසුරන්ද යනමේ සියල්ල අමරාදේවින්ගේ මව්පිය දෙදෙනාට දීලා, දෙමහල්ලන්ට "නුඹවහන්සේ රක්ෂාවට නොසිතුව මැනව"යි අස්වසා, අමරාදේවින් හැරගෙණ නුවරටගොස්, නවත් විමසන පිණිස දෙරටුපාලයගේ ගෙයි ඉඳුවා, දෙරටුපාලයාගේ අඹුවට සවරූප කියාලා තමන්වහන්සේ ගෙටගොස් පිරිමින් දෙදෙනෙකු කැඳවා "අසවල්ගෙයි ගැණියෙකු රඳවා ආමි; මසු දහසක් ඇරගෙණ ගොස් ඇ විමසව"යි මසුදහසදී යවූසේක. උයින් බෝධිසත්ත්වයන් වදාළ ලෙසම ගොස්, අමරාදේවින්ට මසුදහස දික්කොට විචාළහ. අමරාදේවී "මේ මසුදහස මාගේ සමුණන්ගේ පයපිසුන් නොඅගනේය"යි කියා උන්කිඹස් නොගිවිස්සාහ. ඒ පුරුෂයෝ ගොස් පණ්ඩිතයන්වහන්සේට දැන්වූහ. ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයන්වහන්සේ ඒ පුරුෂයන් නැවතනැවත තුන්වරක් දක්වා යවා නොගිවිස්නා හෙයින් සතරවන වාරයෙහි "එසේවිනම් ඇ අත අල්වා ඇදගෙණ එව"යි වදාළසේක. ඒ පුරුෂයෝගොස් නොකැමතිපරිද්දෙන් ඇදගෙණ ගියහ.

අමරාදේවී මහබෝසතානන්වහන්සේ සැපතෙහි සිටියහෙයින් හැඳිනගතනොහී මූණබලා සිනාසුනාහ. හඬාත්පිහ, පණ්ඩිතයන්වහන්සේ අමරාදේවී සිනාසුනු කාරණයත් හැඬූ කාරණයත් විචාළසේක. ඉක්බිති බෝධිසත්ත්වයන්වහන්සේට අමරාදේවී "ස්වාමිනි නුඹවහන්සේගේ මූණබලා සිනාසෙන්නෙම්, ඔබවහන්සේගේ දිව්‍යසැපතක් හා සමානවූ සැපත් බලා මේ සම්පත් නොකාරණයෙනුත් ලදදෙයක් නොවෙයි, පූර්වජාතියෙහි පින්කම්කොට ලබනලද කුසලකර්මයාගේ විපාකය නොසිතියහැකි නිසායයි සිතා, සමාධින් සිනාසුනිමි; හඬන්නෙම් වනාහි, දැන් 'මබස් පත ලැබෙයි කියා අනුන් විසින් රක්ෂිත ගොපිතව සිටි ස්ත්‍රීන් කරා එළඹ, හෙවත් පරදාරකර්මකොට මතු නරකයට යන්නාහයි සිතා ඔබවහන්සේ කෙරෙහි දයාවෙන් හැඬීමි"කීහ. බෝධිසත්ත්වයන්වහන්සේ උන් පරීක්ෂාකොට පිරිසිදු අදහස් ඇතිබව දැන "යවමුන් මෙසේ මා නොගිවිස්නෙන් උන්ගෙණා නෙනම ලාපියව"යි

කියා අමරාදේවීන් යවා, නැවත තමන්වහන්සේ සන්නාලි වෙස් ගෙණ එදා රෑ උන්දෑගේ ලඟට ගොස් සැතපිලා, දෙවන දවස් උදෑසනක්සේ රජගෙට ගොස් උදුම්බරාදේවීන්ට සුදුසු කුමාරිකාවක් ගෙණාබව වදාළසේක. බිසවුන් රජ්ජුරුවන්ට එපවත් කියා අමරාදේවීන්, පාමුදු පාඩගන් පාසලඹ පාදජාලා ශිරෝජාලා කණාභරණ ග්‍රීවාලඞ්කාර කෙපෝට්ටු සිරිකන් ආදිවූ සියලු ස්ත්‍රී ආභරණයෙන් සරහා, මහත් ගිදෙළුවෙක ගිදුවාලා, ඉක්බිති රජ්ජුරුවන්ගේ විධානයෙන් ඒසා මහත් සත්යොදුන් මියුලුනුවර නොයෙක් පරිද්දෙන් සරහා රන් ධජ නගා විසිතුරුකොට සරහා නිමවනලද උතුම්වූ මංගල රථයෙක්හි වඩා ''රථයෙහි දේවීන් උන්හොත් කැළිබවත් මිටිබවත් රූ ඇතිබවත් නැතිබවත් නුවරවාසීන්ට නොපෙණෙන්නේවේදෑ"යි සිතා, දේවීන්ගේ රූප විලාසය නුවරවාසී සියල්ලන්ම සුවසේ දක්නා පරිද්දෙන් රථයෙහි සිටුවා, දේවතාවන් හා සමග විමියෙහි නමාගත් තරුණ දිව්‍ය ස්ත්‍රියකු පරිද්දෙන් මහපෙරහරින් මහබෝසතාණන්ගේ ගෙට ගෙණවුත් සරණපාවාදී මගුල්කළහ. රජ්ජුරුවෝ බෝධිසත්වයන්ගේ සරණ මගුලෙහි එකී එකී වස්තුවෙන් දහසක් ගණන් මිළ වටනා පඬුරු යැවූහ. රජ්ජුරුවන් ආදිකොට වාසල් බලන්නවුන් ඇතුළුව ගොපල්ලන් දක්වාත් මියුලු නුවර වාසීන් ගෙන් පඬුරෙක් නොගෙණ ගිය එකද සත්වයෙක් නැත. අමරාදේවිද රජ්ජුරුවන් යැවූ පඬුරු සමයේ දෙකක්කොට බෙදා, එක් භාගයක් නෙටගෙණ අනිත් භාගය නැවත රජ්ජුරුවන්ට යැවූ දැය, මෙම ක්‍රමයෙන් උදුම්බරාදේවීන් ඇතුලුවූ නුවර වාසීන් විසින් එවනලද සියලු පඬුරු සරියේ දෙකක්කොට බෙදා භාගයක් ගෙණ නැවත භාගයක් උන් උන්ට යවා, ඒසා මියුලුනුවර වාසීන් හැමදෙනම එකදවසින් එක ඇසිල්ලෙන්ම සිත්ගත්හ. එවක්පටන් තුන්ලොවට ඇසක් වැනි මාගේ බොධිසත්වයන්වහන්සේ අමරාදේවින් හා සමගි වාසයෙන් වාසයකරණසේක් රජ්ජුරුවන්ට අර්ථයෙන් හා ධර්මයෙන් අනුශාසනා කළසේක.—

ස්ත්‍රී ප්‍රශනය නිම්.

---

**ඉක්බිති** එක්දවසක් සේනක පණ්ඩිතයෝ පුක්කුසාදී අනිත් තුන්දෙනා තමන් සම්පයට අවුත් බණවා "පින්වත්නි අපි ගොවිය, පුතු මහෞෂධ පණ්ඩිතයාට නොසැහෙම්හ, දැන්වනාහි ගොවියා පුතු විසින් තමාට වඩා වියත් අඹුවක් ගෙණෙනලදු; කිසිවක් කියා රජ්ජුරුවන්කෙරේ ඌ බිඳුවාපුව මැනව"යි කීහ. ආචාරීන්වහන්ස අපි කුමක් කරමෝද නුඹවහන්සේම ඊට සුදුසු කාරණා සිතුව මැනව"යි කීහ. "වන්නාටය, නෙපි නොසිතව, උපායෙක් ඇත; මම රජ්ජුරුවන්ගේ චූඩාමාණික්‍යය සොරා ගෙණෙම්, පුක්

කුසයෙනි තෙපි රත්මාලාව ගෙණෙව; කාවින්දයෙනි තෙපි රජ්ජුරුවන් පොරවනා පලස ගෙණෙව; දේවින්දයෙනි තෙපි රන්මිරිවැඩිසගල ගෙණෙව"යි කීහ. මෙසේ ඔහු සතරදෙනම වංචාවෙන් යටකී වස්තු සතර රජගෙන් පිටත්කොට ගත්හ. ඉක්බිත්තෙන් "බොහෝදෙනා නොදන්වා ගොවියාපුතු ගෙට යවම්හ"යි කියා සේනකයෝ පළමුකොට තමන්ගත් මැණික මොර කළයක බහාලා, කෙල්ලක අත තබා "මොර කළය අනික් කෙනෙකුන්ට ගනිතොත් නොදී, මහෞෂධ පණ්ඩිතයන්ගේගෙයි ඉදින් ගනින්නම් මිළ නොගෙණ කළයෙන්ම දිපියා එව"යි කියාලා යවූහ.

ඒ කෙලි පණ්ඩිතයන් වහන්සේගේ ගෙදරට ගොස් 'මොර ගනුව'යි කියා දුරටත් නොගොස් ඊ දූවටෙන්නිය. අමරාදේවී දෙරසිටි තැනැත්තෝ ඒ කෙල්ලගේ ක්‍රියාවදැක "මෝ අන්ක්තැනකට නොගොස් මෙතනම දූවටෙන්නිය; එක් කාරණයක් උවමැනවැ"යි සිතා තමන් ගෙයි කෙල්ලන්ට ඉඟිකොට ඔබ්බට යවා තුමූම "අම්ම මෙසේ එව මොර ගනුම්හ"යි ඒ කෙල්ල බණවා ඇ තමන් සමීපයට ආකල්හි, තමන්ගේ කෙල්ලන් අඬනා ආදිම කියාලූ හෙයින් නොඇසූවාසේ තමන් සමීපයට නොඑන්නා "යව අපගේ කෙල්ලන් මෙතනට බණවාලව"යි ඇම යවා, කළයෙහි අතලා ඇතුළෙහි තුබූ මැණික දැක ලහට ආ කෙල්ලට "මැනියෙනි තෙපි කවුරුන් සමීපයෙහිසිට අවිදු"යි විචාරා "සේනක පණ්ඩිතයන්වහන්සේගේ කෙල්ලකිම්" කී කල්හි ඉක්බිති ඈගේද මවගේද නම් විචාරා "එසේවිනම් මොර දෙව"යි කියා "අම්ම නුඹදෑ මොරගන්නා කල මට මිලයෙන්කාරිය කිම්ද කළයෙන්ම ගතමැනමැනව"යි කී කල්හි 'එසේවිනම් යව'යි කියා ඈ යවා "අසවල් මස අසවල් දවස සේනකචාරීහු තුමූ තමන්ගේ අසවල් කෙල්ල දුව අසවල් තැනැත්තිය අත රජ්ජුරුවන්වහන්සේගේ චූඩා මාණික්‍යය පණයම් පිණිස එවූහ"යි පතෙක ලියාගත්හ.

පුක්කුස පණ්ඩිතයෝ රත්මාලාව සමන්මල් කරඬුවක ලාලා සේනක ආචාරීන් යවූ ලෙසම යැවූහ. කාවින්ද පණ්ඩිතයෝ පලස පලාපැසෙක ලාලා යැවූහ. දේවින්ද පණ්ඩිතයෝ රත්මිරිවැඩි සගල පිදුරු කැරැල්ලක් ඇතුළේ ලාලා යැවූහ, අමරාදේවී උන් හැම්දෙනා යවූ දෙය හැරගෙණ පතෙක වක දවස හා ගියවුන්ගේ නම් ලියා මහබෝසතාණන්වහන්සේට ස්වරූප කියාලා තබාලූහ. ඒ සේනකාදි සතරදෙනම වස්තු සතර උපායෙන් බෝසතානන්ගේ ගෙට යවා රජගෙට ගොස් "කිමෙක්ද දේවයන්වහන්ස ඔබවහන්සේගේ ආභරණවූ චූඩාමාණික්‍යය නොපළඳනා සේක්

ද"යි විචාළහ. "පලඳිමි ගෙණෙව"යි කීහ. මැණික භාණ්ඩාගාරයේ සොයා නුදුටුවහ. සෙස්සත් එසේමය. *

ඉක්බිත්තෙන් සේනකාදි සතරදෙනම "දේවයන්වහන්ස ඔබවහන්සේගේ ආභරණ මහෞෂධපණ්ඩිතයන් ගෙනිය, තුමූ එකී වස්තු පලඳින්නාහ. දේවයන්වහන්ස ගොව්යාපින් නුඹවහන්සේට සතුරුය"යි රජ්ජුරුවන් කෙරේ බෝසතාණන් බිඳවූහ. ඉක්බිත්තෙන් එපවත් බෝසතාණන්වහන්සේට වැඩපසස්නා මිනිස්සු ගොස් කීහ. පණ්ඩිතයන්වහන්සේත් "රජ්ජුරුවන් දැක ඒ ස්වරූප දනිමි"යි රාජසේවයට වැඩිසේක. "රජ්ජුරුවෝත් සේනකාදි දුර්ජනයන්ගේ බස් අසා මහබෝසතාණන්වහන්සේට කිපී 'නොදකිමි නුඹ අවුත් කුමක්කෙරේද"යි තමන් දක්ක නුදුන්හ. පණ්ඩිතයන්වහන්සේ රජ්ජුරුවන් කිපි බවදැන 'පලායන්ට සුදුසුකලැ'යි අමරාදේවීන්ට සලකුණුදී අප්‍රසිද්ධ වෙශයෙන් නුවරින් නික්ම, දකුණු යවමැදුම්ගමට ගොස් කුඹල්ගෙයක කුඹල්කම්කොට වසනසේක. නුවර මුළුල්ලෙහිත් "මහෞෂධපණ්ඩිතයෝ පලාගියහ"යි එක කෝලාහලව ගියේය. සේනකාදි සතරදෙනම පණ්ඩිතයන්වහන්සේ පලාගියබව දැන, කනස්සළු නොවන්නාහු, කිමෙක්ද අපිත් පණ්ඩිතවරු නොවමෝද"යි ඔවුනොවුන් නොදත් නාම අමරාදේවීන්ට පත් යවූහ. අමරාදේවී සේනකාදි සතරදෙනම යවූ පත් අතටගෙණ 'අසවල්වේලාවට එන්නේය'යි කියා යවා, වෙන වෙනම උන් තමන් තමන්ට අවධිකළ වේලාවට ආකල්හි, අල්වාගෙණ නොසැලෙන අන්දමට බන්දවාලා ඉසකේ කප්පවා පරණ නානා ගෙයක හෙළවා බොහෝ දුකට පමුණුවා පැදුරැමාලු හා පැස්මාලුවල හොවා වසා බන්දවා රජ්ජුරුවන්ට කියා යවා, ඒපණ්ඩිතවරුන් සතරදෙනා හා සමග වස්තු සතරත් ගෙන්වාගෙණ ගොස් රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිට "දේවයන්වහන්ස මහෞෂධපණ්ඩිතයෝ සොර නොවෙති ඔබවහන්සේගේ භාඩාර සොරකම්කළෝ මේ සතරදෙනය, මුත් සතරදෙනාණෙත් සේනකයා මැණික්සොරාය, පුක්කුසයා රන්මාලා ගත් සොරාය, කාවින්දයා පලස් සොරාය, දේවින්දයා රන් මිරිවැඩි සොරාය, අසවල් මස අසවල් දවස් අසවල් කෙල්ලගේ දුව අසවල් තැනැත්තිය අත, මොහු සතරදෙන මෙකී වස්තු මට පණ්ඩුම් පිණිස එවූහ, මේ මා ලියාතුබූ පත් බලා වදාළමැනව, ඔබවහන්සේ සතු මෙකී වස්තු පාවාගත මැනව දේවයන් වහන්සැ"යි රජ්ජුරුවන් වැඳ ගෙට ගියහ. රජ්ජුරුවෝ බෝසතාණන් නැකී

---

* තෙපි චත්තාරෝ ජනා රාජකුලං ගන්ත්වා කිං දෙව තුම්හාකං චූළාමණිං නපිළන්ධථාති ආහංසු රාජාපිළන්ධිස්සාමි ආහරථාති ආහ මණිං න පස්සිංසු ඉතරානිපි න පස්සිංසු යෙව.

ගිය බැවින් උන්වහන්සේ කෙරේ සැකයෙන්ද අනික් මනත්‍රිකෙනෙකුත් නැති බැවින්ද සේනකාදි පණ්ඩිතවරුන් සතරදෙනාට කිසිවක් නොකියා 'නාපියා තොපගේ ගෙදරවලට යව'යි කීහ.

ඉක්බිති රජ්ජුරුවන් දළපුඩු සේසත අධිගෘහිත දේවතා දූ මහබෝසතානන්ගේ කුරවික නාදයක් හා සමානවූ කටහඩ විහිදුවා වදුරන්නාවූ මිහිරි ධර්‍ම දෙශනාවෙහි ශබ්ද නොඅසන්නී "කිමෙක්දෝහෝ"යි පරීක්‍ෂාකොට ඒකාරණය දැන "පණ්ඩිතයන් ගෙන්වන උපායක් කෙරෙමි"යි මධ්‍යම රාත්‍රියෙහි දළපුඩු සිදුරෙහි සිට අඩ ශරීරයක් දක්වා දේවතා ප්‍රශනයෙහි,

"හන්ති හත්ථෙහි පාදෙහි මුඛංච පරිසුම්භති:
සවෙ රාජ පියො හොති කං තෙන මභිපස්සසි"

යනාදි ගාථා සතරකින් දක්වනලද ප්‍රශන සතරක් රජ්ජුරුවන්ගෙන් විචාළහ. රජ්ජුරුවෝ එහි අර්ත්‍ථ නොදැන 'සේනකාදි පණ්ඩිතවරුන් විචාරමි'යි එක්දවසකට අවසර ඉල්වාගෙණ දෙවන දවස් 'පණ්ඩිතවරු සතරදෙන එත්ව'යි කියා යවා, පණ්ඩිතවරුන් විසින් "අපි මුඩුහිස් ඇරගෙණ වීථියට බස්නට විලි ඇන්නම්හ"යි කීකල්හි පයි සතරක් විද්දවා යවා 'තෙල ඉසලාගෙණ එත්ව'යි * කියා යවූහ. ඒ ඉසිපයි ඇතිවූයේ එතැන්පටන්කොටල. පණ්ඩිතවරු ඉස්පයි ඉසලා අවුත් රජ්ජුරුවන්වැඳ පණවනලද අසුන් මත්තෙහි හුන්හ. ඉක්බිති රජ්ජුරුවෝ "සේනකයිනි ඊයේ රෑ මධ්‍යම රාත්‍රි වේලෙහි දළපුඩු සේසත වසන දෙවිදූ මා පැණයක් විචාළිය. මම එහි අර්ත්‍ථය නොදන්නෙමි, පණ්ඩිතවරුන් විචාරමි, ඒ පැණය මට කියව"යි කියා,'හන්තිහත්ථෙහි පාදෙහි' යනාදි පළමුවන ගාථාව කීහ. සේනකයෝ ගාථාව අසා "කිං හන්ති කං හන්ති"යි කියා කටට ආ දෙයක් දෙඩා කිසිවක් දැනගත නුහුනුවහ. සෙස්සෝත් කිසිවක් කියාගත නොහි කරබාගත්හ.

රජ්ජුරුවෝ දොම්නස්ව, දෙවන දවස් රෑ දේවතාදූ විසින් "පැණසතරෙහි අර්ත්‍ථ දුටුද"යි විචාරණලද්දාහු"මා විසින් පණ්ඩිතවරුන් සතරදෙනා විචාරණලදහ. උයින් එහි අර්ත්‍ථ නොදන්හ"යි කීහ. දේවතාදූ "මූ හැමදෙනම කුමක් දනිද්ද මහෞෂධපණ්ඩිතයන් විනා අනික් මේ පැණය කියන්ට සමර්ත්‍ථ කෙනෙක් නැත, ඉදින් මහෞෂධපණ්ඩිතයන් ගෙන්වා මේ පැණය උත්ලවා නොකියවූනම් මේ දිලියෙන යකුලෙන් තොපගේ හිස සත්පළුවක් කොට "බිඳපියම්යි" රජ්ජුරුවන් භයගන්වා "රජ්ජුරුවෙනි ගින්නෙන් ප්‍රයෝජනයක් ඇතිකල්හි කණමැදිරියන් පිඹින්නටද කිරෙන් ප්‍රයෝජනයක් ඇතිකල්හි අඟ අල්වාගෙණ දෙනටද සුදුසු නොවන්නේය"යි කියා බජෝපණ ප්‍රශනයෙහි මේ මතු

* ඉමෙ සීසෙසු කත්වා ආගවජ්ජනතුනි.

කියන කාරණා කිම.— “ගිනි නැතිව ගිනිසොයා ඇවිදිනා පුරුෂයෙක් දිලියෙන්නාවූ කණ්දෙපැණියෙක් ‘ගිනි පුපුරකැ’යි සිතා ඒ කණ්දෙපැණියා මත්තෙහි ගොමවැරටි හා තණරොඩු පොඩිපොඩිකොට ලාලා ‘කණමැදිරියා ගිනිපුපුරකැ’යි යන විපරීත සලකුණෙන් දෙදන බිමඇන ඇස් පිපිරෙනතුරු පිඹත්, ගිනි දල් වාගත නොහේද, ඒ පරිද්දෙන් නුවණ නැති හෙයින් තිරිසනුන් හා සමානවූ නැනැත්තෝ උපායක් නැතිහෙයින් තමහට අභිවෘද්ධියක් නොලබන්නේය. පසමිතුරන්ට නිග්‍රහකිරීමෙන්ද සත්‍වයෝ නොයෙක් වැඩට පැමිණෙන්නාහ. සේනාවට නායක අමාත්‍යයන්ගේ ලැබීමෙන්ද වැඩ පසස්නා මිත්‍රයන්ගේ උපදෙශයන්ද රජදරුවෝත් රාජ්‍යයට පැමිණ වාසයකරන්නාහ. තොපසේ, නුවණැති අමාත්‍යයන් පලවාපියා නොවසන්නාහ. ගිනි තබා කණ්දෙපැණියන් පිඹින්නාසේද, ලොටතන තබා අඟ ගෙණ කිරි දොනා සේද; තරාදිය තබාලා අතින් කිරණසේද, මේ නියා ගැටමුසුපැණ මහෞෂධපණ්ඩිතයන් නොවිචාරා සේනකාදිවූ පණ්ඩිතවරුන් විචාරන්ට ඒ කොල්ලෝ කුමක් දනිද්ද? * උහුම කණ්දෙපැණියන් හා සමවූහ. ඉදින් තොපගේ පණරකිනා කැමැත්තෙහිනම් ගල් මුදුනෙක දිලියෙන මහ ගිනිකඳසේ නුවණින් දිලියෙන්නාවූ මහෞෂධපණ්ඩිතයන් ගෙන්වා විචාරා මට පැණ සතරෙහි අර්ථ කියාලව, එසේ නොකළෙහිනම් තොපගේ ජීවිතය නැතැ”යි රජ්ජුරුවන් භයගන්වා සැඟවී ගියාය.— බජෝපණප්‍රශනය නිමි,

---

ඉක්බිති රජ්ජුරුවෝ මරණබියෙන් තැතිගෙණ දෙවන දවස අමාත්‍යයන් සතරදෙනෙකු කැඳවාලා “දරුවෙනි තෙපි සතරදෙන රථ සතරක නැගී නුවර සතරවාසලින් නික්ම, යම් තෙනකදී මපුතනුවන් මහෞෂධණ්ඩිතයන් දුටුනම් එතනදීම උන්ට සත්කාරකොට වහා කැඳවා ගෙණ එව”යි කියා යවූහ. උන්සතරදෙනා අතුරෙන් දකුණුවාසලින් නික්මුණු අමාත්‍යයා දකුණුයව මැදුම්ගම මහබෝසතානන්වහන්සේ මැටි ඇරගෙණ කුඹල් ආචාරීන්ට සක වටා මැටිවැකුණු ඇඟින්ම පිදුරු බිස්සෙක හිඳ මිටිමිටිකොට ගෙණ යවසාලේ බත් අනුභවකරන්නාවුන් දුටුයේය. ‘කුමක් පිණිස එබඳු දුකෙක් ගෙණ කුඹල් කර්මාන්තය කළෙසේක්ද”යි යතහොත් මහෞෂධපණ්ඩිතයෝ මහා නුවණැත්තෝය, නිසැකයෙන් රාජ්‍යය ගන්නාහ”යි සැකයෙක් රජ්ජුරුවෝ කළෝනම් “කුඹල්කර්මාන්තකොට ජීවත්වනු අසා සැක නොවන්නාහ”යි සිතා මේ කාරණය පිණිස මෙබඳු දුකෙක් ගත්සේක. මහබෝසතානන්වහන්සේ රජ්ජුරුවන්ගේ අමාත්‍යයා දැක, තමන්වහන්සේ කැඳවා ආ බැව් දැන “මාගේ සම්පත පෙර පරිද්දෙන්ම

* බජෝපණක සදිසා එතෙ.

වන්නේය. අමරාදේවීන් විසින් ඉදිකරණලද අනගි රසඇති රස මසවුලෙන් යුක්තවූ බත්ම අනුභවකෙරෙමි"සිතා, අනිත්ගත් බත්පිඩ හෙළා නැඟීසිට අතකට සෝධාපියා සිටිසේක. ඒ ඇසිල් ලෙහිම අමාත්‍යයා ලඟට ගියේය. ඒ වැලිත් සේනකපණ්ඩිතයන් ලබඩි එකෙක, එහෙයින් මහබෝසතානන්වහන්සේට "පණ්ඩිතයෙනි ඉසුරුමත් නැනැත්තේ උතුමැයි යම් බසක් ආචාරී කිවුනම් ඒ සෙනක ආචාරී කී බස සැබව; තොපගේ යසස පිරිහුන කල්හි එබඳු නුවණ තොපට පිටිවහල්වන්ට නොපොහොසත්විය. දැන් මැටි වැකුණු ඇඟින් පිදුරුබිස්සෙක හිඳ මෙබඳු බතක් අනුභව කරව; ඉදින් තොපගේ වාදය සැබැවිනම් යසසින් පිරිහුනු තොපට තොපගේ නොපිරිහුනු වීයඞ්යත් සමෘති ශක්තියත් පිටිවහල් උවමනාවේදැ"යි කීය.

ඉක්බිති මහතානන්වහන්සේ "නුවණ නැත්තව මම මාගේ නුවණ බලයෙන් නැවත ඒ මාගේ පිරිහුනු සම්පත මුහුකරවන් නෙම් මේ සැඟවෙනු මනා කාලයයි මේ පිළියමට මනා කාලයයි කල් නොකල් දැන, රජ්ජුරුවන් කිපුණු කල සැඟවී ඇවිද සතුටු කල්හි එලිබැස, පෙර පරිද්දෙන් විදි සම්පතෙහි පිහිටන පිණිස කුඹල් කර්මාන්තකොට මෙබඳු රස නැති යවසාලේ බත් අනුභව කරන්නෙම් වීරියකරණයට කල්දැන, මාගේ නුවණින් පුරාතන සම්පතෙහි පිහිටා, සැටයොදුන් රත්ගල්තලා මුදුනෙහි විභ්‍රමණයකරණ සිංහරාජයක්හු මෙන් අසමහිතව හැසිරෙන්නෙම් දකුව"යි වදාලසේක. නැවත අමාත්‍යයා "රජ්ජුරුවන්ගේ සේසත වසන දෙව්දූ රජ්ජුරුවන් පැණ සතරක් විචාළිය. රජ්ජුරුවෝ සේනකාදි පණ්ඩිතවරුන් සතරදෙනා විචාලහ. එක්කෙණෙකුත් එ පැණය කියාගත නුහුනුවහ; එසේහෙයින් රජ්ජුරුවෝ තොප සම්පයට එවූහ"යි කීහ. එසේකල නුවණෙහි බල දුටුයෙනි වේද ? එසේවිට ඉසුරු සැපත් පිටිවහල්නොවෙන්නේය"යි මහතානන්වහන්සේ නුවණෙහි ආනුභාව වර්ණනාකලසේක. අමාත්‍යයා "පණ්ඩිතයන් දුටුතැනදී නහවාපියා හඳවාලා ගෙණව"යි කියා රජ්ජුරුවන් කීවිසින් දුන් පිළිසඟලත් මසුරන් දහසත් මහබෝසතානන්වහන්සේ අත තිබූයේය. කුඹලානෝත් 'මා මෙහෙගත්තේ මහෞෂධපණ්ඩිතයන් අනිනැ'යි සිතා බාගියහ. පණ්ඩිතයන්වහන්සේ "තොබව ආචාරිනි තොපි මට බොහෝ උපකාරිව සිටිය"යි අස්වසා කුඹලානන්ට මසු දහසදී මැටිවැකුණු ඇඟින් රථයෙහි හිඳ, සිතුනුසේ වනයෙහි ඇවිද වසන තෙනට ගමන් ගත් හස්තිරාජයෙකු පරිද්දෙන්, නුවරට වැඩිසේක. ඇමතියා රජ්ජුරුවන්ට බෝසතාණන්වහන්සේ වැඩි නියාව කීය. "පුත පණ්ඩිතයෝ තොප විසින් කොයිදී දක්නාලදහුදැ"යි කී කල්හි

දේවයන්වහන්ස, දකුණු යවමැදුම්ගම කුඹල්කම්කොට ජීවත් වෙති; ඔබවහන්සේ කැන්දූ එවූහයි අසමින් නොනාම මැටි වැකුණු ඇඟින් අවුය"යි දැන්විය. රජ්ජුරුවෝ "ඉදින් මට පසම්තුරුව්නම් සම්පතෙහි පිහිටා සේනාව ඇතිකොට ගෙණ ඇවිදිනි මූ මට සතුරු නොවෙති" සිතා "මපුතනුවන් තමන්ගේ ගෙට ගොස් ඉස් සෝධා නහා සර්වාලඞ්කාරයෙන් සැරහී මා දුන් පෙරහරින් දකින්ට එන්ට කියව" යි කීහ. එබස් අසා පණ්ඩිතයන්වහන්සේ රජ්ජුරුවන් කී ලෙසම සැරහී, සිවරඟ සෙනග පිරිවරා; විජයොත් මහපායෙන් සුදම් දෙව්සබාවට වඩනා දෙව්රජානන් පරිද්දෙන් අවුත්, රජ්ජුරුවන් විසින් 'එන්නේය'යි කීකල්හි රජගෙට වැද රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටිසේක. රජ්ජුරුවෝ බෝධිසත්වයන්වහන්සේ හා සමග සුවදුක් දොඩා, පණ්ඩිතයන්වහන්සේ විමසන්නාහු "සමහර කෙනෙක් ඉසුරුසම්පතෙහි පිහිටා "සිට මෙනෙක් සැපත් අපට ඇතැයි සම්පත් නිසා පණිවා ආදි "පව් නොකරන්නාහ. සමහර කෙනෙක් ආමන්ට සැපත් දුන් "උන්ට වැරැද්දෙයයි අනුන් බණිනා පිණිස පව් නොකරන්නාහ "සමහර කෙනෙක් කිසිවක් කරන්ට නොපොහොසත් හෙයින් "පව් නොකරන්නාහ; සමහර කෙනෙක් නුවණනැතිව අමනාත්‍ර "හෙයින් පව් නොකරන්නාහ, තොපි බොහෝවූ අර්ථ චින්තනයෙහි දක්ෂව, සිතුවහොත් දසදහසක් යොදුන් දඹදිව් රජ්ජුරුවන් "මරා රාජ්‍ය ගන්නට පොහොසත්ව, කුමක් නිසා මට නොවැ"රැද්දූද ? මරාපියා රාජ්‍ය නොගතුදැ" යි කීහ.

එබස් අසා මහබෝසතානන්වහන්සේ "නුවණැත්තෝ තමන්ට සුව පිණිස පව්කම නොහැසිරෙන්නාහ; යසසින් පිරිහී කායික චෛතසික දුකින් පෙළෙනලදුවත් එක්කෙනෙකුන් කෙරෙහි සෙනෙදසයෙන් වේවයි, උරණින් වේවයි පැවත එන සුචරිත ධර්මය නොහරණාහ" යි වදාළසේක. නැවතත් රජ්ජුරුවෝ බොධිසත්වයන් විමසන පිණිස රාජමාසමක් කියන්නෝ "මොලොක්වූ හෝ දරුණුවූ හෝ යම් කිසි කාරණයකින් සත්වතෙමේ බැගෑවට පැමිණ තමා සම්පත පිහිටා, පසුව ආචාර ධර්මයෙහි හැසිරෙන්නේය" යි කීහ. ඉක්බිති බෝධිසත්වයන්වහන්සේ එසේ කී රජ්ජුරුවන්ට ගසක් උපමාකොට දක්වනසේක් "යම් ගසක් මුල සෙවණ සැතපී යමෙක් හුන්නේවීනම් වේවයි වැද හොත්තේ සිටියේ හෝ නම්, ඒ සැතපුණු ගස අත්තක් වෙවයි, සත්පුරුෂ තැනැත්තේ නොබිඳිනේය; ඉදින් බින්දේවීනම් පව්ටු මිත්‍රද්‍රොහිය" යි වදාරා "දේවයන්වහන්ස සැතපුණු රුක කොල අත්තක් පමණ කඩාපී මාත්‍රයෙකින් මිත්‍රද්‍රෝහි වනකල, මපියානන්වහන්සේටද බොහෝ සැපත් දී මාත් මේසා ඉසුරු සම්ප

නෙහි පිහිටුවා රකිමින් සිටි ඔබවහන්සේ කෙරේ එරදනා මම කෙසේනම් මිත්‍රද්‍රොහි නොවෙම්ද" යි සියලු සැටියේම තමන්වහන්සේ මිත්‍රද්‍රෝහි නොවන බව වදාරා; රජ්ජුරුවන්ගේ සිත් සසරට යෝජනාකරණසේක් "යම් පුරුෂයක්හු සමීපයෙන් යමෙක් තෙමේ ස්වල්පවූ කාරණයකුදු විචාරා දන්නේද; යම් නුවණැති කෙනෙක් තුමූ යමක්හට සිත උපන් සැකයෙක් දුරුකෙරෙද්ද; ඌ තුමූ සැක විචාරාගත් තෙනැන්නවුට පිහිටව සිටීමෙන් පිළිසරණ වන්නාහ; සැකදුරුකිරීමෙන් ආචාර්‍ය්‍ය තැනතුරෙහි සිටි නුවණැත්තවුන් හා සත්පුරුෂ තෙනැන්නේ විශ්වාසය නොහරණේය"යි වදාරා; දූත් රජ්ජුරුවන්ට අවවාදකරණසේක් "රජ්ජුරුවන්වහන්ස, පස්කම් සුව අනුභවකරණ ගෘහස්ථතෙමේ කුසීත වීනම් යහපත් නොවන්නේය; තමා විඳිනා ඒ පස්කම් සැප තරකොට ගතනොහෙන්නේය; කායාදි සංහිඳීමක් නැති මහණද ඒ මහණ ධර්මය පුරාගත නොහෙන්නේය; එසේහෙයින් යහපත්නොවෙයි නොවිමසා සංග්‍රහ නිග්‍රහ කරන්නාවූ රජද යහපත් නොවෙයි; යම් නුවණැත්තෙක් තෙමේ කෝපිවී නම් අමායෙහි වස බින්දුවක් හුනුවාසේ ඔහුගේ සන්තානයෙහි පිහිටි සියලු ගුණම නස්නාහෙයින් එයින් උතුම් නොවන්නේය. දේවයන්වහන්ස රජතෙමේ පරීක්ෂාකාරීව රාජ්‍යය කරන්නේය; අපරීක්ෂිතව රාජ්‍යය නොකරන්නේය; පරීක්ෂිතව දශරාජධර්මයෙන් රාජ්‍යයකරන්නාවූ රජ්ජුරුවෝ යසස් පරිවාර ගුණ කීර්ති ඒකාන්තයෙන් වඩන්නාහුය"යි වදාළසේක.—භූරිප්‍රශ්නය නිමි.

---

**මෙසේ** වදාළකල්හි රජ්ජුරුවෝ මහබෝසතාණන්වහන්සේ නාගනලද දළිපුඩු සේසත් ඇති රජ අස්නෙහි වඩා හිඳුවා, තුමූ මිටි අස්නෙහි හිඳ "පණ්ඩිතයෙනි සේසතෙහි වසන දෙවිඳු, මා පැණ සතරක් විචාළිය; මම ඒ පැණ දැනගන නුහුනුයෙමි; මේ සේනකාදි පණ්ඩිතවරුන් සතරදෙනාට කී තැන උන්ටත් නොවැටහින; පුත ඒ පැණ මට කියව"යි ආරාධනා කළසේක.

එ දවස් මහබෝසතාණන්වහන්සේ සැට යොදුන් රත්ගල් මුදුනෙහි සිංහනාදකරණ අභීත කේසර සිංහයෙකුසේ "දේවයිනි සේසතෙහි වසන දේවතාවා වේවයි, චාතුර්මහා රාජිකාදිවූ සදිව්‍යලෝකයෙහි දේවතාවෝ වෙත්වයි සොළොස් බඹතෙලෙහි බඹහු වෙත්වයි, යම් කිසි කෙනෙකුන් විසින් විචාරණලද්දවූ පැණ, තියුණු මුවහත් ඇති කඩුවකින් ඇඹුල මල් මිටියක් කපා වගුරුවන බල ඇති පිරිමියක්හුමෙන්, මාගේ නිර්මලවූ නුවණ නැමති කඩුවෙන් පිරිසිඳ කියම්; කියව දේවයිනි දෙවිඳු විචාළ පැණය"යි සර්වඥප්‍රවාරණයක් පරිද්දෙන් වදාළසේක. එ දවස් මහබෝසතාණෝ සවනේ නොදත්තෝනම් කෙසේද? මතු ලොව්

තුරා බුදුව සියලු සතුන් සිත සැක දුරුකොට ධර්මසිංහනාද කිරීමට මෙම දෘෂ්ටාන්ත නොවේද ? වැලිකෙළියෙහිදී එනෙක් පැණ විසඳූ ඒ මහතානන්වහන්සේට දූන් එක දේවතාවකු විචාළ පැණයක් විසඳීම නම් කවර අරුමයක්ද ? ඉක්බිති රජ්ජුරුවෝ, දේවතාදුව විචාළ ලෙසම කියන්නාහු "හනති හත්ථෙහි පාදෙහි" යනාදින් දක්වනලද පළමු පැණය කීහ.

"හනති හත්ථෙහි පාදෙහි මුඛංච පරිසුම්භති.
"සවෙ රාජ පියො හොති කංතෙන මභිපස්සසි" *

මහබෝසතානන්වහන්සේට ගාථාව අසම්න්ම ආකාශයේ නගාලූ පුන්සඳමඬලක් මෙන් අර්ථය අවබෝධවිය. ඉක්බිති බෝධිසත්වයන්වහන්සේ "අසව දේවයිනි" වදුරා "යම් වේලෙක්හි මැනියන්ගේ ඇකයෙහි හොත්තාවූ ලදරු කුමාරයා කිරි බී බඩ පුරාගෙණ සතුටුව මැනියන් හා සමග කෙළිතේ, තමාගේ ලහෝ පලුපත් සේ මොලකැටි අතින් මැනියන් මරන්නේද, ඉසකේ ඇද කඩන්නේද, මිටින් මැනියන් මූණ අන්නේද; එවේලෙහි වගුළු සඳරැසින් ඔදවැඩි ක්ෂීරමුහුදක් සේ, සෙනහයෙන් ඔදවැඩි යාවූ සිත් ඇති මැනියෝ පුතනුවන්ට 'සෙරගේ පුත මා කුමට මරන්නේදැ"යි යනාදි සෙනහ වශයෙන් කියා සෙනහ ධරාගන්ට අසමර්ථව දරුවන් ලෙහි හොවා සිපගනිති; † මෙසේ ඔර හිඳ තමන් මරා කෙළිනා වේලෙහි මැනියන්ට දරුවෝ ආදි ඇති ප්‍රේමයට වඩාලාම ප්‍රියවන්නාහ; පියානන්ටත් එසේම ප්‍රියවෙති" මෙසේ නභොමධ්‍යයෙහි සූර්යමණ්ඩලය ඔසවා පාන්නාක්හුමෙන් ප්‍රශනය පහළකොට වදළසේක. ඒ ප්‍රශන විසර්ජනය අසා, දේවතාද දළපුඩුසේසත් විවරයෙන් මැත්ව අඩ ශරීරයක් දක්වා, "ප්‍රශනය වදළ නියාව ඉතා යහපතැ"යි මිහිරි කටහඬින් ශබ්ද පවත්වා සත්රුවන් කරඬුවක දිවමල් දිවසුවඳින් පුරා, මහබෝසතානන්වහන්සේට පූජාකොට සැඟවී ගියාය.

රජ්ජුරුවෝද මහබෝසතානන්වහන්සේට ගඳින් මලින් පූජාකොට දෙවන පැණයට ආරාධනාකොට 'කියව දේවයෙනි' යි වදළකල්හි "අක්කොසති යථා කාමං" යනාදි ගාථාවෙන් දෙවන පැණය කීහ.

"අක්කොසති යථාකාමං ආගමඤ්ච න ඉච්ඡති
සවෙ රාජ පියො හොති කං තෙන මභිපස්සසි." ‡

---

* අතින් පයින් අනිති, මුහුණටද අනිති, මහරජ (එසේකල) ඉදින් ප්‍රියවේනම්, එයින් කවරෙක් දක්නෙහිද ?

† ඵතනන්තරෙ නිපජ්ජාපෙත්වා පරිචුම්බති.

‡ මුඛ නොසැහෙනතෙක් ආක්‍රොශ බෙණෙයි. හෙවත් යදී; ඉන් කිසිවකගේත් ඒම නොකමැතිය. මහරජ (එසේකල) ඉදින් ප්‍රියවේනම්, එයින් කවරෙක් දක්නෙහිද ?

ඉක්බිති රජ්ජුරුවන්ට බෝසතාණන්වහන්සේ "රජ්ජුරුවෙනි කකුල්දඬගොසින් කීදේ කවලන්ට සමඟ සත්ඇවිරිදි පුතනුවන් විසින් 'ඉදින් මට මේ මේ කැවුම් දුන්නෝවිනම් යෙමි' කියන්නා 'එසේද පුතණුඩ'යි උන් කැමති කැවුම් ඉදිකොට දුන් කල්හි ඒ කැවුම් කාලා නොපි සිහිල් සෙවණේ හිඳුව, මම නොපට පිටත ඇවිද මෙමෙහෙවර කෙරෙම්ද්ද"යි කියා හස්තවිකාර මුඛවිකාරාදි නොයෙක් උසුළු පැ පැ කී මෙමෙහෙවර නොගොසින් සිටිනා පුතනුවන්ට, මැනියෝ කිපි මරන්ට දණ්ඩක් හැරගෙණ 'මා සන්තක දෙය කාලා කුඹුරේ කුරුල්ලන් පමණ පලවාපියන්ටත් නොයෙයිද්ද"යි හය ගැන්වූකල වේගයෙන් දිවගත් පුතනුවන් ලුහු බැඳ අල්වාගන්ට අසමර්ථව සෝනට යේවයි බිල්ලට යේවයි සොරූ තා කඩ කඩකොට කපාපියන්ව'යි යනාදීන් කියා කැමති පරිදෙන් කටහෙළන පමණක් හැව්ලි අවන්නි යමක් මුඛයෙන් බෙණේ නම් ඉන් සිඬ්හතකුත් දරුවන්ට වන්නා නොකැමැත්තිය. ඒ කුමාරයා දවස මුළුල්ලෙහි කොල්ලන් හා එක්ව කෙළපියා සවස ගෙට වදනට නොපොහොසත්වූයේ, නෑයන්ගේ ගෙට යන්නේය. මැනියෝද 'දරුවෝ දූන් එන්දෙහෝ දූන් එන්දෙහෝ'යි පෙරමග බලබලා හිඳ සවස්වනතුරු නොඑන්නා දැක 'මා උරණ හෙයින් ගෙට එන්ට හය ඇතිව නොඑති' සිත සෝකයෙන් පුරා ගෙණ කඳුලු පිරුණු මුහුණින් යුක්තව, නෑයන්ගේ ගෙවල්හි බලන්නාහු පුතනුවන් දැක වඩාගෙණ සිපසනාපියා දැතින් තර කොට අල්වාගෙණ 'පුත මා කී බසුත් සිත තබද්ද'"යි ආදී ඇති ප්‍රේමයටත් වඩාලා ප්‍රේම උපදවන්නිය. මෙසේ දේවයිනි දරුවෝ මැනියන්ට කිසි කලෙකත් වඩාලාම ප්‍රිය වන්නාහ" යි වදරා දෙවන පැණය විසඳ වදාළසේක. දේවතා දූ පෙර පරිද්දෙන්ම සාධුකාර දී පූජාකළාය.

රජ්ජුරුවෝද පූජාකොට තුන්වන පැණයට ආරාධනාකොට 'කියව දේවයිනි' වදාළ කල්හි "අබ්භක්ඛාති අභූතෙන" යනාදි ගාථාවෙන් තුන්වන පැණය කීහ.

"අබ්භක්ඛාති අභූතෙන අලිකෙන මභිසාරයෙ
සචෙ රාජ පියො හොති කන්තෙන මභිපස්සසි." *

ඉක්බිති මහබෝසතාණන්වහන්සේ "දේවයිනි යම් වේලක අඹු සැමි දෙමහල්ලෝ රහසිගතව ලෝකාස්වාද රතියෙන් කෙළිනාහු ඔවුනොවුන්ට 'තොප මා කෙරෙහි මදකුත් ප්‍රේමයක් නැත, තොපගේ සිත බැහැරය'යි මෙසේ ඔවුනොවුන්ට නැත්තාක් කියද්ද

* අභූතයෙන් බොරු බෙණේයිද, බොරුවෙන් චොද[illegible]කෙරෙයිද; මහරජ (එසේකල) ඉදින් ප්‍රියවේනම්, එයින් කව[illegible]රක් දන්නෙහිද ?

බොරුවෙන් චෝදනා කෙරෙද්ද; එවේලෙහි ඔහු දෙමහල්ලෝ ඔවුනොවුන්ට අධිකව ප්‍රිය වන්නාහ" යි තුන්වන පැණය වදාළසේක. දේවතාදූ පෙරසේම පූජාකළාය.

රජ්ජුරුවෝද පූජාකොට අනික් පැණයට ආරාධනාකොට 'කියව දේවයිනි' වදාළ කල්හි "හරං අන්නංච පානංච වත්‍ථ සෙනාසනානිච" යනාදි ගාථාවෙන් සතරවෙනි පැණය කීහ.

"හරං අන්නංච පානංච වත්‍ථ සෙනාසනානිච
අඤ්ඤදත්‍ථු හරා සන්තා
තෙ වෙ රාජ පියා හොන්ති කං තෙන් මභිපස්සසි" *

ඉක්බිත්තෙන් රජ්ජුරුවන්ට "දේවයිනි මේ පැණයනෙම ධර්මිෂ්ඨවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සඳහාය; ඔවුන් තමන්ගේ ගෙදෙර සිඟා සිටිකල්හි තමන් විසින් පිළිගන්වනලද ආහාරාදිය පිළිගෙණ යන්නාද, ගොස් වළඳන්නාද † දැක අපම සිඟන්නාහ; අපම සන්තකවූ ආහාරාදිය ගෙණයන්නාහ; ගොස් අනුභවකරන්නාහ'යි ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන් විෂයෙහි වඩාලාම ප්‍රේම ඇති වන්නාහ; මෙසේ ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්, සැදැහැති උපාසකකුලය, තමන් දෙනලද්දවූ සතරපසය දැක්කදී අනුභවකරණකල්හි, අධිකයක්ම ප්‍රියකරන්නාහ"යි සතරවන පැණය වදාළකල්හි, දේවතා දූ පෙර පරිද්දෙන්ම පූජාකොට සාධුකාර දී සත්රුවන් පිරුරුවන් කරඬුවක් "ගනුව පණ්ඩිතයෙනි" යි මහබෝසතානන් වහන්සේගේ ශ්‍රී පාද මූලයෙහි පූජාකළාය. රජ්ජුරුවෝද පැහැද සෙනෙවිරත් තනතුරු දුන්හ. එතැන් පටන්කොට මහබෝසතානන්වහන්සේගේ යසස මහත්වූයේය.—දේවතා ප්‍රශ්නය නිමි.

---

**තැවත** සේනකාදි සතරදෙන "ගොවියාපුතු වඩාලා මහත් යසසට පැමිණියේය. කුමක් කරමෝද්ද"යි මන්ත්‍රණය කළහ. ඉක්බිත්තෙන් සේනක පණ්ඩිතයෝ අනික් තුන්දෙනාට කියන්නාහු "උඹ මහනට පැමිණියෙන් කාරිය කිම්ද ? රජ්ජුරුවන් කෙරෙහි බිඳුවාපියන්ට මා විසින් උපායක් දක්නාලද්ද" යි කීහ. "කුමන උපායෙක්ද ආචාරිනි" කීකල්හි "ගොවියාපුතු සමීපයට ගොස් 'රහස්නම් දෙය කාට කිවහොත් යහපත්ද'යි විචාරම්හ. ඒ තෙමේ මහාමන්ත්‍රිහෙයින් 'කිසිවක්හට කිය නොහැක්කැ' යි ඉදින් කීයේ වීනම් ඉක්බිති 'ගොවියාපුතු දේවයන්වහන්ස ඔබවහන්සේට වරදනට සිටියේය'යි බිඳුවාපියම්හ"යි කියා ඔහු සතර

---

* ආහාර පාන වස්ත්‍ර සෙනසුන් හැරගනිමින් ඒකාන්තයෙන් හැරගණිති. මහරජ ඔව්හු ඉදින් ප්‍රියවෙත්නම්, එයින් කවරෙක් දක්නෙහිද ?

† අමෙහයෙව යාවන්ති, අම්භාකංයෙවසන්තකානි.

දෙනා සිංහරාජයෙකු සමීපයට යන්නාවූ ජරපත් ශෘගාලයන් සතරදෙනෙකු පරිද්දෙන් පණ්ඩිතයන්වහන්සේගේ ගෙට ගොස් සුවඳුක් දෙඩා ‘පණ්ඩිතයෙනි පැණයක් විචාරම්හ’යි කියා බෝධිසත්ත්වයන්වහන්සේ ‘විචාරව’යි කී කල්හි සේනකයෝ ‘පණ්ඩිතයෙනි පුරුෂයා විසින් ආදිකොට කුමක්හි පිහිටිය යුතුද්ද’යි විචාළහ. සබවයෙහි පිහිටියයුතුය’යි වදාළසේක. ඔහු ‘සබවස පිහිටියවුන් විසින් කුමක් කටයුතුද්ද’යි විචාළහ. ‘වස්තු සෙවියයුතුය’යි වදාළසේක. ‘වස්තු උපයාගෙණ කුමක් කටයුතුද්ද’යි පිළිවිස්සාහ. මනත්‍රණය උගතයුතුය’ යි වදාළසේක. ‘පසු කුමක් කටයුතුද්ද’යි පිළිවිස්සාහ. ‘තමා සිත රහස් කටයුතු අනුන්ට නොකියයුතුය’යි වදාළසේක.

ඔහු සතරදෙන ‘යහපත පණ්ඩිතයෙනි’යි සතුටු සිත්ඇතිව ගොවියාපුතු පිටිදකුම්හ’යි රජ්ජුරුවන් සමීපයට ගොස් “දේවයන්වහන්ස ගොවියාපිත් ඔබවහන්සේට වරදනට සිටියේය”යි කීහ. රජ්ජුරුවෝ “මම නොපගේ බස් නොඅදහමි, ඌ තුමූ මට නොවරදනි”යි නොගිවිස්සාහ. “දේවයන්වහන්ස අප කී බස් නොඅදහනසේක් විනම් උන් ඔබවහන්සේම දක්නට ආකල ‘පණ්ඩිතයෙනි තමා සිත උපන් රහස් කටයුත්ත කාට කියයුතුද්ද’යි විචාළමැනව. ඉදින් ඔබවන්හන්සේට සතුරු නොවෙත්නම් ‘අසවලුන්ට කියයුතුය’ යි කියති; ඉදින් ද්‍රොහි වෙත්නම් කිසිවක්හට නොකියයුතුය, මනදෙළ පිරුණුකල කියයුතුය’යි කියනි. එවිට අප අදහාගෙණ සැක හළමැනව”යි කීහ. රජ්ජුරුවෝත් ‘යහපතැ’යි උන් කීවා ගිවිස එක් දවසක් පණ්ඩිතවරුන් පස්දෙනා එක්ව අවුත් දැකලා උන් කල්හි රහස් කියයුත්තන් විචාරන්නාහු, “පණ්ඩිතවරුන් පස්දෙනාත් එක්වූහ. ප්‍රශනයෙක් මට වැටහෙයි ප්‍රශනය හැමදෙනම අසව නින්දකටයුතු හෝ ප්‍රශංසාකටයුතු හෝ රහසක් කවරක්හට කියන්නේද, රහස් කිවමනා කාටද්ද”යි විචාළහ. මෙසේ කී කල්හි සේනකයෝ ‘රජ්ජුරුවනුත් අප හා එක්කොට ගනුම්හ’ යි සිතා “පොළවට ඉසුරුවූ රජ්ජුරුවන්වහන්ස ඔබවහන්සේ අපට රක්‍ෂාස්ථානව සිටිසේක, අපගේ සියලු කාරිය භාරය උසුලා සිටිසේක; එසේ හෙයින් නුඹවහන්සේම ආදිකොට වදාළමැනව, ඔබවහන්සේගේ අදහස පරීක්‍ෂාකොට හෙවත් වදාළාක් අසා පණ්ඩිතවරු පස්දෙනාත් කියන්නාහ”යි කීහ. ඒ අසා රජ්ජුරුවෝ තමන් කෙලෙස් වශගහෙයින් යම් ස්ත්‍රියක්තොමෝ ආචාරසීලයෙන් යුක්තද පුරුෂයන් කරා නොඑළඹෙන්නීද හෙවත් පතිව්‍රතා ධර්මය රක්‍ෂාකරන්නීද පුරුෂයාගේ අදහස් දැන පවතීද ප්‍රියද මනාවඩන්නීද එසේවූ තමාගේ අඹුවට නින්දකටයුතු හෝ ප්‍රශංසාකටයුතු හෝ රහස් කියන්නේයයි කීහ.

ඉක්බිති සේනකයෝත් "අපකෙරේ රජ්ජුරුවෝ ඇතුළත් වන ලදහ" යි සතුටුව තමන් කළ කාරණයම * ප්‍රකාශ කරන්නාහු "යමෙක්තෙමේ දුකට පැමිණි ආතුරයාහට සරණවපිටිවහල්වේද "එසේවූ දුකෙහි නොහරණ තමා යහලුවාහට රහස් කියයුතුය"යි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ "පුක්කුසයෙනි තොපට කෙසේ වැටහේද? රහස් කියයුතු කාටදැ"යි විචාළහ. පුක්කුසයෝ] "දේවයන්වහන්ස යමෙක් තෙම තමාට වැඩිමහලුද නොහොත් මැදිබව සිටියේද නොහොත් කිස්දෙවුන්ද, ඉදින් එක කුසෙහි හොත් නැනැත්තේ ආචාරසීලයෙන් යුක්තවීනම්, තමාට පැමිණි සුවදුක් දෙකෙහි කණස්සලුව පසුබැස නොසිටී නම්, එසේවූ තමාගේ හිතකාමිවූ මලුවේවයි බෑයා වේවයි සහෝදරයාට රහස් කියයුතුය"යි කීහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ කාවින්දයන් විචාළහ. කාවින්දයෝද 'දේවයන්වහන්ස යම් පුත්‍රයෙක් තෙමේ පියානන්ට වහලෙක්සේ මෙහෙවර කොටගෙණ වංශයත් රක්‍ෂාකෙරේද (අභිජාත අනුජාත අවජාත පුත්‍රයෝ තුන්දෙන නම් කවුරුදැ'යි යතහොත්.—පියානන්ට වඩා සැපත් රුස්කොටගෙණ ඨානාන්තරයට පැමිණෙන්නේ අභිජාත නම් වෙයි, පියා සන්තක වස්තුව නසා ධූර්තව වසන්නේ, අවජාත නම් වෙයි. පියා සන්තක සම්පත් ස්ථිරකොටගෙණ වංශයත් රක්‍ෂාකරන්නේ අනුජාත නම්වෙයි) එසේවූ අනුජාත පුත්‍රද අලාමකවූ නුවණඇත්තේද, එවෙනි තමා පුතුට රහස් කියයුතුය"යි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ දේවින්දයා විචාළහ. දේවින්දයෝද "දෙපාඇත්තවුන්ට අධිපතිවූ රජ්ජුරුවෙනි. යම් මැනිකෙනෙක් තුමූ ප්‍රේමයෙන් යුක්තවූ සිත්න් තමන් පුතනුවන්ට සියලු පොෂ්‍යකෙරෙද්ද එසේ හිතකාමිවූ මැනියන්ට රහස් කියයුතුය"යි කීහ. සේනකාදි පණ්ඩිතවරුන් සතරදෙනා විචාරා රජ්ජුරුවෝ මහෞෂධපණ්ඩිතයන් විචාළහ. ඉක්බිති පණ්ඩිතයන්වහන්සේ "රජ්ජුරුවෙනි රහස් දෙය නම් නින්දකටයුතුවත් කිම, ප්‍රශංසා කටයුතුවත් කිම, සැඟවීමම උත්තමය; රහස් ප්‍රකාශකිරීම නුවණැත්තන් විසින් ප්‍රශස්ත නොවන්නේය. තමා සිතූ දෙය මුදුන් නොපැමිණියේ වීනම් නුවණැති සාර පුරුෂතෙම ඒතාක්කල්ම කිසිකෙනෙකුන්ට ප්‍රකාශ නොකරන්නේය, ඒ සිතූ කටයුත්ත මුදුන් පැමිණියේ වීනම්, එවිට සභාමධ්‍යයෙහි කිසි සැකයක් නැතිව ප්‍රකාශකරන්නේය"යි වදාළසේක. පණ්ඩිතයන්වහන්සේ විසින් මෙසේ වදාළ කල්හි රජ්ජුරුවෝ නොසතුටුවූහ.

ඉක්බිත්තෙන් සේනකයෝ රජ්ජුරුවන් මූණ බැලූහ. රජ්ජුරුවෝත් සේනකයන් මූණ බැලූහ. බෝසතානන්වහන්සේ උන්දෙන්නාගේ ක්‍රියාව දැක "මුන් සතරදෙන දූසා කියා පළමුව

* සයං කතකාරණ මෙවදී පෙනෙනා.

රජ්ජුරුවන් කෙරේ මා බිඳුවාපි වන්හ; පරීක්ෂාකරණ පිණිස ප්‍රශ්නය විචාරණලද්දේ වනැ" යි සිතුසේක. රජ්ජුරුවන් හා පණ්ඩිතයන් කථාකෙරෙමින් සිටියදීම හිරු අස්තයට ගියේය, රාජභවනයෙහින් ඒ ඒ ස්ථානයෙහි වට විලක්කුවල පානුත් නග නලද්දේය. පණ්ඩිතයන්වහන්සේ 'රජ්ජුරුවන්ගේ කටයුතුනම් බැරිය, කුමක් වනබවත් නොදනෙයි, වහා මෙතනින් නැගී යනබව සුදුසුය"යි හුනස්නෙන් නැගී රජ්ජුරුවන් වැඳ රාජ භවනයෙන් නික්මෙනසේක්—" මුන් සතරදෙනාගෙන් එක් කෙනෙක් 'යහලුවාහට රහස් කීම යහපත'; එක්කෙනෙක් 'මල් බෑයන්ට රහස් කීම යුතුය,; එක්කෙනෙක් 'පුතනුවන්ට රහස් කීම යුතුය'; එක්කෙනෙක් 'මැනියන්ට රහස් කීකල යහපතැ'යි කීහ. මුන් විසින් තමන් තමන් කළ දෙයක්වත් දුටුදෙයක්වත් කියතියි * සිතමි; වන්නාටය අදම ඒ තත්වයත් දනිමි" සනිටුහන් කරමින්—ඔහු සතරදෙනද මෙතෙක් දවස් රජගෙන් නික්ම මාලිගා දොරකඩ එක් හඹු හොරුවක් මත්තේ හිඳ කළමනා කටයුතු දැන තමනමන්ගේ ගෙවලට යන්නාහ. එසේ හෙයින් පණ්ඩිතයන්වහන්සේ "මුන්ගේ රහස් හඹුහොරුව යට වැදහොත් තොත් දතහැක්කැ"යි සිතා ඒ හඹු හොරුව තමන්වහන්සේ ගේ මිනිසුන් ලවා උසුලුවා උඩ නංවා යට සැතපෙනදෑ අතුරුවා හොරුව යට වැද තමන්වහන්සේගේ පුරුෂයන්ට "තෙපි මුවාව සිට පණ්ඩිතවරුන් සතරදෙනා කථාකොට නැගී ගියකල්හි අවුත් මා හැරගෙණ යව"යි සම්මතකළසේක; ඔහුත් "යහපතැ"යි මුවාව ගත්හ. සේනකයෝද " දේවයන්වහන්ස අප කීවක් නුඹ වහන්සේ නො අදහනසේක්වේද, දූන් අප කීවා ශ්‍රීබුද්ධියට නැ ගේදැ"යි කීහ. රජ්ජුරුවෝ හෙදකාරීන්ගේ බස්ගෙණ පරීක්ෂා නොකොට හයින් ත්‍රස්තව "දූන් කුමක් කරමෝද සේනකයිනි" විචාළහ. දේවයන්වහන්ස කල් නොයවාම කිසි කෙනෙකුත් නොදන්නා ලෙස ගොවියාපුතු මරවාපීම යහපතැ"යි කීහ. "සේ නකයිනි තොප විනා මට අනිකෙක් නැත, තෙප්ම තොපගේ මිත්‍රයන් හැරගෙණ වාසල් කඩ ඇලි සිට ගොවියා පුතු උදෑසන රාජ සේවයට එමින් වාසල් ඇතුළුවූ විටම කඩුවෙන් ඉස කපා පියව"යි තමන්ගේ මගුල් කඩුව සේනකයන් අතට දුන්හ. ඔහු සතරදෙනාත් යහපත දේවයන් වහන්ස භය නුවූව මැනව, අපි ගොවියාපුතු මරන්නෙමු"යි † කියා රජගෙන් නික්ම "අප විසින් පසමිතුරාගේ පිටු දක්නාලද්දැ"යි කියා හඹු හොරුව මත්තේ හුන්නාහ.

* කියති කර්මකාරක ක්‍රියාය.

† වයංතං මාරෙස්සාමාති,

ඉක්බිති සේනකයෝ "කොල ගොවියාපුතු ගසන්නේ කවරෙක්ද"යි කීහ. අනික් තුන්දෙන "ආචාරීන්වහන්ස තුඹවහන්සේම ගැසුව මැනවැ"යි ඔහුටම භාරකළහ. නැවත සේනකයෝ ඉන් අනික් තුන්දෙනාට "තොපි රහස් අසවලුන්ට කියයුතුයයි කිවුය. කීමෙක්ද තොපි කළ දෙයෙක්ද නොහොත් දුටු දෙයෙක්ද ඇසූ දෙයෙක්දැ"යි විචාළහ. "ආචාරින්වහන්ස ඒ පසු කළ මැනව; තුඹදැ 'රහස් යාලුවාට කියයුතුය'යි යමක් වදාළසේක් වීනම් ඒ තුඹවහන්සේ කළ දෙයෙක්ද නොහොත් දුටු දෙයෙක්ද ඇසූ දෙයෙක්දැ"යි විචාළහ. සේනකයෝ "තොපට ප්‍රයෝජන කිම්දැ"යි කීහ. "කිවමැනව ආචාරීන්වහන්සැ"යි කීහ. "මේරහස් කටයුත්ත රජ්ජුරුවන් දතහොත් මාගේ දිවිනැතැ"යි කීහ. "නොබව මැනව ආචාරීන්වහන්ස මෙතන තුඹවහන්සේගේ රහස් ප්‍රකාශකරණ කෙනෙක් නැත. සැක නොකොට කිව මැනවැ"යි කීහ. සේනක පණ්ඩිතයෝ හඹු හොරුව නියපිටින් ගසා * "මේ හොරුව යට ගොවියා පුත් ඇද්දෙහෝ" යි කීහ. "ආචාරීන්වහන්ස ගොවියාපුත් තමාගේ ඓශ්වර්‍ය්‍යයෙන් මත්ව සුව විඳිනේ මෙබඳු අපවිත්‍ර තැනකට කුමට වදිද? නොවදිය. තුඹවහන්සේ කිවමැනවැ"යි කීහ. සේනකයෝ තමන්ගේරහස් ප්‍රකාශකරන්නාහු "මේ නුවර අසවල් වෛශ්‍යාදුව හඳුනව්දැ"යි කීහ. "එසේය හඳුනම්හයි ආචාරීනි" කිවුය. "දැන් ඒ වෛශ්‍යාදු පෙණේදැ"යි කීහ. "නොපෙණෙයි ආචාරීනි" කීහ. "එසේවී නම් එඹා මම මගුල් සල්උයනේදී ඈ හා සමග පුරුෂකෘත්‍යය කොට හෙවත් සැතපී ඇගේ පළඳනා ලොභයෙන් ඈ මරාපියා ඇගේම† හන්සළුවෙන් පොදියක්කොට බැඳගෙණ අපගේ ගෙයි අසවල් මාලේ අසවල් ගබඩාවේ මුවහං කොක්කේ එල්වාලීමි, තව දක්වා ඉන් කිසිවක් අලෙවි කළේ නැත, පරණව ගන්නාතුරු බලා හිඳිමි, මෙබඳු රාජපරාධ කටයුත්ත මාගේ යාලුවෙකුට කීමි, ඌ කිසි කෙනෙකුන්ට නොකීවිරීය. මේ කාරණයෙන් යාලුවාට රහස් කියයුතුය'යි කීයෙම්යයි"කීහ. පණ්ඩිතයන්වහන්සේ සේනකයන්ගේ රහස අසා සිත තබාගත්හ. පුක්කුසයෝද තමන්ගේ රහස ප්‍රකාශකරන්නාහු "එඹා මාගේ කලවයේ අසාධ්‍ය කිලාස කුෂ්ඨයෙක් ඇත්තේය. මාගේ මලනුවෝ උදසනක්සේම කිසි කෙනෙකුන් නොදන්වාම ඒ කිලාසය කසටපැනින් සෝදපියා බේත්ගල්වා මත්තෙහි මොලොක්කොට කඩරෙදි වසා බඳනාහ. රජ්ජුරුවෝ මා කෙරෙහි මොලොක් සිතින් 'මෙසේ එව පුක්කුසයෙනි'යි කැඳවාලා බොහෝසේම මගේ ‡ කලවයෙහිම ඉස තබාගෙණ සැතපෙන්නාහ; ඉදින් නොකටයුතු

* නාජ්ජනුබො ඉමස්මිංහෙඨා ගහපති පුත්තොති.

† තස්සායෙවසාටකෙන

‡ ඌරුයංයෙව

දත්තු නම් මා මරාපියන්නාහ; ඒ රහස් මාගේ මලනුවන් විනා අනික් දන්නා කෙනෙක් නැත; ඒ කාරණය හේතුකොටගෙණ 'රහස් නම් මල්බෑයන්ට කියයුතුය'යි මාවිසින් * කීයේය''යි කීහ.

කාවින්දයෝද තමන්ගේ රහස් ප්‍රකාශකරන්නාහු ''එඹා මා වරද, අව පසළොස්වක් දවස් නරදේවනම් යක්‍ෂයෙක් මා ඇඟට නැඟෙන්නේය, ඒ යක්‍ෂයා නැගි කල්හි මම වියරු හුනු බල්ලෙකු පරිද්දෙන් හඬමි; මම ඒ යක්‍ෂවිකාරය මට ඇති නිසාව මාගේ පුතනුවන්ට කීමි, උඹ මා ඇඟට යක්‍ෂයා ආවෙශවූ බව දැන ඇතුළුගෙයි මා හුවැටි බැම්මෙන් බැඳ හොවාලා දොර පියාගෙණ ගෙන් පිටත්ව මා හඬන බලු හඬ කිසි කෙනෙකුත් නොඅසනු පිණිස දොරලඟ රඟමඬුලු බන්දා අරගල කරන්නේය. මේ කාරණය හේතුකොට ගෙන 'රහස පුතනුවන්ට කියයුතුය''යි මා කීයේය''යි කීහ. ඉක්බිති තුන්දෙනම දේවින්දපණ්ඩිතයන් විචාළහ. උයින් තමන්ගේ රහස් ප්‍රකාශකරන්නාහු ''එඹා ශක්‍රදෙවේන්ද්‍රයන් විසින් කුසරජ්ජුරුවන්ට දුන්නාවූ ශ්‍රී සම්පත් එළවන්නාවූ මාණික්‍යරත්නය රාජපරම්පරාවෙන් පැවත අවුත් රජ්ජුරුවන් සන්තකව භාණ්ඩාගාරයේ තුබූවා මැණික් මටකම් කරවන්නාවූ මා විසින් සොරා හැරගෙණ මාගේ මැනියන්ට දෙනලද, මැනියෝ කිසිකෙනෙකුත් නොදන්වා රජගෙට යනවේලෙහි ඒ මැණික මට දෙන්නාහ, මම ඒ මැණිකින් ශොභාව මූණට පතුරුවාගෙණ රජගෙට යෙමි.. රජ්ජුරුවෝ නොප හැමදෙනා හා කථානොකොට පළමුකොට මා හා සුවදුක් දොඩන්නාහ. දවසක් පාසා අටකහවණුවක් හෝ සොළොස් කහවණුවක් හෝ දෙතිස් කහවණුවක් හෝ සුසැට කහවණුවක් හෝ මසුරන් වියදම්දෙන්නාහ; ඉදින් † ඒමිණිරුවන සොරාගත්බව රජ්ජුරුවෝ දත්තුනම් මාගේ දිවි නැත. මේ කාරණය හේතුකොට ගෙණ 'රහස්නම් මැනියන්ට කිය යුතුය'යි කීහ. බෝසතාණන්වහන්සේ මේ හැමදෙනාගේම රහස් ප්‍රත්‍යක්‍ෂකොට සිත තබාගත්සේක. ඔහු වනාහි තමන්ගේ ළය පළා බඩවැල් පිටත්කරවන්නවුන් මෙන් රහස් ඔවුනොවුන්ට කියා හැමදෙනම 'පමානොවව, උදෑසනම එව, ගොවියාපුතු මරම්හ'යි කියා හුන්තැනින් නැගීසිට තම තමන්ගේ ගෙවලට ගියාහ.

ඒ සේනකාදි පණ්ඩිතවරුන් ගියකල බෝධිසත්ත්වයන් වහන්සේගේ පුරුෂයෝ අවුත් ඔරුව ඔසවා මහබෝසතාණන් ගෙණ ගියහ. උන්වහන්සේ ඉස්සෝධා නා ගඳවිලවුන් ගෙණ සැරහි

* කීයේ යනු කර්‍මකාරක ක්‍රියායි.

† සවෙ තස්ස මණිරතනස්ස ජහනභාවං.

දිව්‍ය භොජනයක් හා සමානවූ රස මසවුලින් යුක්ත ආහරය අනුභවකොට "අද මාගේ බ්‍රාහ්මණියෝ උදුම්බරාදේවී රජගෙන් මට සවරූප කියා අස්නක් එවනියි" දූත "රජගෙන් ආ කෙනෙකුත් වහා ඇතුළට ඇරගෙණ මට පෑල"යි කියා ඇදතිලි පුරුෂයෙකු වාසල සිටවූසේක. මෙසේ විධානකොට විචිත්‍රාස්තරණයෙන් විභූෂිතවූ ශයන මස්තකයෙහි බ්‍රහ්මකුමාර විලාසයෙන් සැතපුණුසේක. රජ්ජුරුවෝද ඒ ක්ෂණයෙහි ශ්‍රීයහනෙහි සැතපුණාහු, පණ්ඩියන් වහන්සේගේ ගුණ සිහිකොට "මහෞෂධ පණ්ඩිතයෝ සත්ඇවිරිදි කල්පටන් මා සේවයකරන්නාහු, මට කිසි අවැඩක් නොකළහ,* දේවනාදූ ඒවාලි පැණයෙහි පණ්ඩිතයන් නැතහොත්, මාගේ ජීවිතයද නැත්තේය. වෛරී පසමිතුරන්ගේ බස් ගෙණ 'අසමානවූ නුවණැති මහෞෂධ පණ්ඩියන් මරව'යි කියා මගුල්කඩුව දුන්නාවූ මා විසින් කෙළේ අයුක්තිය, සෙට පටන්කොට එවැනි පණ්ඩිතරත්නයක් දක්නට නොලැබෙ"යි ලය පැළියහ පරිද්දෙන් ශොක ඉපදූහ. ශරීරයෙන් ඩා බිදගත්තේය. ශොකයෙන් මඩනා ලද්දාහු, චිත්තාස්වාදයක් නොලද්දාහ. උදුම්බරාදේවී රජ්ජුරුවන් හා සමග එක්ව යහනෙහි ඉඳ, රජ්ජුරුවන් චිත්තාස්වාදයක් නොලැබ සැතපෙන්නාදැක 'කිමෙක්දෝහෝ මාගෙන් කිසි වරදෙක් ඇද්දෝහෝ නොහොත් අනික් කිසි කාරණයෙක් රජ්ජුරුවන් සිතට උපන්දෝහෝ'යි විචාරන්නාහු "රජ්ජුරුවෙනි නෙපි ඉතාම දොම්නස් උව, තොපගේ සිතට නොහැඟිලෙස මා කළ වරදෙක් නැත්තේය, අනික් කවුරුන් කළ වරදක් සිතට ගෙණදෝහෝ නොහොත් කවුරුන්ගේ විෂයෙහි තොපට ශොකයක් ඇතිවීද ඒ මට කියව"යි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ "සොඳුර සේනකාදි පණ්ඩිතවරු සතරදෙන 'මහෞෂධ පණ්ඩිතයෝ තොප මරාපියා රාජ්‍යය ගන්නට සිතතියි, මට කීහ. මා විසින් තත්ත්වය පරීක්ෂානොකොට 'එසේවී නම් ඌ මරා පියව'යි මගුල් කඩුව අතට දීලා පණ්ඩිතයන් මරන්නට විධාන කරණලද. ඒ කාරණය සලකන්නාවූ මම 'මහෞෂධ පණ්ඩිතයන් මරණට පෙරතුකොට මට මරණ වීනම් යහපතැ'යි උන්ගේ වාග්විෂයාතික්‍රාන්ත ගුණ නුවණ සලකන්නෙම් 'එවැනි පණ්ඩිත රත්නයක් සෙටපටන් නොදකිමියි'සිත උපන් බොහෝ ශෝකයෙන් දොම්නසිම්"කීහ. එබස් අසා උදුම්බරාදේවීන්ට බෝධිසත්ත්වයන් වහන්සේ විෂයෙහි පර්වතයකින් මඩනාලද පරිද්දකින් ශොක උපන්නේය.

ඉක්බිති 'උපායකින් රජ්ජුරුවන් අස්වසමි' සලකා, 'රජ්ජුරුවන් නිදන්ට වත් කල්හි මාගේ මලනුවන්ට සරුපකියා පත් යවමි' සිතා "රජ්ජුරුවන් වහන්ස ගොවියාපුතු වේසා මහත් ඓශ්වර්යයක පිහිටුවා නෙපිම වද ඇතිකළෙහිය, තොප කෙරෙන්ම සෙ

* මංඋපඪහනෙතා නකිංචිමඤහං අතපපමකාසි.

නෙව්රත් ධුරයට පැමිණ, දූත් තොපටම වරදනට සිටියෝය; එබඳු පසම්තුරෝ නම් කුඩා නොවෙති, මැරිය යුත්තෝමය, නෙපි නොසිතව"යි රජ්ජුරුවන් බිසව් වංචාවෙන් ඇස්වැසූහ. රජ්ජුරුවෝ බිසවුන් කී බසින් තුනීකරණලද ශොක ඇතිව නිදන්ට වත්හ. බිසව් රජ්ජුරුවන් නිදන නියාව දැන, නැගීසිට ශ්‍රීයහන් ගබඩාවට වැද, පතක් පත්හිදක් ගෙණ "මහෞෂධපණ්ඩිතයෙනි සේනකාදි පණ්ඩිතවරු සතරදෙන රජ්ජුරුවන්ට දූසා කියා තොප බිඳුවාපිහ රජ්ජුරුවෝ කිපි සෙට උදසනම තොප රජගෙට එන වේලෙහි වාසලදී මරණ පරිද්දෙන් විධානකොට තමන්ගේ කඩුව සේනකයාට දුන්හ. සෙට රජගෙට නොඑව; ඉදින් එව්නම් නුවර මුළුල්ල අත්පත්කොට ගෙණ යුධයක් වී නමුත් කරණ පරිද්දෙන් බල ඇති ා එව"යි පතලියා අකුළුවා අග්ගලාවක් පළා ඇතුලේ ලා නොපෙණෙන ලෙස හුයකින් අග්ගලාව වෙළා සුවඳකවා අලුත් සැළියක ලා අස්ඹබා * තමන්ට වැඩ පසස්නා කම්මිත්තකට 'ගෙනගොස් මාගේ මලනුවන්ට දිලව'යි කියා දුන්හ. කම්මිත්තිත් බිසව් කී ලෙසට කළ්‍රිය. 'රැකවල් ඇති තැන කොහෙස් ගියාද්ද'යි නොසිතිය යුතුය. රජ්ජුරුවන් විසින් බිසවුන්ට පළමුකොටම 'කැමති වේලක අමුත්තක් තොපගේ මලනුවන්ට යැව්ව රැකවල් නැතැ'යි වර දෙනලද. එසේහෙයින් කිසි කෙනෙකුත් නොවැලකූහ. බෝධිසත්වයන්වහන්සේ බිසවුන් යැවූ පඬුරු සඞ්ඛ්‍යාත අග්ගලාව අතට ගෙණ 'මා මේ පඬුරුගත් නියාව බිසවුන්ට කියාලව'යි කියා කම්මිත්ත යව්සේක. ඔයින් රජගෙට අවුත් යැවූදෙය පණ්ඩිතයන්වහන්සේට දුන් නියාව බිසවුන්ට කිව. එවිට බිසව් ගොස් රජ්ජුරුවන් සමග සැතපුණාහ.

බෝසතානන්වහන්සේද, අග්ගලාව බිඳ ඇතුලෙහි තිබූ පත කියවා එපවත් තත්වූපරිද්දෙන් දැන නුවර කළමනාකටයුතු මුලුල්ල විචාරා, යහනෙහි සැතපුණුසේක. සේනකාදි සතරදෙන රාත්‍රිභාගය වර්‍ෂයක් මෙන් දික්කොට සිනත්නාහු 'කවර විටක පහන්වෙද්දෝහෝ'යි වර්‍ජිත කරණලද නිදි ඇතිව උදසනක්හේම කඩුගත් අත් ඇතිව වාසල ඇල් රැකසිට, පණ්ඩිතයන්වහන්සේ නොදක දෙම්නස්ව, බෝධිසත්වයන්වහන්සේගේ මුළු ලොව පතල මෛත්‍රී නැමති චණ්ඩවාතයෙන් උදුරාදමනලද්දවූ වෘක්‍ෂ සතරක් මෙන්, රජ්ජුරුවන් සමීපයට ගොස් 'කිමෙක්ද පණ්ඩිතවරුනි තොප විසින් ගොවියාපුතු මරණ ලදද්ද'යි කී කල්හි 'දේවයන්වහන්ස නුඹවහන්සේගේ ගොවියාපුතු නුදුටුවුමු"යයි කීහ. මහබෝසතානන්වහන්සේද හිරු නැගෙමින් සිටියදීම, සත්යොදුන් මියුලු නුවර මුළුල්ලම තමන්වහන්සේ වසඟකොට, ඒ ඒ ස්ථානයෙහි රැකවල් තරකොට ලවා, බොහෝදෙනා විසින් පිරි

* ලඤ්ජතවා.

වරණලදුව, සර්වාලඞ්කාරයෙන් සරසනලද උතුම් රථයානාවකට නැගී, මහත්වූ හස්ත්‍යශ්වාදි පරිවාරයෙන් හා අනුපමවූ ශ්‍රී සෞභාග්‍යයෙන් උපලක්ෂිතව, රජගෙයි වාසල කරා වැඩිසේක. රජ්ජුරුවෝ සිව්මැදුරු කවුළුව හැරපියා බෝධිසත්ත්වයන් වහන්සේ එන්නා බලා සිටියහ. ඉක්බිති මහබෝසතාණන්වහන්සේ රථයෙන් බැසපියා එනනදීම රජ්ජුරුවන් වැඳිසේක. රජ්ජුරුවෝ 'ඉදින් පණ්ඩිතයෝ මට පසමිතුරු වෙත්නම් මා නොවඳනාහ'යි සිතූහ මෙසේ සිතා ඉක්බිති මපුතනුවෝ වහා එව'යි වහා කැඳවා යවා රාජාසනයෙහි හුන්හ. මහබෝසතාණන්වහන්සේද ගොස් එකත්පස්ව හුන්හ. සේනකාදි පණ්ඩිතවරු සතරදෙනත් එතනම උන්හ.

ඉක්බිති රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් වහන්සේට කිසිවක්ම නොදන්නා කෙනෙකුන්මෙන් * "පුත මහෞෂධපණ්ඩිතයෙනි ඊයේ පෙර සන්ධ්‍යායෙහි ගියෙහිය, දැන් හිරු නැගී මෙතෙක් වේලෙන් අවුත් මා දුටුව, මාමෙසේ කුමට හළුවාද? කුමක් අසා තොපගේ සිතට කුමන සැකයෙක් වීද? කවුරු තොපට 'රජ්ජුරුවන් දැක්මට නොඑව'යි කුමන බසක් කිව්දැයි සවරූප අසන්නා කැමැත්තම්හ; එබැවින් තොප පමාවූ කාරණය කියව"යි විචාළහ. ඉක්බිති මහබෝසතාණන්වහන්සේ රජ්ජුරුවන්ට "දේවයන්වහන්ස ඔබවහන්සේ විසින් මට සතුරුවූ සේනකාදි සතරදෙනා බස් ගෙණ මා මරන්ට නියෝගකරණලද්දේවේද, එසේ හෙයින් නොආයෙමි" රජ්ජුරුවන්ට චොදනා කරණසේක් "ජනප්‍රධාන වූ දේවයන්වහන්ස ඔබවහන්සේ විසින් 'ප්‍රඥසම්පන්න මහෞෂධපණ්ඩිතයෝ මැරියයුත්තෝය'යි වෛරිවූ සේනකාදීන්ගේ බස් ගෙණ මා අපරීක්ෂිතව මරන්ට නියෝගකරණලද. යම්හෙයකින් ඊයේ මධ්‍යම රාත්‍රි වේලෙනි බිසවුන්වහන්සේට රහසිගතව කියනලදද; එබඳුවූ නුඹවහන්සේගේ රහස් කටයුත්ත ප්‍රකාශ කළවිට මා විසින් අසනලදැ"යි වදාළසේක. රජ්ජුරුවෝ ඒ අසාලාම 'මා විසින් කියනලද රහස එවිට තමා මලුව කියා යවනලදැ'යි කිපි බිසවුන් මූණබැලූහ.

රජ්ජුරුවන් බිසවුන්ට කිපි නියාව දැන, මහබෝසතාණන්වහන්සේ "දේවයන්වහන්ස බිසවුන්වහන්සේට කුමකට කිපෙනසේක්ද? මම අතීතානාගත වර්තමාන සඞ්ඛ්‍යාත කාලත්‍රය වර්තිවූ සියල්ලම දනිමි; දේවයන්වහන්සේගේ රහස් වනාහි මට දේවීන් විසින් කියනලද්දේ වේවා; ආචාරී සේනකයන්ගේ හා පුක්කුසාදීන්ගේ රහස් මට කා විසින් කියන ලදද? මම උන්ගේ රහසුත් දනිම්මය'යි කියා සේනකයන්ගේ රහස් පළමුකොට වදරණ

* තාතනව · හියොගතො ඉදනි ආගච්ඡසි කිං මං එවං පරිච්චජසීති

සේක් 'දේවයෙනි සේනකයා මෙම නුවර අසවල් වෛශ්‍යාදුව මගුල් සල් උයනේදි මරාපියා, ඈ පලන් ආභරණ ඈගේම කඩේ පොදියක් කොට බැඳගෙණ අවුත්, තමාගේ ගෙයි අසවල් තෙන තුබූයේය; ඉක්බිති තමා කළ ලාමක පාප කර්මය තමාගේ එක් යහළුවෙකුට රහසිගතව * කීය. ඒ රහස්ද මා විසින් අසනලද, මම දේවයන්වහන්සේට සතුරු නොවෙමි සේනකයා සතුරාය, ඉදින් ඔබවහන්සේට පසමිතුරෙකුගෙන් කාර්ය්‍යයෙක් ඇත්නම් සේනකයා ඇල්ලුව මැනව"යි වදාළසේක. රජ්ජුරුවෝ සේනකයන් මූණ බලා 'සැබෑද සේනකයිනි' විචාරා 'සැබව දේවයන්වහන්සැ'යි කීකල්හි ඔහු කරපය මස්වා සිරගෙයි ලන්ට විධානකළහ.

පණ්ඩිතයන්වහන්සේද පුක්කුසයන්ගේ රහස් වදාරණසේක් "දේවයන්වහන්ස මේ පුක්කුසයා නම් රජදරුවන් කරා නොඑළඹිය යුතුවූ අසාධ්‍ය කුෂ්ඨරොගයක් කලවයෙහි ඇති එකෙක, ඒ කුෂ්ඨරෝගය අනලන්ටත් පිළිකුල් වන්නේය, නුඹවහන්සේ 'පුක්කුසයාගේ කලව මොළොකැ' යි බොහෝසේ උහුගේ කලවයෙහි ඉස තබාගෙණ සැතපෙනසේක. ඒ මේ වනයෙහි බැඳි කඩ රෙද්දෙහි මොළිකය දේවයන්වහන්සැ" යි කියා "එසේ තමාගේ රහස මලුට කීයේය. ඒ රහස කියන කල මා විසින් අසන ලද්දේය" යි වදාළසේක. රජ්ජුරුවෝ පුක්කුසයන් මූණබලා 'සැබෑද පුක්කුසය'යි විචාරා 'එසේය දේවයන්වහන්සැ'යි කී කල්හි උනුත් දඟගෙයි ලැවූහ. පණ්ඩිතයන්වහන්සේ කාවින්දයාගේ රහස් වදාරණසේක් "දේවයන්වහන්ස යම් යක්ෂවිකාරයෙක් ඇතිවූ කල්හි සඬනෙමේ වියරුහුනු බල්ලෙකුසේ හඬා ඇවිදිද, එසේවූ රජගෙටත් නොවැද්ද යුතුවූ නපුරුස්වභාවඇති නරදේව නම් යක්ෂයෙක් අවපසළොස්වක්හි මොහු ඇඟට නැගෙයි; ඒ යක්ෂයා ඇඟට ආවේශවූකල්හි උන්මත්ත සුනඛයෙකුමෙන් සතරපය බිම ඔබාගෙණ මුලුල්ලෙහි අඬා ඇවිදිද්දි, ඒ යක්ෂ විකාරය තමාට ඇති නියාව තමාගේ පුතුට රහස කියේය; ඔහු පුතුට ප්‍රකාශ කළ නියාව් මා විසින් අසනලද"යි වදාළසේක. රජ්ජුරුවෝ 'සැබෑද කාවින්දය'යි විචාරා 'සැබෑය'යි කී කල්හී උනුත් දඟගෙයි ලැවූහ. පණ්ඩිතයන්වහන්සේ දේවින්දයාගේ රහස් ප්‍රකාශ කරණසේක් "දේවයන්වහන්ස ප්‍රභාවති බිසවුන් නිසා, ඒසා යුඩයක් සජ්ජනකොට ආ රජ්ජුරුවන් සද්දෙනෙකු 'මම සිංහස්වරය කුසරජය'යන වචන මාත්‍රයකින් පරාජය කොට ශත්‍රු සේනාවෙහි කිසි කෙනෙකුන් ඇටලේ මැස්සෙකු බොහා පමණත් ලේ පතක් නොසල්වා; චණ්ඩ පවනකින් එකපැහැර වගුළ තල්වනයක් පරිද්දෙන් විසංඥකොට හෙළා, යුඩයේ ජයලත් නුඹවහන්සේගේ මී මුත්තනුවන් කුසරජ්ජුරුවන්වහන්

* එකස්සසහායස්සරහොගතො හුත්වා අක්ඛාසි.

සේට සන්තුෂ්ටව, ශක්‍රදේවේන්ද්‍රයන් විසින් දෙන ලද්දාවූ මහත්වූ මංගල්‍ය සම්මත අෂ්ටවඞ්ක මාණික්‍යරත්නය ඔබවහන්සේගේ භාණ්ඩාගාරයෙහි තුබූවා, දැන් දේවිඳයා අතට ගියේය, තමා මැණික සොරාගත් නියාව රහස්කොට මවට කීයේය; උඹ මවට කී රහසත් මා විසින් අසනලද; දේවයන්වහන්ස මම ඔබවහන්සේට පසමිතුරු නොවෙමි, මෙකී පණ්ඩිතවරු සතරදෙන ඔබවහන්සේට පසමිතුරෝය, පසමිතුරන්ගෙන් ඔබවහන්සේට කාරියෙක් ඇත්නම් මෙකී පණ්ඩිතවරුන් සතරදෙනා අල්වාගෙණ කැමැත්තක් කළමැනව"යි වදාළසේක. රජ්ජුරුවෝ 'සැබෑද දේවිඳය'යි අසා 'සැබව'යි කී කල්හි උනුත් දඟගෙයි ලවා පිහ.

මෙසේ සේනකාදි පණ්ඩිතවරු "බෝධිසත්ත්වයන්වහන්සේ මරම්හ'යි හැමදෙනම සිරගෙට වන්නාහ. බෝධිසත්ත්වයන්වහන්සේද "දේවයන්වහන්ස තමන් සිත උපන් රහස්කටයුත්ත මුදුන්පැමිණියොත් මුත් අනුන්ට නොකිය යුතුයයි කීයේ මේ නිසාය" කීසේක. "අසවලුන් අසවලුන්ට රහස් කීම යහපතැ"යි කීවාහු මහත් විනාශයට පැමිණියෝය"යි වදාරා මත්තෙහි ධර්ම දේශනා කරණසේක් "මහරජ රහස් නම් දෙය සැඟවීමම යහපත නුවණැත්තෝ 'රහස් ප්‍රකාශකිරීම උතුමැ"යි නොකියත්නාහ; යම්තාක් තමා සිතූදෙය මුදුන් නොපැමිණියේනම්, ඒතාක්ම නිධානයක්මෙන් නුවණැත්තේ ඉවසන්නේය; නිෂ්පන්නවූ අර්ථ ඇත්තේ කැමති පරිද්දෙන් ප්‍රකාශකරන්නේය; තවද දේවයන්වහන්ස විශෙෂයෙන්ම රහස් නොකියයුත්ත අසා වදාළමැනව. මේ ලෝකයෙහි ස්ත්‍රීතොමෝ, හදවතක්සේ වෙසේනමුත් නුවණැත්තේ ගැණිටත් රහස් නොකියන්නේය. යමෙක් ආමිෂයෙන් සිත් ගතයුතුනම් එසේවූ තැනැත්තවුටද, යමෙක් සතුරුව මිත්‍රරෙකුසේ මුඛයෙන් එකක් බැණ සිතින් එකක් සිතානම් එසේවූ කූටසිත් ඇත්තාහුටද, රහස් නොකියන්නේය; යම් අඥානයෙක් කිසිවක්හට ප්‍රකාශ නොකටයුතු රහස යමක්හට කියේ වීනම්. ඔහු මරතොත් ආක්‍රෝශ පරිභව බණතොත් දාසයෙකු පරිද්දෙන් 'තමා කී රහස් ප්‍රකාශකළේ වීනම් නපුරැයි යන සිතින් සියලු නින්දාම ඉවසන්නේය; තමා සිත උපන් රහස යම්තාක් දෙන දනිත්නම්, ඒ මන්ත්‍රණය කළාවූ එතෙක් දෙනා කෙරෙහිම 'මුන් විසින් ප්‍රකාශවේද්දෝහෝ'යි එතෙක්ම භය ඕහට උපදනේය. එසේහෙයින් රහස් කිසිවක්හට නොකියන්නේය. දහවල් රහස් මන්ත්‍රණයක් කරණු කැමැතහොත් අවකාශයක් කරවාගෙණ හෙලි තැනකදී මන්ත්‍රණය කරන්නේය. ඉදින් රෑ මන්ත්‍රණයක් කරණු කැමතහොත් කන් සීමා නොඉක්මවා

උන්ගේ කණින් බැහැරට නෙප්ල නොවනලෙස සෙමෙන් ප්‍රකාශකරන්නේය. 'කුමක්හෙයින්දැ'යි යතහොත් භිත්ති ප්‍රාකාරාදී ප්‍රච්ඡන්න ස්ථානයෙහි සිටි කෙනෙක් ඇත්නම් මන්ත්‍රණය අසන්නාහ. එසේහෙයින් දේවයන්වහන්ස ඒ මන්ත්‍රණය හෙළිවන්නේ"ය වදාළසේක.

රජ්ජුරුවෝ මහබෝසතානන්වහන්සේගේ ධර්මකථාව අසා 'මොව්හු තුමූම රාජද්‍රෝහිව නිරපරාධවූ පණ්ඩිතයන් මට ද්‍රෝහිකරන්නාහ'යි කිපී යව කොල මේ කොල්ලන් මරමරා නුවරින් පිටත්කොට වාසල්දෙර සමීපයෙහි අගල ඔස්සේ ගෙණ ගොස් හුල හෝ හිඳුවව * ඉස් කපාපියා අගලට හෝ දමාපියව'යි නියම කළහ. උන් පිටිතල හයා බැඳ සන්ධිසන්ධියෙහි සිටුවා කටු සැමිටියෙන් සියගණින් පහර ගසගසා මරන්ට ගෙණයන වේලෙහි පණ්ඩිතයන්වහන්සේ 'දේවයිනි මොව්හු තුමූ ඔබවහන්සේගේ පුරාතන අමාත්‍යයෝය, උන්ගේ වරද ක්ෂමාකළ මැනව'යි රජ්ජුරුවන්ට වදාළසේක. රජ්ජුරුවෝ 'යහපතැ'යි ගෙන්වා බෝධිසත්වයන්වහන්සේටම දස්කොට පාවාදුන්හ. උන්වහන්සේ වනාහි පණ්ඩිතවරුන් එතනදීම නිදහස් කළසේක. 'එසේවීනම් මාගේ විජිතයෙහි සිටිය නොහැක්කැ'යි රටින් නෙරණට නියෝගකළසේක. පණ්ඩිතයන්වහන්සේ 'නුවණ නැත්තන්ගේ වරද ක්ෂමාකළ මැනව'යි දිව්‍ය ඖෂධයකින් අසාධ්‍ය ව්‍යාධියක් සංහිඳුවන්නාක් මෙන් තමන්වහන්සේගේ වචනෞෂධයෙන් රජ්ජුරුවන්ගේ කෝප ව්‍යාධිය සංහිඳුවා ක්ෂමාකරවා උන්ගේ තානතුරු පෙර පරිද්දෙන් දෙවා වදාළසේක. රජ්ජුරුවෝ 'පසමිතුරන් කෙරෙහිදු මුන්ගේ මෛත්‍රිය මෙබඳුය, සෙස්සවුන් කෙරේ මෛත්‍රී කෙබඳු වන්නීදැ" යි පණ්ඩිතයන්වහන්සේට වැඩියක්ම සතුටුවූහ. එතැන් පටන්කොට සේනකාදි පණ්ඩිතවරු සතර දෙන දළ උදුරාපු සර්පයන්මෙන් වැඩියක් ප්‍රභූ ශක්තියක් නැතිව බෝධිසත්වයන්වහන්සේට කිසිවක් කියන්ට අසමර්ථවූහ.

පංච පණ්ඩිත ප්‍රශ්නය නිමි.

## පරිබඩ කථා නිමි.

---

**එතැන්** පටන්කොට පණ්ඩිතයන්වහන්සේම රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකරණසේක, උන්වහන්සේ "රජ්ජුරුවන්ට ධවලච්ඡත්‍රයමය, රාජ්‍යය විචාරන්නෙම් නම් මමය. එසේහෙයින් මා විසින් නොපමාවිය යුතුය"යි සිතා සත්යොදුන් මියුලු නුවර වටා, ක්ෂීරසාගරයෙන් නැගි තරඞ්ගමාලාවක් සේ, ධවලවූ අටළොස්රියන් පමණ උස මහාසීමාපවුරක් ලැවූසේක. ඒ පවුරගාවා ඇතුළතින් තරය පිණිස මහා පදනමක්ද වටකොට සියගණින් සාරිගෙවල් හා වටබඳ වෙට්ටම්ද ලවා, වාස

---

* සූලෙසුවා උත්තාසෙථ සීසානිවා ඡින්දථාති.

ලක් පාසා පිටත පුලිමුබම්ද ඒ ඒ ස්ථානයෙහි බලකොටුද කරවූසේක. සීමා පවුර වටා පිටතින් සුංසුමාර මකරාදි චණ්ඩමත්ස්‍යයන් විසින් ගහණවූ පඤ්චවිධ පද්මයෙන් සංඡන්න දිය පිරුණු අගලක්ද, ඒ වටා කලල් අගලක්ද, ඒ වටා පොළෝ අගලක්දැයි තුන් අගලක් බිඳවූසේක. ඇතුළුගෙවල මුළුල්ල කටුකෝල් ඇරවූසේක. ඒ ඒ ස්ථානයෙහි මහපොකුණු බින්දවා, එහි දියපිරවූ සේක. නුවර සියලු ගෙවල් වී පිරවූ සේක. හිමාලවන ප්‍රදේශයෙන් කුලූපග තාපසවරුන් ලවා අරුණුවන් මඩ හා ඇඹුල බිජුවට ගෙන්වා තැබ්බවූසේක. බොහෝ කලක් රෙන් බොර ගසා වැලි බොර අසුඩ ඇල හෝ ආදිය සකස්කරවා වාරිමාර්ගවල් සුණු මැටිකවා පිටිනුවරද සුත්බුත්තැන් පිරියම් කරවූසේක. මේ හැම කුමක්නිසාද යතහොත් මත්තෙහි සතුරන් විසින් වන භය වලකන පිණිසය. ඒ ඒ නුවරවලින් ආ වෙළඳුන් අතින් කොයිසිට අවුදැ'යි විචාරා 'අසවල් රටසිට ආම්හ'යි කී කල 'තොපගේ රජ්ජුරුවන්ට කුමක් ප්‍රියදැ'යි විචාරා 'අසවල් දෙය ප්‍රියය'යනු අසා ඒ වෙළඳුන්ට කළමනා සත්කාරකොට යවා, තමන්වහන්සේ හා එකදා උපන් යෝධයන් දහස බණවා "සබඳිනි මා දුන් පඬුරු ගෙණ දඹදිව එක්සියයක් රාජධානියට ගොස් මේ පඬුරු තොපකෙරෙහි සෙනෙහස තබන පිණිස ඒ ඒ රජදරුවන්ට දීලා; ඒ ඒ රජදරුවන්ටම සේවාකම්කොට උන්ගේ කරණ ක්‍රියාවක්වත් බණන මන්ත්‍රණයක්වත් කියා එව, එවා එහිම වසව; මම තොපගේ අඹුදරුවන් රක්‍ෂාකෙරෙමි"කියා සමහර රජදරුකෙනෙකුන්ට මැණික් මය කුණ්ඩලාභරණද සමහර රජදරු කෙනෙකුන්ට රන්මිරිවැඩිද සමහර රජදරුකෙනෙකුන්ට විසිතුරු මගුල්කඩුද, සමහර රජදරුකෙනෙකුන්ට රන්මාලාද, තමන්වහන්සේ නම අකුරු කොටා "යම් දවසක් මාගේ කාර්‍ය්‍යයෙහි නිෂ්ඨාවෙක් වේද, එදවස් මේ අකුරු බැලූවන්ට පෙණේව'යි අධිෂ්ඨානකොට එක්සියයක් යෝධයන් අත යැවූ සේක.

ඒ යෝධයෝ ඒ ඒ නුවරට ගොස් ඒ ඒ රජදරුවන්ට තමතමන් ගෙනගිය පඬුරු දී 'ඔබවහන්සේට සේවාකම් කරන්ට ආම්හ'යි කියා රජදරුවන් විසින් 'කොයිසිට අවුදැ'යි විචාරණලද්දහු තමන් ආ නුවරතබා, අනික් නුවරක්ම කියා * ඒ රජ්ජුරුවන් විසින් 'යාපත'යි රදවනුලදුව සේවාකම්කරන්නාහු ඒ ඒ රජදරුවන්ට ආතම සමානවූහ. එසමයෙහි එකබලරට සඞ්ඛපාල රජ්ජුරුකෙනෙක් ආයුධ සන්නාහ සැපයීම කරන්නාහ. සේනාව රැස්කරන්නාහ. ඒ රජ්ජුරුවන් සමීපයෙහි සිටි යෝධයානෝ පණ්ඩිතයන්වහන්සේට "මේරට රජ්ජුරුවෝ මෙසේවූ ප්‍රයෝගයක් කෙරෙති; කුමක්බවත් නොදනිමි සුදුසු කෙනෙ

* අඤ්ඤානි ඨානානි ආචික්ඛිත්වා.

සූත් එවා තණ්ඩය දතමැනව"යි එවූහ. ඉක්බිති මහබෝසතානන්වහන්සේ ගිරපෝතකයන් බණවා "සබඳ ගොස් ඒකබල රට ශඞ්ඛපාල රජ්ජුරුවෝ මෙනම් ප්‍රයෝගයක් කෙරෙති; දූනගෙණ දඹදිව මුළුලෙලහි ඇවිද, ඒ ඒ රට පවත් දූනගණ එව"යි කියා විලඳ කවා මීපැණි පොවා, ශතපාක සහශ්‍රපාක තෛලයෙන් දෙපියාහස්ස මැඩ, නැගෙණහිරි සිවමැදුරු කව්එව සමීපයෙහි සිට ගිරපණ්ඩිතයන් හළසේක. ගිරපෝතකයෝද ඒකබල රට ගොස් ශඞ්ඛපාල රජ්ජුරුවන්ගේ සමීපයෙහි සිටි යෝධයන් අතින් රජ්ජුරුවන්ගේ පවත් තත්වූ පරිද්දෙන් දූන; දඹදිව මුළුල්ල පරික්‍ෂාකරන්නාහු කම්පිලල රට උත්තරපංචාල නුවරට පැමිණියහ.

එසමයෙහි උත්තරපංචාල නුවර චූලනී බ්‍රහමදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යයකෙරෙති. ඒ රජ්ජුරුවන්ට කේවට්ට නම් බමුණුකෙනෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකරන්නාහ. ඌ තුමූ නුවණැත්තාහ, ව්‍යත්තාහ. ඒ කේවට්ටාචාරී එක් දවසක් තුමූ අලුයම්වේලෙහි පිබිද සුවඳ තෙලෙහි නගනලද පහන් ආලෝකයෙන්, ගන්ධදම පුෂ්පදමාවලම්බිත නානාවර්ණ විචිත්‍රවිතානෝපලක්‍ෂිත අලඞ්කෘත ශ්‍රීයහන්ගහීය බලන්නාහු, මහත්වූ සම්පත් දැක "මේ මාගේ යසස කවුරුන් සන්තක දෝහෝ'යි සිතන්නාහු "අනික් කෙනෙකුන් සන්තක නොවෙයි. චූලනී බ්‍රහමදත්ත නම් රජ්ජුරුවන් සන්තකය; මෙබඳු සම්පතක් දුන් රජ්ජුරුවන් සියලු දඹදිවට අගරජ කළොත් යහපත; එසේ උවහොත් මමත් අග්‍රපුරෝහිත වන්නෙමි * සිතා උදෑසනක්සේම රජ්ජුරුවන් සමීපයට ගොස් රෑ දවස සුවයෙන් නිදිලත් පරිදි විචාරා "දේවයන්වහන්ස කොටපියයුතු කථාවේක් ඇතැ"යි කීහ. රජ්ජුරුවෝ 'කියව ආචාරීනි' කීහ. "දේවයන්වහන්ස ඇතුළුනුවරදී රහස් කියන්ට නොපිළිවන; මගුල්උයනට යම්හ"යි කීහ. රජ්ජුරුවෝ 'යහපත ආචාරීනි' කියා බමුණන් හා සමග උයනට ගොස්, සේනාව පිටත සිටුවා, වටකොට රැකවල් ලවා, බමුණන් හා සමග ඇතුළු උයනට වැද, මගුල්සල්වට හුන්හ. ගිරපණ්ඩිතයෝ මෙ ක්‍රියාව දැක "මේ එක් කාරණයෙක් උවමැනව, අද පණ්ඩිතයන්වහන්සේට කියයුතු කිසිවක් අසම්" උයනට වැද මගුල්සල් ගස කොල අතුර සැඟවී උන්හ රජ්ජුරුවෝ බමුණන්ට 'කියයුතු රහස් කියව ආචාරීනි' කීහ. "දේවයන්වහන්ස ඔබවහන්සේගේ කණ මැතට නමාලුවමැනව; මේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණය වන්නේය එහෙයින් ඔබවහන්සේගේ දෙකණ හා මාගේ දෙකණ හා මුත් අනික් කණකට නොයායුතු වන්නේය. ඉදින් දේවයන්වහන්ස මා කීවා කරණසේක් නම්, සියලු දඹදිවට ඔබවහන්සේ අගරජ කොටලම්" කීහ. චූලනීබ්‍රහමදත්ත රජ්ජුරුවෝද

* අහංචඅග්ගපුරොහිතො භවිස්සාමි.

මහත්වූ රාජ්‍යලෝභයෙන් යුක්ත බැවින් බමුණන්ගේ බස් අසා "කියව ආචාරිනි තොප කිවාක් කරමි" කීහ. "දේවයන්වහන්ස අපි සේනාව රැස්කොටගෙණ පළමුකොට කුඩා නුවරක් වටකොට ගනුම්හ; මම කුරුබිලියෙන් ඇතුළු නුවරට වැද ඒ නුවර රජ්ජුරුවන්ට 'දේවයිනි තොප හා අප හා සටන්කොට කාරියෙක් නැත; හුදක් අපනතුවව, තොපගේ රාජ්‍යය තොපටම * වන්නේය; සටන්කලෝනම් අපගේ සේනා වාහන මහත් හෙයින් ඒකාන්තයෙන්ම පරදුව'යි කියමි. ඉදින් මා කී ලෙස නොකලෝනම්, සටන්කොට අල්වාගෙණ මරාපියා, උන්ගේ සේනාවත් හැරගෙණ අනික් නුවරකට යම්හ; ඒ නුවරත් එසේම සටන්කොට ගෙණ ඉන් අනික් නුවරකැයි මෙම සැටියේම සියලු දඹදිව රාජ්‍යය ගෙණ ජයපානය අනුභවකරම්හ'යි කියා එක්සියයක් රජදරුවන් අපගේ නුවරට ගෙණවුත් උයනදී රාමණ්ඩලයක් සාදා උන් හැමදෙනා 'රාබොන්නටය'යි රා මැඩිල්ලේ හිඳුවාලා, විෂ යොදා කරණලද්දාවූ රා අනුභවකරවා, උන් හැමදෙනාම ජීවිත විනාශයට පමුණුවා ගඟ දියට දමා, එක්සියයක් රාජධානියෙහි රාජ්‍යය අත්පත්කොට ගනුම්හ; එසේකල්හි නුඹවහන්සේ සියලු දඹදිවට අගරජ වනසේකැ"යි කීහ.

රජ්ජුරුවෝ 'යහපත ආචාරීනි තොප කී ලෙසම කෙරෙමි' කීහ. "දේවයන්වහන්ස මේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණය නම් වෙයි; අනික් කෙනෙකුන් දත නොහැක්කේය; එසේහෙයින් කල් නොයවා යහපත් නැකතකින් වහා නික්මුණමැනව"යි කීහ. රජ්ජුරුවෝ 'යහපතැ'යි ගිවිස්සාහ. ගිරාපෝතකයෝ ඒ මන්ත්‍රණය අසා නිමවා උන් දෙදෙනා මන්ත්‍රණයකොට අනන්තයෙහි, සාල්ලෙක ලාලා පාතට බාන කෙනෙකුන්මෙන්, කේවට්ට බමුණා හිස වච්ස් පිඩක් හෙළා 'කිමෙක්ද'යි කට දල්වාගෙණ උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවත වච්ස්පිඩක් හෙළා; 'ක්‍රිත්' යන අනුකරණයෙන් හඬමින් කොලත්තෙන් උඩ නැගී "කේවට්ටය තෝ තමාගේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණයයි සිතයිද ? දැන්ම සකණකට ගියේය, නැවත අටකණකට ගොස් පසුව සිය දහසකට යන්නේය"යි කීහ. ගිරවා කොල † ගනුව ගනුව'යි කියදීම පවනට බඳුවූ වේගයෙන් පියාසරකොටගෙණ මියුලු නුවරට ගොස්; මහෞෂධපණ්ඩිතයන්වහන්සේගේ ප්‍රාසාදයට වන්හ.

ඒ ගිරාපණ්ඩිතයන්ගේ මෙබඳුවතෙක් ඇත්තේය; ඉදින් කිසි තෙනකින් ගෙණා අස්නක් පණ්ඩිතයන්වහන්සේට පමණක් කිය යුතුවීනම්, උන්වහන්සේගේ දසරුවට බස්නාහ. ඉදින් අමරාදේවීනුත් ඇසුවමනාවීනම් ඇකයෙහි ගොස් ඉඳිනාහ. ඉදින් බො

* තවරජ්ජංතවෙව භවිස්සති. † ගණ්හථ ගණ්හථාති.

හෝදෙනාත් ඇසුවමනාවීනම්, කිමටබස්නාහ. එදවස් ගිරාපණ්ඩිතයෝ පණ්ඩිතයන්වහන්සේගේ දසරුවෙහි බැස උන්හ. ඒ සලඝුණෙන් 'රහස බිණීයයුතුය'යි බොහෝදෙන ඉවත්ව ගියහ. පණ්ඩිතයන්වහන්සේ සුවපෝතකයන් හැරගෙණ මතු මාල්තලයට නැඟී 'සබඳ තොප විසින් කුමක් දක්නාලදද කුමක් අසනලදදැ'යි විචාළසේක. ඉක්බිති ගිරාපණ්ඩිතයෝ බෝධිසත්ත්වයන්වහන්සේට "මම දේවයිනි සියලු දඹදිව අනික් රජ්ජුරුකෙනෙකුන් සමීපයෙන් කිසි භයක් නුදුටිමි, උත්තර පංචාල නුවර චූලනිබ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ කේවට්ටනම් පුරෝහිතයානෝ රජ්ජුරුවන් උයනට ගෙණගොස් සතරකන් මන්ත්‍රණයක් කළහ, මම මගුල්සල්ගස සල් අත්තක් ඇතුළේ සැඟවී ඉඳ මන්ත්‍රණය අසා නිමවාගෙණ කේවට්ට බමුණා කට වර්චස් පිඩක් එළාපියා ආමි" කියා සියලු තමන් දුටු දෙයත් ඇසූ දෙයත් පණ්ඩිතයන්ට දැන්වූහ. උන්වහන්සේ විසින් 'රජ්ජුරුවෝ ගිවිස්සෝදැ'යි විචාළකල්හි 'ගිවිස්නාලදය, දේවයිනි,' කීහ. පණ්ඩිතයන්වහන්සේ ගිරාපෝතකයන්ට කළමනා සත්කාරකොට හෙවත් මීයෙන් ඇනූ විලඳ කවා මීපැන් පොවා බෙත් තෙලින් පියාසහල මැඩ මොලොක් ඇතිරිලි අතුරණලද රන් මැදිරියෙහි සතප්පා "කේවට්ටයා මා මහෞෂධපණ්ඩිතබව නොදනී" සිතමි; දූත් ඔහු කළ මන්ත්‍රණය මුදුන්පැමිණිය නොදෙමි" සිතා ඇතුළු නුවර හුන් දිළිඳුන් පිටත්කරවා පිටිනුවර ලැවූසේක, පිටරටින් දනව්වලින් සතරවාසල නියම්ගම් සතරින් වස්ත්‍රාභරණ ධන ධාන්‍යාදින් සමෘද්ධවූ ඉසුරුමතුන් ගෙන්වා, ඇතුළුනුවර වැස්වූසේක. බොහෝ ධන ධාන්‍ය රැස්කරවූසේක.

චූළනිබ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද කේවට්ටයින්ගේ බස් ගෙණ, හස්ත්‍යශ්වාදි සෙනග පිරිවරා ගොස්, එක් කුඩා නුවරක් වටලා ගත්හ. කේවට්ට බමුණු තමා යට කී සැටියේම කුරුබිලියෙන් ඇතුළුනුවරට වැද කාරණා කාරණා ඒ රජ්ජුරුවන්ට කියා තමන් වශගකොටගෙණ දෙසේනාව එක්කොටගෙණ අනික් නුවරක රජ්ජුරුවනැයි, මෙසේ චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කේවට්ටාචාරීන්ගේ අවවාදයෙහි සිට ඒ වෛදේහ රජ්ජුරුවන් තබා සෙසු සියලු දඹදිව රජදරුවන් තමන් නතුකළහ. බෝධිසත්ත්වයන්වහන්සේ විසින් ඒ ඒ රජ්ජුරුවන් සමීපයෙහි සිටුවනලද පුරුෂයෝද බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විසින් 'අදවකට මෙතෙක් නුවර ගන්නාලදැයි පණ්ඩිතයන්වහන්සේ නොපමාවනසේක්ව' යි කියා නිරන්තරයෙන් හසුන් එවන්නාහ. උන්වහන්සේද ඒ යෝධයන්ට 'මම මෙහි පමාවක් නැත්තෙමි, තෙපි උකටලි නොව නොපමාව වසව'යි කියා යවනසේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සත් හවුරුදු සත්මස් සත්දවසකින් වෛදේහ රජ්ජුරුවන්ගේ රාජ්‍යය

තබා, සෙසු දඹදිව රාජ්‍යයන් ගෙණ කේවට්ට බමුණන්ට 'ආචාරීනි මියුලු නුවර වෛදේහ රජ්ජුරුවන්ගේ රාජ්‍යය ගනුම්හ'යි කීහ. දේවයන්වහන්ස මහෞෂධ පණ්ඩිතයන් වසන නුවර රාජ්‍යය ගන්ට නොපොහොසතුම්හ. ඒ පණ්ඩිතයෝ වනාහි මෙබඳු නුවණැත්තාහ. ඉතාමඋපායවන්තයහ"යි මෙසේ ඒ කේවට්ට බමුණු ආචාරී විස්තරකොට සඳමඩලෙහි අඳනා කෙනෙකුන්මෙන් මහබෝසත්තානන්වහන්සේගේ ගුණ රජ්ජුරුවන්ට කීහ. ඒ ආචාරී වනාහි තුමූත් උපායවත්හුමය. එසේහෙයින් "මියුලු නුවර රාජ්‍යය නම් ඉතා සවල්පය, සියලු දඹදිව රාජ්‍යය අපට සෑහෙයි, එක් රාජ්‍යයකින් අපට කාරිය කිම්දැ"යි උපායෙන් රජ්ජුරුවන් ගිවිස්සූහ. * සෙසු රජදරුවෝද 'අපි මියුලුපුර රාජ්‍යය ගෙණම ජයපානය බොන්නාම්හ'යි කියන්නා කේවට්ට ආචාරි උනුත් කාරණා කියා වලකා "වෛදේහ රාජ්‍යය ගෙණ කුමක් කරමෝද ඒ රජ්ජුරුවෝත් අප නතුවෝමය නවතුව"යි එක්සියයක් රජදරුවන් උපායෙන් ගිවිස්වූහ.

ඒ රජ්ජුරුවෝ කේවට්ට නම් බමුණාගේ බස් අසා මියුලු නුවර රට යන ගමන් නැවැත්තාහ. බෝසත්තානන්වහන්සේට ඔබවහන්සේගේ චරපුරුෂයෝ "බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක්සියයක් රජදරුවන් පිරිවරා මියුලු නුවරට නික්මුණාහු, නැවත තමන්ගේ නුවරටම නැඟී ගියහ"යි හසුන් එවූහ. බෝධිසත්වයන්වහන්සේද ඒ පුරුෂයන්ට මෙතැන් පටන්කොට රජ්ජුරුවන් කරණ ක්‍රියාවන් දැන † එවත්ව'යි කියා නැවත අසුන් යැවූසේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද කේවට්ටයන් හා සමග "විෂමිශ්‍ර සුරාපානය අනුභව කරවා රජදරුවන් මැරීම් සඞ්ඛ්‍යාත ඒ කටයුත්ත දැන් කරම්හ"යි මන්ත්‍රණයකොට 'අපි ජයපානය බොම්හ'යි කියා 'මඟුල්උයන නඳුන් උයනක්සේ සරහා, දහස්ගණන් කුඩම්වල රා පුරා තබ්බවා අනේකප්‍රකාර මසවුළු ඒ ඒ ස්ථානයෙහි වළින් පුරා රැස්කොට තබව'යි අමාත්‍යයන්ට විධාන කළහ. එ පවත් පණ්ඩිතයන්වහන්සේට අන්තස්සර පුරුෂයෝ කියා යවූහ. ඔහු වනාහි විෂ යොදා රජ්ජුරුවන් මරණු කැමති නියාව නොදනිති. මහබෝසත්තානන්වහන්සේ වනාහි ගිරපෝතකයන් අතින් ඇසූබැවින් දන්නාසේක. එසේහෙයින් උන්වහන්සේගේ අන්තස්සරයන්ට 'ජයපානය බොන දවස් නියමකොට කියාඑව'යි නැවත අසුන් යැවූසේක. ඒ යෝධයෝ වදාළ ලෙසම දවස් නියමකොට යවූහ. ඒ අසා පණ්ඩිතයන්වහන්සේ "මා බඳු පණ්ඩිත කෙනෙකුන් ජීවත්ව හින්ද්දීම මෙහොක් රජදරුවන් මියයාම්

* සෙසරාජානොපි මයං මිථිලාය රජ්ජං ගහෙත්වාව ජයපානං පිවිස්සාමාති වදන්ති.

† ජානන්තූති.

යුක්ත නොවන්නේය; උන්ට මා පිටවහල්වුව මැනව”යි සිතා තමන්වහන්සේ හා එකදවස උපන් යෝධයන් දහස බණවා “සබඳිනි චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ උයන සරහවා, එක්සියයක් රජදරුවන් පිරිවරා සුරාපානය අනුභවකරණු කැමැත්තෝල; තෙපි ඔබනොස් රජ්ජුරුවන්ට අසුන්පණවාලූකල කිසිකෙනෙකුන් නොහිඳිනාතුරුම ‘චූලනි බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හිඳිනට පැණවූ අස්නට ඉක්බිති පැණවූ මාහැඟි අස්නක් අපගේ රජ්ජුරුවන්ටය’යි ගෙණ ඒ රජදරුවන්ගේ සේනාව විසින් ‘තෙපි කවුරුන්ගේ සේනාවදැ’යි කී කල වේදේහ රජ්ජුරුවන්ගේ සේනාවම්හ’යි කියව. ‘කුමක්ද අපි සත්අවුරුදු සත්මස් සත්දවසක් මුළුල්ලෙහි දඹදිව රාජ්‍යගත්තමෝ’ එකදවසකුත් වේදේහ රජ්ජුරුකෙනෙකුන් නුදුටුම්හ; වේදේහරජ්ජුරුවෝ නම් කවුරුද යව උන්ට උවමනාවිනම් කෙළිවර හස්තක් ගනුව’යි තොප හා සමග කලහ කරන්නාහ. තෙපි බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විනා අපගේ රජ්ජුරුවන්ට වැඩිතරම් කෙනෙක් නැතැ’යි කලහ වඩා ගෙණ ‘අප ගේ රජ්ජුරුවන්ට හස්ත පමණකුත් නොලබන්නමෝ දුන් තොප රාත්පිය නොදෙම්හ’යි ‘මස්අවුළු ආදියත් කැ නොදෙම්හ’යි වාසිබෙණෙමින්, සිංහනාද ඇසූ මුවපොල්ලන් පරිද්දෙන් තොපගේ අභීත ශබ්දයෙන්ම උන් භයගන්වා, යමුගුරු බාලා සියලු රා මස් පිරූ සැලවල් බිඳ තු තු කොටපියා, එහා රා මස් අවුළු විසුරුවා, නොකෑ හැකි පරිද්දෙන් කොට, දිවිමෙන් ගොස් සේනා මධ්‍යයට වැද ශක්‍ර පුරයට වන් අසුරභටයන් පරිද්දෙන් මහත් අරගල කොට ‘අපි මියුලු නුවර මහෞෂධපණ්ඩිතයන්ගේ යෝධයම්හ, පිළිවන් වීනම් අප අල්වාගනුව’යි තොප ගියබව අඟවා එව”යි කියා යෝධයන් දහස බණවා යවූසේක. ඒ යෝධයෝත් බෝධිසත්වයන්වහන්සේ වදාළ බස මුදුනෙන් පිළිගෙණ වැඳ සමුගෙණ දුනු මුගුරු අඬයටි පත්කොහොල් පාරවලලූයයි යන පඤ්චායුධ සන්නාඬව, උතුරු පසල් දනව්ව නුවරට ගොස්, නඳුන්උයන් මෙන් සරහනලද උයනට වැද, තගන ලද දලිපුඩු සේසත් ඇති එක්සියයක් රාජසන ආදිවූ පිළියෙළකොට තබනලද ශ්‍රීවිභූතීන් දැක, මහබෝසතානන්වහන්සේ විසින් වදාරණලද ක්‍රමයෙන්ම සියල්ලකොට, සේනාව මධ්‍යයට වැද බොහෝදෙනා ක්ෂොභකොට තමන්ගේ මියුලුනුවර වන්හ.

චූලනී රජද ‘එක්සියයක් රජදරුවන් මරණ පිණිස, ශෘංගිලා ඉදිකරණලද මෙබඳු සුරාපානය මහෞෂධ පණ්ඩිතයන් විසින් * බාධාකළේය’යි කිපියේය. එක්සියයක් රජදරුවෝද ‘අපට ජයපානය බිනත නුදුන්හ’යි කිපියෝය. සේනාවද ‘අපි නො

* කෙළේය යනු කර්මකාරක ක්‍රියායි.

මිලයේ බොන සුරපානය නොලද්දම්හ'යි කිපියහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද, එක්සියයක් රජදරුවන් බණවා "එව පින්වත්නි මියුලුනුවර ගොස් වෛදේහ රජ්ජුරුවන්ගේ ඉස තල්පැන් පකක් මඩනාසේ කඩුවෙන් කපාපියා දෙපයින් මැඩගෙණ හිඳ ජයපානය බොම්හ; සේනාව ගමනට සැරහිගෙණ එන පරිද්දෙන් විධානකරව"යි කියා නැවත රහසිගතව කේවට්ටයන්ටද එපවත් කියා "අපගේ මෙබදු මන්ත්‍රණයකට බාධාකළාවූ පසමිතුරා ගනුම්හ, එක්සියයක් රජදරුවන් හා අටළොස් අක්‍ෂෞහිණියක් පමණ සේනාව පිරිවරා ඒ මියුලුනුවරට යම්හ; අපහ: කැටිව එව ආචාරී"නි කීහ. බමුණානෝ තමන් නුවණැති හෙයින් "මහෞෂධ පණ්ඩිතයන්දැ ගන්ට නොපිළිවන, ගියොත් * අපටම මහා ලජ්ජාවන්නීය; කාරණා කියා රජ්ජුරුවන් නවත"මි සිතා රජ්ජුරුවන්ට "දේවයිනි මේ වේදේහ රජහුගේ බලයෙක් නොවෙයි, මහෞෂධපණ්ඩිතයන්ගේ විධානය, ඌතුමූ මහානුභා ඇත්තාහ. ඒ මහෞෂධපණ්ඩිතයන් විසින් රක්නාලද මිථිලා නම් රාජධානිය සිංහයෙකු විසින් රක්නාලද රත්ගල් ගුහාවක් පරිද්දෙන් වෙන කිසිකෙනෙකුන් විසින් ගන්නට නොහැක්කේය; ගියොත් හුදක් අපටම ලජ්ජාවන්නිය; ඔබ ගමන නොකමැත්තෙමි"යි මෙසේ කීහ. රජ්ජුරුවෝ වනාහි රාජමානයෙන්ද ඉසුරු මදයෙහ්ද මත්ව, දණ්ඩකින් පහරණලද සර්පරාජයකුසේ, කෝපයෙන් දිලිහි 'ඒ මහෞෂධයා කුමක් † කරන්නේදැ' කියා එසේම අභිමාන පුරස්සරවූ එක්සියයක් රජදරුවන් පිරිවරා, වේරම්බවාතයෙන් ඇලලිගිය අටළොස් අක්‍ෂෞහිණියක්සේනාවෙන් යුක්තව නික්මුණාහ. කේවට්ටයෝද තමන්ගේ බස් රජ්ජුරුවන් සිතට නංවා ගතනොහි, රජ්ජුරුවන්ට පටහැණි විම්නම් යුක්ත නොවේ'යි සිතා, රජ්ජුරුවන් හා සමග නික්මුණාහ.

බෝධිසත්වයන්වහන්සේ විසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ ජයපානය විධවංසනය කරන්ට එවනලදදූවූ දහසක් යෝධයෝ තමන් ආ කටයුතු සම්පාදනයකොට එකදවසින්ම රාත්‍රිය මුළුල් ලෙහි ගොස් මියුලුනුවරට පැමිණ තමන්කළ කටයුතු පණ්ඩිතයන්වහන්සේට දැන්වූහ. පළමු ඒ ඒ රජ්ජුරුවන් සමීපයට යවනලද්දාවූ චරපුරුෂයෝද පණ්ඩිතයන්වහන්සේට "චූලනී බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ 'වේදේහරජ්ජුරුවන් ගනුම්හ'යි එක්සියයක් රජ්ජුන් පිරිවරා එන්නාහ. පණ්ඩිතයන් වහන්ස පමා නොවනසේක්ව"යි හසුන් එවූහ. අද අසවල් තෙන ලැගුම් ගත්තාහ. අද අසවල්තෙන ලැගුම්ගන්නාහ. අදවනාහි නුවරටඑන්නාහ"යි පණ්ඩිතයන්වහන්සේට නිරන්තරයෙන් හසුන් එවන්නාහ. ඒ අසා

---

* අම්හාකං යෙව. † කිං සො කරිස්සතීති වත්වා.

මහබෝසතාණන්වහන්සේ එඩාලාම කළමනා විධානයෙහි නොපමාවූසේක. වේදේහරජ්ජුරුවෝ වනාහි 'මේ නුවර ගන්ට එත්ල'යි පරම්පරා ශබ්දයෙන් ඇසූහ.

ඉක්බිති බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ පෙර සඞ්ඛ්‍යායෙහිම ගන්නා ලද්දාවූ ලක්‍ෂගණන් දඬුවැට පහන් ආලෝකයෙන් ශොභ, සියලු සත්යොදුන් මියුලුනුවර පිරිවරාගත්හ. කෙසේ වටකළෝදයත්? පළමුකොට පාපොමළොත් අගල වටා, රන් සන්නාහ ලනලද්දාවූ රන් සැත් රන් පොරෙදු ආදි හස්ත්‍යලංකාරයෙන් සරහනලද්දාවූ, සොඬින් ගන්නා මුගුරු ඇති ලෝහ ප්‍රාකාරවී නමුත් පිටින් ඇත සුණුවිසුණුකරන්ට සමර්ථ ශක්ති ඇති, දෙකපෝලය හා කෝෂය යන තුන්තැනින් වැහෙන්නාවූ එක් මදයකින්ද, ශඞ්ඛස්ථාන තුනහා දෙකන් සිදුරු හා දෙඇස් සිදුරුයයි යන සප්තස්ථානයෙන් වැහෙන්නාවූ එක් මදයකින්ද, එම සප්තස්ථානය හා දෙනාසාපුටය ගුදමාර්ගය යන දශ ස්ථානයෙන් වැහෙන්නාවූ එක් මදයකින්දැයි මෙසේ තුන්මදැතින් ගිලිහෙන්නාවූ, සර්වාභරණයෙන් විභූෂිත ජයඅකුසු හා තොමරාදි ආයුධගත් අත් ඇතිව; පිට හිඳිනා ඇතුරුවන් විසින් ගැවසීගත්, ඒ රජ්ජුරුවන්ගේ කෝප නැමති ගින්නෙන් නැගී දුම්කඳසේ, උස්වූ කන්තලින් කන්තල ගසා සිටුවන ලද්දාවූ ඇත්වලල්ලකින්ද, යුද්ධයට ලනලද්දාවූ සන්නාහ ඇති, අශ්වාලඞ්කාරයෙන් සරහනලද, සින්ධු කාම්බෝජ යෝනකාදි උත්තම දේශයෙහි උපන්නාවූ, නානාභරණ ප්‍රතිමණ්ඩිතව සන්නාහ සන්නද්ධව පිටහිඳිනා අසරුවන් විසින් ගැවසීගත්, 'සතුරා හසුකොට ගනි'ම් ඔදවැඩියාවූ රජ්ජුරුවන්ගේ සිත් නැමති ආකාශ ගඞ්ගාවෙහි බිඳි බිඳී දිවන්නාවූ රළපතරසේ, යුද්ධයට පිඹිනාලද කාහල ශබ්දයෙන් සතුටුව පැණපැණ සිටිනාවූ, ග්‍රීවයෙන් ග්‍රීවය ගසා සිටුවනලද්දාවූ අස්වලල්ලකින්ද, සිංහ ව්‍යාඝ්‍ර ආදි සම් අතුරණලද්දාවූ රථාලඞ්කාරයෙන් සරහනලද, නගනලද නානාවර්ණ ධ්වජපන්ති ඇති, සෛන්ධව අශ්වයන් යොදනලද, සර්වාලඞ්කාරයෙන් සැරසී පිටබඳනාලද හියවුරු ඇති නැගෙණලද ධනුර්ධරයන් විසින් උපලක්‍ෂිතවූ, සේනා නැමති සමුද්‍රයෙන් නැංගාවූ මහ තල්මස් කැලසේ, රියසකින් රියසක ගසා සිටුවනලද රථ වලල්ලකින්ද ~ සිඬාවී කුමාරයන් සමතිස් පෙරුම් පුරා මුළුකොටගෙණ, බොධිද්‍රැමයක් පිටිවහල් ලදින් සත්තිස් බෝධි පාක්‍ෂික ධර්ම සඞ්ඛ්‍යාත යෝධයන් බලකොටගෙණ, විදුරසුන් අරා, බුදුවන්ට උන්වේලෙහි ජයගැන්ම පිළිවන් හෝ වේවයි නොපිළිවන් හෝ වේවයි දුර තබාම අන්‍යතර ජාතියෙක අන්‍යතර යුද්ධයක් කොට බැලුවමැනවැ"යි සිතා; චූලණීරාජ ව්‍යාජයෙන් ආ වසවර්ති මාරයාගේ සිංහමුඛ හස්තිමුඛ අශ්වමුඛ ව්‍යාඝ්‍රමුඛාදිවූ නොයෙක් භයඞ්කරවූ

මුඛ මචා, අසි ශක්ති තෝමර භෙණ්ඩිවාල කරවාලාදිවූ දිප්තිමත් නානාවිධ අවි ගන්මින්, අනේකප්‍රකාර විකාර වේශයෙන් ආ දසබිම්බරක් මාරසේනාවසේ, භයඞ්කාරවූ සේනායෙහි බාහුවෙන් බාහුව ගසා සිටුවනලද්දාවූ යෝධ වලල්ලකින්දයි; මෙසේ සතරවලල්ලකින්, ඒ සත්යොදුන් මියුලුනුවර වටලවා, ඒ ඒ ස්ථානයෙහි බලඇණි සිටවූහ.

මනුෂ්‍යයෝ ඔල්වර හඬ දෙන්නාහු අත්පොලසන් දෙන්නාහු පණින්නාහු 'වටලාගතුම්හ' යන සමාධියෙන් නටමින් ගජ්ජනාකරමින් සිටගත්හ. අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාවෙහි නගනලද මිණිදඬු වැටෙහි ලක්ෂණණින් පහන් ආලෝකයෙන්ද එක්සියයක් රජදරුවන් හා හස්ත්‍යශ්වාදි සේනාව පළන් ආභරණයෙහි ආලෝකයෙන්ද සියලු සත්යොදුන් මියුලුනුවර ඒ මහෞෂධපණ්ඩිතයන්ගේ ප්‍රඥා නැමති සූර්ය්‍යයා පහළව සත්වයන්ගේ සිත මෝහාන්ධකාර විගමනයෙන් හෙළිවූ කලක් පරිද්දෙන්, ආලෝකවිය. ඇතුන්ගේ කුංචනාදයෙන්ද අසුන්ගේ හේෂාරවයෙන්ද රථයෙහි චක්‍රනාදයෙන්ද පාබල සෙනගෙහි ගජ්ජනාවෙන්ද, සක් සින්නම් හර තන්තිරිපට ගැටපහටු මහබෙර පනාබෙර රන්සක් රිදිසක් ආදිවූ පංචාඞ්ගික තූර්ය්‍ය නාදයෙන්ද, පොළව පැළියන පරිද්දෙන් වූයේය. සේනකාදිවූ පණ්ඩිතවරු සතරදෙන මහත්වූ කෝලාහල ශබ්දය අසා, කුමන අරගලක් බවත් නොදන්නාහු, වෛදේහරජ්ජුරුවන් සමීපයට ගොස් "දේවයිනි මහත්වූ කෝලාහල ශබ්දයක, අපි කුමක්බවත් නොදනුම්හ 'කුමන අරගලයෙක්ද'යි විමසුවහොත් යහපතැ"යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ 'සලි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ආවහ'යි සිවමැදුරුකවුළුව හරවා පිටත බලන්නාහු උන් ආබැව් දැන හයින් ත්‍රස්තව "ඉතිකින් අපගේ දිවි නැත බ්‍රහ්මදත්තයා තෙමේ දැන් දැන් අප හැම මරන්නේය"යි සේනකාදීන් හා සමග කථාකරමින් හුන්හ.

මහබෝසතානන්වහන්සේ වනාහි චූළනී රජ්ජුරුවන් ආ බව දැන, සිහයෙකුමෙන් කිසිභයක් නැතිව, නුවර මුළුල්ලෙහි රැකවල් සකස්කොට ලවා "රජාදිහු භයින් දිලිනිලා ඉඳිති, මා උන් අස්වසාලුව මැනව"යි රජගෙයි මතුමාලට නැඟී රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටිසේක. රජ්ජුරුවෝ මහබෝසතානන්වහන්සේ දැක, ලබනලද අස්වස් ඇතිව 'මපුතනුවන් මහෞෂධපණ්ඩිතයන් විනා අනික් මා මේ දුකින් මුදන්ට සමර්ථකෙනෙක් නැතැ'යි සිතා; පණ්ඩිතයන්වහන්සේ හා සමග කථාකරන්නාහු "මහෞෂධපණ්ඩිතයෙනි පංචාලදේශවාසිවූ බ්‍රහ්මදත්තරජතෙම එක්සියයක් රාජධානියෙහි සියලු අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව හා සමග ආයේය. පංචාල රාජධානි සන්තකවූ

මේ සේනාතොමෝ 'මෙතෙකැ'යි පමණ නැත්තීය. ඉතා මහත් මාරට්ට සාලාදිවූ නොයෙක් කර්මාන්තට පිටින් ගෙණ එන්නාවූ දූව පත්‍ර සංගාලියම් වෙටටම් ලෑලි ආදිවූ දරුසම්භාරයන් ගෙණ ඇවිදිනා වඩු සෙනඟින්යුක්තව; සියලු සංග්‍රාමයෙහි දක්‍ෂවූඇතුන් අසුන් ආදිවූ බලසෙනඟ ඇත්තීය. ගහණ බැවින් තමා අතුරට වන්නවුන් නොපෙණෙන පරිද්දෙන් පය බිමගෑවිය නොදී උර පිටින් ගෙණයන්නිය. හස්තිශබ්දය අශ්වශබ්දය රථශබ්දය විණා ශබ්දය මෘදංග ශබ්දය ගීත ශබ්දය තාල ශබ්දය 'විදුව ගනුව අනුව'යි මෙසේ දශවිධ ශබ්දයෙන් යුක්තවූය; ඇතුන් ආදිවූ සිව්රඟ සෙනඟෙහි පවත්නා නාදය මූදුපරගානාසේ පවත්නා හෙයින් මුබ එව, ඔබ යව, යුඩකරව, පමානොවව' යනාදිවූ ඒඒ කටයුත් තෙහි නියෝග වචන වාගෙහදයෙන් දන්වන්ට නොපිළිවන් හෙයින් මෘදංග මද්දලාදිවූ නානා ප්‍රකාර භෙරි ශබ්දයෙන් හා ශඞ්ඛ කාහල ශබ්දයෙන් හඟවන්නාවූ ඒ ඒ කටයුතු ඇත්තිය. සත් රුවනින් විසිතුරුවූ සන්නාහයෙන් හා සවර්ණජාල හස්තිකුන්ත විශෙෂයෙන්ද රාජ රාජ මහාමාත්‍යාදීන් පළඳනා ලද්දවූ කනක කටක රසන නූපුර නාඩඞක වලය තිසරපට අවුල්හර උදර බන්ධන ගැටනිමුල් හර පස්රූ පස්වලලු පේරැස් එක් වැටි පාමුදු පාඩගන් පාසලඹ පාදජාලා පාදත්‍ර පාදාභරණාදිවූ ශරීරා භරණ යෙන්ද හොබනිය. කනක රජතාදීන් විචිත්‍රවූ රකත නිලාදිවූ නානාවස්ත්‍රයෙන් සමුජ්වලිත රථාදියෙහි නගනලද නානාප්‍රකාර ධවලවජ්‍ර පන්තියෙන් ගැවසීගත්තීය. ඇත් වාහන අස්වාහන රථ වාහනයෙන් යුක්තය. හස්ති ශිල්පය අශ්ව ශිල්පය රථ ශිල්පය ධනුශශිල්පය ආදිවූ අටළොස් මහා ශිල්පයෙහි කෙළි පැමිණියන් විසින් විශෙෂයෙන් සමෘඩය. මේ සේනා තොමෝ සිංහසමාන වික්‍රම ඇත්තිය. සූර යෝධයන් විසින් සුප්‍රතිෂ්ඨිතය. මේ සේනාවෙහි පොළව හා සමාන නුවණ ඇති රහස් මන්ත්‍රණ කරණ සුලුවූ, හෙවත් දෙදවසක් තනිව හිඳ සිතුවහොත් මහ පොළව පෙරලන්ටද අහස හා පොළව ගැටලන්ටද, පොහො සත්වූ පණ්ඩිතවරු දසදෙනෙක් ඇත්තාහ. ඒ පණ්ඩිතවරුන්ට වඩා අධිකවූ ප්‍රඥ ඇති රජ්ජුරුවන්ගේ මැතියෝ තලතාදේවි, පණ්ඩිතවරුන් දසදෙනාට එකොළොස්වැනිව හිඳ, චූලනි රජ්ජුරුවන්ගේ සේනාවට අනුශාසනා කරන්නාහුය.

වැලිදු 'ඒ තලතාදේවීන්ගේ ප්‍රඥව කෙසේද යතහොත්–එක් දවසක් මිනිසෙක් සාල් නැළියක්ද පලාබත් මුලක්ද මසුරන් දහසක්ද හැරගෙණ 'ගඟෙන් එතරයෙමි'යි ගඟ මැදට ගොස්, දිය සැඩහෙයින් එතරව ගත නොහී එතර සිටි මිනිසුන්ට 'පින්වත්නි මා අතසාල් නැළියක් හා බත් මුලක්ද මසු දහසෙක්ද ඇත, මෙකී තුනින් මට යමක් රුචිව්නම් ඒ දෙමි, නොප ඇම

දෙනා කෙරෙන් යම් කෙනෙක් මා එතරකළ හෙයිනම් ඌ මා එතර කෙරේව'යි මෙසේ කීය. ඉක්බිති ශක්තිසම්පන්න පුරුෂයෙක් කඩිය තරකොට හැඳගෙණ ගඟට බැස ඒ පුරුෂයා *අත අල්වාගෙණ එතරකොට මට දියයුතුදෙය දෙව'යිකීය. ඒ තෙමේ සාල්නැළිය හෝ බත් මුල හෝගනුව'යි කීයේය. ඒ අසා දියෙන් එතර කළ පුරුෂයා ''මම මාගේ ජීවිතය නොසලකා, තොප එතර කෙළෙමි, මට සාල් නැළිය හා බත් මුලින් ප්‍රයොජන නැත, මසු දහස දෙව"යිකීය. ඒ අස මින් යමක් මට රුචිවීනම් ඒ දෙන්නෙමි කියෙමි, දැන් මටයමක් රුචිවීනම් ඒ දෙමි, කැමතහොත් ගනුව'යි කිය, ඒ තෙමේ සමීපයෙහි සිටි එකෙකුට එපවත් කිය, එයින් 'යමක් තමන්ට රුචිවීනම් ඒ තොපටදෙමි කියාවේද උන් කීයේ; උන් දෙනු කැමතිදෙයක් හැරගනුව'යි කීයේය. ඒ පුරුෂයා උන් කී බසත් නොසිට 'එසේ මා ගන්නේ නැතැ'යි ඔහු ඇරගෙණ අධිකරණ නායකයන්ට සරුප කිය. අධිකරණයේ ඇත්තෝද දෙන්නාගේ බස්අසා 'ඌ දුන් දෙයක් ගනුව'යි එලෙසම කිවුය. ඒ පුරුෂයා අධිකරණ නායකයන්ගේ යුක්තියෙහි නොසිට රජ්ජුරුවන්ට දැන්විය, රජ්ජුරුවෝ අධිකරණ නායකයන් ගෙට ගෙන්වාගෙණ උන් මැදයේ දෙන්නාගේ බස් අසා එලෙසම කියා යුක්තිය පසිඳිනා සේ නොදන්නාහු තමාගේ ජීවිතයෙහි ආසාවක්නැතිව ගඟට බට තැනැත්තවුම පැරදවූහ. එවේලෙහි රජ්ජුරුවන්ගේ මැනියෝ තලතාදේවී තුමූ එතනට නුදුරුතැනක හුන්නාහු රජ්ජුරුවන් යුක්තිය නපුරුකොට පසුන් බව දැන 'පුත මේ යුක්තිය සලකාපියා කියව'යි කීහ. මෑනියන්වහන්ස මා දන්නේ මෙපමණෙක්මය; ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දන්නාසේක් විනම් පසිඳුව මැනව'යි කීහ. තලතාදේවී 'යහපත යුක්තිය පසිඳිමි' කියා ඒ දියෙන් යන්ට සිටි පුරුෂයා බණිවා 'මෙසේ එව දරුව, තොප අත තුබූ සාල් නැළියත් බත් මුලත් මසු දසත් තුනම පිළිවෙළින් බිම තබාලව'යි කියා පිළිවෙළින්ම තබවා 'තෝ දියෙන් යන්නෙහි මූට කුමක් කීයෙහිද'යි විචාරා 'මෙලෙස කීමි, කී කල්හි 'එසේ වීනම් තට රුචියක් හැරගෙණ යව'යි කීහ, ඒ තෙමේ මසු දස අතට ගත. ඉක්බිති මද තැනක් ගියකල බිසව්ඌ ගෙන්වා 'දරුව මසු දහස තොපට අභිප්‍රායදැ'යි විචාරා 'එසේය කැමැත්තෙමි' කීකල ''දරුව තොප විසින් මින් මටයමක් රුචිවීනම් ඒදෙමි මෝහට කියනලදද නොකියන ලදදැ"යි කියා 'කියනලදැ' යි දේවීන්වහන්ස කීකල එසේවීනම් මේ මසු දස මෝහට දෙවයි කීහ. ඒ තෙමේ හඬමින් වලපමින් මසු දස ඔහට දුන්නේය. එවේලෙහි රජ්ජුරුවෝද අමාත්‍යයෝද සතුටුව සාධුකාර දුන්හ. එතැන් පටන් තලතා දේවීන්ගේ නුවණ දඹදිව මුළුල්ලෙහි පහළවිය. මේ

* තංහත්ථෙ ගහෙත්වා

නිසාය. 'චූළනීරජ්ජුරුවන්ගේ මෑනියෝ තලතාදේවී එකොළොස්වනුව සේනාවට අනුශාසනා කෙරෙති' කීයේ.

නැවත ඒ සේනාවෙහි පංචාල රාජ්‍යයෙහි අනූනවූ පරිවාර සම්පත් ඇති බ්‍රහ්මදත්තයා විසින් හැරගත් රටඅයිති මරණභයින් තැතිගත් එක්සියයක් රජදරුවෝ මේ චූළනීරාජයා සමගයෙති. අටළොස් අක්ෂෞහිණියක් සේනාවෙන් මේ මිථිලා නම් රජධානිය වටලා; පළමුව ඇත්පවුරෙක, දෙවැනිව අස්පවුරෙක, තුන්වැනිව රථ පවුරෙක, සතරවැනිව යෝධපවුරෙකැයි මෙසේ සතර වලල්ලක් හා, ඇත් වලල්ලට හා අස් වලල්ලට අතුරෙහි එක් වීථියෙක, අස් වලල්ලට හා රථ වලල්ලට අතුරෙහි එක් වීථියෙක, රථ වලල්ලට හා බළ වලල්ලට අතුරෙහි එක් වීථියෙක, මෙසේ තුන් සන්ධියකින් වටකරණලද, වෛදේහ රට වාසීන්ගේ මිථිලා නම් රාජධානිය හාත්පසින් කැණ උඩ නගන කලක් පරිද්දෙන් පවුරු පදනම් බිඳ දූන් දූන් සුණු විසුණු කරණු ලැබෙයි, මහෞෂධපණ්ඩිතයෙනි හාත්පසින් යම්බදු සේනාවක් පිරිවරණලදද ඒ සේනාවට මත්තෙහි පෙණෙන නොයෙක් සියදහස් ගණන් මිණිදඹුවැට පහන් කරණකොටගෙණ තරුවැලයෙන් ගහණවූ ආකාශය වැන්න. පණ්ඩිතයෙනි * අවීචියෙහි පටන් භවාග්‍රය දක්වා තොප හාසමාන නුවණැති කෙනෙක්නම් නැත. නුවණනම් මෙසේවූ තැනටවේද එහෙයින් තෙපිමදනුව මේ මහසේනාවෙන් අප ගැලවීමෙක් කෙසේවේදැ"යි කීහ.

මෙසේ රජ්ජුරුවන් මරණ භයින් යුක්තව කියන්නාවූ බස් අසා මහබෝසතානන්වහන්සේ "මේ රජ්ජුරුවෝ ඉතා මරණ භයින් භයපත්ව ගියාහ. රෝගයෙන් පෙළෙන එකක්හට අවසථා පිළියමක් දන්නා වෙදෙකු පිළිසරණ වන්නාසේද, සාදුකින් පෙළෙන එකෙකුට භොජනය මුත් අනිකක් පිළිසරණ නොවන්නාසේද, පිපාසා ඇති එකෙකුට පැන් පොවා මුත් ඒ පිපාසය නො සන්හිඳෙන්නා සේද, මේ රජ්ජුරුවන්ට මා මුත් අනික් පිළිසරණක් නැතැ"යි †රජ්ජුරුවන් අස්වසාලම් සිතූසේක. ඉක්බිති රජ්ජුරුවන්ට මහබෝසතානන්වහන්සේ සැට යොදුන් රන්ගල්තලා මස්තකයෙහි නාදකරණ සිංහරාජයෙකු මෙන් "නොබව මැනව් දේවයන්වහන්ස රාජ්‍ය සුව අනුභවකළමැනව්. මම කැටක් ගෙණ කපුටු රැසක් පලවන එකක්හු මෙන්ද, දුන්නක් අල්වාගෙණ වඳුරු මුලක් පලවන එකක් පරිද්දෙන්ද, මේ අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව බඩබන් කඩපමණකටවත්

* තාත මහොසධ අවීචිතොයාව භවග්ගා අජ්ඣොත්ථතයා සදිසො උපාය කුසලො පණ්ඩිතො නාම නත්ථි. පණ්ඩිතභාවොච නාම එවරූපෙසු ඨානෙසු පඤ්ඤායති තස්මාත්වමෙවජාන.

† අස්සාසෙස්සාමි නන්ති.

අස්වාමික කරවා නිගණ්ඨ සේනාවක් පරිද්දෙන් ඉස් ලූ ලූ අත ලුහුබඳවා පියමි; එය මට භාරය 'සටනෙකැ'යි සිතක් නොතබාභය නොගෙණ සුවසේ රාජ්‍යශ්‍රී අනුභව කළමැනව"යිකීසේක. මෙසේ කියා රජ්ජුරුවන් අස්වසාලා මාලිගාවෙන්බැස නුවරබෙර ලවා හැමදෙනාට වදාරණසේක් "පින්වත්නි නෙපි හැම'සතුරෝ වටලා ගත්තෝ වේදැ'යි නොසිතා මල් ගඳ විලවුන් හා අටලොස් වර්ගයේ කැවුම්හා රා මස්ආදි නොයෙක් අන්නපාන සපයා වස්ත්‍රාභරණයෙන් සැරහී උත්සවයට පටන් ගනුව, සමහර කෙනෙක් තොප තොපට සුදුසු පරිද්දෙන් බොව නම් මහාපානයත් බොව, බෙර ගසව, ගී කියව, එළු සත් ඔල්වර සත් අසුරුසත් දෙව, සියල්ලක් නැති කෙනෙකුන්ට මාගෙන්දෙමි, මහෞෂධපණ්ඩිතයෝ නම් මමය. කිසි භයක් නොකරව, මාගේ ආනුභාව බලව"යි කියා අස්වසා වදාළසේක. ඒ බසින් නුවර වාසිහු සත් අවුරුද්දේ පටන් ඔබගේබල තමන් ඇම ඉදුරා දන්නා හෙයින් කිසි භයක් නැතිව ශඞ්කා රහිතව නැටුම් ආදි සියල්ලෙන්ම මහතානන් වදාළ පරිද්දෙන් උත්සවයට පටන්ගත්හ. නුවර ඇතුළෙහි ගී කියන වයන අරගල පිටනසිටි සතුරෝ අසන්නාහ. සතුරන්ගෙන් බොහෝ දෙන කුරුබිලියෙන් ඇතුළු නුවරට වදනාහ. සතුරුව ආ විටෙක මුත්, දුටු දුටුවන් නො අල් වන්නාහ. එසේ හෙයින් සතුරන්ගේ සංචාරය නොසිඳෙන්නේය; නුවරට වත් වත් මනුෂ්‍යයෝ උත්සව කෙළිනාත් ජය පානය බොන්නාත් ජන කෝලාහලත් දක්නාහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් ඇතුළුනුවර කෝලාහලඅසා සමීපයෙහි සිටියවුන්ටකියන්නාහු "පින්වත්නි අටලොස් අක්ෂෞහිණියක් පමණ මේ සේනාව ගෙණවුත් තමන්ගේ නුවර වටලාගත් නියාවට කිසි භයක් වත් නැති ගැන්මක්වත් නැත්තේය; සන්තොෂයෙන් යුක්තව පස්විණක් ප්‍රීතීන් පිණාගියවුන් සේ අත්පොළසන් දෙන්නාහ, අඩගසන්නාහ, එළු සත් දෙන්නාහ, ගී කියන්නාහ, බෙර ගසන්නාහ, කොල කුමන ආශ්චර්යයෙක්දැ"යි කීහ.

එසේ කී රජහට චරපුරුෂයෙක් බොරුවක් ගොතා ගෙණ කියන්නේ "දේවයන්වහන්ස මම කිසි කටයුත්තක් නිසා කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙම් සැණකෙළි කෙළනා ජනයන් දැක 'පින්වත්නි සියලු දඹදිව රජදරුවන් සේනා සහිතව අවුත් තොපගේ නුවර වටලාගෙණ සිටියදී, තොප හැම මෙසේ ප්‍රමාදව වසන්නට කාරණා කිම්දැ'යි විචාළෙමි; ඔහු මට කියන්නාහු 'අපගේ රජ්ජුරුවන් කුමාර කල මෙසේවූ දෙළෙක්විය; කෙසේදයත්–දසදහසක් යොදුන් දඹදිව රජුන් මුලුල්ල සේනාව පිරිවරා අවුත් මා උන්නුවර පිරිවරා සිටි

කල 'සැණකෙළි කෙළිම්' යි දෙලෙක් උපන; ඒ දෙළ දූත් මුදුන් පැමිණියේය; එබැවින් 'සත් දවසක් සැණකෙළි කෙළිව'යි නුවර බෙරලවා තමන්වහන්සේ මාලිගාවේ මතු මහලේ අමාත්‍යමණ්ඩලයා පිරිවරා හිඳ මහ සන්තොෂයකින් මත්ව ජයපානය බොනසේක් මේ රජ්ජුරුවන්හා සේනාව ආතියාව ඔබතමා දන්නාසේක්දැ"යි කිහ. මම එබස් අසා 'රජෙකු බොලඳ නියාය"යි නින්‍දකෙළෙමියි කීය. බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ එබස් අසා දණ්ඩෙන් ගසනලද ආශිවිෂයකුමෙන් ක්‍රොධයෙන් දිලිහි කිපුණාහු "කොල වහා මේ නුවර ඒ ඒ දිගින් අගල මැඩ හැස්වා, පවුරු දොරටු අටලු වාසල් බලකොටු ආදිය බිඳ සුණු විසුණු කෙරෙමින් වහා නුවරට වැද ගැල් පුරා ගෙණවුත් කොමඩු බානාසේ මහජනයන් ඉස් කපාගෙණ, වෛදේහ රජහු ඉසත් වහා ගෙණෙව"යි කිහ.

එබස් අසා බලසම්පන්න යෝධයෝ නොයෙක් ආයුධ ගත් අත් ඇතිව 'නුවර ගනුම්හ'යි පවුරු වාසල් සමීපයට ගියාහු, බෝධිසත්ත්වයන්වහන්සේගේ යෝධයන් විසින් දමනලද කලල් වැලි ආදියෙන් මහා විනාශයට පැමිණ නුවර බිඳිනා තබා, පවුර සමීපයටත් යා නොහී නැවත යන්නාහ. ඉන් සමහර කෙනෙක් නොනැවත 'පවුර බිඳුම්හ'යි වාසි කියා සහාසිකව ගොස්, අගල බටුනම් අනතරට්ටාලවල සිටියෝ ඊදඬුමුණ කොහොල් තෝමර හෙණ්ඩිවාලාදීන් දමා මහා විනාශයට පමුණුවන්නාහ. බෝධිසත්ත්වයන්වහන්සේගේ යෝධයෝ බ්‍රහ්මදත්තයන්ගේ යෝධයන්ට අතින් මුහුණින් උසුළු විසුළු පෑ නොයෙක් ප්‍රකාරයෙන් ආක්‍රොශ පරිභව බෙණෙමින් ගහට කරන්නාහ. මච්ඡ මාංස හා කන බොන දැ හා රා විත් ඔඩම් ආදි පුරාගෙණ පිටත සිටියවුන්ට දික්කොට පුළුගන්වා නැවත තුමූම කන්නාහ, බොන්නාහ; මෙසේ සතුරන් කිපෙන සුලුවූ නොයෙක් විකාර පවුරෙන් ඇතුළේ පදනම උන්ට පෙණෙන නියායෙන් සක්මන් කරන්නාහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යෝධයෝ උන්ට කිසිවකුත් කොට ගත නොහී ගෙඩි බැට කා අත පය හිස නළල ලේ පිස පිස පසු බල බලා දිවන්නාහු රජ්ජුරුවන් සමීපයට ගොස් 'දේවයන්වහන්ස සෘඬිමත් කෙනෙකුන් ආකාශයෙන් ගොසින් වදුත් මුත්, මිනිසුන් විසින් මේ නුවර වදනා තබා සිතන්ටත් බැරිය'යි කිහ. එ බස් අසා රජ්ජුරුවෝ නොසතුටුව කිප දවසක් රඳා නුවර ගන්නා උපායක් නොදන්නාහු කේවට්ටයා විචාළහ; "ආචාර්ය්‍යිනි නුවර ගන්නා තබා පවුර ළඟට යන්ටත් සමර්ථ එකද සත්ත්වයෙක් නැත; කුමක් කරමෝදැ"යි කිහ. එ බස් අසා බමුණා කියන්නේ "වන්නාටය; මහරජ නුවරට පැන් නම් පිටතින් වන්නේය, කිප දවසක් පැන් නාවතාලන්නා පැන් නොලදින්

කලානන වූවාහු දෙර හැරපියන්නාහ; එවිට අපි සිත්වූ පරිද්දෙන් සතුරන්ට කටයුතු කියම්හ"යි කීය. 'කොල එයින් උපායෙකැ'යි එනැන් පටන් පැන් වැද්ද නොදෙන්නාහ. එ පවත් බෝධි සත්ත්වයන්වහන්සේගෙන් රජහු සමීපයෙහි සිටි චර පුරුෂයෙක් පතක ලියා ඊදණ්ඩකබැඳ ඇතුළු නුවරට විදපීය.

බෝධිසත්ත්වයන්වහන්සේද සතුරන් ආ දවස් විධානයක් කරණසේක් "යමෙක් ඊදණ්ඩකලියා විදපීපතක් දුටුයේවීනම් වහා ගෙනවුත් මට දෙව'යි වදාළසේක. එබැවින් එක් පුරුෂයෙක් ඒ පත ගෙනවුත් දින. ස්වාමිදරුවානෝ එ බව දැන 'මේ කේවට්ට මහල්ලා ඇතුළුවූ අඥාන ජඩයෝ මා නවම මහෞෂධ පණ්ඩිත බව නො දන්නා වන්හ'යි සිතා සැටරියන් උණ්දණ්ඩක් ගෙන්වා සරියේ දෙකක් කොට පළා ඇතුළු පිට ගැට හරවා සූඩකොට එක්කොට නබා සමින් වසා බඳවා පිට මැටි ගාවා, තපස්වින්ලවා හිමාලයෙන් ගෙන්වූ මැටිහා ඇඹුලු අල ගෙන්වා, පොකුණු අස දියෙහි මැටිතබා මැටිපිට උණ්දණ්ඩසිටුවා, ඇතුළේ පැන් පුරවාලූසේක. * එකරැයින්ම පැලය නැගී උණ්දණ්ඩ මුදුනෙන් රියනක් පමණවැඩී මලෙක් පිපි සිටියේය. ඒ අභිමතාර්ථ සාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ ස්වාමිදරුවූ බෝධිසත්ත්වයන්වහන්සේ ඒ මල්දණ්ඩ මුලින් උදුරුවා 'මේ බ්‍රහ්මදත්තරජ්ජුරුවන්ට දෙව'යි නමන්වහන්සේගේ පුරුෂයන්ට දුන්හ, ඔහු ඇඹුලුදණ්ඩ වලල් ලේලා 'කොල බ්‍රහ්මදත්තයන්ගේ පුරුෂයෙනි සයින් නොමිය තෙලෙ මල කඩා ඉස පැලඳගෙණ ඇඹුල දණ්ඩ හුයාගෙණ බඩපුරාකාපියව'යි පවුරෙන් පිටත දමාලූහ. එයින් බෝධිසත්ත්වයන්වහන්සේගෙන්ම සිටි චරපුරුෂයෙක් හැරගෙණ රජ්ජුරුවන් සමීපයට ගොස් "බැලූව මැනව දේවයන්වහන්ස මෙබඳු ඇඹුල මලක් හා මේ දිග ඇඹුල දණ්ඩක් දුටු විරූදෑ නැතැ"යි කීය. 'රජහු මැන බලව'යි කීහෙයින් චරපුරුෂයා මනන්නේ සැටරියන් දණ්ඩ අසූරියන්කොට මැනපීය. නැවත රජහු "මේකෙසේවූ නෙනක ඇනිවිද්ද"යිකීහෙයින් ඉන්මඑකෙක් රජහු කටින් බස උදුරාගන්නාසේ බොරුවක් ගොතාගෙණ කියන්නේ 'මම එක් දවසක් රාවිකක් බීපියනුකැමත්ව සුරුබිලිසෙන් ඇතුළු නුවරට වන්නෙම්, නුවරවාසින් දියකෙළිනා මහ පොකුණක් දුටිමි. බොහෝ මනුෂ්‍යයෝ ඔරු අගුළු ආදියෙහි ඉදගණ මල්කඩා දියකෙළි ඇවිදිනාහ. මේ වූකලී, ඒපොකුණේ ගොඩ අස පිපි මලෙක්සැටිය, ඉදින් ගැඹුරු තැනෙක පිපි මලෙක්වීනම්, සියක් රියනටත්වඩා ඇත්තේවේද'යි කීය. ඒ අසා "ආචාරීනි 'පැන් නවතා මේ නුවර ගනුම්හ"යි.

* එකරත්තෙනෙව වඩ්ඪිත්වා පුප්ඵං වෙළුමත්ථකතො උග්ගන්ත්වා රතනමත්තං අට්ඨාසි.

නොසිතව; ඒනොපගේ උපායෙක් නොවෙයි* ඒගැරුපියවයිකීහ. "එසේ කල දේවයන්වහන්ස මෙවිට මාසිතුදෙය ඉතාම යහපත, නුවරට වී සාල් නම් පිටතින්ම වන්නේය. ඒ වී සාල් වැද්ද නොදෙම්හ. බතින් පීඩිතවූ මනුෂ්‍යයෝ දෙර ඇර පියන්නාහ; එවිට අල්වාගෙන කැමැත්තක් කරම්හ"යිකිය,† රජ්ජුරුවෝ ආචාරිනි එසේවේවයි කීහ.

ඒ මනාත්‍රණයන් පලමු පරිද්දෙන් පතකින්ම දූත, මේ නිවටවූ කේවට්ටයා මා තුවිණ්ණැනි නියාව නොදන්නා වනැ"යි කියා 'අනුපාකාරය'යි කියනලද පදනම් මුදුනේ කලල් අතුරුවා ඊපිට වී ඉස්වාලිසේක; බෝධිසත්වයන්ගේ අභිප්‍රාය නම් සිඬවන්නේය; එබැවින් ඒ වී එකරැයින් පැලනැගී සත්යොදුන් මියුලු නුවර වට පවුර මුදුනෙන් ඉතා නිල් වලා සමුහයක්සේ අති නිලව පෙණෙන්ට වන, ඒ දුටු රජ්ජුරුවෝ 'පවුර මුදුනේ ඉතා නිල්ව අර මේ පෙණෙන්නේකිම්දැ'යි සිටියවුන් විචාළහ. චරපුරුෂයෙක් කියන්නේ "දේවයන්වහන්ස ගොවියාපින් මහෞෂධපණ්ඩිතයා තමා ප්‍රඥබලයෙන් මතුවන්නාවූ භයදුනතමාගේ විධානවැටෙන්නාවූ මේ ජනපදයෙහි වී ටිකක් ඇයි තිබිද, එකහෙළා ගෙන්වාගෙණ මේසා මහත් නුවර හැමදෙනාගේ කොටු ගෙවල් පුරවා, ඉතිරි වී පවුරපිට හා වීථියේ ඒ ඒ ස්ථානයෙහි ලවාපිය, ඒ වි තෘක්මු එල්ල අව්වේ වියලි වැස්සේ තෙමී පැලනැගී ගොයම්ව ගියේය; මම එක් දවසක් කටයුත්තක් පිණිස කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙම්, ඇස්වූ වියෙන් වී ටිකක් ඇරගෙණ 'කොල ඉතා යහපත් වියෙක, ඉස්නෙම්' කියා වීථියට දමාපීම්; ඒ දැක එනන සිටි ජනයෝ මා වෙහෙසන්නාහු 'ඉතාම බඩසාය සැටියක, කැමැත්තෙහි වීනම්, තිලින් පොදියක්කොට බැඳගෙණ ගොස් පැහැරපියා පිසගෙණ බඩපුරා කා නොමිය'යි කීහ. ඒ වි මා ඇල්ලු සේ 'ඉතා නපුරැ'යි ලජ්ජාවට පැමිණියෙමි" කිය. ඒ අසා රජ කේවට්ටයාට කියන්නේ 'වී නවතාලාත් මේ නුවර ගත නොහැක්ක; තාගේ එයින් උපායෙක් නොවෙයි හැරපියව'යි කිය. "දේවයන්වහන්ස නොසිතා වදාළ මැනව, අනිත් බලවත් මාගේ උපායෙක් ඇත, නුවර ඇතුලේ වලක් නැතිහෙයින් දරනම් පිටතින්මුත් ගෙණා නොහැක්කේය; දර නවතාලා ඇරගනුම්හ"යි කීයේය. ‡ රජ්ජුරුවෝ ආචාරීනි එසේ වේවයි කීහ. ඒ මනාත්‍රණයත් පෙර පරිද්දෙන්ම දූනවදුරා පවුරුපිටින් වී හා ගොයම් හරවා ඊටන පෙණෙන නියායෙන් දර රැස්කරවාපීසේක; පවුරේ උන් මනුෂ්‍යයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යෝධයන්ට සිනාසිසී වෙහෙසන්නාහු 'කොල දර නැතිව පිස කෑ නොහී සයින් පීඩිතව නොහිඳ, නැතිකෙනෙක් උලුකැන් ඛත් ආදිය පිස

* හරථෙතං මතනාති.  † එවං හොතු ආචරියානි.

‡ එවං හොතු ආචරියානි.

කව බොව'යිකියමින් 'තෙල ඇරගන්ව'යි මහත්මහත් දරකඳන් ඇඟට දමාලන්නාහ; සමහරු ඒ වැදගෙණ තැළි තැළී මහත් දුකට පැමිණෙන්නාහ; රජ්ජුරුවෝ දරරාශිය පෙණෙන්නා දැක 'තෙලේ කිමෙක්දැ'යි විචාළහ. එතන සිටි වර පුරුෂයන්ගෙන් එකෙක් "ඇයි මහරජ නොදන්නා සේක්ද ගොවියාපුත් මහෞෂධයා මතු වන්නාවූ භය දැන වල දරක් තිබ්ද? එකහෙළා අද්දා ගෙණවුත් නුවර ගෘයක් පණහා පැල දොරවල් පුරා ඉතිරිවන දර පවුර පිට රැස්කරවාපිය"යි කිය. රජ්ජුරුවෝ ඒ අසා කේවට්ටය 'මේ නුවර දර නවතාලාත් * ඇරගන්ට නොපිළිවන; තාගේ එයිත් උපායෙක් නොවෙයි ඇරපියව"යි කීහ. ඉනාඇවිලි අවන්නාවූ නිවටවූ කේවට්ටයා කියන්නේ "මහරජ නොසිතා වදාළ මැනව; මාගේ බලවත් අනික් උපායෙක් ඇතැ"යි කීය. ඒ අසා "ආචාරීනි උපායනම් තමා කිම්ද? මම මේසා මහත්වූ තොපගේ උපායකින් වැඩකුත් නිමාවකුත් නුදුටිමි, මේනුවර වේදේහ රජු අල්වාගන්ට නොපිළිවන, එබැවින් අපගේ නුවරටම යම්හ"යි කීහ.

නැවත අඥනවූ මහලු බමුණු කියන්නේ "දේවයන්වහන්ස 'බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක්සියයක් රජදරුවන් හා ඒසා මහත් චතුරංගිනි සේනාවක් ගෙණ වේදේහරජු අල්වාගත නොහී පැරදපලාගියහ'යි අපට මහත් ලජ්ජාවන්නේය; එබැවින් නුවණැත්තෝනම් මහෞෂධ පණ්ඩිතයෝම මතුනොවෙති; මමත් මහානුවණැත්තෙමි; එක්ලෙසකින් ඔහු පරදවාපියම්හ"යි කීය. "ආචාරීනි ලෙසනම් තමා කිම්දැ"යි කීහ. ධර්මයුද්ධ නම් දෙයක් කෙරෙමි' කීය. ධර්මයුද්ධනම් කිම්දැ"යි කීහ 'මහරජ දෙසේනාව සටන් නොකොට මැනව; රජදරුවන් දෙදෙනාගේ පණ්ඩිත දෙදෙන එක් තැනකට එද්ද; ඉන් එක්කෙනෙක් වැන්දවූනම් වැඳි පක්‍ෂයේ රජහට පරාජය වන්නේය; වැඳුම්ලත් පක්‍ෂයේ රජහට ජය වන්නේය. එබැවින් ඒ මන්ත්‍රණය මහෞෂධ පණ්ඩිතයෝ නොදන්නාහ; මම ඉතා වැඩිමහල්ලෙමි, මහෞෂධ පණ්ඩිතයෝ බාලයෝය, ආදර දන්නා නුවණැති පණ්ඩිතයන් හෙයින් ඔහු මාදුටු කල සැක නැතිව වඳනාහ; එවේලෙහි වේදේහ රජ සැබවින් පැරැද්දනම් වන්නේය; එසේ කොටත් වේදේහ රජු පරදවාපියා නැඟීයම්හ; එසේකල අපට ලජ්ජා නොවන්නේය, ධර්මයුද්ධ නම් මේ ය"යි කිය † ඒරහස් කථාවත් පෙර පරිද්දෙන්ම දැන වදුරා "ඉදින් කේවට්ටයාට මිත්‍රුත් මම පැරැද්දෙම්නම් මාගේ කුමන පණ්ඩිතකමෙක්දැ"යි සිතූසේක. බ්‍රහ්මදත්තරජ්ජුරුවෝත් ආචාරීනි ඒ උපාය ඉතා යහපත, සෙට්උදසන ධර්මයුද්ධ වන්නේය. ‡ පණ්ඩිතවරුන් දෙදෙනාගේ සමවූ ධර්මයෙන් ජයපරාජය වන්නේය. ඉදින් ධර්මයුද්ධයට නො අවනම් එයිත් පැරැද්ද නම් වන්නේය"යි පත ලියා කුරුබිලියෙන් වේදේහ රජහට යවූහ.

* දාරුක්ඛ යෙනාපි. † තම්පිරහස්සං.

‡ චිත්තානං පණ්ඩිතානං ධම්මෙන සමෙන ජයපරාජයො භවිස්සති.

ඒ අසා වෛදේහ රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්දැ කැඳවා එපවත් කීහ. ඒ අසමින් සකල ජනානන්දකරවූ තිලෝගුරු බෝධිසත්ත්වයන්වහන්සේ 'යහපත දේවයන්වහන්ස * සෙට උදෑසනම බස්නාහිර වාසලින් පිටත ධර්මයුද්ධමණ්ඩලය සරසත්වා. ධර්මයුද්ධමණ්ඩලයට එන්වායි පත් යැව්ව මැනවැ'යි වදාළසේක. රජ්ජුරුවෝ ඒ අසා ආවාවූ දූතයා අතමහසුන් යැවූහ. † බොධිසත්ත්වයන්වහන්සේ දෙවන දවස් 'කේවට්ටයාටම පරාජයවේවා'යි කියාබස්නාහිර වාසලින් පිටත ධර්මයුද්ධමණ්ඩලය සැරහූසේක. එතකුදුළුවත් ඒ ඒ රජුන් කෙරෙහි සිටි චරපුරුෂයෝ එක් සියයක්දෙන "කවුරු දනිද්ද කිම්දැ"යි බෝධිසත්ත්වයන්වහන්සේට ආරක්ෂා පිණිස කේවට්ටයා පිරිවරා සිටගත්හ. බ්‍රහ්මදත්තයන් හා එක්සියයක් රජදරුවෝ ධර්මයුද්ධමණ්ඩලයට ගියාහු, පුරදියවක යහපත් දවස් සඳ බලන්ට එක්සිත්ව එක දසාව බලන්නවුන් පරිද්දෙන් පැදුම් දිග බලා සිටියහ. එසේම නිවටවූ කේවට්ටයාත් නැගෙණහිරි දිසාව බලබලා 'කල් යේනුයි කල් යේනුයි' කිය කියා සිටියේය. තමන් පාපියුම් ලෝ මුදුන්කළ තිලෝගුරු බෝධිසත්ත්වයන්වහන්සේ එදවස් උදෑසන සොළොස් කළයක් සුවඳ පැනින් ඉස්සෝධා නහා ලක්ෂයක් වටනා කසීසළුවක් හැඳ, සර්වාභරණයෙන් විභූෂිතව, නොයෙක් රසයෙන් අග්‍රවූ අමරාදේවීන් පිසනලද භෝජනය අනුභවකොට, මහත් පෙරහරින් වාසල් දොරකඩට ගොස්, ආ නියාව කියායවා 'මපුතනුවෝ වහා එත්ව'යි රජ්ජුරුවන් විසින් කී කල්හි රජගෙට වැද රජ්ජුරුවන් වැඳ, එකත්පස්ව සිට 'කිමෙක්ද පුත මහෞෂධ පණ්ඩිතයෙනි' රජ්ජුරුවන් කී කල්හි ධර්මයුද්ධයට යෙමි' වදාළසේක. පුත මා විසින් කුමක් කළමනාදැ'යි කීහ. 'දේවයන්වහන්ස කේවට්ටයා මැණිකකින් වංචා කරණු කැමැත්තෙමි; එබැවින් අෂ්ටවඞ්ක මාණික්‍යරත්නය ලද මැනවැ'යි වදාළසේක. පුත එයිත් මටකියාද ගන්නේ ඇරගන්ව'යි කී කල්හි ශක්‍රයන් පළමුත් තමන්වහන්සේට දුන් මාණික්‍යරත්නය ශ්‍රීහස්තයෙන් ගෙණ රජහු වැඳ මාලිගාවෙන් බටසේක.

තමන්වහන්සේ හා එක දවස උපන් යෝධයන් දහස හා සිව්රඟසෙනඟ පිරිවරා අනූදහසක් රන් වටනා හැළි අසුන් යොදනලද සර්වාලඞ්කාරයෙන් සැරහූ රථයකට පැණනැගී දවල් මේ නිමවන වේලාවට වාසල සමීපයට පැමිණිසේක. කේවට්ටයෝද 'ම

---

* පණ්ඩිතො සාධුදෙව සෙවපාතොව පච්ඡිමද්වාරෙ ධම්මයුද්ධමණ්ඩලං සජ්ජෙස්සතු ධම්මයුද්ධමණ්ඩලං ආගච්ඡන්තූති පෙසෙථ දෙවාති තංසුත්වා ආගත දූතස්සෙව පණ්ණං දාපෙසි.

† පණ්ඩිතොපුනදිව සෙකෙවට්ටස්සෙව පරාජයොහොතූති

හෞෂධපණ්ඩිතයෝ දැන් එති, දැන් එති' මහබෝසතාණන්වහන්සේ වඩනා පෙරමග කර ඔසව ඔසවා බලාගෙණ සිටීමෙන් කොක් කරක්සේ දික්වූ කර ඇතිවූහ. මහබෝධිසත්වයන්ගේ දිගන්තරයෙහි පතලාවූ තේජස් පරිද්දෙන් පහරන්නාවූ හිරුරැසින් ඩාවැහෙන්නාවූ ශරීර ඇතිවූහ. මහබෝසතාණන්වහන්සේද ඔදවැඩියාවූ සාගරය පරිද්දෙන් පොළොව මැඩපියන්නා සේ, විපිය පුරාගෙණ යන්නාවූ ඇත් අස් අදිවූ පරිවාරයෙන් යුක්තව, අසම්භිනව වාසල් දෙර හරවා නුවරින් නික්ම රථයෙන් බැස, කෙසුරු සලා විදහා කිලිපෙන්නාවූ සිංහරාජයෙකු සේ, විජෘම්භනය කොරෙමින් ධර්‍මයුද්ධමණ්ඩලයටම වැඩිසේක. එක්සියයක් රජදරුවෝ ඒ මහතාණන් වහන්සේගේ රූපෛශ්වර්‍ය්‍යය දැක "නුවණින් සියලු දඹදිව තමන්ට දෙවනු කෙනෙකුන් නැති සිරිවඩ්ඪන සිටාණන් පුතනුවෝ මහෞෂධපණ්ඩිතයෝ නම් මොහුය"යි සමාධීන්ඔල්වරහඬ සියගණින් පැවැත්තූහ. පණ්ඩිතයන්වහන්සේද, දෙදෙව්ලොව දෙවියන් පිරිවරා අසුර යුද්ධයට නික්මුණු සක්දෙව්රජහු පරිද්දෙන්, උපමාවිෂයාතික්‍රාන්තවූ ශ්‍රී සෞභාග්‍යයෙන් යුක්තව, ඒ අෂ්ටවඞ්කමාණික්‍යරත්නය අතින් ගෙණ කේවට්ටයන් ඉදිරියෙහි ලංව වැඩිසේක.

කේවට්ටබමුණා මහබෝසතාණන්වහන්සේ දැක ඔබගේ තේජසින් සිටිපළ සිටින්ට නොපෝසත්ව පෙරගමන්කොට 'මහෞෂධපණ්ඩිතයෙනි, අපි දෙන්නමෝම පණ්ඩිත වරුම්හ, තොප නිසා අවුත් මෙතෙක්කල් මෙතන වසන අපට තෙපි අමුතු පඬුරක් පමණවත් නොඑවූවිරුව, කුමක් නිසාද මෙසේම සාදරයක් නොකෙළේය' යි කිය. එසේ කී කේවට්ටයන්ට බෝසතාණන්වහන්සේ 'පණ්ඩිතයෙනි, තොපට සුදුසු පඬුරක් සොයන්නෙම් අද මේ මිණිරුවන ලදිම්, හැරගනුව මෙබඳු මිණිරුවනක් මේ මූත් නැතැ'යි වදාළසේක. කේවට්ටයෝ පණ්ඩිතයන්වහන්සේ අත දිලියෙන මිණිරුවන දැක 'මේ පණ්ඩිතයෝ මට මිණිරුවනක් ගෙණාවන්නාහ'යි සිතා 'එසේ වීනම් දෙව'යි අත දික්කළහ. බෝසතාණන්වහන්සේද 'හෙද ගනුව'යි කියා අත දික්කොට අත ඇඟිලි අග මැණික එළාලූසේක. බමුණානෝ බරවූ මිණිරුවන ඇඟිලි අගින් රඳවා ගතනුහුනුවහ. මැණික පෙරළීගණ ගොස් බෝසතාණන්වහන්සේගේ පාමුල වැටීගියේය. බමුණානෝත් ලෝභයෙන් 'මැණික ගනිම්' බෝධිසත්වයන්වහන්සේගේ ශ්‍රීපාමූලයට නැඹුරු වූහ. ඒ දැක බෝසතාණන්වහන්සේ බමුණා නැඹුරුවූ තැනැත්තවූත් කර ඔසවාගතනොදීම, එක් අතකින් පිටිකර හා එක් අතකින් පිටිමුල තරයේ අල්වාගෙණ 'නැගීසිටුව ආචාරීනි, නැගීසිටුව ආචාරීනි,* මම බාලයෙමි; තොපගේ

* උට්ඨෙථ ආචරිය උට්ඨෙථ ආචරිය.

මුනුබුරු තරමට ඇත්තෙමි, මා නොවඳුව මා නොවඳුව'යි කිය කියා බමුණා හා සමග නලළ පෙරළී පෙරළා කොරසැඩි බිම උළා රත් වදමලක්සේ ලේ හා පස් වකා නුවණනැත්තව තෝ මා අතින් වැඳුම්ගන්ට සිතයිද්ද'යි බොටුව අල්වාගෙණ දමාලූසේක. මේ නෙමේ ඉස්ඹක් පමණ නැන වැටීගොස් නැඟීසිට වැලි පිස පිස පලාගියේය. මැණික එනාගී මහබෝසතානන්ගේ මිහිස් සුම ඇරගත්හ. * නැඟීසිටුව නැඟීසිටුව ආචාරීනි මා නොවඳුව මා නොවඳුවයි කියා මහබෝසතානන්වහන්සේ බැණ නැගි අඩ සියලු චතුරංගිනි සේනාවෙහි අරගල මැඬගෙණ සිටියේය. "කේවට්ටබමුණා විසින් මහෞෂධපණ්ඩිතයන්වහන්සේගේ පා වඳ නා ලද්ද"යි සියලු පකීත් කොක්සත්දි පිළී ඉස සිසාරා අත්පොළි සන්දි කෝලාහල කළහ බ්‍රහ්මදත්තරජ්ජුරුවන් හා එක්සිය යක් රජදරුවන් ඇතුළුවූ හැමදෙනම කේවට්ටයා මහෞෂධ පණ්ඩිතයන් පා පිට නැමුණා දුටුවාහුමය. නැවත කියන්නාහු 'අපගේ කේවට්ට ආචාරීන් විසින් මහෞෂධපණ්ඩිතයෝ වඳනාල දහ. එබැවින් අපි පැරැද්දම්හ, අපගේ ජීවිතය මෙව්ට නොදෙන් නාහ'යි හයින් තැතිගෙණ, තම තමන්ගේ අසුන් පිට නැගී උත්තරපංචාලනුවරට මූණලා නමාගත්හ.

ඒ යන්නවුන් දැක බෝධිසත්වයන්වහන්සේගේ පිරිස එක පැහැර කියන්නාහු 'කොල බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක්සියයක් රජුන් හා සේනාව ඇරගෙණ බිදි පලායන්නාහ'යි මහත්කොට හඬගසා කෝලහල කළහ. ඒ අසා රජදරුවෝ තාක් මූළුල්ල වඩවඩා හයපත්ව පලායන්නාහුමය. ඔවුනොවුන් නොබලා මහා සේනාවත් බිදීගියහ; බෝධිසත්වයන්ගේ පිරිස ඒ දැකත් වඩවඩා කෝලාහල පැවැත්වූහ. කරුණානිධානවූ මාගේ ස්වාමිදරුවා නෝ 'බිඳියන්නවුන් ලුහුබඳව'යි යන බසකුත් නොකියා, තමන් වහන්සේගේ සේනාව පිරිවරා නුවරටම වන්සේක. බ්‍රහ්මදත්තරජ්ජුරුවන් හා ඒසා මහත් සේනාව දෙලොස්ගව්වක් නැන් බිඳී පලාගියහ. ඉතා අලජ්ජීවූ දුෂ්ටවූ කේවට්ටයා අසු නැගී කපින් ලේ දමදමා නලළ ලේ පිසපිස දිවත්තේ සේනාවට ආසන්නව අසු පිටම හිද 'පින්වත්නි නොයව නොයව, මම ගොවියාපුත්‍ර නොවැන්දෙමි, සිටුව සිටුව'යි කිය. ඒසේ කිවත් සේනාව නොරඳම දිවන්නාහු මෙසේ කියන්නාහ. "කොල පව්වූ දුෂ්ට අධර්මිෂ්ඨවූ නිකෘෂ්ට අනාචාර්‍ය්‍ය ස්වරූප ඇති අවලක්ෂණවූ අඥාන බමුණු මහල්ල! තෝ ධර්ම්යුද්ධ කෙරෙමි' කියා ගොසින් තට මුනුබුරු තරමටත් නැති ඉතා බාල තෙතැත්තන් වැඳපීය; මේ මනුෂ්‍ය ලෝකයෙහි උපන් සත්වයන්ගෙන් ජඩවූ යම් එකක්හු කළමනා

* උට්ඨෙථ උට්ඨෙථමාමං වන්දථමාමං වන්දථාති.

යම් නොකටයුත්තෙක් ඇත්නම්, ඒ සියල්ලෙන් තා විසිනුත් නොකළමනා දෙයක් ඇද්ද, ජඩය! මැත නොදෙඩා, තොයිත් තාගේ පණ නොනසා යන අතෙක නැගීයා"යි යනාදින් කිය කියා ඔහුගේ බස් තමන් කණෙක නොහෙළාම * ඕහට ආක්‍රෝශ පරිභව බෙණෙමින් නොරඳම දිවන්නාහ.

ඒ බමුණා වහවහාම දිවගෙණ ගොස් සේනාව මැදට පැණ මෙස් කියාලිය. "ඇයි කුමක් කියව්ද? මම ගොවියා පුතු නොවැන්දෙමි, මම ගොවියාපුතු නොවැන්දෙමි, කොල! වඩිනාකොනෙක් තලළු දන වැලම්ට ජේ ලාගෙණත් වදිද්ද? මේ වැදීම් මාන තොප අහින් අද ඇසිමි; ඒ ගොවියාපින් මාණික්‍ය රත්නයකින් මා වංචාකොටපිය"යි නොයෙක් කාරණා කියා ගිව්ස්වා තමා වසඟකොට එසේ බිදී තුන් යොදුනක් පලාගිය ඒසා මහත් සේනාව රඳවා නැවත ගෙණවුත් පළමු පරිද්දෙන්ම වටලාගත.

බෝධිසත්වයන්වහන්සේගේ ආනුභාවයෙන් නොසිතු හෙයින් මුත්, ඒ සේනාව එකිඑකී පස්මිටවත් දූමුවේවීනම්, අගල තුන පුරාගෙණ අටලොස්රියන් පවුර පිට නැවත එපමණ ගොඩක රන්වත් වඩා ඇතිවන්නේය; ඒ එසේ මැයි, තිලෝගුරු බුදුරජානන්වහන්සේ ශ්‍රී මුඛයෙන්ම "බෝධිසත්තානං අධිප්පායානාම ඉජ්ඣන්ති" (බෝසතුන්ගේ අදහස් නම් සිදුවෙති) වදාළබැවින් අභිමතාර්ථ සාධකවූ චින්තාමණික්‍යයක් බඳුවූ මාගේ බෝධිසත්වයන්වහන්සේගේ තේජසින්ම පස් මිටක්වත් කැටක්වත් නුවර දශාවට දමන්නා තබා සිතිනුත් සිතූ එකද සත්වයෙක් නැත්තේය. සියල්ලෝම අවුත් තමන් පළමු උන්නාවූ සථානයෙහිම හිඳගත්හ.

බ්‍රහමදත්තරජ්ජුරුවෝ 'ආචාරිනි මෙවිට කුමක්කරමෝද'යි කේවට්ටයා විචාළහ. ඒ දුෂ්ටයා කියන්නේ දේවයන්වහන්ස කිසි කෙනෙකුත් මහ වාසලින් තබා කුරුබිලියෙනුත් පිටත්විය නොදෙම්හ. එසේ කල මනුෂ්‍යයෝ උකලීව තුම්මූම දෙර හැරපියන්නාහ. එවිට අපි අනායාසයෙන් සතුරන් අල්වාගෙණ කැමැත්තක් කරම්හ'යි කිය. ඒ වූ නියාවත් † බෝධිසත්වයන්වහන්සේ චරපුරුෂයෙක් පියදූ පතකින්ම දූන වදුරා "මේ සතුරන් බොහෝ දවසක් මෙතන විසීමෙන් අප හැමදෙනාගේම සිතට සැපයෙක් නැත්තේය; උපායකින්ම මුන් පලවාපියමි' සිතා; මන්ත්‍රණයෙහි දක්ෂවූ උපායවත් පුරුෂයක්හු පරීක්ෂාකරණසේක් **'අනුකේවට්ටයාය'**යි යන එකෙකු දූක ඕහට වදුරණ සේක් 'අපගේ කටයුත්තෙක් ඇත, තොප විසින් සමංඩකොට දූන යහපතැ'යි

---

* තස්සකථං අසුණන්තාව.

† පණ්ඩිතොතං පවත්තිං පුරිමනයෙනෙවසුත්වා.

වදාළසේක. ‘ස්වාමීනි කුමක් කෙරෙම්ද වදාළමැනවැ’යි කීය. “තෙපි මහ පවුරෙහි පදනම සිට අපගේ මිනිසුන්ගේ ප්‍රමාදයක් බලාලා, අතරතුරේ බ්‍රහ්මදත්තයන්ගේ පිරිස සිටියවුන්ට ‘පින්වත්නි උකටලි නොව කිපදවසක් රඳන්ට උත්සාහකරව, නුවර වාසි සියල්ලෝ මැදිරියෙහි අසුවූ කුකුළන් පරිද්දෙන් ඉතා උකට ලිවතියහ. කිපදවසකින් තුමූම දොර හරින්නාහ; එවිට තෙපි වේදේහයාත් දුෂ්ටවූ ගොවියාපුතුත් අල්වාගනුව’යි කියා මච්ඡමාංස කනබොන දෑ දීමෙන් ඔවුන් සිත්ගෙණ කියා ඇවිදුව; ඒ තොපගේ කථාව අපගේ මනුෂ්‍යයෝ අසා තොපට ආක්‍රෝශ පරිභව බැණ තොප අල්වාගෙණ බ්‍රහ්මදත්තයාගේ මිනිසුන් බලබලා සිටියදීම දැන දෙපය තරව අල්වා උණපත්තෙන් මරන්නාසේ පැලා, ඉන් බාගෙණ ඉස පස්කොණ්ඩයක් බඳවා ඇඟ උළුසුණු ගල්වා රත්මල් කණේරු මල් වඩම් කරලා කිප පාරක් ගසා පිට ගඩුනංවා පිටිතල හයා බැඳ පවුර පිට නගා සාල්ලෙක හිඳුවා යොතකින් පිටත බාවා බ්‍රහ්මදත්තරජුගේ මිනිසුන්ට ‘මනාහෙදක සොරාය’යි කියා දක්වන්නාහ. *බ්‍රහ්ම දත්තයන්ගේ මිනිස්සු තොප ගෙණ ගොස් රජහට පානාහ; † රජ්ජුරුවෝ ‘තොපට මෙවැන්නක් කරන්ට තොපගේ අපරාධය කවරේදැ”යි විචාලෝනම් තොප කියනකල ‘මහරජ මාගේ සම්පත් බොහෝය, ගොවියාපින් මහෞෂධයා ‘මනාහෙදක සොරාය’යි මට කිපී රජහට කියා මාගේ සම්පත් උදුරාගත; ‘ඒ නිසා දැන් මම මාගේ සම්පත් නැසුවාවූ සොරවූ ගොවියා පුතුගේ ඉස දෙවාපියන්නට සිතන්නෙමි; නුඹවහන්සේගේ සේනාව මේ නුවරසාධා ගතනොහී උකටලිවන හෙයින් එහි ඉතා කණස්සලුව ඔවුන්ට අතරතුරේ කන බොනදෑත් දෙමි, ඇතුළුනුවර අඩුවැඩියත් කියමි, ඒ දූන මාගේ පරණ වෛරයත් සිත තබාගෙණ මට මෙසා මහත් ව්‍යසනයක් කරවිය. මේ සියල්ලම නුඹවහන්සේගේ මනුෂ්‍යයෝ දන්නාහ’යි කියා රජහු නොයෙක් පරිද්දෙන් ගිවිස්වා තොප කෙරේ තරව ඇදහිලිව ගත් කල නැවත තෙපි මෙසේ කියව—‘මහරජ මෙවිටමා ලත් පසු නොසිතා වදාළමැනව, දැන් වේදේහයාත් ගොවියා පිත් මහෞෂධයාත් දිවි නැත්තේය. මම මේ නුවර පවුර තරතැනුත් නොතර තැනුත් අගල මුවරුන් හා කිඹුලුන් ඇති තැනුත් නැති තැනුත් ඉඳුරා දනිමි; නොබෝ දවසකින් නුවර ගෙණ දිලන්නෙමි’ කියව; ඉක්බිතිව රජ්ජුරුවෝ ‘සැබව’යි ගිවිස තොපට බොහෝ සත්කාරකොට තමන්ගේ සේනාව තොපට පාවා දෙති; තෙපි ඒ සේනාව හා සටනට ගොස් වණ්ඩවූ කිඹුළුන් හා මුවරුන් ඇතිතෙනටම බාලව’ කිඹුළුන් හා මුවරුන්ගෙන් භයපත්වූවාහු සටන් තබා අගල සමීපටත් ලං නො

* බ්‍රහ්මදත්තමනුස්සානං දස්සෙත්වාති.

† තෙනංරඤ්ඤො සන්තිකං නෙස්සන්ති.

වන්නාහ. එවිට තෙපි අවුත් 'දේවයන්වහන්ස නුඹවහන්සේගේ මේසේනාව ගොවියාපුත්‍ර විසින් හිනාව ගියාහ; කේවට්ටියා ඇතුළුවූ සිලු රජදරුවෝම ඔහු අතින් අත්ලස් නොගත් එකද කෙනෙක් නැත්තාහ; නුඹවහන්සේට හිතයෝ නම් මම්මය. හුදක් නුඹවහන්සේ පිරිවරා ඇවිදිනා බවමුත් මේ සියල්ලෝම ගොවියාපුත්‍ර සන්තකයහ; මෙතෙක් දෙනා නුඹවහන්සේට වෙනස් කල මම තනිව කුමක් කොටලියහෙම්ද? ඉදින් මා නොඅදහතසේක් වීනම් සියලු රජදරුවෝ සර්වාභරණයෙන් සැරහී අවුත් මා දකිත්වයි නියෝග කළ මැනවැයි'යි කියව; ඒ බසින් හැමදෙනම සැදී පැහැදී ආ කල්හි 'ගොවියාපිත් තමාගේ නම අකුරු ලියා දෙනලද වස්ත්‍රාභරණ කඩු ආදිය අකුරු බලා තෙල අදහා ගනමැනවැ'යි කියව; ඔහු තොප කී පරිද්දෙන් 'රජදරුවන් එන්ට කියව'යි නියෝගකොට ඔවුන් සැරහී ආ කල්හි, තොප කී පරිද්දෙන් අකුරු දැක හයින් තැතිගෙණ බියගත්තාහු රජදරුවන්ට සමුදී යවා 'මෙවිට කුමක්කරමෝද ආචාර්යනි' විචාරති; ඒ විචාළ රජහට තෙපි මෙසේ කියව—'මහරජ ගොවියාපිත් බොහෝ මායම් දන්නේය; ඉදින් කිපදවසක් මෙතන රැඳුනු සේක් නම්, නුඹවහන්සේගේ සියලු සෙනග තමා වසඟකොට ගෙණ නුඹවහන්සේ ජීවිතක්ෂයට පමුණුවයි; ප්‍රපංච නොකොට අද මධ්‍යම රාත්‍රියෙහි අසුපිට හිඳගෙණ පලායම්හ'යි කියව; සතුරන් අත මියන මරෙක් අපට නොවේව'යි කී කල්හි, රජ්ජුරුවෝ ගිවිස තොප කී ලෙසම කරන්නාහ; තෙපි උන් නික්මෙණ වේලා දැන, නැවත අපගේ මනුෂ්‍යයන්ට ඒ බව අඟවා ලව"යි වදාළසේක.

ඒ අසා, අනුකේවට්ට බ්‍රාහ්මණයා 'පණ්ඩියන්වහන්ස, මා නිසා වැඩෙක්වේනම් නුඹවහන්සේ වදාළ ලෙසම කෙරෙමි' කීය. එසේ වීනම් උන්ට පෙණෙන පරිද්දෙන් පහර කීපයක් ඉසාපුව යහපතැ'යි වදාළසේක. 'පණ්ඩිතයන්වහන්ස, මාගේ ප්‍රාණයත් දැත් දෙපයත් නොනසා; සර්වාංගය මුලුල්ල නුඹවහන්සේ කැමැත්තක් කරවූව මැනවැ'යි කීය. එවේලෙහි අනුකේවට්ටයාගේ අඹුදරුවන් පවත් උන් සන්තක කිසි කෙනෙකුන්ත් නොවරදවා සංග්‍රහකොට, අනුකේවට්ටයන් හිස පස්කොණ්ඩයක් බැඳ පෙණෙන ලෙස පහර කීපයක් ගසා ගඩු නගා සර්වාංගයෙහි උළුසුණු ගල්වා කණේරු මල්වඩම් කරලා මහා විප්‍රකාරයට පමුණුවා, සාල්ලෙක හිඳුවා ලනුවෙක බැඳ පිටතට බාවා බ්‍රහ්මදත්තයන්ගේ මනුෂ්‍යයන්ට දක්වූවාහ. රජ්ජුරුවෝ අනුකේවට්ටයන් නොයෙක් පරිද්දෙන් විමසා අදහාගෙණ ඕහට ප්‍රසාද දී සේනාව පාවාදුන්හ. ඒතෙම සේනාව ගෙණ 'නුවර ගන්මි' ගොස් 'මෙතනින් බටකල නිරුපද්‍රවය, මෙතන පවුරත් දුර්වලය, එතන

රුකවලුත් නැතැ'යි ගෙණගොස් පොවාලූ ඇඟිල්ල කඩාකන තරම් වණබවූ කිඹුළන් හා මුවරුන් ඇති තොටවලටම බාලයි, බටුබටුවන් ගසාකන්නාහ; අට්ටාලවල සිටියාහු ගී මුණ කෝල් හෙණ්ඩිවාළ තෝමරාදියෙන් දමාඇන මහා විනාශයට පමුණුවන්නාහ; සේනාව මහා ව්‍යසනයට පැමිණ නැවත ඒ දසාවට යන්නා තබා බලන්ටත් අසමර්ථවූහ. අනුකේවට්ටයෝ රජහු සමීපයට ගොස් "මහරජ නුඹවහන්සේ නිසා සටන් කරණ කෙනෙක් නැත්තාහ. හැම ගොවියාපුත්‍රගෙන් අත්ලස් ගත්තාහ; මා බස් නොඅදහනසේක් වීනම්, රජදරුවන් සැරහී එන්ට කියා ගෙන්වා, හන් පළින් වස්ත්‍රාභරණාදිය අකුරු බලා, සැක හළ මැනවැ"යි කීහ.

රජ්ජුරුවෝ ඔහු කී පරිද්දෙන් හැම ගෙන්වා, නොයෙක් ආභරණාදියෙහි ලියා තිබූවා දැක 'ඒකාන්තයෙන් හැමදෙනම අත්ලස් ගත්සේ සැබැය'යි අදහාගෙණ උන් හැම යවා 'ආචාරීනි මෙවිට කුමක් කරමෝද'යි විචාරා "දේවයන්වහන්ස මෙවිට අනික් කටහැකි දෙයක් නැත; ඉදින් ප්‍රපංචකොට කල්යවූසේක් වීනම්, ගොවියාපින් නුඹවහන්සේ අල්වාගන්නේය, වැලිත් කේවට්ටයාත් නලළ වණයක්කොට ගෙණ ඇවිදිනා බව මුත් ඔහු විසිනුත් අත්ලස් ගත්තේමය, ධර්මයුද්ධයෙහිදී අනඝවූ මාණික්‍ය රත්නයක් කාටත් නොදන්නා පරිද්දෙන් ඇරගෙණ, නුඹවහන්සේ තුන්යොදුනක් පලාගියවුන් නැවත ගිවිස්වා ගෙණවුත් මේ මරළගුලේ ලාපිය. * එයිත් නුඹවහන්සේට ඒකාන්තයෙන්ම අහිතමය, † එබැවින් එක රැයකුත් මෙතන රඳන්නා කැමති නැත, අද මධ්‍යම රාත්‍රියෙහි නැඟියන්නා කැමැත්තෙමි, මා විනා නුඹවහන්සේට මනා සිත්කෙනෙක් මේ සේනාවෙන් එකෙකුත් නැතැ'යි ‡ කී කල්හි ඒ අසා වඩ වඩා භයින් නැතිගෙණ "එසේවී නම් ආචාරීනි තොප විනා මට හිත කෙනෙක් නැත, තෙපිම අසෙකු සඳ ගමන නිලකරව"යි කීහ. අනුකේවට්ටයාත් රජහු ඒකාන්තයෙන්ම යන බව දැන "මහරජ නොබා වදළමැනවැයි අස්වසාලා, ඒ ක්ෂණයෙහි අවුත් චරපුරුෂයන්ට කියන්නේ "අද රජ්ජුරුවෝ පලායෙති 'කොල නිදාපියම්හ'යි නොසිතව"යි කියාලා, රජහට අසුසදන්නේ, යම්සේ රඳන්ට කඩියාලම හයාලූ කල නොරඳම ඉදිරියට දිවේද, එපරිද්දෙන් අවකල්පන සැදිමෙන් අසු සදලා, මධ්‍යම රාත්‍රියෙහි අවුත් අසු සදලා ගෙණාම් වේලාදත මැනව,.වහා නික්මුණ මැනවැ'යි කිය. රජ්ජුරුවෝ අසු.නැඟී පලාගියහ. අනුකේවට්ටයාත් අසෙකු නැඟී රජු හා එක්ව යන්

* නිවතෙනසි.

† අයම්පි පරිභින්නකොව

‡ නාපිතිවුතෙත.

නාසේ මදක් තැන් ගොසින්ලා, රඳගියේය. අවකල්පන සැද්මෙන් සැදූ අස් රඳවන්ට හයාලූයේද * නොරඳම ඉදිරි යට දිවන්නේ බ්‍රහ්මදත්ත රජු හැරගෙණ පලාගියේය.

අනුකේවට්ටයා සේනාව මැදට වැදලා ‘චූලනිබ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පැලහ’යි මහත්කොට හඬගසාලීය. චරපුරුෂයෝද තමතමන්ගේ අතවැසි පුරුෂයන්හා සමග මහත්කොට හඬගසා ශබ්දපැවැත්වූහ. එක්සියයක් රජදරුවෝ ඒඅසා සිතන්නාහු මහෞෂධපණ්ඩිතයෝ වාසල් හරවා පිටත්වූවන්හ, මෙවිට අපහැම ගේ ජීවිතය නැත්තේය’යි භයින් තැතිගෙණ උපභෝග පරිභෝග වස්තුවෙන් කිසිවක් නොගෙණ මගුල්කඩු හා උතුරුසළු ආදිවූ වස්ත්‍රාභරණාදියත් ආලය නොකොට නිගණ්ඨ සේනාවක් සේ ඉස් ලූ ලූ අත උනුන් නොබලාම දිවගත්හ. චරපුරුෂයෝ එවිටත් ‘එක්සියයක් රජදරුවෝ පැලහ’යි වඩවඩා කෝලාහල පැවැත්වූහ. ඒ අසා නුවර වාසල් අට්ටාල පවුරු පදනම් ආදිය සිටියාහුද මහත්කොට කෝලාහල කළහ. එවේලෙහි පිටත සිටි චරපුරුෂයෝ ඇතුළු නුවර මනුෂ්‍යයන් හා එක පැහැර ශබ්ද පවත්වා කෝලාහල කළහ. ඒ ගැසූ සියලු හඬ පොළව පැළියන් නාසේ, වාතවේගයෙන් මහා සමුද්‍රය ඇලලීගියාසේ ක්ෂොභව ගොස් පිටිනුවරත් ඇතුළුනුවරත් කෝලාහලයෙන් එකනිනාදවිය, අටළොස් අක්ෂෞහිණියක් පමණ මනුෂ්‍යයෝ සිතන්නාහු ‘මහෞෂධ පණ්ඩිතයන් විසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා එක්සියයක් රජදරුවෝ එකාන්තයෙන්ම අල්වාගන්නාලදහ’යි මරණභයින් තැතිගත්තාහු කිසි සරණයක්වත් පිටිවහලක්වත් ගැලවෙන්ට කිසි උපායක්වත් නොදන්නාහු සෙසු දෑ තබා හත්කඩවත් අස්වාමිකව සියල්ලම උන් උන් නැනම ඇරපියා පලමු පැලැවුන්සේ ඉස් ලූලූ අත දිවගත්හ. ඒසාමහත් රාජසේනාවක් කඳවුරු බැඳ හුන්තැන එකද මනුෂ්‍යයෙක් නැතිව සිස්වූයේය. චූලනි රජ්ජුරුවෝ එක්සියයක් රජදරුවන් හා සමග බිඳී තමන්ගේ නුවරටම ගියහ.

රෑ පැවති කෝලාහලයෙන් ඇත් අස් ආදිහු කඹ දම් ආදින් කඩා බිඳගෙණගොස් වල් නැංගාහ. දෙවන දවස් උදෑසන නුවර වාසල් හැර බල ඇණී නුවරින් පිටත්ව, ඒ මහා විප්‍රකාර දැක අභිමතාර්ථසාධක චින්තාමාණික්‍යයක් බඳුවූ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ සමීපයට ගොස් මේ සම්පතට කුමක් කරමෝද’යි විචාළහ. ඔබ වදාරණසේක් ‘උන් ඇමදෙනා නොකැමතිකරවා උදුරාගත් දෙයක් නොවන පසු, උන් තමන්ම ආලය නැතිව දමාපියා නිරාලයව ගිය වස්තු හෙයින් සියල්ලම අප සන්තක වන්නේය; ඉනුත් රජදරුවන් සන්තක වස්තු අපගේ රජ්ජුරු

* ආකඞ්ඛියමානොපි.

වන්ට දෙව, සිටුවරුන් හා කේවට්ටයා සන්තක වස්තූනාක් මුළුල්ල අපට ගෙණෙව, සෙසු අටළොස් අක්ෂෞහිණියක් පමණ මහා සේනාව සන්තක වස්තු මුළුල්ල නුවරවාසීහු ගනිත්වා'යි වදාළසේක. ඉන්මාහැඟි රත් රුවන් ආදි වස්තුව අදනවුන්ට දෙපෝයක්ම ඉක්ම ගියේය. වී සාල් ආයුධ ආදිවූ අවශෙෂ වස්තු අදනවුන්ට සාරමසෙක් ඉක්ම ගියේය. බෝධිසත්ත්වයන්වහන්සේ අනුකේවට්ටයන්ට බොහෝ සත්කාර කළහ. වල ගිය ඇත් ආදීන් බඳවා ගෙන්වා ගත්තාහ. එවක් පටන් මියුලුනුවරවාසීහුද දශවිධරත්නයෙන් සමෘද්ධවූහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් එක්සියයක් රජුන් හා එක්ව බිදීගොස් උත්තර පංචාලනුවර වසන්නවුන්ට අවුරුද්දක් ඉකුත්ව ගියේය.

එක් දවසක් කේවට්ට මහලු බමුණු කැඩපතකින් තමා මුහුණ බැලූයේ, නලළේ කබරව දැගියාසේ වණ කැලල දැක "මේ අනිකෙක් නොවෙයි, ගොවියාපීත් මහෞෂධයා අත කර්මාන්තය, ඔහු විසින් එක්සියයක් රජුන් හා මේ සේනාව මධ්‍යයෙහි මම ලජ්ජාවට පමුණුවන ලදිමි'යි දණ්ඩෙන් ගසනලද ආශිවිෂයෙකු පරිද්දෙන් වඩනලද ක්‍රොධ ඇත්තේ කවර දවසෙක ඔහු පිටිදක පියන්නෙම්, * හෝ'යි සිතන්නේ 'එ වන්නා බලවත් උපායෙක් ඇත, අපගේ රජ්ජුරුවන්වහන්සේගේ පංචාලචණ්ඩි කුමාරිකාවෝ දිව්‍යාපසරාවක් සේ උතුම් රූ ඇත්තාහ; සිවසැටක් පමණ ස්ත්‍රීලක්‍ෂණයෙන් යුක්තයහ. ඒ කුමාරිකාවන් වේදේහ රජහට දෙම්හ'යි කියා රජු කාමයෙන් පොලඹා බිලියක් ගිලූ මසෙකු ගොඩ ගන්නාසේ මහෞෂධපණ්ඩිතයා හා සමග මේනුවරට ගෙණවුත් දෙන්නාම මර ජයපානය බොන්නෙමු † යි සනිටුහන්කොට සිතා නිමවා රජහු සමීපයට ගොස් 'දේවයන් වහන්ස එක් රහස් කථා මන්ත්‍රණයෙක් ඇතැ'යි කිය. 'පළමු තාගේ මන්ත්‍රණ නිසා අප ගේ උතුරුසළුවටත් අස්වාමිකව දමාපියා ආම්හ; මේ මන්ත්‍රණයෙන් කුමක් කෙරයිද? මුවෙන් නොබැණැ'යි කිවුය. 'මහරජ මේ උපාය හා සමාන උපායෙක් නැතැ'යි කීය. එසේවී නම් කියයි කීහ. 'මහරජ අප දෙන්නා මතු තනිවිය යුතුය' යි කියා ‡ රජ්ජුරුවන් යහපතැයි කීකල ඔහු ඇරගෙණ මාලිගාවේ මතු මාලට නැගී 'මහරජ වෙදේහ රජු කාමයෙන් පොලඹා ගොවියාපුත්‍රු සමග මේ නුවරට ගෙණවුත් ජීවිතක්‍ෂයට පමුණුවා පියම්හ'යි කීය. ඒ වන්නා තොප කීවා § ඉතාම යහපත, කවර උපායකින් පොලඹා මේ නුවරට ගෙණෙමෝද'යි කීහ. මහරජ නුඹ

* කදා නු බො තස්ස පි පස්සිතුං සමත්ථො භවිස්සාමීති.

† ජයපානං පිවිස්සාමාති.

‡ එවං හොතූති අථ නං බ්‍රාහ්මණො උපරිපාසාදතලං ආරොපෙත්වා

§ සුන්දරො ආචරිය උපායො.

වහන්සේගේ දියනියෝ පංචාලචණ්ඩි කුමාරිකාවෝ උතුම් රූ ඇත්තාහ, ඒ ලක්ෂණ සම්පන්නාවූ කුමාරිකාවගේ රූපවිලාසය කවීන් ලවා ගීබඳවා කාව්‍යකරවා ඒ කාව්‍ය මියුලු නුවර ගායනා කරවා 'මෙබඳු ස්ත්‍රී රත්නයක් නොලබන්නාවූ වේදේහ රජහට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්දැ'යි රූපශ්‍රී ඇසූ පමණකින්ම ඔහු ශ්‍රවණ සංසර්ගයෙහි බැඳුණුකල මමම ඔබ ගොස් දවස් නියම දැන නැකැත්ලා එන්නෙමි; ඒ රජ දවස් නියමකොට මා ආකල්හි බිලියක් ගිලූ මසෙකු සේ ගොවියා පුතු හා සමග මේ නුවරට එන්නේය; එවිට උන් දෙන්නා අල්වාගෙණ මරා ජීවිතක්ෂයට පමුණුවාපියම්හ"යි කීය. රජ්ජුරුවෝ ඔහුගේ බස්අසා ගිවිස ඉතා සතුටුව 'ආචාරීනි ඒ උපාය ඉතා යහපතැ'යි කියා 'නොපකී ලෙසම කෙරෙමි' ගිවිස්සාහ.

මේ දෙදෙනාගේ රහස් කථාව චූලනී රජ්ජුරුවන්ගේ යාන බලන එක් සැලලිහිණියක් සකස්කොට අසා සිත තබාගත. ඉක්බිතිව රජ්ජුරුවෝ යහපත්කොට අදාළ කාව්‍යකාරයන් ගෙන්වා ඒ වූ නියාව කියා බොහෝ වස්තු දී ඔවුන්ට දියනියන් පෙන්වා 'කුඩාවරිනි මේ කුමාරිකාවගේ රූපශ්‍රී වර්ණනාකෙරෙමින් මුන්නිසා කාව්‍ය කරව'යි කීහ. ඒ කාව්‍යකාරයෝ කර්ණරසායන කොට අති මනෝහර කොට ගී බැඳ රජහු ඇස්වූහ. එදවස් රජ්ජුරුවෝ බොහෝ ප්‍රසාද දුන්හ. කවීන් අතින් විද්දත් නායකයෝ ඉගෙණ බොහෝදෙනා මධ්‍යයෙහි ගායනා කළහ. ඒ ගීතිකා ඇසූ ඇසූවන්ට කර්ණරසායනය; මෙසේ කාව්‍ය ගීතිකා බොහෝදෙනා අතරේ ප්‍රසිඬවූකල්හි රජ්ජුරුවෝ ගීකියන්නවුන් කැඳවා කියන්නාහු "දරුවෙනි තෙපි කොස් ලිහිණියන් අල්වාගෙණ රෑ ගස් උඩ ඉඳ ගීත්කාවන් කියා අළුයම් වේලෙහි උන් කර කයිතාලම් බැඳ උන් ආකාශයට හැරපියා කාත් නොදන්වා බැසපියව"යි කීහ. ඒ කුමක් පිණිසද යත් බ්‍රහ්මදත්තරජ්ජුරුවන්ගේ දුවනියන්ගේ රූප විලාසස දේවතාවෝ පවා කියන්නාහ'යි දඹදිව ප්‍රසිඬවන පිණිස කරවූහයි දතයුතු.

නැවත රජ්ජුරුවෝ කවින් කැඳවා කුඩාවරිනි, දැන් තෙපි කියනකල මෙවැනි රූ ඇති කුමාරිකාවක් දඹදිව අනික් රජක්හට තරම් නොවෙයි, මියුලු නුවර වේදේහරජහට තරමැයි වේදේහරජ්ජුරුවන්ගේ රාජ්‍යශ්‍රී හා කුමාරිකාවන්ගේ රූපවර්ණනාව හා එක්කොට ගී බැඳ කාව්‍ය කරව"යි කීහ. * ඔව්හු ගී බැඳ රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ බොහෝ ප්‍රසාද දී දරුවනි මියුලු නුවරට ගොස් මේ උපායෙන්ම ගායනාකරව්යයි කියායැවූහ. ඔහුඑනැන් පටන් වත් වත් තැන ගායනාකෙරෙමින් සාරසියයක් ගව්ගෙවා

* තථා කත්වා රඤ්ඤො ආරොචයිංසු රාජතෙසං ධනං දත්වා තාතාම්පිලංගනත්වා තස්ස ඉමිනාව උපායෙන ගායථාති පෙසෙසි.

මිථුලානුවරට පැමිණ බොහෝදෙනා රැස්වූ සභායෙහි ගායනා කළහ. ඒ අසා බොහෝ ජනයෝ ඔල්වර හඬ දහස් ගණන් පවත්වා මහා සන්තොෂයෙන් වස්ත්‍ර දුන්හ. ඒ ගායකයෝ රෑ ගස්වල හිඳ ගායනාකොට, අළුයම් වේලෙහි කොස්ලිහිණියන් කර කාංසුතාලම් බැඳ ආකාශයට හැර බස්නාහ. ආකාශයෙහි ඒ කංසුතාලම් හඬ අසා චූලනීරජ්ජුරුවන් දුවනියන්ගේ රූපවර්ණනාව දේවතාවෝ පවා කියන්නාහ'යි නුවර මහත්වූ කෝලාහල විය. වෛදේහ රජ්ජුරුවෝ ඒඅසා, කාව්‍යකාරයන් කැඳවා තමන්ගේ රජගෙයිදී බොහෝදෙනා මධ්‍යයෙහි කියවා 'බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ තමන්ගේ මෙබඳු රූපශ්‍රීන් විරාජමානවූ දුවනියන් මට සරණ දෙත්ල'යි මහත්වූ සොම්නසට පැමිණ නාටකයන්ට බොහෝ වූ ප්‍රසාද දී මහත්වූ සත්කාර කළහ. ඔහු නැවත අවුත් ඒ බව චූලනී රජ්ජුරුවන්ට කීහ. ඊට අනතුරුව කේවට්ටනම් බමුණු කියන්නේ 'මහරජ දූන් මම ගොස් නැකත් ලාලා දවස් නියමකොට එමි කීය. 'යහපත ආචාරිනි කුමක් ලදමනාදැ'යි කීහ. යම්තම් පඬුරක් ලදමැනවැ'යි කීය. 'යහපත ගන්ව'යි කියා මාහැඟි පඬුරු දෙවූහ. ඒ බමුණු මහපෙළහරින් ගොස් වෛදේහ රටට පැමිණයේය. ඔහු එන ගමන අසා "බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ තමන්ගේ දුවනියන් අපගේ රජ්ජුරුවන්ට සරණ දෙත්ල; රජදරුවන් දෙදෙනාගේ බන්ධුත්වයත් මිත්‍රකමත් යහපත් වන්නේය; කේවට්ට බ්‍රාහ්මණයා නැකැත්ලන්ට එමින් සිටියේල"යි නුවර ඒක කෝලාහලවිය; වෛදේහ රජ්ජුරුවෝත් ඇසූහ.

පරසිත් දන්නා බෝධිසත්ත්වයන්වහන්සේ එපවත් අසා සිතනසේක් "මේ විවාහය කියා කේවට්ටයා එන ගමන මට රුස්නේ නොවෙයි, ඒතත්ත්වය දැනපීම් නම් යහපතැ'යි සිතා; චූලනිරජ්ජුරුවන් කෙරෙහි සිටිය චරපුරුෂයන්ට 'මේසරණය තත්වූ පරිද්දෙන් කියා එව'යි කියා හසුන් * යවූසේක. නැවත උහුකියා එවන්නාහු "අපින් ඒතත්ත්වය නොදනුම්හ; කේවට්ටයෝ රජ්ජුරුවන් හාමාලිගාවේ මතුමාළේ ශ්‍රියහන් ගබඩාවේහිද මන්ත්‍රණය කළහ. රජ්ජුරුවන්ගේ යාන බලන සැළලිහිණියක් ඇත, ඕතොමෝ එහි තත්ත්වය ඉඳුරා දන්නිය"යි නැවත කියාඇවූහ. ඒ අසා බෝධිසත්ත්වයන්වහන්සේ සිතනසේක් 'යම්සේ සතුරන්ට අවකාශයෙක් නොපෙණේද එබැවින් මා විසින් සුරක්ෂිතකොට රක්නාලද මේ නුවර මේ දුෂ්ටවූ කේවට්ටයාට නොපාමි' සිතා නුවර මහවාසල පටන් රජගෙයි දොරකඩ දක්වාද එතැන් පටන් තමන්වහන්සේගේ දොරකඩ දක්වාද ඇතුළුවීථි මාර්ග දෙපාර්ශ්වයෙහි බටපැලලි හදවා, මුදුනෙහිත් පැදුරු බඳවා සිත්තම් කරවා බිම සුදුවැල්ල ලවා පස්වණක් මල් ඉස්වා දෙපාර්ශ්වයෙහි පුන්කලස් හා මං

* සාසනංපෙසෙසි.

රුක්මල් තබා කෙහෙල්ගස් බඳවා * ධජ නංවා සරහාලූසේක. කෝවට්ටියාත් නුවරටවන්නේ නුවර ගෙවල්ආදිවූදෙය ඉඳුරා නොදැක 'රජහු විසින් මා එන්නාවූ මගුල් පිණිස සරහන ලද්දේවනැ'යි සිතීය. ඒ බමුණු තමාට නුවර නොපානා පිණිස කළ නියාව නොදන්නේය. කෝවට්ටියාත් සරහනලද වීථියෙන් ගොස් රජ්ජුරුවන් දැක, ගෙණා පඬුරු පාවාදී මියුරු කථාකොට එකත්පස්ව හිඳ රජහු විසින් කරණලද සත්කාර සම්මාන විඳ තමා ආ කාරණය කියන්නේ "මහරජ අපගේ රජ්ජුරුවන්වහන්සේ නුඹවහන්සේ හා ඥතිසම්බන්ධයෙන් අතිශයින් හිතමිත්‍රව හිඳිනා කැමතිසේක, අනඝවූ රුවන් ආදිවූ පාක්කුඩම් එවූසේක, මිහිරිවූ ප්‍රියතෙපුල් දන්නා දූතයෝ එරටින් මෙහි එත්වා, යම් බසක් ප්‍රිය මනාප නම් එසේවූ මෘදු තෙපුල් කියත්වා, පංචාලයෝද විදේහයෝද යන දෙපක්ෂය එක්වෙත්වා, මෙසේ කියා නැවත කියන්නේ "යම් යම් බසෙක් සන්තොෂයට කාරණා වීනම් ඔවු නොවුන්ට එසේවූ ප්‍රියතෙපුල් කියත්වා; කුමක් නිසාද යත් පංචාලදෙශයෙහි රජ්ජුරුවන් හා වෛදේහ රජ්ජුරුවන් හා දෙදෙන ආවාහ විවාහයෙන් එකාත්මිකව ඔවු නොවුන් කෙරෙහි සතුටුව වසන්නාහ, එබැවින් අවමඞ්ගල්‍ය වචනයක් නොකියා මඞ්ගල්‍ය සන්නිශ්‍රිතවූ බසක්ම කියත්ව"යි කියා නැවත කියන්නේ "නවත් ඒ මතු නොවෙයි; තමන්ගේ දූරුවන හා උතුම් උතුම් මාහැඟි රුවන් එවනසේක; මෙවක් පටන් දෙරටින් ඔවු නොවුන්ට පාක්කුඩම් ගෙණ මිහිරිවූ ප්‍රිය තෙපුල් දන්නා දූතයෝ මොබින් ඔබ යෙත්වා, ඔබින් මොබ යෙත්වා, මේ දෙරට සම්බන්ධවූ නියාව කුමක් වැනිද යත්, ගංගා නම් ගඟ දිය හා යමුනා නම් ගඟ දිය එක්වූ කලක් පරිද්දෙන් ඔවුනොවුන් එක්සිත්ව සමගිව සන්තොෂව වෙසෙත්ව"යි කීය. මෙසේද කියා නැවත කියන්නේ "අපගේ රජ්ජුරුවන්වහන්සේ අනික් මහා අමාත්‍යයෙකු එවනු කැමතිවත් අනික් කෙනෙක් මේ මඞ්ගල්‍ය වචනය සිත්ගෙණ ඉඳුරා කියාලන්ට අසමර්ථයයි සිතා මට කියනසේක් 'ආචාරීති තෙපිම ගොස් මේ මගුල් කියා රජ්ජුරුවන් සහපත්කොට සතුටුකරවා කැඳවා ගෙණ එව'යි කීසේක. එබැවින් රාජෝත්තමයානන්වහන්ස වහා වැඩිය මැනව; ඔබ ගියාවූ නුඹවහන්සේට වැඩ දෙකෙක් වන්නේය. ඒ කවරේද යත් අසමාන රූ ඇති කුමාරිකාවනුත් ලබනසේක; රජ්ජුරුවන් හා සමග මෛත්‍රී සිතත් අධිකවන්නේය" යි කීය.

රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා සතුටුව 'උතුම්වූ රූ ඇති කුමාරිකාව ලැබේල'යි ඇසූ බස් පමණකින්ම බැඳීගොස් නැවත කියන්නාහු "ආචාරීති තොප හා මහෞෂධපණ්ඩියන් හා දෙන්නා

* ධජෙපග්ගණ්හාපෙසි.

ධර්මයුද්ධයෙහි පළමු වාදයෙක් වූයේවේද, යව මපුතනුවන් දකුව තොප දෙදෙනාම පණ්ඩිතවරුන් බැවින් ඔවුනොවුන් සම්මෝද රවා ප්‍රිය කථාකොට එව'යි කීහ. ඒ අසා කේවට්ට නම් බමුණු තෙම 'යහපත * පණ්ඩිතයන් දකිමියි ඔබ දක්නා පිණිස යන්ට නමාගත; බෝධිසත්ත්වයන් වහන්සේද එදවස් උදැසන 'ඒ පව්වා හා මා හා එක්ව කථාවෙක් නොවේවා'යි සිතා උදැසනම තමන්ගේ බසට කැප පිණිස එළඟිතෙල් සුහක් අනුභවකොට ගෙයි ගොමපිරිබඩ ගාවනසේක් දැගුල් බොල ඇතිකොට ගාවා මිදුණු තෙල් කප්වල ගාවා බෝධිසත්ත්වයන්වහන්සේ වැදහෝනා එක් පවු හැඳක් පමණ තබා, සෙසු ඇඳ පුටු ආදිය ගෙන් පිටත්කරවූසේක. නැවත සිටියවුන්ට විධානකරණසේක් "බමුණු මා හා කථාවට ආරම්භකළ කල 'බමුණ පණ්ඩිතයන් වහන්සේ හා නොදෙඩ; අද බෙහෙත් තෙලක් අනුභවකළසේකැ'යි ඔහු නවතා මාත් දෙඩන්ටවන් කල්හි 'ස්වාමිනි බෙහෙත් තෙලක් වැළඳුසේක්වේද නොදෙඩා වදළමැනවැ යි කියව"යි විධානකොට රතක් පෙරවාගෙණ සත්වන දෙරටුවේ යටිමාලේ පවුහැඳ වැදහොත්සේක.

කේවට්ටයාත් සත්වන දෙරටුවෙන් පළමුවිනා දෙරකඩට අවුත් රැකවළුන්ට පණ්ඩිතයෝ කොයිදැ'යි කීය. සිටියෝ කියන්නෝ "බමුණ මහත්කොට නොදෙඩා අරගල නොකොට බැණ නොනැගී ගොළුවෙකුසේ කරබාගෙණ නැගීවර, අද අපගේ ස්වාමි බෙහෙත් තෙලක් වැළඳූසේක. එබැවින් මහත්කොට දෙඩීම් හා අරගලකිරීම් නොකමැත්තේය"යි කීහ. සෙසු දෙරටුවල සිටියාහුත් එපරිද්දෙන්ම † කීහ. බමුණු මුවෙන් නොබැණ කරබාගෙණ ‡ සත්වන දෙරටුව ගෙවා බෝධිසත්ත්වයන් සමීපයට ගියේය.

බෝධිසත්ත්වයන්වහන්සේ ඒ ගිය බමුණා හා කථාවට ආරම්භදක්වූසේක. ලඟ සිටියාහු "ස්වාමිනි ඉතා සූක්ෂමවූ තෙලක් වලදනාලද්දේ වේද, එබැවින් මේ දුෂ්ටවූ බ්‍රාහ්මණයා හා කථාවෙන් ප්‍රයෝජන කිම්දැ"යි කියා නැවතූහ. කේවට්ටයා බෝධිසත්ත්වයන් වහන්සේ සමීපයෙහි හිඳිනා ආසනයක්වත් වැතිරගෙණ සිටිනා ආධාරයක්වත් බෝධිසත්ත්වයන් වහන්සේගෙන් මිහිරි කථා මාත්‍රයක්වත් නොලදින්, වැසි සමයෙහි ගවරපිරි ගොවූදකට වත් ගොන්මාල්ලෙකුසේ බොල් ගොම ඇඟිලි අසුවලින් පලව පලවා, මිරිමිරියේ ඒ පයින් ඒ පය ලලා මිරිකමින් සිටියේය. ඒ සිටියාවූ බමුණා මූණ බලා එකෙක් තමාගේ නුවන කසාලීය. එකෙක් තමාගේ බැම උඩනගාලිය. එකෙක් තමාගේ වැලමිට කසාලිය. බමුණු ඔවුන්ගේ මේ ක්‍රියාව දැක ඉඟිකරුව ඇත් මැත් බලන්

---

* පසසිස්සාමි පණ්ඩිතනන්ති තංපස්සිතුං අගමාසි.

† එවමෙවආහංසු—‡ සත්තමම්මාරකොට්ඨකං

නේ 'පණ්ඩිත්යෙනි අපි යම්හ'යි කියා අනිකෙකු විසින් "කොල අරිටු බමුණ 'නොදෙඩ'යි කියදිත් දෙඩ දෙඩාම සිටිනෙහිද? දැන් තොපගේ ඇට බැට තලාපියම්හ"යි කී කල්හි හයින් ත්‍රාසනව නැවත පිටිපස්ස බැලිය, ඉක්බිති එසේ බැලූ බමුණාට එකෙක් හුණපත්තෙන් පිටට පහරක් ගැසීය, එකෙක් 'යෙයිද නොයෙයිදැ'යි කියා කර අල්වාගෙණ දැමීය. එකෙක් දිවමින් ගොස් පිටිදැමැද අතුල් පහරක් ගැසීය. ඒ තෙමේ දිව්යෙකු කටින් ගැලවුණු මුවමාල්ලෙකු මෙන් හයින් තැතිගෙණ වෙව්ල වෙව්ලා දිවන්නේ දුකසේ ගොස් රජගෙට පැමිණී යේය.

රජ්ජුරුවෝ සිතන්නාහු "මපුත නුවෝ අද මාගේ විවාමගුල් අසා අතිශයින් සතුටුවන්නාහ, තවද පණ්ඩිතවරුන් දෙදෙනාගේ * ධර්මයෙන් යුක්තවූ කථාවකුත් වන්නේය, අද දෙදෙනා ඔවුනොවුන් ක්‍ෂමාකරවා ගන්නාහ; එබැවින් මට වූයේ මහත් ලාභයෙකැ"යි සිත සිතා උන්නාහ, එවේලෙහි ආ න ආ නා අවුත් එතනට වත් කේවට්ටයා දැක, දෙදෙනා ඔවුනොවුන් දැක කථාකළ සංසන්‍දනය විචාරන්නාහු මේ ගාථාවෙන් කීහ.

කථන්‍නු කෙවට්ට මහොසධෙන,
සමාගමො ආසි තදිඞ්ඝ බ්‍රෑහි;
කච්චිතෙ පටි නිජ්ඣතෙතා,
කච්චි තුඨො මහොසධො.

මේ ගාථාවෙන් රජ්ජුරුවෝ කියන්නාහු "කිමෙක්ද කේවට්ට පණ්ඩිතයෙනි, මහෞෂධපණ්ඩිතයන් හා තොප හා එදවස් ධර්මයුඩයෙහිදී වූ කණස්සල්ල හැර ක්‍ෂමාකරවා ගතුද ? නැවත තොප දෙදෙනාගේ මිහිරි කථා කෙසේවීද ? තොපගේ රජ්ජුරුවන් කියාඑවූ මගුල්විවාහය අසා මපුත නුවෝ සතුටුවූද ? ඒ මට නොවලහා තත්වූ පරිද්දෙන් කියව"යි කීහ. ඒ අසා කේවට්ටයා කියන්නේ මේ ගාථාවෙන් කීය.

අනරියරූපො පුරිසො ජනින්‍ද,
අසම්මොදකො ථඩො අසබ්භි රූපො;
යථාමූගොව බධිරො,
න කිඤ්චත්ථං අභාසථ.

"ජනප්‍රධාන රජ්ජුරුවන් වහන්ස ඒ මහෞෂධ පණ්ඩිතයා නම් අනාර්ය්‍ය ස්වරූප ඇති සාධු ගුණයක් නැති ඉතා තද එකෙක, ස්වභාවයෙන්ම ඉතා තද එකෙක, අසත් පුරුෂයෙක. ගොළුවෙකු සේ බසකුත් නොකීයේය, බීරෙකුමෙන් මාගෙන් බසකුත් නොඇසූයේය, ඒ පණ්ඩිතයා නුඹවහන්සේටම තරම,

* ධම්ම සාකච්ඡාය භවිතබ්බං

ඔහු තරම් දුර්ජනයෙක් මනුෂ්‍යයන් කෙරෙහි එකද කෙනෙක් නැතැ"යි ඉතා දෙඩමලුවූ බමුණුමාලු තමා කටට ආවාක්ම කීයේය. තමා කෑ ගෙඩිබැටයෙහි නමකුත් නොකීයේය. 'හන්දුරුවා කෑ බැට නම් තමා මේය 'යි සිතමි. එහෙයින් තමා ලත් අවමානයේ නාමකුත් නොකියා මහතානන්ගේ නුගුණම කීය. රජ්ජුරුවෝ තුටුද නොවී විරුඩයකුදු නොකියා කේවට්ටයා හා කැටිව ආවුන්ට බත් වියදම් දී නවාතැන් ලවා 'යව ආවා ඊනි සැතපී ගනුව'යි කීහ. ඔහු යවා ඉක්බිති රජ්ජුරුවන් "මපුතනුවෝ ඉතා නුවණැත්තාහ, ප්‍රියනෙපුල් ඇත්තාවූ කෙනෙක, මේ බමුණා හා කථාවකුත් නොකළාහ. දැක සතුටු පමණකුත් නොවූහ; කිමෙක්ද? මොහු ආ ගමනේ මතුවන්නාවූ භයක් මපුතනුවන් දුටුහෝයි සිතමි; එබැවින් මේ කේවට්ටයා ආ ගමන අපට වැඩක් හා අභිවෘඩියක් නිසා නොවෙයි, සරණ දෙම්හයි කාමයෙන් පොලඹා, ඔබ ගෙන්වාගෙණ මරණ පිණිස මා කැඳවා ආවහයි සිතමි; ඒ බව දැනලාවන, මපුතනුවන් ඔබට කිසිවකුත් නොකීයේය'යි සිතා භයගෙණ හුන්කල්හි සේනකාදි ප්‍රඥ සමුද්‍රයෝ සතරදෙන ආහ.

ඔවුන්ට රජ්ජුරුවෝ කියන්නාහු "කිමෙක්ද සේනකය උත්තරපංචාලයට ගොස්, චූලනීරජ්ජුරුවන්ගේ දුවනියන් ගෙණමෝද ඒ ගමන නෙපි ඇම කැමැත්තෝද'යි විචාළහ. ඉක්බිති සේනකයා කියන්නේ "මහරජ කුමක් කියනසේක්ද? තමාකරා එන ශ්‍රීකාන්තාව ගසා දුරුකරණ කෙනෙක් ඇද්ද? ඉදින් ඔබවහන්සේ ඔබ ගොස් * ඒ කුමාරිකාව ගෙණාසේක් වීනම් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හැර සියලු දඹදිව නුඹවහන්සේ හා සමාන රජෙක් නැත්තේය. ඒ කුමක් පිණිසද යත් නායක රජ්ජුරුවන්ගේ දියනියන් රක්‍ෂාකරණහෙයිනි, තවද ඒ රජ්ජුරුවෝ සිතනකල සෙසු රජදරුවෝනම් මාගේ සේවකයෝය. මා හා සමානයෝනම් එකවේදේහරජ්ජුරුවෝමය'යි සිතා, දඹදිව සියලු සත්‍රින්ට වඩනා රූ ඇති දුවනියන් නුඹවහන්සේට දෙන්නාහ. නුඹවහන්සේට වන්නේ මහත් අභිවෘඩියෙක, යම් කිසිකෙනෙක් නුවණ මදව ඊට බාධා කෙරෙත් නම් ඊට කිසි සැකයක් නොකොට වැඩිය මැනව; අපිත් නුඹවහන්සේ හා ගිය කල වස්ත්‍රාභරණ අන්නපානාදියෙන් සංග්‍රහ † ලබන්නෙමු"යි කේවට්ටයාට නොඅඩුවූගුණඇති ඉතා දෙඩමලුවූ ගුණමකුවූ ස්වභාවයෙන් ඉතා ලෝභිවූ සේනක නම් බමුණුතෙම රජහු අතිශයින් පොලඹා හිවිස්නා පරිද්දෙන් සිතට නගා කීය. ‡ පුක්කුසාදි සෙසු පණ්ඩිතවරුන් විචාළකල ඔ

* නසා ගණ්ණවා † ලභිස්සාමාති —
‡ රාජානෙපෙපුට්ඨතෙපි තථෙවකථෙසුං

හුත් එලෙසම කිවුය. ඔවුන් හා සමග කථාකෙරෙමින් උන්තැනට කේවට්ටයා තමා හුන් තැනින් අවුත් 'මහරජ අප රඳන්ට නොපිළිවන යම්හ'යි කීය. රජ්ජුරුවෝ ඔහට සත්කාර කොට යවූහ.

බෝධිසත්ත්වයන්වහන්සේ ඔහු ගියබව දැන නහා සැරසී රාජ සේවයට අවුත් රජ්ජුරුවන් වැඳ එකත්පස්ව උන්සේක. රජ්ජුරුවෝ සිතන්නාහු "මපුතනුවෝ මහාමන්ත්‍රීය, සියලු මන්ත්‍රණයෙහි පාරප්‍රාප්තය; අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න යන තුන් කල්හි වන්නාවූ අර්ථයන් පරොපදෙශ රහිතව ස්වයම්භුඥනයෙන් මනාකොට දන්නාහ. * එබැවින් අප ඔබ යන ගමනේ යහපත නපුර මේ පණ්ඩිතයෝ දනිති" සිතා, තමන් පළමු සිතූ ලෙස නොරඳ රාගයෙන් රත්ව මෝහයෙන් මූඪව විචාරන්නාහු මේ ගාථාවෙන් කියත්.

ඡන්නං හි එකාව මතී සමෙති,
යෙ පණ්ඩිතා උත්තම භූරිපත්තා;
යානං අයානං අථවාපි ඨානං,
මහොසධො ත්වම්පි මතිං කරොහි.

"පුත මහෞෂධ පණ්ඩිතයෙනි සේනකය පුක්කුසය කාවින්දය දේවින්දය කේවට්ටය වේදේහය යන අප සදෙනාගේ අදහස් උත්තර පංචාල දෙශයට බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ දුවනියන් ගෙණෙන්ට යාම යහපතැ'යි එක්වූ නියාව ගංගොදකය හා යමුනොදකය හා වෙනසක් නැතිවූවා මෙන්ය. මහෞෂධපණ්ඩිතයෙනි තෙපිත් කියව්, ඔබ යාමවත් නොගොස් රැඳීමවත් යහපත නපුර යන මේ දෙකින් එකක් තොපගේ සූක්ෂමවූ ප්‍රඥවෙන් මනාකොට සිතාලා කියව, ඔබ යමෝද නොයමෝදැ"යි කීහ. ඒ අසා මහතානෝ සිතනසේක් "මේ රජ තමා නුවණ මද හෙයින් මුන් සතරදෙනාගේ බස් ගිවිස නුවණින් අන්ධව කාමයෙහි ගිජුව ඒකාන්තයෙන්ම යන්නේය, ගොස් මහා විනාශයට පැමිණෙන්නේය, ගමනෙහි දෙෂකියා නවත්ත් නම් නවතාලමි" සිතා "මහරජ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් පංචප්‍රකාර බලයෙන් යුක්ත නියාව නොදන්නාසේක්ද? පළමුන් තමන් මේ නුවරට අවුත් පැරද පලාගිය හෙයින් ලජ්ජාව පසිඳගන්නා පිණිස 'දුව සරණ දෙමි' ඔබ ගෙන්වා දූල මුවෙකු අසුවූකල වැද්දෙකුසේ තමන් කැමැත්තක් කෙරෙතියි සිතම්, තවද ඇම කෙරේ ගිජුවූ මත්ස්‍යයා යට තිබූ බිලිය නොදැක ගැලපියා නස්නා පරිද්දෙන් කාමයෙහි ගිජුව ඉදින් පංචාලදෙශයට ගියසේක් වීනම් ඒ බිලිය ගිලූ මත්ස්‍යයා පරිද්දෙන් වහා නස්නාසේක. තවද පණ හසුවූ

* ජානාති.

මුවෙකු පරිද්දෙන් මහත්වූ විනාශයට පැමිණෙනසේක; එබැවින් ඈත යන ගමන මම නොකැමැත්තෙමි"යි ගාථා සතරකින් වදාරණසේක්

ජානාසි ඛො රාජ මහානුභාවො,
මහබ්බලො චූළනී බ්‍රහ්මදත්තො;
රාජා 'වතං ඉච්ඡති කාරණත්ථං,
මිගං යථා ඔකචරෙණ ලුද්දො.
යථාපි මච්ඡො බලිසං වඞ්කං මංසෙන ඡාදිතං,
* කාමගිද්ධො න ජානාති මච්ඡො මරණ මත්තනො
එවමෙව තුවං රාජ, චූළනෙය්‍යස්ස ධීතරං
කාමගිද්ධො න ජානාසි, මච්ඡොව මරණ මත්තනො.
සචෙ ගච්ඡසි පංචාලං, ඛිප්පමත්තං ජහිස්සසි
මිගං පන්ථානුපන්නංව, මහන්තං භයමෙස්සසි,

වදාළ කල්හි නුවණ නැති රජ එබස් අසා නුවණින් සලකා ගත නොහී 'තමන්ට හෙළා දෙඩූව'යි සිතා "මේ තමාගේ දාසයෙකුත් කොට" නොසිතා 'රජ්ජුරුවෝය'යි මදකුත් නොතකා දඹදිවට අග්‍රවූ රජ්ජුරුවන් "තමන්ගේ ළෙහිද දුවනියන් සරණ දෙමි"යි කියා තමන්ගේ දූතයන් එවූ නියාව දැනදැනම, මඟුලට නිසි එකබසකුත් නොකියා, මා කෙළතොලුවෙකුසේද, බිලියක් ගිලූ මසෙකුසේද, පණ හසුවූ මුවෙකු සේද, මහත්වූ භයට හාමරණට පැමිණේ"යි කියයි කිපි 'මඟුලට නිසි කථා දන්නෝනම් සේනකාදි පණ්ඩිතවරු සතරදෙනා හා කේවට්ට පණ්ඩිතයෝය; තා නිමුත්මිට එලිගෙණ සීසා කන ගොවියාපුතු අනින් ඹම්සා උතුම් මංගල්‍ය වචන විචාළාවූ අපිම නුවණ නැති කෙළතොල්ලම්හ"යි බෝධිසත්වයන්වහන්සේට නොයෙක් පරිද්දෙන් නින්ද පරිභව බැණපියා 'මේ ගොවියාපුතු මෙතනින් පිටත ලව"යි නියෝගකරන්නාහු † "මාගේ මේ නියා ස්ත්‍රීරතන ලාභයගේ අන්තරායට සුදුසු බස් කිවාවූ මොහුගේ කර අල්වාගෙණ මාගේ විජිතයෙන් පිටත ලව"යි කීහ.

බෝධිසත්වයන්වහන්සේ රජහු කිපි බව දැන සිතනසේක් "ඉදින් මෙහි යමෙක් නුවණ නැති රජහුගේ බස් ගෙණ මා අත වත් කරවත් ඇල්වූයේ වීනම් මා දිවිහිම්යෙන් ලජ්ජාවට එම සැහෙත්තේය; එබැවින් මම්ම යෙමි" සිතා උනස්නෙන් නැඟී රජහු වැඳ තමන්වහන්සේගේ ගෙට ගියසේක. රජ්ජුරුවෝත් කිපී බස් කී බවමුත් බෝධිසත්වයන් කෙරෙහි ගෞරවයෙන් එ

* ආමගිද්ධො කියාත් පාඨයි

† ඉමංගලෙගහේත්වාන නාසෙථ විජිතාමම
යොමෙරතනලාභස්ස අන්තරායායභාසති.

කක්හට 'තුලු ගසව මරව පිටත ලව'යි නොකීහ. එසේහෙයින් තම තමන් මූණු බලා එකෙක්හට නොකීහෙයින් බෝධිසත්ත්වයන් ලඟට ගිය එකද කෙනෙක් නැත්තාහ. ඒ එසේමැයි, රජගෙයි වසන්නාවුන් විසින් රජහු යමෙක්හට කිපී 'තුලුගසව මරව පිටත ලව'යි සාමාන්‍යයෙන් කිකල්හි සිටියවුන් විසින් එබස් අසා සිටි පියෙන් නොයිගිලි රජහු මුහුණ යටිසින් බල බලා සිටියවුන් අතක් නොසෙල්විය යුතුය. එකෙකු මුහුණ බලා කී කල ඒ නියෝග ලද්දහු මුත් අනිකක්හු කිසිවකුත් නොකට යුතුය. ඒ නියොග ලද්දහු තබා අනික් කෙනෙක් නොමේවරෙයි මේවර කෙළේ නම් අරුට කළමනා නිග්‍රහ වරදවා කළ නැනැත්තේ විදගන්නේය; එබැවින් රජහු එකෙක්හට නෝරා නොකීහෙයින් බෝධිසත්ත්වයන් ලඟටගොස් සෙසු නිග්‍රහ තබා 'පිටතගියමැනව'යි යන බසක් පමණකුත් කී එකද සත්ත්වයෙකුත් නැත්තාහ.

ඉක්බිති බෝධිසත්ත්වයන්වහන්සේ සිතනසේක් "රජ්ජුරුවෝ නුවණ නැතිව හිතයන් අහිතයන් නොදැන කාමයෙහි ගිජුව 'බ්‍රහ්මදත්තයන්ගේ දුව *ලබන්නෙම්මයයි සිතා මතුවන භය නොදැන ගොස් මහා විනාශයට පැමිණෙන්නාහ; එබැවින් මට බොහෝ යසදයකවූ උපකාරව සිටි රජ්ජුරුවන්ගේ බස් සිත තිබිම මට තරම් නොවෙයි, මා විසින් මෝහට පිටිවහල් වියයුතුය"යි සිතා 'පළමුකොට ගිරවානන් යවා තත්ත්වය දැන පසුව මම යන්නෙමි † සිතා ඒනුවරට ගිරානන් යැවූසේක. පණ්ඩිතයන්වහන්සේ ගිරානන් යවා තත්වූ පරිදි දත් නියාව බුදුව වැඩහිඳ වදාරණ මාගේ ස්වාමිදරුවූ තිලෝගුරු බුදු රජානන්වහන්සේ මේ ගාථාවෙන් වදාළසේක.

තතො ච සො අපක්කම්ම, වෙදෙහස්ස උපන්තිකා
අථ ආමන්තයී දූතං මාඪරං සුවපණ්ඩිතං
එහි සම්ම හරීපක්ඛ, වෙය්‍යාවච්චං කරොහි මෙ
අත්ථි පංචාලරාජස්ස, සාලිකා සයනපාලිකා

තං පත්ථරෙන පුච්ඡස්සු, සා හි සබ්බස්ස කොවිදා
සා තෙ සබ්බං පජානාති, රඤ්ඤො ච කොසියස්ස ච
ආමොති සො පටිස්සුත්වා, මාඪරො සුවපණ්ඩිතො
ආගමාසි හරීපක්ඛො, සාලිකාය උපන්තිකං

තතො ච සො ඛො ගන්ත්වාන, මාඪරො සුවපණ්ඩිතො
අථ ආමන්තයී දූතො, සාලිකං මංජුභාණිකං
කච්චි සරෙ ඛමනීයං, කච්චි වෙස්ස අනාමයං
කච්චි තෙ මධුනා ලාජා, ලබ්භතෙ සුසරෙ තව

* ධිතරංලභිස්සාමියෙවාති.

† පච්ඡාසයංගමිස්සාමීති.

කුසලංසෙසව මෙ සමම, අනාමය මථො මම
අථො මෙ මධුනා ලාජා, ලබ්භතෙ සුවපණ්ඩිත
කුතොනු සමම ආගමම, කසස වා පහිතො තුවං
නච මෙ’ සි ඉතො පුබෙබ, දිඨො වා යදිවා සුතො.

“එඹා මහණෙනි ඒ මහෞෂධ පණ්ඩිතයෝ වේදේහ රජුගෙන් උදහස් අසා තමාගේ ගෙට ගියාහු තමන් වැඩූ මාඪර ගෝත්‍රයෙහි උපන් ගිරාපැටවානන් කැඳවා ඕහට දූත මෙහෙවර කියා යවන්නාහු ‘රන්වන්වූ පක්‍ෂවයක් ඇති සබඳ ගිරා පණ්ඩිතයෙනි මෙසේ එව; තොප විසින් මට කළ මනා මෙහෙවරෙක් ඇතැ’යි කීහ. ගිරානෝ එබස් අසමින් තමන් හුන් රන් මැදිරියෙන් පිටත්ව මහාසත්තාෂයට පැමිණ තමන් දෙපියා මුදුනේ තබා වැඳ එකත්පස්ව සිට කි යම් මෙහෙවරක් කොට දිලමි, සැකනොකොට වදළමැනව”යි කීහ. ඒ අසා පණ්ඩිතයන්වහන්සේ වදාරණසේක් මාඪර ගෝත්‍රයෙහි උපන් ගිරාපැටවානෙනි, කේවට්ට බ්‍රාහ්මණයා හා බ්‍රහ්මදත්තරජහු දෙදෙනා ‘සරණ දෙම්හ’යි කළ කථාව රහස හෙයින් ‘සැබෑද බොරුද’යි රජහුගේ යාන බලන සැළලිහිණිය අතින් තත්වූ පරිද්දෙන් විචාරා දැනගෙණ වහා අවුත් මට කියව”යි කියාලා මී හා විලඳ කවා මීපැන් පොවා ශතපාක සහස්‍රපාක තෙලින් දෙපියා අතුර මැඩි කල්හි ඉතා සියුම්වූ නුවණැති ගිරානෝ අසාගත් මෙහෙවර ඉඳුරා සිත තබාගෙණ මහනානන් තුන්විටක් පැදකුණුකොට වැඳලා මාලිගාවේ මතුමාලේ හරණලද සිව්මැදුරු කවුළුවෙන් නික්මුණාහු වාත වේගයෙන් සිව්රට දිශාවට මූණලා නික්ම එහි පවත් සිත තබාගෙණ සැළලිහිණිය සමීපයට ගියාහ. ඒ කෙසේද යත් ? ගිරානෝ ගොසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මාලිගාවේ රන්කොත් කැරැල්ල මුදුනේ හුන්නාහු මධුරස්වරයෙන් රාගනිශ්‍රිත අඬක් ඇඬූහ, ඒ කුමක් පිණිසද යත් සැළලිහිණිය කවර මාලෙක කවර ගබඩාවෙක බවත් නොදන “මේ මාගේ ශබ්දය අසා මට ප්‍රතිවචන දී නොමෝත් හඬයි, ඒ සලකුණෙන් ඈ සම්පයට යෙමි” සිතා ඇඬූහ; ඔයිත් ඒ ශබ්දය අසා ඒ රජහුගේ ශ්‍රීයහන් ගබඩා සම්පයට ගොස් රන් මැදිරියේ උන් නැනැත්තී රාගයෙන් රත්වූ සිත් ඇත්තී පිට පිට තුන් අඬක් ඇඬූහ. ගිරානෝ මදක් ගොසින්, නැවත නැවත ශබ්දය අසා, ඒ අනුසාරයෙන් ක්‍රමයෙන් ගොස් සිව්මැදුරු කවුළුයේ එළිපත පිට හිඳ ගෙයි මිනිසුන් ඇත්ත නැත්ත පරීක්‍ෂාකොට නැතිසේ දැක ඈ සමීපයට ගියාහ.

මෙසේ කෙළේ කුමක් පිණිසද යත් ? “මේ සත්වලෝකයෙහි සත්‍රීන් නිසා ගොස් ඇත තොල්මිටි බිඳවාගෙණ මහා පීඩාවට පැමිණෙන්නාහු ඇත; ඉදින් මේ ගෙයි යමෙක් මා දුටුයේවී නම් මටත් අවවාදයක් කළේනම් නපුරැ”යි සිතාමේ එසේ පරීක්‍ෂා

කළහ. නැවත සැළලිහිණිය 'සබඳ මෙසේ අවුත් රන් මැදිරියේ හිඳිනැ'යි කිව. ගිරානෝ මැදිරියට වැද 'සැළලිහිණිය'යි බැණ වූහ. 'කිමෙක්ද ස්වාමිනි' කිව. 'කිමෙක්ද තොප මේ රන්මැදිරියේ වසන්නවුන්ට දෙම්නසෙක් නැද්ද? මි හා විළඳ සුවසේ ලැබේදැ'යි විචාළහ. තොමෝත් කියන්නී 'මා මෙහි වසන්නියට ඉතා සැපය, දෙම්නසෙකුත් නැත, විළඳ හා මි සුවසේ ලැබෙයි පණ්ඩිතයෙනි' තෙපි කොයිසිට අවුද කවරෙකුගේ බසට හෝ ආයෙහිදැ'යි * කිව. ගිරානෝ ඈ කී බස් අසා 'ඉදින් මම මියුලුනුවර සිට ආමි කීම් නම් තමා පණයේ නමුත් සමාගමයක් නොවන්නේය'යි සිවිදේශයෙහි අරිෂ්ටපුරය සඳහන්කොට ඔබ සිට ආම් කියා සිවිරජ්ජුරුවන් එව්වාකොට බොරු ගොතාගෙණ කියන්නාහු මේ ගාථාවෙන් කියත්:—

අහොසිං සිවිරාජස්ස, පාසාදෙ සයනපාලකො
තතො සො ධම්මිකො රාජා, බද්ධෙ මොචෙසි බන්ධනා.

'සොඳුර මම වැලිත් එසේ මෙසේ කෙනෙක් නොවෙමි; සිවිරජ්ජුරුවන්ගේ යානබලන්නාවූ ගිරවෙකිමි; අපගේ රජ්ජුරුවෝ ඉතා ධර්මිෂ්ඨ කෙනෙක, එසේහෙයින් දහගෙයි හිඳින මනුෂ්‍යයන්ද මැදිරිවල හිඳිනා පක්‍ෂීන්ද හරවනසේක්, මාත් රන් මැදිරියෙන් හැරිසේක; මම මා කැමති තෙන ඇවිද ගොදුරු කා අවුත් දවස්පතා මාගේ රන්මැදිරියේ වෙසෙමි; තොපසේම මැදිරියෙන් පිටත් නොවී ඇතුළුමැදිරියේ හිඳිනෙම් නොවෙමි" කීහ. එසේ කී ගිරානන්ට සැළලිහිණි තමාට රන්මැදිරියෙහි ලා තුබූ විළඳ කවා මිපැන් පොවා අනතයෙහි කියන්නී 'සබඳ තෝ ඉතා දුර සිට ආයෙහිය, කුමක් පිණිස අවිදැයි කිව, ගිරානෝ ඇගේ බස් අසා සිතන්නාහු මේ ලොව බොරුවක් නොකියා බොරු සනාවක් නොකොට සත්‍යින් නම් සිත්ගත නොහැක්ක; එබැවින් බොරුවක් කියා ඈ නුම්මාගෙණ රහස් විචාරාගනිමි' සිතා කියන්නාහු මේ ගාථාවෙන් කීහ:—

තස්ස මෙකා දුතියාසි, සාලිකා මංජුභාණිකා
තං තත්ථ අවධි සෙනො පෙක්ඛතො සුසරෙ මමං

"එඹා සොඳුර තොපගේ කුලෙහිම වූ මාගේ පළමු ඇඹෙනි කෙනෙක් වූවා, උයිත් එසේ මෙසේ කෙනෙක් නොවන්නාහ; පුරුෂයන් සිත්ගන්නා තරම් ළදබොළඳ මිහිරි ප්‍රියතෙපුල් දන්නාහ; මාගේ ඇසට රසාඤ්ජනයක් හා සමානවූ ඒ මාගේ භාර්‍ය්‍යාව මා බලබලා සිටියදි මා ඇස්හමුවේ උකුස්සෙක් අල්වාගෙණ මරාපියා ඇරගෙණ පලාගියේය"යි කීයේය. එසේ කීකල්හි සැළ

* සම්මකුතො ආගන්ත්වාත්වං ඉධ පවිඨොසි. කෙනවා පෙසිතොත්වං ඉධා ගතොසි.

ලිහිණි විචාරන්නී 'තොපගේ අඹුවන් උකුස්සා කෙසේ මරාපියා ඇරගෙණ ගියේදැ"යි කිව. ගිරාතෝ ඇ සිතට නැගෙණ පරිද්දෙන් බොරු ගොතා කියන්නාහු "එක් දවසක් අපගේ රජ්ජුරුවෝ දියකෙළියට යන්නාහු මාත් කැඳවූසේක; මම මාගේ අඹුවන් කැඳවාගෙණ ගොසින් දිය කෙළිපියා සවස රජ්ජුරුවන් හා සමග අවුත් මාලිගාවට නැගී ඇඟ දිය වියලාගන්නා පිණිස මාගේ බිරින්ද කැඳවාගෙණ සිවුමැදුරු කවුළුවෙන් නික්මලා පිටත කූටාගාර කුක්ෂියෙහි කොබෝගෙඩි වලල්ලෙහි උන්නෙම්, ඒ ඇසිල්ලෙහි උකුස්සෙක් කුළුගෙය ආසින් යන්නේ * අප අල්වාගන්ට දිවීය; මම මරණ භයින් තැතිගෙණ වහා දිවපීමි; උන් දූරිඇති හෙයින් බඩබරව වහා යා නුහුනුවාහ; එවිට මා බලබලා සිටියදීම අල්වාගෙණ මරාපියා ඇරගෙණ ගියේය, උන්ට ශොකයෙන් හඬන්නාවූ මා දැක, අපගේ රජ්ජුරුවන් වහන්සේ 'සබඳ කුමට හඬාදැ'යි විචාරා ඒ බව අසා 'සබඳ නොහඬව, අනික් බිරින්දක් සොයා යව'යි කීහ.

"එබසට මම කියන්නෙම් 'ස්ත්‍රීහු නම් බොහෝසේ අනාචාර ශීලිහුය; එසේ අනාචාර දන්නා දුස්සීල එකකු ගෙණ්ඊමට වඩා උදකලාව විසීම 'යහපතැයි' කීමි. එබසට කියනසේක් තොපගේ ඇඹතියන්ට ශතසහස්‍ර ගුණයෙන් වඩනා සීලාචාර සම්පන්න සැළලිහිණියක් චූළනී රජ්ජුරුවන්ගේ යාන බලා ඉඳිනීය; ඕ ඉතා යහපත් එකක, තෙපි වහා ඔබගොස් ඇගේ අදහස් පරීක්ෂාකොට පියා 'යහපත ඉඳිමි' ගිවිස්සි නම් ඇගෙන් අවකාසයක් ලද්දනම් තෙපිත් කැමැත්තාහු නම් වහා අවුත් කියව; මම වත් බිසව්වත් ගොසින් මහපෙරහරින් ගෙණවුත් පාවාදෙන්නෙමුය'යි කියා තොප සම්පයට එවූසේක. මම තොප සරණ බණවා ආමි'යි කීහ. ඉක්බිති කියන්නාහු "ඉදින් තෙපි මා කැමැත්තා නම් වහා කියව; මා රඳන්ට නොපිළිවන; මා කෙරේ රුකෙන්නා කැමැත්තානම් අපි දෙන්නමෝ සමග වාසයෙන් එක්සිත්ව සුවසේ වසම්හ'යි සිත ඇත්ත නොවලහා කියව "යි කීහ.

උන්ගේ බස් අසා සැළලිහිණි ඉතා මහත් සොම්නසට පැමිණ තමා සතුටුබව නොහඟවා නොකමැත්තියකමෙන් හඟවන්නී මේ ගාථාවෙන් කියා.—

සුවොච සුවිං කාමෙය්‍ය, සාලිකො පන සාලිකං
සුවස්ස සාලිකායාච, සංවාසො හොති කීදිසො.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම් ගිරා පණ්ඩිතයෙනි, කුමක් කියව්ද ? ගිරවෙක් රක්ෂාකෙරේ නම් "ගිරාධෙනුවෙක; සැළලිහිණියෙක් රක්ෂාකෙරේ නම් සැළලිහිණියක; ගිරවෙකු විසින් සැළ

* අමෙහගණ්හිතුංපක්ඛන්දි.

ලිහිණියක රක්ෂාකිරීමනම් කවර කලෙකවූ විරූ දෙයෙක්ද! එසේ දෙයෙක් මාඇසූ විරූදැත් නැතැ"යි කීව. ඒ අසා ගිරානෝ සිතන්නාහු "දූරිය බැහැවුම් කියන බව මුත් මා නොකමැති ඤැටිය නොවෙයි, සිතින් ඉතා කැමැත්තීය. නොයෙක් පරිද්දෙන් කාරණා කියා ගිවිස්වාගතමැනව"යි සිතා කියන්නාහු මේ ගාථාවෙන් කීහ.

යං යං කාමී කාමයති, අපි චණ්ඩාලිකාමපි
සබ්බො සදිසො හොති, නත්ථි කාමෙ අසාදිසො.

"එම්බල යම් ස්ත්‍රියක් යම් පුරුෂයෙක් කැමැත්තේ වීනම් චණ්ඩාල උවත් උත්තම උවත් ඇමදෙනම පංචකාමයෙන් සමයහ; ඒ විෂයෙහි අඩුවැඩියක් නැත; මනුෂ්‍යයන් විෂයෙහි පවා නොයෙක් ජාති වෙන වෙන ඇතත් ප්‍රමාණ නම් කාමචේතනාවම ය"යි අඟවන්නාහු මේ ගාථාවෙන් කීහ.—

අඤ්ඤ ජම්බාවතී නාම, මාතා සිබිස්ස රාජිනො
සා හරියා වාසු දෙවස්ස, කණ්හස්ස මහෙසි පියා.

"යටගිය දවස වාරවතීනුවර රජකළ කෘෂ්ණායන ගෝත්‍රයෙහි උපන් දසබෑරජ්ජුරුවන්ට වැඩිමාලු වාසුදේව රජ්ජුරුවෝ නුවරින් නික්ම උයන්කෙළියට යන්නාහු චණ්ඩාල ග්‍රාමයෙන් තමාගේ යම්කටයුත්තක් නිසා නුවරට එමින් සිට මඟින් ඉවත්ව සිටි අනඝි රූ ඇති එක් කුමාරිකාවක දූක පිළිබඳවූ අදහස් * ඇතිව ඇගේ ජාති විචාරා 'චණ්ඩාල කුලයෙහිය'යි කීවත් බලවත් ප්‍රේම ඇති බැවින් අස්වාමික බව අසා උයනට නොගොසින් ඈ රැගෙණ නැවත මාලිගාවට ගොසින් † රුවන් රැසක් පිට සිටුවා සොළොස් දහසක් බිසෝවරුන්ට නායකකොට ඔටුනුපළඳවා අගමෙහෙසුන් කළාහ. ඒ බිසව් රජහට සිවිනම් පුතෙකු වැදූහ, ඒ කුමර පියරජහු ඇවෑමෙන් වාරවතී නුවර රජකළේයයි උදාහරණකොට එබඳු ක්ෂත්‍රිය කුලෙහි උපන් රජ්ජුරුවෝ පවා චණ්ඩාල ස්ත්‍රියක් රක්ෂා කළහ; තොපත් අපත් තිරිසනුන් හෙයින් කවර වෙනසෙක්ද? අපට ප්‍රමාද නම් ඔවුනොවුන් කැමති පමණෙක්මය " යි කියා නැවත අනික් කාරණයක් දක්වන්නාහු මේ ගාථාවෙන් කීහ,—

රථාවතී කිම්පුරිසී, සාපි වච්ඡං අකාමයි
මනුස්සා මිගියා සද්ධිං, නත්ථි කාමෙ අසාදිසා.

මේ ගාථායෙහි අභිප්‍රාය නම් යටගිය දවස එක්බමුණෙක් පංචකාමයෙහි ආදීනව දූක තමාගේ බොහෝ සැපත් හැර හිමාල වනයට වැද තවුස් පැවිද්දෙන් මහණව පන්සලක්කොට වසන්නේය. එතනට නුදුරු තැනෙක්හි එක් ගල්ගුහායෙක බොහෝ කිඳුරෝ වසන්නාහ. එතනට නුදුරු තැනෙක මහ මකුළුවෙ

* පටිබද්ධචිත්තොහුත්වා. † රතනරාසිම්හිඨපාපෙත්වා.

කුත් වසන්නේය. ඒ මකුළුවා කිඳුරුලෙන දෙර දැලක් බැඳ උදෑසන එකෙකු බැගින් කිඳුරන් ඉස්කඩා ලේ බොන්නේය. කිඳුරෝ* නම් ඉතා දුර්වල සත්ත්වකෙනෙක, ස්වාභාවයෙන්ම බාන සුල්ලහ, මකුළුවා නම් රථසකක් පමණ ඇති මහාප්‍රාල එකෙක. කිඳුරෝ ඕහට කිසිවකුත් කොටගතනොහී තාපසයන් සමීපයට ගොස් මිහිරි කථාකොට ආ කටයුතු විචාළ කල්හි "ස්වාමිනි එක් මකුළුවෙක් අපගේ ජීවිත හරණය කෙරෙයි; නුඹවහන්සේ හැර අනික් පිටිවහලෙක් නැත, ඌ මරා අප ඇම දිවි රැකදී අප සුව පත් කළමැනවැ"යි කීහ. ඒ අසා තපස්වී "අප වැන්නෝත් ප්‍රාණවධ කෙරෙද්ද? මෙතනින් පහවයා"යි අසුරගසා නෙරපිය. එවිට කිඳුරෝ සිතන්නාහු "අපගේ රථවතී නම් කින්නරාඞ්ගනාව අස්වාමිකය, ඇ සරහාලා ගෙණවුත් යාවඤකරම්හ'යි තපස්වි ලඟට ගෙණවුත් 'මැ නුඹවහන්සේට පාදපරිචාරිකා † වේවා අපගේ සතුරා මරාවදාළ මැනවැ'යි කීහ. තාපසයා ඇකෙරේ පිළිබඳ සිත් ඇතිව ඇ ‡ සමග වැස අලුයම් වේලෙහි කිඳුරන්ගේ ලෙන දෙර සැඟවී සිට ගොදුරට ආ මකුළුවා මුගුරකින් ගසා ජීවිතක්‍ෂයට පමුණුවාපිය, § ඈ හා සමග වසන තපස්වියා, එහිම දරුවන් ලදින් බොහෝදවස් වැස කාලක්‍රියා කෙළේය. ගිරානෝ මේ උදාහරණය ගෙණහැර දක්වා "එම්බල තාපසයෝ මනුෂ්‍යව සිට තිරිසන් කින්නරාඞ්ගනාව සමග විසූහ. අපි දෙපක්‍ෂයෙම පක්‍ෂිම්හ, එබැවින් තොපහා අප හා සරණමගුලට ප්‍රමාද නම් ඔවුනොවුන් කැමතිවීමය"යි කීහ.

එවිට සැලලිහිණී ගිරානන්ගේ බස් අසා "ස්වාමිනි හැම දවස්ම සිතනම් එකලෙස තිබෙන්නේ නොවෙයි; ප්‍රිය විප්‍රයොග ඉතා නොකමැත්තෙමි, හෙවත් නුඹවහන්සේගෙන් මතු වියෝ වීමෙක් ඇත, දැන්ම නැවැත්තමැනව, පසුව වියොවින් ඉතා නොකැමැත්තෙමි"යි කිව. ගිරානෝ තමත් ඉතා නුවණැති හෙයින් හා ස්ත්‍රී මායමෙහි දක්‍ෂහෙයින් නවත් විමසන පිණිස මේ ගාථායෙන් කීහ.

හන්දබො 'හං ගමිස්සාමි සාලිකෙ මංජුභාණිකෙ
පච්චක්ඛානුපදං හෙතං අතිමඤ්ඤසි නූන මං.

මේ ගාථාව කියා "තොප මෙසේ මා නොකමැතිවම කියන හෙයින් අපි යම්හ; තොපගේ මෙතනට මා තනිව අවුත් යාවඤකරණ හෙයින් තෙපි මා නිකම් එකෙකුයයි සිතූද ? මම ඉතා රාජපූජ්‍යයෙමි, මට අඹුවෝත් අරුමද? අනිකක් සොයාගනිමි; එබැවින් දැන්මයෙමි"කීහ. සැළලිහිණී "දැන්ම යෙමි" කී බස

* කින්නරනාම. † පාද පරිචාරිකාහොතු.
‡ සංවාසංකප්පෙසි. § ජීවිතක්ඛයංපාපෙසි.

අසම්න්ම ලැය පැළියනතරම් සෝකයෙන් පිඩිතවන්නී, ඔහුදුටු විටම උපන් සෙනහයෙන් හා කාමචෙතනාවෙන් සර්‍වාංගයෙහි දහ වැදගන්නාසේ වියෝගින්නෙන් පැලහෙන්නී, තවත් තමාගේ ස්ත්‍රීමායමෙන් නොකමැත්තියකමෙන් හඟවා; නොයාදී රඳවන්ට උපමා මිශ්‍රකොට කියන්නී, මේ ගාථාවෙන් කියා.—

න සිරි තරමානස්ස, මාඨර සුවපණ්ඩිත
ඉධෙව තාව අච්ඡස්සු, යාව රාජාන දක්ඛසි
සොස්ස සද්දං මුතිංගානං, ආනුභාවංච රාජිනො.

මේ ගාථාවෙහි අර්ථනම් ගිරාපණ්ඩිතයෙනි යම්සේ සිත ඇත්තක් සාදගන්නා එකක්හු ඉක්මන් නොවිය යුතුය; ඉක්මන් නැනැත්තවුට ශ්‍රීකාන්තා නොමෝම දුරුවන්නීය; එබැවින් අද මෙහිම රඳව, ගෘහවාසය නමුත් බිරින්දක් රක්‍ෂාකිරීම නමුත් ඉතා ඉක්මන්ව බැරිය, ඉක්මන්ව කළ දෙය ඔබින්නේ නොවෙයි; එබැවින් අද රෑ මෙහි රඳව; ඉදින් රැඳුනානම්, අපගේ රජ්ජුරුවන්ගේ මහත්වූ රාජෛශ්වර්‍ය්‍ය දූක උතුම්වූ රූ ඇති සර්‍වාභරණයෙන් සැදුණු නාටිකාංගනාවන් ලියකිදුරන්සවර හා සමානව කියන්නාවූ ගීතිකා ඇසුවමැනව; ඔවුන් විසින් වයනලද මෘදංග නාදයත් අසව; ඉක්මන් නොවී සැබවින් අද රැඳුනානම් වැඩක්මුත් අවැඩෙක් නැත්තේය; තොපගේ ගම බිරින්දත් නැත, ඇතිබිරින්ද උකුස්සා ගෙණගිය'යි කිව. තොප ඉක්මන්වත්තේ ඇයිද? රැඳුනා නම් තොපගේ අභිමතාර්ථය සිඩවන්නේය"යි බැහැවූන් වසයෙන් රඳන්නා කැමතිවම කිව.

ගිරාතෝ 'තොප මෙසේ කියනපසු රඳයෙමි' කියා රැඳුනාහු නොයෙක් අලලාප සලලාපයෙන් ඇ සිත්ගෙණ එදවස් සවස්වේලේ ලෝකස්වාදරතියෙහි යෙදී සනතුෂ්ටව ඔවුනොවුන්ට ප්‍රාණය සමානවූහ. ඉක්බිති ගිරාපණ්ඩිතයෝ "මෙවිට මෝ තමා සිත ඇති යම්ම රහසක් මට නොවලහා කියයි. ප්‍රපංච නොකොට විචාරාගෙණ මෙතනින් වහා නැගීයෙමි" සිතා 'සැළලිහිණිය'යි කීහ. 'කිමෙක්ද ස්වාමීනි' කිව. 'යම්ක් විචාරන්නා කැමැත්තෙමි' කියව්ද'යි කීහ. යහපත කිවමැනව, අද අපගේ මගුල් දිනය, පසුදවසේ කිවමැනව ඉදින් මගුලට නිසි දෙයෙක්වී නම්, අද කිවමැනව; අවමඩගල්‍යයෙක්වී නම් නොකිවමැනවැ'යි කිව. 'තෝ කුමක් කියයිද! මියේ මිවන් කළාසේ මගුල් පිට මගුලෙක මා කියන්නේය'යි කීහ. * එසේනම් කිවමැනව'යි සැළලිහිණි කිව. ඉදින් අසන්නා කැමැත්තෙහිනම් කියමි'යි කියා 'කිමෙක්ද බ්‍රහමදත්ත

* තෙනහිකථෙහිති සචෙසොතුකාමො
හවිස්සසි කථෙස්සාමිතෙනිවත්‍තා

රජ්ජුරුවෝ ඉතා රූපශ්‍රීන් බබලන්නාවූ තමන්ගේ දූවනියන් තමන් වසහව හිඳිනා එක්සියයක් රජදරුවන්ටනොදී, සතුරුවූ වෛදේහ රජ්ජරුවන්ට කුමක් පිණිස දෙද්දූ' * යි කීහ.

සැළලිහිණි ගිරානන්ගේ බස් අසා ඉතා නොසතුටුව කියන්ති 'ස්වාමීනි අපගේ ඊනියා මඟුල්දවසේ මෙවැනි අවමඞ්ගල්‍යයක් කුමක් නිසා කීයෙහිදැයි කිව. ගිරානෝ කියන්නාහු "මම 'මඟුලැ'යි කියමි; නෙපි 'අවමඟුලැ'යි කියව; අප දෙන්නාගේ බස් විපරීතවන්නේ කුමක්දැ"යි කීහ. 'ස්වාමිනි මෙසේවූ මංගල්‍ය දිනයෙහි කිවමනා දෙයෙක් නොවෙයි; 'නොකියම්' කිව. සොඳුර අවශ්‍යයෙන් මට කිවමැනව'යි කීහ. 'ස්වාමිනි එසේවූ නොඇසියයුත්තෙක් සමස්ත ලොකයෙහි නැත, එබැවින් කියන්ට නොපිළිවන නොකියමැ''යි කිව. 'එසේද තොප සිතා ඇති රහස් මට නොකියනකල තොපගේ හා මාගේ හා සමග වාසයෙන් ප්‍රයෝජන කිම්දැ'යි කීහ. සැළලිහිණි එබසට සෝකයෙන් පිරුණු ලය ඇත්තී 'එසේ නොකීයෙම්නම් මා ඇරපියා පලාගියෝ නම් නපුරැ'යි සිතා 'එසේවීනම් කියමි ඇසුවමැනවැ'යි කියන්ති 'බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා වෛදේහ රජ්ජුරුවන් හා දෙන්නාගේ විවාහ මංගල්‍යය සේවූ මඟුලෙක් තොපගේ සතුරන්ටත් නොවේව' යි කිව.

එදිසො තෙ අමිත්තානං, විවාහො හොතු මාඨර
යථා පංචාලරාජස්ස, වෙදෙහෙන භවිස්සති.

ගිරානන් 'ඊට කාරණා කිම්දැ"යි කී කල්හි 'එහි තත්වය කියමි, ඇසුවමැනවැ'යි කියන්ති "බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ 'දූවනියන් සරණදෙම්හ"යි කියා වෛදේහරජ්ජුරුවන් හා මහෞෂධ පණ්ඩිතයන් හා දෙන්නා මායම්න් මේ නුවරට ගෙන්වාගෙණ මරන්නාහ; ඉදින් අවුනම් උන්ට මර බාධා නැත, මිත්‍රකමට කරණ දෙයෙක් නොවෙයි, ඒ මඟුල නිසා වන්නාවූ අභිවෘද්ධියක් නැතැ"යි කිව. නැවත කියන්නී "සරණ දෙන්නා තබා දුව ඇසටත් නොපානාහ. 'දෙන්නාම මරා ජයපානය † බොන්නෙමුය'යි කේවට්ටයා හා රජ්ජුරුවන් හා දෙන්නා මා උන් ශ්‍රීයහන් ගබඩාවේ හිඳ රහස් මන්ත්‍රණය කොට දූන් කේවට්ටයා රජ්ජු ගිවිස්වා ගෙණෙන්ට ගියේය'යි දෙන්නාගේ රහස් කථාවෙන් මදකුත් නොවරදවා ගිරාපණ්ඩිතයන්ට කිව.

ඒ අසා 'කේවට්ටයාගේ නුවණ ඉතා යහපත් නියායු; මේ උපායෙන් රජහු මේ නුවරට ගෙන්වා මරන්ට බැරි නොවෙයි;

* යොනුබොයංතිරොසදෙදූ තිබ්බොජනපදෙසුනො
ඛීතාපංචාලරාජස්ස ඔසධීවිය වණ්ණිනි
තංදස්සති විදෙහානංසො විවාහො භවිස්සති.

† ජයපානංපිවිස්සාමාති.

සිතූ නියාව ඉතා යහපතැ'යි කේවට්ටයාට කයිවාරු කොට 'අපගේ මේ නියා මගුලේ අවමගුලක් කීමෙන් ප්‍රයෝජන කිම්ද ? ඒ නොකිය'යි කියා නවතා, තමන් ආ කම් සැපයුණු බව දැන, ඒ රාත්‍රියෙහි ඇ හා සමග දවස් යවා පාන්වූ කල්හි "සොඳුර මම සිව්රට ගොසින් 'මා සිත්වන් බිරින්දක් ලදිමි' මාගේ රජ්ජුරුවන්ට කියන්ට යෙමි, මට සද්දවසකට සමු දෙව, අටවැනි දවස මහ පෙරහරින් එන්නෙමි, මා එනතෙක් තෙපි මා කෙරේ ශෝකයෙන් නොකා නොබි වැහැර නොගොස් උකටලි නොව සුවසේ ඉඳුව"යි කීහ. සැළලිහිණී ගිරානන්ගේ වියෝදුක් ඉවසිය නොහිසමණන්ට උත්තර කීමෙහි අසමර්ථව 'යහපත සද්දවසකට අවකාස දෙමි, අටවෙනිද ආයෙහිනම් ඒකාන්තයෙන් මා මළ තෙනට නුඹ එන්නෙහිය; * සැබවින් මා කැමතහොත් සද්දවස ඇතුළත අවමැනවැ"යි ක්ව සොඳුර කුමක් කියව්ද ? ඉඳින් අටවෙනිද තොප නුදුටිම් නම් මාගේ ජීවිතය තමා ඇද්ද ? දූරි ඇති අඹුව නොකලේ මියයාමක් හා අලුත් අඹුවන් රක්‍ෂාකළ සද්දවසකින් මළ කල මාගේ ලය ගලෙක්ද ? තෙපි මා එන ගමන සැකනොකරව'යි කියා සිතින් සිතන්නාහු 'තෝ මියේවා, රැකේවා' නිගෙන් මට ප්‍රයෝජන කිම්දැ'යි මැදිරියෙන් නික්ම සිව්රට දිසාවට මුහුණ ලා මදක් තැන් ගොසින් නැවත මියුලුනුවරට ගොස් බෝධිසත්වයන් වහන්සේගේ උරයට බටහ. මහතානෝ මතු මහල්තලයට වඩාගෙණ විවාළකල්හි සැළලිහිණීය කී කළදූ මූළුල්ල ආඥනත නොවරදවාම කිහ. බෝධිසත්වයන්වහන්සේ මී හා විලඳ කවා මිපැන් පොවා ශතපාක සහශ්‍රපාක තෙලින් දෙපියා අතුර කකුල් සඬ මිරිකා ඉතා සැපවූ රන්මැදිරියේ සැතැප්පූසේක. ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදු රජානන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේකි.

තතො ච ඛො සො ගන්ත්වාන, මාඪරෝ සුවපණ්ඩිතො
මහොසධස්ස අක්ඛාසි, සාලියා වචනං ඉදං

'එම්බා මහණෙනි ඒ ගිරාතෙමේ සැළලිහිණියගෙන් රහස් කථා ගෙණවුත් මහෞෂධ පණ්ඩිතයන්ට කීයේවේදැ'යි වදාළසේක.

ගිරානන්ගෙන් බස් ඇසූ අනතුරු බෝධිසත්වයන්වහන්සේ සිතනසේක් "මේ රජ්ජුරුවෝ මා නොකමැති කරවා ගොසින් මහ විනාශයට පැමිණෙන්නාහ; මෙවෙනි යසදුයකවූ රජ්ජුරුවන්ගේ බස් සිත තබා ඒ බව දැන පිටිවහල් නුවූහ'යි දන් කෙනෙක් නින්දා කෙරෙති. මා වැනි පණ්ඩිතයෙකු ජීවත්ව ඉන්දදී මේ රජ කුමක් පිණිස නස්නේද ? රජහට පළමුව ගොස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දූක වේදේහ රජ්ජුරුවන්ට යහපත් නුවරක්

* අඪමෙදිවසෙ අනාගච්ඡන්තො මයිමතාය ආගමිස්සසි.

කරවාලා ගව්වක් පමණ සුළු උමගක් හා දෙගව්වක් පමණ මහ උමගක් කරවාලා, චූලනී රජ්ජුරුවන්ගේ දියනියන් අපගේ රජ්ජුරුවන්ට අභිෂෙකකරවාදී, එක්සියයක් රජදරුවන් හා අටළොස් අක්‍ෂෞහිණියක් පමණ මහා සේනාව අප උත් නුවර වටලාගෙණ සිටියදී අපගේ රජ්ජුරුවන් රාහු මුඛයට වන් සඳමඩලක් පරිද්දෙන් ගලවාගෙණ එනගමන මට භාරවන්නේය”යි සිතූසේක. * මෙසේ සිතන්නානාවූ ස්වාමිදරුවානන් ශරීරයෙහි පස්වණක් ප්‍රිති උපන්නේය. ප්‍රිති වේගයෙන් උදන් අනනසේක් “යම් පුරුෂයෙක් යම් රජක්හුගෙන් සියලු සම්පත් ලදින් කිසිවෙකිනුත් අනූනව මහා අඪ්‍යව වෙසේනම්, එසේවූ ප්‍රඥා සම්පන්නා පුරුෂයා විසින් කායවාක් මනඃ යන වාරත්‍රයෙන්ම ඒ රජහට වැඩෙහි හැසිරිය යුතුය; ඔවුන්ගේ ආපදාවක් දුටු කල්හි ඉන් මුදලන්ට ශක්ති ඇතිවත් ඊට පිටිවහල් නොවී නම්, මිත්‍රද්‍රොහියාය; එබැවින් රජහු නුවණ නැතිව නොදන කියාපු යම්තම් බස් පමණක් සිත තබාගැන්ම මට තරම් නොවේ”යි සිතා සොළොස් කළයක් සුවඳ පැනින් ඉස්සෝධා නහා සර්වාභරණයෙන් සැරහී මහපෙරහරින් රජගෙට ගොස්, රජහු වැඳ එකත්පස්ව සිට වඳරණසේක් “කිමෙක්ද මහරජ උත්තරපංචාල දේශයට යනසේක් මදැ”යි වදාළසේක.

“එසේය පුත යෙමි, පංචාලචණ්ඩි කුමාරිකාව නොලබන්නාවූ මට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්ද ? තෙපිත් මා අත්නොහැර කැටිව එව; ඔබ යාමෙන් වැඩ දෙකක් වන්නේය, ස්ත්‍රී රත්නයක් ලබමි, රජ්ජුරුවන් හා නෑ වීමෙන් ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී සිතත් පිහිටන්නේය’යි කීහ. ඉක්බිති රජ්ජුරුවන් වහන්සේට පණ්ඩිතයෝ කියන්නාහු “මහරජ එසේ වීනම් මම පළමුකොට ගොස් නුඹවහන්සේ ඉඳිනා මාලිගා ආදි ගෙවල් නංවාලා, යම් දවසෙක කියා එවීම් නම් එද වැඩිය මැනවැ ” යි වදාළිසේක. ඒ අසා රජ්ජුරුවෝ ‘ඒකාන්තයෙන් දරුවන් මා අත්නොහරණා සැටිය ’ යි ඉතා සතුටුවූ සිත් ඇතිව ‘පුත තොප පළමු යන්නාවුන්ට කුමක් ලදමනාදැ’යි කීහ. ‘බල වාහන ලද මැනවැ’යි කීහ. යම් පමණක් කැමැත්තා නම් එපමණක් ගෙණයව’යි කීහ. ඒ මහතානන්වහන්සේ “ සිරගෙවල් රැකවල සිටිනා බලසම්පන්නා යෝධයන් මා හා කැටිව එව්වමැනවැ ” යි වදාළිසේක. රජ්ජුරුවෝ කියන්නාහු ‘මට කියන්නේ කිම්ද ? තොප කැමැත්තක් කරව’යි කීහ. ඒ මහතානෝ සිරගෙවල දොර හරවා ගියගිය තැන සිතූ සිතූ අපරාධයක් සාදා දෙන්ට බල ඇති සූර වීර යෝධයන් දම් බිඳුවා පිටත්කරවා ගෙණ ‘මට සේවයකරව’යි ප්‍රසාද දෙවා වඩු කඹුරු සොම්මර චිත්‍රකාරාදිවූ නො

* තුසෙසවංචිනෙතතානසස.

යෙක් කම්මාන්තයෙහි දක්‍ෂවූවන්ගෙන් අටළොස් කුලයක් හා වැපොරෝ උදලු යහුල් ආදිවූ උවමනා බොහෝ උපකරණ හා ගෙණ ගෙන්වාගෙණ මහ සේනාව පිරිවරා නික්මුණුසේක. බෝධිසත්ව යන්වහන්සේ නික්මුණු නියාව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක.

තතො ච පායාසි පුරෙ මහොසධො
පංචාලරාජස්ස පුරං සුරම්මං
නිවෙසනානි මාපෙතුං, වෙදෙහස්ස යසස්සිනො.

"එම්බා මහණෙනි ඒ මහෞෂධ පණ්ඩිතයෝ වේදේහ රජහට පලමු ගොස් නුවර හා ගෙවල් කරණ පිණිස බලවාහන ගෙණ නික්මුණෝවේද' යි වදාළසේක. බෝධිසත්වයන්වහන්සේ වඩනාසේක් සතර ගව්වෙන් සතරගව්වට එකි එකි ගමක් බැගින් ගම් කරවා ගමකට ඇමැත්තෙකු බැගින් සිටුවා මෙසේ විධාන කරණසේක් "නෙපි අපගේ රජ්ජුරුවන් පංචාලචණ්ඩි කුමාරිකාවන් ඇරගෙණ එනකල, ඇත් අස් රථ ආදිවූ වාහන සරහා කැටිව ආ දුබිල වාහන රඳවාගෙණ තොපගේ වාහනවලට නංවා සතුරන්ට අසුවිය නොදී වහා මියුලු නුවරට යවාලව"යි වදාළසේක.

මෙසේ මාර්ග සංවිධානයෙන් ගොස් ගංතෙරට පැමිණ ආනන්ද කුමාරයයි යන එකක්හු කැඳවා "නෙපි තුන්සියයක් පමණ නැව් වඩුවන් ඇරගෙණ * උඩු ගං බලා ගොස් හර ඇති දඬු කප්පවා තුන්සියයක් නැව් කරවා මාලිගා වාසල් දොරටු අට්ටාල ගෙවල් ආදිය කරවාගත්නාලෙස දරු සම්භාර ඔබදීම ලඝුකොට සස්වා නැව් තුන්සියය පුරාගෙණ එව"යි විධානකොට යවා තමන්වහන්සේ ගඟින් එතරව බැස පියවරසනින් ගණනසේක් "මේ දෙගව්වක් පමණ තැන මහ උමග වන්නේය, ඒ ඉක්බිති මෙතැන්හි අපගේ රජ්ජුරුවන් හිඳිනා නුවර වන්නේය, නැවත මෙතැන් පටන් රජගෙය දක්වා මේ ගව්වක් පමණ තැන සුලු උමග වන්නේය'යි ස්වකීය ප්‍රඥාවෙන්ම නියම දැන මහපෙරහරින් නුවරට වන්සේක.

බෝධිසත්වයන්වහන්සේ එන නියාව චූළනී බ්‍රහමදත්ත රජ්ජුරුවෝ අසා † මෙවිට මාගේ මනදොළ පිරෙන්නේය, ඒකාන්තයෙන්ම මාගේ සතුරන් පිටිදක්නෙමි, මහෞෂධයා ආකල වේදේහයාත් නොබෝ කලකින් එන්නේය; මෙවිට දෙන්නාම මරා ජයපානය බී, සියලු දඹදිව එකසත්කොට රජකරන්නෙමි 'යි ඔදවැඩි සතුටුව ගියහ. ජනනෙත්‍ර රසාංජනවූ ස්වාමි

---

* උඩගංගංගන්වා.

† ඉදානි මෙමනොරථොපූරිස්සති පච්චාමිත්තානංපිඨිං පස්සිස්සාමිති ඉමස්මිංපන ආගතෙවෙදෙහොපි ආගමිස්සති.

දරුවා තත් නුවරට වදුත්ම අයම්විතරින් අටසාළිස් ගව්වක් පමණ ඇති ඒසා මහත් නුවරවාසි මනුෂ්‍යයෝ එකහෙලා "මහෞෂධතයෝ නම් මූල, එක්සියයක් රජුන් හා අටළොස් අක්‍ෂෞහිණීයක් සේනාව, කැටක් දමා කපුටුරූසක් තෙරණාසේ, ඉස් ලූ ලූ අත අත ලුහුබඳවාපුවෝ නම් මේ මහතානෝද" යි බලා ඇස් ඇදගත තොහි මහා ආශ්චර්‍ය්‍යයට පැමිණියහ. සියලු නුවර එදවස් සඳරුස් වන් කිරිමුහුදක් සේ ක්‍ෂොභව ගියේය.

මෙසේ ඒ නුවරවාසීන් තමන්වහන්සේගේ රූපදර්ශනයෙන් සන්තොෂව බල බලා සිටියදීම රජගෙදරට ගොස් ආ නියාව කියා යවා 'එන්ට කියව'යි කීකල්හි රජගෙට වැද රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටිසේක. එවිට රජ්ජුරුවෝ මියුරු කථාකොට 'පුත රජ්ජුරුවෝ කවර ද එද්ද"යි කීහ. 'මා කියා යැවූකල ය'යි වදාළසේක. 'තෙපි පළමු කුමක් පිණිස අවිද්ද"යි කීහ. දේවයන්වහන්ස අපගේ රජ්ජුරුවන්ට මගුලට මාළිගා නංවන්ට ආමි'යි වදාළසේක. 'යහපතැ'යි කියා බොධිසත්ත්වයන්වහන්සේ හා කැටිව ආ සේනාවට බත් වියදම් දෙවා මහතානන්ට මහත් සත්කාරකොට ඉඳිනට යහපත් මාළිගාවක් දී 'පුත රජ්ජුරුවන් එනතෙක් උකටලි නොව අපටත් කළමනා දෙය කරවාලා සුව සේ ඉඳුව'යි කීහ. ඔබත් රජගෙට නැගෙණසේක්ම මතුමාලට නැගෙණ හිණි පාමුල සිට 'මෙතැන්හි සුලු උමග දොරකඩය'යි සිතූසේක. නැවත ඔබට මෙසේවූ අදහසකුත් වූයේය. "මේ රජ්ජුරුවෝ 'අපටත් කළමනා දෙය කරවාලව'යි තුමූම කීහ; එබැවින් උමග කණනකල මේ හිණ නොවැටෙන ලෙසක් කෙරෙමි" සිතා නැවත රජ්ජුරුවන්ට වදාරණසේක් "මහරජ මාළිගාවට නැගෙන් නෙම් හිනිපාමුල සිට මාළිගාවේ නවකර්මාන්ත බැලිමි, තෙපු මා දුටු නපුරෙක් නම් නැත, නැගෙන හිණ යම්තම් වරදෙක් ඇත, කැමතිසේක්නම් ඊට තරම් දඬුපත් ලදිම් නම් නිකම් වඩුවෙකු තබා විශ්වකර්මයාත් 'නපුරැ'යි නොකියන ලෙස කරවාලමි" වදාළසේක. 'යහපත තොප කැමතිලෙස කරවාලව'යි දූරුසම්භාර දෙවූහ. ඒ මහතානෝ 'උමග දොර මෙතන වියයුතුය'යි සිතා ඉඳුරා සලකාගෙණ පරණ හිණ හරවා, යම් තෙනක උමග දොර වේද, එතන පස් නොවැගිරෙණ පරිද්දෙන් පෝරු අතුරුවා තොහෙන පරිද්දෙන් නිශ්චලකොට හිණ සිටුවාලූසේක. රජ්ජුරුවෝ මේ අන්තරාය නොදන්නාහු තමා කෙරේ ඉතා සිතින්ම කෙරෙති'යි සිතූහ. ඒ පරණ හිණ ඔබ දුටු වරදනම් 'යටින් උමග බිඳිනකල හිණ ඉණිතම් නපුරැ'යි යන මෙපමණෙක්මය.

මෙසේ එදවස් නවකර්මාන්තයෙන් දවස් යවා දෙවන දවස් රජ්ජුරුවන්ට කියනසේක් "දේවයන්වහන්ස ඉඳින් එක් ත්‍රිලයක් ලදුමෝනම් අපගේ රජ්ජුරුවන් හිඳිනා පරිද්දෙන් යහපත්

කොට මාලිගා ආදිවූ ගෙවල් තංවාලත්නමෝ වේදැ"යි වදාළසේක. "යහපත පුත මාගේ මාලිගාව හැර මේ නුවරින් යම් ගෙයක් කැමැත්තෙහි නම් ඒ ගන්ව"යි කීහ. "මහරජ අපි ආගන්තුකයම්හ, ඔබවහන්සේගේ බොහෝ වල්ලභයෝය, ඔහු තමතමන්ගේ ගෙවල් ගන්නාකල අප හා කලහකරන්නාහ, උන්ට අපි කුමක් කරමුදැ"යි වදාළසේක. පණ්ඩිතයෙනි තෙපි උන්ගේ බස් නොගිවිස තොප කැමති ගෙයක්ම ගන්ව"යි කීහ. * "දෙවයන්වහන්ස ඔහු නැවත නැවතත් අවුත් ඔබවහන්සේට කියන්නාහුය. එයින් ඔබගේ සිතට සැපයෙක් නොවන්නේය. ඉදින් නුඹවහන්සේ කැමතිසේක්නම් අප ගෙය නිලකොට ගන්නාතෙක්ම අපගෙන් දොරකඩ රැකවල්විනම් කියන්ට ආවුන් වැද්ද නොදන්නා, පලායන්නාහ. එසේකල අපටත් නුඹවහන්සේගේ සිතටත් දොම්නසක් නැත්තේය"යි වදාළසේක. රජ්ජුරුවෝත් " ඉතා යහපත, තොපගෙන්ම රැකවල් ලවාගන්ව"යි කීහ. බෝධිසත්වයන්වහන්සේද සිණිඳුසය රජගෙයි දොරකඩය යන මේ හැමතන්හිම රජගෙට කාත් වැද්ද නොදෙවයි තමන්වහන්සේගෙන්ම රැකවල් ලැවූසේක. පළමුකොට ගොස් රජ්ජුරුවන්ගේ මැනියන් තලතාදේවීන්ගේ ගෙය බිඳුව "යි නියෝගකළසේක. ගියාවූ පුරුෂයෝ දොරටුයෙහි පටන් භිත්ති පදනම් ඇතුළුව උළුසුණු මැටි ආදිවූ දෙය බිඳ හරණට පටන්ගත්හ. රාජමාතාවෝ එ පවත් අසා වහ වහා ගෙන් අවුත් 'කොල ! අපගේ ගෙය බිඳුනෝ කවුරුදැ'යි කීහ. මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ ගෙය බිඳුවා තමන්වහන්සේගේ රජ්ජුරුවන්ට මාලිගා තංවනසේකැ ' යි කීහ. 'ඇයි දරුවෙනි, මේ ගෙයි හුන්කල කිම්දැ'යි කීහ. 'අපගේ රජ්ජුරුවන්ගේ බොහෝ සේනාව හෙයින් මේ ගෙය ඉතා කුඩාය, මහත්කොට මාලිගා කරවන්ටය'යි කීහ. එ බසට බිසව් කිපී "කොල ! තෙපි මා රජ්ජුරුවන්ගේ මැනියන් බව් නොදනුද ? දූත් මපුතනුවන්ට කියාලා තොපට කියටි දන්නෙම්වේදැ " යි කීහ. " නුඹවහන්සේ කුමක් දෙඩනසේක්ද ? අපි † රජ්ජුරුවන්ගේම බසින් බිඳුම්හ, ශක්ති ඇතිදැ විනම් නවතාගන්නැ"යි කීහ. තොපට කියටි ‡ දන්නෙම්'යි කිපී රජගෙට කියන්ට ගියහ. දොරකඩ සිටි රැකවල්හු 'නොවදුව'යි කියා නැවතූහ. "කුමක් කියව්ද ? මම රජ්ජුරුවන්ගේ මැනියෙමි, මට පෙර රැකවලෙක් නැත, මා යා දෙව" යි කීහ. " 'කාත් වැද්ද නොදෙව්'යි තොපගේ රජ්ජුරුවන් විසින්ම කියනලද, තෝ මෙතන නොසිට පලායා"යි කීහ.. බිසව් කිසිවක්

* දෙවපුනප්පුනතෙ ආගන්ත්වාතුම්හාකං කථෙස්සන්තිසචෙපන ඉච්ඡෙය්‍යාථ.

† මයංරඤ්ඤොවචනෙනෙවභින්දාපෙම. ‡ කත්තබ්බංජානිස්සාමීති-

කියන්ට නොපොහොසත්ව තමන්ගේ ගේ බිඳුනා බල බලා සිටියහ. එසේ සිටියවුන් එකෙක් නැගීසිට 'මෙතනින් යෙසිද නොයෙසිද්ද'යි බොටුව අල්වාගෙණ තරවා දමාලීය. ඒ මැහැලිවහන් සේ මුහුණින් ගිපියා දූකසේ නැගී සිට සිතන්දෑ "ඒකාන්තයෙන් රජ්ජුරුවන් කීයේ සැබෑ යැටිය, ඉන් මිසක් මට මෙසේ කරන්ට සමත් එකෙක් ඇද්ද, පණ්ඩිතයන් සමීපයට යෙමි" සිතා ගොස් "පුත මහෞෂධපණ්ඩිතයෙනි මාගේ ගෙය කුමක් නිසා බිඳුවාදූ"යි කීහ. ඔබ උන් හා කැටිව එකබසකුත් නොකියා නොඇසූ කන්ව ඒ දසාව නොබලාපියා සිටිසේක. ලඟ සිටි පුරුෂයෝ 'දේවින්දෑ කියන්නේ කිම්දූ'යි කීහ. 'දරුවෙනි පණ්ඩිතයෝ මාගේ ගෙය කුමට බිදුවද්දෑ'යි කීහ. 'වේදේහ රජ්ජුරුවන්ට මාලිගා කරවන්ටය'යි කීහ. "ඇයි දරුවෙනි මෙසා නුවර අනික් ගෙයක් නොලැබෙයි සිතවද ? මාගේ මේ මසු ලක්‍ෂය ගෙණ අනික් තැනකින් ගෙයක් ගෙණ මාලිගා කරව " යි කීහ. "ඒ වන්නා නුඹගේ මේ ලක්‍ෂය ඇරගෙණ ගෙය අරවාපියම්හ, මේ නුවර අපොහොසත් කෙනෙකුන් මදවුව, එසේහෙයින් අනික් නෙයක් අල්වාගත් කල උයින් අත්ලස් දෙන්නටම සිතති, එසේකල ගත් ගත් ගෙවල් අත්ලසටම අරණකල අප නෙවල් ලබන්නේත් මාලිගා තගන්නේත් කෙසේද ? වන්නාටය, නුඹවහන්සේ මෙසේම අඬාදෙඩා යාවක්‍ෂුකරත්. අත්ලස් දී ගෙය අරවාගත් නියාව ඔබ්බට නොකියතොත් හැරපියම්හ"යි කීහ. "දරුවෙනි කුමක් කියවද? රජ්ජුරුවන් මැනියෝ පවා අත්ලස් දී ගෙය හරවාගත්හ'යි කීකල මටත් ලැජ්ජාවන්නේය; එබැවින් මා පණ තබා කාටත් නොකියන්නෙමි * කීහ. ඔහු යහපතැ'යි බිසවුන් දුන් මසු ලක්‍ෂය ඇරගෙණ ගෙය බිසවුන්ටම අළුහ ~~~ වැලිත් ඒ මසුරන් ලක්‍ෂය නම් දූන් මේ සමයෙහිදු තඹ ආදි පස්ලොයින් ගැසූ රනෙක් නොවන්නේය. ඒ රනට 'නිලකහීපණ' යයි කියති. ඉන් සතර අකෙක් මාඪරත්රන්ය, සතර අකෙක් පස්ලෝය, එබැවින් ඒ බිසවුන් දුන් මසුරන් ලක්‍ෂයෙන් පණස්දාසෙක් 'මාඪරත්රනැ'යි දතයුතු.

ඒ ගෙය හැර එතනින් ගොස් කෝවට්ටයාගේ ගෙයි බාගෙණ පළමු පරිද්දෙන් දෙරටුසෙහි පටන් බිඳිනට වන්හ. ඒ බමුණු පැනනැගී "ගොවියාපුත් තමාගේ නුවරදී එක්සියයක් රජදරුවන් හා සේනාව බල බලා සිටියදී තමාට සතුරුව ගිය මෙතෙක් දෙනාගෙන් මාගේම බොටුව අල්වාගෙණ බිම උලා නලළී මූණ ආදිවූ තැන් ලේකැන් ලේමඩුලු කොටපියා දූන් කබරව ද ගියාසේ ලජ්ජාවට පමුණුවාපීය, නැවත විවාමගුල කියා ගියාවූ මා තමාගේ ගෙයිදී තනිකොට ගෙණ තමාගේ බලසම්පන්න පුරුෂයන් ලවා උණපත්තෙන් මරවා පිටිකර ගස්වා එසේත් මා නොමී නියා

* නකඛසච්කථෙස්සාමි.

වත් කොටපිය. ඒ මදින්ද්‍ර දූත් මීට අවුත් මේසා නුවරින් මාගේ ගෙය බිඳුවා මා උන් තෙනින් නෙරණමාන කෙරෙයි, වන්නාටය උගේ රජු නාවන් දෙන්නාටම කළමනා දෙය මූට කරවම්” යි තරව කිපී රජහට කියන්නට රජගෙයි දෙරට ගියේය; රුක වල සිටියාහු ‘බමුණුමාල්ලා මැත නේයි’ කියව කියවා තමා වලලහකමට දෙරකඩට ගියෝය. රුකවලුන් ‘කොල නිකෘෂ්ට ගුණඇති දුෂ්ටවූ බමුණු මැත නේයි කියව කියවා එයිදූ’යි එකෙක් නැගී සිට ගසන්නේ තමා පසහිල්ල බමුණා පිටිකර පෙණෙන පරිද්දෙන් ගසා ගඩු නගාපිය. ඒ පාර ලදින් තුෂ්ණීම්භූතව ඉංගිකරුව කකිය කකියා, අනික් උත්තරයක් කියන්නට අසමර්‍ථව ගත යුත්තක් නොදන්නේ මසු ලක්‍ෂයක් දී ගෙය අරවාගත. මේ උපායෙන් එදවස් සවස්වන දැතුරේ සියලු නුවර ගෙවල් බිඳුවා නැවත හරණට ගත් අත්ලස් රන් එක්කොට නව කෝටියෙක් වන්නේය. ඒ නවකෝටියෙන් සෘාරකෝටි පණස්ලක්‍ෂයක් මාඪර නැයි දතයුතු.

නැවත බෝධිසත්ත්වයන්වහන්සේ නුවර මුළුල්ලෙහි ඇවිද රජගෙට වැඩිසේක. රජ්ජුරුවෝ ‘පණ්ඩිතයෙනි වසන තෙනක් ලදුදූ’යි විචාළහ. ‘මහරජ නොදෙන කෙනෙක් නම් නැත, එසේ වුවත් බොහෝ දවසක් වැදහුන් ගෙවල් ගන්නාකල මහත් දෙම්නසින් කම්පිතවන්නාහ, උන් උන්ට ප්‍රිය විප්‍රයෝග කිරීම * අපට තරම් නොවෙයි, මේ නුවරින් පිටත † ගංගාවටත් නුවරටත් මැද ගව්වක් පමණ මෙනම් තෙන බිම අවකාශයෙක් ඇත, එතන අපගේ රජ්ජුරුවන්ට ගෙවල් මාලිගා නගම්හ’යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු “ ඇතුළු නුවරදී සටන්කරණ කල සතුරන් දතනොහැක්ක’ පිටතදී විතම් වටලාගෙණ සුවසේ සතුරන් මරා ජයගතහැක්කැ”යි සිතා සොම්නස්ව ‘යහපත පුත තොප සැලකූ තෙනම තිලකරව’යි කිහ. මහරජ අපි වන්නා ඒ සියල්ල කරම්හ. නුඹවහන්සේගේ මිනිසුන් ඒ දසාවට දරපලාදි යම් කිසිවක් පිණිස අපගේ නවකර්‍මාන්ත භූමියට නොයායුතුය, ගිය කෙනෙක් යම්සේ කලහයක් කෙරෙත්මය, එවේලෙනි නුඹවහන්සේගේ ‡ හා අපගේ සිතට සැපයෙක් නැත්තේය’යි වදාළසේක. ‘යහපත පුත මැතින් ඒ දසාවට යන මිනිසුන්ගේ ගමන් නවතාලම්”යි කීහ. දේවයන්වහන්සඅපගේ ඇත්තු දිය කෙළියට රුස්වන්නාහ, එක්වන් දියෙහිව කෙළිනාහ. § පැන් මඩවූකල ‘මහෞෂධපණ්ඩිතයන් ආවක් පටන් පහන් පැනක් බිපියන්ටත් නොලබම්හ’යි නුවරවාසි කිපෙත්නම් එයින් ඉවසුව මැනවැ”යි වදාළසේක. ‘පුත තොපගේ ඇත්තු සුවසේ හිම් නිවා

* අම්හාකම්පිඅයුත්තං † ගංගායචනගරස්සච අන්තරෙ.

‡ තුම්හාකම්පිඅම්හාකම්පි. § උදකෙ ආවිලෙජාතෙ.

දියකෙළිත්ව'යි කියා * නැවත රජ්ජුරුවෝ "මහෞෂධයන්ගේ නවකර්මාන්ත භූමියට මේ නුවරින් යම් කෙනෙක් ගියාහු නම් දහසක් දඬය"යි නුවර බෙර ලැවූහ.

**බෝධිසත්ත්වයන්වහන්සේ** රජහු වැඳ තමන්වහන්සේගේ පිරිවර හා සමග නුවරින් නික්ම තමන් විසින් නියමකරගත් තැන නුවර කරවන පිණිස ගොසින් ගඞින් එතර **'ගහුල්ගමුවය'යි** ගමක් කරවා ඇත් අශ්ව රථ ආදිවූ වාහනද ගෙරිසරක්ද එහි රඳවා නුවර කර්මාන්තයට විධානකරණසේක් 'මෙතෙක් දෙන මේ මේ කරව, මෙතෙක්දෙන මේ මේ කරව'යි කර්මාන්ත බෙදා උමග කර්මාන්තයට පටන්ගත්සේක. **මහඋමඟ** දෙරකඩ ගංගායෙහි අසවිය. බලසම්පන්න † සැටදහසක් පමණ යෝධයෝ මහඋමග කණින්නාහ, මහත්වූ සම්පයිවලින් පස් පුරාගෙණ ගඟ දියෙහි ලත්නාහ, ලූ ලූ පස් මුළුල්ල ඇත්තු මඩනාහ, එබැවින් ගඟ පැන් කැළඹී මඩවන්නේය. නුවර වාසීහු ‡ 'මහෞෂධ පණ්ඩිතයන් ආවක් පටන් පහන් පැනක් බීපියන්ටත් නොලබම්හ. ගඟ පැන් කැලඹී මඩවන්නේය, 'මීට කාරණා කිම්දැ'යි කියන්නාහ. § ඔවුන්ට මහතානන්ගේ චරයෝ "මහෞෂධ පණ්ඩිතයන්ගේ ඇත්තු දිය කෙළනාහ, ඉන් ගඟ පැන් මඩ වන්නේය, මැඩ මැඩ මඩ මතු කරන්නාහ'යි කියති, එබැවින් සැක නොකරන්නාහ.

බෝධිසත්ත්වයන්ගේ අභිප්‍රාය නම් සිඩවන්නේය. එසේ හෙයින් ඒ උමග ගලෙක්වත් මුලෙක්වත් නැතිව බිම ගිලී අනන්තඝන විය. සුලු උමග දෙරකඩ **උපකාරිනුවර** වූයේය. සත්සියයක් පමණ යෝධයෝ ඒ උමග කණින්නාහ. සම්පයිවලින් පස් ගෙණවුත් නුවර ලත්නාහ. ලූ ලූ පස් පැනින් මිරිකා අත්‍රා පවුරු බඳනාහ. ගෙවල් මැටි ආදි කම්මාන්ත හෝ කරන්නාහ. මහ උමගට වදනා දෙරකඩ එම නුවර වූයේය. අටළොස් රියන් උසඇති යන්ත්‍රයෙන් යුක්ත දෙරවලින් ගැවසීගත්තේය, ඒ දෙරවල් මුළුල්ල එක ඇණක් මිරිකාලන්නා සියලු දෙරවල් පිහියන්නේය, අනික් ඇණක් මිරිකාලන්නා ඇරීයන්නේය. ඒ උමග දෙපාර්ශ්වයෙහි උළින් බඳවා සුණුකර්මාන්ත කරවූසේක, මුදුනේ වියන්පෝරු අතුරුවා සකලා ගාවා මකුලෙන් අතිධවල කරවූසේක, ඒ මහ උමග අසූ මහදෙරක් හා සූසැටක් සුලුදෙර වූයේය. ඒ මුළුල්ල යන්ත්‍රයෙන් යුක්තවූයේය. ඒ උමග දෙපාර්ශ්වයෙහි නොයෙක්

---

* තුම්හාකං හත්ථිකීළනතුතිවත්වා † සට්ඨිමත්තානි යොධසතානි.

‡ නගරවාසිනො මහොසධස්ස ආගතකාලතොපට්ඨාය පසන්නං උදකං පාතුං නලභාම. ගංගා ආලූලාවවහති. කිනනුඛො එතනති වදන්ති. § අථනෙසං පණ්ඩිතස්ස. උපනික්ඛිතපුරිසා ආරොචෙන්ති.

සියදහස් ගණන් පාත්ගබඩාත් වූයේය. එයින් යන්ත්‍රයෙන් යුක්ත අගුලුම වූයේය. තවද ඒ උමග දෙපාර්ශ්වයෙහි එක්සියයක් රජ දරුවන්ට * එක්සියයක් ශ්‍රීයහන්ගබඩාත් වූයේය. එයින් යන්ත්‍රයෙන් යුක්ත අගුලුම වූයේය. එකී එකී ගබඩායෙක්හි නොයෙක් පැයෙන් යුක්තවූ කොඳුපලස් ආදියෙන් අතුට සරහා තබනලද සැතපෙන මහයානකුත් ඇත්තේය. නංගණලද ධවලච්ඡත්‍ර ඇති එසේම සරහනලද එකී එකී සිංහාසනයකුත් ඇත්තේය — ශ්‍රීයහන් ගබඩාවල මහ යහන් ලඟ උතුම්වූ රූ ඇති දිව්‍යාප්සරාවන් බඳු සර්වාභරණයෙන් සරහා සිටුවානලද පෙනැලි රූත් වත්තේය. නොදත්තවුන් අතින් පිරිමැද මුත් ‘අජීවය’යි නොදතහැක්කේය තවද ඒ උමග දෙපාර්ශ්වයෙහි දක්ෂවූ චිත්‍රකාරයන් ලවා අති මනොහරවූ සිත්තම් කරවනලද්දේය, ඒ සිත්තම් කවරේද යත්? ශක්‍රවිලාසය, මහමේරු පර්වතය, සතරමහා සමුද්‍රය, සතර මහද්වීපය,† හිමාලයපර්වතය, අනවතප්තවිලය, සිරියෙල් අතලය, චන්ද්‍රබිම්බය සූර්ය්‍යබිම්බය, චාතුර්මහාරාජිකාදි කාමාවචර දිව්‍යලෝකය, ෂොඩශ බ්‍රහ්මලොකය, යනාදි ලොව විද්‍යමාන ආශ්චර්ය්‍යමත් දෙයත් උමග සිත්තම් කරවාලූසේක. ‡ එහි බිම රිදී පටක් හා සමානවූ සුදු වැලි ඉස්වා ඒ උඩුවියන නවු උඩ බලා කෙමි බිම බලා එල්වනලද සුපුෂ්පිතවූ පද්මවනයක් පරිද්දෙන් අඳවාලූසේක. උමග දෙපාර්ශ්වයෙහි නොයෙක් බඩු පුරා තිබෙන සල්පිලින් සැදවූසේක. ඒ උමග ඒ ඒ ස්ථානයෙහි ගන්ධදාම පුෂ්පදාමයන් එල්වූසේක. ඒ උමග සුධර්මා නම් දිව්‍යසභාව § සේ ඉතා අලඞ්කාරවිය.

පළමු යවූ **ආනන්ද නම්** අමාත්‍යයා තුන්සියයක් වඩුවන් ලවා සැස නිමවනලද දරුසම්භාර නැව් තුන්සීයක් පුරා ගඟින් ගෙණවුත් බෝධිසත්වයන්වහන්සේට කීය — බෝධිසත්වයන්වහන්සේ දඹුපත් නුවරට බාගෙණ ‘තෙල නැව් සඟවා තබා මා කී යම් දවසක ගෙණෙව’යි නික්මෙණ තොට උඩුගඟින් නුදුරු තැනෙක්හි සඟවා තැබ්බවූසේක — නැවත ඒ නුවර ‘පැන් අගලය කලල් අගලය වියලි අගලය’යි අගල තුනකුත් කැණවූසේක. තවද ඒ නුවරට අටළොස් රියන් උස පවුරද පවුරට තරම් පදනමද වාසල් අට්ටාල බලකොටු කුරුබිලි ආදියද රජගෙය ආදිවූ නොයෙක් ගෙවල් සමූහද ඇත්හල් අස්හල් පැන් පොකුණු ආදියද යන මේ සියල්ල නිමාවට පැමිණියේය. **සුළු උමඟය, මහ උමඟය,** ඒසා මහත් බිම පිස කරවූ නුවරය යන මේ සියල්ල සාර මසකින් නිමවා ඉක්බිති බෝධිසත්වයන්වහන්සේ රජ්ජුරුවන් කැඳවා දූතයන් යැවූසේක. ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක.

---

* එකසතසයනගබ්භා අහෙසුං. † චතුමහාදීපහිමවන්ත.

‡ භූමිංරජතපට්ටවණ්ණ වාලුකංඔකිරිත්වා. § සුධම්මදෙවසභංවිය.

නිවෙසනානි මාපෙත්වා, වෙදෙහස්ස යසස්සිනො,
අථස්ස පහිණි දූතං,
එහි දානි මහාරාජ මාපිතං තෙ නිවෙසනං.

“එම්බා මහණෙනි මහෞෂධ පණ්ඩිතයෝ වේදේහ රජහට පළමුව ගොස් නුවර උමං රජගෙවල් ආදිය කරවා සාරමසකින් නිෂ්ඨාකොට වේදේහරජු කැඳවා දූතයන් යැවූහයි” වදාළසේක.

පෙරමග බලබලා උන්නාසේ රජ්ජුරුවෝ දූතයාගේ බස් අසමින්ම සේනාව පිරිවරා නික්මුණාහ. ඒ බව ප්‍රකාශකොට වදරණ බුදුරජානන්වහන්සේ මේ ගාථාවෙන් වදරණසේක.

තතො ච රාජා පායාසි, සෙනාය චතුරංගියා,
අනන්තවාහනං දට්ඨුං, ඵිතං කම්පිල්ලියං පුරං.

“එම්බා මහණෙනි අටළොස් අක්ෂෞහිණී සඞ්ඛ්‍යාත ඒසා මහත් සතුරු සේනාවක් හා එක්සියයක් රජුන් හුන්නාවූ උත්තර පංචාලදේශයෙහි කම්පිල්ල නුවරට කාමයෙහි ගිජුවූ නුවණින් අන්ධවූ ඒ වේදේහරජ මෝහයෙන් මූඪවූයේ අර්ථානර්ථ දෙක ඉදුරා සලකාගතනොහී, චතුරංගිනී සේනාව පිරිවරා නික්මුණේ වේද”යි වදාළසේක — ඉක්බිති රජ්ජුරුවෝ සාරසියයක් ගව්ගෙවා ගොස් ගංතෙරට පැමිණියහ. බෝධිසත්වයන්වහන්සේ රජ්ජුරුවන්ට පෙර ගමන්කොට කැඳවා අවුත් තමන්වහන්සේ කරවූ නුවරට ගෙණ ගියසේක. රජ්ජුරුවෝ මාලිගාවට නැගී අග්‍රවූ භෝජනය අනුභවකොට මදක් සැතපී පස්වරුවේලේ තමන් ආ නියාව චූලනී රජ්ජුරුවන්ට කියා දූතයන් යැවූහ. ඒ බව වදරණ බුදුරජානන්වහන්සේ මේ ගාථාදෙකින් වදරණසේක.

තතො ච ඛො සො ගන්ත්වාන, බ්‍රහ්මදත්තස්ස පාහිණි
ආගතොස්මි මහාරාජ, තව පාදානි වන්දිතුං.
දදාහි දානි මෙ භරියං, නාරිං සබ්බඞ්ගසොභිනිං,
සුවණ්ණෙන පටිච්ඡන්නං, දාසීගණ පුරක්ඛතං.

“එම්බා මහණෙනි වේදේහරජ බ්‍රහ්මදත්තරජහට කියා යවත්තේ ‘මහරජ නුඹවහන්සේගේ ශ්‍රීපාදය වඳනා පිණිස ආමි, සර්වාභරණයෙන් සරහනලද ශරීරශොභා ඇති දාසි දස් සමූහයා විසින් පිරිවරණලද නුඹවහන්සේගේ දියනියන් මට බිරින්දකොට වහා එව්වමැනවැ’යි කියා යැවීය”යි වදාළසේක — අශ්වත් කෙරේ ලෝභයෙන් ‘වඳිමි’ කී බවමුත් වේදේහ රජ්ජුරුවෝ ඉතා වැඩිමහල්ලහ, චූලනී රජ්ජුරුවෝ වූකල් මුනුබුරු තරමටත් ඇත්තාහ. දූන් රක්ෂාකරණකල කෙසේ මහලු උවත් කෙසේ පොහොසත් ලුවත් වැන්දමනා හෙයින් එසේ තමාන් සිත්ගෙණ කුමාරිකාව ලැබ ගනිම් නම් යහපතැයි සිතා වැඳයැවූහයි දතයුතු.

වේදේහ රජ්ජුරුවන්ගෙන් ගිය දූතයන්ගේ බස් අසා චූලනී රජ්ජුරුවෝ මහ සොම්නසට පැමිණ 'මෙවිට මාගේ සතුරා කොයි යේද ? සෙට දෙන්නාගේ ඉස් කපාපියා පයින් මැඩගෙණ හිඳ ජයපානය බොන්නෙමි, සිතින් ක්‍රෝධ උපදවා බසින් දූතයන්ට සතුටු හඟවා උන්ට ප්‍රසාද දී නැවත කියා යවන්නාහු මේ ගාථාවෙන් කීහ.

සවාගතං තව වෙදෙහ, අතොතෙ අදූරාගතං;
නක්ඛත්තඤ්ඤෙව පරිපුච්ඡ, අහං කඤ්ඤං දදාමි තෙ,
සුවණ්ණෙන පටිච්ඡන්නං, දාසීගණ පුරක්ඛතං.

මේ ගාථායෙහි අභිප්‍රාය නම්" වේදේහ රජ්ජුරුවෙනි තමන් මිට ආ ගමන නපුරු ගමනෙක් නොවෙයි; ඉතා යහපත් ගමනෙක; තොප විසින් විවාලමනා මගුලට යොග්‍ය නක්ෂත්‍රයක්මය, සවර්ණාලඞ්කාරයෙන් සරහා නිමවනලද හොබනා අවයව ඇති මාගේ දුවනියන් දාසිදස් සමූහයා විසින් පිරිවරණලදුව තොපට පාවාදෙමි" කියා යැවූහ. ඒ දූතයෝ ගොස් වේදේහ රජ්ජුරුවන්ට දෙවයන්වහන්ස ඔබින් බාධා නැත, මගුලට හදාළ නකත් වහා විචාළමැනව, රජ්ජුරුවෝ දුවනියන් පාවාදෙන්නාහ"යි කීහ. "ඉක්බිති රජ 'අදම නකත් යහපතැ'යි දූතයා අත කියා යැවීය"යි වදාරණ බුදුරජාණන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක.

තතො ච රාජා වෙදෙහො, නක්ඛත්තං පරිපුච්ඡථ,
නක්ඛත්තං පරිපුච්ඡිත්වා, බ්‍රහ්මදත්තස්ස පාහිණි.
දද හි දානි මේ භරියං, නාරිං සබ්බඞ්ගසොභිනිං
සුවණ්ණෙන පටිච්ඡන්නං, දාසීගණ පුරක්ඛතං.

මහණෙනි ඒ ඉක්මන් රජ අද නකත් යහපත; සියලු ස්ත්‍රී ලක්ෂණයෙන් ශොභනවූ දුවනියන් පරිවාර සහිතව වහා එවව මැනවැ'යි කියා යැවීය"යි වදාළසේක.

**බ්‍රහ්මදත්තරජ** නැවත කියා යවන්නේ 'සියලු බිසෝ පළඳනාවෙන් හොබනාවූ මාගේ දියනියන් සියලු පිරිවර හා සමග මහපෙරහරින් දැන්ම එවමි, * දැන්ම එවමි"යි බොරු කියා ආ දූතයන් යවා, එක්සියයක් රජදරුවන්ට කියා යවන්නේ 'එදවස් මියුලුනුවරට ගියාසේ අටළොස් අක්ෂෞහිණී මහා සේනාව හා පංචායුධ සන්නාඬව උපකාරී නුවර බලා නික්මෙන්ට කියව, සතුරන් දෙන්නා ඉස් කපා සෙට ජයපානය † බොන්නෙමුයයි කීය. ඒ සියල්ලෝම රජහු කී පරිද්දෙන් චතුරංගිනී සේනාව ගෙන නික්මුණාහුය. රජහු තුමූත් නික්මෙන්නාහු ‡ මැනියන් තලතා

* ඉදානිපෙසෙමි ඉදානිපෙසෙමීති. † ජයපානංපිවිස්සාමාති
‡ තෙසබ්බෙපිනික්ඛමිංසු. සයංනික්ඛමනෙතාපන.

දේවීන්ද අගමෙහෙසුන් නන්දාදේවීන්ද පුතනුවන් පංචාලචණ්ඩ කුමාරයන්ද දුවනියන් පංචාල චණ්ඩී කුමාරිකාවන්ද යන මේ සතරදෙනා මාලිගාවේ දෙවෙනි මාලේ රඳවා සුරක්ෂිතකොට රැකවල් ලවා උපකාරී නුවරට ගියහ.

බෝධිසත්ත්වයන්වහන්සේ වේදේහරජ්ජුරුවන්ට හා කැටිව ආ මහ සේනාවටත් බොහෝවූ සතකාර කළසේක. ඉන් සමහර කෙනෙක් රා බොන්නාහ, සමහර කෙනෙක් මච්ඡමාංස කන්නාහ, සමහර කෙනෙක් ඉක්මන්ව එන රජ්ජුරුවන් හා කැටිව නොසැතපී දිවදිව ආ හෙයින් ශ්‍රාන්තව නිදන්නාහ — වේදේහ රජ්ජුරුවෝ සේනකාදි පණ්ඩිතවරුන් හා අමාත්‍ය මණ්ඩලයා පිරිවරා සරහනලද මාලිගාවේ මතුමහලේ ශ්‍රියහන් මුදුනෙහි මිහිරි කථා කෙරෙමින් උන්නාහ.

ඉක්බිති චූලනී රජ්ජුරුවෝද එක්සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණී සඞ්ඛ්‍යාත සේනාව ගෙණවුත් එදවස් මියුලු නුවර වටලූවා සේ තුන්සක්ෂියකින් හා සතර වලල්ලකින් කිසිතෙනකිනුත් සිදුරක් නොපෑ වටලාගත්තාහ. විලක්කු සියදහස් ගණනින් යුක්තව අරුණු නොනැගෙණ තෙක්ම නාල්ලම්හ'යි සනිටුහන්කොට සිටගත්හ.

අභිමතාර්ථසාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ ස්වාමිදරුවූ ශ්‍රීමහා බෝධිසත්ත්වයන්වහන්සේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ආ බව දැන සහජාත යෝධයන් තුන්සියයක් දෙනා තෝරාගෙණ "තෙපි හැම **සුළු උමඟින්** ගොස් බ්‍රහ්මදත්තරජ්ජුරුවන්ගේ මෑනියන්ද අගමෙහෙසුන් බිසවුන්ද දරුවන් දෙන්නාද යන මේ සතරදෙනා මාලිගාවෙන් බාගෙණ එම උමගින් ගෙණවිත් **මහඋමඟට** බාලා ඉන් ගෙණගොස් උමගින් පිටත්නොකොට පියා **ඇතුළු උමඟම** රඳවාගෙණ අප එනතෙක් මහ විසල් මලුවේ සිටුව"යි වදාළසේක. යෝධයෝ මහතානන්ගේ බස් මුදුනෙන් පිළිගෙණ සුළු උමගින් ගොස් හිණිපාමුල අතුළු පෝරුවේ යට පිට තිලකර දොර අගුළු හැර උඩට නැගී හිණිපාමුලය හිණිඉසය මාලිගාවේ ඒ ඒ ස්ථානය යන මෙතෙක් තැන්හි * රැකවල සිටියවුන්ද, පිරිවරා සිටි කුරුන් කුදුන් ආදීන්ද අල්වාගෙණ දැත් දෙපා එක්කොට තරවා බැඳ බැණ නොනැගෙණ පරිද්දෙන් කට කඩරෙදි ගන්වා මුවාව තිබෙන්නාවූ ඒ ඒ ස්ථානයෙහි කොකුවල එල්වා රාජභෝජනයට සකස්කොට සපයා තුබූ නොයෙක් වර්ගයේ අනර්ඝවූ කැවුම් ජාති තාක්මුළුල්ල සමහරක් අනුභවකොට පියා සමහරක් සුණුවිසුණුකොටපියා මාලිගාවේ මතුමාලට නැංගාහ — එදවස් තලතා දේවී යෙහෙලනියන් හා මුනුබුරන් දෙන්නා හා සතරදෙන එක

---

* එත්තකෙඨානෙ.

යහනට නැගී ඔවුනොවුන් වැලඳගෙණ 'සටන් නම් චපල දෙයක, කවුරු දනිද්ද ? ජය පරජය නම් කාටවෙන්නේද්දැයි * සිතිය හැකිද්ද'යි සිත සිතා වැදහොත්තාහ.

එවේලෙහි යෝධයෝ ඔවුන් උන් ගබඩාවෙහි දොරකඩ සිට බැණවූහ. එබස් අසා නලතාදේවී යහනින් නැගීසිට 'කිමෙක්ද දරුවෙනි'යි කියමින් දොරකඩට ආහ. යෝධයෝ ඔවුන්ට කියන්නාහු "දේවීන්වහන්ස අපගේ රජ්ජුරුවන්වහන්සේ වෛදේහ රජුත් මහෞෂධ පණ්ඩිතයාත් අල්වාගෙණ මරාපියා සියලු දඹදිව රාජ්‍යය එක්සත්කොට එක්සියයක් රජුන් පිරිවරා මහපෙරහරින් ජයපානය බොන්නාහු ඒ මගුලට තුඹ සතරදෙනාත් කැඳවා † යන පිණිස අප එවූහ; වැඩිය මැනවැ"යි කීහ. එබස් අසමින් අතිශයින් සතුටුවූවාහු දොර ඇර සතරදෙනා මාලිගාවෙන් බැස හිණිපාමුලට ගියාහ. යෝධයෝ ඔවුන් ඇරගෙණ සුළුඋමගට ‡ වන්හ. එවිට රජදරුවෝ කියන්නාහු "අපි මෙතෙක්කල් මෙහි වසන්නමෝ එක දවසකුත් මේ වීථියට නොබට විරැම්හ. මේ විථිය කිනම්ද්ද'යි කිහ. එබසට යෝධයෝ කියන්නාහු 'කුමක් කියන්නේද ? මේ වීථියට ඇමදුම බට නොහැක්ක, මේ මංගල වීථිනම, අද ජයපානය බොන දවස් මගුල් හෙයින් රජ්ජුරුවෝ තුඹ සතරදෙනා § මේ මගින් කැඳවා එවූහ'යි කීහ. එබස සැබවැ'යි ගිවිස උමග විස්තර බලමින් කෙළිමින් සෙමින් සන්තොෂයෙන් යන්නාහ. යෝධයන්ගෙන් සමහර කෙනෙක් රඳා නැවත රජගෙට ගොස් රුවන් ගබඩාවල දොරවල් ඇන බිඳපියා තම තමන් ගෙණ යන පමණ සාරවූ අනඝීවූ රුවන් පොදි බැඳගෙණ උමගට බැස දොර අගුලු ගෙණ පැලහ.

රජදරුවන් සතරදෙනා පළමු ගෙණයන යෝධයෝ දිව්‍යපුරයක් මෙන් සරහනලද මහ උමගට බාගෙණ නමාගත්හ. ඔහු සතරදෙන සිහිනෙනුත් නුදුටුවිරූ ඒ විස්තර බලා රජ්ජුරුවන්ට මගුලටම කළහ'යි සිතූහ. යෝධයෝ උන් සතරදෙනා උමගින් පිටත්නොකොට ඇතුළු උමග සරහනලද එක් ශ්‍රීයහන් ගබඩාවෙක ඉඳුවා සමහර කෙනෙකුන් රැකවල සිටුවා සමහර කෙනෙක් උන් ගෙණාබව බෝධිසත්ත්වයන්වහන්සේට ගොසින් කීහ. උන්ගේ බස් අසා ජනානන්දකරවූ මාගේ ස්වාමිදරුවානෝ 'මෙවිට මාගේ මනදෙළ මුදුන්පත්වීය'යි ඔදවැඩී සතුටුව රජ්ජුරුවන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිටිසේක.

රජ්ජුරුවෝ කෙලශයන් විසින් මඩනාලද අදහස් ඇතිව උන් බැවින් 'දුවතියන් දූත් එවති දූත් එවති සිත සිතා උන්නාහු

---

* කිංහවිස්සතීති. † තුම්හෙචත්තාරොපි ගහෙත්වා ආනෙතුං අම්හෙපහිණීති. ‡ ජඞ්ඝුම්මග්ගං පවිසිංසු.
§ ඉමිනාමග්ගෙන ආනෙතුං.

වහා හුනස්නෙන් නැගී සිව්මැදුරු කවුළුව හැර පවුරෙන් පිටත බලන්නාහු දිලිහෙන්නාවූ විලක්කු සියදහස් ගණනින් යුක්තවූ අනන්තාපරිමාණ චතුරංගිනි සේනාව නුවර වටලා සිටියවුන් දැක ලය ඉපිල අතිශයින් සැකව, සේනකාදි ප්‍රඥාසම්පන්න පණ්ඩිතවරුන් හා සමග මන්ත්‍රණයකරන්නාහු "ඇත් අස් රථ ආදිවූ සන්නාහ සන්නද්ධවූ 'ගනුව මරව කොටව' යනාදි යුද්ධයෙහි කිව මනා බස් බණන්නාවූ සේනාවය, ශරදාකාශයෙහි තාරකාවන් පරිද්දෙන් බබලන්නාවූ 'විලක්කු ආලෝකයෙන් මේ නුවර හිරු නැගි කලක්මෙන් අතිශයින් බබලා ගියේය. චූළනීරජ්ජුරුවෝ මරසෙනගක් පරිද්දෙන් මේසා සේනාවක් ගෙණාවාහු අප කෙරේ සතුටින් අවුද? නොහොත් රැහැණිව අවුද? පණ්ඩිතවරුනි මේ කුමකැ'යි සිතද්ද"යි මේ ගාථාවෙන් කීහ.

හත්ථී අස්සා රථා පත්ති, සෙනා තිට්ඨන්ති වම්මිතා,
උක්කා පදිත්තා ඣායන්ති, කිං නු මඤ්ඤන්ති පණ්ඩිතා.

ඒ අසා සේනක පණ්ඩිතයන්දැ "මහරජ නොසිතා වදාළ මැනව. බොහෝ විලක්කු ආලෝක පෙණෙයි; නැකත් වේලා නොවරදවා සරණදෙන පරිද්දෙන් දුවනියන්ගැර ගෙණ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ආහ' යි තිතමි" යි කීහ — නැවත පුක්කුසයා කියන්නේ "මහරජ නුඹවහන්සේට සත්කාර පිණිස තොරට ආ හෙයින් රැකවල් ගෙණ සිටිනා නියාය" යි කිය — ඒ අඥාන පණ්ඩිතයෝ සතරදෙන යමක් සිතුවෝ වී නම් නත්දෙඩන්නවුන් මෙන් කටට ආවාක්ම කීහ.

වෛදේහ රජ්ජුරුවෝද "මේ මේ ස්ථානයේ මෙතෙක් මෙතෙක් සේනාව බැගින් සිටිත්වා, මේ ස්ථානයෙහි සුරක්ෂිතකොට රැකවල් ගනුව, පමානොවව, නොනිදව" යනාදි කියන්නාවූ බස්ද අසමින් සන්නාහ සන්නද්ධව යුද්ධයට සැරහී සිටින්නාවුන්ද දැක, මරණභයින් තැතිගෙණ බෝධිසත්ත්වයන්වහන්සේගේ බසක් ප්‍රාර්ථනා කරන්නාහු මෙසේ කියන්නාහ. "ඇත් අස් රථ පදික අනන්තා පරිමාණවූ චතුරංගිනී සෙනාව සන්නාහ සන්නද්ධව සිටිනීය. අනන්තවූ විලක්කු ආලෝකය, මහෞෂධ පණ්ඩිතයෙනි තෙපි 'මේ කිමෙකැ'යි සිතව්ද ? මේ සේනාව අපට කුමක් කරන්නීද"යි කීහ. එබස් අසා කල්පද්‍රැමයක් වැනි තිලෝගුරු බෝධිසත්ත්වයන්වහන්සේ සිතනසේක් "මේ අඥනවූ රජු මදක් මරණ ගින්නෙන් තවාලා පසුව මාගේ බල දක්වාලා අස්වසාලන්නෙමි"* සිතා වදාරණසේක්"අර්ථබල කායබල ආදිවූ පංචප්‍රකාර බලයෙන් අසමානවූ බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ 'වෛදේහරජ්ජුරුවෝ මේ නුවරට ඇවිත් පැමිණියෝය, දුකසේ මැන්කොට ගනිමි, පලාගිය නම්

* අස්සාසෙස්සාමිති.

නපුරු'යි අද මේ වේලෙහි පටන් තුන්යම් රාත්‍රියෙහි සුරක්‍ෂිත කොට රැකවල් ලවා රැකසිට පාන්වූකල තුඹවහන්සේ අල්වාගෙණ මරති, මදකුත් දුවනියන් සරණදෙන්ට හා හිතකමට ආ. ගමනෙක් නොවෙ"යි වදාළසේක.

එබස් අසමින්ම සේනකයා ආදිවූ සියල්ලෝම මරණභයින් තැතිගෙණ කිසිවකුන් කියන්ට අසමර්ථවූහ. රජහු උගුර වියලි කෙල සිඳී ගියේය; ඇ ිනින් ඩා සෙල්වී ගොස් මරණභයින් වලප් නාහු මෙසේ කියන්නාහ—"ඉතා මෘදුවූ ලා අඹදළුවක් පරිද්දෙන් මාගේ ලය වෙව්ලන්නේය, මුඛයෙහි කෙල සිඳීගියේය, ගින්නෙන් පැලහිගිය එකක්හු අව්වේ ලූ කලක් පරිද්දෙන් මේ භයින් ගැලවීමක් නොදන්නෙම් සැනසිලි නොලබමි; තවද කඹුරන්ගේ උදුනෙහි ගිනි ඇතුළෙන් දවන්නේය, පිටතට නොපෙණෙන්නේය, එපරිද්දෙන්ම මාගේ ලෙහි ගිනිගත් හෘදයමාංසය ඇතුළෙන් දවන්නේය, පිටතට නොපෙණෙන්නේය"යි කියා ඇඬූහ. බෝසතානන්වහන්සේ රජුගේ බැගෑපත්ව වලප්නා හඬ අසා 'මේ නුවණින් අන්ධවූ රජ මා පළමු කීවා නොකළේය, මතු කීකරු වනලෙස නිග්‍රහකොට අඳුන්වාලමි' සිතා වදාරණයේක් "මහරජ තුඹවහන්සේ කාමයෙන් අන්ධවූසේක් මෝහයෙන් මුළාවූසේක් ගමන් විචාළ තෙන මාගේ ප්‍රඥාවෙන් මතු මේ නියා භයෙක් වන්නේයයි කියව කියවා 'ඒ නපුරු' යි නොගිවිස සේනකාදින්ගේ බස් 'යහපතැ'යි ගිවිස හීනනාවූ මනත්‍රණයෙන් මේනා මහත්වූ භයකට පැමිණීසේක, ඒ මහාමනත්‍රීවූ සේනකාදි පණ්ඩිතවරුන් සතරදෙනාගේ බසින් සරණගිඳුවා රජ්ජුරුවන් හා නෑ සම්බන්ධය කළා ඉතා යහපත, තුඹවහන්සේගේ සිත හීනනාකොට තුමූ ඇමත් 'ඉනකඩක් පිඩක් ලැබගනුම්හ'යි ලෝභචෙතනායෙන් කයි වාරුකොට ගෙණාවෝ මේ දුකින් කුමකට ගලවා නොගනිද්ද ? 'වන්නාට උන් ගලවාගන්නාත් දකිමි, උන්ගේ බලන් දක්නෙම් වේද්ද"යි වදාළසේක.

මෙසේද කියා "මෙලොවින් පරලොවින් වැඩක්ම වන්නාකැමති සියල්ලෙන්ම උතුම් අමාත්‍යව සිටි මාගේ බස් නොගිවිස, කාමයෙන් ඇලුණුසිත් ඇතිව, යම් කිසිවෙක්හි ලෝභයෙන් මුවෙකු අවුත් දැඩිමලෙක බැඳුනාසේ 'පංචාලචණ්ඩි කුමාරිකාව ලබමි' යන ලෝභයෙන් අවුත් මරුමුවෙහි අසුවූසේක. එදවස්ම 'පංචාලදේශයට ගමන් යහපත්ද"යි විචාළ තුඹවහන්සේට මෙම උපමාකොට කියෙම්වේද්ද'යි වදාළසේක. මෙසේද කියා නැවතත් වදාරණසේක් "ජනප්‍රධානවූ රජ්ජුරුවන්වහන්ස 'අනාචාර සව රූප ඇති අසත්පුරුෂයා හා මිත්‍රධර්මයක් නොකළමැනව, ඉදින් ඔහුගේ බස් ගිවිස සරණ සොයා ගියසේක්වීනම් මේලොවින් පරලොවින් වන වැඩෙක්නම් නැත, දෙලොවින්ම ඕහට දුක්මවන්

තේය'යි කියව කියවා මා කීවා නොකොට ඔහු කීවාම කළසේක, ඉදින් මා කීවා කළසේක්විනම් අද මේසා දුකෙක්වත් භයෙක්වත් නැත්තේවේද"යි වදුරා නැවත සිතනසේක් මේ රජහු මතුත් නොකීකරු නොවන ලෙස තරකොට තික්මවා නිග්‍රහයට පමුණුවමි, පළමු කීවාම කියා භය හා ලජ්ජාවට පමුණුවමි' සිතා වදුරණසේක් "මහරජ එදවස් ගමන් නොගිය මැනවැ'යි කීවාවූ මට නුඹවහන්සේ කියන්දැ 'කේවට්ට පණ්ඩිතයන් ආදිවූ පණ්ඩිතවරුය, රජගෙයි අසළුයෝත් රජදරුවන්ගේ අදහස දන්නෝත් මගුලට නිසි බස් දන්නෝත් උඹමය. මේ ගොවියාපුත් නිමුත් මිට එලිගෙණ සී සා කනසේ දන්නාබව මුත් රජගෙයි කාරිය හා මගුල් කාරණා බැවහාර දනිදැ'යි මට කිපි 'කොල ගොවියාපිත් බොටුව අල්වාගෙණ මාගේ විජිතයෙන් ඇත ලව'යි වදළසේක් නොවේද ? එදවස් එසේ කී නුඹවහන්සේ දැන් එසේවූ ප්‍රඥසමුද්‍රයන් සිටියදී මා ගොවියාපුතු අතින් ගැලවෙන උපාය විචාරණසේ ඉනා නොයෙදෙන්නේය, මා අතින් උපාය විචාරණ නුඹවහන්සේමය, කෙලතොලුසේකුත්, නුවණනැතිසේකුත්, මා දන්නේ සී සා කන පමණක්මය, උවමනාසේක් වීනම් සිසානාමාන විචාරගත මැනව, නුවණැත්තෝත් පණ්ඩිතවරුත් මේ මරින් ගැලවෙන උපාය දන්නෝත් සේනාකාදි පණ්ඩිතවරුය, නුඹවහන්සේ මට කිවමනා වීනම් එදවස් කීවාසේ කර අල්වා පිටත ලන්ට කිවමැනව, අටළොස් අක්ෂෞහිණී සඞ්ඛ්‍යාත මේ සේනාව අතුරෙන් සේනකාදිහු ගලවාගනිත්වා, මම කුමක් දනිම්දැ"යි වදළසේක.

ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු "පණ්ඩිතයෝ පළමු කී අපරාධයම කියන්නාහ, මපුතනුවෝ මේ මතු වන්නාවූ භය තමන්ගේ ප්‍රඥ චක්ෂුසින් මනාකොට දුටුවහ, එබැවින් මා තරව නිග්‍රහයට පමුණුවති; අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න යන තුන්කල් දන්නාවූ වජ්‍රබුද්ධිවූ ජනහිත නිරතවූ මාගේ පුතනුවෝ අනාගතයේ මෙබඳුවූ භයෙක් වන්නේය'යි දැන 'සාරමසක් මුළුල්ලෙහි හිඳිනාහු නිකම් නොයිඳිනාහ; ඒකාන්තයෙන් ගැලවෙන උපායෙක් කෙරෙත්මය; එයිත් මා විසින් පරීක්ෂාකළ මැනවැ" යි සිතා කියන්නාහු "පුත මහෞෂධපණ්ඩිතයෙනි නුවණැත්තාහු ගිය දවස කළ දැඩිකම් හා නොදන කියාපි බස් පමණක් සිත තබාගෙණ කිය කියා දුකට පැමිණියන්ට නිග්‍රහ නොකරන්නාහ, තෙපිත් මහත්වූ නුවණැත්තෝය, අනුවණින් කියාපි වරදම කියව, සතුරු සේනාවක් වටලා ගත්කල්හි පිට හිඳුවාගෙණ නැගීයන්ට තරම් ජවසම්පන්න සඳසිටි අයෙකුට තියුණු කැහැටකින් විදුනාකලක් පරිද්දෙන් කුමට මා විදුද ? ඉදින් කියව්නම්, ගැලවී නැගීයන උපායක්වත් සතුරන්ට අසුනොවී නැගීයන තෙනක්වත් දනුනම්, ඉන් මට අනුශාසනාකරව, ගිය දවස මා නුවණ නැතිව කී

කථා සිහිකොට තොපගේ බස් නැමති හියෙන් මා නොවිදුව, තරකොට බැඳි හසු කැවිටින් විදිනාසේ මා නොවිදුව, ගැලවෙන උපායක් කියව * තොප හැර මට අනික් පිටිවහලෙක් නැතැ"යි කීහ.

එබස් අසා කරුණාවට ආකරවූ ස්වාමිදරුවානෝ සිතනසේක් "මේ රජහට මා විනා අනික් පිටිවහලෙක් නැත්තේය, මේ රජ ඉතා අන්ධබාලය, තමා නුවණ නැතිහෙයින් පුරුෂ විශෙෂය මද කුත් නොදන්නේය; තවත් මදක් බලා පසුව අස්වසාලන්නෙමි" සිතා වදාරණසේක්—

අතීතං මානුසං කම්මං දුක්කරං දුරභිසම්භවං,
න තං සක්කොමි මොචෙතුං, ත්වංපි ජානස්සු ඛත්තිය.

"මහරජ මේසා සේනාවක් වටලාගෙණ සිටිකල ඉන් මිදියහැකි තරම් උපායක් කොටගැන්ම මනුෂ්‍යයන්ට ඉතා බැරිවන්නේය; මිනිසුන් කලමනා යම්දෙයක් ඇත්නම්, ඒ සියල්ල ඉක්ම ගියේය, දූන් මෙවිට ගැලවෙන උපායක් කරන්නා තබා සිතන්වත් නොපිළිවන, දූන් කරණ උපායකින් නුඹවහන්සේ ගලවාගන්ට මම අසමර්ථයෙමි; මහරජ නුඹවහන්සේම ගැලවෙන උපායක් දනමැනවැ"යි මේ ගාථාවෙන් වදාරණසේක්—

සන්ති වෙහායසා නාගා, ඉද්ධිමන්තො යසස්සිනො,
තෙපි ආදය ගච්ඡෙය්‍යුං යස්ස හොන්ති තථාවිධා.

සන්තිවෙහායසා අස්සාඉද්ධිමන්තායසස්සිනො
තෙපිආදයගච්ඡෙය්‍යුං යස්සහොන්ති තථාවිධා.

සන්තිවෙහායසාපක්ඛී ඉද්ධිමන්තායසස්සිනො
තෙපිආදයගච්ඡෙය්‍යුංයස්ස හොන්තිතථාවිධා.

සන්තිවෙහායසායක්ඛා ඉද්ධිමන්තායසස්සිනො
තෙපිආදයගච්ඡෙය්‍යුංයස්ස හොන්තිතථාවිධා.

"සමහර රජදරුවන් මෙසේවූ දුකෙහිදී ගලවා අකාශයෙන් ඇරගෙණ යන්නාවූ උපොසථය ඡද්දන්තය යන ඍද්ධිසම්පන්නවූ ඇත්කෙනෙක් ඇත්තාහ. එසේවූ ඇත්කෙනෙක් නුඹවහන්සේට ඇත්නම් මේ දුකින් ගලවා ආසෙන් ගෙණයෙත්වා; නැවත සමහර රජදරුවන්ගේ ඍද්ධිමත්වූ වලාහක අශ්වයෝ ඇත, එසේවූ අස්කෙනෙක් නුඹවහන්සේගේ ඇත්නම් උයින් නුඹවහන්සේ ආකාශයෙන් ගෙණයෙත්වා; තවද සමහර රජදරුකෙනෙකුන්ගේ ආකාශචාරිවූ ගරුඩ වාහනත් ඇත්තේය; තවද සමහර රජදරුවන්ගේ එසේම පක්ෂිවාහනත් ඇත්තේය; තවත් ඍද්ධිමත්වූ යක්ෂකෙනෙක් ඇත්තාහ; එසේවූ වාහනයෙක් නුඹවහන්සේට ඇත්නම් මේ දුකින් ගලවාගනිත්වා. මම ආකාශචාරීවූ

* නාංහිමෙථපෙත්වා අඤ්ඤංපටිසරණංනත්ථි.

ඇත් අස් පක්‍ෂි යක්‍ෂ ගරුඬ ආදීන් පරිද්දෙන් නුඹවහන්සේ ආකාශයෙන් ගෙණගොස් මියුලු නුවර ලාලන්ට අසමර්‍ථයෙමි” වදාළසේක. එබස් අසා රජ්ජුරුවෝ මුවෙන් නොබැණ උන්හ.

එවිට සේනකයා සිතන්නේ “රජ්ජුරුවන්ටත් අපටත් පණ්ඩිතයන් විනා අනික් කිසි සරණෙක් නැත්තේය, රජ්ජුරුවෝ පණ්ඩිතයන්ගේ බස් අසා භයින් තැතිගෙණ කිසිවකුත් කියන්ට අසමර්‍ථයහ. මෙවිට මමත් තමා දතපත නියා යාචඤකොට බලමි” සිතා කියන්නේ මේ ගාථාවෙන්;

අතීරදස්සී පුරිසො, මහන්තෙ උදකණ්ණවෙ,
යත්‍ථ සො ලභතෙ ගාධං, තත්‍ථ සො වින්‍දතෙ සුඛං;
එවං අම්හංච රඤ්ඤොච, ත්වං පතිට්ඨා මහොසධ,
ත්වං නොසි මන්තිනං සෙට්ඨො, අම්හෙ දුක්ඛා පමොචය.

“යම්සේ සයුරෙක හුනු පුරුෂයෙක් දුකසේ ගොඩක් දුටුයේ නම් ගොඩ දුටු වේලෙහි පටන් ඕහට මහා සැපවන්නේය, එපරිද්දෙන් අපටත් රජ්ජුරුවන්ටත් නුවණින් හා මන්ත්‍රිකම්න් උතුම් සේක් නුඹවහන්සේ වේද, එබැවින් මේ දුකින් මුදා අප ගලවාගත මැනවැ”යි කීය. එසේ කී සේනකයාට තරව භය උපදවා නිග්‍රහ කරණසේක් මේ ගාථාවෙන් වදාරණසේකි—

අතීතං මානුසං කම්මං දුක්කරං දුරභිසම්භවං;
න තං සක්කොමි මොචෙතුං, ත්වංපි ජානස්සු සෙනක.

එම්බල අඥානය එදවස් ‘මේ ගමන් නොකමැත්තේය’යි මා කියතුත් රජුට නොයෙක් කාරණා කියා උගන්වාගෙණ ආයෙහිත් තෝමය, ගෙණවුත් මේ සා දුකකට පමුණුවා, මේසා අනර්‍ථයක් යෙදුයෙහිත් තෝමය, එම්බල අසත්පුරුෂය මනුෂ්‍යයන් විසින් ගැලවෙන්ට කටයුතු යම් උපදෙශයෙක් ඇත්නම්, මෙවිට මේ ඇසිල්ලෙහි කරන්නා තබා සිතන්ටත් නොපිළිවන, ඒ සියල්ලම ඉකුත්ව ගියේය, මා විසින් දූත් කොට සාදගතහැකි කිසිවකුත් නැත්තේය, මට නොපිළිවන, තෙපිත් පෙර ‘අපමුත් නැතැ’යි බැහැ වෙන පණ්ඩිතවරු වූහ, නොපගේ නුවණින් මිට උපායක් සිතා තෙපිත් ගැලවී රජ්ජුරුවනුත් ගලවාගන්ව”යි වදාළසේක. මෙසේද කියා නැවත ‘තෙපි සපනීනම් ආකාශයෙන් ගෙණගොස් මියුලුනුවර ලාපියව’යි වදාළසේක.

රජ්ජුරුවෝ ගැලවෙන්නට උපායක් සිතන්නාහු මරණ භයින් තැතිගෙණ බෝධිසත්‍වයන් හා සමග කිසිවකුත් කියන්ට අසමර්‍ථව “යම්සේ මේ සේනකයාත් පණ්ඩිතයෙකු උව. කිසිම උපායක් දනීනම් විචාරමි” සිතා ‘සේනකය මේ උපන් භයින් ගැලවී යන්ට සුදුසු උපායක් දනිනම් කියව’යි මේ ගාථාවෙන් කීහ.

සුණොහි එතං වචනං පස්සසෙ තං මහබ්භයං;
සෙනකං දානි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසි.

මේ ගාථාවෙන් විචාළ රජ්ජුරුවන්ට සේනකයා "යම්සේ මසක් මංමුළාවූ එකෙක් සමසක් මංමුළාවූ එකෙකු අතින් මං විචාලේද එපරිද්දෙන් මේ රජ්ජුරුවෝ මා අතින් ගැලවෙන උපාය විචාරන්නාහ, යහපත් උවත් නපුරු උවත් මා කටට ආවක්ම කියම්" සිතා එක් උපායක් සලකාගෙණ කියන්නේ මේ ගාථාවෙන් කියා—

අග්ගිං ද්වාරතො දෙම, ගණ්හාමසෙ විකන්තනං;
අඤ්ඤමඤ්ඤං වධිත්වාන, ඛිප්පං හෙස්සාම ජීවිතං;
මා නො රාජා බ්‍රහ්මදත්තො, චිරං දුක්ඛෙන මාරයි

මේ ගාථාවේ අර්ථයනම් "මහරජ කරණසේක් වීනම් මා සියන උපාය යහපත, මේ අප හැම උන් මාලිගාවට අපි හැම වැදලා දෙර පිටතින් බන්දලා ගිනිගස්වාලා තියුණු මුවහත් ඇති කඩුවක් බැගින් තමකට එක එක කඩුව ගෙණ ඔවුනොවුන් කොටා මියම්හ; එසේ මළාවූ නුඹවහන්සේ හා අප හැමදෙනාට සැරහූ මාලිගාව එකදරසැයක් වන්නේය; බ්‍රහ්මදත්තයෝ අල්වාගත්තු නම් ජන්මාන්තර වෛරී හෙයින් වධකොට බොහෝ දවසකින් දුක් දී මරන්නාහ; එබැවින් වහා මියයාම උත්තමය"යි කීය.

ඒ අසා රජ්ජුරුවෝ 'තට හා තාගේ අඹුදරුවන්ට මෙබඳු දරසැයකුත් මෙසේ මරකුත් වේව'යි 'මට මෙවැනි මරක් නොවේව'යි කියා පුක්කුස ආදි තුන්දෙනා විචාළහ. ඔහුත් නුවණ නැතිව කටට ආවක්ම කිහ. එසේ හෙයින් කියනලදී.

සුණොහි එතං වචනං, පස්සසෙ තං මහබ්භයං;
පුක්කුසං 'දානි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසි.

මේ ගාථාව අසා පුක්කුසයා කියන්නේ "මහරජ බ්‍රහ්මදත්තයෝ අල්වාගත්තුනම් ජන්මාන්තර වෛරී හෙයින් නොයෙක් වධකොට චිරාත්කාලයක් දුක් දී මරන්නාහ, කෙසේ කොටත් මරණ නොනවත්නා බැවින් අපි හැම දෙනම උග්‍රවූ විෂයක් කාපියා වහා මියම්හ"යි කීය. උගේ බස් අසා නොසතුටුව "තාගේ අඹුදරුවන් හා සමග තෝ වහා මියයව, මට මෙවැන්නක් නොකිය"යි කියා කාවින්දයා විචාළාහ.

"කාවින්දයාත් පණ්ඩිතයෙකු උව, මින් ගැලවෙන්නට උපායක් දනීනම් කියව"යි කියා මේ ගාථාවෙන් කීහ.

සුණොහි එතං වචනං, පස්සසෙ තං මහබ්භයං;
කාවින්දං 'දානි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසි.

ඒ අසා කාවින්දයා කියන්නේ "මහරජ බ්‍රහ්මදත්තරජතෙම අප අල්වාගෙණ බොහෝ වධ කරවා මහ දුක් දී බොහෝ දවසකින් මරන්නේය; ඔහු අතින් වධ විඳ මියන්නා බලාත් නමකට ලනුවක් බැගින් අරගෙණ මාලිගාවේ මතුමාලට නැගී සිව්මැදුරු කවුළුවෙන් පිටත කොබෝගෙඩි එලල්ලේ රැණ බැඳලා මල ඉදි කොට කරලාගෙණ පැනපියම්හ, නොහොත් කර වැල්ලාගෙණ මියම්හ, නැත ගැඹුරු ප්‍රපාතයකට පැනපියා වහා මියම්හ"යි කීය. ඒ අසා රජ්ජුරුවෝ' එසේ කර වැල්ලාගෙණ මියන මරෙක් තාගේ අඹුවන්ට හා තට වේව'යි 'එසේවූ දෙයක් මට නොවේව'යි කියා "දේවින්දය මේ උපන් භය තොයිත් දුටුයෙහි වේද? ඉදින් තොයිත් උපායක් දනීනම් කියා බල"යි මේ ගාථාවෙන් කීහ.

සුණොහි එතං වචනං, පස්සසෙ තං මහබ්භයං;
දෙවින්දං 'දනි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසි.

මේ ගාථාව අසා ඒ පැනනැගී අතිකක් සොයාගන්ට අසමඣීව 'සේනකයා කී ලෙසම කීයම්' සිතා "මහරජ බ්‍රහ්මදත්තයා අල්වා ගතීනම් තමා කැමති වධයක් කරවා බොහෝ දුක් දී කලාතුරකින් මරන්නේය, එසේ දුක්විඳ සතුරන් අත මියන්නා බලාත් මේ මාලිගාවේ දොර පිටතින් අයා බන්දලා ගිනි ගස්වාලා අපි නමකට කඩුවක් බැගින් ඇරගෙණ ඔවුනොවුන් කොටා මියයම්හ, මේ විසිතුරු මාලිගාව බ්‍රහ්මදත්තයාට ප්‍රයෝජනවත් නොව අප හැමදෙනාට එකම දරසැයක් වන්නේය, මේ විනා මා දන්නා අනික් උපායෙක් නැත, පොලොව පැකුලුණන්ට එම පොලෝ පිහිට වන්නාසේ මේ දුකින් අප හැමදෙනා සුවසේ මුදපියත්නම් කරුණානිධානවූ ජනහිතනිරතවූ මහෞෂධ ස්වාමීන් විනා අප සේ නුවණින් අඬයන්ට ඒ විෂය නොවෙයි, ඇවිලෙන ගිනි තබා කණමැදිරියන් පිම්බාසේ ප්‍රඥ නැමති වහනිස්කඩයෙන් සමස්ත ලොකය ඒකාලොකකර බබලුවන මේ උත්තමයානන් සිටියදී අප සතරදෙනා සේ නුවණින් අඬයන් අතින් ගැලවෙන උපාය විචාරන්නේ අපටත් වඩා නුවණ නැති නියාද ? කරණ යාචඤුවක් අපි හැමදෙනම පණ්ඩිතයන්වහන්සේට කරම්හ"යි මෙසේද කියා "අපි හැමදෙනම එක්ව බැගෑපත්ව හඬා දෙඩා 'අප ගලවා ගතමැනවැ"යි යාඥකරම්හ, සතුරන් කෙරෙහිත් මිතුරන් කෙරෙහිත් සඳරුස්වත් කිරිමුහුද සේද සක කිරි වත්සාලා සේද සමවූ මෛත්‍රී ඇති මේ උත්තමයානෝ තමන්ට විෂය වීනම් මෙතෙක්දෙනා අනාථ මරණින් මියයා නොදෙන්නාහ, උන්වහන්සේත් තරව 'නොපිළිවනැ'යි කිවහොත් සේනකපණ්ඩිතයන් කී ලෙස දොර බැඳ ගිනිගස්වා උනුන් කොටා මියම්හ"යි කිය.

ඒ අසා රජ්ජුරුවෝ පෙර තමන් බෝධිසත්වයන්ට කළ කී අපරාධ සඳහන්කොට ඔබ හා සමග කිසිවකුත් කියන්ට අසමර්ථව මහතානන් අසඅසා සිටියදී ඔබ ලය කම්පාවන පරිද්දෙන් බැගෑපත්ව * හඬන්නාහු මේ ගාථාවෙන් කීහ.

යථා කදලිනො සාරං, අන්වෙසං නාධිගච්ඡති;
එවං අන්වෙසමානානං, පඤ්ඤං නාජ්ඣගමාමසෙ.

යථා සිම්බලිනො සාරං, අන්වෙසං නාධිගච්ඡති;
එවං අන්වෙසමානානං, පඤ්ඤං නාජ්ඣගමාමසෙ.

අදෙසෙවනතොවුත්තං කුංජරානංවනොදකෙ
සකාසෙදුම්මනුස්සානං බලානමවිජානතං.

උබ්බෙධතිමෙහදයං මුඛං ච පරිසුස්සති
නිබ්බුතිංනාධිගච්ඡාමි අග්ගිදඩ්ඪොව ආතපෙ.

කම්මාරානංයථාඋක්කා අන්තොඣායතිනොබහි
එවම්පිහදයං මය්හං අන්තොඣායතිනොබහි.

මේ ගාථායෙහි අභිප්‍රාය නම් "යම්සේ කෙහෙල් ගස් හර ඇතැයි වරදවා සිතාගත් නුවණ මද පුරුෂයෙක් කැපෙන යකඩයක් නැවතත් ගා මුවහත සියුම්කොට ගෙණ මහත් රම්භවනය කට වැද මහත් මහත් කෙහෙල්ගස් කපා බඩදක්වා බිඩලු හැරත් එහි කිසි හරයක් නොදකීද, එපරිද්දෙන් මින් ගැලවෙන උපාය සොයන්නාවූ මම කිසි කෙනෙකුන්ගෙනුත් නුවණ නැමති සාරයක් නොදුටුයෙමි; තවද ඉඹුල් හරයකින් ප්‍රයොජන විඳිනා කැමති පුරුෂයෙක් කෙහෙල්වන හර සෙවි පුරුෂයාසේ ඉඹුල්වනය කොටා එක ගසකත් හර නොදකීද; එපරිද්දෙන් මේ දුකින් ගැලවීගන්නා උපායක් සොයන්නාවූ මම හර නැති ඉඹුල් රුකක් සේ වූ මොවුන් හැමදෙනා කෙරෙහි ප්‍රඥ නැමති සාරයක් මද කුත් දුටුදෑ නැත්මි; පැන් නැති මහ වනයෙක්හි විසූ මහ ඇතෙක් ගිම්සමයෙහි ඝර්මයෙන් පීඩිතවූවහු සේ දුකට පැමිණි කල්හි දුකින් මුදා ගලවා ගන්නට තරම්වූ උපායක් නොදන්නා අඥනයන් සමීපයේ අනේ මා විසූ නියාවක් ඉතා නපුරුය; දූත් මාගේ ලය සුලඟට වෙව්ලන්නාවූ ලදපලලවයක්සේ කම්පිතවන්නේය, කට කෙල සිඳී උගුර වියලී ගියේය, ගින්නෙන් තැවුණු එකක්හු අව්වේ ලූ කලක් පරිද්දෙන් කිසි අස්වැසිල්ලක් නොලැබෙයි; තවද කඹුරුඋදුනේ ගිනි ඇතුලෙන් දවයි, ඒ ගිනි පිටතට නොපෙණෙයි; එපරිද්දෙන් දූත් මාගේ ලෙහි මරණ ගිනි ඇතුලෙන් දවන්නේය, පිටත නොපෙණෙන්නේය, මේ පණ්ඩිතවරුන් අමාත්‍ය ධුරයෙහි නුවණට හා මන්ත්‍රිකමට තබාගෙණ විසූ නියාව පැන් නැති මහ වනයෙහි ඇතු විසුවාක් වැන්න, නුවණනැති

* පරිදෙවන්තො.

පුරුෂයා කෙහෙල්ගර සෙව්වා වැන්න, ඒ නිරුදක වනයෙහි විසූ ඇත් උදකයෙන් පීඩිතවූයේ නොබෝකලකින් සතුරන්ගේ හස්ත ප්‍රාප්තවේද එපරිද්දෙන් හුවණනැති පණ්ඩිතවරුන්ගෙන් එකෙකුත් මේ දුකින් මුදාලන්ට සමර්ථ නොවෙ"යි බැගෑපත්ව ඇඬූහ.

මෙසේ ඇසුවන් ලය කම්පාවන පරිද්දෙන් අඬන්නාවූ රජ පුරුවන්ගේ බස් අසා සරණාගත වජ්‍රපංජරයක් වැනිවූ මාගේ ස්වාමිදරුවූ බෝධිසත්වයන්වහන්සේ "මේ රජ මරණභයින් ඉතා කලාන්තවිය, සා පිපාසා ඇත්තවුන්ට අන්නපාන දෙක පිටිවහල් වන්නාසේ ගිලනුන්ට වෙදුන් පිටිවහල් වන්නාසේ මේ රජහට මාමුත් අනික් පිටිවහලෙක් නැත, මෙවිට මොහු අස්වසා නොලා තවත් තද විනම්, ශෝකයෙන් ලය පැළී ගියනම් නපුර සාරමසක් මුළුල්ලේ මා ගත් දුක් නිෂ්ඵල වන්නේය, එබැවින් අස්වසාලම්" සිතා අස්වසා වදාළසේක. එබව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන්වහන්සේ මේ ගාථාවෙන්

> තතො සො පණ්ඩිතො ධීරො අත්ථදස්සී මහොසධො
> වෙදෙහං දුක්ඛිතං දිස්වා ඉදං වචනමබ්‍රවි.

"එම්බා මහණෙනි ඒ රජතෙමේ මහෞෂධ පණ්ඩිතයන් නොකමැති කරවා සරණ සොයා ගොස් හුන් උපකාරීනුවර බ්‍රහ්මදත්තයා එක්සියයක් රජුන් සහිතව මහසේනාව ගෙණවුත් වට ලාගත්කල්හි, අඹුවන් තබා, තමා ගැලවිගතනොහි මිදෙන උපාය විචාළේය; ඔහුට මහෞෂධයන් 'ඔබ නොගියමැනව, ගියහොත් මහා විනාශයට පැමිණෙන්නේය, නොයාහැක්කැ'යි කීම්; ඒ මා කටයුතු නොදනිති'යි වරදවා බැණ නිග්‍රහයෙන් පිටත ලවා, ඔබ ගියමැනව, ගියහොත් මහත් වැඩවන්නේය'යි කියනලද සේනකාදීන් බසින් තුඹවහන්සේ ආසේක්වෙද දූන් ඒ පණ්ඩිතවරුන් අතින් උපාය විචාරා ගතමැනවැ"යි කීකල්හි සේනකාදිවූ සතර දෙනාත් විචාරා, උන් හැමදෙනා කියනලද මරණෝපාය අසා නොසතුටුව, මහෞෂධ පණ්ඩිතයන්ට කියනොහි භය ඇතිව උන්ට ඇසෙන පරිද්දෙන් අඬන්නාවූ වෛදේහරජු බස් අසා ඒ මහෞෂධ පණ්ඩිතයෝ 'මෙවිට අස්වසා නොලිම්නම් ලය පැළී නැසී ගියහොත්, මා දිවාරැ ගත් දුක් මුළුල්ලම ව්‍යර්ථවන්නේය, තවද මතු බොහෝවා දහස් මුළුල්ල සඳමඬල ඇත්දසේ පෙණෙන්නාවූ මාගේ ප්‍රඥ විශෙෂය ජල රේඛාවක් පරිද්දෙන් තුච්ඡ වන්නේයයි සිතා රජහු අස්වන්නාහු—

> මාභායි මහාරාජ මාභායි රථෙසභ
> අහං තං මොචයිස්සාමි රාහුගහිතං වචන්දිමං
> මාභායි මහාරාජ මාභායි රථෙසභ
> අහං තං මොචයිස්සාමි රාහුගහිතං වසූරියං.

මාත්වං භායි මහාරාජ මාත්වං භායි රථෙසභ.
අහං තං මොචයිස්සාමි පඞ්කසත්තං වකුඤ්ජරං.

මාත්වං භායි මහාරාජ මාත්වං භායි රථෙසභ
අහං තං මොචයිස්සාමි පෙළාබද්ධං ව පන්නගං

මාත්වං භායි මහාරාජ මාත්වං භායි රථෙසභ
අහං තං මොචයිස්සාමි සයොගබල වාහනං.

මාත්වං භායි මහාරාජ මාත්වං භායි රථෙසභ
අහං තං මොචයිස්සාමිකාකසෙනං ව ලෙඩ්ඩුනා.

අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යන කාලත්‍රයවර්තීවූ සියලු පදාර්ථයන් ස්වයම්භූ ඥානයෙන් පරෝපදෙශ රහිතව තමන්ම දත්හෙයින් ඉතා නුවණැතිවූ මහෞෂධ පණ්ඩිතයෝ වේදේහයා මරණභයින් පීඩිතව වලප්නවුත් මෙසේ කියා සන්හිඳුවමින් "මහරජ නොබවමැනව, මේ එක්සියයක් රජුන් හා අටළොස් අක්ෂෞහිණී සඞ්ඛ්‍යාත සේනාව වටලාගෙණ සිටියදී රාහු මුඛයට වන් සඳමඬල ගලවාගන්නාසේ ගලවාගනිම්; තවද මහමඬෙහි එරීගිය ඇතක්හු ගොඩගන්නාසේ ගලවාගනිම්; තවද මේ සේනාවෙන් කිසිකෙනෙකුන් නොදන්නා පරිද්දෙන් පේළාවක හසුවූ නයෙකු ගලවාගන්නාසේ බ්‍රහ්මදත්ත රජ නැමති අහිගුණ්ඨිකයාගෙන් සේනානමැති පේළාවෙහි හසුවූ වේදේහනැමති නාගරාජයා ගලවාගෙණ ගොස් මියුලුනුවර ලා ලන්නෙම්; තවද මැදිරියේ හසුවූ පක්ෂීන් ගලවාහරණාසේ සුවසේ ගලවාගනිම්; තවද දැල බැඳී මසුන් ගලවාගන්නාසේ ගලවාගනිම්. තවද මහරජ නොබවමැනව, නුඹවහන්සේ මතු තනිව ගලවා ගනිති නොසිතුවමැනව; නුඹවහන්සේ හා කැටිව ආවාවූ ඇත් අස් රථ පාදතිවූ සේනාවෙන් එකක්හටත් මේ සතුරාගෙන් කිසි උපද්‍රවයක් වියනොදී සුවසේ ගලවාගෙණ ගොස් මියුලුනුවර ලාලන්නෙමි; තවද මහරජ නොබව මැනව, ඉදින් සිතිම්නම් එක්සියයක් රජදරුවන් හා අටළොස් අක්ෂෞහිණීයක් පමණ රාජසේනාව අනික් කෙනෙකුන්ගේ උපදේශයක් හා යුඬප්‍රයෝගයක් නැතිව මාගේ ප්‍රඥාබලයෙන්ම කැටක් අල්වාගෙණ දමා කපුටු සමූහයක් නොරණාසේ පලවාපියන්ටත් බැරි නොවන්නේය; නුඹවහන්සේ නොබව මැනවැ"යි අස්වැසූහයි වදාළසේක.

ඒ එසේමැයි—සෙස්සවුන්ගේ නුවණින් ප්‍රයෝජන කිම්ද ? අමාත්‍යයෝ නමුත් නුවණැත්තෝ නමුත් මෙසේවූ දුකෙහිදී පිටිව හල්ව ඒ දුකින් මුදලන්නෝ උත්තමයෝ නොවෙද්ද? තවද බෝධිසත්වයන්වහන්සේ වදාරණසේක් මහරජ නුඹවහන්සේ මම පළමු ආයෙම් කුමක් පිණිස ආහයි සිතූසේක්ද? මතු නුඹවහන්සේට

මෙවෙනි හයෙක් වන්නේයයි කියා ප්‍රඥනමැති දිවසින් දුටුවාවූ මම නවතාලීමි, ඒත් නොනවත්නා හෙයින් ඒබව දැන නුඹවහන් සේනැසියාදී ඉඳීම මට තරම්නොවෙයි සිතා මට උදහස් උවත් ඒ මා සිත නොනබා නුඹවහන්සේට පළමු අවුත් සාරමසක් මුළුල් ලෙහි මෙහි හිඳ කුමක් කළහයි සිතුසේක්ද? මහරජ නොබව මැනව; මේ හයින් මුදා සුවසේ ගලවාගෙණ ගොස් මිථුලුනුවර ලාලමි”යි * අස්වසා වදාළසේක. — † වේදෙහ රජ්ජුරුවෝද බෝධිසත්ත්වයන්වහන්සේ ශඞ්කාරහිතව අභීත කේසර සිංහරාජ යෙකුසේ කිසි හයක් නැතිව කියන්නාවූ බස් අසා ‘මෙවිට මාගේ ජීවිතය ලද්මි’යි අතිශයින් සතුටුව අස්වැසීගත්හ. බෝධිසත්ත්වයන් වහන්සේ මෙසේ සිංහනාද කළ කල්හි සේනකයා ආදිවූ බොහෝදෙන සතුටුව ගියහ. බෝධිසත්ත්වයන්වහන්සේ ‘නොබව තොප හැමත් සුවසේ ගලවාගනිමි’ කියත්ම සේනකයා ආශ්චර්‍ය්‍යයට පැමිණියේ ‘ස්වාමිනි මෙසා සේනාවක් අවුත් තුන් සන්ධියකින් හා සතර වලල්ලකින් අතුරු සිදුරු නැතිව වටලාගෙණ සිටියදී කවර උපායකින් ගලවා ගෙණයන සේක්දැ’යි කීය. එම්බල සේනකය මේ සතුරන් ලුහුබඳවාපියා වාසලින් පිටත්ව සතුරන් බල බලා සිටියදී යන්නෙමි වී නමුත් මට බැරි නොවෙයි. එතකුදු උවත් උන් හැම නොදන්නා පරිද්දෙන් සරහනලද උමගින් ගෙණයෙමි” වදාළසේක.

මෙසේද කියා ‘සේනකය නෝ ගමනට සැරහීගනැ’යි වදාරා උමග දොර හරණට තමන්වහන්සේගේ යෝධයන්ට විධානකරණසේක්–

එථමානවඋට්ඨෙථමුබං සොධෙථසන්ධිනො
වෙදෙහොසහමචෙවහි උම්මගෙනගමිස්සති.

“කුඩාවරුනි විහා නැගී ගොසින් උමග දොර හරුව වේදේහ රජ්ජුරුවන්වහන්සේ අමාත්‍ය සමූහයා විසින් පිරිවරණලදුව උමගින් වඩනාසේකැ”යි වදාළසේක. ඔහු ගොසින් උමග දොර හැරපීහ. සියලු උමග සරහනලද සුධර්මානම් දිව්‍යසභාව සේ අතිමනෝහරවිය; බෝධිසත්ත්වයන්වහන්සේගේ විධානයෙන් යෝධයන් උමග දොර හළ නියාව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක්—

තස්සතංවචනංසුත්වා පණ්ඩිතස්සානු සාරිණො
උම්මගගා වාරංවිවරිංසු යන්තායුත්තෙව අගලෙ.

“එම්බා මහණෙනි මහෞෂධපණ්ඩිතයන්ගේ සුශික්ෂිත කීකරු යෝධයෝ ඒ පණ්ඩිතයන්ගේ තීක්ෂණවූ ප්‍රඥවෙන් කරණලද උමග යන්ත්‍රයෙන් යුක්තවූ දොර හැර එ බව බෝධිසත්ත්වයන්ට කීහ”යි වදාළසේක— එබව අසා බෝධිසත්ත්වයන්වහන්සේ ‘වැඩි

* අස්සාසෙසි. † සොපි.

යමනා කලැ'යි වේදේහ රජ්ජුරුවන්ට කල් දූන්වූසේක. රජ්ජුරුවෝ මාලිගාවෙන් බටහ. එවිට සේනකයා එදවස් අමරා දේවින්දෑ නිසා තමා ලත් ඉස්පය්ය ඉසින් ගලවා කෝනමක් තරව හැඳ කඩ හකුලුවා තමා සිත වන් භය සේ පොට්ටනියත් එල්වාගෙණ ඇත් මැත් බලබලා ඉඟිකරුව සලෙයිකඩ ඉරා දණ වැලමිට තලිල් ආදිවූ ස්ථානයෙහි නොබැන්දයි නොසිතම්. මොහු මේ කරන්නාවූ විකාර මුළුල්ල බෝධිසත්වයන්වහන්සේ දූක 'නුවණ නැත්තව ! තෙලෙ කුමක් කෙරෙයිද්ද'යි වදාළසේක. "පණ්ඩිතයන්වහන්ස ! උමගින් යනකල නම් * කෝනමක් හැඳගෙණ හන් පළින් වස්ත්‍රාභරණාදි සියලු අලඞ්කාර තබා දණ නමාගෙණ වෙදයන්නේ, එසේහෙයින් මමත් උමගින් යන්නට සැරහෙමි"යි කීය. ඹහට වදාරණසේක් "එම්බල සේනකය තෝ වැලිත් උමගට වදනාකල දණ බිම ඔබා නැබුරුවගෙණ ගොයෙකු සේ බඩගායෙමි"යි නොසිත, තෝ ඉදින් ඇතෙකු පිටින්වත් අසෙකු පිටින්වත් රථයකින්වත් යන්නා කැමැත්තෙහි වීනම් ඉන් තා කැමති වාහනයකට නැගීයව, මා විසින් කරණලද උමග උසින් අටලොස් රියනෙක, ඉතා උස්වූ පලල්වූ වාසල් හා දොරටු ඇත්තේය, එබැවින් තෝ උමගින් යන්ට කෝනමක් නොහැඳ දණ කඩරෙදි නොබැඳනා සැරහෙන යම් අලඞ්කාරයකින් සැරහී කැමති වාහනයකට නැගී රජ්ජුරුවන්ට පළමු නික්මෙව"යි වදාළසේක.

බෝධිසත්වයන්වහන්සේ ඒ ඉතා භයපත්වූ සේනකයා පළමුව යන්ටත් රජ්ජුරුවන් මධ්‍යයෙහි යන්ටත් නිලකොටලා තමන්වහන්සේ පසුව ගමන්ගත්සේක. කුමක් නිසාදයත් ? සේනකයා සතුරන් දූක තරව බාගියේය, කිසිවෙකත් ආලයනොකොට පසු නොබලා දිවන්නේය, රජ්ජුරුවෝ තමන් සිහිනෙනුත් නුදුටුවිරූ විසිතුරුකොට සරහනලද උමග විස්තර බලා නොයන්නාහ, එබැවින් තමන්වහන්සේ 'මහරජ වහා වැඩියමැනව වහා වැඩියමැනවැ"යි කම්සන් කොටකොට යන පිණිස රජහට පසුවූ සේකැ'යි දතයුතු. ඒ උමග ඇතුළේ මහ ජනයාට බොහෝ බත් මාළු කන බොනදෑ මෙතෙකැයි පමණ නැතිවිය, එහි වන් මනුෂ්‍යයෝ කන්නාහු බොන්නාහු උමග විස්තර බලමින් මහත්වූ සන්තෝෂයෙන් යන්නාහ. බෝධිසත්වයන්වහන්සේ 'මහරජ වහා වැඩියමැනවැ'යි කම්සන්කෙරෙමින් පස්සෙහි වඩනාසේක. රජ්ජුරුවෝ සුදම් දෙව්සබාව සේ ඉතා සිත්කළුවූ උමග බලමින් යන්නාහ. උමගින් යන පරිදි වදාරණ බුදුරජානන්වහන්සේ මේ ගාථාවෙන් වදාරා—

පුරතො සෙනකො යාති, පච්ඡතො ච මහොසධො;
මජ්ඣෙ ච රාජා වෙදෙහො, අමච්ච පරිවාරිතො.

* උම්මග්ගෙන ගච්ඡන්තනාහිනාම.

“එම්බා මහණෙනි එදවස් උමගින් යන ගමනේ සේනකයා පලමු යෙයි; මහෞෂධපණ්ඩිතයෝ පස්සෙහි යන්නාහ, දෙදෙනා මධ්‍යයෙහි වේදේහරජ අමාත්‍යමණ්ඩලයා පිරිවරා නික්මිණැයි වදාළසේක.

රජ්ජුරුවන් හා පණ්ඩිතයන්වහන්සේ ආ බව දැන, රුකවල සිටියෝ බ්‍රහමදත්ත රජ්ජුරුවන්ගේ මෑනියන් ආදිවූ රජදරුවන් සතරදෙනා උමගින් පිටත්කොට මහවිසල්මලුවේ සිටුවාලූහ.— රජ්ජුරුවෝත් බෝධිසත්‍වයන් හා සමග උමගින් පිටත්වූහ. ඔහු සතරදෙන බෝධිසත්‍වයන්දැත් රජ්ජුරුවනුත් දැක “ඒකාන්ත යෙන් සතුරන් අතපත් වූම්හ, අප ගෙණාවන් පණ්ඩිතයන්ගේ යෝධයන් සැටිය”යි මරණභයින් තැතිගෙණ මහ හඬින් හැඬූහ. ඔහු සතරදෙනා ඇඬූ වේලෙහි බ්‍රහමදත්ත රජ්ජුරුවෝත් ‘වේදේහ රජ පලායෙ’යි යන ක්‍රෝධයෙන් ඒ නුවර වට තුන්ගව්වක් මානයේ රුකවල් බලා අවුත් ගංතෙරට නුදුරු තැනෙක්හි සිටියාහු නිශබ්දව තුබූ මධ්‍යම රාත්‍රියෙහි ඒ හැඬූ ශබ්දය අසා නඳාදේවීන්ගේ කටහඬ වැන්නැ’යි කිම්තම් “කොයින් නඳාදේවිය ගිය යම්ම තැනක නඳාදේවී සඳහන් නොකොට හිඳිනා දවසෙක් නැතැ”යි කියන බසට ලජ්ජාවෙන් කවුරුන්ටත් නොකීහ.— බෝධිසත්‍වයන්වහන්සේ උමගින්ම ගෙණායෙන් රුවන්රුසක් පිට සිටුවා පංචාලචණ්ඩි කුමාරිකාවන් අභිෂේකයට පමුණුවා‘ “මහරජ නුඹවහන්සේ මේ කුමාරිකාව ගෙණයන්ට අවුදින් මේසා භය කට පැමිණිසේක; එබැවින් නුඹවහන්සේට අගමෙහෙසුන් වන්නියයි වදාළසේක.

එවේලෙහි තුන්සියයක් නැව් ගෙණවුත් තොට තබාලූව, මහවිසල්මළුවෙන් ගොස් රජ්ජුරුවෝ සරහනලද නැවකට නැංගාහ, බ්‍රහමදත්තරජ්ජුරුවන්ගේ මෑනියන් ඇතුළුවූ රජදරුවෝ සතරදෙනාත් එම නැවට නැංගාහ. එබව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන්වහන්සේ මේ ගාථාවෙන් වදාරා—

උම්මග්ගා නික්ඛමිත්වාන, වෙදෙහො නාවමාරුහි;
අභිරූළ්හංච තං ඤත්වා, අනුසාසි මහොසධො.

අයං තෙ සසුරො දෙව, අයං සස්සු ජනාධිප;
යථා මාතු පටිපත්ති, එවං තෙ හොතු සස්සුයා.

යථාපිනියකොභාතාස උදරියො එකමාතුකො
එවං පංචාල චණ්ඩොතෙ දයිතබ්බො රථෙසභ

අයං පංචාල චණ්ඩීතෙ රාජපුත්ති අභිජ්ඣිතා
කාමංකරොහිතෙතාය භරියාතෙ රථෙසභ.

“එම්බා මහණෙනි එදවස් වේදේහරජ උමගින් පිටත්ව නැවට නැංගේය. ඕහට මහෞෂධ පණ්ඩිතයෝ ‘මහරජ මේ පං

චාල චණ්ඩ කුමාරයෝ නම් සුහුරු බඩුනුවෝය, මේ නන්දදේවීනම් නුඹවහන්සේගේ නැන්දනියෝය, ඒ නැන්දනියන් කෙරෙහි වැඩූ මැනිකෙනෙකුන්ට කරණ ආදරයක් පරිද්දෙන් පිළිපැද්දමැනව, පංචාලචණ්ඩ කුමාරයෝ සුහුරුබඩුනුවෝයයි ආලිස්සත් නොකොට එක කුසින් උපන් මල්බෑකෙනෙකුන් පරිද්දෙන් දයාකටයුතුය; මේ පංචාලචණ්ඩි කුමාරිකාවෝනම් උභයකුල පරිශුඞක්‍ෂත්‍රිය කන්‍යාවෝය, උන් නුඹවහන්සේ කැමති පරිද්දෙන් රාජඓශ්වර්‍ය්‍යයෙහි පිහිටුවා රක්‍ෂාකළ මැනවැ'යි කියා අවවාදකළහ"යි වදාළසේක.

මෙසේ අනුශාසනාකළේ කුමක් පිණිසද යත්? "සරණදෙම්හයි අප මායමින් ගෙන්වාගෙණ මේසා භයකට පමුණුවා ගහට කළ රජුගේ මව මරව, අඹුදරුවන් මරවයි මැරුයේවිනම් නපුරු"යි සිතාත් "දුවනියන්ට වඩා නන්දදේවින් අධික රූ ඇතිහෙයින් අඬවූ මුළාවූ රජ්ජුරුවෝ දුවනියන් තබා මැනියන් කෙරේ ලෝභ උපදවා නෑකම් වරදවාපීහුනම් නපුරු"යි සිතා පළමුකොට රජ්ජුරුවන් අතින් ප්‍රතිඥා ඇරගත්හයි දතයුතු. රජ්ජුරුවෝත් 'පුත තොප කී ලෙසින් කිසිවකුත් නොවරදවා කෙරෙමි" ඔබගේ අවවාද සිතින්ම පිළිගත්හ. එසේ අවවාදකරණසේක් රාජමාතාවන් තලතාදේවීන්ගේ නමකුත් නොවදාළසේක. කුමක්පිණිසදයත්? උන් මැහැලිහෙයින්ම කිසිවකුත් නොවදාළසේක. මේ සියලු කථාව මහාබෝධිසත්‍වයන්වහන්සේ ගොඩසිටම වදාළසේක. ඉක්බිති රජ්ජුරුවෝ නැවින් වහා යනු කැමතිව 'පුත තෙපිගොඩ සිටම දෙඩව්ය, වහා නැවට නැගෙව, කුමක් නිසා ගොඩ සිටුද' සතුරන් අතින් දුකසේ මිදුනම්හ, එබැවින් වහා යම්හ"යි මේ ගාථාවෙන් කීහ.

ආරුය්හ නාවං තරමානො, කින්නු තීරම්හි තිට්ඨසි;
කිච්ඡා මුත්තම්හ දුක්ඛාතො, යාම 'දානි මහොසධ.

ඒ අසා දේවයන්වහන්ස නුඹවහන්සේ හා එක්ව නැගී යාම යුක්ත නොවෙයි' කියා ගාථා දෙක්කින් වදාරණසේක්—

නෙස ධම්මො මහාරාජ, යොහං සෙනාය නායකො;
සෙනංගං පරිහාපෙත්වා, අත්තානං පරිමොචයෙ.

නිවෙසනම්හි තෙ දෙව, සෙනංගං පරිහාපිතං
දින්නාංච බ්‍රහ්මදත්තෙන, ආනයිස්සං රථෙසභ.

"මහරජ සේනාවට නායක කෙනෙක් සේනාව සතුරන්ට අත්පත්වූකල තමා දන්නා යම් උපායකින් ඒ සේනාව ගලවාගණ යාමක් වත් නොහොත් එක්ව නැසීයාමක්වත් නොකෙළේ වීනම් උන්ගේ සේනානායක කමින් ප්‍රයෝජන නැත්තේය, ඒ තමාම ධර්මිෂ්ඨකමකුත් නොවන්නේය, දැන් මමත් සේනා නාය

කව සේනාව සතුරන්ට හස්තප්‍රාප්තව ඇතුළු නුවර සිටියදී [යෙම්ද ?] අප වැන්නෝත් තනිව දිවි රැකගැන්මක් කෙරෙද්ද? "මහරජ නුඹවහන්සේ හා කැටිව සාරසියයක් ගව් ගෙවා ආ සේනාවගෙන් සමහර කෙනෙක් මාර්ගයෙහි ගමනින් ශ්‍රාන්තව නිදන්නාහ, සමහර කෙනෙක් අන්නපානාදියෙන් සන්තුෂ්ටව මේ ශමන් තමා නොදන්නාහ, තවද මා හා කැටිව ආවුන්ගෙන් සාර මසක් මුළුල්ලෙහි උමග හා අගල පවුරු ආදී සියලු කර්මාන්ත කොට රැපාන අනවරතයෙන් දුක්ගෙණ විඩාවූවාහු මේ එන නියාව උයිත් නොදන්නාහ. එබැවින් ඇම මට උපකාරව සිටියන්ගෙන් එකෙකුත් ඇරපියා ඊම මට තරම්නොවෙයි, ඒ සියලු සේනාවම බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ජයගෙණ උන් දුන් සේනාවක් පරිද්දෙන් නැවත හැරගෙණ එන්නෙමි * මහරජ නුඹවහන්සේ අන්තරාය මාර්ගයෙහි ඇසිල්ලකුත් නොරඳ වහා වැඩිය මැනව, පළමු මා විසින් නුඹවහන්සේට යොත්නකට ගමක් බැගින් ගම් කරවා ඉඩම් ලවා අතරමග ගම් සියයෙහිම වස්ත්‍රාභරණ අන්නපානයෙන් සමෘඩකරවා ඇත් අස් ආදී වාහන සරහා සිටුවනලද, ගමින් ගමට පැමිණිකල කැටිව යන වාහනයෙන් දුර්වලයන් එහි රඳවා එහි තුබූ වාහනයකට නැගී වහා මියුලු නුවරටම වැඩියමැනවැ"යි වදාළසේක, ඒ අසා රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කිහ—

අප්පසෙනො මහාසෙනං, කථං විග්ගය්හ ඨස්සසි;
දුබ්බලො බලවන්තෙන, විහඤ්ඤිස්සති පණ්ඩිත.

මෙහි අභිප්‍රාය නම් "මහෞෂධ පණ්ඩිතයෙනි තොපගේ සේනාව මඳවූව, බ්‍රහ්මදත්තයන්ගේ මහාසේනාව කෙසේ ජයගනුද? බලවත්තයෝ දුර්වලයන් නසාපියා මහා විනාශයට පමුණුවාපියති"යි කීහ—ඒ අසා බෝධිසත්වයන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක්—

අප්පසෙනොපි චෙ මන්තී, මහාසෙනං අමන්තිනං;
ජිනාති රාජ රජ්ජානං, ආදිච්චොවොදයං තමං.

"මහරජ ඇසුව මැනව; මහාසේනාව ඇතිවත් අමන්ත්‍රී තැනැත්තවූ අල්ප සේනාව ඇති මහමන්ත්‍රියා ජයගන්නේමය, එබැවින් අමන්ත්‍රීවූ බ්‍රහ්මදත්තරජුගේ එක්සියයක්රජුන් හා අටළොස් අක්ෂෞහිණී සඞ්ඛ්‍යාත මහාසේනාව මහාමන්ත්‍රීවූ මම මාගේ ප්‍රඥ බලයෙන් ජයගනිමි. තවද අමන්ත්‍රී කෝට්ටයා ඇති මහා සේනාව සහිතවූ බ්‍රහ්මදත්තරජහු මහාමන්ත්‍රීවූ මා වැනි එක් ඇමතියෙක් ඇති මද සේනාව සහිතවූ නුඹවහන්සේ ජයගන්නාසේක. ඒ කුමක් වැන්ද යත්? සමස්තලෝකයෙහි එකපැතිර පවත්නාවූ මහා ඝනාන්ධකාරය ඉරු උදාකළ කල්හි එක පැහැර දුරුව ආ

* ආනෙස්සාමි.

ලෝක වන්නේය. එබැවින් සේනාව මදවුවත් ජයගන්නෙම් නම් මම්මය, නුඹවහන්සේ සැකයක් නොසිතා වැඩිය මැනවැ"යි වදරා රජ්ජුරුවන් වැඳ රැඳුණුසේක.

ඉක්බිති රජ්ජුරුවෝ 'සතුරන් අතින් මිදුනම්හ, සොයා ආ බිසවුනුත් ලදුම්හ, අපගේ මනදෙළුත් * මුදුන් පැමිණියේය'යි බෝධිසත්‍වයන්ගේ ගුණ සිහිකොට උපන්නාවූ පස්වණක් ප්‍රීතීන් පිණා ඔබගේ ගුණ සේනකයාට කියන්නාහු—

සුසුඛං වත සංවාසො, පණ්ඩිතෙහිති සෙනක;
පක්ඛිව පංජරෙ බද්ධෙ, මච්ඡෙ ජාලගතෙරිව;
අමිත්තහත්ථත්ථගතෙ, මොචයී නො මහොසධො.

"සේනකය නුවණැත්තහු හා එක්ව විසීම උතුම, මෙලොවිනුත් පරලොවිනුත් සැපවන්නේය, මැදිරියෙහි හසුවූ ලිහිණියන් සෙයින්ද දැල බැඳි මසුන් පරිද්දෙන්ද සතුරන්ට අත්පත්වූ අප හැමදෙනම මහෞෂධ පණ්ඩිතයෝ ගලවා ඇරපීහ; එබැවින් නුවණැත්තවුන් හා එක්ව විසීම උතුමැ"යි මුබ නොසැහෙන පරිද්දෙන් කිහ. ඒ අසා සේනකයා තමා ඇතිවක් පටන් මහතානන්ගේ ගුණයක් කියන්නේ මේ ගාථාවෙන් කියා—

එවමෙතං මහාරාජ, පණ්ඩිතාහි සුඛාවහා;
පක්ඛිව පංජරෙ බද්ධෙ, මච්ඡෙ ජාලගතෙරිව;
අමිත්තහත්ථත්ථ ගතෙ, මොචයී නො මහොසධො.

"මහරජ ඒ සැබව ඉතා සැබෑමය, නුවණැත්තවුන් හා එක තැන විසීම ඉතා සැපවන්නේය, මැදිරියෙහි හසුවූ ලිහිණියන් සෙයින්ද දැල බැඳි මසුන් පරිද්දෙන්ද සතුරන් අත්පත්වූ අපහැම මහෞෂධ පණ්ඩිතයෝ සුවසේ ගලවා ඇරපූහ"යි කීහ.

ඉක්බිති වේදේහරජ්ජුරුවෝ ගඟින් එතර බැස බෝධිසත්‍වයන්වහන්සේ විසින් යොදනෙන් යොදන කරවනලද ගම්වලට පැමිණ ඔබ විසින්ම පළමු විධාන අසාගත් අමාත්‍යයන් සපයා එවනලද හස්ත්‍යශ්වාදි වාහන හා අන්නපානාදියෙන් හා නොයෙක් වර්ගයේ කැවුම් හා කන බොන දෙයින් සන්තුෂ්ටව ගමන් විඩාවූ වාහන එහි රඳවා නවවූ වාහනයකට නැගී යන්නාහු ගම්න්ගමට පැමිණ මහතානන්ගේ විධාන පරිද්දෙන් මාගීවිඩා සන්හිඳුවා නොපමාව යන්නාහු සාරසියයක් ගව් ගෙවා දෙවන දවස් පෙරවරු බතට මියුලුනුවරට වන්හ.

බෝධිසත්‍වයන්වහන්සේ රජහු යවා උමඟ දෙරට වැඩ තමන්වහන්සේ උරෙහි එල්වාගිය කඩුව කොපුවෙන් මැත්කොට උමං දෙර මහවිසල්මළුවේ වැලිපිරා යට සඟවා තබා උමඟින් ගොස් උපකාරීනුවරට වැද සොළොස් කළයක් සුවඳපැනින් ඉස සෝධා

* මනොරථොපි.

නහා නොයෙක් රසයෙන් අනඝීවූ භෝජනය අනුභවකොට සහන් මුදුනේ සැතපුණුසේක් 'මාගේ මනදෙළ මුදුන් පැමිණියේය' සිතා පස්වණක් ප්‍රීතීන් පිණා සුවසේ සැතපුණුසේක.

ඒ රාත්‍රිය පහන්වූ ඇසිල්ලෙහි චූලනී රජ්ජුරුවෝ සේනාව මෙහෙයන්නාහු නුවරට සම්පවූහ. ඒ රජහු සේනාවට විධාන කෙරෙමින් සැරහී ආ නියාව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන් වහන්සේ—

රක්ඛිත්වා කසිනං රත්තිං, චූළනෙය්‍යො මහබ්බලො
උදෙන්ත අරුණුග්ගම්හි, උපකාරිං උපාගමි.

ආරුය්හ පවරං නාගං බලවන්තං සට්ඨිහායනං;
රාජා අවොච පංචාලො, චූළනෙය්‍යො මහබ්බලො.

සන්නද්ධො මණිවම්මෙන, සරමාදාය පාණිනා;
පෙස්සියෙ අජ්ඣභාසිත්‍ථ, පුථු ගුම්බෙ සමාගතෙ.

“එම්බා මහණෙනි බලවාහන සහිතවූ බ්‍රහ්මදත්තරජ තුන්යම් රාත්‍රියෙහි තුන් සන්ධියකින් හා සතර වලල්ලකින් අතුරු සිදුරු නොපෑ ඒ ඒ ස්ථානයෙහි බලඇණි සිටුවා තුමූ රැකවල් බලා ඇවිද අරුණු නැගී පහන්වන්නාහාම ඒ උපකාරි නුවරට ආහ. තවද පංචප්‍රකාර බලයෙන් යුක්තවූ බ්‍රහ්මදත්තරජ සැටඅවුරුද් දෙන් මදනැගී බලහිඳුනාවූ කම්පට තුන්තැනකින් පැළී තිබෙන්නාවූ සටන්හි ජයබිම් හඳුනන්නාවූ ගිය ගිය තැන සතුරන් බිඳ ජයගන්ට සමර්ථවූ මහබලඇති සවිලක්ෂණ සම්පන්න සියලු හස්ත්‍යලඞ්කාරයෙන් සරහනලද මඟුලැතක්හු පිටට පැනනැගී මැණික් ඔබා කරණලද රුවන් සන්නාහ සන්නද්ධව හියක් නිය පිට ලා ධනුශිල්පයෙහි දක්ෂවූ සන්නාහ සන්නද්ධ අනේක ප්‍රකාර යෝධයන්ට මෙසේ විධානකෙරෙමින් නුවරට සම්පවිය”යි වදාළසේක.

ඒ රජහු සේනාව මෙහෙයූ පරිදි මේ ගාථාවෙන් වදාළසේක.

හත්ථාරොහෙ අනීකට්ඨෙ, රථිකෙ පත්තිකාරිකෙ;
උපාසනම්හි කතහත්ථෙ, වාලවෙධෙ සමාගතෙ.

* මෙවිට චූලනී රජ්ජුරුවෝ වේදේහරජ ජීවග්‍රාහයෙන් අල්වාගන්ට ආඥා කරන්නාහු “ඇතුන් නැගෙන්නාවූද අසුන් නැගෙන්නාවූද රථ නැගෙන්නාවූද පංච යුධ සන්නද්ධව ආවාවූ මහසේනාවද; ඉනුත් ධනුශිල්පයෙහි දක්ෂවූ කෘතහස්තවූ එක්වන් කරණලද අභ්‍යාස ඇති එසේ හෙයින්ම, කළු හස් ලොම කරබටුවක් බැඳ දඬු වස්නා මාත්‍රයේ දෙදණ්ඩක් හිඳුවා එහි සරස බැඳි වියල දණ්ඩේ බැඳ එල්වූ කර බටු විදුලිය ආදිවූ යම් කිසි ආලෝකයකින් බටුව එල්වූ කළු අස්

* ඉදනිරාජාවෙදෙහං ජීවගාහං ගණ්හාපෙතුං ආණාපෙන්තොආහ.

ලොම පළාවිද පියත්ට සමර්ථවූ යෝධයෝ වහා සන්නද්ධව එත්ව"යි කියාද— තවද චූලනී රජ්ජුරුවෝ "වෛදේහරජ නොමරා අල්වාගන්මියි කියමින් සැට අවුරුද්දෙන් මදහෙන්නාවූ මට සිළුවූ දළු ඇති කුංජරයයි කියනලද බලසම්පන්න යෝධ ඇත්සමූහයන් සියදහස් ගණන් මෙහෙයා මෙම "වෛදේහරජු නිසා මහෞෂධපණ්ඩිතයා විසින් කරණලද මේ උපකාරීත්වවර අටලොස්රියන් පවුර මිරිකාපියව"යි කියාද— "තවද බාලවස්සන්ගේ දත්සේ ඉතා සුදුවූ තියුණු මුවහත් ඇති විදිනාකල ඇටපළා විදපියත් මුත් මැතක නොරඳවන්නාවූ ධනුශිල්පයෙහි දක්ෂ යෝධයෝ මහා වර්ෂාවක් පරිද්දෙන් ශරවර්ෂා වස්වත්වයි; තවද සූරවීරිය ඇති තරුණ යෝධයෝ අනේකප්‍රකාර විචිත්‍රවූ පංචායුධ සන්නද්ධව සඞ්ග්‍රාමයෙහි එඩි පසුනොලා ඉදිරියටම දිවන්නාවූ තමන් ඉදිරියෙහි ඇතුන් දුටත් දළු අල්වාගෙණ වෙවුල්වාපියන්ටත් සමර්ථවූ යෝධයෝ වහා එත්වයි— තවද ආයුධම බලකොට ඇත්තාවූ නොහොත් බලවත් ආයුධ ගත්තාවූ සන්නාහ සන්නද්ධවූ සටනෙහි පිටිපා නොයන්නාවූ මාගේ යෝධයන් අතින් වෛදේහරජ කෙසේනම් මිදී පලායන්නේද? ඉදින් යම් කිසි භාග්‍යයෙකින් පක්ෂියෙකු පරිද්දෙන් ආකාශයෙන් යේ නමුත් මාගේ දුනුවා යෝධයෝ යා නොදෙන්නාහ, තවද මාගේ තිස්නවදහසක් පමණ බලසම්පන්නවූ අසමාන යෝධයෝ සඞ්ග්‍රාමයට සිස්අතින් ගියාහු වී නමුත් සතුරන් අත ආයුධම උදුරාගෙණ සතුරන් සාධාගන්නාහ; උන් සමාන එකෙකුත් දඹදිව එක් රජක්හු සමීපයෙහිත් මා දකින්නේ නැත; එබඳුවූ යොධයන් ඇත්තෙම් මමය; උයිත් සන්නාහ සන්නද්ධව වහා එත්වයි. තවද රන් සන්නාහයෙන් සරහනලද බලසම්පන්න ඇතුන්පිට උන්නාවූ මනාවූ දැකුම් ඇති රාජකුමාරවරු වහා ඇතුන් මෙහෙයත්වයි. තවද රන්වන් පිළී ඇඳ සර්වාලඞ්කාරයෙන් සැරහී රත්වන් අංගරාග ගල්වා පංචායුධසන්නද්ධව රන්සැත් රන්පොරොදු ආදි සර්වාලඞ්කාරයෙන් සරහනලද ඇතුන් නැගී නඳුන්වන උයන්හි දේවතා සමූහයක් මෙන් අසමානවූ යෝධයෝ සියදහස් ගණන් වහා එත්වයි, තවද පෙටියන් බඩපැහැ සමාන වර්ණඇති සකස්කොට ධාරා නගණලද නුවණැති පුරුෂයන් විසින් සුවිනීතකොට තුන්සනගා නිමවනලද ඉදින් සුළඟින් මුවහතට සම්ප්‍රාප්තවූ පුළුන්රළු උවත් කැපී සිඳී යන තරම්වූ තීක්ෂණවූ මුවහත් ඇති මධ්‍යාහ්නයෙහි සූර්ය්‍යමණ්ඩලය මෙන් බබලන්නාවූ යහපත්කොට කරණලද කඩු ගත්තාවූ (ඒ කෙසේවූ කඩු ජාතියෙක්ද යත්? ජාතිවාණේ කැටි පිහිරින් ගා සුණුකොට ඒ සුණු දඩමස් හා එක්කොට අනා ඒ මස් කොස්ලිහිණියන් කවා උන් ලූ වසුරුදවා වාණේ ගෙණ, නැවත ගා හනා පළමු පරිද්දෙන් ඒ පක්ෂීන් කවා එම පරිද්දෙන් සත්වාරයෙක කවා දවාගත් වාණයෙන් කළ කඩු ජාතියෙකැයි

දතයුතු). යෝධයෝ සතුරන්ට නොවරදවා පාරදෙන්නාහු කොපු වෙන් අදනාලද කඩු ගෙණ වහා එත්වයි, තවද මාගේ අසමානවූ තිස්නව දහසක් පමණ පතාක යෝධයෝ වහා එත්වයි (ඔහු කෙසේවූ යෝධකෙනෙක්දයත්? යම්සේ මාරසේනාවක් බඳුවූ සතුරු සේනාවක් අගල පවුරු අට්ටාල බලකොටු වාසල් සහිතවූ අයොධ්‍යපුරය හා සමාන එක් නුවරෙක උන්නාවූ නමුත් මේ මාගේ පතාක යෝධයෝ ඉන් පිටත සිටියාහු එබඳු අවිෂය ස්ථානයෙහි සිටි සතුරන් සාදම්හ'යි සිතූනම් පිටත සිටි තැනම සිට ආකාශයට කරණම් පැන එසේ උඩපිනූ කරණමින්ම නැවතත් බිම නොහී නැවත නැවත කරණම් පනන්නාහු ආකාශයෙන් ගොස් අත තුබූ ආයුධයෙන් ඇතුළුනුවර උන් සතුරන් සාදා නැවත එප රිද්දෙන්ම කරණම් පැන පැන ආකාශයෙන් අවුත් තමන් පළමු සිටි තැන සිටිනට පෝසත්හ. ඒ යෝධයෝ, ඉදින් ඇත්කඳ වී නමුත් තමන්ගේ කඩුවෙන් එකපහරින් මැදින් පොළුගසන්නට සමර්ථයහ;) එම්බල වෛදේහකොල්ල පළමු තාගේ ගොවියාපුතුගේ මන්ත්‍රිකමින් හා ඔහුගේ ප්‍රඥානුභාවයෙන් ගැලවිත, දූන් වූ කලී තට මිදීයාමෙක් නම් කොයින්ද? දූන් තාගේ රාජානුභාවයත් තාගේ මන්ත්‍රිකමුත් මින් ගැලවී මියුලු නුවරට යාමත් බලන්නෙම්වේද? දූන් තෝ කරපු හෙලාගත් මසෙකු පරිද්දෙන් අසුවූයෙහි වේදැ"යි කියා වෛදේහ රජහට තතනමින් 'දූල්හි අසුවූ මසෙකුමෙන් දූන් අල්වමියි වජ්‍රාඞ්කුශයෙන් ඇතුමෙහෙයන්නාහු 'ගනුව* බිඳුව විදුව'යි කියකියා සෙනග මෙහෙයන්නාහු උපකාරී නුවර මැඩ වතුරක් ගලන්නාක් පරිද්දෙන් අවුත් වත්හ.

ඉක්බිති බෝධිසත්ත්වයන්වහන්සේගේ චරපුරුෂයෝ තමන් තමන්ගේ ආණ්ඩුපිරිස හා සමග "කවුරු දනිද්ද කිම්ද ඉදින් පවුරු බිඳ නුවර මිරිකාගෙණ වදිත්නම් ඒ සියයක් රජුන් හා බ්‍රහ්මදත්තයන්ගේ ඉස් ගසාලා අපගේ පණ්ඩිතස්වාමින්ගේ පාපිට දමාලම්හ"යි තමතමන් සිටින්නාවූ රජදරුවන් පිරිවරා ගත්හ. එවේලෙහි තුන්ලෝ තිලකවූ ත්‍රිලෝකෛකගුරුවූ පරශත්‍රු මර්දනවූ ප්‍රතාප හා ගම්භීර ප්‍රඥාවිශෙෂ ඇති සකල ගජවක්‍ර මර්දනයට භාස්වර කේසර සිංහරාජ වික්‍රමඇති මාගේ ස්වාමිදරුවූ ශ්‍රීමහා බෝධිසත්ත්වයන්වහන්සේ රෑ සැතපුණු ශ්‍රියහනින් නැගී සිට ශරීරකෘත්‍ය සපයා පෙරවරු බත කල් තබා අනුභවකොට, රන්පට රුවන්සෝළු කණ්ණකුණ්ඩල නාඩඞ්ක නාගවඩම් කාදුකාප්පු මුතුපට පටෝඩම් බාහුදණ්ඩි මිණිවලලු ගිගිරිවළළු මණිකයිවඩම් පස්රුරුවන්වැල රන්සවඩි පාදසඞ්ඛලා පාදාභරණ පාසලඹ පාදකිංකිණික පාදජාලා මේ ආදිවූ ආභරණයෙන් සැරහී ලක්‍ෂයක් වටනා කසීසළුවක් ඇඳ ලක්‍ෂයක් වටනා රත්පලසක්

* ගණ්ඨාගණ්ඨි භින්දථ විජ්ඣථාති

ඒකාංශකොට පෙරවා සතරත්මය රුවන් කර්මාන්තයෙන් විසිතුරුවූ සෝළුලියක් අතින්ගෙණ රන් මිරිවැඩිසඟලක් පයලා දෙවඟනන් පරදවන රූ ඇති සර්වාභරණයෙන් සැරහුනාවූ තරුණ ස්ත්‍රීන් දෙදෙනෙකු ලවා සුදුචාමර දෙකක් සල්වනසේක් සිත්කළුකොට සරහනලද තමන්වහන්සේගේ මාලිගාවේ සිව්මැදුරු කවුළුව හරවා චූලනි රජ්ජුරුවන්ට තමන්වහන්සේ පෙණෙන පරිද්දෙන් ශක්‍රලීලාවෙන් ඇත්මැත් බලා * සක්මන්කළසේක. චූලනි රජ්ජුරුවෝ ඒ මහනානන්වහන්සේගේ රූපශ්‍රී බලා සිත පහදවාගතනොහි 'දූන්ම මොහු අල්වාගනිමි' සිතා වහ වහා ඇතු මෙහෙයන්නාහ.

ඒ දැක පණ්ඩිතයන්වහන්සේ සිතනසේක් ''මේ රජ ඒකාන්තයෙන් වෛදේහයා මා විසින් අසුකරණලද්දැ'යි සිතා වහ වහා ඇතු මෙහෙයමින් එන්නේමය, තමන්ගේ අඹුදරුවන් ඇරගෙණ අපගේ රජ්ජුරුවන් මියුලුනුවර ගිය නියාව 'නොදන්නේ''යි සිතා, ''සකස්කොට ඔප් නැගූ රන්කැටපතෙක පැහැ සමානවූ මාගේ මුහුණ මේ රජුට දක්වාලා රජු හා සමග කථාකරමි '' සිතා සිව්මැදුරුකවුළුවෙන් රජහු මුහුණ බලා මධුරස්වරයෙන් රජහු හා කථාකරණසේක් මෙසේ වදරණසේක—

කිනන්නු සන්තරමානොව, නාගං පෙසෙසි කුඤ්ජරං;
පහට්ඨරූපො ආපතසි, ලද්ධත්ථොස්මීති මඤ්ඤසි.

ඔහරෙතං ධනුං චාපං, ඛුරප්පං පටිසංහර;
ඔහරෙතං සුභං වම්මං, වෙළුරියමණි සන්ථතං.

''ඇයි මහරජ ඉක්මන් ඉක්මන්ව ඇතු මෙහෙයනසේක් තමාගේ අභිමානාර්ථය සිද්ධවීයයි සිතනසේක්ද? එකවිටෙකත් එසේ නොසිතුවමැනව, මහරජ නුඹවහන්සේ සිත ඇත්ත තබා පියා මෙවිට මා කීවක් කළමැනව; ඊයේ දවස් පස්වරු දුනුම්ට තරව අල්වාගත් අත තවදක්වා මිට මිරිකාගැන්මෙන් සිරිහිගියයි සිතමි, එසේහෙයින් තෙල දුනුර්තල දමාපුවමැනව, එසේ නැත අනිකක්හට හෝ දෙවාපුවමැනව, තවද වෛඩූර්යමාණික්‍යමය කොට කරණලද ඉතා ශෝභමානවූ තෙල සන්නාහයත් ඊයේ පස්වරුම ලාගත් හෙයින් ශරීරය ඉදී නුඹවහන්සේට බොහෝ පීඩායයි සිතමි, නොහොත් ශරීරය පඹුවන් පැහැවීයයි සිතමි, තවද ඊයේම පස්වරු පටන් තුන්යම් රාත්‍රියෙහි නිදිමරා විඩාව ගියසේක. තවද ඉර අවුකා කලාන්ත නොවී නිද නැගී නුඹවහන්සේගේ නුවරට පලාගොස් මාලිගාවේ සුවසේ සැතපී වදාළමැනවැ''යි රජු හා කෙළනා සේ වෙහෙසූහ.

* චඞ්කමි.

රජ්ජුරුවෝ ඔබගේ බස් අසා 'ගොවියාපිත් මා හා කෙළ නේය'යි බෝධිසත්ත්වයන්වහන්සේට ගජ්නාකොට 'තට කළම නාදෑ දූත් දන්නෙම්වේදෑ'යි සැහෙන්නාහු මේ ගාථාවෙන් —

පසන්නමුඛවණ්ණොසි, මිහිතපුබ්බං ච භාසසි
හොන්ති බො මරණෙ කාලෙ, තාදිසී වණ්ණසම්පදා.

මේ ගාථායෙහි අභිප්‍රාය කෙසේදයත් ? තාගේ මුඛය හෙවත් තාගේ මුහුණ ඔප්නැගූ රන් කැටපතක් සේ යහපත්ව බබලන්නේය, සිනා පෙරදරිකොටම බස් කියයි; ඒ තට මතු නොවෙයි, සමහර කෙනෙකුන් මරණාසන්නයෙහි මෙබඳු මිහිරිබස් හා මුහුණ පැහැ ඇතිවන්නේය; දූත් නොසිත් නොබෝකලකින් මියෙයි' එබැවින් මෙබඳු රූපශ්‍රීන් බබලයි; දූත් දූත් තා මරා ඉස කපා ජයපානය බොම්”යි කීහ. මෙසේ රජහු බෝධිසත්ත්වයන් හා දෙඩන වේලෙහි මහතානන්ගේ රූපසෝභාව දුටුවාවූ මහසේනාව අපගේ රජ්ජුරුවන් හා මහෞෂධපණ්ඩිතයන් හා දෙන්න කථාවක් කෙරෙති, ඒ කුමක් බවත් නොදනුම්හ; කොල ! අසන්ට යම්හ”යි එක්සියයක් රජුන් හා සේනාව රජහු සමීපයට ගියහ. මහතානෝ * ද රජගේ බස් අසා සිතනසේක් “මේ රජ තවම මා මහෞෂධ පණ්ඩිත බව නොදනී, මම මා මරාගත නොදෙම්”යි වදරණසේක් “මහරජ යම් දවසක් නුඹවහන්සේ හා කේවට්ටයා හා දෙන්න සිතින් එකක් සිතා බසින් එකක් කියා කළ මන්ත්‍රණයෙක්විද එයින් සිතින් සිතුවා නොවිය, බසින් කීවාම වියයි ප්‍රකාශකරමින් —

මොඝං තෙ ගජ්ජිතං රාජ, භින්නමන්තොසි ඛත්තිය;
දුග්ගණ්හා හි තයා රාජ, බලුඛෙකනෙව සින්ධවො.

තිණ්ණගිරාජ්ගංගං සාමච්චොසපරිජ්ජනො
හංසරාජංයථාවකො අනුජවංපපතිස්සති

මෙයින් වදාරා “මහරජ නුඹවහන්සේ හා කේවට්ටයා හා දෙන්න මතුමාලේ තනිව ශ්‍රීයහන් ගබඩාවේ හිඳ රහස් මන්ත්‍රණයක් කළාහුය. 'අප දෙන්නාමුත් අනික් දන්නෝ නැතැ'යි සිතා කළ ඒ මන්ත්‍රණය නොදනිත්යි සිතූසේක්ද ? එසේනොසිතුව මැනව, ඒ මන්ත්‍රණය මට කියාලූ දෙයක්සේ ඉඳුරාම දනිමි, නුඹවහන්සේගේ මන්ත්‍රණය භින්නව ගියේය, එසේහෙයින් අපගේ රජ්ජුරුවෝ තමන්ගේ නුවරට පලාගියෝය. ඉදින් 'ලුහුබඳවා ගනිමි' සිතනසේක් වීනම් එයින් නොපිළිවන, අපගේ රජ්ජුරුවෝ ජාතිසෛන්ධවයෙකු නැගී බලවත් ආකාශචාරයෙකු වැන්නාහ, නුඹවහන්සේ කොටළුවෙකු නැගී ඉතා බාන සුලුවූ පුරුෂයෙකු වැන්නාහ, එසේ හෙයින් ලුහුබඳවා අල්වාගන්ට නොපිළි

* පණ්ඩිතොපි තස්සකථංසුත්වා.

වන, කේවට්ටයා කොටළුවා වැන්න, නුඹවහන්සේ කොටළුවා නැගි පුරුෂයා වැනිසේක, මම අජිනිය සෛන්ධවයා වැන්නෙමි අපගේ රජ්ජුරුවෝ ඒ සෛන්ධවයා නැගි පුරුෂයා වැන්නාහ"යි උපමාකොට වදාළසේක. "මහරජ වැලිත් ගෑහින් එතරව යන්නාහු තනිව ගියාහු නොවෙති, සේනාවාහන සහිතව අමාත්‍ය මණ්ඩලයා පිරිවරා මහ පෙරහරින් වැඩිසේක, ඉදින් නුඹවහන්සේ 'ලුහුබඳවා අල්වාගනිමි'යි සිතා දිවනසේක් ඒනම් අල්වාගතනොහී අතරමග නස්නාසේක; කුමක්මෙන්ද යත් ? සුවණී හංසයෙකු ලුහුබඳවා දිවන කොකෙකු මෙනැ"යි කියා නැවතත් අසම්භිත කේශරසිංහරාජයෙකු පරිද්දෙන් උපමාවක් දක්වමින්-

සිගාලා රත්තිභාගස්මිං, ඵුල්ලං දිස්වාන කිංසුකං,
මංසපෙසීති මඤ්ඤන්තා, පරිබ්බූළ්හා මිගාධමා.

වීතිවත්තාසුරත්තීසු උග්ගතස්මිං දිවාකරෙ,
කිංසුකං ඵුල්ලිතං දිස්වා ආසංජින්නාමිගාධමා.

එවමෙව තුවං රාජ, වෙදෙහං පරිවාරිය;
ආසච්ඡින්නො ගමිස්සසි, සිගාලා කිංසුකං යථා.

"මහරජ නුඹවහන්සේ මේසා සේනාවක් ඇරගෙණ තුන්යම් රාත්‍රියෙහි නිදිමරා සිතූ අර්ථයෙන් ස්වල්ප මාත්‍රයකුත් සාධාගත නුහුනු නියාව කුමක් මෙන්ද යත් ? යම්සේ ගොදුරු සොයා ඇවිදිනා සිවල් මුලෙක් සුපුෂ්පිතවූ කැලවෘක්ෂයක චන්ද්‍රාලෝකයෙන්වත් තාරකා ලෝකයෙන්වත් විජ්ජුලතාදියෙන්වත් යම්කිසි ආලෝකයකින් එලෙන්නාවූ මල්කැන් දැක 'මේ වූකලී ඒකාන්තයෙන් මස්වැදලිය'යි වරදවා සිතාගත්තාහු අනික් ගොදුරක් සොයා නොගොස් 'දඩමස් කම්හ'යි ගස් වටකොට හිඳ අරුණු නැගී පහන්වූකල සුපුෂ්පිතවූ කැලමල් දැක ඒ ශෘගාලයෝ ඔවුනොවුන්ට 'කොල ! මස්වැදලි නොවෙයි, කැලමල්කැනැ'යි නියම දැන එහි ආලය හැරපියන්නාහ, එපරිද්දෙන් මහරජ නුඹවහන්සේ 'වේදේහරජ අසුකෙලෙමි' සිතා රාත්‍රිය මුළුල්ලෙහි නිදිමරා ඇවිද අධමවූ කැනහිලුන් පරිද්දෙන් අපගේ රජ්ජුරුවන් කෙරෙහි ආලය හැර යනසේක් වේදැ'යි වදාළසේක.

රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්වහන්සේ කිසි චකිතයක් නැතිව නිර්භීතව කියන්නාවූ බස් අසා සිතන්නාහු "මේ ගොවියාපිත් බුහුටිව 'රජහු පැළහ'යි කියන්නේය, මොහු විසින් රජහු යවාපුවෝ සැබැ සැටිය"යි අතිශයින් කිපී 'පෙරත් අපි මේ ගොවියා පුතුම නිසා මොහුගේ නුවරට ගියමෝ හත්කඩට උතුරුසළුවටත් අස්වාමිකව දමාපියා ආම්හ, දූත් හස්තප්‍රාප්තවූ පසමිතුරා පලවාපියනලද, මූ තරම් අනර්ථකාරි එකෙක් නැත, රජුටත් මූටත් කළමනා ඉස්සිඳීම් ආදිවූ යම් වධයක් ඇත්නම්, මොහුටම කො

රෙමි"යි විධාන කරන්නාහු "මේ මහෞෂධයා මා හස්තප්‍රාප්තවූ සතුරු වේදේහරජහු ගලවා යවාපිය, එසේකළාවූ මොහුගේ දෑත් දෙපා කන් නාසා කපා හරුව, ඇඟමස් කපා ලියා උළ අවුණා ගිත්තේලා පලහාපියව, තවද සිංහ ව්‍යාඝ්‍ර වෘෂභ මෘග ආදීන්ගේ සම් බිම වනා එට කණු ගසා වියලන්නාහ, එපරිද්දෙන් මේ මහෞෂධයා බිමහොවා සතර අතට කණු ගසා වධකරව, තවද මොහු බිම හොවා තියුණු මුවහත් ඇති කඩුවෙන් කොටා පළා ව්‍යාඝ්‍ර මෘග සූකරාදීන්ගේ මාංස පරිද්දෙන් ඉරා ලියා වධකරව"යි කීහ.

මේ එක් රජෙකු තබා දසදහසක් සක්වළ රජදරුවෝ එක්වත් මාගේ ස්වාමිදරුවානන්ට එවැන්නක් කරන්ට අසමර්ථයහ, ඒ රජහුගේ බසමුත් කීවායින් කිසිවකුත් කළ නොහෙන්නාහ. බසින්වූ බස් අසා බෝධිසත්වයන්වහන්සේ සිනාපහළකොට වදළසේක; ඒ රජහු කිපෙත් කිපෙත් මාගේ ස්වාමිදරුවානන් මූණ පෙම් වඩනා නියාව කුමක් වැනිද යත්? බ්‍රහ්මදත්තරජහුගේ ඉතා රළුවූ ක්‍රෝධ නැමති සුත්තෙන් උළා ඔප්නැගූ රත් කැටපතක පැහැ සමානව වඩ වඩා සෝභාමත්ව අතිශයින් බබලන්ට වන, එවිට සිතනසේක් "මේ නුවණනැති රජ තමාගේ නෑසත් ආගියබැව් නොදැන මට වධ විධානකරන්නේය, මෑනියනුත් අඹුදරුවනුත් ගෙන්වාගෙණ, මියුළුනුවරට යැවූ නියාව නොදැන මට සැහෙන්නේය, මේ රජ මහා ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටා සිටියේ මා කළ දෙයක් කෙළේය'යි සිතා ක්‍රෝධ වශයෙන් අත තිබූ හියෙන් විදපී නමුත් අන් කිසි උපක්‍රමයකින් නසාපී නමුත් නපුර * මේ රජහු ශෝකයෙන් මූර්ඡාකරවා උන් ඇතුපිටම විසංඥ කරවා පියා නැවත අස්වසාලන්නෙමි" සිතා වදාරණසේක්—

සචෙ මෙ හත්ථ පාදංච කණ්ණනාසංච ඡේදයී,
එවං පංචාල චණ්ඩස්ස, වෙදෙහො ඡේදයිස්සති.

සචෙමෙහත්ථපාදං චකණ්ණනාසංචඡේදයී,
එවං පංචාලචණ්ඩියා වෙදෙහො ඡේදයිස්සති.

සචෙ මෙ හත්ථපාදංච, කණ්ණනාසංච ඡේදයී,
එවං නන්දාය දෙවියා, වෙදෙහො ඡේදයිස්සති.

සචෙමෙහත්ථ පාදංච කණ්ණනාසංචඡේදයී,
එවංතෙපුත්තාදරස්ස වෙදෙහො ඡේදයිස්සති.

සචෙමංසංච පාතබ්බං සූලෙකත්වා පචිස්සසි,
එවංපංචාලචණ්ඩස්ස වෙදෙහො පාචයිස්සති.

සචෙ මංසංචපාතබ්බං සූලෙකත්වා පචිස්සසි,
එවංපංචාලචණ්ඩියා වෙදෙහො ඡේදයිස්සති. †

* සොකාතුරං වෙදනාමත්තං කත්වා, හදයපිණ්ඩයෙව තං විසඤ්ඤං නිප්පජ්ජාපෙතුං, තංකාරණං ආරොචෙස්සාමීති.

† මෙතැනට තව ගාථා කීපයක් තිබේ.

"මහරජ ඉදින් නුඹවහන්සේ මාගේ අත් පා කන් නාසා කප්පවා වධ කරවූසේක් වීනම් නුඹවහන්සේ මට කරවූ වධ මුළුල්ල නුඹවහන්සේගේ පුතනුවන් දියනියන් නන්දාදේවීන් නුඹවහන්සේ වැදූමෑනියන් යන සතරදෙනාට අපගේ රජ්ජුරුවෝ අත් පා කන් නාසා කපා වධ කරවන්නාහ. මහරජ මාගේ ඇඟමස් ලියා උල අවුණා වධ කරවූදෑ වීනම්, අපගේ රජ්ජුරුවෝත් නුඹවහන්සේගේ නෑයන් සතරදෙනාට මට කළ වධයට දිවුණක් කරවන්නාහ. තවද සිංහ ව්‍යාඝ්‍ර මෘග වෘෂභාදීන්ගේ සම් බිම වනා කණු ගසා වියලන්නාසේ මට වධකරවූදෑ වීනම්, නුඹවන්සේගේ නෑයන් සතරදෙනාටත් අපගේ රජ්ජුරුවෝ නොයෙක් චිත්‍ර වධකරවන්නාහ, තවද මහරජ සම්කරුවන් ලවා සම් සියක්පටින් සකස්කොට කරවා වැළඳගන්නාලද සන්නාහය තමහට බැහැරින් වදනා සැර ආදි උපද්‍රව නිවාරණයකොට ආත්ම රක්ෂාව පිණිස වන්නේද—එපරිද්දෙන්ම මම මාගේ රජ්ජුරුවන්ට සම් සියක් පටින් කළ සන්නාහයක් පරිද්දෙන් ඉදිරිවසිට කිසි භයක් නොවැද්දදී සැප එළවමි"යි වදාළසේක.

මෙසේද කියා නැවත වදාරණසේක් "මහරජ වැලිත් මේ නිකම් කියන දෙයෙකැයි නොසිතුව මැනව, නුඹවහන්සේගේ අඹුදරුවන් හා මෑනියන් අපගේ රජ්ජුරුවන්ට පාවාදී මියුළුනුවරට යවන්නෙම්, මහරජ ඉදින් චූළනී රජ්ජුරුවෝ 'නුඹවහන්සේ තමන්ට සොරා යවාපීහ'යි මා අල්වාගෙණ කන් නාසා අත් පා කප්පවා වධකරවූ නම් කුමක් කරණසේක්දැයි කී හෙයින් 'මහෞෂධපණ්ඩිතයෙනි තොපට සැබවින් වධයක් කළේවීනම් ඒ තොපට කළ වධ මුළුල්ල ඒ රජ තමා මහබල ඇති හෙයින් ඕහට කළ නොහෙතත් ඔහුගේ අඹුදරුවන් මෑනියන් යන සතරදෙනාට, තොපට කළ වධයට දිවුණක්ම කරවමි' කියා ප්‍රතිඥ ගනිමියි කියා සැබවින් මහරජ නුඹවහන්සේ මා එක තැනැත්තවූට එක් වධයක් කරවූසේක් වීනම් නන්දාදේවීන් හා දරුවන් දෙන්න ඇතුළුවූ නෑයන් සතරදෙනාටත් අපගේ රජ්ජුරුවෝ තමන්ට පිළිවන් වධබන්ධන කරවන්නාහ"යි වදාළසේක. මෙසේද කියා මහරජ "නුඹවහන්සේගේ ප්‍රඥ නැමැති සියට මම සම් සියයක් පටින් කළ සන්නාහයක්ව ඉදිරිව සිට මාගේ රජ්ජුරුවන්ට ඒ සැරයෙන් වන්නාවූ උපද්‍රව දුරුකොට සැපයක්ම කෙරෙමි"යි වදාළසේක.

ඒ ඇසූ චූළනී රජ්ජුරුවෝ සිතන්නාහු "මේ ගොවියාපුත් කුමක් කියාද ? මම යම් වධයක් තමාට කරවමි කීම්නම් මේ තෙමේ තමාගේ රජ්ජුරුවෝ මාගේ අඹුදරුවන්ට කරවන්නාහයි කියයි, මම ඊයේ එන්නෙම් මාගේ අඹුදරුවන්ට සුරක්ෂිතකොට

රූකවල් ලවාලා ආමි, ඒ නියාව නොදන්නා වන, නොබෝ කලකින් මේ මියන්නේය, එබැවින් මරණ විකලයෙන් නන්දෙඩ"යි කියා මහතානන්ගේ බස් නොඇසූහ.

පරසිත් දන්නා නුවණැති මාගේ බෝධිසත්වයන්වහන්සේ රජු සිතුවා දැන "මේ රජ මා මරණභයින් නන්දෙඩයි සිතයි, සැබැවින්ම අඹුදරුවන් මියුලු නුවරට යැවූ නියාව දන්වාලම්" සිතා වදුරණසේක් "මහරජ * මූ මරණභයින් නන්දෙඩත්යි සිතූ බැවින් මාගේ බස් අදහන පිණිස මිනිසුන් යවා මාලිගාව බැලවුවමැනව, නන්දාදේවීන් හා දරු දෙදෙනා හා නුඹවහන්සේගේ මෑනියන් ඇතුළුවූ නෑයන් සතරදෙනා සුළුඋමගින් බාගෙණ වෙදේහ රජ්ජුරුවන්ට පාවාදී මහඋමගින් මියුලු නුවරට යවාපියනලද්දහු, මෙතනට සාරසියයක් ගව් ගෙවා මියුලුනුවරට යන්නාහ"යි වදාළසේක.

එවිට රජ්ජුරුවෝ සිතන්නාහු "පණ්ඩිතයෝ ඉතා බුහුටිවම කියන්නාහ, † මධ්‍යම රාත්‍රියෙහි ගංතෙර රූකවල් බලා ඇවිදින මා විසින් නන්දාදේවීන්ගේ වැනි ශබ්දයක්ද අසනලද, මේ පණ්ඩිතයෝත් එසේ මෙසේ කෙනෙක් නොවන්නාහ, මූන් හා සමාන ප්‍රඥාඇති කෙනෙක් කොයිත් නැත්තාහ, එබැවින් මූන්ගේ බස් සැබෑ සැටිය"යි උපන්නාවූ බලවත් ශෝක ඇත්තාහු රාජධෛර්‍ය්‍ය උපදවාගෙණ නිශෝකී එකක්හු මෙන් එක් අමාත්‍යයෙකු කැඳවා මාලිගාව බලවන්නාහු "එම්බා දරුව මේ මහෞෂධ පණ්ඩිතයෝ කියන්නෝ 'මාගේ අඹුදරුවන් ආදිවූ අවශ්‍යබන්ධූන් සතරදෙනා උමගින් ගෙන්වා තමා රජ්ජුරුවන්ට පාවාදී මියුලු නුවරට යවාපීමි' කිවූය. උන්ගේ බස් සැබෑද බොරුද පරීක්ෂාකොට පියා වහා එව"යි ‡ ගාථාවකින් කීහ.

ඒ අසා අමාත්‍යයා සේනාව පිරිවරා ගොස් දොර හැර ගෙට වැද, ඒ රජගෙයි අත් පා බැඳ කට කඩරෙදි ඔබා භිත්ති කොකුවල එල්වාපියා තුබූ පුර රකින්නන් කුදුන් කුරුන් ආදිවූවන්ද, බඳුන් බිඳ ඒ ඒ ස්ථානයෙහි විසුරුවා පියා තුබූ කන බොනදෑද, රුවන් ගබඩාවල දොර හැර බිඳපියා රුවන් උකාගත් තැන ඉසපියා තුබූ රුවන් සමූහද, දොරහැර තුබූ ශ්‍රීයහන් ගබඩාද, එසේම ඇරපියා තුබූ සිව්මැදුරු කවුළුවෙන් ඇතුළට වැද උනුනුන් කටින් පූ උදුරා කන්නාවූ කාරූස් බැඳ ඇවිදිනාවූ කපුටු සමූහයාද, මූදු

* අයංමමහයෙන කථෙතීති.

† මයාරත්තියාභාගෙ ගං ගායපසෙස
නන්දාදෙවියා සද්දොපිසුතො.

‡ ඉංසඅනෙතාපුරං මයෑහං ගන්ත්වාතවිචිනාථනං
යථාඉමස්සවචනං සච්චංවායදිවාමුසාති.

බඩ කෙවුලන් හැරපියා ගිය සැඩිගමක් සේද, අමුසොහොනක් සේද, ඉතා නිශ්‍රීකවූ රාජභවනය බලාපියා ඇවිත් කියන්නේ— * "මහරජ යම්සේ මහෞෂධ පණ්ඩිතයෝ කිවුද, උන් කිවායින් එක බසකුත් බොරු දෙයෙක් නැත, ඒ සැබෑමය, පෙර නුඹවහන්සේගේ මාලිගාව දිව්‍යපුරයක් වැන්නැයි සිතමි, එසේවූ රජගෙය දූත් මූදුතෙර කෙවුලන් ඇරපියා ගිය ගමෙක මස්ගඳට හැසිරෙන්නාවූ කාකසමූහයක් සෙයින් ඒ මාලිගාව කපුටු සමූහයන්ගෙන් අතුරු සිදුරු නැතිව තුබුයේය, ඒ රජගෙයි නුඹවහන්සේගේ අඹුදරුවෝත් මැනියෝත් මා දුටුවෝත් නැත, ආගියතෙනක් ඇසුදැත් නැතැ'යි පණ්ඩිතයන් කියේ සැබෑමය"යි කිය. රජ්ජුරුවෝ නැයන් සතරදෙනාගේ වියෝදුකින් කම්පිතව වෙව්ලන්නාහු මේ දුක්ඛය ගොවියාපුතු නිසාම මට වූයේය'යි දණ්ඩෙන් පහරණලද ආශීවිෂයෙකු පරිද්දෙන් බෝධිසත්ත්වයන් කෙරේ පළමු තරමටත් වඩා ක්‍රෝධ ඉපදවූහ.

බෝධිසත්ත්වයන්වහන්සේ රජුගේ ආකාරයෙන්ම දැනලා සිතනසේක් "මේ රජ්ජුරුවෝ මහා යසස් හා කීර්ති හා පරිවාර ඇත්තාහ, යම්සේ ක්‍රෝධවශයෙන් තමාට මතු මා නිසා වන්නාවූ අභිවෘද්ධි නොසලකා රාජමානයෙන් † 'ඔවුන්ගෙන් මට ප්‍රයොජන කිම්දැ'යි නොසොයා මට හිංසාවක් කළෝනම් නපුර, නුවණනම් මෙසේවූ තැනට වේද, උපායකින් මේ රජු මා කරා නමාගන්මි"යි සිතා නන්‍දාදේවීන් පෙර මේ රජු නුදුටුවිරූ කෙනෙකුන් මෙන් ඒ බිසවුන්ගේ රූපශ්‍රී වර්ණනා කෙළෙම්නම් බිසවුන් සඳහන් කරන්නාහුට 'මේ මහෞෂධ පණ්ඩිතයන් මරාපීම්නම් එබඳු මාගේ ස්ත්‍රිරත්නය නොලබන්නෙමි, උන් මැරීම්නම් ඒකාන්තයෙන් නැයන් සතරදෙනා නොලබන්නෙමි' සිතා තමන්ගේ බිසවුන් කෙරේ කළ සෙනහයෙන් මට කිසි අපරාධයක් නොකරන්නාහ"යි සිතා තමන්වහන්සේගේ ආත්මරක්ෂාව පිණිස මාලිගාවේ මතුමහලේ සිටිසේක්ම සන්ධ්‍යා වලාපටලයක් හස්සෙන් ගැසූ විදුලියක් පරිද්දෙන් පෙරව සිටියාවූ රත්පලස යටින් රන්වන්වූ ශ්‍රී හස්තය මැත්කොට ගෙණ නන්‍දාදේවීන් ගිය මග මේයයි කියන්නාසේ උන්ගේ රූපවර්ණනා කරණසේක් මෙසේ විදාරණසේක.

ඉතො ගතා මහාරාජ, නාරී සබ්බඞ්ගසොභනා,
කොසුම්භ ඵලක සුසොණී, හංසගග්ගර භාණිනී,
මහාරාජ ඉතො නීතා, නාරීසබ්බඞ්ග සොභනා,
කොසෙය්‍ය වසනා.සාමා, ජාතරූප සුමෙඛලා.

---

* එවමෙතංමහාරාජ යථා ආහමහොසධො
සුඤ්ඤං අනෙතාපුරං සබ්බංකාක පට්ටනාකං යථා.

† කිංමෙතෙහීති.

සුරතත පාද කල්‍යාණී සුවණ්ණමණි මෙඛලා
පාරෙවටක්ඛිසුතනු බිම්බොට්ඨා තනුමජ්ඣිමා
සුජාතාභුජංගලට්ඨීව වෙල්ලිව අනුමජ්ඣිමා
දී ඝස්ස කෙසා අසිතාර්සකගග පවෙල්ලිතා

සුජාතාමි ගජපිව හෙමන්තගගිසිඛාරිව
නදීව ගිරිදුගෙසු සංඡන්නා ඛුද්දවෙළුභි
නාගනාසූරුකල්‍යාණී පඨමාතිම්බරුඤ්ති
නෙවාතිදීඝානාරස්සානාලොමානාති ලොමසා.

මෙයින් වදරා "රජ්ජුරුවන්වහන්ස සිව්සැටක් පමණ ස්ත්‍රීලක්‍ෂණයෙන් විරාජමානවූ නන්‍දාදේවී මෙසේගියාහ, කෙසේ ගියාද යත් ? මා විසින් උමගකින් පිටත්කරවා වෛදේහරජ්ජුරුවන් හා කැටිව මියුලුනුවරට යවාපියනලද්, තවද මහරජ නුඹවහන්සේ ඒ බිසවුන් 'කෙසේවූ රූඇති කෙනෙකුනැ"යි සිතනසේක්ද, උන්ගේ උපමාරහිතවූ රූපශ්‍රී විලාසය මා අතින් අසාගතමැනව, ගතරන්පෝරුවක් බඳුවූ ඉතා මට සිලුටුවූ ශ්‍රෝණී ප්‍රදෙශ ඇත්තාහ, බාලහංස පෝතකයන්ගේ ශබ්දය හා සමානවූ මිහිරිවූ ලද බොළඳ ප්‍රියනෙපුල් දන්නාහ, කසීදේශයෙහි රන්කම්කළ තිහිරිපිළි ඇන්දාහ, ස්වභාවයෙන්ම රන්වන් ශරීර ඇත්තාහ, ජාත රූපයෙන් කරණලද මිණිමෙවුල්දම් පැළැන්දාහ. මෙසේ සර්වාංග සුන්‍දරවූ මේ නන්‍දාදේවී මා විසින් මෙසේ යවාපියනලදු"යි වදාළසේක.

තවද අලතා පිරියම්කලාක්වැනිවූ රත්වූ පතුල් ඇත්තාහ, ලදමුවපොල්ලන්ගේ ඇස් හා සමානව, කණට රහස් කියන්ට ගියාක් වැනිව දික්ව, කෘෂ්ණමණ්ඩලය පරෙවියන්ගේ ඇස් මෙන් ඉතා වටව, නිලුපුල්පෙති පරදවන්නාවූ පස්පැ දිස්නා නෙත්‍ර ඇත්තාහ, මනාව විලිකුන් බිඹුවැලසේ රත්වූ අධර පල්ලව ඇත්තාහ, තවද දැහිහුල්පල්ලෙක්හි ගා වැද්දූ සක්කැබලි පෙළක්සේ ශෝභමානවූ දන්තපන්ති ඇත්තාහ, තවද මනාව හටගත් කළුවැල්ලතාවක්මෙන් ඉතා චංචල ගාත්‍ර ඇත්තාහ, සිහින්වූ මධ්‍ය ප්‍රදේශ ඇත්තාහ, තවද ඉතා නිල්වූ දික්වූ සිනිඳුවූ අක්බඹුරුවූ කේශකලාප ඇත්තාහ, තවද අභිනව මෘගාඩගනාවක්සේ ඉතා යහපත් බැලුම් ඇත්තාහ, තවද හේමන්ත කාලයෙහි ගිනිකඳක් සේ ඉතා පැහැපත්ව බබලන්නාහ, හෙවත් හේමන්ත කාලයෙහි ගිනිකඳක්මෙන් බැලූ බැලූවන් ඇසට ඉතාප්‍රියවන්නාහ—ඇයි ගිනිකඳක් දුකත් ප්‍රියවෙත්ද යත් ? ඒ මෙසේයයි දතයුතු—හිම සමයෙහි ගින්නක් දුටු කල්හි එහි අත තවාපියන්නට නොසිතන කෙනෙක් නැත්තාහ; එසේපැහැපත්වූ වහ්නිරාශියක්මෙන්

සියලු රූපශ්‍රීන් බබලන්නාවූ ඒ නන්දාදේවීන් දුටුයේ නම් උන් ප්‍රාර්ථනා නොකරණ එකද පුරුෂයෙක්ම නැත. තවද පර්වත ප්‍රාන්තයෙන් හුනු ගංගාවක් දෙඟිනාත්යෙන් දියට ගී එකපිට ගමන්ගෙණ සිටි සිහින් නල කොල සමූහයෙන් හොබනිද එපරිද්දෙන්ම ඒ බිසවුන් ඇඟ තුනුවූ නොදික්වූ නිල්වූ එකඟි සිටියාවූ රෝම රාජියෙන් හෙබියාහ.

තවද ඒ නන්දාදේවී ඡවිකල්‍යාණය මාංසකල්‍යාණය වයඃකල්‍යාණය දන්තකල්‍යාණය අස්ථිකල්‍යාණය යන ඉතා ආශ්චර්‍ය්‍යවූ පංචකල්‍යාණයෙන් යුක්තයහ. තවද ඉතා යහපත් සවර්ණඵලකයෙක්හි තබාලූ රන්තිඹිරිඵල දෙකක් සේ ඉතා සන්තෝෂකරවූ දරුවන් කෙතෙක් ලදත් ආයුෂ කොතෙක් ගියත් සොලොස් ඇවිරිද්දෙහි තන මෙන් ඉතා දෑඩිවූ තනසඟල ඇත්තාහ; ඒ බිසවුන්ගේ තන දෑඩි නියාව කියන්ට කාරණා කිම්ද යත්? යම් ස්ත්‍රියක් දිව්‍යාංගනාවක් සේ යහපත්වූ රූ ඇති නමුත් එසේවූ ස්ත්‍රිය නඛාග්‍රයෙහි පටන් කේශාග්‍රය දක්වාත් ඇගේ සර්වාංගයෙහි ඒ ඒ ස්ථානයෙහි සැරහුවමනා විචිත්‍රවූ නොයෙක් පළඳනාවෙන් අනූනව සැරහී සිටියා නමුත් ඇගේ තනය මෙලෙක්වීනම් පුරුෂයන් ඈ කෙරෙහි කරන්නාවූ සනාසුහත් මෙලෙක් වන්නේය, එබැවින් “බිසවුන්ගේ රූවත් සිත්කලුය, තන දෙකත් ඔවුන් දුටු පුරුෂයන්ගේ සෙන්හය පරිද්දෙන් ඉතා දෑඩිය, එසේවූ සිව්මැලි බිසව් මෙසේ මිසුලුනුවර බලා ගියහ”යි ශ්‍රී හස්තය ඔසවා පෑ වදාළසේක.

මෙසේ ඒ මහතානන්වහන්සේ නන්දාදේවීන්ගේ රූපවර්ණනා කරත් කරත් රජ්ජුරුවෝ නන්දාදේවීන් පෙර තමන් නුදුටුවිරූ කෙනෙකුන් පරිද්දෙන් බලවත් සෙන්හ ඉපදවූහ. රජහුගේ සෙන්හය ආකාරයෙන් දැන වදුරා “මහරජ මෙබඳු රූපත් බිසවුන් මියයාමෙහි සතුටුසේක්ද, උන් මළකල නුඹවහන්සේට කිසි අප්‍රයෝජනයෙක්ම නැද්ද? තවත් උන් මළහොත් මට සන්තෝෂකරය. කාරණා කිම්ද යත්? නුඹවහන්සේ මා මොබදී මරාපු නම් මාගේ රජ්ජුරුවෝ ඔබින් නන්දාදේවීත් මරවාපියන්නාහ. එකල නන්දාදේවීත් මමත් දෙන්නාම යමරජු ළඟට යන්නෙමුය. ඉතා ධර්මිෂ්ඨවූ යමරජ අප දෙන්නා බලාපියා කියනකල ‘පුරුෂයන්ගෙන් මහෞෂධපණ්ඩිතයන් වැනි කෙනෙකුත් නැත, ස්ත්‍රීන්ගෙන් නන්දාදේවීන් වැනි කෙනෙකුත් නැතැ’යි කියා ‘නන්දාදේවි මහෞෂධ පණ්ඩිතයන්ට තරම්හ’යි නන්දාදේවීන් * මටම පාවාදිපියන්නේය; එබැවින් මා මියත් එබඳු ස්ත්‍රීරත්නයක් ලබනකල සෙසු කුමක් නම් මට සිඩනොවේද, එබැවින් මා මියත් මෙහි කිසි හානියක් නැතැ”යි වදාළසේක. බෝධිසත්වයන්වහන්සේ මෙ පරිද්දෙන් නන්දාදේවීන්ම වර්ණනා කළසේක.

* මයහමෙව.

සෙස්සවුන්ගේ නමකුත් නොකීසේක. කුමක්නිසාද යත්? පුරුෂයෝ නම් තමන් ප්‍රිය භාර්‍ය්‍යාවන් කෙරෙහි මෙන් සෙස්සවුන් කෙරෙහි සෙන්හ නැත්නාහ. ඒ නන්‍දාදේවින් සඳහන්කරන් නෝ දරුදෙන්නාත් සඳහන්කරත්මය"යි සිතා, නන්‍දාදේවින්ම වර්‍ණනාකළසේක; තලනාදේවී මැලිහෙයින් උන්ගේ නමකුත් නොවදාළසේක. ප්‍රඥාසම්පන්‍න ඒ මාගේ ස්වාමිදරුවානන් නුවණින් යෙදි මධුරස්වරයෙන් වර්‍ණනාකරන් කරත්ම නන්‍දාදේවී අවුත් තමා ඉදිරියේ පෙණී ගියාසේ වැටහිණ.

එවිට රජ්ජුරුවෝ සිතන්නාහු 'මේ මහෞෂධ පණ්ඩිතයන් හැර අනික් කෙනෙක් නන්‍දාදේවීන් ගෙණවුත් මට දෙන්ට සමර්‍ත්ථ නැතැ'යි සිතුහ. † මෙසේ ඒබිසවුන් සිතන්නාවූ රජහට බලවත් ශෝක උපන්නේය. ඒ බව තමන්වහන්සේ දැන "මහරජ නොසිතා වදාළ මැනව, නන්‍දාදේවීන් පුතනුවෝත් මැතියන්වහන්සේත් තුන්දෙනම එන්නාහ, උන් මිට එන්නට බාධානම් මා නොයන පමණෙක්මය, මා ගියවිටම එන්නාහ"යි වදාළසේක. මෙසේද කියා නැවත වදාරණසේක් "මහරජ මා ඉන්දදී මෙපමණකට ශෝක නොකළමැනව, අස්වැසුන මැනවැ"යි රජහු අස්වසා වදාළසේක, එවිට රජ්ජුරුවෝ සිතන්නාහු "ඉතා ආශ්චර්‍ය්‍ය නියාය—මාගේ නුවර සුරක්‍ෂිතකොට රැකවල් ලවා මහත්වූ බලඇණි පිරිවරා අවුත් මේ නුවර මෙසේ රැකවල් ලාගෙණ සිටියදී මේ පණ්ඩිතයා නුවරින් නන්‍දාදේවීන් ඇතුළුවූ මාගේ නෑයන් සතරදෙනා කිසි කෙනෙකුන් නොදන්නා පරිද්දෙන් ගෙන්වාගෙණ වෛදේහ රජුට පාවාදී අප හැම තමා හුන් මේ නුවර තුන්සම් රාත්‍රියෙහි නිදිමරා රැකවල් ගෙණ සිටියදී අපගෙන් කාත් නොදන්නා පරිද්දෙන්, වෛදේහරජු හා සේනාව නුවරින් පිටත්කොට යවාපිය. දිව්‍යමායමක් දනීද, නොහොත් ඉන්‍ද්‍රජාලයක් දනිද්දෝහෝයි විචාරම්" සිතා කියන්නාහු මේ ගාථාවෙන්කීහ—

දිබ්බං අධීයසෙ මායං, අකාසි චක්ඛුමොහනං,
යො මෙ අමිත්තං හත්ථගතං, වෙදෙහං පරිමොචයි.

"මේ කිමෙක්ද පණ්ඩිතයෙනි මෙසා රාජසේනාවක් වටලා සිටියදී එසේ රැකවල උන් මාගේ නෑයන් සතරදෙනා ගෙන්වා මාගේ සතුරු වෛදේහරජුත් එක්කොට නුවරින් පිටත්කොට යවාපූ තෙපි දිව්‍යමායමක් දනුද, නොහොත් ඇසට ඉන්‍ද්‍රජාලයක් දනුද්දෝහෝ"යි විචාළහ. ඒ අසා මහතානෝ වදාරණසේක් "මහරජ මම දිව්‍යමායමුත් දනිමි, ඉන්‍ද්‍රජාලයත් නොදන්නෙම් නොවෙමි, නුවණැත්තාහු දිව්‍යමායම් ඉගෙණ යම්සේ තමහට භයක් පැමිණිකල ඒ භයින් තුමූත් ගැලවී ආශ්‍රය කළවුනුත් ගලවත්නෝම වේදැ"යි වදාරා මේ ගාථාවෙන් කීහ—

† අථසසතං සරනතසස

අධීයන්තෙ මහාරාජ, දිබ්බමාඨිධ පණ්ඩිතා;
තෙ මොචයන්ති අත්තානං, නිස්සිතෙ මන්තිනො ජනෙ.
සන්ති මානව පුත්තා මෙ, කුසලා සන්ධිඡෙදකා;
තෙසං කතෙන මග්ගෙන, වෙදෙහො මිථිලං ගතො.

මහරජ මා විසින් කළ මායමකුත් නැත, ඇසටලූ ඉන්ද්‍රජාලය කුත් නැත, එසේකල කෙසේ ගියෝදයත්? උමං බිඳීමෙහි දක්‍ෂවූ මාගේ තරුණ යෝධයන් විසින් විසිතුරුකොට සරහනලද උමගකින් වෛදේහ රජ්ජුරුවෝ නුඹවහන්සේගේ නෑයන් ඇරගෙණ මිථුලුනුවරට පලා ගියහ”යි වදාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු “එකෙකු දෙන්නෙකු පවා උමගින් යන කල මහා ව්‍යසනයෙන් දුකසේ පිටත්වන්නේය, මේ පණ්ඩිතයෝ සේනා සහිත රජ්ජුරුවන් උමගින් පැලවයි කියති, ඒ උමග කෙබඳු දෙහෝ”යි උමග දක්නා කැමති වූහ. බෝධිසත්ත්වයන්වහන්සේ රජ්ජුරුවන්ගේ ආකාරයෙන්ම “රජහු උමග දක්නා කැමති සැටිය, උන්ගේ මනදෙළ පුරා උමග දක්වාපියම්” සිතා රජහට වදාරණසේක්—

ඉඞ්ඝ පස්ස මහාරාජ, උම්මග්ගං සාධු මාපිතං;
හත්ථිනමථ අස්සානං, රථානමථ පත්තිනං;
ආලොක භූතං තිඨන්තං, උම්මග්ගං සාධු නිට්ඨිතං.

මෙසේ වදාරා “මහරජ මා විසින් කරණලද උමග, චිත්‍රකාරයන් විසින් සරහා සිටුවනලද ඇතුන් අසුන්ද, එසේම රථාලංකාරයෙන් සරහා සිටුවනලද රථවාහනද, යුඞයට සැරසී සිටි යාක්මෙන් සජීවයක් මුත් අජීවයයි වහා නොදත හැක්කාවූ නොයෙක් ආයුධ ගත් අත් ඇතිව සිටි මහත්වූ පාබල සේනාවද යන සියලු අලඞ්කාරයෙන් දිව්‍ය සභාවක් මෙන් දසදහසක් සක්වළ එකද තෙනකත් මෙබඳු ආශ්චර්‍ය්‍යයක් නැත. එබඳු උමග බලා වදාළ මැනවැ”යි කියා නැවත වදාරණසේක්—

“මහරජ මාගේ ප්‍රඥනමැති චක්‍ෂුයා හා උපාය නමැති සූර්‍ය්‍යයා එක්ව නැංගාවූ ස්ථානයෙහි සරහනලද උමග, අසූවක් පමණ මහදොර ඇත්තේය, සිව්සැටක් පමණ සුළු දොර ඇත්තේය, එක්සියයක් ශ්‍රියහන් ගබඩා ඇත්තේය, නොයෙක් සියගණන් පහන් ගබඩා ඇත්තේය. මේ සියල්ලම දක්නා පිණිස වංචාසිතක් නැතිව සතුටු සිතින් අවෛරීව අවමැනව, එක්සියයක් රජදරුවන් හා අමාත්‍යමණ්ඩලයා පිරිවරා මේ උපකාරී නුවරට වැඩිය මැනව.

ඉදින් එසේ නොව ගිය රජහු ගියත් ‘අඞයක් ලද්දේ පණ්ඩිතය’යි කීවාසේ මා කෙරේ මායමින් ගිත සිත් හගවා නොසතුරු ලෙසින් නුවරට වැද; ‘දෙන්නාට කරණ දෙය මුටම කෙරෙමි’

සිතා මා අල්ලාගන්ට මායම් සිතකින් ආසේක් වීනම් මේ එක දසදහසක් යොදුන් දඹදිව එක් සියයක් රජුන් හා අටළොස් අක්ෂෞහිණී සඞ්ඛ්‍යාත චතුරංගිනී මෙපමණ සේනාවක් තබා සෘද්ධි සම්පන්න චක්‍රවර්ති රජෙක් තමාගේ ආනුභාවයෙන් සතර මහා ද්වීපයෙහි සේනාව ඒ ඒ රජදරුවන් සහිතව ගෙණායේ වීන මුත් මාගේ එකද උපත් යෝධයන්ගෙන් එක් යෝධයෙක්ම ඒ සේනාව මරා ලූහු බඳවා ජයගෙණ මා රැකගන්ට පොහොසත් වන්නේය, එබැවින් මහරජ මා කෙරේ පරණ වෛරයක් සිත ඇත්නම් එසේවූ දුර්වලයක් නොසිතා වහා වැඩිය මැනවැ" යි උපකාරී නුවර වාසල් හරවා වදාළසේක.

චූලනී රජ්ජුරුවෝ එක්සියයක් රජුන් හා අමාත්‍ය මණ්ඩලයා පිරිවරා නුවරට වන්හ. අභිමතාර්ථ සාධක චින්තාමාණික්‍යයක් බඳුවූ ජනනේත්‍ර රසායනවූ මාගේ ස්වාමිදරුවූ ත්‍රිලෝගුරු බෝධිසත්වයන්වහන්සේ ඇත් සේනාවක් ලහට නොබා නික්මුණු කේසර සිංහරාජයෙකු සේ මාලිගාවෙන් බැස රජ්ජුරුවරුවන් වැඳ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ඇතුළුවූ එක් සියයක් රජදරුවන් හා මහා සේනාව පිරිවරා උමගට වන්සේක. බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ රාජමංගල්‍යයට සරහනලද මාහැඟිවූනුවරක් බඳුවූ ඉතා ආශ්චර්යමත්වූ උමග දැක බෝධිසත්වයන්ගේ ගුණ කින්නාහු "එම්බා රජදරුවෙනි යම් රජක්හුගේ ජනපදයෙහිද එක රටද එක නුවරද එක රජගෙයිද මේ මහෞෂධ පණ්ඩිතයන් වැනි කෙනෙක් වෙසෙත්නම් ඒ රටටත් ඒ ජනපදයටත් ඒ රජුටත් ලාභයෙක් මුත් අලාභයක් නැත්තේය; එසේහෙයින් පණ්ඩිතයන් හා සමග වසන්නාවූ වෛදේහ රජහට එසේම මහා ලාභයෙකැ"යි බෝධිසත්වයන්ට සතුතිකරන්නාහු වෛදේහ රජු කෙරේ ව්‍යාජයෙන් "ඉදින් මහෞෂධපණ්ඩිතයෝ මා සමීපයෙහි වත් මාගේ නුවරවත් මාගේ ජනපදයෙහිවත් මාගේ ආඥ පවත්නා රට දනව්වෙහිවත් වෙසෙත් නම් මටත් වන්නේ මහ වැඩක් මය මහා අභිවෘද්ධියෙක්මය"යි මහා පසාරයෙන් කිහයි දතයුතු.

ඉක්බිති බෝධිසත්වයන්වහන්සේ එක්සියයක් ශ්‍රී යහන් ගබඩාදැක්වූසේක. ඉන් එක් ගබඩාවෙක දොර හළ මුළුලූගබඩාවලම දොර හැරෙන්නේය; එකක් පිහිකල මුළුලු දොර පිහියන්නේය, මෙසේ ආශ්චර්යමත්වූ උමග විස්තර බලමින් රජ්ජුරුවෝ පළමු යන්නාහ. පණ්ඩිතයන්වහන්සේ පසුව යෙති, එක්සියයක් රජදරුවන් හා රජ්ජුරුවන්ගේ අගම්පඩි සේනාව උමගට වන්නාහ, මහ උමග දෙගව්වක් පමණ ගෙවාගෙණ ගොස් රජජරුවෝ උමංදොර එලිපත්න් පිටත්වූහ. බෝධිසත්වයන්වහන්සේ රජහු පිටත්වූබව දැන, තමන් වහන්සේ පිටත්වනසේක් අනිකක්හු පිටත්විය නොදී උමග දොර පියන්නෝ නොහහවා ඇණයක් මැඩලූසේක. ඒ ඇසිල්ලෙහි අසූ මහදොරය, සිව්සැටක් සුළු දොරය,

එක්සියයක් ශ්‍රියහත් ගබඩාවල දෙරය සියදහස්ගණන් පහන් ගබඩාවල දෙරය, යන සියළු දෙරවල් ඒක්‍ෂණයෙහි පිහි අඟුලුහි ගියේය, ඒ සියලුම උමග ලෝකාන්තරික නරකය මෙන් අන්ධකාරව ගියේය. මහජනයා භයින් තැතිගෙණ ගියේය, උමග හසුවූවෝ ඔවුනොවුන්ගේ ශබ්දයමුයත් 'මූ මූය'යි නොදන්නාහ. බෝධිසත්වයන්වහන්සේ ඒයේ මධ්‍යම රාත්‍රියෙහි සරණපාවාදි වේදේහරජ්ජුරුවන් යවා නැවත උමගට වදිමින් ස්‍වාමින්වහන්සේගේ මගුල්කඩුව වැල්ලේ සඟවා තුබූසේක් ඒ කඩුව තුබූතෙනින් වහාම අතට ගෙණ අටළොස්රියනක් පමණ තැන් ආකාශයට පැන නැගී බිමට බැස වමතින් රජහු අත අල්වාගෙණ කඩුව බොටුවට පෑ අමෝරා භය ගන්වා 'මහරජ මේ සියලු දඹදිව රාජ්‍යය කාගේද'යි විචාළසේක.

රජ්ජුරුවෝ භයින් තැතිගෙණ 'පණ්ඩිතයෙනි තොපටය තොපටය'යි තුන්විටක් කියා 'මා නොමරා මට අභය දෙව'යි කීහ. එබසට බෝධිසත්වයන්වහන්සේ වදාරණසේක් "මහරජ නොබවමැනව, නුඹවහන්සේ මරණ පිණිස කඩුව එසවූයෙම් නොවෙම්, මාගේ ප්‍රඥවේ ආනුභාව දක්වන පිණිස කඩුව එසවීමි" කියා රජ්ජුරුවන් අතට කඩුවදී වදාරණසේක් "මහරජ ඉදින් මා මරණු කැමතිසේක් විනම් මේකඩුවෙන් දූන්ම මා මැරුවමැනව, නොමරණසේක් විනම් අභය දුනමැනවැ"යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ "මාවිසින් තොපට අභය දෙනලද්දේමය, තෙපි මාකෙරෙහි සැක නොකරව"යි මතුත් ඔවු නොවුන්ට නොවරද නාලෙස කඩුව ගෙණ සපථකළහ ඉක්බිති රජ්ජුරුවෝ කියන්නාහු "පණ්ඩිතයෙනි තොපගේ මෙබඳු ප්‍රඥබල හා කායබල ඇතිව කුමක් පිණිස රාජ්‍යය නොගනුද්ද"යි කීහ. මහරජ ඉදින් කැමැත්තෙම් නම් සියලු රජදරුවන් මරා රාජ්‍යය ගනිමි, අනුන් මරා යසස් ගැන්ම නුවණැත්තන් විසින් නිඥකරණලද්ද" යි වදාලසේක. රජ්ජුරුවෝ එබසට සතුටුව කියන්නාහු 'පණ්ඩිතයෙනි උමගට හසුවූ මහජනයා උමංදෙර නොහරණෙන් වලප්නාහ, දෙරහැර ඒ සත්වයන්ට ජීවිතදානය දෙව'යි කීහ.

සකල ජනානන්දකරවූ තිලෝගුරුවූ අනාථනාථවූ කරුණානිධානවූ මාගේ ස්වාමිදරුවානෝ එවේලෙහි දෙරහළසේක. සියලු උමග ඉරුනැංගාසේ ඒකාලෝකවිය, මහජනයා අස්වස් ලදින් සැපසේ සිටියහ. එක්සියයක් රජදරුවෝ තමතමන්ගේ අගම් පඞි සේනාව හා සමග උමගින් පිටත්ව බෝධිසත්වයන්වහන්සේ සිටි තෙනට ගියහ. ඉක්බිති රජදරුවෝ කියන්නාහු "තොපනිසාය පණ්ඩිතයෙනි අප ජීවිත ලද්දේ, මද ඇසිල්ලකින් දෙර නොහළුවෝ නම් අපි හැම උමග මළහ"යි කීහ. ස්වාමිදරුවානෝ වදාරණසේක් දූන් මතු නොවෙයි තොප හැම මා නිසා

රැකුණේ, පළමුත් රැක්කෙම්වේදැ”යි වදාළසේක. පළමු තමන් ඔබ නිසා රැකුණුනියාව නොදන්නා රජදරුවෝ ‘ඒ කවර කලකද පණ්ඩිතයෙනි’ කීහ. ස්වාමිදරුවානෝ උන් හැම ගිවිස්වා සලකුණු වදූරණසේක් “රජදරුවෙනි අපගේ මිසුලුනුවර තබා සියලු දඹදිව රාජ්‍යය ගෙණ මේ උත්තර පංචාලනුවරට අවුත් මගුල්උයනදී ‘ජයපානය බොම්හ’යි රා මස් ආදි සියල්ලක් සැරහුදවස් සිහිකරව්දැ”යි වදාළසේක. ‘එසේය පණ්ඩිතයෙනි සිහිඇතැ’යි කීහ. “එසේවීනම් මේ රජ්ජුරුවන් හා කේවට්ටයා කලි නපුරු මන්ත්‍රණයකින් කේවට්ටයාගේ බස් ගෙණ විෂ මිශ්‍ර රා හා මච්ඡමාංස කවා නොපහැම මරණ පිණිස කළාවූමන්ත්‍රණය මම දැන ‘මා ජීවත්ව ඉන්දදී මා බලබලා මේ රජදරුවෝ අනාථ මරණින් නොමියෙත්ව’යි සිතා මාගේ සහජාත යෝධයන් එවා රාසැලවල් බිඳුවා මොවුන් දෙදෙනාගේ මන්ත්‍රණය බිඳ තොප හැමදෙනාටම ජීවිතදානය දුන්නෙම්වේදැ”යි වදාළසේක.

ඒ රජදරුවෝ කලකිරුණු සිත් ඇතිව සැබෑද මහරජ එසේ කෙළේ’යි කීහ. කේවට්ටයන්ගේ බස්ගෙණ එසේ කෙළේ සැබෑය, පණ්ඩිතයන් කී බස් සැබව’යි කීහ. ඒ රජදරුවෝ සැමදෙනම බෝධිසත්ත්වයන් සිපගෙණ “පණ්ඩිතයෙන් අප හැමදෙනාට පිහිටව සිටියාහු තෙපිමය, තොප නිසාය අප දිවිලද්දේ’යයි තමන්තමන් පළන්වොවුනු සහිතවූ සිවසැට ආභරණයෙන් බෝධිසත්ත්වයන්ට පූජාකළහ. ඒ පූජා විදගෙණ සිට චූලනි රජ්ජුරුවන්ට උපන් කණස්සල්ල හරණසේක් “මහරජ නොසිතුව මැනව, නුඹවහන්සේගේ වරදෙක් නොවෙයි, නෙල දුෂ්ටවූ කේවට්ටයාගේ පාපමිත්‍ර සංසර්ගයෙන්වූ දෝෂය, මතු මෙවැන්නක් නොකරන්නෙමි’ මේ රජදරුවන් ක්‍ෂමාකරව”යි වදාළසේක. රජ්ජුරුවෝ කියන්නාහු ‘රජදරුවෙනි මාගේ නුවණකින් තොප හැමදෙනා කෙරෙහි ජන්මාන්තර වෛරයකින් මා කළ දෙයෙක් නොවෙයි, නෙල ඉතා දුර්ජනවූ ගුණමකු ලාමකවූ කෙලෙහිගුණ නොදන්නාවූ අලජ්ජිවූ අනාර්ය්‍ය ස්වරූප ඇති අවලක්‍ෂණවූ කේවට්ට නම් ජඩයා නිසා මා නොදැන කළ අපරාධය ක්‍ෂමාකරව, නැවත මා පණ තබා මෙවැන්නක් කරන්නේ නැ නැ”යි ක්‍ෂමාකරවූහ. මෙසේ රජදරුවන් ඔවුනොවුන්ගේ වරද දෙසා හැම එක්සිත් වීමෙන් සමාගම්වූහ.

ඉක්බිති බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ බොහෝ කත බොනදෑ හා මල්ගඳ විලවුන් ගෙන්වා සියලු රජදරුවන් හා උත්තර පංචාලය වේදේහය යන දෙරට සේනාව එක්ව සත්දවසක් උමග ඇතුළෙහිම කෙළ ඉන් නැගී උපකාරීනුවරට වැද බෝධිසත්ත්වයන්වහන්සේට බොහෝ සත්කාර සම්මානකොට එක්සියයක් රජදරුවන් පිරිවරා මාලිගාවේ මතුමහල් තෙලෙහි හුන්නාහු බෝධිසත්ත්වයන් තමන් සමීපයෙහි රඳවනු කැමති කියන්නාහු,

"මහෞෂධ පණ්ඩිතයෙනි දවස්පතා ජීවිතවෘත්තියට දෙන ලද වියදම් ආදියද ගම්බිම් ගවමහිෂ ඇත් අස් ආදීන් හා වාහන සමූහද, මුතු මැණික් පබලු වෛඩූර්‍ය්‍ය මසාරගල්ල ලෝහිතඞ්ක රජත සුවණ්ණාදි දශවිධ රත්නසමූහයද, දෙමි. ඒ ඒ දෙශයෙහි අනේකප්‍රකාර වස්ත්‍රසමූහයෙන්ද, දුසිදුස ආදිවූ නොයෙක් කර්ම්කාරයන්ගෙන්ද මාගේ රාජ්‍යාභිවෘද්ධියට දෙවනු කොට සිටුවාලමි, වෛදේහ රජ්ජුරුවන් තබා දුන් වෘත්තියට හැම දෙයින්ම කිසිවකුත් නොවරදවා ද්විගුණකොට දෙවාලමි, එක දේශයට නායක වෛදේහ රජ්ජුරුවන් තොප රැකලියහෙනකල, දසදහසක් යොදුන් දඹදිවට නායකවූ මම රැක්කනොහෙම්ද? තවද තෙපි මිථුලු නුවර එක වෛදේහ රජ්ජුරුවන්ට හා වෛදේහ රටට සෙනෙවිරත්කම්කරණ පමණෙක් වේද, මා සමීපයෙහි රැඳුනාවූදෑ වීනම් දසදහසක් යොදුන් දඹදිවටත් එක්සියයක් රාජධානියෙහි රජදරුවන්ටත් මවුත් තොප තනිව සෙනෙවිරද්ධුරය කරණ හෙ සිත් රජහු එක්සියයක් දෙනය, එක සෙනෙවිරද්දුය; රජදරුවන් මුළුල්ලට වඩා තොපගේ ආඥවත් තේජසත් ප්‍රඥවත් කිතීතියත් සිටිනේය; ඉදින් මෙහි තෙපි රඳ උනු නම් එක්සියයක් රාජධානිවල අමාත්‍ය මණ්ඩලයා සහිතවූ මනුෂ්‍යයෝ තොප මුත් අප ඇතැයි කියා නොදන්නාහ. තවද අවශෙෂවූ මනුෂ්‍යයින් හා එක්සියයක් රජදරුවන් තබා මමත් තොප කීවා මුත් සිතින් සිතා කිසිවකුත් නොකරමි රඳව"යි කීහ.

රජුගේ සම්පත බෝධිසත්වයන්වහන්සේ ප්‍රතික්ෂෙපකරණසේක් මෙසේ වදාරණසේක * "මහරජ යම් පුරුෂයෙක්, බොහෝ දවසක් බොහෝ සම්පත් දී භත්තෘස්වාමිව රක්ෂාකළ රජක්හු සමීපයෙන් අනික් රජක්හු ඒ සම්පතට වඩා සැපත්දෙමි කීහයි ඒ චිරාත්කාලයක් මුළුල්ලෙහි රැකිරජහු හැර අමුතුව සැපත්දෙමි කී රජහුගේ සම්පත් නිසා එහි ලෝභයෙන් ගියේවීනම් ඔහට තමා විසිනුත් නින්‍දමය, අනුන් විසිනුත් නින්‍දමය"යි වදාළසේක ඒ කෙසේදයත් ? තමා විසින් ලබනනින්‍දනම් මේ "රජ්ජුරුවෝ තමහට සෙසු නෑසියකමක් නැතිව සත් ඇවිරිද්දෙහි පටන් මාතමන් සමීපයෙහි රඳවා මා නිසාම මාගේ දෙමව්පියන්ට ඒසා මහත්උපකාරයකුත් කොට මා මේසා මහත්තනතුරෙක තබා මහ ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටුවා රකිමින් සිටියහ. ඒ රජහු අත්හැර 'වඩා සැපත් දෙමි' කිවයි මා කළදෑ නපුරැ'යි තමා තමාහට නින්‍දකරන්නේය.

තමා බාල අවස්ථාවෙහි පටන් කාරණා කාරණා උගන්වා සියලු සම්පත්තීන් සමෘද්ධකොට මේසා තනතුරෙක තබා රකිමින්

* යොවජේන මහාරාජභත්තාරං ධන කාරණා
උජ්ඣනාං හොති ගාරය්හා අත්තනො ච පරස්ස ච.

සිටි රජහු හැර'සැපත් වඩා දෙමි' කී පමණින් මෙතෙක් දවස් කළ උපකාර ජල රේඛාවක් පරිද්දෙන් කෙළේය. නැවත අන් රජහටත් මෙතෙක් වේදැයි අනුත්ගෙනුත් නිඤලබමි, අනුත් ගෙන් ලබනනිඤනම් මේය, මෙසේ දෙතනින් නිඤයෙන් මට ගැලවීමෙක්නැත; † එබැවින් මාගේ රජ්ජුරුවෝ යම්තාක් ජීවත්ව ඉඳිද්ද ඒතාක්කල් මුළුල්ලෙහිම 'වෛදේහ රජ්ජුරුවන්ගේ මහෞෂධ පණ්ඩිතයෝය'යි කීවාවුන් ලවා 'බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මහෞෂධ පණ්ඩිතයෝය'යි නොකියවමි. මිහුලු නුවර මහෞෂධපණ්ඩිතයෝය'යි කීවාවුන් ලවා "උත්තර පංචාල දේශයෙහි මහෞෂධ පණ්ඩිතයෝය"යි නොකියවමි, මේ මාගේ රජ්ජුරුවන් ජීවත්ව ඉන්දදී මා රඳන්නේ නැතැ"යි වදාළසේක.

නැවත රජ්ජුරුවෝ කියන්නාහු "එසේවීනම් පණ්ඩිතයෙනි තොපගේ රජ්ජුරුවන් ස්වර්ගස්ථවූ කල 'එන්නෙමි' කියා මට ප්‍රතිඥ දෙව"යි කීහ. මහරජ 'ජීවිතයනම් මහලුය බාලය'යි නියමයක් නැත, එතකොට මම රැකීඋනිම්නම් එන්නෙමි'යි වදාළසේක. ඉක්බිති රජ්ජුරුවෝ බෝධිසත්වයන්වහන්සේට ප්‍රමාණාතික්‍රාන්ත මහා සත්කාර කරවූහ. සත්දවසක් ඉකුත්කල්හි මහතානෝ ගමනට සමු ඉල්ලූසේක. නැවත රජ්ජුරුවෝ "පණ්ඩිතයෙනි තොපට මේ මේ දෙය දෙමි, ඒ ගන්ව'යි ප්‍රසාදකියන්නාහු මේ ගාථාවෙන් කියත්—

දම්මි නික්ඛසහස්සං තෙ, ගාමාසීති ච කාසිසු;
දාසිසතානි චත්තාරි, දම්මි භරියා සතංච තෙ;
සබ්බසෙනඞ්ග මාදාය, සොත්ථිං ගච්ඡ මහොසධ.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම් "මහෞෂධපණ්ඩිතයෙනි තොපට නික් දහසක් දෙමි, හෙවත් රන් පස්විසි දහසක් දෙමි, තවද තොපගේ වෛදේහරටට ආසන්නවූ කසීදේශයෙන් එකිඑකි ගමකින් අවුරුද්දකට ලක්‍ෂයක් අය නිමන්නාවූ මෙසෙයින් අවුරුද්දකට අසූලක්‍ෂයක් නිමවන උත්තම තරමේ උතුරු සළුගම් අසුවක් දෙමි, තවද නොමැලිවූ බාලපරායෙහි සිටි කෙල්ලන් සාර සියයක් දෙමි, තවද නොයෙක් බිසෝ පළඳනාවෙන් සරහා නිමවනලද ශරීර ශෝභා ඇති සවිලක්‍ෂණ සම්පන්නවූ බිසෝවරුන් සියයක් බිරින්දන්කොට පාවාදෙමි, තවද මාගේ ඇත් අස් රථ පදාති සේනාව තොපට නින්දේම ප්‍රසාද සේනාවක් කොට දෙමි; තොපගේ සේනාවත් මාගෙන් දුන් සේනාවත් ඇරගෙණ සුවසේ තොපගේ රටට යව"යි සමුදුන්හ.

† මේ ඉහල කොටස අටුවාවට හා පරණ පිට පතටත් එකගව ශුද්ධකලෙමු.

ඉදින් නන්දාදේවීන් හා නැයන් සතරදෙනා වේදේහ රජ්ජුරුවෝ නේවත් නමුත් පණ්ඩිතයන්වහන්සේ තමන්ගේ යාච්ඤාවට රුදුණුදැවීනම් බ්‍රහ්මදත්තරජ්ජුරුවෝත් චක්‍රරත්නය හස්ත ප්‍රාප්තවූ සක්විති රජක්හු මෙන් සතුටුවත් මුත් "පිටත මාගේ බිසවුත් හා නෑකෙනෙක් ඇත්තේවේද්ද"යි කියන්නා තබා සිතිනුත් නොසිතන්නාහ.

බෝධිසත්වයන්වහන්සේ සමු දුන් රජ්ජුරුවන් අශ්වසා වදාරණසේක් "මහරජ නුඹවහන්සේගේ නැයන් 'මාගේ නෑකෙනෙක් සාරස්සයක් ගව්වෙන් පිටත වේද්ද'යි නොසිතුව මැනව, මම මාගේ රජ්ජුරුවන් නික්මෙන දවස්ම මෙසේවූ සම්මතයක් කොළෙම්, කෙසේදයත් මහරජ තෙල නන්දාදේවීන් මව් තනතුරේ තබා දුටමැනව, පංචාල චණ්ඩකුමාරයන් මල් තනතුරේ තබා දුටමැනවැ'යි කියා පංචාලචණ්ඩිකුමාරිකාවන් අභිෂේකයට පමුණුවා සොළොස්දහසක් බිසෝවරුන්ට නායක කොට ඔවුනු පළඳවා රජහට පාවාදී යැවීමි, නුඹවහන්සේගේ නැයන් මෑනියන්වහන්සේත් බිසවුන්වහන්සේත් පුතනුවන්දැත් මා ගිය නොබෝදවසකින් වහා එවාලන්නෙමි"යි * වදාළසේක.

"යහපත පණ්ඩිතයෙනි කියා තමන්ගේ දුවනියන්ට දූතමනා දෑයාදයට දසිදස වස්ත්‍රාභරණ අලඞ්කාර මුතු මැණික් ආදි දශවිධ රුවන් සමූහද, රත්නාලඞ්කාරයෙන් සරහනලද ඇත් අස් රථ ආදිවූ වාහන සමූහද, යන මේ දෑයාද මුළුල්ල කිසිවෙකිනුත් අඩුනොකොට තමන්ගේ නායක තනතුරට හා 'රජව මුත් මෙසේ දියඇකිද්ද'යි කට කට කයිවාරුකරණ පරිද්දෙන් නොයෙක් සම්පත් මුළුල්ල 'මාගේ දුවනියන්ට දෙව්'යි බෝධිසත්වයන්ට පාවාදී, බෝධිසත්වයන් හා කැටිව යන සේනාවට දියයුතු වියදම් ආදි සියල්ලට විධානකරන්නාහු එකී නියුක්තයන්ට මෙසේ කියත්—කෙසේද යත්—

"එම්බා සගයෙනි වේදේහරජ්ජුරුවන්ගේ සොළොස් දහසක් ඇත්ඇණිය සොළොස්දහසක් අස්ඇණිය සොළොස් දහසක් රථ ඇණිය ඒ තරමට නොමදවූ සේනාවය යන සියල්ලෝම වේදේහ රජ්ජුරුවන් හා කැටිව පළමු පලාගියහ. පණ්ඩිතයන් කැටිව සිටියාහු බොහෝදෙනෙක් නොවන්නාහ. උන් තමන්ට අගම්පඩිව සිටින්නාහු, සොළොස්දහසක් ඇත්ඇණිය සොළොස් දහසක් අස්ඇණිය සොළොස්දහසක් රථඇණියු ඒ තරමට වඩා සිටිනාවූ මහසේනාවය, උන් උන්ට දෙන්නේ වැඩියෙක් නොවෙයි, උන් උන්ට පළමු දෙන තරම් පණ්ඩිතයන්ගේ වියදම් කැමියන් අතින් නියම දූන පළමු උන්ගෙන් දෙන්නාට දෙන විය

* පෙසෙස්සාමීති.

දම් දූත් එකෙකුට බැගින් සියල්ලන්ට දෙන වෘත්තිය උත්තමයන් කෙරේ පවත් අධමයන් දක්වා ඇතුන් පවත් ගවයන් දක්වා පළමු වියදම් කා සිටියවුන්ට කිසිවෙකිනුත් රුහැණි නොකරවා අන්නපාන වස්ත්‍රාභරණ ආදිවූ සියල්ලකිනුත් අඩුනොකොට වහා දෙව; එසේකල සාරසියයක් ගව් ගෙවා යන්නාහු මග සුවසේ නිදුකින් කල්‍යාන්ත නොව් යන්නාහ"යි විධානකළහ.

නැවත බෝධිසත්ත්වයන්වහන්සේට සමු දෙන්නාහු මෙසේ කියත්—

හත්ථි අස්සා රථා පත්ති, ගවෙජ වාදය පණ්ඩිත;
පස්සතු තං මහාරාජා, වෙදෙහො මිථිලං ගතං.

මෙයින් කියා "මහෞෂධපණ්ඩිතයෙනි ඇත් අස් රථ පදනි සේනාව පිරිවරා මහ සන්තෝෂයෙන් 'අසුරවිජයකොට ජයලත් ශක්‍රදේවේන්‍ද්‍රයා පරිද්දෙන් වහා නික්මෙව; තොප සුවසේ මියුලු නුවර ගියවුන් දකින්ට පුලපුලා උන් වෛදේහ රජ්ජුරුවන් හා පෙරමග බලබලා ඉඳිනා නුවර වාසීහු තොප ගියවුන් දැක සතුටු වෙත්ව"යි කිහ. ඒ සියයක් රජදරුවෝද බෝධිසත්ත්වයන්වහන්සේට බොහෝ සත්කාරකොට බොහෝ පඩුරු දුන්හ.

ඒ ඒ රජදරුවන් අතරේ සිටි චරපුරුෂයෝ ඒ සියයක් දෙන තමන්ගේ පමීත් හා සමග අවුත් පණ්ඩිතයන්වහන්සේ පිරිවරා ගත්හ. ඒ මහතානන්වහන්සේ ප්‍රමාණාතික්‍රාන්තවූ නොහොත් මෙතෙකැයි පමණ නැත්තාවූ චතුරංගිනී සේනාවෙන් යම්සේ ගොඩ ගමන්ගත් මහ සමුද්‍රය පරිද්දෙන් නික්මුණුසේක්, අතර මග සිට බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දුන් සළුගම් අසුවෙහි අය ගෙණෙට'යි මිනිසුන් යවා තමන්වහන්සේ වෛදේහ රටට සම්ප්‍රාප්ත වූසේක.

එ දවස් 'උමගින් යන්ටය'යි කී බසින් දණ නළල වැල මිට කඩරෙදි බැඳ කෝනමක් හැඳ සැරහුනු ප්‍රඥාසමුද්‍රවූ ඉතා ගැටවා සේනකයා මතුවන්නා දැන, අතරමග එක් පුරුෂයෙකු සිටුවන්නේ මෙසේ කියා—"එම්බා කුඩෙනි චූළනී රජ්ජුරුවන් මැත එන්නක්වත් අනික් කිසි කෙනෙකුන් මැත එන්නක් වත් වහා අවුත් මට කියව"යි කියා සිටුවිය. ඒ පුරුෂයා මියුලුනුවර දෙළොස් ගව්වකින් ඔබ්බේ වඩනා මහබෝසතානන්වහන්සේ දැක "මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ මහ පෙරහරින් වඩිමින් සිටිසේකැ"යි අවුත් සේනකයාට කීය. ඒ අසමින් සේනකයා වහා රජගෙට ගොස් රජහට කීය. එපවත් රජ්ජුරුවෝ සිව්මැදුරු කව්ළුවෙන් පිටත බැලූවාහු, එන්නාවූ සේනාව දැකමෙසේ කියත්—"සේනකය කුමක් කියයිද; අපගේ පණ්ඩිතයන්ගේ සේනාව මදය, එසේහෙයින් මේ ඉතා භයානක ස්වරූප ඇත්තේය"යි භයින් තැතිගෙණ සේනකයා අතින් විචාරන්නාහු—

හත්ථී අස්සා රථාපත්තී, සෙනාගි දිස්සතෙ මහා
චතුරංගිනී භිංසරූපා, කිනනු මඤ්ඤසි පණ්ඩිත.

"ඇත් අස් රථ පදිකයයි කියන බියකරු චතුරංගිනී මහාසේනාව පෙණෙයි, සේනකයෙනි උන් කවුරුනැයි කියා සිතවද්ද"යි කීහ.

එවිට සේනකයා රජු සැක හරවා තත්වූ පරිද්දෙන් කියන්නේ "මහරජ නොබා වදාළමැනව තුඹවහන්සේට උතුම් සන්තොෂයෙක් වන්නේය. ඊට කාරණා කිම්ද යත් එක්සියයක් රජදරුවන්ගේ සේනාවය, බ්‍රහමදත්ත රජ්ජුරුවන්ගේ සේනාවය, මියුලුනුවරින් ගිය සේනාවයයි යන චතුරංගිනී සේනාව පිරිවරා සුව සේ එනසේක් අපට යසදායකවූ අපගේ ලයක් වැනි අපගේ ඇසක් වැනි අපගේ ජීවිතයක් වැනි අපගේ ස්වාමිදරුවූ ජනානන්දකරවූ ලෝකස්වාමිවූ තිලෝගුරුවූ තිලෝකේක තිලකවූ ප්‍රඥාසම්පන්නවූ සරණාගත වජ්‍රපංජරවූ ප්‍රඥාප්‍රදීපවූ මහෞෂධපණ්ඩිතයන්වහන්සේ වඩනාසේකැ"යි කීය.

"සේනකය කුමක් කියයිද ? පණ්ඩිතයන්ගේ සේනාව මදය, මේ සේනාව එදවස් බ්‍රහමදත්තරජ්ජුරුවන් ආ නියාවක්මෙන් මහසේනාවෙකැ"යි කීහ. නැවත සේනකයා කියන්නේ "මහරජ නොසිතා වදාළමැනව, අපගේ ස්වාමිදරුවානන්ගේ ඉතා මිහිරිවූ කර්ණරසායනයක් බඳුවූ ධර්මානවිතවූ මධුර කථාවෙහි බැඳුන රජ්ජුරුවන් විසින් ඔබ කෙරෙහි පැහැද ඔබට ප්‍රසාදයෙන් දුන් සේනාවය, සැකනොකොට වදාළමැනව"යි කීය.

ඒ අසා රජ්ජුරුවෝ ඉතා සතුටුව නුවර බෙරලවන්නාහු "මේ මාගේ සත්යොදුන් මියුලුනුවර දිව්‍යපුරයක්මෙන් සදා පණ්ඩිතයන්ට පෙරගමන් කෙරෙත්ව"යි කියා බෙරලැවූහ. නුවරවාසිහු දූක්මට පුලපුලා උන්නාහු එබස් අසමින්ම අටවිසි ගව්වක් පමණ ඒ සා මහත් නුවර අසුරවිජයකොට ජය ලදින් එන ශක්‍රදේවේන්ද්‍රයාට සරහා නිමවනලද ශක්‍රභවනයමෙන් අභිමනෝහරකොට ධජ පතාක පුන්කලස කදලිතෝරණ ආදියෙන් හා සුදුවැලි ලදපස්මල් ආදියෙන් විසිතුරුකොට සරහා, සර්වාභරණයෙන් සැරහී ස්වාමිදරුවන්ට පෙරගමන්කොට වඩා ගෙණාහ. පණ්ඩිතයන්වහන්සේ ඒ නුවරවාසීවූ ස්ත්‍රී පුරුෂයන්ගේ නේත්‍ර සමූහයන් සතුටු කඳුලෙන් පුරා තුෂාරයෙන් ආද්‍රීවූ නිලුපුල්පෙත් සේ කෙරෙමින් ඇස් සිත් නිවා තමන්වහන්සේ පස්මසක් මුළුල්ලෙහි නුදුටුවන්ගේ ශෝක සන්හිඳුවා ලෙහි අමාදිය ඇසට රසාඤ්ජනදෙන්නක්හුමෙන් අනන්තයා සේ දහසක් මුඛ මවා ඉදින් කිව හොත් ඒ මහතානන්ගේ ශ්‍රී විලාසයෙන් ස්වල්ප මාත්‍රාවකුත් කියන්නට අසමර්ථවූ අනෝපමෙයවූ ශ්‍රී විභූතීන් රජගෙට වැද රජ්ජුරුවන් දුටුසේක.

රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් දැක, ඛුද්දකප්‍රීතිය ඛණිකප්‍රීතිය උද්වේසිකප්‍රීතිය අවක්‍රාන්තිකප්‍රීතිය ඵරණප්‍රීතිය යන පස්වණක් ප්‍රීතීන් පිණාගියාහු, වහා උනස්නෙන් නැඟී ඉදිරියට අවුත් සිප ගෙණ ඉස සිඹ සනහා නැවත ගොස් ආසනයේ ඉඳ, සිහිකටයුතුවූ මිහිරිකථාකරමින් මේ ගාථාවෙන් කියන්නාහු—

යථා පෙතං සුසානස්මිං, ඡඩ්ඩෙත්වා චතුරො ජනා;
එවං කම්පිල්ලියෙ ත්වම්හා, ඡඩ්ඩයිත්වා ඉධාගතා.

අථ ත්වං කෙන වණ්ණෙන, කෙන වා පන හෙතුනා;
කෙන වා අත්ථජාතෙන, අත්තානං පරිමොචයී.

“එම්බා පණ්ඩිතයෙනි යම්සේ මළ මිනිසෙකු සතරදෙනෙක් සුරා ල යක ලා උසුලාගෙණ ගියාහු අමුසොහොනේ දමාපියා ඔහු කෙරේ කිසි අපේක්ෂාවක් නැතිව නැඟීඑද්ද, එපරිද්දෙන්ම, අපිත් තොප කම්පිල්ලදේශයේ ලා පියා අපගේ පණ ගලවාගෙණ තොප කෙරේ කිසි අපේක්ෂාවක් නැතිව නැඟී ආම්හ; දූන් තෙපි කවර කාරණයෙකින් කවර උපායකින් කවර නුවණකින් කවර හේතුවකින් තෙමේත් රැකී සේනාවත් රැකගෙණ සුවසේ අවුදැ’යි විචාළහ.

ඒ අසා පණ්ඩිතයන්වහන්සේ මේ ගාථාවෙන් වදාරණසේක්-

අත්ථං අත්ථෙන වෙදෙහ, මන්තං මන්තෙන ඛත්තිය;
පරිවාරයිස්සං රාජානං, ජම්බුදීපංව සාගරො.

“මහරජ බ්‍රහ්මදත්තරජ්ජුරුවන් සිතු සිතූ යම් අර්ථයක්, මාගේ තීක්ෂණවූ ප්‍රඥාවෙන් අනික් අර්ථයක් සිතා, ඔහු සිතූ යම්ම අර්ථයක් ජයගතිමි; ඒ රජ යම් මන්ත්‍රණයක් සිතුයේ නම්, එයින් මාගේ මන්ත්‍රණයෙන්ම ජයගතිමි; තවද දඹදිව පිරිවරා සිටි සාගරය පරිද්දෙන් දඹදිවට අධිපතිවූ එක්සියයක් රජුන් හා සේනාව මාගේ ප්‍රඥාබලයෙන් මා පාපිට ගස්වා මම චක්‍රවර්තිරජක්හු සේ, සියලු රජුන් හා සේනාව පිරිවැරුයෙම් වේදැ”යි වදාළසේක.

මෙසේද කියා නැවත වදාරණසේක් බ්‍රහ්මදත්තරජ්ජුරුවන් සවනට මෙහෙයූතැන් පටන් නුවර වාසල් හරණතුරු කී කළ දෙයත් උමගට වන් තැන් පටන් උමගින් රජු ගෙණගොස් මහවිසල් මළුවේදි කඩුව සැඟවූ තැන් දක්වාත් එතනදී සපථකොට රජුගේ යාචඤාවෙන් උමග අසුවූ රජුන් සහිතවූ සේනාවට දෙරහැර මරණින් මුදා නැවත සත්දවසක් උමංකෙළියෙන් දවස් යවා ඉක්බිති රජදරුවන් හැමදෙනා සත්දවසක් තමන්වහන්සේට දුන් පඬුරු හා නැවත බ්‍රහ්මදත්තරජ්ජුරුවන් දුන් නොයෙක් ප්‍රසාද හා නැවත එම රජහු දුවනියන්ට දුන් දායාද හා නැවත චූලනී රජ්ජුරුවන් ඇතුළුවූ සියළු රජදරුවන් තමන්වහන්සේට දුන් ප්‍රසාදත් ‘මේ මේය’යි වදාරණසේක්—

දිනනං නික්ඛ සහස්සං මෙ, ගාමාසීතිංච කාසිසු,
දසීසතානි චත්තාරි, දිනනං භරියා සතංච මෙ;
සබ්බසෙනංග මාදය, සොත්ථිනම්හි ඉධාගතො.

මෙයින් වදරා "මාඑරත්රන් පස්විසි දහසක් දුන්හ; සව්ාභරණයෙන් සැරසූ ශරීරශෝභා ඇති තන සිටි බාල කෙල්ලන් සාරසියයක් දුන්හ; නොයෙක් පලඳනාවෙන් සැදි බිසෝවරුන් සියයක් මට බිරින්දකොට පාවාදුන්හ; අපගේ මේ වෙදේහ රටට ආසන්න තමන්ගේ කාසිදේශයෙන් ගමකින් අවුරුද්දකට ලක්‍ෂයක් බැගින් අය නිමන්නාවූ ගම් අසූවක් දුන්හ; බ්‍රහ්මදත්තරජ්රුවන් හා සියළු රජදරුවෝත් තමන්ගේ චතුරංගිනී සේනාව කෙරෙහි නිරපේක්‍ෂව ප්‍රසාද සේනාවක් කොට මටම දුන්හ; ඒ සියලු සේනාව පිරිවරා උකටලියක් නැතිව මහාසන්තෝෂයෙන් සුකතව නැඟීආමි"යි වදාළසේක.

ඒ අසා ප්‍රීතීන් පිණාපියා රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ගේ ගුණ කියන්නාහු මේ ගාථාවෙන් කිහ—

සුසුඛං වත සංවාසො, පණ්ඩිතෙහිති සෙනක;
පක්ඛීව පංජරෙ බද්ධෙ, මච්ඡෙ ජාලගතෙරිව;
අමිත්ත හත්ථගතෙ, මොචයී නො මහොසධො.

"සේනකය, නුවණැත්තන් හා එක්ව විසීම් ඉතා යහපත් වන්නේය, ඉනුත් මේ මහෞෂධ පණ්ඩිතයන් හා එක රටක එක නුවරක එක තෙනක යමෙක් වෙසෙත් නම්, මෙලොව සොර සතුරු බියෙක්වත් පරලොව අපාය භයෙක්වත් නැත්තේය, ඊට කාරණා තෝම දුටුයෙහි වෙද, අටලොස් අක්‍ෂෞහිණී සංඛ්‍යාත ඒසා මහත් සතුරු සේනාවක් මැද මැදිරියෙක බැඳිසියොතුන් සේද, දැල බැඳි මසුන්සේද හසුවූ තොප දෙමුරයක ගලවාගත් බැවින් තොපටම දැනෙන්නේවේද, එසේහෙයින් නුවණැත්තවුන් හා එක්ව විසීම ඉතා යහපතැ"යි ගුණ වර්ණනාකළහ. සේනකයාත් රජහු බස මුදුනෙන් පිළිගෙණ සැබවැයි කියා තමා ඇතිවක් පටන් සම සිතින් බෝධිසත්ත්වයන්ගේ ගුණ කියන්නේ "මහරජ ඒ සැබව නුවණැති පණ්ඩිතවරු නම් මෙලොවින් පරලොවින් ඉෂ්ටයක් මුත් අනිෂ්ටයක් වියනොදෙන්නාහ; මැදිරියෙහි හසුවූ මසුන් පරිද්දෙන් සතුරන්ට අත්පත්ව ජීවිත විනාශයට පැමිණ සිටියාවූ අප හැමදෙනා ගලවා සැපයෙහි පිහිටුවාලූසේක; සමස්තලෝකයෙහි නුවණැත්තාවූ සියලූ සත්ත්වයන්ට ශතසහශ්‍ර ගුණයෙන් වඩනාසේක්, අපගේ මේ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේය"යි තමාගේ මුඛ නොසෑහෙන පරිද්දෙන් වෙනසක් නැතී සිතින්ම ගුණ වර්ණනා කළේය.

ඉක්බිති රජ්ජුරුවෝ නුවරබෙරලවන්නාහු “සත්දවසක් සැණකෙළි කෙළව, යම් කෙනෙක් මට හිතයෝනම්, ඒ සියල්ලෝම පණ්ඩිතයන්ට නොයෙක් පඬුරෙන් සත්කාර සම්මාන කෙරෙත්වා”යි විධාන කළහ, ඒ බව ප්‍රකාශකොට වදාරණ බුදුරජානන්වහන්සේ මෙසේ වදාරණ සේක—

ඔරොධා ච කුමාරා ච, වෙසියානො ච බ්‍රාහ්මණා;
බහුං අන්නං ච පානං ච, පණ්ඩිතස්සාභිහාරයුං.

හත්ථාරූහා අනීකට්ඨා, රථිකා පත්තිකාරිකා;
බහුං අන්නං ච පානං ච පණ්ඩිතස්සාභිහාරයුං.

සමාගතා ජානපදා, නෙගමා ච සමාගතා;
බහුං අන්නං ච පානං ච, පණ්ඩිතස්සාභිහාරයුං.

බහුජ්ජනොපසන්නොසිදිස්වා පණ්ඩිතමාගතෙ
පණ්ඩිතම්හි අනුප්පත්තෙ චෙලුක්ඛෙපො අවත්ථො

“එම්බා මහණෙනි, ඒ වෛදේහරජුගේ විධානයෙන් සියලු වීණාවාද්‍ය ඉතා සිත්කලුකොට ගායනාකළහ, තවද කරසක් විජයසක් ජයතුරාසක් ආදිවූ පංචප්‍රකාර සඞ්ඛනාද පැවැත්වූහ, ආතතය විතතය විතතාතය ඝනය ශුෂිරය යන පංචාංගික තූර්යනාද පැවැත්වූහ, නුවරවාසීන් හා ජනපදවාසීහු ස්වභාවයෙන්ම ස්වාමිදරුවානන්ට සත්කාර කරන්ට සිතන්නාහු බෙර හඬ අසමින් වඩවඩා සන්තෝෂව තමන් තමන්ගේ විභවානුරූප කොට මහත්වූ සත්කාර සම්මාන කළහ, උදුම්බරා නම් අගබිසවුන් ආදිවූ බිසෝවරුද රාජකුමාරයෝද ව්‍යාපාරයෝද බ්‍රාහ්මණයෝද යන සියල්ලෝම කනබොනදෑ හා බොහෝ පඬුරු ගෙණ ගියාහ, තවද ඇත් අස් රථාදි වාහන නැගෙන්නෝද පාබල මහ සේනාවද ජනපද වාසිහුද නියම්ගම් වැස්සෝද බොහෝ කනබොනදෑ හා පඬුරු ගෙණ පණ්ඩිතයන්ගේ ගෙට ගියහ.

එක්සියයක් රජදරුවන් හුන් තෙනට තමන්ගේ රටින් සාරසියයක් ගව් ගෙවා ගොස් තමන් මරන්ට වටලාගත් රජදරුවන් හා ඒසා මහත් චතුරංගිනී සේනාව තමන්ගේ ප්‍රඥා බලයෙන් තනිව ජයගෙණ උත්තර පංචාල දේශයෙන් මියුලුනුවරට ආ දවස් රැස්වූ බොහෝ ජනයෝ සුවසේ ආවාවූ පණ්ඩිතයන් දැක ‘බ්‍රහ්මදත්තරජ්ජුරුවන් ඇතුළුවූ එක්සියයක් රජුන් ජයගෙණ ආ සේකැ’යි ඉතා ප්‍රසන්නව ඔදවැඩිව සතුටුවූවාහු ඒ පණ්ඩිතයන්ගේ කීර්තිය පැතිරෙන්නාක් පරිද්දෙන් සත්දවසක් මුළුල්ලෙහි පිළීහිස සිසාරා නෙය්‍යාඩන් කෙළියහ”යි වදාළසේක.

මෙසේ බෝධිසත්ත්වයන්වහන්සේ සත්දවසකින් සැණ කෙළි අනතවූ කල්හි රජගෙට ගොසින් "මහරජ චූලනී රජ්ජුරුවන්ගේ මැනියන් පුතනුවන් බිසවුන් වහා යැව්ව මැනවැ"යි වදාළසේක "යහපත පුත මට කියන්නේ කිම්ද යවාපියව"යි කීහ. බෝධිසත්ත්වයන් වහන්සේ තුන්දෙනාට වෙන වෙනම බොහෝ සත්කාර සම්මාන කොට එක්සියයක් රජදරුවන් හා බ්‍රහ්මදත්තරජ්ජුරුවන් තමන්ට ප්‍රසාදයේ දුන් චතුරංගිනී මහසේනාවට බොහෝ ප්‍රසාදදීමෙන් සත්කාර සම්මාන කරවා ඒ මහසේනාවත් බ්‍රහ්මදත්තරජ්ජුරුවන් තමන්ට පාවාදුන් සියයක් ස්ත්‍රීන් ඇතුලුවූ සාරසියයක් කෙල්ලන්ද නන්දාදේවින්ට පාවාදී, ප්‍රසාද සේනාවත් උන් ඇරලාලා එන පරිද්දෙන් උත්තම පාවාදී මහ පෙළහරින් යැවූසේක.

ඒ රජදරුවෝ තුන්දෙන අපමණවූ රජ පෙරහරින් යන්නාහු සියක් යොදුන් මග ගෙවා උත්තර පංචාලනුවරට පැමිණියහ. බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ මැනියන් විචාරන්නාහු "කිමෙක්ද මැනියන්වහන්ස වේදේහ රජ්ජුරුවෝ 'සතුරාගේ මැනියෝය'යි මාකෙරේ කළ වෛරයෙන් නුඹවහන්සේ කෙරෙහි නොසතුටුව විසූද? නොහොත් සංග්‍රහකළෝද"යි කීහ.

දේවී "පුතණ්ඩ කුමක් කියන්නෙහිද? මා දේවතා තනතුරෙහි තබා දුටහ, නන්දාදේවින් මව්තනතුරෙහි තුබා දුටහ, පංචාලචණ්ඩ කුමාරයන් එකකුසින් උපන් මල්තනතුරේ තබා දුටහ, බොහෝ සත්කාර සම්මානයෙන් බොහෝ ආචාර සමාචාරයෙන් සංග්‍රහකළහ"යි මැහැලිවහන්සේ තමන් මුඛනොසෑහෙන පරිද්දෙන් ගුණ කීහ. රජ්ජුරුවෝ එබස් අසා වඩවඩා සන්තෝෂයට පැමිණ බැනනුවන්ට බොහෝ පාක්කුඩම් හා පඬුරු යවූහ.

වේදේහ රජ්ජුරුවන් කළ සංග්‍රහ මැනියන් අතින් විචාරන්වත් නන්දාදේවීන් අතින් නොවිචාරන්ටත් කාරණා කිම්ද යත් නන්දාදේවී තරම් රූ ඇති කෙනෙක් මුලු දඹදිව අනික් තෙනක නැත, මා සමීපයෙන් ගොස් සාරසියයක් ගව්වේ උන් තැනැත්තී "මා කෙළෙක් කෙළේය"යි සිතා මා කෙරෙහි ආදරයක්වත් භයක්වත් නැතිව අනාචාර සීලිවතමා සිත්වූ පරිද්දෙන් වැසපූ නම් විචාළකල නැත්තක් මුත් ඇත්තක් නොකියන්නීය, නැත් ඥ නම් යෙහෙලියන්ට කුකුලන් හා බළලුන්සේ කෙනෙක, ඇත්තක් තබා නැත්තක් කියා බිඳුවන්ට නිස්සහ; එසේහෙයින් බිසවුන් අතින් නොවිචාරා මැනියන් අතින් විචාළහයි දතයුතු. එතැන් පටන් දෙපක්ෂයේ ඇත්තෝම ඔවුනොවුන් සමග සුවසේ විසූහ.

**මහා උම්මග්ගකාණ්ඩය නිමි.**

# දිය රකුසු පැණය.

---o---

පංචාලචණ්ඩිබිසව් වෛදේහරජ්ජුරුවන් ප්‍රියසිත් ගෙණ වසත්නාහු දෙවන අවුරුද්ද පුතනුකෙනෙකුන් වැදූහ. ඒ කුමාරයන් වැඩි දසඅවුරුදු කල වෛදේහරජ්ජුරුවෝ සවර්ගස්ථවූහ. බෝධිසත්‍වයන්වහන්සේ දස ඇවිරිදි කුමාරයන්, ධවලච්ඡත්‍ර නගා රාජ්‍යයෙහි පිහිටුවා "දේවයන්වහන්ස නුඹවහන්සේගේ මුතුන් රජ්ජුරුවන් සමීපයට යෙමි" වදාළසේක. කුමාරයෝ "මා බාල තැනැත්තවූ ඇරපියා නොයව, තොප පියහනතුරේ තබා රකිම්, සියල්ලෙන්ම ආදර කෙරෙමි"යි කීහ. ඒ අසා පංචාලචණ්ඩි බිසව් කියන්නාහු "මාගේ මව්පියන් ඇතත් මට පියතනතුරේ සිට මේ සාරසියයක් ගව්වට සරණදුන්දැත් නුඹදැමය, ජන්මාන්තර වෛරී රජදරුවන් කිරඹසේ එක්සිත්කරවා අවෛරීකළදැත් නුඹදැමය, එසේ හෙයින් මටත් මපුතනුවන්ටත් අභිවෘඩිදැ නුඹදැමය, නුඹ මේ නුවරින් ගියකල අපට කිසි පිටිවහලෙක් නැත, නොගියමැනව, දරුවන්ගේ පිය රජ්ජුරුවන් සිටියාසේ සියලු සම්පත් වළඳ රාජ්‍යයකළ මැනව"යි කීහ.

එබසට වදාරණසේක් "ඒ එසේමය, එදවස් මා එන ගමනේ වෛදේහරජ්ජුරුවන් මළකල එන්නෙම්යි නුඹවහන්සේගේ පිය රජ්ජුරුවන්ට ප්‍රතිඥ දී එනලද, එසේහෙයින් නොගොස් රඳන්ට නොපිළිවනැ"යි කියා මියුලුනුවර බොහෝ ජනයන් කරුණාවෙන් බැගෑව හඬමින් සිටියදී අමරාදේවින්දැ හා සහජාත යෝධයන් හා අවශෙෂවූ දූසිදූස් ආදීන්ගෙන් කැටිව එනුකැමැත්තන් ඇරගෙණ නික්මුණුසේක්, සියක් යොදුන් මග ගෙවා ගොස් උත්තර පංචාලනුවරට පැමිණිසේක. "මහෞෂධපණ්ඩිතයන්වහන්සේ එනසේකැ"යි යනු චූළනීරජ්ජුරුවෝ අසා චතුරංගිනී සේනාව පිරිවරා පෙරගමන්කොට ඉදිරියට අවුත් මහපෙරහරින් ගෙණ ගොස් ඉඳිනට මාහැඟි මාලිගාවක් දුන්හ, පළමු දුන් සළුගම් අසූව විනා අමුතුව දුන් කිසිවකුත් නැත්තේය. එසේ උවත් එහි කිසි කණස්සල්ලක් නොව කළමනා රාජසේවය පමානොව කරණසේක.

එසමයෙහි ඉතා නුවණැත්තාවූ කීමෙහි බිණීමෙහි දක්ෂවූ කාරණා කාරණා දන්නා ඉතා ධර්මිෂ්ඨවූ භේරීනම් පරිබ්‍රාජිකා කෙනෙකුන්දැ එක්වන් රජගෙයිදී වළඳ මගුල් උයන ඉඳිනාසේක. "මහෞෂධ පණ්ඩිතයෝ යයි යන කෙනෙක් රජ්ජුරුවන්ට සේවය කෙරෙත්ල, උන් හා සමාන කෙනෙක් නැත්ල"යි

පරිබ්‍රාජිකාවන්දෑ නාමින් අසා දන්නාසේක. * "මෙබඳු ගුණඇති කෙනෙකුන්දෑ රජ්ගෙයි වළඳනසේකෑ" යි බෝධිසත්වයන් වහන්සේ අසා දන්නාසේක; එකදවසකුත් ඔවුනොවුන් දුටුවිරුදෑ නැත්මය, නන්දදේවීත් "එසේ උමගින් සොරා ගෙණගොස් මසක් වන ගණන් රජ්ජුරුවන් කෙරෙන් මා වියෝකොටපීහ"යි තමන්ගේ එපමණ ප්‍රියවිප්‍රයෝගයට බෝධිසත්වයන්කෙරෙහි නොපහන් නැනැත්තෝ වෛරයෙන් තුමූත් කිසිවකුත් කොටගන්ට අසමර්ථව තමන් කෙරේ වලලභ සත්‍රීන් පස්දෙනෙකුන්ට කියන්නාහු "තෙපි ඇම මහෞෂධපණ්ඩිතයාගේ අපරාධ පරීක්‍ෂාකොට රජ්ජුරුවන්ට කියා බිඳුවාපියව"යි කීහ. ඔහු පස්දෙන මහතානන්ගේ වරද සොයන්නාහු ඔබ යන එන තෙන අනුන්ට කිසිවකුත් නොහඟවා පරීක්‍ෂාකොට ඇවිදිනාහ. එදවස් පරිබ්‍රාජිකාවන්දෑ රජගෙයි වළඳා තමන්වහන්සේගේ ආශ්‍රමයට වඩනාසේක් බෝධිසත්වයන්දෑ රාජසේවයට වඩනාවුන් රාජාංගනයෙහි මිදුලෙහි දුටුසේක. මහතානෝ පරිබ්‍රාජිකාවන්දෑ වැඳලා සිටිසේක. පරිබ්‍රාජිකාවන්දෑ සිතනසේක් "මේ පණ්ඩිතයෝ නුවණැත්තෝල, එබැවින් මුන්ගේ නුවණ පරීක්‍ෂාකෙරෙමි" සිතා "බසින් කීවා කවුරු නොදනිද්ද? හස්තමුද්‍රා නම් බැරි දෙයක, එබැවින් හස්තමුද්‍රාවෙන් ප්‍රශ්නයක් විචාරමි" සිතා බෝධිසත්වයන්දෑ මූණ බලා අත්ල විදහා පෑසේක.

ඒ කුමක් කී නිසාදයත් "කිමෙක්ද පණ්ඩිතයෙනි, රජ්ජුරුවෝ තොපගේ රටින් මෙරටට ගෙන්වාගෙණ අත විදෑ සම්පත් දී පියා සුවසේ රකිද්ද නොරකිද්දෑ" † යි සිතින් සිතා බසින් නොකියා අත්ල විදහා පෑ නියාය. බෝධිසත්වයන්දෑ සිතනසේක් "මා අතින් හස්තමුද්‍රාවෙන් ප්‍රශ්න විචාරණසේක් වනෑ" යි ඒ ප්‍රශ්නය විසඳනසේක් තමන්වහන්සේගේ මිට අකුළුවා පෑසේක. කුමක් කී නියාදයත් "මා සමීපයට එව'යි ප්‍රතිඥ ගෙණ මාගේ රටින් මා ගෙන්වාගෙණ මිටින් තරවගත් දෙයක් අනුන්ට නොදෙන්නාසේ, ‡ අමුතු කිසිවකුත් මට නොදෙන්නාහ"යි සිතා අතින් ප්‍රශ්නය විසඳූ නියාය. පරිබ්‍රාජිකාවන්දෑ ඔබ දැනගත් නියාව දැන අත ඔසවා තමන්දෑගේ ඉස පිරිමැඩලූසේක. කුමක් කී නියාද යත් ඉදින් උකටලී වූනම් අපසේ මහණව නොගනුදැයි හැඟවූ නියාය. එයිත් දැනලා තමන්වහන්සේගේ බඩ පිරිමැඩලූසේක. ඉන් හැඟවූයේ "මා විසින් රකිනා බඩවල් බොහෝය,

* නායමහාසතෙනාතදිඨ පුබ්බොමහොසධපණ්ඩි
තොකිරරාජිනං උපඩ්ඪාතීති සද්දමෙවසුණාති.
තෙනාපිසානදිඨපුබ්බා හෙරීනාම පරිබ්බාජි
කාරාජගෙහෙභුංජතීති සද්දමෙවසුණාති.

† පටිගගතින පටිජගගතීති. ‡ අපුබ්බංකිඤ්චි.

එබැවින් පැවිදිවන්ට නොපිළිවනැ"යි කී නියාය. මෙසේ ඒ පරිබ්‍රාජිකාවන්දෑ හස්තමුද්‍රාවෙන් ප්‍රශ්න විචාරා තමන්වහන්සේගේ ආවාසයටම වැඩිසේක. බෝධිසත්ත්වයන්දෑත් පරිබ්‍රාජිකාවන් වැඳ රාජසේවයට ගියසේක.

නානාදේශීන්ගේ වල්ලභයන්හු රජගෙයි සිව්මැදුරු කවුළුවෙන් පිටත බැලූවාහු මේ ක්‍රියාව දැක, රජ්ජුරුවන් සමීපයට ගොස් "දේවයන්වහන්ස මහෞෂධ පණ්ඩිතයෝ පරිබ්‍රාජිකාවන් හා එක්ව නුඹවහන්සේ සතු රාජ්‍යය ප්‍රාර්ථනාකරන්නාහ. නොබෝකලකින් නුඹවහන්සේ මරා රාජ්‍යය ගන්නාහ"යි බිඳවාපිහ.

ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු 'කිමෙක්ද තොප දුටු දෙයෙක්ද ප්‍රත්‍යක්ෂකොට ඇසූ දෙයෙක්දැ'යි කීහ. "අසා වදාළමැනව, පරිබ්‍රාජිකාවන්දෑ ඊයේ රජගෙයිදී *වල්ලභයන්නවුන්දෑ මහෞෂධ පණ්ඩිතයන් දැක බොහෝදෙනා හෙයින් බසින් මන්ත්‍රණයට භය ඇතිව ඉඟිපානාහු 'පණ්ඩිතයෙනි තෙපි නුවණැති නැනැත්තන් උව, දඹදිව සියලු රාජ්‍යය අතුල්තලයක්මෙන්ද, නොහොත් කලමඩලක්මෙන්ද තනාගෙණ රාජ්‍යය තොප අත්පත් †කරගන්ට නොපෝසත්දැයි තමන්ගේ අත්ල විදහා උපමාකොට පෑදැය. පණ්ඩිතයෝ ඒ දැනගෙණ 'කඩුව මිරිකාගනිම්නම් කිප දවසකින් රජහු මරා රාජ්‍යය අත්පත්කොට ගනිමි කඩුව ගන්නාලෙස මිට අකුලුවා පෑහ. පරිබ්‍රාජිකාවෝ 'එසේවිනම් 'රජහු ඉස කපාහැරපියව'යි තමන් ඉස පිරිමැඩලූහ. එවිට පණ්ඩිතයෝ 'ඉසට ගැසූ පහර මාගේ හයින් අත වැරද මුදුනෙන් ඉස පලාගියේ නම් නපුර, බඳ මැදින් පොළුකෙරෙමි' සිත තබා බඩ පිරිමැදලිය. මහරජ ඇසූ දෙයක් කුමට කියමෝද ? අප ඇස් පුරා දුටුම්හ"යි කියා නැවතත් කියන්නාහු "අප්‍රමාදව මහෞෂධ පණ්ඩිතයා මරාපියමැනවැ"යි කීහ.

රජ්ජුරුවෝ උන්ගේ බස් අසා මෙසේ සිතූහ—පණ්ඩිතයන් ‡ විසින් මා කෙරේ වරදනට නොපිළිවන, පණ්ඩිතයන් කිවයි කියන කාරිය පරිබ්‍රාජිකාවන්දෑ අතින් විචාරා දැනපියමි" සිතා දෙවන දවස් පරිබ්‍රාජිකාවන්දෑ වළඳා අනතයෙහි උන්දෑ විචාරන්නාහු 'කිමෙක්ද ? පණ්ඩිතයෝ දුටුදැ'යි කීහ. "මහරජ ඊයේ රජගෙයි වළඳා යන්නමෝ අතරමගදී දුටුම්හ"යි කිසේක. 'උන් හා කළ කථාවෙක් ඇද්දැ'යි කීහ. "මහරජ § උන් හා බසින් කී දෙයෙක් නැත 'උහු නුවණැත්තාහ'යි යනු අසා 'ඉඳින් නුවණැත්තාහු වීනම් දැනගන්නාහ'යි සිතා පරීක්ෂාකරණ පිණිස හස්තමුද්‍රාවෙන්

* පරිබ්බාජිකාහුංජිත්වා ඔතරන්තී.
† හත්ථගතංකාතුං න සක්කොසීති.
‡ තුණ්හකාපණ්ඩිතෙනමයිදුස්සිතුං, § සල්ලාපෙනාපි.

ප්‍රශනයක් විචාළම්හ, අප විචාළ ප්‍රශනය දැන අප සිත්වූ පරිද්දෙන් විසඳූහ"යි වූනියායෙන් වදාළසේක. 'ස්වාමිනි පණ්ඩිතයෝ නුවණැත්තෝද්ද'යි කීහ. "මහරජ නුවණැත්තෝය, උන් හා සමාන කෙනෙක් එකතෙනකත් නැත්තාහ"යි වර්ණනාකළසේක. රජ්ජුරුවෝ පරිබ්‍රාජිකාවන්ගේ බස් අසා වැද පන්සලට යැවූහ.

උන්වහන්සේ ගිය ඉක්බිති බෝධිසත්ත්වයන්දැ ආසේක. පරිබ්‍රාජිකාවන් විචාළ නයින්ම 'කළ කථා කිම්ද්ද'යි කීහ. ඔබ "මා හා බසින් කී දෙයෙක් නැත, හස්තමුද්‍රාවෙන් ප්‍රශනයක් විචාළසේක; ඔබ විචාළ ප්‍රශන මමත් නොවරදවා හස්තමුද්‍රාවෙන්ම විසඳිමි'යි පරිබ්‍රාජිකාවන්දැ කී පරිද්දෙන් නොවරදවාම වදාළසේක.

එදවස් රජ්ජුරුවෝ මහතානන් කෙරෙහි පැහැද දසදහසක් යොදුන් දඹදිව මුළුල්ලට නායකකොට සෙනෙවිරත් ධුරය පාවාදී පටබැඳවූහ. "සියලු රාජ්‍යය මුලුල්ල පණ්ඩිතයන් කිවක් කෙළේමය, මෙවක් පටන් උන් කිවක්මය මා කරන්නේය"යි යනාදීන් සියලු දඹදිව මුලුල්ලම උන්වහන්සේට පාවාදුන්හ, හිමාලයෙන් හුනු පංචමහාගංගාවන් එක්ව මහමුහුදට වදනා කලක් පරිද්දෙන් බෝධිසත්ත්වයන්වහන්සේගේ ගෙට සියලු සම්පත් හා ඓශ්වර්‍ය්‍ය මහමුහුදට වඩබාදියසේ ප්‍රමාණාතික්‍රාන්තව ඉතා බොහෝ විය.

රජහු තමන්වහන්සේට යසස් දුන් ඉක්බිති නුවණැති මහතානන්වහන්සේ මෙසේ සිතූසේක, කෙසේද යත් "රජ්ජුරුරුවෝ එකවිටම මේසා මහත් තනතුරක් දී තමන් හැර මා මුත් සියලු සම්පත්තීන් නැති නියාවට මේසා මහත් ඓශ්වර්‍ය්‍යයෙහි පිහිටුවාලූව, රජදරුවෝ යමක්හුකෙරෙහි වෛරවූනම් පස්වරු නසත්නම් පෙරවරු මහා සම්පත් දෙන්නාහ; දැන් මටත් මෙනෙක් දවස් කිසිවකුත් නොදී මහෝෂයක් සේ මේසා මහත් සම්පත් එකපැහැර දීපීහ, රජ්ජුරුවන් මා කෙරෙහි ඉත සිතින් දුන් බවත් අහිත සිතින්දුන් බවත් නොදනිමි, කල් නොයවා එයින් දැනපීම් නම් යහපතැ"යි සිතා "රජ්ජුරුවන්ගේ අදහස් තත්වූ පරිද්දෙන් දැනපියන්නට අන්කෙනෙකුන්ට නොපිළිවන, භේරීපරිබ්‍රාජකාවන්වහන්සේ මහානුවණැතිසේක, උන්වහන්සේ එක් උපායකින් ඒ දැනපියන්ට තරම්සේකැ" යි බොහෝ සුවඳ මල් හා ගිලාන ප්‍රත්‍යයෙන් කිසිවකුත් ගෙන්වාගෙණ පන්සලට ගොස් සුවඳින් මලින් පූජාකොට "ස්වාමිනි නුඹවහන්සේ මාගේ ගුණ කීවක් පටන් රජ්ජුරුවෝ තමන් හැර සම්පත්තීන් මා මුත් අනික් කෙනෙකුන් නැති නියාවට මහවතුරක් පරිද්දෙන් මාගේ මාලිගාව නොයෙක් ඉසුරෙන් සමෘධ කොටපීහ, ඒ මා කෙරෙහි

සමසිතින් දුන් බවත් මා නසාපියන සිතින් දුන් බවත් නොදන්මි, රජහු මා කෙරෙහිඇති සමාධිගුණය තත්වූපරිද්දෙන් දැනපිය මැනව"යි වදාළසේක.

පරිබ්‍රාජිකාවන්දැත් 'යහපතැ'යි ගිවිස දෙවන දවස් රජගෙට යන ගමන්ම * **'දියරකුසු පැණය'**යි එක් ප්‍රශනයක් සිතා නැවත මෙසේ සිතනසේක් "පණ්ඩිතයන් හා එක්ව කථාකළ චරපුරුෂයෙකු සේ නොවී, උපායකින් ප්‍රශනය විචාරා, රජ්ජුරුවන්ගේ හිත අහිත දෙක දැනපියම්හ"යි වළඳ අනන්තයෙහි රජ්ජුරුවන් ඇවිත් වැඳ උන්කල්හි පරිබ්‍රාජිකාවුන්දැට මෙසේවූ අදහසෙක් වූයේය. කෙසේදයත් "ඉදින් මේ ප්‍රශනය බොහෝ දෙනා මැදයෙහි විචාලෙම්නම් රජ්ජුරුවෝ පණ්ඩිතයන් කෙරෙහි වෛරිවූනම් බොහෝදෙනා මධ්‍යයෙහිම † වෛරිබව කීවු නම් යුක්තනොවෙයි" සිතා "මහරජ තනිව රහස්කථාවක් කියනු කැමැත්තම්හ"යි වදාළසේක. රජ්ජුරුවෝ සමීපයෙහි මිතිසුන් පිටත්කරවූහ. එවිට පරිබ්‍රාජිකාවන්දෑ කියන්දෑ 'මහරජ තොප අතින් ප්‍රශනයක් විචාරම්' වදාළසේක. 'විචාළමැනව දනිම් නම් කියමි' කීහ. එවිට භේරිනම් පරිබ්‍රාජිකාවෝ කියන්නාහු මේ දියරකුසු පැණයෙහි පළමුවන ගාථාව වදාරණසේක්—

සචෙවො වුය්හමානානං, සත්තන්නං උදකණ්ණවෙ;
මනුස්සබලි මෙසානො, නාවං ගණ්හෙය්‍ය රක්ඛසො;
අනුපුබ්බං කථං දත්වා, මුංචෙසි දකරක්ඛතො.

මේ ගාථාවෙන් කීයේ "එසේ වීනම් මහරජ තොපගේ වැදූ මැනියන් තලතාදේවීය තොපගේ නායක බිසව් නන්දාදේවීය තොපගේ මලනුවෝ තීක්ෂණ මන්ත්‍රී කුමාරයෝය, තොපගේ යහලුවූ ධනුසේකර කුමාරයෝය, අග්‍රපුරෝහිත කේවට්ට බ්‍රාහමණයෝය, මහෞෂධ පණ්ඩිතයෝය, තෙපිය, යනමේ සත්දෙනා මහා සමුද්‍රයෙහි එක නැවකින් යවුනම්, මිනිසුන් කා ඇවිදිනා උදක රාක්ෂසයෙක් මිනිස් බිල්ලක් සොයා ඇවිදිනේ, තොප සත්දෙනා නැගීයන්නාවූ නැව දැක මුහුදදිය දෙබෑකොට ගෙණ අවුත් නැව අල්ලාගෙණ තොපට කියනකල මහරජ 'මේ තොප හා කැටිව එක නැවෙන් යන සදෙනා පිළිවෙළින් දුනහොත් මුත් නැව නාරිමි' කී නම් ඒ සදෙනාගෙන් කවුරුන් පළමුව දෙවුද දෙවැනිව තුන්වැනිව සතරවැනිව පස්වැනිව දී කවුරුන් අනන්ත කොට බිලිදී ඒ ජලරාක්ෂසයා අතින් ගැලවෙව්දෑ"යි විචාළහ.

* ගවජමාතාව. † මජ්ඣයෙව.

ඒ අසා රජ්ජුරුවෝ තමන් සිත වංචා නැතිව අදහස්වූ පරිද්දෙන් කියන්නාහු—

මාතරං පඨමං දජ්ජං, භරියං දත්වාන භාතරං;
තතො සහායං දත්වාන, පංචමං දජ්ජ බ්‍රාහ්මණං;
ඡට්ඨාහං දජ්ජ මත්තානං, නෙව දජ්ජං මහොසධං.

මේ ගාථාවෙහි අභිප්‍රාය නම් "ස්වාමිනි සැබවින් ජල රාක්ෂසයා නැව අල්වාගෙණ 'සදෙනා මට පිළිවෙළින් බිලිදී තෙපි ගැලවෙව්'යි කී නම් ඔහට පළමුකොට මාගේ මෑනියන් දෙමි, දෙවැනිව නඤ්දේවීන් දෙමි, තුන්වැනිව මාගේ මලනුවන් දෙමි, සතරවැනිව මාගේ යහලුවා දෙමි, පස්වැනිව කේවට්ටයා දෙමි. පස්දෙනා දී මහෞෂධ පණ්ඩිතයන් හා මා හා දෙන්නාම මතු සිටි කල්හි, තවත් බිලි ඉල්වා නම්, පිළී තරව හැඳගෙණ කැසපට කවාගෙන දසදහසක් යොදුන් දඹදිව මා කරන්නාවූ රාජ්‍යශ්‍රී නොසිතා 'එම්බල මා කාපියවයි' කියා මහෞෂධපණ්ඩිතයන් මා පිටිපස්සට දමාපියා ඒ රාක්ෂසයා කට දල්වාලූකල්හි පණ්ඩිතයන් මාරුවෙහි ඔහු කටට පැන ඔහට බිලිවෙමි තමුත් මා පණ ඇතිව හිඳ මා ඇසින් බල බලා මාගේ පණ්ඩිතයන් රාක්ෂසයාට නොදෙම්මය"යි කීහ.

මේ ප්‍රශනය මෙතෙකින්ම නිමියේය. එතකුදු උවත් "රජ්ජුරුවන් පණ්ඩිතයන් කෙරේ ඇති ඉත සිතත් මා විචාළ ප්‍රශනයත් මා ඇසූ පමණින්ම ප්‍රසිඩවන්නේ නොවේ; එබැවින් මුහුදු දියපිට ඉසලූ තෙලින්නක් මුළුල්ලෙහි විහිද යන පරිද්දෙන් කෙලෙම්නම් යහපතැ"යි සිතා "මහරජහු සමගින් මාලිගාවෙන් බැස ජනසමාගමය කරවා එතනත් රජහු අතින් විචාරමි, රජ්ජුරුවෝ මට පළමු කී ලෙසම 'පස්දෙනා පිළිවෙළින් දී පණ්ඩිතයන් රකිමි'යි කියති, එතන මම මෑනියන් ආදි පස්දෙනාගේ ගුණ බොහෝ දෙනා මැදයේ කියමි, පණ්ඩිතයන්ගේ නුගුණ කියමි, රජ්ජුරුවෝ උන් හැමදෙනා නුගුණ බොහෝකොට කියා පණ්ඩිතයන්ගේ ගුණ කියති, එසේ කල්හි බෝධිසත්වයන්ගේ ගුණ ආකාශයෙහි පූර්ණචන්ද්‍රයා පරිද්දෙන් ප්‍රසිඩවන්නේය"යි සිතා "මහරජ තොපගේ අන්තඃපුරවාසීන්ද රාජකුමාරවරුන්ද මේ මහත් නුවර ප්‍රසිඩ ජනයන් එකහෙලා රැස්කරවා, රාජාංගනයෙහි මාහැඟි ආසනයක් පණවා විසිතුරුකරව"යි අනඝවූ ආසන පණවා එහි උන් පරිබ්‍රාජිකාවන්දැ රජහු අතින් පළමු තනිව විචාළ පරිද්දෙන් ප්‍රශනය ආදියෙහි පටන් විචාරා රජ්ජුරුවනුත් තමන් පළමු කී පරිද්දෙන්ම ඒ රාක්ෂසයාට "පළමු මෑනියන් හා සවෙනිව තමන් පිළිවෙළින් බිලිදී මහෞෂධපණ්ඩිතයන් රකිම්මය, මා පණ තබා ඇසිල්ලකුත් මාගේ පණ්ඩිතයන් කෙරෙන් වියෝව විසිය නොහෙමි" කී කල්හි කියනසේක්—

"මහරජ සිත ඇත්තක් තබා බසින් එකක් නොකියව, අප වැන්නන්ටත් මායම් කියද්ද ? තොප කියන්නේ කවුරුන් අදහා ගන්නා බසෙක්ද 'දියරකුසා නැව අල්වාගත්කල වැදූ මැනියන් පටන් තොප සදෙනා පිළිවෙළින් බිලිදී පණ්ඩිතයන් රකිමි' කිව බැලූකල මහෞෂධපණ්ඩිතයන් තරම් තොපට සතුරෙකුත් නැත වැදූ මවුන් නම් සත්‍වයන්ට උන් විනා උපකාරී කෙනෙකුත් නැත, ඉනුත් තොපගේ මැනියෝ සෙස්සවුන්ගේ මවුන්සේ අල්පවූ ගුණඇති කෙනෙක් නොවෙත්, තොපට බොහෝ උපකාරී උව, එසේවූ ගුණඇති මැනියන් කුමක් පිණිස දෙවිද"යි රජහට ප්‍රත්‍යක්ෂකොට දූනෙන පරිද්දෙන් කියනසේක් මෙසේ වදාරණ සේක්—

පොසෙතා තෙ ජනෙත්තී ච, දීඝරත්තානුකම්පි තාං;
ඡබ්බෙ තයි පදුට්ඨස්මිං, පණ්ඩිතා අත්‍ථදස්සිනී;
අඤ්ඤං උපනිසං කත්‍වා, වධාතං පරිමොච යී.

තං තාදිසිං පාණදයිං ඔරසං ගබ්භධාරිණිං;
මාතරං කෙන දොසෙන, දජ්ජාසි දකරක්ඛනො.

මෙහි අර්ථ කෙසේදයත් මේ චූලනි රජ්ජුරුවන්ගේ පියානන් සමයෙහි චූලනී කුමාරයන් බාලකල ඒ රජහු පිරි මස සිටි ඡබ්බ නම් පුරෝහිත බමුණා හා මේ තලතාදේවීන් ලෝකස්වාද රතියෙන් සතුටුව සමග වසන්නාහු විෂමිශ්‍ර භෝජනයකින් රජහු මරා බමුණාට ධවලච්ඡත්‍ර නංවා ඔහට අගමෙහෙසුන්ව බමුණා රාජ්‍යයකරණ සමයෙහි, එක්දවසක් චූලනිකුමාරයන් 'මැනියන් වහන්ස බඩසාය'යි කීකල්හි * ඔහට සකුරුආදි පැණියක්හා කැවුම් දෙවූහ. එහි මැස්සෝ පිරිවරාගත්හ. කුමාරයෝ රන් තැටියෙන් මී බිඳූ බිම හෙලා තැටියේ උන් මැස්සන් ගසා නෙරපූහ. ඒ මැසි සමූහයා ගොසින් බිම මී බිඳුවල වසාගත්හ. එවේලෙහි කුමාරයෝ මැස්සන් නෙරා කැවුම් කා අතකට සුඩකොට කෙළියට ගියහ.

බමුණු මේ ක්‍රියාව දැක සිතන්නේ "මේ ඉස නොනැගීම තමා කන කැවුමේ මැස්සන් පලවා කැවුම් කැය. ඉදින් නොනැසී, වැඩිනිනම් මට රාජ්‍යය නොදෙන්නේය, මොවුන්දැ † දැන්ම මරා පියමි" සිතා එපවත් තලතාදේවීන්ට කීය. බිසව කියන්නාහු "දේවයන්වහන්ස මම නුඹ කෙරෙහි කළ සෙන්හයෙන් මාගේ එවැනි රජ්ජුරුවන් පවා විෂලා මරාපීමි; එබැවින් මට මුන්ගෙන් ප්‍රයෝජන කිම්ද සැලනොකොට සොරා මරාපියම්හ"යි කියා බමුණා අස්වසාලා, ඉතා නුවණැති බිසව උපායක් ක්ෂණයෙහි සිතා අරක්කැමියා කැඳවා "දරුව මපුතනුවෝ චූලනි කුමාරයෝත් තොපගේ පුතා ධනුසේඛර කුමාරයාත් එකද උපන්හ,

* අම්මඡාතොමක්ඛිතිවුතෙන † ඉදානෙවතං මාරෙමීති.

අසමානවූ කුමාර පෙරහරින් වැඩියහ; එබැවින් ප්‍රාණය සමාන යහලුවහ, දැන් ඡබ්බ නම් බ්‍රාහමණයා මපුතනුවන් මරණු කැමත්තේය, තෙපි මා දරුවන් දිවි රැකදෙව" යි කියා "යහපත දේවීන්වහන්ස කුමක් කෙරෙම්දැ ' යි කීකල්හි "එසේ වීනම් මාගේ පුතනුවෝ එක්වන් . තොපගේ ගෙයිම වෙසෙත්වා, කවුරුනුත් සැක නොකරණ පරිද්දෙන් හා හැමදෙනාම දන්නා පරිද්දෙන් හා කීපදවසක් තුන්දෙන තනිව මහමුළුතැන් ගෙයි වැදහෙව 'චූලනී කුමාරයන් හා අරක්කැමියා හා පුතු ඇතුළුවූ තුන්දෙනා මුළුතැන්ගෙයිමය'යි සැක නැතිවූ කල තොප වැදහොත් තැන එළුවන්ගේ ඇට ඇද ලාපියා, මිනිසුන් රැ නිදිගත් කල මුළුතැන්ගේ ගිනි ලා පියා, කිසි කෙනෙකුන්ටත් නොහඟවා දරුදෙන්නා හැරගෙණ මේ නුවර හළ් පැලැල්ලෙන් පළමු නික්ම පසල්දනව්වෙහි අනික් නුවරකට පලාගොස්* මපුතනුවන් රාජකුමාරබව නොහඟවා දිවි රැකදෙව"යි කීහ.

'ඒ යහපතැයි ගිවිස්සේය. මුතු මැණික් ආදිවූ රුවනින් යම්තාක් දෙයක් දුන්හ, ඒ අරක්කැමියා ආදි තුන්දෙනම මුළුතැන්ගේ ගිනිලා යන්නාහු ක්‍රමයෙන් ගොස් මද්‍රරට සාගලපුර නුවරට වැද රජ්ජුරුවන් වැඳ තමන්ගේ ජාති ඇඟවූහ.

මද්‍රරජ්ජුරුවෝ තමන්ගේ පරණ අරක්කැමියා ඇර ඔහුගේ මුළුතැන්ගේ රක්නාධුරය ඕහට පාවාදුන්හ. කුමාරවරු දෙදෙන ඔහු සමගම එක්වන් † රජගෙට යන්නාහුය. රජ්ජුරුවෝ 'කුමාරවරු කාගේ දරුවෝදැ'යි විචාළහ, 'මාගේ දරුවෝය'යි කීකල්හි 'මේ එක්වණ, මේ වෙනස්ය'යි කී කල්හි "මාගේ බිරින්දන් දෙන්නාගේ දරුවෝ දෙන්නාහ; එබැවින් මේ මා වැනිය මේ මැනියන් වැනිය'යි කීය. එසේ කල් යත්යත් ඔව්හු යහලුව ගොස් මද්‍රරජ්ජුරුවන්ගේ දුවනියන් හා එක්ව රජගෙයිම කෙළිනාහ. නැවත චූලනී කුමාරයන් හා කුමාරිකාවන් හා දෙදෙන එක්වන් දැක්මෙන් ඔවුනොවුන් කෙරෙහි පිළිබඳවූ අදහස් ඇතිවූහ. කෙළිමඩලේදි චූලනි කුමාරයෝ තමන් කෙළිනා පලස්හුවටත් ලනුවත් කුමාරිකාවන් ලවා 'තෙලේ ගෙණ'යි යනාදීන් තමන් සිටි තැනට ගෙන්වන්නාහුය, සමහර විටෙක නොගෙණාව තරවා ඔලුවේ ඇනලන්නාහ. කුමාරයා තමාගේ රාජමානයෙන් තරවා ගැසූ පහර සමහරවිට සෙන්හයෙන් ඉවසාපියති, සමහරවිට ඉනාම රිදී යන්නා ඉවසියනොහී අත්ගගා හඬන්නාහ, ඒ අසා රජ්ජුරුවන් මාගේ දරුවන්ට ගැසුවෝ කවුරුදැ'යි කී කල කිරිමව් ගොස් විචාරන්නාහ "ඉදින් මම මේය මා ගැසූයේ යයි කීම්නම් මපියානෝ ඕහට රාජඥ කරන්නාහ"යි සිතා සිතා ඔහු කෙරේ සෙන්හයෙන් එබව වලහා ‡ "කුමක් කියව්ද මා කවුරු මරද්ද නිකම් අඬාපීමි"යි යටකරන්නීය.

* තිරොරට්ඨංගන්ත්වා. † රාජනිවෙසනං ගච්ඡන්ති. ‡ හඟවා–ඇතම්

නැවත එක් දවසක් මරන්නවුන් රජ්ජුරුවෝ තුමූම දැක මෙසේ සිතූහ—"මේ කුමාරයා මූහා එක සැටියත් නොවෙයි, සුවර්‍ණ ප්‍රතිබිම්බයක් මෙන් ඉතා ප්‍රියවන්නේය, 'මේ රජගෙයකැ'යි වත් 'රජ්ජුරුවන්ගේ දුවකැ'යි වත් මම නොරටින් අම්, වත් අරක්කැමියාගේ පුතෙකිම් වත් කිසි භයක් නැත්තේය; මට වලහා කී බව මුත් මේ අරක්කැමියාගේ පුතෙක් නොවේ"යි කියා එවක් පටන් විමසන්නාහ. කිරිමව් කුමාරිකාවන් කෙළනා තැනට කැවුම් ගෙණයන්නාහ. කුමාරිකාවෝ සෙසු බාල දරුවන්ටත් බෙදදෙන්නාහ. සෙස්සෝ දික්කළ කැවුම් ගන්නා කල දණ්වක නමාගෙණ නැඹුරුව * දෙතුන් දික්කොට ඇරගෙණ කන්නාහ. චූලනිකුමාරයෝ කෙළිම්න් සිට අතින් උදුරාගෙණ කන්නාහ. එයිත් රජ්ජුරුවෝ දුටහ.

නැවත එක් දවසක් චූලනි කුමාරයන් කෙළනා බමර දමා ලූව රජ්ජුරුවන්ගේ කුඩා යහන යට වැදගියේය. ඒ ගන්නා කුමාරයෝ තමන්ගේ රාජමානයෙන් 'මේ ප්‍රත්‍යන්ත රජුගේ ඇඳ යටට ඉස නැමිම් † නම් ඔහු වැන්දට අඩුදැ'යි මානයෙන් දණ්ඩකින් මෑත්කොට ගත. රජ්ජුරුවෝ ඒ ක්‍රියාවන් දැක ඒකාන්තයෙන් මේ අරක්කැමියාගේ පුතෙක් නොවේ'යි සිතා; අරක්කැමියා කැඳවා 'මේ කාගේ පුතෙක්දැ'යි විචාළහ. මාගේම පුතාය'යි කීහ. "එම්බල ‡ තාගේ පුතාත් නොපුතාත් මමදනිම්, බොරු නොකියා ඇති සැටියේ කිය; බොරු කියෙහි නම් දත්තෙහි වේද"යි කඩුව අමෝරා භයගැන්නූහ. ඒ මරණ භයින් තැතිගෙණ 'තනිව දන්වාලම්' කී කල්හි රජ්ජුරුවෝ මිනිසුන් දුරුකළහ. එවිට අභය ඉල්වාගෙණ මාලු චූලනි රජ්ජුරුවන් බේත්ලා මැරූ තැන් පටන් රජහු විචාළ තැන් දක්වා තමන් කොට ආපවත් කථාවවූ පරිද්දෙන් නොවලහා කීය. රජ්ජුරුවෝ තත්වූ පරිද්දෙන් අසා දැන තමන්ගේ දුවනියන් බිසෝපළඳනාවෙන් සරහා චූලනි කුමාරයන්ට පාවාදුන්හ. මේ චූලනි කුමාරයන් මදුරව විසූ නියාවය.

අරක්කැමියා හා කුමාරවරුන් හා ගියු දවස් "අරක්කැමියාත් පුතාත් චූලනි කුමාරයෝත් තුන්දෙන මුළුතැන්ගෙයි ගත්ගින්නෙන් ඇතුළුගෙයිම ද මළහ"යි සියලු නුවර § කෝලාහලවිය. තලතාදේවි එ පවත් අසා බමුණාට කියන්නාහු "නුඹ හා අප හා සිත ඇත්ත මුදුන්පත්විය, ඒ තුන්දෙනා එක ගෙයි ද මළහ"යි කීහ. බමුණු ඔදවැඩී සතුටු වීය. ඒ තලතාදේවී 'චූලනි කුමාරයන්ගේ ඇටය'යි එළු ඇට ගෙන්වා බමුණාට

* දෙහොත් සුත්-ඇතම්. † හෙඩාසයනෙ හවිස්සාමිති.

‡ අහංතවපුත්තං ච අපුත්තංච ජානාමි,

§ සකල නගරෙ කොලාහල මහොසි.

පෑ ගිවිස්වූහ. මේ නිසා පරිබ්‍රාජිකාවන්දෑ අනික් උපක්‍රමයක් තමන්ගේ නුවණින් දක්වා මතාප මරණින් මුදා රැක්කීය"යි කියා 'ඒසා අපමණ සැපත් දුන් එවැනි මැනියන් කවරවරදකින් ජලරාක්ෂසයාට දෙව්ද"යි කීහ.

ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු මාගේ "මැනියන්දෑගේ ගුණ බොහෝ බවත් දනිමි, නුඹවහන්සේ විදාළ ගුණයට වඩා මා දන්නා නුගුණ බොහෝය"යි කියන්නාහු "ස්වාමිනි උන්දෑ නුගුණ හැම කියන්ට නොපිළිවන, යම්තම් දෙයක් කියමි අසා වදාළ මැනව—

දහරාවිය අලඞ්කාරං, ධාරෙති අපිළන්ධිය,
දෙවාරිකෙ අණීකඩ්ඪෙ, අතිවෙලං පජග්ඝති.

තතොපි පටිරාජානං, සයං දූතානි සාසති;
මාතරං තෙන දෙසෙන, දජ්ජාහං දකරක්ඛනො.

තමන්දෑ ඉතා වයස්ගතවසිට බාල සත්‍රින් පළඳනාවූ මිණි මෙවුල්දම් ආදි නොපළඳමනා පළඳනා පැළඳ මා අමාත්‍යමණ්ඩලයා පිරිවරා සිංහාසනාරූඪව උන් කල්හි බොහෝදෙනාට පෙණෙන පරිද්දෙන් සක්මන්කොට ඇවිදිනාදෑය, පැළැන්දවූ මණිමේඛලා දමාදියෙහි ශබ්දය සියලු රජගෙය එකනින් නාද කරමින් සිටිනීය. අමාත්‍ය මණ්ඩලයා මැද උන් මම 'මුන්වහන්සේ පැළඳි ආභරණයෙහි ශබ්දය තියා දූන ලජ්ජාවෙන් කරබාමි, අමාත්‍යසමූහයා ඔවුනොවුන් මුහුණ බලන්නාහ. තවත් නොකටයුත්තක් බලා වදාළමැනව, *මූන්දෑගේ ඉඳුල්කන්වත් තරම් නුවූ දෙරටුපාල කොල්ලන්ද . ඇත් ගොව්වන් ආදීන්ද කැඳව කැඳවා බොහෝවේලක් උන් හා සමග මහත්කොට සිනාසෙන්දෑය. මා සතු ප්‍රත්‍යන්ත රජදරුවන්ට මා යැව්වාකොට පත් ලියා යවන කල 'මාගේ මැනියන්දෑ මැහැලිනොවන්දෑය, සොළොස් ඇවිරිද්දෙහි සිටියන්ටත් මූන්දෑ වඩනාදෑය, මෙනම් රජ්ජුරුවෝ අවුත් තමන්ට බිරින්දකොට යෙත්ව'යි මා යැව්වාකොට මට සොරා පත් යවන්දෑය; රජදරුවෝ පත් බලාපියා හසිත් තැතිගෙණ නැවත මට පත් එවනකල 'අප තමන්වහන්සේගේ සේවකයන් උව, මෙසේ නොතරම් කටයුතු කියා එව්වේ ඇයිද්ද'යි පත් එවන්නාහ. ඒ ගෙණා පත් සබයෙහි කියවන්ට වන් කල මා ඉස් වද්දන තැනක් නැත්තාසේ මහාලජ්ජාවෙන් පොළව පැළී නොයන සේය'යි සිතමි, ස්වාමිනි මේ වැරදි නිසා මැනියන් ජලරාක්ෂසයාට දෙමි"කීහ.

---

* එතෙදෙවාරිකා චෙටකෙ වහත්ථි අවරියාදිකෙ අණී කඩ්ඪෙව යෙ එතිස්සා උච්ඡිට්ඨකම්පි භුංජිතුං අයුත්තරූපාතෙ ආමන්තෙත්වා ආමන්තෙත්වා තෙහි සද්ධිං අතිවෙලං මහාහසිතං හසීති.

"මැනියන් මේ වරදින් ජලරාක්‍ෂසයාට දෙව. නන්දාදේවීන් තරම් ගුණ ඇතිකෙනෙක් නැතැ"යි උන්ගේ ගුණ කියනසේක් මෙයින් වදාරණසේක්—

ඉත්‍ථිගුම්බස්ස පවරා, අච්චන්ත පිය වාදිනී;
අනුගතා සීලවතී, ඡායාව අනපායිනී.
අක්කොධනා පඤ්ඤවතී, පණ්ඩිතා අත්‍ථදස්සිනී;
උබ්බරිං කෙන දෙසෙන, දජ්ජාසි දකරක්ඛනො.

මෙයින් කියා "මහරජ මේ නන්දාදේවී නම් තොපගේ සොළොස්දහසක් බිසෝවරුන්ට නායකව පංචකල්‍යාණයෙන් හා සියලු රූපශ්‍රීන් විරාජමානව බාලයෙහි පටන් සවකියවූ ඡායාවක් පරිද්දෙන් තොප අත් නොහැර පවත්නීය. උන්ගේ ගුණ කියත් නම් මදුරට සාගලනුවර තොප වසන සමයෙහි තොප තමා මැරූ කල ගෙඩි කත් මුත් තොපගේ ආඥ මරුත්තු නොකොට තොපකෙරේ සෙන්හයෙන් දෙමව්පියන්වත් නොකිවූය; මෙබඳු ගුණ ඇති නොකිපෙණ සුලු ඉතා නුවණැති අභිප්‍රාය දන්නා තොප සිත්වූ පරිද්දෙන් වැස තොප සේ පිණැති දූදරුවන් වදා රාජාභිවෘද්ධිය වඩා දුන් ඒ නන්දාදේවීන් කවර වරදකින් රාක්‍ෂසයාට දෙවදැ"යි කීහ.

ඒ අසා උන්ගේ නුගුණ කියන්නාහු මෙයින් කීහ—

ඛිඩ්ඩා රතිසමාපන්නං, අනත්‍ථවස මාගතං;
සා මං සකානං පුත්තානං, අයාචං යාචතෙ ධනං.

සොහං දදමි සාරත්තො, බහුං උච්චාවචං ධනං;
සුදුච්චජං චජිත්‍වාන, පච්ඡා සොචාමි දුම්මනො;
උබ්බරිං තෙන දෙසෙන, දජ්ජාමි දකරක්ඛනො.

මෙයින් කියා "ස්වාමිනි මේ නන්දාදේවී රහසිගතව ලොකාස්වාදරතියෙන් සතුටුව මා තමා වසගත්වයට පමුණුවා මා අතින් නොඉල්වියයුතු ආභරණාදිය ඉල්වයි, මාගේ සෙසු බිසෝවරුන්ට හා උන්ගෙන් උපන් දූදරුවන්ට මා විසින් සෙන්හයෙන් කරවා පළඳවනලද නොයිල්විය යුතු පළඳනා මා අතින් ඉල්වයි, මම 'ඒ දුන් කල මතු ඒ නිසාවන පසුතැවිලියෙක් ඇතැ'යිනො සිතා; කාමරාගයෙන් දවනලද අදහසින් 'ඇරගනුව'යි ඉල්වූ පළඳනා උදුරාදෙමි; මෝ රජහුවිසින් මට දෙනලදැ'යි දරුවන් හඬද්දීමගලවා ඇරගෙණ 'දරුවන්ට දුන් පළඳනා උදුරාගත්මි'යි අතිසයින් සතුටුවෙයි. එකල බිසෝවරුන්හා දරුවෝ අවුත් 'මෙකිවා දුන්නෙත් ඇයිද, නැවත උදුරා ගත්තෙත් ඇයිදැ'යි සබාවෙ උන් මට ඇ මැදහත් නියාය'යි මැසිවිලි කියති, බාල දරුවන් අඬත් අඬත් මටත් සෝක උපදනේය, 'මා කළදෑ නපුරැ'යි පසුතැවිලියට පැමිණ නැවත භාණ්ඩාරයෙන්, ඇරගත්තාට දිවූ

ණක් දීත් උන් හැම සංහිඳුවාගත නොහෙම්, මේසා දෙම්නසක් වන්නේ උන් නිසාවේද මේ වරදින් උන් ජලරාක්ෂසයාට දෙමි'යි කීහ.

“ඒ වන්නා”මේ වරදින් බිසවුන් බිලිදෙව, නොපගේ මලනුවෝ මහා උපකාරී වූහ, උන් කවර වරදින් රාක්ෂසයාට දෙව්ද”යි කියන සේක් මෙයින් වදාරණසේක්—

යෙ නොවිනා ජනපදා, ආනීතාව පටිගගහං;
ආහතා පර රජ්ජෙහි, අභිණ්ය බහුං ධනං.

ධනුගගහානං පවරං, සූරං තිඛිණ මන්තිනං;
භාතරං කෙන දොසෙන, දජ්ජාසි දකරකඛනො.

මෙයින් වදරා “මහරජ තොප සවදේශයෙන් ගොස් අන්‍ය දේශයෙහි උන්නවුන් තමන්ගේ උපායෙන් ගෙණවුත් සියලු සම්පත්තීන් සමෘඩවූ රාජ්‍යයෙහි පිහිටුවා, තවද දසදහසක් යොදුන් දඹදිව දුනුවායන්ට අග්‍රවූ වැරසැරවූ තීක්ෂණ මනත්‍රිවූ එක කුසින් උපන් මලනුවන් කවර වරදකින් බිලිදෙව්ද”යි විචාළසේකි. ඒ තීක්ෂණ මනත්‍රි කුමාරයෝ නම් මෑනියන් හලනාදේවින් මාලු චූලනි රජ්ජුරුවන් විෂලා මරා බමුණා හා එක්ව වසන කල උපන්හ. එසේබව මුත් උපන්නේ මාලු චූලනි රජ්ජුරුවන්ටය. ඒ *බමුණු මනත්‍රිකුමාරයන් වැඩුනු කල කඩුවක් අතටදීලා “මේ ඇරගෙණ එක්වන් මාලඟ සිටුව”යිකීය. ඒකුමාරයෝත් 'බමුණා නෝතමාගේ පියානෝමය'යි සිතා සේවයකරන්නාහ. (එකලත් දූන්සේම වියරුවෝ ඇතිවන්නාහ.) එක් අමාත්‍යයෙක් සෙමෙන් කියන්නේ “කුමාරයෙනි තෙපි මොහුගේ කුමාරකෙනෙක් නොවව, තොප මව්කුස වසන සමයෙහි තොප මව් මේ බමුණා පිණිස තොප පියානන් මරා මොහු රාජ්‍යයෙහි පිහිටිවූහ. තෙපි මහා චූලනි රජ්ජුරුවන්ගේ පුතනුවෝය”යි කීහ.

ඒ කුමාරයෝ දණ්ඩෙන් ගැසූ නයෙකුසේ කිපි 'එක් උපායෙකින් මේ බමුණා මරම්' සිතා, රජගෙට නොසිත් වදනාහු ඒ බමුණු තමන්ට දුන් කඩුව තමන් ලඟ සිටි එකක්හටදී අනිකක්හට කියන්නාහු “තෝ 'තෙලේ කඩුව මාගේ කඩුවය'යි වාදකොට කළහ වඩව”යි කියා රජගෙට වන්හ. ඔහු දෙදෙන 'මේ මාගේ කඩුවය, තට දුන්නෝ කව්රුද'යි කලහ කළහ. කුමාරයෝ පළිමූනොදන්නා වන්ව 'කොල කුමන කලහයෙක්ද'යි එකෙකු බලන්ට යැවූහ. ඒ අවුත් 'නුඹවහන්සේගේ කඩුව අනිකෙක් 'තමාගේ කඩුවය'යි උදුරා කලහ කෙරෙති”යි කීහ. බමුණා ඒ අසා 'කුමක්ද'යි විචාළ කල්හි 'නුඹවහන්සේ මටදුන් කඩුව අනික් කෙනෙකුන්ගේ කඩුවද'යිකීහ. “කුමක් කියව්ද, මාගේ භාණ්ඩාරයෙහි සියදහස්ගණන් කඩු තිබියදී තොප එක පුතනුවන්ට අනු

* බ්‍රාහමණො බගගංහතෝ දත්වා.

න්ගේ කඩුවක් කුමකට දෙම්ද"යි කීහ. "එසේවී නම් නුඹවහන් සේ මට දුන්කඩුව ඇඳිනාගතහෙන සේක්ද? පරීක්‍ෂාකරවන පරිද්දෙන්ගෙන්වමෝද"යි කීහ. 'ඇයි පුත මාදුන් කඩුව මම නොහ ඳුනම්ද වහා ගෙන්වව'යිකීහ. කුමරයෝ කඩුව ගෙන්වා කොපුවෙන් මැත්කොට 'බැලූව මැනවැ"යි කඩුව පානා එකක්හු පරිද්දෙන් වමතින් කොපුව ගෙණ විදුලියක් ගැසූ ඇසිල්ලක්මෙන් එක පහරින් බමුණා හිස කපා පාපිට හෙළූහ. එවෙලෙහි මල බමුණා රජගෙන් පිටත්කොට ගෙය පවිත්‍ර කරවා කුමාරයන්ට ධවලච්ඡත්‍ර නංවාසිටි කල්හි මැතියෝ චූලනී කුමාරයන් සාගල නුවර වසන නියාව කීහ. ඒ අසා තීක්‍ෂණ මන්ත්‍රි කුමාරයෝ චතුරංගිනි සේනාව පිරිවරා ගොස් බැණන් ගෙණවුත් රාජාභිෂේක කරවා රජකළහ. ඒ කුමාරයෝ ක්‍ෂණයෙහි සිතාපියන බුඞි ඇත්තාහ, එයින් තීක්‍ෂණ මන්ත්‍රි කුමාරයෝයයි, දඹදිව ප්‍රසිඞවූහ. පරිබ්‍රාජිකාවන්දෑ 'මේ වැනි කුමාරයන් කවර වරදකින් රාක්‍ෂසයාට දෙව්ද'යි වදාළසේක.

එ අසා මලනුවන්ගේ නුගුණ කියන්නාහු මෙයින් කීහ.

මයොචිතා ජනපදා, ආනිතාච පටිග්ගහං;
ආහතං පර රජ්ජේහි, අභිඨාය බහුං ධනං.

ධනුග්ගාහානං පවරෝ, සූරෝ තිඛිණමන්තිසො;
මයා සො සුඛිතො රජ්ජ, අතිමඤ්ඤති දාරකො.

උපට්ඨානම්පි මෙ අයේ‍ය, න සොඑති යථාපුරෙ;
භාතරං තෙන දෙසෙන, දජ්ජාහං දකරක්ඛනො

මේ ගාථා කියා "නිඞීනිව විසූ මොහු මේ නුවර ගෙණවුත් මට පැමිණි රාජ්‍යයෙහි පිහිටුවාලිමි"යි කියාත් 'තද දුනු ඇදිම් විදිම්හි සියලු ධනුශ්ශිල්පයෙහි දඹදිව මටවඩා දක්‍ෂයෝ කවුරුදැ'යි කියාත් ඉක්මසිතන්නේය. සෙස්ස තබා පෙර රාජසේවයට එනකල බොහෝ දෙනාට කල්තබා එන්නාහ, දැන් මෙම නිසා අභිමානයෙන් කල්යවාත් එන්නේය, සමහර දවස් තමාම නොඑන්නේය, මේ වරද නිසා රාක්‍ෂසයාට බිලිදෙමි"යි කිහ.

'මලනුවන් ඒ වරදින් දෙව' ධනුසේඛර කුමාර යන්ගේ ගුණ කියන සේක්—

එකරත්තං ච උභයො, සමංචාපි ධනුසෙඛවා;
උභොජාතෙත්‍ථ පංචාලා, සහායා සුසමාවසා.

චරියායං අනුබන්ධිත්‍ථො, එකදුක්ඛ සුඛො තව;
උස්සුක්කො තෙ දිවාරත්තං, සබ්බකිච්චෙසු ව්‍යාවටො;
සහායං කෙන දෙසෙන, දජ්ජාසි දකරක්ඛනො.

මේ ගාථාවෙන් වදාරා "මහරජ ධනුසේඛරයා නම් තද දුනු ඇදීම් විදීම් ආදි ධනුශ්ශිල්පයෙහි ඉතා දක්‍ෂය, මේ පංචාලනුවර තොප හා එකදවස් උපන, තොපගේ ඡායාවපරිද්දෙන් සුව දුක්

දෙක එක්ව විඳආය, තවද තොපගේ රාජකෘත්‍යයෙහි රැ දෙ වෙහි අප්‍රමාදව වසන්නේය, එසේවූ බන්ධු සමාන යාලූවා කවර වරදින් යකුට දෙව්ද”යි කීහ. ඒ අසා නුගුණ කියන්නාවූ රජ්ජුරුවෝ මේ ගාථා තුන කියත්—

චරියායං අයං අය්‍යෙ, පජග්ඝිත්‍ථො මයා සහ;
අජ්ජාපිතෙන වණ්ණෙන, අතිවෙලං පජග්ඝති.

උබ්බරියාපි මෙ අය්‍යෙ, මන්තයාමි රහොගතො;
අනාමන්තොව පවිසති, පුබ්බෙ අප්පටිවෙදිතො.

ලද්ධවාරො කතොකාසො, අහිරීකං අනාදරං;
සහායං තෙන දෙසෙන, දජ්ජාහං දකරක්ඛනො.

“ස්වාමීනි මාගේ යාලුවා කුමාර කල පටන් එක්ව කාබී සිට එක්ව කෙළි බොහෝ දවසක් මා කෙරෙහි භය රහිතව විසූ පම ණකින් දූත් මා රජව සිටිකලත් පළමු පරිද්දෙන්ම මා කෙරෙහි ගෞරව ආදර නැත්තේය. තවද තමාට රැකවල් නැති හෙයින් කවර වේලකත් බිසවුන් හා රහස් කථාවක් කෙරෙම් නමුත් සිටි රැකවලුන් නැවතුවත් උන්ට පරුෂ බැණ උන් භයගන්වා නිර්භීතව තන්ව උන්තැනට ගොස් වදනේය, අනාදර කරන්නේය, මා ඉදිරියෙහි අත්පොළා සෙන්නේය, මා දුප්පත් සමය සේ දැනුත් සිත්තේය. පළමුව කියානේවාම මා උන් යම්ම තෙනකට වහා එන්නේය; මේ වරදින් යාලුවා දියරකුසාට දෙම්”යි කීහ.

“යාලුවා ඒ වරදින් දෙව, කේවට්ටයා නම් තොපට බොහෝ උපකාරිය”යි ඔහුගේ ගුණ කියනසේක් මේ ගාථාවෙන් වදාරණ සේකි—

කුසලො සබ්බනිමිත්තානං, රුදඤ්ඤූ ආගතාගමො;
උප්පාදෙ සුපිනෙ යුත්තො, නීය්‍යා නෙව පවෙසනෙ,
පණ්ඩො භුම්මන්ත ලික්ඛස්මිං, නක්ඛත්ත පද කොවිදො;
බ්‍රාහ්මණං කෙන දෙසෙන, දජ්ජාසි දකරක්ඛනො.

මේ ගාථායෙහි අභිප්‍රාය නම් “මහරජ මේ කේවට්ටයා නම් බසින් නොකියා අනුන් සිතූ දෙයක් තමා ඇසූ දුටු දෙයක් සේ ශාස්ත්‍රබලයෙන්ම දන්නාවූ රාජනීති ආදි ලෝකව්‍යවහාරයෙහි දක්ෂවූ දුටුවාවූ ස්වප්නයෙහි වැඩ අවැඩ දන්නාවූ ගමනාගමනයෙහි අභිවෘද්ධි මේයයි නොවරදවා දන්නාවූ චන්ද්‍රග්‍රහණ සූර්‍ය්‍යග්‍රහණ ආදිය තත්වූ පරිද්දෙන් නොවරදවා දන්නාවූ ඉඳින් සිතිනම් අහස පොළව දෙක ගැටලනනරම සියලුඋපායෙහි දක්ෂවූ සිතූ අර්ථයක් සාදගන්නා තරම් නුවණ හා මන්ත්‍රිකමින් අග්‍රවූ කෙනෙක, ඒ බ්‍රාහ්මණයා කුමක් පිණිස රකුසාට දෙව්ද”යි වදාළ සේක. ඒ අසා බමුණාගේ වරද කියන්නාවූ රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කියත්—

පරිසානමපි මෙ අය්‍යෙ, මීලයිත්වා උදික්ඛති;
තස්මා අච්චහම්පිං ලුද්දං, දජ්ජාහං දකරක්ඛිනො.

මේ ගාථාවෙන් කියේ "මම අමාත්‍යමණ්ඩලයා පිරිවරා සිංහාසනාරූඪව උන්නෙම්නමුත් මේ තමාගේ බැම රැළියෙන් වැසීතිබෙන්නාවූ ඇටිකුලින් ඇස්මෙන් පිගුවූ ඇසින් බැමය නගාලා කිපි බලන එකෙකුමෙන් එක්වන් මා මුහුණ බලන්නේය, සිනෙන් දුටුවත් බානතරම් මොහුගේ රූප විලාසය හා කඩදත් හා මූණ හා රත්වූ ඇස්ඇති රාක්ෂසයෙකු දුටුවා සේ ඉතා භයපත්ව මොහු දකිනා සේයයි සිතමි; එසේ විරූපවූ බමුණා මෙ සෙයින් දිය රකුසාට දෙමි"යි කීහ.

ඒ අසා පරිබ්‍රාජිකාවන්දෑ "වැද්දූ මැනියන් ආදිවූ පස්දෙනා රකුසාටබිල්ලට දී මේසා රාජ්‍යසම්පත්තියක් හා ශ්‍රීවිභූති අලුයම දූමූ කෙලපිඩක් සේ නොසිතා තොපගේ ජීවිතය මහෞෂධපණ්ඩිතයන්ට දෙමියි කිව. ඒ පණ්ඩිතයන්ගේ පෙර ගියදවසත් මතු එන දවසත් කවර ගුණයක් දැක එවැන්නක් කරව්දැ"යි රජ්ජුරුවන්ගේ යසස හා කීර්ති වර්ණනා කරණ පරිබ්‍රාජිකාවන්දෑ—

ස සමුද්ද පරියායං, මහිං සාගරකුණ්ඩලං;
වසුන්ධරං ආවසසි, අමච්චපරි වාරිතො.

චාතුරන්තො මහාරට්ඨො, විජිතාවී මහබ්බලො;
පඨව්‍යා එකරාජසි, යසො තෙ විපුලං ගතො.

සොළසිත්‍ථි සහස්සානි, ආමුත්ත මණි කුණ්ඩලා;
නානාජනපද නාරියො, දෙවකඤ්ඤූ සමා පභා.

එවං සබ්බංග සම්පන්නං, සබ්බකාම සමිද්ධිනං;
සුඛිතානං පියං දීඝං, ජීවිතං ආහු ඛත්තිය;

අථ ත්වං කෙන වණ්ණෙන, කෙනවාපන හෙතුනා;
පණ්ඩිතං අනුරක්ඛන්තො, පාණං චජසි දුච්චජං.

මෙයින් කියා "මහරජ තෙපි වූකලි සතරදිගින් මුහුද දිය කෙලවරකොට ඇති දසදහසක් යොදුන් දඹදිවට අගරජව, තොපට සේවකවූ සෙසු රජදරුවන්ට අනුශාසනාකරව, අමාත්‍ය සමූහයා පිරිවරා බලවාහනයෙන් යුක්තව, සියල්ලවුන් ජයගතුව~ ශක්‍රදේවේන්ද්‍රයා මෙන් යසස් හා කීර්ති ඇතිව, තවද බහා පලඳනාලද මාණික්‍ය කුණ්ඩලාභරණාදිවූ නොයෙක් බිසෝපලඳනායෙන් විභූෂිතවූ සොළොස් දහසක් පුරස්ත්‍රීන් පිරිවරණලදුව~ මෙසේවූ ජනපද ගම් නියම් ගම් රාජධානි ගෘහ උද්‍යාන ක්ෂෙත්‍ර වස්ත්‍රාභරණ අන්න පාන දාසි දස් පුත්‍ර දර ගව මහිෂ රන් රුවන් ආදියෙන් හා ඇත් අස් රථදේලි කූනම් ආදියෙන් හා චතුරංගිනී සේනාව ආදි නොයෙක් බලවාහනයෙන් හා පංචකාමයට නිවාසස්ථානයක් බඳු මේ තොපගේ ආත්මස්වභාවය, නුවණැත්තවුන් විසින් 'තමාගේ ජීවිතය සේ තමාට ප්‍රිය වස්තුයෙක් නැතැ'යි

වර්ණනාකරණලද්දේය, ඒ ආත්මය කුමක් නිසා මේ මහෞෂධ පණ්ඩිතයන් මාරුවේදී මනුෂ්‍යයන් විසින් නොකටගතහැකි නොසිතියහැකි ප්‍රාණ පරිත්‍යාගය කරවද්ද”යි වදාළසේක.

ඉක්බිති රජ්ජුරුවෝ “ස්වාමීනි කුමක් වදාරණසේක්ද? පණ්ඩිතයන්ගේ ගුණ මා තබා දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයන් හා නාග සුපර්ණාදිවූ දෙවියෝද ඒ ඒ සක්විළ අනන්ත නම් නාගරාජයෝද තමන් එකි එකී දෙනා දහසක් දහසක් මුඛ මවා එකි එකී මුඛයකින්කි ගුණ අනික් මුඛයකින් නොකියා එකි එකී මුඛයෙන් එකි එකී ගුණයෙක්ම කීයත් නම් මපුතනුවන් මහෞෂධපණ්ඩිතයන්ගේ ගුණ තම තමන් ආයු පමණින් කියාත් උන්උන්ගේ ආයුෂය ගෙවෙත් මුත් ගුණෝහි නිමාවක් වත් කෙළවරක් දකිමක් වත් හැක්කැයි නොසිතම්; එසේවූ ප්‍රමාණාතික්‍රාන්ත ගුණ හා නුවණ ඇති පණ්ඩිතකෙනෙක් මුන් විනා ගියදවස උපන්නෝත් නැත, එන දවස උපදින්නෝත් නැත; මෙදවස තමාත් නැත, එබැවින් උන්ගේ අනල්පවූ ගුණයෙන් ස්වල්පමාත්‍රයක් ඉදිකටුමලින් ආකාශය පානාසේ කියම්”කියා—

යථාපි ආගතෙ අයෙ‍්‍ය, මම හත්‍ථං මහොසධෙ;
නාභිජානාමි ධීරස්ස, අනුමත්තම්පි දුක්කටං.

සචෙ ච කිස්මිඤ්චි කාලෙ, මරණං මෙ පුරෙ සියා;
පුත්තෙ ච මෙ පපුත්තෙ ච, සුඛාපෙය්‍ය මහොසධො.

අනාගතං පච්චුප්පන්නං, සබ්බමත්‍ථං විපස්සති;
අනාපරාධකම්මන්තං, නෙව දජ්ජං මහොසධං.

“ස්වාමීනි මේ මහෞෂධපණ්ඩිතයන් මොබ ආවක් පටන් අද මේ වේලාව දක්වා ස්වල්පමාත්‍රයක් පමණ මා නුරුස්නා වරදක් දුටුදෑ නැත, ඇසූදෑත් නැත, ඉදින් තමන්ට පළමු මාගේ නම පිරිහුනුයේ වීනම් මාගේ දරුවන්ද මුනුබුරන්ද තමන්ගේ ප්‍රඥාබලයෙන් උන් හැමදෙනාටම කිසි දුකක් නොවැද්දදී සැපයෙහි පිහිටුවාලන්නාහ; තවද අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යන තුන් කල්හි පවත්නාවූ ඉෂ්ටානිෂ්ට අර්‍ථානර්‍ථ දෙක ලොවුතුරා සර්වඥ කෙනෙකුන් මෙන් තමන්ගේ ප්‍රඥාබලයෙන් ඉදුරාම දන්නාහ; නිරපරාධකාරී අසම්බුරවූ පණ්ඩිතයන් මා පණ තබා මම රැකී උදක රාක්ෂසයාට බිල්ලට නොදෙම්මය”යි බෝධිසත්වයන්ගේ ගුණ සඳමඬල අඳනාසේ තමන් සිත් පරිද්දෙන් නොසඟවා නොවළහා සියලු ජනයාට ඇසෙන පරිද්දෙන් කීහ.

රජහු සිත දෙවලයක් නොකොට තමන් සිත්වූ පරිද්දෙන් නොවළහා කී කල්හි පරිබ්‍රාජිකාවන්දෑ ඒසා මහාජන සමාගමයෙහි රැස්වූ බොහෝදෙනාහට ඇසෙන පරිද්දෙන් තවත් තරකොට ප්‍රසිද්ධවන ලෙස වදාරණසේක්—

ඉදං සුණොථ පංචාලා, චූලනීයස්ස භාසිතං;
පණ්ඩිතං අනුරක්ඛන්තො, පාණං චජති දුච්චජං.

මාතු භරියාය භාතුච්ච, සඛිනො බ්‍රාහ්මණස්සච;
අත්තනොචාපි පංචාලො, ඡන්නං චජති ජීවිතං.

එවං මහිද්ධිකා පඤ්ඤා, නිපුණා සාධු චින්තනී.
දිට්ඨ ධම්ම හිතත්ථාය, සම්පරාය සුඛාය ච.

මෙයින් වදාරා "එම්බා පින්වත්නි මා කියන්නක් අසව; චූලනි රජ්ජුරුවෝ තමන්ගේ වැදූ මෑනියන් ඇතුළුවූ අවශ්‍ය බන්‍ධූන් පස්දෙනාත් තුමූ තමන්ගේ ජීවිතයත් සදෙන ජලරාක්‍ෂසයාට බිලිවත් මේ මහෞෂධ පණ්ඩිතයන් රකිත්ල. එ බව පින්වත්වූ නුවරවාසි හැමදෙනම ඉඳුරා අසා සිත තබත්වා"යි කිහ.

"මෙසේ ප්‍රඥතොමෝ සිතූ සිතූ අර්ථසාධක බැවින් මහා සෘද්ධි ඇත්තිය, සියක්වර පැළූ අස් රෝම් අගක් සෙයින් ඉතා සියුම, ඓහලෞකික සකලාර්ථජාත පිණිසත් එසේම පාරලෞකික සකලාර්ථය පිණිසත් අත්‍යන්තෝපකාර බැවින් 'කේවල ප්‍රශස්තය'යි සිත්ය යුත්තිය"ඛියා පරිබ්‍රාජිකාවන්දෑ සත්රුවන් මාලිගාවක මැණික් කොතක් පළඳවන්නාක් මෙන් බෝධිසත්වයන්වහන්සේගේ ප්‍රඥ ගුණ සමූහය තමන්වහන්සේගේ නුවණින් දේශනාකොට කුළුගන්වා දියරකුසු පැණයෙන් මේ උම්මග්ගජාතකය නිමවා වදාළසේක.

මෙසේ ඒ මාගේ තිලෝගුරු බුදුරජානන්වහන්සේ, දුක්ඛ සත්‍යය සමුදයසත්‍යය නිරෝධසත්‍යය මාර්ගසත්‍යයයන චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශකොට ධර්‍මශාලාවෙහි රැස්වූ භික්‍ෂූන් වහන්සේ මධ්‍යයෙහි තමන්වහන්සේගේ ප්‍රඥපාරමිතාව සඳමඬල අඳනාසේ දේශනාකොට ජාතකය නිමවා වදාළසේක. ඒ ධර්‍මදේශනාව බොහෝ මනුෂ්‍ය දිව්‍ය නාග සුපර්ණයන්ට අභිවෘද්ධි දායකවිය. මෙසේ ජාතකය නිමවාවදාරා අනන්තයෙහි මහෞෂධපණ්ඩිතයන් ආදිවූ එක් ප්‍රසිද්ධයන් වෙන වෙනම තෝරා වදාරණ බුදුරජානන්වහන්සේ මෙසේ වදාරණසේක්.

භෙරි උප්පල වණ්ණාසි, පිතා සුද්ධොදනො අහු;
මාතා ආසි මහාමායා, අමරා බිම්බසුන්දරී.

සුවො අහොසි ආනන්දො, සාරිපුත්තොසි චූලනී;
මහොසධො ලොකනාථො, එවං ධාරෙථ ජාතකං.

මේ ගාථාවෙන්;—"එම්බා මහණෙනි, එසමයෙහි **පරිබ්‍රාජිකාවන්දෑ** නම් මාගේ සස්නෙහි **උපුල්වන් මහාස්ථවිරිය**. පණ්ඩිතයන්ගේ පියානෝ **සිරිවඩ්ඪන සිටානෝ** නම් **සුද්ධොදන මහ රජ්ජුරුවෝය.** පණ්ඩිතයන්ගේ මෑනියෝ **සුමනාදේවි**නම් දැන්

**මහාමායාදේවිය.** පණ්ඩිතයන්ගේ බිරිඳ **අමරාදේවි** නම් දූන් මෙවක එක්ලක්ෂ සයානූදහසක් බිසෝවරුන්ට නායකව මපුත නුවන් රාහුල කුමාරයන් වැදූ **යශෝධරාදේවිය.** පණ්ඩිතයන්ට රහස්මේවරකොට සියළුවැඩ සාදදුන් **ගිරාශෝ** නම් මාගේ සස් නෙහි බුදුන්ට උපස්ථාන කරන්නවුන්ට අග්‍රවූ ධර්මභාණ්ඩාගාරිකවූ සිහිනුවණ ඇත්තවුන්ට අග්‍රවූ බුදුන්කෙරේ වලලහවූ මාගේ බුදුසසුන් නැමති ආකාශයෙහි පූර්ණ චන්ද්‍රයා වැනිවූ මාගේම මල්වූ ජනානන්දකරවූ **ආනන්ද ස්ථවිරයෝය.** එසමයෙහි පණ්ඩිතයන් හුන් නුවරට අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව ගෙණවුත් පැරද බිඳී පැලවූ **චූලනී බ්‍රහමදත්ත රජ** නම් දූන් මට දකුණත් සව් මා විනා නුවණැත්තවුන්ට අග්‍රවූ **ශාරිපුත්‍ර ස්ථවිරයෝය.** එසමයෙහි සත් අවුරුද්දෙහි පටන් සේනකය, පුක්කුසය, කාවින්දය, **දේවින්දය**, කේවට්ටය, යන ප්‍රඥසම්පන්න පණ්ඩිතවරුන් නුවණින් ජයගත්තාවූ **මහෞෂධපණ්ඩිතයෝ** නම් දූන් **ලොවුතුරා** බුදුවූ මම්මය'යි තමන්වහන්සේ දක්වා වදාලසේකි.

**සිඛිර සතු.**

---

[අවුඩුයි] ඹේරුවලේරො දෙවදතෙතා'සි, තලතා චූලනඤිකා;
පංචාලචණ්ඩි සුන්දරදෙවි චාසියස ඝුසිකා.

අම්බඨො ආසි කාවින්දෙ, පොඨපාදෙසි පුක්කුසො;
පිලොතිකොච දෙවින්දෙ, සෙනකොචාසි සච්චකො

දෙවී උදුම්බරා දිඨමංගලි;
සාළිකා චාපි කුණ්ඩලී, විදෙහො ලාලුදයිති.

# ගැටපද විවරණය.

## අ.

අක්බඹුරු, අගින් නැමුණු

අක්ෂෞහිණී, 21870 ක් ඇත් සේනාව, 21870 ක් රථ සේනාව, 65610 ක් අශ්වසේනාව 109350 ක් පදික සේනාව යන සිව්රඟ සෙනඟ එක්වූකල අක්ෂෞහිණී නම් වේ. මහා භාරතයෙහි අක්ෂෞහිණීය මෙසේ දක්වා තිබේ.

අක්ෂෞහිණ්‍යාඃ ප්‍රමාණංතනු
ඛාගාංෂෛටක විකෛගීජෛඃ
රථෛ රෛතෛකීයෛස්ත්‍රිසෛනාඃ
පංචසෛනාශ්ච පදාතිභිඃ.

අකක්, මදටිය දෙකහමාරක බර

චත්තාරොවිහයොගුංජා
වෙගුංජාමාසකොභවෙ
වෙඅක්ඛාමාසකාපක්ඛා
ක්ඛානං ධරණමඛ්කං.

අකුසු, හෙණ්ඩු

අගම් පඩි සේනාව, පඩියට මෙහෙ කරණ සේනාව

අගය, වටිනාකම

අගනා, වටින්නාවූ

අංගරාග, ඇගේ ගාන විලවුන්

අංගානිය, මස්කඩේ

අගීදූයි, වටීදූයි

අඟුටුමිටියා, මිට්ටා

අචින්ත්‍ය, නොසිතිය හැකි

අජානිය අශ්වයා, උතුම් අශ්වයා; අජවත් ශිවවෘෂභවත් යථාසමා රොහිණංතයති. ඊශ්වරයාගේ නන්දිනම් වෘෂභයා සෙයින් ආරෝහකයා ගෙනයන්නේනුයි අජානෙයනම්. උත්තම අශ්වයාගේ ලක්ෂණ මෙසේ කියත්.

ලලාටෙයස්‍යවා චතෝ
ච්ඡීයස්තුකුක්ෂුදරෙ
මස්තකෙච තෘතීයස්තු
සචිංඥයොහයොත්තමඃ

යම් අශ්වයෙකුගේ නලලෙහි සුලියක්වේද දෙවැනි සුලියක් හැල්ලැවලෙහිත් වේද තුන්වැනි සුලියක් ඉස්මුදුනෙහිත්වේද ඒ උත්තම අශ්වයායි.

අජීව, පණනැති

අට්ටාල, (අට්ටවත් ප්‍රාසාදගෘහවත් අලතිහවති) ප්‍රාකාර මුදුනේ සෑදූ ප්‍රාසාදයක් වැනි ගේ. මැස්සයයිද කියත්. මේ ගෙවල් යුඩවලදී ප්‍රාකාර උඩ තනති.

අටතුරාසිය, එකසිය අට

අටසාළිස්, හතළිස් අට

අටවිසි, විසි අට

අඩයටි, අනිත ආයුධ

අටළොස්, දස අට

අණයක, ආඥචක්‍රය; මුළුරට පවතින අණ; රජ අණ

අත්පොළසන්, අත්පිඩි ගැසීම

අත්ල, අල්ල (ර

අත්‍යන්තෝපකාර, බොහෝඋපකා

අනවැස්සානත්ව, ගෝලයාට
අනවිද, අන දිගහැර
අති, අධික; ඉතා
අතීත, පසුගිය
අතුල්තල, අල්ල
අතුරු විථිය, ඇතුළු විථිය
අතුරුවා, අතුරවා; එලවා
අතුරු සිදුරු, අතරෙහි අවකාශ
අදවකට, අදවෙනි දිනට; අද දව
අදලි, ඉගණගත්තාවූ (සට
අධර්මිෂ්ඨ, ධර්මයෙහි නොහැසිරෙ
අධම, නිච (න
අධරපල්ලව, තොල් නැමති දලු
අධිකරණය, නඩුශාලාව
අධිකරණ නායකයා, ප්‍රධාන විනි ශ්චයකාරයා
අධිගෘහීත, අරක්ගත් (ම
අධිෂ්ඨාන, සිතාගැන්ම; බැඳගැන්
අන්තේද, අනිත්තේද
අනතර, ඇතුලි
අනතයෙහි, කෙලවර
අනනසසර, ඇතුළත හැසිරෙන
අනනපාන, කෑමබීම
අනතරායට, විනාශයට
අනතරාමාගීය, අතරමග
අනතඃපුර, බිසෝ වාසල
සත්‍යාගාරංභූභූජාමනතඃ
පුරං ස්‍යාදවරොධනම්
අනනත, කෙලවරක් නැති
අනලප, අල්පනුවූ; පිකනුවූ; බො
අනවරතයෙන් නිතර (හෝ
අනතුරුව, ඉන්පසු
අනනතා පරිමාණ, කෙලවරක් ප්‍රමාණයක් නැති
අනනතයා, එනම් නාග රාජයා; මොහුගේ පිට උඩ පෘථිවිය රඳා තිබේයයි වේදවාදිහු කියත්
අනාගත, මතුකාලය

අනාචාර ශීලිහුය, පැවතුම් නොදත් සවභාව ඇත්තාහුය
අනාචාරිය, පැවතුම් නොදත්
අනාචායෂි, ගුරුකමට ගතනොහැ
අනාථ, පිහිටක් නැති (කි
අනාථනාථ, පිහිට නැත්තන්ට පිහිට ඇති
අනාථ මරණය, මරණින් මිදීමට කටයුතු උපකාර නොලැබ මැරී
අනායාශයෙන්, පහසුවෙන් (යාම
අනායඝ, උතුම්නොවූ
අනිෂ්ටයක්, අශුභයක්
අනුකරණයෙන්, ශබ්දයෙන්
අනුබඩ, එකට බැඳුන
අනුමතිය, එකඟකම
අනුව්‍යංජන, බුදුරජානන්වහන්සේගේ ශරීරයෙහි කුඩා පින් ලකුණු
අනුසාරයෙන්, පසුපස්සෙහි යා
අනූනවූ, අඩුනැති (මෙන්
අනූපමවූ, උපමාකල නොහැකි
අනේක, නොයෙක්
අනෝපමෙය, උපමාවක් දක්විය
අන්‍යතර, එක්තරා (නොහැකි
අන්‍යතීර්ථක, බුඩාගමට විරුඩ මක්ඛලිගෝසාලාදිහු
අපහාස නින්ද
අපරීක්ෂිතව, පරීක්ෂානොකොට
අපායගාමී, අපායට යන
අපේක්ෂාවක්, බලාපොරොත්තුව
අභිනව, අලුත් ක්)
අභිප්‍රාය, අදහස; කැමැත්ත
අභිභවනය, යටත්කිරිම; පහත් කිරිම
අභිභූතව, යටත්ව; පහත්ව
අභිමතාර්ථ සාධක, සිතූ අදහස් සිඩකර දෙන්නාවූ
අභිමානය, අහංකාරය

අභිවෘද්ධි, දියුණුව
අභිෂේකය, ඔටුනු පැළඳවීමෙහිදී ඉස පැන් වත්කිරීම
අභීත, භයනැති
අභූත, බොරු; නුවූදෙය
අභ්‍යාස, පුරුද්ද
අමයි, වීහිදෙයි
අමනාත්‍රි, මන්ත්‍රණයෙහි දක්ෂනුවූ රාජ්‍යය සම්බන්ධ කාරණා ගැන කථාබස්කර විනිශ්චයකට නොපැමිණිය හැකි
අමාත්‍ය මණ්ඩලය, ඇමති සමූහයා
අමාදිය, දෙවියන්ගේ බිම
අමා, දිව්‍යභෝජනය
අමාර්ගප්‍රතිපන්න, නොමගට පැමි
අමුරන්, ශුද්ධනොකළ රන් (ණී
අමු සොහොන, මිනීකුණු දමන ස්ථානය.
අමෘතාභිෂේකය, දිව්‍ය ඔජස් ඉස වැක්කිරීම
අමෝරා, ඔසවා; උළුක්කර
අයනිමන ආදායම් උපදින
අයම්විතරින්, දිගපුළුලින්
අසීකාව, ඇගෑය; පහන්ගහ
අර්ථ, අදහස; වස්තු; වැඩ; කාරණය
අර්ථචර්යාව, වැඩෙහි හැසිරීම
අර්ථබලය, වස්තුවේ බලය
අර්ථයෙන්, අර්ථශාස්ත්‍රයෙන්; අර්ථශාස්ත්‍රයනම් චාණක්‍යාදීන් විසින් ප්‍රණීත ශාස්ත්‍රයයි. දණ්ඩනීතියයයිද කියත්
අර්ථසාධක, අදහස් සිදුකරදෙන; වැඩ සිදුකරදෙන
අර්ධයක්, අඩක්; භාගයක්
අර්ධමාෂක, ඔලිඳඇටයක බර
අර්ධශරීරය, ශරීරයෙන් භාගය
අරගල, කෝලාහල; දබර

අරබයා, ආරම්භකොට
අරා. ආරූඪව; නැගී
අරිටු, අරිෂ්ට; නපුරු
අරුණුවන්, ඉරඋදාවීමට පෙර පෙනෙන ආලෝකය වැනි පාට
අලජ්ජිවූ, ලජ්ජානැති; විළිනැති
අලතා පිරියම්කළ, ලාකඩින් පිරියම්කළාවූ
අලලා, කලතා
අලාමක, ලාමක නොවූ
අලෙවිකළේ, වියදම්කෙළේ
අල්ප, ටික; ස්වල්ප
අල්ලාපසල්ලාප, සාධුසාමිචි කථා
අව්පහරණකල්හි, අව්ව පායනවේලාවෙහි
අවකම්පනන, අනියම් විදියෙන් සෑදීම
අවකල්පන, විරුද්ධාකාරයට සැ
අවකාශ, ඉඩ; අවසර (දිම
අවන්තී, සිප්‍රාගඟබඩ පිහිටි ප්‍රදේශය; එහි අගනුවර උදේනිනම.
අවධිකළ, සීමාකළ; නියමකළ
අවපස්ලොස්වක්, මාසේ පෝය
අවබෝධවිය, වැටහී ගියේය
අවමංගල්‍යය, අශුභකාරණය
අවමානක්, නිඤ්ඤාවක්
අවශ්‍යයෙන්, ඒකාන්තයෙන්
අවශ්‍යබන්ධූන්, ඇවැස්ස නෑයන්
අවස්ථාපිළියම, වේලාවට සුදුසු ප්‍රතිකාරය; ස්ථානයට සුදුසු කටයුත්ත
අවිෂයස්ථාන, නොයාහැකි තැන්; නොදත් තැන්;
අවීචිය, එනම් මහා නරකය
අවුල්හර, කරපළඳින මාලයක්
අවෛරීව, වෛරයක් නැතිව

අශ්වතරයා, කොටලුවාට දාව වෙළඹ බඩ උපන් සතා; අශ්වායාං ගර්දභෙනජාතඃ පශුවිශෙෂඃ

අශීති, අසූව

අශෝක හෝපලු ගස, ස්ත්‍රීන්ගේ වම්පය වැදීමෙන් මේ ගස මල් පිපේ

අෂ්ටවංක, අටතැනකින් වක්වූ

අස්ඔබා, මුද්දර තියා

අස්ඇණිය, අශ්වයුඩ සමුදාව

අස්නක්, ලියමනක්

අස්වැසිල්ලක්, සැනසීමක්

අස්වසම්, සනසම්

අස්තපර්වත, බටහිර පර්වතය; මිට ඉර මුවාවන්නේයයි කියත්

අස්තයට, බැසීමට; බටහිරට; අස්ත පර්වතයට

අසමසමවූ, කිසිවෙකු හා සමනුවූ හෙයින් අසමයි. අන්‍ය බුදුවරයන් හා සමහෙයින් අසමසමයි. මෙය සර්වඥයන් වහන්සේට (නමකි

අසදෘශ, සමනොවන

අසල්ගම, සමීපගම; ළඟගම

අසම්භීතව, භයනැතිව

අසරුවන්, අසුන් පිට යන්නන්

අසමර්ථව, අදක්ෂව; අපොහො සත්ව

අසළයෝත්, ආශ්‍රයකළ අයත්; පුරුදු අයත්

අසාධ්‍ය, සුවකළනොහැකි; සාධ්‍ය, අසාධ්‍ය, යාප්‍යයයි රෝග තුන් ආකාරයි. එයින් සුවකළහැකි රෝගය සාධ්‍යයි. සුවනොකළ හැකි රෝගය අසාධ්‍යයි. පිළිය මින් යට කළහැකි රෝගය යාප්‍යයි

අසාධාරණ, සමනොවන; අනික් අයට නැති

අසි, කඩු

අසුන්, ආසන; ලියුම්; අශ්වයින්

අසුරගසා, අහුරුගහලා

අසුරහටයන්, අසුරයන්ගේ යුඩ කාරයන්

අසීත්‍යනුව්‍යංජන, සර්වඥශරීරයේ දෙතිස්මහා පුරුෂ ලක්ෂණවලට පිරිවරවූ කුඩා ලකුණු අසූවක්

අසුරුසන්, අහුරුගැසීමේ හඬ

අහහ, ඛෙදහර්ෂයෙහි හෝ විස්මයාර්ථයෙහි නිපාතය

අහිගුණ්ඩිකයා, නයි නටවන්නා

අහිත, හිතනැති; ලැදිකමක් නැති

---

## ආ.

ආකරවූ, උත්පත්තිස්ථානවූ

ආකාශ ගංගාව, භාගීරථී නම් ගඟ, කපිලනම් ඍෂිවරයාගේ සාප යෙන් සගර රජුගේ පුත්‍රයෝ සැට දහසක්ද අළුව ගියෝය. ඔවුන්ගේ භගීරථනම් පුතෙක් ඒ ඍෂින්ට උපස්ථානකොටපි යන්ගේ නැවත ඉපැදීමට වර ඉල්වූකල දිව්‍යලෝකයෙන් ආකාශ ගංගාව ඔවුන් දැගිය තැනට එළාගත්තොත් උපදිතියයි කී හෙයින් 12 අවුරුද්දක් ජප කොට පොළවට හෙළාගත්තේය. ඒ ගඟ ගලා එද්දී ජහ්නුනම් රජුගේ යාගභූමියෙන් ගලා ආ හෙයින් ජහ්නුරජ කෝපව ඒ ජලය සියල්ලම බිවේය. එවිට දෙවියන් සහ විශේෂවශයෙන් භගීරථත් යාඥකොට සංසිඳවාගත්පසු ජහ්නු තෙමේ තමාගේ

කන් දෙකින් ඒ ජලය පිටකෙළේය. පසුව දියපාර ගලාවිත් හිමාලයෙහි කුමාරයින් ද අඩු වුන තැන සළුශීවිය. එද පටන් ගඟ සෑදී මුහුදට ගලා ගියේ යයි වේදයෙහි පෙණේ.

ආකාශචාරිවූ, අහසින් යන්නාවූ

ආකාරයෙන්ම, සැටියෙන්ම

ආකීණි, ගැවසීගත්

ආක්‍රෝශ, නින්‍දව; අපහාසය; සාපය

ආගන්තුක, පිටතින් පැමිණි අය; අමුත්තා

ආගමනය, ඊම

ආචාරධර්මය, සිරිත් විරිත් පැවැත්වීම

ආචාරශීලය, යහපත් සිරිත; යහපත් හැසිරීම

ආඪ්‍යව, සමෘඩව

ආත්මසමාන, ජීවිතය සමාන

ආත්මරක්‍ෂාව, ජීවිත රැකගැන්ම; පණ රැකගැන්ම

ආදිකොට, පළමුකොට

ආදියෙන්, පළමුවෙන්

ආදීනව, දෝෂය; වැරැද්ද

ආදිම, ඉස්සරින්ම; මුලින්ම

ආද්‍යන්ත, මුල පටන් කෙළවර

ආධාරත්වයෙන්, උපකාර බැවින්

ආනආනා, ඇනුම් ඇර ඇර

ආපදව, විපත්තිය

ආමිෂ, උපභෝග පරිභෝග වස්තු

ආයර්‍ය, උතුම්වූ

ආයර්‍ය විහාරය, උතුම් පැවැත්ම; මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්‍ෂා, යන සතරින් යුක්තව වා

ආද්‍රවූ, තෙත්වූ (සයක්රීම

ආලම්බන එල්බගැන්ම

ආලිස්සන්, නොසැලකීම

ආලෝපය, ආහාර පිඩ

ආවාහ, සරණපාවාදීම

ආවිෂ්ටවූකල්හි, අවේශවූකල; නැගුනකල

ආවේශ, වැඟීම; ආරුඪවීම

ආශ්චය්‍යීය, විෂ්මය; පුදුමය

ආශ්චය්‍යීමත්, පුදුමයට පැමිණ

ආශිවිෂ, දළයෙහි විෂ ඇති; සර්පයා; (ආශිෂුවිෂංයෙෂාංතෙ ආශි

ආශ්‍රමය, පන්සල (විෂාඃ

ආස්තරණය, ඇතිරිල්ල

ආස්වාද, රසවිඳ ගැන්ම

ආසන්නවූ, සමීපවූ; ලංවූ

ආසින්, ආකාශයෙන් (ත්ත

ආහාරකෘත්‍යය, කෑමබීමේ කටයු

---

## ඇ.

ඇකය, ඉණ

ඇගය, පහන්ගහ; අග්ගිකා

ඇඟිලි අසුවලින්, ඇඟිලි අස්සෙන්

ඇගේම කඬේ, ඇගේම රෙද්දේ

ඇත්තල, ඇතුන් බඳින ගේ (ඇත්හල යනු ඇත්තල කියා පූර්වරූප සන්ධියෙන් සිඩවේ.

ඇත්ඇණිය, හස්ති සේනාව

ඇත්හලයෝ, ඇතුන් බලන්නෝ

ඇතමැනවැයි, ඇතොත් යහපතැ

ඇතිමටවම්, ඇතිතරම් (යි

ඇතුරුවන්, ඇතුන් පිටයන්නන්

ඇතුළතදී කව්ද? රජතෙයිදී බත් කන්නෙකිද?

ඇදගිලි, විශ්වාස

ඇදගිලිගත්කල, විශ්වාසවූකල

ඇදිලිබැඳ, දෙඅත් එක්කිරීම් වශයෙන් නමස්කාරකොට

ඇඹනියෝ, භායර්‍යාව

ඇඹුලබිජුවට, නෙළුම්ඇට

ඇඹුලඅල, නෙළුම්අල

ඇඹෙනි, හායකිාව
ඇම්මුණමැතවැයි, නැවතුනොත් යහපතියි
ඇලහෝ, ඇල හා ඔයවල්
ඇලිසිට, රැකසිට; මුවාව සිට
ඇලුම් කටයුතු, ආදරය කටයුතු සිත් අලවන්නාවූ
ඇවිලිඅවත්නි, ශාපකරන්නි
ඇවැත්නි, ආයුෂමතුනි; පින්වතුනි භික්‍ෂූන් විසින් භික්‍ෂූන්ට ආමන්ත්‍රණය කිරීමේදී බොහෝසේ ව්‍යවහාරයි
ඇස් නොමරණ, ඇසිපිය නොහෙළන
ඇසූවිරුදැත්, කිසිකලක ඇසූ බවක්වත්
ඇත්මැත්, ඒ මේ අත

---

ඉ.

ඉක්බිති, ඉන්පසු
ඉක්ම සිතන්නේය, පහත්කොට සිතන්නේය; ප්‍රමාණයෙන් ඉහළට සිතන්නේය
ඉක්මගතනොහී, පැනගත නො
ඉකුත්ව, පසුව (හැකිව
ඉඟි, අභිප්‍රාය
ඉඟිකරුව, කල්පනා සහිතව; කුමක්කෙරෙම්දැයි ඔබ මොබ බල
ඉඟිකොට, සංඥකොට; සල (බලාකුණින් දන්වා
ඉඟිපාතක්හුමෙන්, අදහස පෙන්වන්නෙක්මෙන්
ඉතසිතින්, ඇතුළත් සිතින්; ආදර සිතින්
ඉතා ගැටවා, අතිශයින් ප්‍රයොග
ඉතිකින්, මින්පසු (දක්‍ෂවූ
ඉදිකරවූහ, තැනවූහ; සකස්කර
ඉදිකොට, තනා; සකස්කරවා (වූහ
ඉදිව, සෘජුව; ඇද නැතිව
ඉඳුනිල්මිණ, ඉන්ද්‍රනීල මාණික්‍යය. මෙම මැණික කිරෙහි ලූකල නිල් පැහැවේ. සමහර කෙනෙක් අවරි යුසින් නැගි බුබුලක් වැනියයි කියත්. කොවුලාගේ බෙල්ලේ පාට වැනියයි ඇතම් කෙනෙකුගේ මතයි.
ඉඳුරා, නිශ්චයකොට; ඒකාන්තයෙන් සෘජුලෙස (මීය
ඉන්ද්‍රජාලය, ඇස්බැන්දුම; මායා ක
ඉන්ද්‍රියයන්, ඇස කන් නාසා දිව කය යන පස
ඉෂ්ටානිෂ්ට, ඉවුනිවූ; යහපත්; අයහපත්
ඉස්පයි, නොපප්පි; ඉස් වැසුම්
ඉස්බ, බඹ 35 ක ප්‍රමාණය
ඉස්ලූලූ අත, බලාඋන් උන් දිසාව; ඉස් හැරුණ පැත්ත
ඉස්සැලීම්, ඉස් සෙල්ලීම්
ඉසපියා, විසුරුවා
ඉසමල් ඇති බැවින්, ඉසේ මලක් ඇතිහෙයින් නොහොත් ඉසේ කරමල ඇති බැවින්
ඉසහෙන, ඉසට වැටෙන්නාවූ
ඉසුරුමතුන්, පොහොසතුන්
ඉසුරුමදයෙන්, වස්තුමදය නිසා වස්තුවේ මානයෙන්
ඉසුරුවූ, ප්‍රධානවූ; පොහොසත්වූ; නායකවූ

---

ඊ.

ඊදණ්ඩ, ඊගස
ඊ දුවවෙන්නිය, එතනම හැසිරෙන්නිය
ඊනියා, මෙබඳුවූ
ඊ සීනදල පමණින්, එහි සිහින් කම හා මහතේ ප්‍රමාණයෙන්

## උ.

උක්තප්‍රකාර, කියනලද ආකාර
උකටලිවූ, කලකිරීමට පැමිණි
උකාගත්, එක්කරගත්; ඔසවාගත් උරාගත්
උගවූ, තියුණුවූ; දරුණුවූ
උච්චාරණය, කීම
උච්ඡේද, මරණින් මතු ඉපදීමක් නැතැයි ගන්නා දෘෂ්ටිය

යාවජ්ජීවන් සුඛංජීවෙත්
ඍණංකෘත්වා ඝෘතංපිවෙත්
භස්මීකෘතස්‍ය දෙහස්‍ය
පුනරාගමනං කුතඃ

මේ උච්ඡේදවාදීන්ගේ මතයි.
උත්කණ්ඨිත, කලකිරුණාවූ
උත්පල, මානෙල්
උතුරුපසල් දනව්ව, උත්තර පංචාල ජනපදය
උත්සවය, මංගල්‍යය; ප්‍රීතියක් සඳහා පවත්වන මංගල්‍යය
උදක, ජලය
උදකලාව, තනියම
උදත්අතනසේක්, සතුටු අඟවන
උදර බන්ධනය, බඳපටිය (සේක්
උදහස්, කෝපය
උදාර, උඩඟු; විශාල
උදුසනක්සේ, උදෙන්ම
උදූන, ලිප
උද්‍යාන, උයන
උනස්න, උන් ආසනය
උපකරණ, යමක් කිරීමට ඕනෑකරණ දේවල්
උපකාර ඇත්තේ වීනම්, වැඩට හොඳනම්
උපදේශයක්, අවවාදයක්; දූතමිතිකමක්
උපද්‍රව, උවදුර; අන්තරාය
උපභෝග, අනුභවකිරීම් ආදියෙන් ප්‍රයෝජන ගන්නා වස්තු
උපමාවිෂයාතික්‍රාන්ත, උපමාකිරීමට වස්තු නැති; උපමාකිරීම ඉක්මගියාවූ
උපයාගෙණ, සපයාගෙණ; සොයා
උපලක්ෂිතව, යුක්තව (ගෙණ
උපායනම් තමා කිම්ද, උපායනාගි කුමක්ද
උපායවන්තය, උපායෙහි දක්ෂය
උපායෙන්, උපක්‍රමයෙන්; ප්‍රඥසම්පන්න කල්පනාවෙන්
උපුල්වන්, මානෙල්පාට
උපේක්ෂාව, සතුටක් හෝ අසතුටක් නැතිව මධ්‍යස්ථව සිටීම
උපෝසථදිනය, පෝය දවස
උභයකුලය, දෙවංශය; මව්පිය දෙකුලය
උයිත්, ඔව්හුත්; ඒ තැනැත්තෝත්
උරණ, කෝපය
උළින්, උළුවලින්
උළුකැන්, කැඳ
උළුසුණු, උළුකුඩු
උසුළුපැපෑ, උහුළු විහිළුකොටකො
උසුළුවා, උස්සවා (ට

---

## ඍ.

ඍද්ධි, ආනුභාසම්පන්න ආකාශචාරිකාදි ආශ්චර්‍ය්‍යමත් දේ සිදුකරණ තපස්බලය
ඍද්ධිවන්ත, ඍද්ධි ඇති
ඍද්ධිසම්පන්න, ඍද්ධියෙන් යුත්

---

## එ.

එක්වණ, එකපාටක්ය
එක්වැටි, තනි ඇටවැල්
එක් සමයෙක්හි, එක් කාලයක;

සර්වඥයන්වහන්සේ දේශනාවේ
යෙදී සිටින එක්කාලයක.
එකත්පසෙක, උත්තමයෙක් සමීප
යෙහි ඉඳීමට නියමකොට ති
බෙනලෙස එක්පැත්තකට වී
එකත්පස්ව, උත්තමයෙක් සමීප
යේ ඉඳීමට නියමව තිබෙන
විධියට එක පැත්තකට වී.

නපච්චතොන පුරතො
නපි ආසන්න දූරතො.
නකච්ජෙවාපි පච්වාතෙ
නචාපිඔනතුන්නතෙ.
එතෙදොසෙවිවජ්ජෙත්වා
එකමන්තංනිසීදති.

එකපැහැර, එකවිට
එකස්කොට, ඒකාංගකොට
එකහෙලා, එකාන්තයෙන්
එකුරුතුපට, රෙද්ද; තෙරිය
එඩි, ආඩම්බරය
එඩිපසුනොලා, එඩිය පසු නො
කොට; ආඩම්බර ඇතිව
එයිත්, ඒ තැනැත්තාත්
එලලිබව, එලලුබව
එලවන්නාවූ, පමුණුවාගෙණදෙන
එලිගණ, එල්ලිගණ මුවාවීගණ
එලඹ, සමීපයට පැමිණ
එළසත්, එළුවාගේ හඬමෙන් නාද
පැවැත්වීම

## ඒ.

ඒ අනුසාරයෙන්, ඒ පස්සේ යාමෙ
ඒකචර, තනිව හැසිරෙණ (න්
ඒකාන්තිකව, එක පණ වැතිව
ඒ විෂයෙහි, ඒ කාරණයෙහි
ඒ වූ නියාව, ඒ සිද්ධවූ සැටිය

## ඓ.

ඓහලෞකික, මේ ලෝකය සම්බ
න්ධවූ

## ඔ.

ඔඩම්, බත්පැන් බිමට ගන්නා භා
ඔදවැඩි, ඕජස් වැඩුනාවූ (ජන
ඔප්නැඟු, ඔපදැම්මාවූ
ඔබ්බට, එහාට
ඔබ්බේ, එහේ
ඔයිත්, ඒ තැනැත්තීත්
ඔරහිඳ, ඔඩොක්කුවේ ඉඳගණ
ඔල්වරසන්, සතුටු නාද
ඔල්වරහඬ, සතුටුඅඬහෝ ඝෝෂාව
ඔසදවටුවා, බෙහෙත් වැටිකරන්
නා; බෙහෙත් වෙළෙන්ද
ඔසවා, උස්සා

## ඕ.

ඕවිල්ලි, උන්සිල්ලාව

## ක.

කකණ්ටකයා, කටුස්සා
කකුල්දඩ, පයින් ඇවිදීම
කග, කඩුව
කටක, වලලු
කටයුතු, කරන්ට සුදුසු ඉද්
කටලන්ට, කරදෙන්ට
කටහෙලන පමණක්, කටට එන
එනදේ පමණක්
කටුකෝල් ඇරීම, කැඩී බිඳී ගිය
තැන් සකස්කිරීම
කටුසැම්ටියෙන්, කසෙන්
කඩ, රෙද්ද
කඩදත්, වැටුන දත්; කැඩුන දත්
කඩමත්ත, රෙද්ද උඩ
කඩරෙදි, රෙදිකෑලි
කඩසාලින්, කැඩුන හාල්වලින්
කඩිය, කූනටිය; (කටි ශබ්දයෙන්,
බිඳුනකල කඩි කියාවේ)
කඩියාලම, කටකලියාව
කණගෙරි, අන්ධවූ ගවයෝ
කණඑනලද, භාරවනලද
කණස්සල්ල, ශෝකය; කණගාටුව

කථාස්වරූපය, කථාප්‍රවෘත්තිය
කදලි, කෙහෙල්
කඳුරු, } කන්දෙන් ගලා යන
කඳුරැළි } දොළපාර
කද්‍යෝපැණියා, කලාමැදිරියා
කන්සීමා නොඉක්මවා, කණෙන් එපිට නොඇසෙනලෙස
කනක කටක, රන්වළලු
කන්‍යාව, තරුණිය; 10 ඇවිරිදි (කෙල්ල
කප්, කණු
කබලක්, පිඩක්; කවේ වරකට අල්ලන බත් පිඩක් හෝ කෑඳ ආදි යමක්
කඹුට, වහල් වැඩකොට
කඹුරා, යකඩ වැඩකරුවා; නවම් දන්න මිනිහා
කඹුල, වහල් වැඩකළ
කම්, කර්මාන්තය
කම්පට, කන්පොත්ත
කම්පාකෙරෙමින්, වෙව්ලමින්
කම්පිතව, සෙල්වී; චංචලවී
කර්මකාරයන්, වැඩකරුවන්
කම්මිතිය, වැඩකාරිය
කම්සන් කොටකොට, කර්ම සංඥා කරමින්; කළයුතු වැඩේ මේ යයි කියාදෙමින්
කය, ශරීරය
කයින්, ශරීරයෙන්
කයිවාරු, වර්ණනාව; ස්තුතිකිරීම
කරප, කරක්ගෙඩිය
කරජස මස්වා, අතපය බැඳලා; අතපය විලංගුදමා
කරවාල, ආයුධ වර්ගයක්
කරසක්, හක්ගෙඩි වර්ගයක්
කරුණා, අනුන්ගේ දුක දැක ලය කම්පාවන සවභාව
කරුණානිධාන, කරුණාවට නිධානයක් වැනිවූ

කල්පද්‍රැමය, දිව්‍යවෘක්ෂය; මන්දාරය පාරිජාතකය; සන්තානය; කල්පවෘක්ෂය; හරිචන්දනය යන දිව්‍යවෘක්ෂ පහක් තිබේ
කලඹ, මිටි
කලඹක්, මිටියක්
කලමඩල, කලවිට; කමත
කලල්, මඩ
කලහ, කෝලාහලය
කලාතුරකින්, කලක් ගතවූ පසු
කළමනා, කටයුතු
කළයෙන්ම, කළය පිටින්ම
කළුවැල්ලනාව, එනම් වැල්වර්ගය
කලිහෙමි, කරනොත් හැකිවෙමි
කවුඩු කෑදැල්ල, කපුටු කූඩුව
කවුළු, ජනේල
කෂාටපැනින්, කසට වතුරෙන්
කසානාවා, කහදියෙන් නාවා
කසීසලු, කසීරට සාදන වස්ත්‍ර
කහවණු, ඔලිඳඇට 40 ක් පමණ බර රන්කාසියක්; රුපියල් 3 ක් පමණ වටියයි ඇතම් අයගේ මතයි
කාඩු, කණේපළඳින ආභරණයක්
කාප්පු, වළලු වර්ගයක්
කාමචේතනා, රූප, ශබ්ද, ගන්ධ රස, ස්පර්ශ, යන පස විඳගැනීමට සිතීම
කාමරාගය, පංචකාමයෙහි ඇලීම
කාමාවචර, කාමයෙහි හැසිරෙන; මිනිස්ලොව, දෙව්ලොව යනමේ කාමාවචර නම්
කායභාරය, ශරීරය නමැති දෙර
කායබලය, ශරීර ශක්තිය
කායවාක්මනස්, කය වචන සිත
කායාදි සංයමයක්, ශරීරාදිය සම්බන්ධ හික්මීමක් නොහොත් වශ ඟකර ගැනීමක්

කායාදි සංහිඳීමක්, ශරීර ඉන්ද්‍රිය ආදීන්ගේ වසඟබවක්
කායික, ශරීරය සම්බන්ධ
කාර්‍ය්‍යභාරය, කටයුතුවල බර
කාර්‍ය්‍යයෙක්, කටයුතු දෙයක්
කාරණාකාරණා, කටයුතු නොකටයුතු
කාරුස්බැඳ, කාකාශබ්දයෙන් රාශිවි සිටින
කාලත්‍රය, කාලතුන; අතීත, අනාගත, වර්තමාන; උදය, දවාලා සවස; හ්‍රස්ව, දීර්ඝ, ප්ලුත
කාලත්‍රයවර්තිවූ, තුන් කාලයේම පවත්නාවූ
කාස, කැසි;
කාහල, හොරණෑව
කැටක්, කැටයක්; ගල්කැටයක්
කැටිව, එක්ව
කැඩපත, කන්නාඩිය; ලියුම; (පත් කඩ යනු පද පෙරළිවීමෙන් කැඩපත් කියා සිඩවේ. එයින් ලියුම්යයි අපි හැඟේ)
කැණ, හාරා
කැඳිත්තක්, කැඳ ටිකක්
කැමියන්, කම්කරුවන්
කැළිබව, කළුබව
කැහැට, කෙට්ටු
කැහැටකින්, කෙට්ටකින්
කිඳුරු, අශ්ව මුහුණක් ඇති දේව වතා කොටසක්
කින්නරාංගනාව, කිඳුරුදෙන
කිනම්මුදූසි, කුමන නමක් ඇත් තාහුදූසි
කියටි, කියන්ට සුදුසු දෙය
කියන්නාම, කියනකොටම
කියනුහුනහොත්, කියන්ට බැරි උනොත්

කිරඹසේ, කිරි සහ වතුර එක්වූ මෙන්
කිලාසකුෂ්ඨය, කබරවර්ණයක් වාතයෙන් අරුණවර්ණවද පිතින් තඹවන්වද සෙමින් සුදුපැහැයද ඇතිවේ.

කුෂ්ඨකං සමහවංශචිත්‍රං
කිලාසං දරුණංවතත්
නිර්දිෂ්ටමපරිශ්‍රාවි
ත්‍රිධාතුද්භවසංශ්‍රයම්.

වාතාත්රූක්ෂාරුණං පිත්තාත්
තාම්‍රංකමලපත්‍රවත්
සදාහංරෝමවිධ්වංසි
කඵාච්ඡ්වේතංඝනංගුරු.

කිලිපොලන්නාවූ, ශරීරය සෘජුකිරීමෙන් හිරි අරින්නාවූ
කිස්දෙවුන්, බාලම මලයා; බඩපිස්
කුංචනාදය, ඇතුන්ගේ හඬ (සා
කුඤ්ජර, ඇතා
කුටුම්බ, පවුල
කුඩාවරිනී, කුඩා තැනැත්තෙනී; දරුවෙනි; පැන්වෙනි
කුඩෙනී, දරුව; පැන්වේ (නාව .
කුණ්ඩලාභරණය, කණේ පළඳ
කුඹල්කම්, කුම්භකාර කර්මය; බඩ හැල වැඩ
කුරවීක, කෝකිල පක්ෂි
කුරුබිලිය, නාගරයකින් පිටවන කුඩා දොරකඩ
කුලයෙහි, පවුලෙහි; වංශයෙහි
කුළුගන්වා, මුදුන්ගන්වා
කුළුගෙය, කූටාගාරය; මහල්ගේය
කුළුපග, විශ්වාස
කුසිත, කම්මැලි
කුශලකර්මයාගේ විපාකය, කුසල ක්‍රියාවේ බලය
කූට, වංචාකාර; ප්‍රයෝග

කූටදන්ත, සිඳිනලද දත් ඇති; සිදුරු දත්ඇති; රෞද්‍ර දත් ඇති
කූටාගාරකුක්ෂිය, ගෙයක උඩුමහලෙහි කාමරය; ඇතුළ
කුඩම්, නානායම් මඩු
කොටුපත්ල, විස්සේ අඩිය
කෘතහස්ත, පලපුරුදු ඇති
කෘෂ්ණමණ්ඩලය, කළු ඉංගිරියාව
කෝෂිය, මල්කෝෂය
කෙලතොලු, කෙලගලන තොල් ඇති
කෙලෙස්, ලෝභ ද්වේෂ මෝහ යන මනුෂ්‍යයා කිලුටුකරණ අකුසල්
කෙලිප්ල, උකකුටිකය
කෙසරු, කේසර; ලොම්
කෙළනේ, ක්‍රීඩාකරන්නේ
කෙළපැමිණි, පරතෙරට ගිය
කෙළිමඩුලු, ක්‍රීඩාමණ්ඩල; සෙල්ලම් පිට්ටනිය
කෙළිමින්, ක්‍රීඩාකරමින්; සෙල්ලම් කරමින්
කෙළෙක් කෙළේයයි, කළ එකක් කරණලද්දේයයි
කේතුමාලාව, සළඟ හිසින් නික්මෙන රැස් වලල්ල; සිරස්පත
කේශකලාපය, කොන්ඩාවල්ල
කේශාග්‍රය, හිසකෙස් අග
කේවල, තනි
කෙපෝච්චු, වලලු වර්ගයක්
කොටපියයුතු, කරන්ට සුදුසු
කොඳුපලස්, ලොම් ඇතිරිලි
කොක්සන්, කොක්හඬ
කොබෝගෙඩි වලල්ල, බිත්තියෙන් පිටට නෙරා තිබෙන බාල්ක කෙළවර
කොළොම්බුව, ලී කොට කෑල්ල
කොහොල්, ලත්ස
කෝප ව්‍යාධිය, කෝප නැමති ලෙඩේ

කෝෂය, බීජ කෝෂය; අණ්ඩය. (පෙශීකොෂොච්ගිනෙණ්ඩං.)
කංසුතාලම්, මිණිගෙඩි
ක්‍රමයෙන්, පිළිවෙළින්; පිළිවෙළින්
ක්ෂමාකරවා, සමාකරවාගන
ක්ෂත්‍රියකුලය, රාජවංශය
ක්ෂත්‍රියකාන්‍යාවෝ, රාජකුමාරී
ක්ෂීරසාගරය, කිරිමුහුද
ක්ෂෝභකොට, කලඹා

## ඛ.

ඛජ්ජෝපණ, කලාමැදිරි

## ග.

ගංගෝදකය, ගංගානම් ගඟේ දිය
ගජචක්‍ර, ඇත්වලල්ල
ගර්ජනාව, ඝෝෂාව
ගඳකිළි පිරිවෙණ, බුදුන් වැඩසිටින විහාර ගේ
ගඳුත්, ගන්ධහස්ති
ගද්‍රභ, කොටළු
ගන්ධද්‍රුම, සුවඳ දම්වැල්
ගන්ධකුටිවාසය, ගඳකිළියෙහිවිසීම
ගම්වර, උතුම්ගම
ගමනාගමනය, යාම ඒම
ගරුඩ, ගුරුළු
ගර්ව නොයිඳ, උඩගුව නොයිඳ
ගවරපිර, ගව්රුන්ගෙන් පිරුණ
ගහට, තින්ද
ගහණ, ගැවසීගත්
ගායකයෝ, ගායනා දන්නෝ
ගැටහු පළඳනාව, නූලින් ගැටගසා හෝ ගොතා කළ පළඳනාව
ගැටමුසු, අදහස් කීමට අමාරුවූ
ගැටපහටු, තූර්‍ය්‍යවර්ගයක්
ගැටනිමුල්, බෙල්ලේ පළඳින ආභරණයක්
ගැටවා, කපටි; ප්‍රයෝගයෙහි; දක්ෂ

ගැත්තෙකු, වැඩකාරයෙකු
ගැරවිල්කුණ, ගැරඬි කුණ
ගැල්වූහ, ගැවෝය
ගිජුව, ලොල්ව; තදආශා ඇතිව
ගිම්සමයෙහි, ග්‍රීෂ්මකාලයෙහි
ගිලනුන්ට, ලෙඩුන්ට
ගිලානප්‍රත්‍යය, ලෙඩුන්ට නොහො
ත් ගිලනුන්ට උවමනා දේවල්
ගිලිහෙන්නාවූ, ඇදවැටෙන්නාවූ
ගිවිස්වා, එකඟකරවා; සන්තක
කරවා; පොරොන්දුකරවා
ගිවිස, පොරොන්දුවී
ග්‍රීවය, බෙල්ල
ග්‍රීවාලඞ්කාර, බෙල්ලේ පළඳින
ආභරණ
ගුණමකු, අනුන්ගේ ගුණ මකන්
නාවූ
ගුණාඞ්ගසංගත, යහපත් ගුණාඞ්ග
වලින් යුක්තවූ
ගුදමාර්ගය, මලමග; අධෝමුඛය
ගෘහස්ථයා, ගිහියා; ගිහිගෙයි වස
ගෘහවාසය, ගෙයිවිසීම (න්නා
ගෙඩිබැට, ගුටිබැට
ගෙත්තම්, ගෙතුම් වැඩ
ගෙයක් පණහා, ගෙයක් ගානේ
ගෙරිසරක්, එලහරක් මීහරක්
ගොදුර, සතුන් ගිලගැනීම
ගොන්ගෙය, ගොන්ඇගේ; හරක්
ගොන්පුකතිය, හරක්නඩුව (බාන
ගොන්මාල්ලා, නාකි ගොනා
ගොපල්ලා, ගවයන් බලන්නා
ගොමපිරිමඩ, ගොමලෑම
ගොයා, තලගොයා
ගොවිඳ, හරක් ගාල
ගෝචර, ගොදුරු
ගෝපිත, ආරක්‍ෂාකරණලද
ගංහෝ, ගංගා ඔයවල්

ඝ.

ඝනය, කයිතාලම
ඝනරත්මය, ඝනවූ රත්රනින්කළ
ඝනවලාවෙක, ඝනවූ වලාකුලක
ඝම්මයෙන්, ග්‍රීෂ්මයෙන්

---

ච.

චක්‍ෂුසින්, ඇසින්
චක්‍රනාදය, රථ රෝදවල ඝෝෂාව
චක්‍රවර්තිරජ, සෘඬියෙන් ගමනා
ගමනයකරණ සක්විතිරජ
චක්‍රරත්නය, සක්විති රජෙකුට
පහළවන අහසින් යාහැකිරථය
චක්‍රාකාරයෙන්, මණ්ඩලා කාර
යෙන්; කවාකාරයෙන්
චකිතයක්, තැතිගැනීමක්
චඞ්ක්‍රමණ, සක්මන්කිරීම
චණ්ඩ, තද
චණ්ඩපවන, සැඩසුලඟ
චණ්ඩමනුෂ්‍යයන්, නපුරු මසුන්;
මිනීකන මසුන්
චණ්ඩවාතය, සැඩ සුලඟ
චණ්ඩාල, සැඩොල්
චතුස්සංග්‍රහවස්තුව, දාන, ප්‍රිය, වච
න සමානාත්මතා, අර්ථචර්‍ය්‍යා
යන සතර
චතුරාර්‍ය්‍යසත්‍යය, දුඃඛසත්‍යය, ජරා
මරණාදිය හා ඊට ආධාර සියල්
ල දුක බව ප්‍රකාශකළ දේශ
නාව, සමුදය සත්‍යය, ප්‍රිය නැ
නැත්තන්ගෙන් වෙන්වීමද අප්‍රි
ය නැනැත්තන් සමග එක්වීමද
යනාදි දුක් ඉපදීමේ හේතුව
ප්‍රකාශිත දේශනාව, නිරෝධ ස
ත්‍යය, දුඃඛසමුදයයන් හේතු නැ
තිකිරීමෙන් සිඩවන ඵලය ප්‍රකා
ශිත දේශනාව, මාර්ගසත්‍යය,

දුක් නැතිකිරීමට පිළිවෙත් උගන්වන දේශනාවූ

චන්දන, සඳුන්

චන්ද්‍රරේඛාව, සඳකලාව

චන්ද්‍රබිම්බය, සඳමඬල

චන්ද්‍රග්‍රහණය, හඳ රාහු ඇල්ලීම; චන්ද්‍රයාගේ මුවහවීම

චන්ද්‍රාලෝකය, සඳපහන; හඳඑළිය

චපල, චංචල; ස්ථිරනැති

චම්පක, සපු

චරණාම්බුජ, පාදපද්මය; පානැමති නෙළුම්මල

චරයෝ, දූතයෝ; පතිවිඩකාරයෝ

චරපුරුෂයෝ, දූතයෝ; ඔත්තුකාරයෝ;

චාතුර්මහාරාජිකාදි ෂඩ්දිව්‍යලෝකය, චාතුර්මහාරාජිකය, තව්තිසාවය, යාමය, තුසිතය, නිර්මාණරතිය, පරනිර්මිත වසවර්තිය යන දිව්‍යලෝක සය

චාමර, සෙමර මුවන්ගේ වල්ගා

චිත්තසන්තාන, හිත් පරම්පරාව

චිත්තාස්වාදයක්, සිතේ සැනසිල්ලක්

චිත්‍රකූටය, එනම් පර්වතය; ප්‍රයාගයට ආසන්නව පිහිටා තිබේ; රාම කුමාරයා වනයට ගොස් පළමුව මෙහි විසූබැවින් මිට රාමගිරි කියාත් කියති

චිත්‍රවධ, නොයෙක් වධ

චින්තනයෙහි, සිතීමෙහි

චින්තාමාණික්‍යය, සිතූදේ පහළවන මැණික

චින්තාවක්, සිතිවිල්ලක්

චිරාත්කාලයක්, බොහෝකාලයක් දීර්ඝකාලයක්

චීවරය, සිවුර

චූතව, පහව; මැරී

චූඩාමාණික්‍යය, ඔටුන්නේ පළඳින මැණික

චූලනිරාජව්‍යාජයෙන්, චූලනිරජුගේ වෙසින්; චූලනිරජයයි අඟ

චෛතසික, සිත සම්බන්ධ (වා.

චෝදනා, වරද; දෝෂ

චෝර, සොර

---

ඡ.

ඡන්නාපථ, වැසුන මාර්ගය; සැඟවූ මාර්ගය

ඡායාව, සෙවනැල්ල

---

ජ.

ජගදානන්දලෝචන, ලෝකසත්වයා සතුටුකරණ ඇසක් වැනිවූ

ජඩ, අතිශයින් මෝඩ

ජන්මය, ජාතිය; උත්පත්තිය

ජන්මාන්තර, අනිත් ජාතිය (වූ.

ජනප්‍රධාන, මනුෂ්‍යයන්ට උත්තම

ජනමූර්තිවූ, ලොකවාසීන්ට එකම ශරීරයක් වැනිවූ

ජනනේත්‍රරසාංජන, ලෝකයාගේ ඇසට රසඳුනක් වැනිවූ

ජනහිතරහිතවූ, සත්වයන්ට යහපත් කරදීමෙහි නිතර ඇලුණු

ජනපදය, දනව්ව; රට

ජනසමාගම, ජනයන්ගේ රැස්වීම

ජනානන්දකරවූ, මනුෂ්‍යයන් සතුටුකරන්නාවූ

ජනිතප්‍රසාද, උපන් පැහැදීම

ජයපානය, දිනීමේ සතුටට බොන බීම

ජයඅකුසු, යුධභූමියෙහිදී ජයපතාලකරණ පිණිස ගෙනයන ආයුධ වර්ගයක්

ජයතුරඟසක්, යුඬයෙහිදී ජයලත් බව ඇඟවීමට පිඹිනහක් ගෙඩි වර්ගයක්

ජරපත්, ජරාවට පත්වූ; මහලුවූ

ජලරේඛාව, දියෙහි ඇඳි ඉර

ජලාශය, දියරඳන; ගංගා වැව් පොකුණු ආදිය

ජවනහංසගතිය, යුහුව ගමන් ඇති හංසයන්ගේ ගතිය

ජවසම්පන්න, වේගවත් ගමන් යා

ජාතකය, උත්පත්තිකථාව (හැකි

ජාතරූපයෙන්, රත්රනින්

ජාතිරඬග මාණික්‍යය, දැරහමිණ රතුකැටේ

ජීවමාන, ජීවත්වන

ජීවිතක්‍ෂයට, මරණයට

ජීවිත වෘත්තිය, දිවි රැකගැන්ම; පණරැකගැන්ම

ඤ.

ඤාතිව්‍යසනය, නෑයන්ගේ විනාශයෙන් වන විපත්ති

ඤාතිසම්බන්ධය, නෑකමින් බැඳීම

ඥෙයමණ්ඩලය, දතයුතු සියල්ල

ඩ.

ඩබරාව, තපසුන් විසින් දිය ගෙන යන පිණිස මැටියෙන් හෝ ලීයෙන් කළ මිණිගෙඩියක ආකාර ඇති භාජනයක්

ඩා, දඩිය; ඩහදියක මණ්ඩලුව

ත.

තටාකය, විල

තඤ්ඤය, ඇතිසැටිය

තත්තාකාරයෙකු, වඩුවෙකු

තතනමින්, කෙඳිරිගාමින්

තන්තිරිපට, වාද්‍යවිශේෂයක්

තරඬගමාලාව, රළපතර

තරය, ස්ථිරය; ස්ථිරත්වය

තරකොට, තදකොට; ස්ථිරකොට

තරවා, තදින්

තරුවරාකීර්ණ, උතුම් වෘක්‍ෂයෙන් ගැවසීගත්

තරුවරශතය, උතුම් ගස් සියය

තල්පැත්පකක්,තල්කුරුම්බාවක්

තලක්කට්ටුව, මුදුන

තලමුරුවට; තල පුන්නක්කු

තවුස් පැවිද්දෙන්, තාපස ප්‍රව්‍රජ්‍යාවෙන්; තපසුන් මහණවෙන ලීලාවෙන්

තාක්මුළුල්ල, ඇනිතරම

තාඩන, තැළීම

තාඩක්‍ක, තෝඩු

තාරකාලෝකය, තරුඑළිය

තැල්, තැල්ල

තිඹිරිගෙය, සූතිකාගාරය; ඇඳිරිගෙය; වදනගෙය

තිල, තල

තිලක, මණ්ඩලාකාරයෙන් කෙකුම් ආදියෙන් නළලේ කරණ ආලේපය

තිලකාදීන්, දෙඹ හෝ මදටිය ආ

තිලින්, ඔයින් (දිය

තිලෝගුරු, තුන් ලෝවැස්සන්ට ගුරුවූ

තිසරපට, හංසරූප ඇති; ආභරණ

තිඹිරිපිලී, කෝසෙය්‍යවස්ත්‍ර (යක්

තීක්‍ෂණ, තියුණු

තීර්ථක, මිථ්‍යාදෘෂ්ටි

තීරණය, විනිශ්චය; තීන්දුව

ත්‍රිභුවන, තුන්ලෝකය

ත්‍රිමණ්ඩල, නාභිය හා දණ හිස් දෙක

ත්‍රිලෝකෙක ගුරුවූ, තුන්ලෝකයට එකම ආචාර්‍යවූ

තුච්ඡ, හිස්; නිස්ඵල
තුට්ටුපහටු, ඉතා සන්තෝෂ
තුණ්ඩ, තුණ්ඩය; හොට
තුන්සත, වැලිගල, කරගල, හම යන තුන
තුනීකරණලද ශෝක, අඩුකළාවූ
තුනුවූ, තුනිවූ (ශෝක
තුදුස, දහහතර
තුෂ්ටි, සන්තෝෂ
තුෂාර, පිනි; හිම (ගසා
තුතුකොටපියා, තුඃතුඃ කියා කෙල
තුෂ්ණිම්භූතව, කථානොකර
තෘප්තිය, ඇතිවීම; සෑහීම
තෙප්ල, වචනය
තෙල, ඔය
තෙසු, වෙත
තෙළෙස, දහතුන
තේජස්වීසෙයින්, තේජස්ඇතිහෙ
තෛලයෙන්, තෙලින් (යින්
තෝරණ, තොරන්
ත්‍රෛලෝක්‍ය, සවර්ග, මර්ත්‍ය, පාතාල යන තුන,හෝ කාමලෝක,රූපලෝක, අරූපලෝක, යනතුන
ත්‍රෛලෝක්‍යෛකගුරුවූ, තුන්ලොවට එකම ආචාර්යවූ
තෝඩු, කුණ්ඩලාභරණය; කණ සිදුරේ ලන ආභරණය
තෝමර, අනිත ආයුධ වර්ගයක්
ත්‍රස්තව, තැතිගැනී; භයවී

---

ද

වාරත්‍රය, දොර තුන; කය, වචන, සිත යන ශරීරයේ තුන්දොර
දහගෙය, සිරගෙය
දඬු, ලී
දඬුබස්නාමානයේ, ඊය වදිනා දුර
දණ්ඩ, පොල්ල (දීම
දන්වැට, දානවෘත්තිය; නිතර දන් දනව්වලින්, ජනපදවලින්; රටව
දම්, දම්වැල් (ලින්
දමකින්, දම්වැලකින්
දරසෑය, මිනිදූවීමට සාදන දරරැස
දරුණු, කෲරවූ; දුඩිවූ
දල්වාගෙණ, අයාගෙණ; ඇරගෙණ
දශබිම්බර, යම් සේනාවක් පෘථිවියෙහි පැත්තක සිටිකල අනිත් පැත්ත මතුවේ නම් ඒ බිම්බර නම්. එබඳු බිම්බර 10 ක් දශ බිම්බර නම්
දශවිධරත්නය, මුතු,මැණික්,වෛදූර්‍ය්‍ය, ගෝමේද දියමන්ති, පබලු පද්මරාග, මරකත, නිල්, රත් රන්
දස්කොට, වැඩකාරයෙකුකොට
දසරුව, උරහිස
දසරාජධර්මය, යහපත්ව රට රකින රජෙකුගේ පැවතුම් දහයක්; දානය, ශීලය, පරිත්‍යාගය, සෘජුකම, මධ්‍යස්ථබව, ක්‍රෝධනැතිබව, හිංසානොකිරීම, ඉවසිල්ල විරුඬ නැතිබව, යන දහය
දළපුඩුසේසත, සිංහාසනය මත්තේ නැගූ සුදු කුඩය.
දළු, දත්
දර, භාර්‍ය්‍යා; අඹු
දරුසම්භාරය, ලිදඬු රැස
දෘගාද, දැවැද්ද
දූහ, දූවිල්ල
දූඩිවූ, තදවූ
දූහිමුවර, දූහිමෝරු
දූත් මතු නොවෙයි, දූත් මාත්‍රයේ පමණක් නොවෙයි; මේ කාලයේ පමණක් නොවෙයි
දූමුණු, දමිතවූ; වසඟවූ; මැඩපැවැත්වූ

දූරිඇති, ගර්භිනිවූ; බඩදරුඇති
දූරිය, තරුණිය
දූසිදස්, වැඩකාර වැඩකාරියන්
දූහැමෙන්, ධර්මතාවයෙන්
දෑඟුල්, අඟල් දෙක
දෑරගම්ණ, රතුකැටය
දෑල, දෙපැත්ත
දෑහිඟුල්, සාදිලිංගම්
දිගන්තරය, සියලු දිසා ඇතුල
දිවිල, දුටුවෙලු
දියත්තක්, දිය ටිකක්
දිරිය, ධෛය්‍ය
දිවකණ, දිව්‍යකණිය; දිව්‍යංශ්‍රෝ
  තෘඥතය
දිව්‍යාපසරාව, දිවවෙසඹුව; දිව්‍ය
  ලෝකයෙහි වේසා සත්
  පෙශාචිමෙනකාරමහා
  ඌර්ශිවතිලොත්තමා
  සුකෙශාමංජු ඝොෂාද්‍යා
  කථ්‍යනෙතපසරසො බුධෛඃ
දිව්‍යෞෂධය, දිව බෙහෙත
දිසාන්තරයෙහි, දික්භාග අතරෙ
දිළිඳුන්, දුප්පත් අය (හි
දී, දිකිරි
දුතමනා, දියසුතු
දුරතබාම, කල්ඇතිවම; වේලාප
  සම
දුර්ගන්ධ, දුගඳ; නපුරු ගඳ
දුර්ජන, අසත්පුරුෂ
දුර්මුඛ, අශෝභන මුහුණ; ලජ්ජා
  වෙන් මැලවිගිය මුහුණ
දුර්වලයක්, බලනැතිකමක්
දුෂ්ටවූ, නපුරුවූ; දූෂිතවූ
දූත, පනිවිඩකාරයා
දූරුවන, දුවනිය නැමති මැණික
දූෂා, කේලාම් බස්
දෘෂ්ටාන්තය, උදාහරණය; ආදශ
දෘෂ්ටිජාලානුගත, මිථ්‍යාදෘෂ්ටිනැම
  ති දැල අනුව යන්නාවූ
දෘෂ්ටිජාලානුබඩ, මිථ්‍යාදෘෂ්ටි නැ
  මති දැලට බැඳුනාවූ
දෙකපෝලය, කම්මුල් දෙක
දෙතිස, තිස් දෙක
දෙතිස්මහා පුරුෂ ලක්ෂණ, බුදු
  කෙනෙකුන්ගේ ශරීරයෙහි පි
  හිටි පුණ්‍යලක්ෂණ තිස්දෙක
දෙන්නා මතු සිටිකල්හි, දෙන්
  පමණක් උන්කල
දෙනාසාපුටය, නාස්පුඩු දෙක
දෙපියාහස්ස, පියාපත් දෙක
දෙහිතතියෙන්, ඉවුරු දෙකින්
  හෝ හිතත් දෙකින්
දෙමහල්ලන්, වැඩිසිටියන් දෙදෙ
  නා; අඹු සැමි දෙදෙනා
දෙව, දෙවා; සෝදා
දෙවලයක්, දෙහිතක්
දෛව, පිණ; වාසනාව
දෛඩමලු, මුබරි; වාචාල
දෞර්මනස, සිත දූෂ්‍යකම
දෞවාරිකපාලයා, වාසල් දොර මුරකා
දෞලි, දෞලා (රත්නා
ද්‍රෝහි, විරුඬ

---

ධ

ධජ, කොඩි
ධන, රන් රිදී ආදී වස්තු
ධනුර්ධරයා, දුනුවායා; දුන්නෙන්
  විදින්නා
ධනුශශිල්පය, දුන්නෙන් විදීම
  උගන්වන විද්‍යාව
ධර්ම, බණ; යහපත; ස්වභාව
ධර්මරාජ, ධර්මයට රජවූ
ධර්මස්වාමි, ධර්මයට නායකවූ
ධර්මභාණ්ඩාගාරික, ධර්මය නැමති
  භාණ්ඩාගාරයෙහි අධිපතියා; (ආ
  නඳ මහතෙරනුවෝ

ධර්මාධිපති, ධර්මයට අධිපතිවූ
ධර්මානවිතවූ, ධර්මයෙන් යුක්තවූ
ධර්මාසනය, බණ අස්න; ධර්මදෙශ
නාකිරිමට තැනූ ආසනය
ධම්මිෂ්ඨවූ, යහපත් හැසිරීම් ඇති;
ධර්මයවූ පරිද්දෙන් පිළිපදින්නා
ධවල, සුදු (වූ
ධවලච්ඡත්‍රය, සුදු කුඩේ
ධාන්‍ය, වි සාල් ආදි වස්තු
ධාර්මික, ධර්මයෙහි හැසිරෙණ; යහ
පත් පැවතුම්ඇති
ධාරිනගතලද, මුවහත් තිබූ
ධුරය, ස්ථානාන්තරය; තිලේ
ධූර්ත, කපටි; ප්‍රයෝගකාර; මායා
කාර; විනාශකාර
අක්ෂධූර්ත, සූදුකෙළියෙන් විනා
ශකාරයා
සුරාධූර්ත; මත්පැන් බීමෙන් වි
නාශකාරයා;
ස්ත්‍රීධූර්ත, ස්ත්‍රීන් නිසා විනාශකාරයා

---

## න

නක්ෂත්‍රයක්, නැකතක්; සුභ වේ
නඛාග්‍රය, නියඅග (ලාවක්
නඩයෙහි, සාලාවෙහි
නතුවව, යටත්වෙව
නඳුන් වනය, ශක්‍රයාගේ නන්‍ද
නම් වනය
නපුංසක, ස්ත්‍රීපුරුෂ දෙපක්ෂයටම
අයිතිනැති; ස්ත්‍රී ලක්ෂණ හෝ
පුරුෂ ලක්ෂණ නැති
නභෝමධ්‍යය, ආකාශය මැද
නම්ගොත්, නාමගෝත්‍ර; නම හා
ජාතිය
නයින්ම, න්‍යායෙන්ම; ආකාර
යෙන්ම
නරනාරීගණාකීර්ණ, ස්ත්‍රීපුරුෂ සමූ
හයාගෙන් ගැවසීගත්
නළකොල, උණකොල; බටකොළ
නව, අළුත්
නා, නයි; ඇත්තු; නාගස්; බූලන්
නාගවඩම්, නයිරූපය ඇති; කණ
පළඳින ආභරණ වර්ගයක්
නාටිකාංගනාවන්, නැට්ටුක්කාරි
යන්
නානාභරණ, නොයෙක් ආභරණ
නානා ලඞ්කාරයෙන්, නොයෙක්
අලඞ්කාරයෙන්
නානාප්‍රභාසමුදය, නොයෙක් ආ
ලෝක සමූහය
නානා ලම්බනයෙහි, නොයෙක්
නොයෙක් දෙයෙහි සිත් බැඳී
නැඹුරුවූ, නැමුණාවූ (මෙහි
නික්දහස, නික් එකක් රන් විසිප
හකි, නික්දහසක් රන් විසිපත්
දහසක් වේ
නිකෘෂ්ට, නීච; අධම
නිග්‍රහ, නින්ද; අපහාස
නිගණ්ඨ, බුද්ධාගමෙන් පිට තාපස
වර්ගයක්; නිර්ග්‍රන්ථ; තපස්රකින
නිදනැඟී, නින්දෙන් පිබිද
නින්නාද, ශබ්දය; හඬ
නිබඳව, නිතර; සැමකල්හිම
නිමානව, පහන්ව
නිමන, උපදින
නිමල, මලනැති; පිරිසිදු
නිමිත්තකොටගෙණ, කාරණයක්
කොටගෙණ; හෙතුකොටගෙණ
නිමුන්මිට, නගුල්මිට; නගුලිස
නියාව අත්දම; සැටිය
නියම්ගම, කඩපිල්ආදිය ඇති ලො
කුගම
නියුක්තයන්, යෙදී සිටින්නන්
නිරපේක්ෂාකොට, ආලයනොකො
ට; බලාපොරොත්තුවක් නැතිව

නිරපරාධ, නිවැරදි
නිරාලයව, ආලයක් නැතිව
නිරුක්ති, ශබ්දෝත්පත්ති සවභාව උගන්වන ශාස්ත්‍රය
නිරුපද්‍රව, අනතුරක් නැති
නිරුදක, ජලයනැති
නිර්භීතව, භය නැතිව
නිලකරවයි, නියමකරවයි; අණකරවයි; රැකගන්වයි
නිලයක්, අවසරයක්
නිලිපුල්, මානෙල්
නිවාරණයකොට, පහකොට
නිවාසස්ථානය, වාසභූමිය
නිශ්චල, නොසෙල්වෙන
නිශ්‍රිත, නිස්සාර; අවලක්‍ෂණවූ
නිෂ්ප්‍රභාව, දිලිසීමක් නැති; කීර්තියක් නැති
නිෂ්ඨාවක්, කෙළවරක්
නිශ්ශෝකී, ශෝකයක් නැති
නිල, නිල්
නුකුසීතව, අලසනොව; මැලිනොව
නුදුරු, දුරනොවූ
නුදුටුවිරූ කිසිකලක නුදුටු
නුඹදෑ නුඹවහන්සේ
නුමුකලී, නොවැඩූන
නුරුස්නා, රුචිනොවන
නුවණැස, ප්‍රඥව නැමති ඇස
නුවණ, ඤාණය
නුවණපෙරුම්, ප්‍රඥ පාරමිතාව; සවකීය ශරීරාවයව විනාශවෙද්දීත් ප්‍රඥවෙන්යුක්තවීම;නුවණපෙරුම්නම්
නුවන, ඇස
නුවර නිසා, නුවර ආශ්‍රයකොට
නුහුනු, නොහැකිවූ
නුපුර, සත්‍රීන් පයලන වලල්ල
නෙත්‍ර, නෙත්; ඇස්
නෙයියාඩම්, නැටුම් ගැහුම් ආදි සෙල්ලම්
නෙරපති, පන්නා දමති
නෙරණාහ, පන්නා දමන්නාහ; පිටිවහල්කරන්නාහ
නෙරණමාන, පිටිවහල්කරණ සැ
නෙරපූහ, එළෙව්වෝය (විය
නෙරා, පන්නා; එළවා
නෙලුම්පත, නෙලුම් කොළේ
නොඇලි, නොතැවරි; නොගැවී
නොඇසූ කන්ව, නොඇසුනාක් මෙන්; ඇසෙනසේ කන්යොමු නොකර
නොකල්, අකාලය; නුසුදුසු කාලය, අනියම් කාලය
නොකනතුරු, කන්ට මත්තෙන්
නොකිව්රිය, කවදුවත් නොකීයේය
නොගිවිස්සාහ, විශ්වාස නොකළෝය
නොදන්නාවන්ව, නොදන්නාක් මෙන්
නොදෙව, නොසෝදා
නොනිමනතුරු, නිමකරන්ට පෙ
නොපහන්, නොසතුටු (ර
නොපැකිල, නොනැවතී; රැඳීමක් නැතිව
නොපෝසත්ව, පුළුවන්කමක් නැතිව; ශක්තියක් නැතිව
නොබවමැනව, භයනොවෙනු මැනවි; භය නොවේවා
නොබැණැයි, නොදෙඩවයි; කථා නොකරවයි
නොබිණූහ, කථා නොකළෝය
නොමද, බොහෝ
නොමැලිවූ, මලානිකනොවූ
නොමිලයේ, මිල නැතිව

නොම්රිකී, වෙහෙසනොවී; පොඩි නොවී

නොමිනියා, නොමැරුණ සැටි

නොමේවරෙයි, නුසුදුසු වැඩෙහි; තමාට අයිති නැති වැඩෙහි (ලී

නොයිගිලී, නොගැලවී; නොසෙල්

නොලත්විරු, කිසිකලක නොලැබුවාවූ

නොවලහා, නොසඟවා

නොවූවිරිය, කිසිකලක නුවූයේය

නොවෙලකවත්, නුසුදුසු වේලාව කවත්; අවසර නැති වේලාවක වත්

නොසැලෙන, නොසෙල් වෙන් නාවූ

නොසැහෙම්හ, සමානනොවමුව

නොසිඳෙන්නේය, නොනවත් නේය

නොහරණාහ,අත්නොහරින්නාහ

නොහළුවෝනම්, නොහැරියෝ නම්

---

පං.

පක්‍ෂවය, පියාපත් දෙක

පක්, එල; ගෙඩි

පඩකතින්, පෙලවලින්

පංචාංගික තූර්‍ය්‍යනාද, පස් ආකාර වාද්‍යනාද; එක් මුහුණ ඇති ර බත් සැල බෙරආදිය; ආතතය; දෙමුහුණු ඇති දවුල් ආදිය; විතතය; දෙපැත්තේත් මැදත් මුහුණුඇති විතතාතතය; කයිතා ලම් තැටි ආදි ඝනය; හොරණෑ නලා ආදි ශුෂිරය

පංචකාම, රූප, ශබ්ද, ගන්‍ධ, රස, ස්පර්‍ශ යන පස; ඇසට රූපයද කණට ශබ්දයද, නාසයට ගන්‍ධ යද, දිවට රසයද, ශරීරයට ස්ප ර්‍ශයද හොඳුරුවේ; මේ පසින් මනුෂ්‍යයා ප්‍රීතිකෙරේ

පංචකල්‍යාණ, කේශකල්‍යාණය, දන්තකල්‍යාණය, මාංශ කල්‍යා ණය, ඡවිකල්‍යාණය, වයඃකල්‍යා ණය යන පස.

නිල්වන් සිනිඳුයහපත් කෙස් ඇත්තේ කේශ කල්‍යාණනම්. මුතු පෙලක් මෙන් එකිනෙක සමව අතුරු සිදුරු නැතිව සක් ගෙඩියක බඳු පැහැඇති උල්වූ සිහින් දත්ඇත්තේදන්තකල්‍යා ණයි. ස්ථූලත් නොව කෘශත් නොව ඒ ඒ අවයවවල මස් පිරි පැවැත්ම මාංසකල්‍යාණ නම්. තල කැලල් ආදියෙන් විරහිත මෘදුවූ කාන්තිමත් සමක් ඇති බව ඡවිකල්‍යාණ නම්. කෙ තෙක් වයස ගියත් තරුණ අව ස්ථායෙහි මෙන් පැවැත්ම වයඃ කල්‍යාණ නම්.

පංචාලයෝ, පංචාලරට වැස්සෝ

පංචායුධ, දුනු, මුගුරු, පත්කො හොල් පාරවලලු, අඩයටි යන පස

පංචප්‍රකාර, පස් ආකාර

පංචප්‍රකාර බලය, පස් ආකාර බ ලය; අර්‍ථබලය, කායබලය, ඥාන බලය, සේනාබලය, ධානාන්තර බලය යන පස; ශ්‍රද්ධා, වීර්‍ය්‍ය, සති, සමාධි, ප්‍රඥා යන පස

පඤ්ජර, මැදිරිය; කූඩුව

පට්ටකාර, ආභරණ වර්ගයක්

පටෝර්ඩම්, ආභරණ වර්‍ගයක්

පටහැණි, විරුද්ධ

පටබැඳවූහ, නළල් පටබැඳීමෙන් ගෞරව කළෝය

පටිධාතුව, සර්වඥයන්වහන්සේගේ ඉන බඳනා සිවුරු පටිය

පඬුරු, තෑගි; පිදවිලි; පෙණුම්

පඬුවන් පැහැ, පඬුවන් පාට

පණයම්, තෑගි; ස්ත්‍රීන්සිත්ගැනීමට දෙන තෑගි

පණ, තොණ්ඩුව; මලපත

පණා, කොස්

පණිවා, ප්‍රාණඝාතය; සතුන් දිවි නැසීම

පත්කොහොල්, ලන්සවැනි ආයුධ වර්ගයක්

පතලේය, ප්‍රසිද්ධවගියේය; සැලවිගියේය

පතාක, තුන්හුලස් කොඩි

පතාක යොධයෝ, කරණම් පැනිමෙන් යුද්ධකරන්නෝ

පතිව්‍රතා ධර්මය, ස්වාමියාගේ සැපදුක් ආදියෙහි සමව වසන යහපත් ස්ත්‍රියකගේ ධර්මතාවය.

ආතීතේ මුදිතා හෘෂෙට
ප්‍රොෂිතෙමලිනාවෘතෙ
මෘතෙම්‍රියෙතයාපත්‍යෞ
සාස්ත්‍රීඥෙයා පතිව්‍රතා

ස්වාමියා දුකට පැමිණිකල්හි දුක්වන්නීද සතුටට පැමිණිකල්හි සතුටුවන්නීද, ස්වාමියා පිටත වසනකල කිලුටු වස්ත්‍ර හැඳ කෘශව ඉඳීද, ස්වාමියා මළකල මැරේද ඒ ස්ත්‍රී පතිව්‍රතා යයි දතයුතු.

මෙබඳු ස්ත්‍රීහු පෙර ඉන්දියාවේ සිටියෝය. නුමුත් දැන් ඉංග්‍රීසි ආණ්ඩුවෙන් ස්වාමියා සමග මැරීම තහනම් කර තිබේ.

පදනම, කය්යෝරුව

පදුම, නෙළුම්

පදාර්ථ, පදයන්ගේ අදහස්

පදාති, පාබල සේනාව; පයින් සිට යුද්ධකරණ සේනාව

පන්ති, පෙළ

පනහා, පාසා; ගානේ

පනාබෙර, බෙර වර්ගයක්

පබන්ධය, නොකඩව පැවැතීම

පමුණුකොට, නින්දගම්කොට

පයපිසුන්, පාපිස්න

පර්වතප්‍රාන්තය, කඳු පල්ලම

පරක්කුව, රෙදිවලින් සෑදූ මල්ලක් වැනි; උපකරණයක්; ඔලගුව

පරම්පරා ශබ්දයෙන්, කටින් කට කියන කථාවෙන්

පරශත්‍රු, පරසතුරන්

පරසිත්, අනුන්ගේ සිත් (න්

පරගානාසේ, සෝෂාවන්නාක්මෙ

පරදාරකර්මය, අන්අඹුවන් සෙවනය කිරීම.

මාතුරක්ඛිතා, පිතුරක්ඛිතා, භාතුරක්ඛිතා, භාගිනිරක්ඛිතා ඤාතිරක්ඛිතා, ගොත්තරක්ඛිතා ධම්මරක්ඛිතා යන මේ ආකාරයෙන් ස්ත්‍රීන් අටදෙනෙක්ද සාරක්ඛා පසරිදණ්ඩා යනාදි වශයෙන් 12 දෙනෙක්ද මෙසේ විසිවැදෑරුම්වූ ස්ත්‍රීන් කරා යෑම පරදාරකර්ම වේ

පරික්ෂිප්ත, වටකළ

පිරිවෙණ, භික්ෂූන්වහන්සේ ඉගෙණගන්නා ස්ථානය

පරිභව, නින්ද

පරිභෝග, සේවනය පිණිස ගන්නා ඇඳ පුටු; වස්ත්‍රාභරණ ආදිය

පරිබණ්ඩකථා, පූර්වකාණ්ඩයෙහි කථාව

පරිබ්‍රාජක, බාහිර තාපස වර්ගයක්
පරිශුඩ, ඉතා පිරිසිදු
පරීක්‍ෂා, විභාගය
පරෝපදෙශ, අනුන්ගේ ගුරුකම්
පල්ලෙක්හි, පලුවක
පලස්හුය, ලොම්; නූල්
පලවාපියන්ට, එළවාදමන්ට
පලවන, එළවන
පලස, කම්බිලිය
පලස්හුවට, ලොම් නූල්වලින් කළ බමරය
පළන්, පළඳිනාලද
පලහාපියව, පුලුස්සව
පවර, ප්‍රාකාරය; තාප්පය
පවනවබදු, හුළඟට සමාන
පවත්කථාව, ඇතිසැටිවූ කථාව
පව්ටා, පාපයෙහි ඇලී වසන්නා
පවුල්, පාංශුකූල සිවුර
පශ්චාත්තාපය, පසුතැවිලිවීම; කළ දෙයක් ගැන ශෝකවීම
පශ්විම, බස්නාඉර
පෂීත්, පිරිස
පස්පියුම්, ඇඹුල, ඉපුල, හෙල්මැලි රත්පියුම්, හෙළපියුම් යන පස
පස්පැඩිස්නා, පස්පැහැයකින් දිලියෙන්නාවූ
පස්කම්සුව, පංචකාම සම්පත්තිය යනු බලනු
පස්රු, කණේ පලඳින ආභරණ
පස්වකා,පස්තවරා (යක්
පස්වලලු, ආභරණ වර්ගයක්
පස්වණක් ප්‍රීතිය, ඛුද්දක, ප්‍රීතිය, (මදක්ප්‍රීතිය), ඛණිකප්‍රීතිය(ඇසිල්ලක් ඇතිවනප්‍රීතිය), උද්වේග ප්‍රීතිය (ශරීරය අහසට ගත්නාමෙන් ඇතිවන ප්‍රීතිය), අවක්‍රාන්ති ප්‍රීතිය (මුහුදු රළමෙන් සිරුර ඉක්මවා ඇතිවන ප්‍රීතිය), ඵරණ ප්‍රීතිය, (ශරීරය පැතිර පවත්නා ප්‍රීතිය)
පස්ලෝ, රන් රිදී තඹ යකඩ ඊයම් යන ලෝහ පස
පස්වරු, සවස්වරුවේ
පසමිතුරු, සතුරා
පසල්දනව්ව, ප්‍රත්‍යන්ත ජනපදය පිටිසර රට
පසඟිල්ල, ඇඟිලි පස
පසාරයෙන්, දීඝීවශයෙන්; විස්තර වශයෙන්
පසිඳපියති, විසඳලති; විස්තරකර දෙති
පසිඳගන්නා පිණිස, පිරිමසා ගන්නා පිණිස
පසුතැවිල්ල, කළදේ උදෙසා ශෝක කිරීම
පසුකඩ, පසුකැල්ල (බව
පසුන්බව, විසඳූබව; විස්තරකළ
පසේබුදු, ප්‍රත්‍යෙකබුදු; තමන් පමණක් නිවන් දක්කහැකි බුදුවර
පහරණ, වේදනා කරන්නාවූ (යා
පහන්ව, පැහැදී
පහරීදැයි, වේදනාකරාදැයි
පහලවිය, ප්‍රසිඩවූයේය
පහන්පැන, පැදිදිය
පහය, ප්‍රාසාදය; ගෙය
පලිහ, අරමිණිය; පයඃඞකය; ආස්තරණය
පලින්, පැලින්දාවූ
ප්‍රකාශවේද්‍යෙ හෝයි, එලිවේශ්කියා
ප්‍රගුණ, හොඳකාර දත්; පුහුණුවූ
ප්‍රවජනන, වැසුනු (වූ
ප්‍රඥවටවලලහවූ, ඥනයට නායක
ප්‍රඥ පාරමිතාව, ධන කුල ආදියෙන් නැණවතුන්, තොතෝරා

කුසලා කුසල විචාරීම් වශයෙන් පුරන්නාවූ ඥනය
ප්‍රඥනුභාව, නුවණෙහි මහිමය
ප්‍රඥසම්පන්න, නුවණින් යුත්
ප්‍රඥසමුද්‍රවූ, නුවණින් මුහුදවැනිවූ බොහෝ නුවණ ඇති
ප්‍රඥ ප්‍රදීපවූ, නුවණින් පහනක් වැනිවූ
ප්‍රඥවිශේෂය, නුවණෙහි අතිශය භාවය
ප්‍රතාප, අන්‍යයන් මැඩපවතින තේජස
ප්‍රතික්ෂෙප, අත්හැරීම; එපාකිරීම
ප්‍රතිච්ඡාදනය, වැසීම
ප්‍රතිඥ, පොරොන්දු
ප්‍රතිපත්ති, පැවැත්ම; හැසිරීම; පිළිපැදීම
ප්‍රතිබිම්බ, පිළිබිඹු; යමකට සමාන කොට සෑදූ රූපය හෝ ඡායාව
ප්‍රතිභාන, වැටහීම
ප්‍රතිමණ්ඩිත, සැරසූ
ප්‍රත්‍යක්ෂ, ඇස් ඉදිරිපිට
ප්‍රත්‍යය, කාරණය; හේතුව; උපකාරය
ප්‍රත්‍යන්ත, පිටිසර
ප්‍රත්‍යුත්පන්න, දැන් කාලය
ප්‍රපංචනොකොට, ප්‍රමාදනොකර; පමානොවී
ප්‍රපාතය, කඳුබෑවුම
ප්‍රභූ ශක්තිය, පොහොසත්කමේ බලය
ප්‍රමාද ප්‍රත්‍යයෙන්, පමාවීම හෙතුකොටගෙණ
ප්‍රමාණාතික්‍රාන්ත, ප්‍රමාණය ඉක්මවා ගිය; පමණකල නොහැකි
ප්‍රයෝගය, උපක්‍රමය; මියදීම
ප්‍රවර, උතුම්
ප්‍රවාරණය, පැවරීම
ප්‍රව්‍රජ්‍යාව, මහණවීම
ප්‍රවෘත්තවූ, පැවතුණු
ප්‍රවේශයට, ඇතුල්වීමට; වැදීමට
ප්‍රශ්නවිසර්ජනය, ප්‍රශ්නවිසඳීම; ඇසූ දේට උත්තරදීම
ප්‍රශ්නව්‍යාකරණය, ප්‍රශ්න විස්තර කිරීම
ප්‍රශස්ත, ප්‍රශංසාකරණලද
ප්‍රසිද්ධහෙයින්, ප්‍රසිඩහෙයින්
ප්‍රසාද, තෑගි
ප්‍රාසාදය, මාලිගාව
ප්‍රාර්ථනා, පැතීම
ප්‍රාකාරවලය, තාප්ප වැට
ප්‍රාණපරිත්‍යාගය, දිවිපිදීම
ප්‍රියවිප්‍රයෝග, ආදරේ ඇති අය ගෙන් වෙන්වීම
පාක්කුඩම්, පෙණුම්; දැකුම්
පාඩගම්, පාවලල්ල
පාණාතිපාත, සතුන්මැරීම
පාදසඞ්ඛලා, පයලන සක්වලලු
පාදජාලා, පයවැස්මක්; මේස් සමාන ඇඳුමක්
පාදත්‍රා, පාවහන්; සෙරෙප්පු සපත්තු ආදිය
පාදපරිචාරිකා, පයම්රිකන්නී
පාදකිඞ්කිණිකා, පයලන මිණිගෙඩි වැලක්
පාදාභරණ, පයලන ආභරණ
පාන්වූකල්හි, එළිවුන වේලාවේ
පාපමිත්‍රසංසර්ගය, පව්කරණ මිතුරන් හා එක්වීම
පාපියුම්, පයනැමති නෙලුම්මල්
පාපිටගස්වා, පා වන්දවා
පාපොලොන්අගල, පයින් යාහැකි වියලි අගල
පාමුදු, පයේ ඇඟිලිවල දමන මුදු

පාරප්‍රාපනය, පරතෙර පැමිණියේය
පාරලෞකික, පරලොව සම්බන්ධ
පාරාවලලු, යුඩායුධයක්
පාලිය, පෙල
පාසලඹ, පයලන ගිගිරි වලලු
පාංශුකූලය, සිවුර; මිනිකුණු ඔතා සොහොන්වල ලූ වස්ත්‍රයෙන් කළ සිවුර
පැකුළුනත්ට, බාධාවට පැමිණි
පැණය, ප්‍රශ්නය; ඇසීම (අයට
පැතිර, පැතිරී; විහිදී; උතුරා
පැදකුණුකොට, ප්‍රදක්ෂිණාකොට; දකුණෙන් පටන්ගෙණ වටේ ගොස් උත්තමයෙකුට නමස්කාරකිරීම
පැදුම්දිග, නැගෙණහිර දිසාව
පැන්, ජලය
පැනින් සෝදාපියා, ජලයෙන් සෝදා
පැලහ, පලාගියෝය
පැලහෙන්නී, දූවෙන්නි, නැවෙන්
පැවරූහ, බාරකළහ (නී
පැස්මාලු, පරණ කූඩා
පැහැරපියා, පැහැලා; කොටලා
පැහැ, පාට
පෑ, ප්‍රකාශකොට; පෙන්නා
පෑලයි, පෙන්වයි
පෑලදෙර, පස්සාදෙර
පිඟුවූ, පිඟුවන්වූ; නිල්පාට කහපාට දෙකින් මිශ්‍රවූ
පිටඅවුරා, පිටහරහා
පිටිවහල, උපකාරය; අනුබලය
පිටිපදනාම, පිටකය්යෝරුව
පිටිදකුම්හ, නෙරපවා හරිමුව; එලවා හරිමුව; පරාජයකරමුව
පිටිනලහයා බැඳ, අත්පිටිකරට බැඳලා
පිදියයුතු, පූජාකටයුතු; ගෞරව කළයුතු
පිදුරුබිස්සෙක, පිදුරුගොඩක් උඩ
පිබිද, අවදිව; නැගිට
පියගැට, පඩි
පියවිගිනි, ස්වභාවගින්න
පියහසර, අඩිපාර
පියදූ, යවනලද
පියවරසනින්, පියවර සටහනින්; පියවර ගණනින්
පියනොදෙම්හ, බොන්ට නොදෙ
පියාසගල, පියාපත් දෙක (මුව
පියාහැඹිම, තටුගැසීම
පියුම්ගැබ, නෙළුම්මල් කෙමිය
පිරිසිඳ, පෝරුම්සහිතව
පිරිහුන්, සමපූණ්වූ
පිරිහුන, හානියට පැමිණි
පිරියම්, අළුත්වැඩියා කිරීම; පිළියම් කිරීම
පිරිමැඩිම, අඟාගැම; මිරිකීම
පිළිපන්නේය, පැමිණියේය
පිළිවිස්සාහ, විචාළහ
පිළිසඳර කථා, සැපදුක් විචාරීම් වශයෙන් කරණ කථා
පිළිබඳ, විශේෂයෙන් බැඳුණු; ප්‍රතිබඩ
පිළියම, ප්‍රතිකාරය; රෝගාදියක් සුවකිරීමට බෙහෙත් ආදියක් යොදා කරණ උපාය
පිළිසරණය, පිහිටවීම
පිළිකුල්, කෑත; දකිමට අසතුටු
පිළි, රෙදි
පිඩිත, පෙළුණු; වෙහෙසවුණු
පුංජ, සමූහ; රාශි
පුත්කලස්, සහල්දිය ආදියෙන් පිරූ කළගෙඩි
පුන්සඳමඩල, පූණ්චන්ද්‍රමංඩලය; පසළොස්වක හඳ

පුරදියවක, මාසේ පෝය ගිය දෙවෙනිදා
පුරාතන, පරණ; පලපුරුදු ඇති
පුරුෂ විශේෂක, පුරුෂයන්ගේ විභාගය
පුරෝහිත, රජහට අනු ශාසනාකරන්නා
පුලපුලා, ඉපිලි ඉපිලී; අධික සතු
පුලිමුබම්, කොටිමූණු (ටුව
පුළුගන්වා, දික්කර
පුළුල්, පලල
පුවමැනව, බිවොත් යහපත
පුවගු, රුක්ගස්
පුවරු, ලෑලි
පුෂ්කරණිය, පොකුණ
පුෂ්පදම, මල්මාලා; මල්දම්
පුස්නා, අගනා; වටිනා
පූ, කැවුම්
පූජිත, පුදනලද
පූදිනාඅග, පිදෙන අනතිමේදි
පූර්වාඩගමවූ, පෙරටුව යන්නාවූ
පූර්වදෙව, පළමුදෙවි; මව්පියන්ට නමකි
පූර්වභාගය, පෙර කොටස; පළමු කොටස
පූර්වජනමය, පෙරජාතිය
පෙතැලි රූ, රූකඩ
පෙරමග, ඉදිරියේ පාර
පෙරටුකොට, පළමුකොට
පෙරළුත්ත, යමක් කිරීමට නැවත නැවතත් ඉල්ලීම
පෙරදූකොට, පළමුකොට
පෙරසඣ්‍යායෙහි, ඊයේ සැන්දෑවේ
පෙරවරු, උදයවරුව
පේරුස්, මුදුවගීයක්
පේලාව, පෙට්ටිය

පොලුකෙරෙමි, පලුකරමි; කැබලිකරමි
පොළෝ අගල, වියලි අගල
පෝතක, පැටි, පැටව්
පෝරු, ලෑලි
පෝෂ්‍යය, ආහාර පානාදියෙන් සැතුසීම

---

## ඵ.

ඵලඵලලව, ගෙඩි හා කොල්
ඵලසමපනතා, ගෙඩිවලින් යුක්තවූ
ඵලකය, ලෑල්ල

---

## බ.

බ්‍යාමප්‍රභා, සර්වඥ ශරීරයෙන් බඹයක් පමණ දුර විහිදෙන රැස්
බටහිර, බස්නාඉර (වලල්ල
බටුයේය, බැස්සේය
බටුබටුවන්, බැස්ස බැස්සවුන්
බඩබන්කඩ, බඩ එතූ රෙද්ද
බඩසාය, බඩගින්න
බණවා, කථාකොට; ආමන්ත්‍රණය
බඳනක්, භාජනයක් (කොට
බදුවදා, වදමල්
බඣනය, බැඳීම
බන්‍ධු, නෑයන්
බන්‍ධුත්‍වය, නෑකම
බමරයුගලය, මීමැස්සන් දෙන්නා
බලඇණි, යෝධවලල්ල
බසට කැප පිණිස, වචනය බොරු නොවෙන්ට
බහන, ලනුව
බහන්නක්හුමෙන්, වගුරුවන්නාක්හුමෙන්; පාත් කරන්නාක් (මෙන්
බහුල, බොහෝ
බාගියහ, භයපත්වූහ
බාහසුල්ලහ, භයවෙන සවභාවක් ඇත්තාහ
බාහාහ, භයවන්නාහුය
බාල්‍යයෙහි, බාලඅවස්ථාවෙහි; තරුණ වයසෙහි

බාලපරාය, බාලඅවස්ථාව
බාහුව, වැලමිටෙන් උඩ කොටස
බාහුදණ්ඩ, බන්දිවලලු; වැලමිටෙන් ඉහළ පළඳින වලලු
බැගෑවට, අසරණ බවට; කණස්සලු බවට
බැණනැගෙණ, කථාවට පටන්ග
බැඳහොවාලා, බැඳදමා (න්න
බෑදෑනිය, නෑනා
බැවහාර, ව්‍යවහාර
බැහැරය, පිටතය
බැහැරින්, පිටතින්
බැහැවුම්, පෙරලන්න; යාඥවශයෙන් කීම
බැහැවෙන, මැනදෙඩන; උඩගුවෙන
බෑණන්, අයියා; සොහොයුරා
බෑයා, අයියා
බිතක්කණ, බිත්තිකොණ
බිඹුවැල, කොවක්කාවැල
බිමහුනු, බිමවැටුණ
බිරින්ද, අඹුව
බුදු, සර්වඥ; බුදුන්
බුඩ විලාශය, බුදුවරයෙකුගේ ලීලාව
බුඩාංකුර, බෝධිසත්වයා; බුදුබව ලැබීමට නියමව තුමූකළ ඥනය ඇත්තා; බුදුබව ලැබීමට පෙරුම් පුරන්නා
බුඩිය, කලපනාව
බුහුටි, කීමෙහි බිණීමෙහි දක්ෂ
බුණනියෝ, අක්කා
බොටුව, බෙල්ල
බොල්, සනකම
බොල්ගොම; ඝනලෙසගාපු ගොම
බොල්වනැයි, ඝනයයි
බොලඳගුණය, මොලොක් ගුණය
බොහොඩා, කවුස්සා
බොහෝවාදහසක් මුලුල්ලේ, බෝවෂී දහසක් මුලුල්ලෙහි
බෝධිද්‍රැමය, බෝගස
බෝධිපාක්ෂික, සෝවාන්, සකෘදගාමි, අනාගාමි, අර්හත්යන සතර මාර්ගයට පක්ෂ ඇති; නිවන් පතා භාවනාකරන්නාගේ පක්ෂයට අයිති

## භ.

භක්ෂණයෙහි, කෑමෙහි
භගිනී, සහෝදරි
භතෘස්වාමි, දිවිරකුමට වැටුප් දිමෙන් ආරක්ෂාකරණ ස්වාමියා
භවය, සංසාරය; ජාතියක් පාසා ඉපදීම
භවාග්‍රය, අකනිටා බඹලොව
භාගී වන්නේයයි, කොටස් කාරයෙක් වන්නේයයි
භාග්‍ය, වාසනා; පින්
භාණ්ඩ, බඩු
භාණ්ඩාගාරය, බඩු හෝ මුදල් ආදිය සුරැකිව තබන ගේ
භාස්වර, බබලන
භින්නාව, බිඳී
භුවනත්‍රය, තුන්ලෝකය
භූරි, බොහෝ
භෙණ්ඩිවාලු, ආයුධවර්ගයක්
භෝදකාරින්ගේ, දූෂා කේලාම් කියා බිඳුවන්නන්ගේ

## ම.

මකර, මෝරු
මකුලෙන්, මකුළු මැටිවලින්
මගුල්, මංගල්‍යය; යහපත් කාරණය
මගුල්සල්වට, මංගල සිලාපට්ටය; රාජඋයන්හි රජුන් හිඳීමට තිබෙන ගල්තලාව

මඟුලසු, උතුම් අශ්වයා; රාජකීය අශ්වයා
මංගලසීනය, ශුභසීනය; යහපත් සීනය
මංගල්‍යසම්මත, යහපත්‍ය කියා සම්මතකරණලද
මංගල්‍යසන්නිශ්‍රිත, යහපත සම්බන්ධවූ
මච්ඡමාංස, දියමස්; ගොඩමස්
මඤ්ජරි, පොකුර
මටකම්, ඔපදැමීම
මටසිලිටු, පිරිමැදීමෙන් සිනිඳුවූ නොහොත් ඔපඇති
මඩනා, මිරිකන්නාවූ
මඩවැකුණු, මඩතැවරුණු
මණ්ඩය, භාජනය; තැටිය
මණිකයිවඩම්, අත බඳින මාණික්‍යාභරණයක්
මණිතාරකයෙන්, මැණික්වලින් කළ තාරකාවලින්
මතුමාල, උඩුමහල්තලය
මද්දල, බෙර වර්ගයක්
මධ්‍යසථව, මැදහත්ව; පොදුවේ; පක්ෂයකට නොවී
මධ්‍යාහ්නයෙහි, ඉරමුදුන් වේලාවේ; දවස මැද
මඳර, සාගරය කැලඹීමේදී දෙවියන් සහ රාක්ෂසයන් විසින් පොල්ලක්මෙන් භාවිතාකළ පර්වතය
මධුරසවරයෙන්, මිහිරි හඬින්
මන්ත්‍රණය, කථාබස්කිරීම
මන්ත්‍රභේදක, රහස්එළිදරව්කරණ
මන්ත්‍රණයක්, රහසක්; රහස්කථාවක්
මන්ත්‍රීබැවින්, පණ්ඩිත බැවින්; උපායවත් බැවින්
මන්නැතිබව, මානයක් නැතිබව; උඩඟුකමක් නැතිබව
මනස, සිත
මනසින්, සිතින්
මනවඩනී, සිතේ ආලය වැඩිකරනී
මනදෙල, ප්‍රාණීනාව; කැමැත්ත
මනෝහරවිය, සිත්කළුවිය; සිත් ගන්නා සවභාවක් ඇතිවිය
මබස්පත ලැබෙයි, මා කිවා සිදුවෙයි
මරණෝපාය, මැරෙණ උපක්‍රමය
මරපලාපිහ, තලා පැන්නුහ
මරීචි, රශ්මිය
මරුත්තුනොකරම්, කඩනොකරම්
මර්දනය, මැඩපැවැත්වීම
මල්කලඹ, මල්මිටිය
මල්කැන්, මල්පොකුර
මල්තනතුර, භ්‍රාන්තඃසථානය; මලයා මෙන් සැලකීම
මල්දම, මාලාදාමය; මල්වැල
මල්පල්ලෙන්, මලින් හා දළුවලින්
මල්බෑ, බාල සහෝදරයා
මල, පුෂ්පය; මලපත; තොණ්ඩුව
මලුවේවයි, මලයා හෝ වේවායි
මලෙක, තොණ්ඩුවක
මස්සක්, ශත 32 ක් පමණ වටිනා රන් කාසියක්; මසුරම
මසවුළු, මස්වලින් සෑදූ නොයෙක් කෑමවර්ග
මසාරගල්ල, මැසිරිගල්
මයෙකු, මනුෂ්‍යයෙකු
මහාපසාරයෙන්, අධික සතුටින්; වැඩි විස්තරයෙන්
මහිමය, මහත්තත්වය
මහීකාන්තාව, මිහිකත; පොළෝ නමැති ස්ත්‍රිය
මහෝසය, මහවතුර
මහෞෂධය, ලොකු බෙහෙත; ආනුභාව ඇති බෙහෙත

මාඊරගෝත්‍රය, හොඳ ගිරාකුලය
මා කියනත්, මා කියද්දිත්
මාකෙළෙක් කෙළේය, මා විසින්
කළ යමක් කරණලද්දේය
මාන, ආකාරය; අන්දම; මාන්නය
මායම්, රැවටිලි; ප්‍රයෝග
මාර්ගසංවිධානය, ගමනට සුදුසේ
සැලැස්සීම
මාගෝ්පකරණ, ගමනට උවමනා
කරණ දේවල්
මාවුලා, මෙට්ට; ගුදිරිඝඝ
මාරුවෙහි, වෙනුවට; ගලවාගැනී
මෙහි
මැඩ පියන්නාසේ, පාගන්නාක්
මෙන්; පොඩිකරන්නාක්මෙන්
මැණික්මය, මැණික්වලින් සෑදූ;
මැණික් ඔබ්බා සෑදූ
මැදිබව, මධ්‍යස්ථභාවය
මැදිරිය, කුඩුව
මැසිවිලි, අවලාද; බොරු
මිණිරුවන, මාණික්‍යරත්නය
මිණිවලලු, මැණික් එබ්බූ වළලු
මිණිමෙවුල්දම්, මාණික්‍යමේඛලා
දමය; සත්‍රීන්ගේ උකුලේ පළඳි
න මැණික් එබ්බූ ආභරණයක්
මිත්‍රද්‍රෝහියා, මිත්‍රව සිටගණ විරු
ඩකම් කරන්නා
මිත්‍රසන්‍භවය, මිතුරුකම; යහළුකම
මිරිවැඩි, සෙරෙප්පු; වහන්
මිරිකාපියවයි, පොඩිකර දමවයි;
බිඳදමවයි; සුණුවිසුණුකරවයි
මිමුත්තා, පියාගේ හෝ සීයාගේ
හෝ සීයා
මුඛපද්මය, මුහුණ නැමති නෙළුම්
මල; කට නැමති නෙළුම්මල
මුඛදී, තුඩු දී; මූණ ඉදිරියට පා
මුඛවිකාර, කට ඇදකිරීමාදිමෙන්
කරණ සරදම්

මුගුරු, පොළු
මුඩුහිස්, බූගාපු හිස්
මුත්හරය, මුතුවැල
මුතුන් මිත්තන්, මුත්තලා; මිත්
තලා
මුදිතා, සැප ඇති අය කෙරෙහි ත
වත් සැපවත්වේවායි සතුටුවීම
මුළුතැන්ගෙය, ආහාර පිසනගෙය
මුළුකොට, රැස්කොට
මුවහං, මුවඅං.
මුවපොල්ලන්, මුවපැටියන්.
මුවරු, මෝරු
මුවමාල්ලෙකු, මහළු මුවෙක්
මුව නොහැහෙනසේ, කටින් කි
ය නොහැකි තරම්
මුවෙන්, කටින්
මුසාවාදය, බොරුව
මුහුකරවීම, පැසීම, මේරවීම
මූලාබව, මුළු භාවය, චංචලගතිය
මූර්ඡා කරවා, සිහිනැතිකරවා
මූදුපරගානාසේ, සමුද්‍ර ඝෝෂාව
පරිද්දෙන්
මෘගාංගනාව, මුවදෙන
මෘදංග, මිහිඟු බෙර
මෙයින්, මේකන්
මෙහෙනිමවා, ආහාරඅනුභව
කොට
මෙහෙයූ, නියම ලැබූ, අණලැබූ,
එව්වාවූ
මෙහෙවර, වැඩ පණිවිඩ
මෙහෙයන්නාහු, අණකරන්නාහු
පිටත් කරන්නාහු
මේඛලාදම, මෙවුල්දම්, සත්‍රීන්ගේ
උකුළේ පළඳින ආභරණයක්
මේනියා, මේ ආකාර
මේසා, මෙපමණ
මෛත්‍රී, සකල සත්‍වයන් කෙරෙහි
එකාකාරවූ මිතුරුකම

මෛත්‍රී නිවාසවූ, මෛත්‍රිය පැවැත් මට වාසභූමියක් වැනිවූ
මොබින්, මෙහෙන්
මොර කළිය, මෝරු කළිය
මොලකැටි, ඉතා මොලොක්
මෝක්‍ෂ, නිර්වාණය
මෝහාංධකාර, මෝඩකම නැමති අඳුර

---

## ය.

යක්‍ෂවිකාරය, යක්‍ෂාවේශයෙන් සැදෙන පිස්සුව

තාම්‍රාක්‍ෂඃප්‍රියතනුරක්තවක්‍ත්‍රධාරී
ගම්භීරොද්‍රුතගති රල්පවාක්ස
හිෂණුඃ
තෙජසව්වදතිවකිංදදම් කසෙම
යොයක්‍ෂග්‍රහ පරිපීඩිතොමනුෂ්‍යඃ

යකුලෙන්, කුළුගෙඩියෙන්
යටත්පිරිසෙයින්, අන්තිමවස
යථෝක්ත, යටකී පරිදි (යෙන්
යමුගුරු, යකඩ පොලු
යමුනෝදකය, යමුනා නම් ගඟේ
යලි, නැවත (ජලය
යවසාල්, යවහාල් (බාර්ලි)
යසස, කීර්තිය
යහුල, යවුල, යකඩ උල
යාන, යහන, ඇඳ
යුක්ති, යුතුකම්
යුගල, දෙක
යුඩප්‍රයෝගයක්, යුඩය පිණිස සැරසීමක්
යුහුව, ඉක්මන්ව
යෙහෙලිනිය, යහලු ස්ත්‍රී
යෝග්‍ය, සුදුසු
යෝධ මූල, හේවා සමූහය

---

## ර.

රක්‍ෂාස්ථාන, රැකීමට හෙතු තැන
රක්ත, රතු
රක්‍ෂිත, ආහාර පානාදිය දීමෙන් රක්‍ෂාකරණලද
රඟමඩල, සෙල්ලම්පල, නෘත්‍යශාලාව (
රජත, රිදී (ලාව
රතක්, රතුරෙද්දක්
රතනාලඞ්කාරයෙන්, මැණික් වලින් අලඞ්කාර කිරීමෙන්
රථ ඇණිය, රථ වලල්ල
රන්කෙණ්ඩිකාව, අතපැන් වත්කිරීමට ගන්න රන් කෙණ්ඩි ය රන කොතලේ
රන් සක්, රණින්කල හක්ගෙඩිය
රන්කොත් කැරලි, කැරැල්ල ආකාරයෙන් සෑදූ රන්කොත
රන්ඇගෑය, රනින්කල පහන්ගහ
රන් පොරෙදු, ඇතුන්ගේ ආභරණ වර්ගයක්
රන්සැත්, ඇතුන් පොරවනා රනින් වැඩකල ආභරණ
රත්මිරිවැඩි, රත්රනින්කලවහන්
රඹ, කෙහෙල්
රසමසවූලෙන්, රසවත් මාංස විකෘතිවලින්
රසන, මෙවුල්දම
රසාස්වාදයෙන්, රසවිඳීමෙන්
රසාංජන, රසඳුන
රහිතව, නැතිව
රහසිගතව, රහසේ ඉඳගණ
රළපතරඝේ, මහත්වූ රළඝේ
රාක්‍ෂසයා, රකුසා (සුත්
රාගනිශ්‍රිත, රාගසහිත, රාගයෙන්
රාජකෘත්‍යය, රාජකාර්‍ය්‍යය, රජ්ජුරුවන්ගේ වැඩ පණිවිඩ
රාජ ධානිය, අග නුවර
රාජපර්ෂත්, රජ පිරිස් (යුක්ත
රාජ පූජ්‍ය, රජුන්ගෙන් පුදලැබූ
රාජ මායම, රජුන්ගේ ප්‍රයෝග
රාජ මාතාවෝ, රජුගේ මව

රාජ්‍යය, රට
රාජ්‍යශ්‍රී, රාජ සම්පත්
රාජාඞ්ගනය, රජවාසල මිදුල
රාජර්ෂි වෘඩිය, රජුන්ගේ ඓශ්චර්‍ය්‍යය
රාජපරාධ, රාජ නීතියට විරුඞ ක්‍රියා
රාජාඥකරන්නාහ, දඬුවම්කරන් නාහ
රාත්‍රිස්ථාන, රෑනිවසනතැන
රාමණ්ඩලය, රා මැඩිල්ල
රාවිත්, රාබිමට ගන්න භාජන
රාසොඩහු, රායෙහි ලොල්වූවෝ බේබද්දෝ
රාහල, සුරාවිකුණන ස්ථානය
රැහැණිව, විරුඩව
රැණ, ලනුව
රැණමාල්ල, පරණ ලනුව
රිදීසක්, රිදියෙන්කළ හක්ගෙඩි
රිය සක, රථචක්‍රය
රුචි, කැමති
රුවන් වැල, රත්රන් ඇටවැල
රුවන් රුස, මැණික් රාශිය
රූපදර්ශනයෙන්, රූපය දැකීමෙන්
රූපවිලාසය, රූපයේ සැටිය
රූපෛශ්චර්‍ය්‍යය, රූපසම්පත්තිය
රූරාගෙණ, ලිස්සාගෙණ, සූරාගෙණ
රෙදිපෙරෙදි, අඳිනා පොරවනා වස්ත්‍ර
රොන්බොර, රොන් හා බොර
රෝපණය, සිටවීම
රෝමකූප, ලොම් සිදුර
රෝමකූප මාත්‍රයකුදු, ලොම් සිදුරක් පමණවත්
රෝමරාජිය, ලොම්වැල

## ල.

ලග්නට, ලැගීමට; විසීමට
ලගනන්ට, ලගින අයට; නවාතැන් ගන්නා අයට
ලගන්වා, සිතට වද්දවා
ලඝුකොට, සැහැල්ලුකොට
ලදමුවපොල්ලන්, තරුණමුව පැ
ලදපලලවය, ලාදලුව (ටියන්
ලදපස්මල්, විලඳ, සුන්සාල්, එළිඅබ, සමන්කැකුළු, ඒතණ යන පස්වගීය
ලදූරි, ලඳරු
ලබ්ධිඑකෙක, මතයගත් එකෙක
ලහෝපළුපත්, ලපටි අශෝක කොළ; අශෝක දළු
ලාක්ෂාරස, ලාකඩ වතුර
ලාභමාත්‍රසයෂී, ලාභයට මසුරුකම
ලාමක, ලපටි හෝ නින්දිත
ලාලු, දුම්මාවූ
ලියකිඳුරන්, කින්නරාඞ්ගනාවන්
ලුහුබැඳ, එලවාගොස් (ගේ
ලෙන්, ලයින්; හෘදයෙන්
ලෙහි, ලයෙහි; ලැපැත්තෙහි
ලෙහිදා, තුරුල්ලෙහි වැඩුණු
ලේකැන්, ලේකැටි
ලේමඩුලු, ලේ පැල්ලම්
ලේ සැලිම්, ලේ ගැලිම්
ලොටතන, එල්ලෙන තන
ලොල්වූ, ලෝභවූ
ලෝකචූඩාමණි, ලෝකයාගේ ඔටුනු මාණික්‍යය
ලෝකව්‍යවහාරයෙහි, මහ ජනයාගේ සම්මතයෙහි
ලෝකාන්තරික නරකය, සක්වළ ගල්තුනක් මැද පිහිටි නරකය

## ව.

වක්නොව, ඇදනොව වංගුනොව
වක, තිපිය; වෙනිද
වකුල, මුහුනමල්
වගුල, වැගුරුණාවූ
වඞකසිත, ඇදසිත; හොර සිත
වචනෞෂධය, වචන නැමති බෙ
වචසින්, වචනයෙන් (හෙත
වජ්‍ර දියමන්ති
වජ්‍රබුඩිවූ, සියුම් නුවණඇති
වජ්‍රපංජරය, දියමනති කූඩුව
වජ්‍රාංකුසය, දියමනති හෙණ්ඩුව
වල, වනාන්තරය
වලය, වලල්ල
වලපමින්, විලාප කියමින්
වල්ලභයෝ, අධිපතියෝ; නාය
කයෝ
වලප්නා, විලාප කියන්නාවූ
වලාපටලය, වලාකුල
වලාහක අශ්වයෝ, අහසින් ගමන්
කරණ අශ්වයෝ
වලූකොට, වලූගසා
වසඟවය, යටත්බව
වසඟකොට, යටත්කොට
වසුරු, වචිස්; බෙටි
වසුන්කොට, වසාදමා
වස්ත්‍රාභරණ, ඇඳුම්; පැලඳුම්
වහ වහා, ඉක්මණින්
වහනිස්කන්ධයෙන්, ගිනිකඳින්
ව්‍යවහාරය, භාෂිතාව; සිරිත
ව්‍යසනයක්, විපත්තියක්
ව්‍යාකරණය, විස්තරකිරීම
ව්‍යාජය, රැවටිල්ල; දඟය
ව්‍යාධිහු, ලෙඩ
ව්‍යර්ථ, නිෂ්ඵල
ව්‍යාපාරයෝ, කම්කරුවෝ; වැඩ
පණිවිඩකරන්නෝ
වාක්විෂයාතික්‍රාන්ත, වචනයෙහි
ශක්තිය ඉක්මවාගිය; වචන
යෙන් කියනොහැකි
වාග්භෙදය, වචනයාගේ බිඳීම
වාදමර්දනය, විරුඩ කියුම් බිඳහෙ
ලීම
වාරිමාර්ග, වතුර බැසයන මාර්ග
වාසල්කඩ, දොරටු සමීපය
වාසිබෙණෙමින්, මැත දෙඩමින්
වාහන, ඇත්, අස්, රථාදි යාන
වැකිපමණින්, ගැවුණ පමණින්
වැකුණු, ගැවුණු, තැවරුණු
වැගිර ගියතැන, ඉගිරී ගියතැන
වැටගින, තේරුම් ගියේය
වැටිකොට, වටකොට
වැටිගි, වැටී පෙරළී
වැඩ පසස්නා, වැඩ සිදුකරණ;
යහපතට හිතැති
වැතිර, හේත්තුවී
වැදහෝනට, වැදඉඳිනට
වැඳීම්මාන, වඳිනා අන්දම
වැලිදු, නැවතත්
වැලිරැණපොල්ල, වැලිකඹකැල්ල
වැලිපිරා, වැලි අවුස්සා
වැසිනගන්නා, වැහැගණ එන්නා
වැරෙණ, දිරන්නාවූ
වැහැර, කෘශ
වික්‍රම, අති සූරබව; පුළුවන්කම
විකලයෙන්, උමතුවෙන්
විගමනය, පහවීම
විචාලනියාව, ඇසූ ආකාරය
විචාරා, අසා
විචිත්‍ර, විසිතුරු
විචිත්‍රාභරණයෙන්, විසිතුරු ඇති
රිල්ලෙන්
විජ්ජුලතා, විදුලිය (දය
විජයොත්පාය, ශත්‍රුයාගේ ප්‍රාසා

විජයසක්, දිනුම හැඟවීමට පිඹිනා (සක්
විජයන, වැදීම
විජිතය, රට
විජෘම්භනය, වැජඹීම
විඩාව, වෙහෙසව
විත්, රාබොන භාජන
විතාන, වියන
විතානෝප ලක්‍ෂිත, වියනින් අ
ලංකාරවූ
විද්දත් නායකයෝ, ගායනාශාස්ත්‍ර
දත්තෝ
විද්ද යුතු, මහත්ට සුදුසුවූ
විධ්වංශනය, විනාශය
විදහා, දිගහැර, විසුරුවා
විද්‍යමාන, ඇතිවූ, තිබෙන්නවූ
විදුර, දියමන්තිය
විදුරු නුවණ, විනිවිද පෙණෙන
ඥානය
විදුරසුන්, වජ්‍රාසනය, දියමන්ති
ආසනය, සිදුහත්කුමරුන් බුදු
වෙන බෝමුලදී වැඩඋන් ආස
නය.
විදේහයෝ, වේදේහරට වැස්සෝ
විධාන, අණ
විධාන වැටෙන්නාවූ, අණ පවති
න්නාවූ
විනිවිද දක්නා, පලා පෙණෙන්
නාවූ; කෙළවර පෙණෙන
විනිශ්චය, විභාගය, පරීක්‍ෂාව
විපරීත, වෙනස්
විප්‍රකාරය, විකාරය, විහිලුස්වභාව
විප්‍රයෝග, වෙන්වීම
විභවානු රූපකොට, පොහොසත්
කමට අනුව
විභූෂිත, අලඞ්කාරවූ, සැරසුවාවූ
විභ්‍රමණය, හැසිරීම
විමසුවහොත්, පරීක්‍ෂාකර බැලූ
වොත්
වියත්, ව්‍යක්ත; උගත්; පණ්ඩිත

වියරුහුනු, පිස්සුවැටුන
වියරුවෝ, විකාරකරන්නෝ; පිස්
සෝ
වියන්පෝරු, වියන්ලෑලි (සීලින්)
වියෝවිම, වෙන්වීම
වියෝගකොට පියයි, වෙන් කෙ
කෙළේයයි
වියෝගින්න, පුරුෂයාගෙන් වෙ
න්වීම නිසා අවගත්නා ශෝක
විරහිත, නැති, වෙන්වූ (ගින්න
විරාජමාන, බබලන.
විරූප, විකාර රූපයක් ඇති, අව
ලක්‍ෂණ
විලවුන්, සම මෘදුවීමටහා සුවඳගැ
හීමටත් ඇඟ උලන සඳුන් කෝ
කුම් ආදිය
විලිකුත්, ඉදුණු; පැසුණු
විලිවේදනා, විලිරුදාව
විලි පහරණෝ, විලි වේදනාවෙන්
පීඩා විඳින්නෝ
විවරව, සිදුරුව
විවරයෙන්, සිදුරෙන්
විශිෂ්ට, උතුම්
විශේෂයෙන්, වෙන්වසයෙන්
විෂයෙහි, ඉන්ද්‍රියයන්ට ගෝචරවන
ශබ්දාදියෙහි
විසර්ජනය, විසදීම
විසංඥකොට, මූර්ඡාකරවා
විහාරය, විහරණය; භික්‍ෂූන් වාස
යකරණ තැන
විළි, ලජ්ජාව
වීණාවාද්‍යය, වේණා ගායනාව
වීචියෙහි, මහපාරෙහි
වෘත්තිය, පැවැත්ම; පඩිය
වෘෂභයා, ගොනා
වෙට්ටම්, ලෑලි
වෙනෙහි, වනයෙහි
වෙල්හැල්, ඇල් වී වර්ගයක්
වෙළඹ, අශ්වදෙනුව

වෙසෙසින්ම, විශෙෂයෙන්ම; බොහෝකොටම
වේගයෙන්, කඩිනමින්; සැරෙන්
වේරඹවාතය, සිව්දිගින් හමන සුළඟ
වේරංජබ්‍රාහමණ, එනම් බමුණු
වේශ්‍යාදුව, වෙසඟන
වෛදූර්‍ය්‍ය, වයිරෝඩි
වෛරිවූ, සතුරුවූ
ශ්වෙත, සුදු

---

ශ.

ශක්‍රාගමනය, ශක්‍රයාගේ ඊම
ශක්ති, අඩයටි
ශක්තිසම්පන්න, වියඊඇති
ශකුන, පක්ෂි; කොස්වාලිහිණි නම් පක්ෂි
ශඞ්කාරහිතව, සැකනැතිව
ශඞ්ඛ, සක්
ශතපාක, සියක් වරක් පෙරූ
ශතසහශ්‍රය, සියදහස
ශත්‍රු, සතුරු
ශරදකාශය, ශරත් කාලයෙහි අහස; වක් ඉල් දෙමස සරත් කාලය
ශරවර්ෂාව, ඊතල් වැස්ස
ශරීරකෘත්‍යය, මලමූත්‍ර පහකිරීම
ශ්‍රවණසංසර්ගය, ඇසූ පමණකින් ඇලීම
ශාක්‍යසිංහවූ, ශාක්‍යවංශයට සිංහයෙක් බඳුවූ
ශාරිකා, සැළලිහිණි
ශාස්වත, රූපාදි කිසිවක් හෝ යම් කිසි ලෝකයක් සදාකාලිකයයි ගන්නා මතය
ශාන්තව, වෙහෙසව;
ශිරෝජාලා, ඉස්වැසුම්; (වේල්)
ශිල, ස්වභාව
ශීලස්කන්ධය, සිල්කඳ
ශ්‍රීපාද, සිරිපතුල්
ශ්‍රීබුඞිය, උතුම් නුවණ
ශ්‍රීමත්, ශෝභාමත්වූ
ශ්‍රියහන්ගර්භය, සයනයකරණ යහන තිබෙන කාමරය
ශ්‍රීවිභූතිය, උතුම් ඓශ්වර්‍ය්‍යය
ශ්‍රී විලාසය, ඓශ්වර්‍ය්‍ය ලීලාව
ශ්‍රීසම්පත්, ශෝභාසම්පත්
ශ්‍රීසෞභාග්‍යය, සිරියෙහි සුභග (බව
ශෘගාලයන්, සිවලුන්
ශෘඞ්ගිලා, සිංගිපොවා; විසදමා
ශ්‍රෙෂ්ඨතරයා අති උත්තමයා
ශෝඩශ, දහසය
ශෝභාමත්ව, ප්‍රභාසහිතව
ශ්‍රෝණිය, උකුල

---

ස.

සප්තරතන, සත්‍රුැමති මැණික
සථාගාරාදි, තනතුරුආදි
සථිරකොට, දැඩිකොට; තදකොට
සමෘතිශක්තිය, දුත් දෙය සිහිකර ගැනීමෙහි ඥනය
ස්වර්ග, දෙව්ලොව
ස්වර්ගස්ථවූ, දෙව්ලොව සිටින්නාවූ; පරලොව ගිය
ස්වර්ණජාලා, රන්දැල්
ස්වර්ණඵලකය, රන්පෝරුව; රන්ලෑල්ල
ස්වර්ණප්‍රතිබිම්බය, රන්පිළිමය
ස්වර්ණාලඞ්කාරයෙන්, රත්රනින් සැරහීමෙන්
ස්වදේශය, තමාගේ රට
ස්වපනය, සීනය
ස්වයම්භූ ඥනය, අනිකෙකුගේ උපදේශ නැතිව; තමාම පහළවූ (නුවණ
ස්වර, ශබ්දය; හඬ
ස්වරූපය, ප්‍රවෘත්තිය; තොරතුරු
සක්විති, චක්‍රවර්ති
සකස්කොට, යහපත්කොට

සකවටා, සකුපෝරුව කරකවා
සකලාගාවා, හක්ගෙඩියෙන් මැද
සකලාඣි, සියලු වැඩ
සකලාඣිජිත, සියලු වැඩවීම
සකණ, කන් සය
සඟල, දෙක
සංගාලියම්, දම්වැල්
සංසග්ගියෙන්, එක්වීමෙන්
ශඞකර, අවුල
සංක්‍ෂෙපයෙන්, සැකෙවින්; කො
සඞ්ඛනාද, සක් පිඹිනා හඬ (වින්
සංඛ්‍යාත, කියනලද
සජීවයක්මුත්, පණඇත්තෙක්යයි
සංග්‍රාමයෙහි, යුඩයෙහි (මිසක්
සංජනන, වැසුන
සඤ්චාරය, හැසිරීම
සඤ්ජාත, උපන්; හටගත්
සණ්ඩාපතය, තැබීම
සතකාර, සංග්‍රහකිරීම
සත්තිස්, තිස් හතක්
සත්බුමු, මාලහතක් ඇති; තට්ටු හතක් ඇති
සත්රුවන්, සත්වගියේ මැණික්; රත්, රිදී, මුතු, මැණික්, වෛදූ ය්‍යී, දියමනති, පබලු, යන සත
සතරඵලය, සෝවාන්, ශකෘදගාමි අනාගාමි අහීත් යන පල සතර
සතරමග, එමපල සතරේ මාගී ස
සතළොස, දහහතර (තර
සතර සඞ්ග්‍රහ වස්තුව, දන, ප්‍රියව චන, සමානාත්මතා, අවිවයහී යන සතර
සතරපසය, චිවර, පිණ්ඩපාත, ගි ලන්පස, සෙනසුන්, යන සතර
සතප්පා, සන්තර්පණය කරවා; නිදි ගන්නවා; සනසවා
සතරවාසල, දෙරටු සතර
සතු, අයිති
සඳවලා, සැන්දෑ වලාකුල්
සදූල්ල, උඩුමහල්තලය
සදෘශ, සමාන
සදුන්සණ, සඳුන් අඹරණගල
සන්නාහ, යුඩාභරණ
සන්නාඩව, යුඩයට සැරසී
සන්හුන්, සන්සිඳුණු
සන්නාලියා, මහන්නා; ගෙත්තම් කාරයා
සන්කම්, සංඥකිරීම; ඇඟවීම
සන්තුෂ්ට, සතුටු
සන්තානයෙහි, සිත ඇතුළෙහි
සන්තක, අයිති
සන්දේශ, ලියුම්
සන්නිශ්‍රිත, ඇසුරුකළ; යෝග්‍යවූ
සන්ධ්‍යා, සැන්දෑව
සනරාමර, දෙවිමිනිසුන් සහිත
සනාවක්, සෙන්හයක්
සනාසුහත්, සෙන්හ පිකත්
සනිටුහන්, සැලකිම
සපනසථානය, සථානහත
සපථ, දිවිරීම
සබඳ, මිත්‍ර
සබවස, සත්‍යවචනය
සභියපරිබ්‍රාජක, එනම් තාපසයා
සම්මාසම්බුදු, චතුරාර්‍යා සත්‍යය ම නාකොට දනගත් උතුමා
සම්මාන, ගරුනම්බු
සමමතවෙත්වයි, යටත්වෙත්වයි; අවනතවෙත්වයි
සමමතකලහ, බොහෝ දෙනාගේ මතයෙන් නිශ්චයකරගත්තෝ
සම්මුඛයේ, ඉදිරියේ (ශ
සමප්‍රාපත, පැමිණි
සමපාදනය, සිඩකිරීම
සම්මතවූ, නියමිතවූ; ඒත්තුගත්
සමය, කාලය
සමන්තභද්‍රවූ, සියළු ආකාරයෙන් යෙන් යහපත්වූ
සමන්විත, යුක්ත

සමස්ත, සියලු
සමතිස්පෙරුම්, පාරමිතා ධර්මයිහ දාන, සීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්‍ය්‍ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන මෛත්‍රී, උපේක්ෂා, යන දශ පාරමිතාව; දාන පාරමිතාව, දාන උප පාරමිතාවය, දාන පරමාර්ථ පාරමිතාවය යන ක්‍රමයෙන් තුන තුන ගත්කල තිසක්වේ
සමගිවගතහෙමෝනම්, මිත්‍රව වාසයකළ හැකිවෙමුනම්; එකගව ඉන්ට හැකිවෙමුනම්
සමණන්ට, ස්වාමි පුරුෂයන්ට
සම්‍යක්ප්‍රතිපත්තීන්, යහපත් පිළිපැදීමෙන්
සමාධිය, සිත එකඟකම
සමානාත්මතා, අන්‍යයන් තමන් සමකොට සැලකීම
සමාචාර, යහපත් හැසිරීම්
සමාපත්තීන්, ධ්‍යානයෙන්
සමීපය, ළඟ
සමුදය, සමූහය
සමුජ්වලිත, බබලන
සමුදුන්හ, අවසර දුන්නුය
සමුණන්දෑ, ස්වාමිපුරුෂයා
සමෘද්ධවූ, සම්පූර්ණවූ
සයන, ආසනය
සයින්, බඩගින්නෙන්
සයුරෙක, සාගරයක
සරණව, ආධාරව; පිහිටව
සරණාගත, පිහිටසොයා ආවාවූ
සරූප, ස්වරූප; ඇතිසැටි
සර්ව, සියලු (ණ
සර්වඥතාඥානය, සියල්ල දත් නුවණ
සර්වාංගය, සියලු ඇඟ; ඇඟ හැම තැනම
සර්වඥප්‍රවාරණය, බුදු කෙනෙකුන්ට පැවරීම

සර්ෂපමාත්‍රයකුදු, අබඇටයක් පමණවත්
සල්පිල, වෙළඳශාලාව
සලම්න්, සොලවමින්
සලෙයිකඩ, පරණ රෙද්ද
සව, සියලු
සවනේ, දතයුතු සියල්ල
සවණ, බුදුරජානන්වහන්සේ
සහජාත, සමග උපන්
සහශ්‍රපාක, දහස්වරක් පෙරූ
සාහසිකව, පරීක්ෂා නොකොට; කලබලව
සාගරය, මුහුද
සාදරය, අතිශය දයාව
සාදුකින්, බඩගින්නෙන්
සාධකවූ, සිද්ධකරන්නාවූ
සාධුගුණය, යහපත් ගුණය
සාපිපාසා, බඩගිනි හා දිය බීමට කැමැත්ත
සාර, සරු
සාරිගෙවල්; මුරගෙවල්
සාල්ලෙක, තට්ටුවක; තටුවක
සැඩිගම, සැඩොල්ගම
සැණකෙළි, අවුරුදු සෙල්ලම්
සැත්, ශස්ත්‍රය; පිහියා ආදි ආයුධ
සැතපෙනදෑ, නිදාගැනීමට උවමනාදේ පැදුරු කොට්ට යනාදිය
සැදුම්ලද, අලඞ්කාරවූ; සරසනලද
සැදැහැති ශ්‍රද්ධාවන්ත
සැපයුණු, සිදුඋනු
සැමියා, ස්වාමියා
සැලවල්, බදුන්; භාජන
සැවය, හැව
සැහෙන්නාහ, උදහස් වන්නාහ; කෝපවන්නාහ
සිඟිත්තකුත්, ඉතාම ටිකකුත්
සිටිපල, සිටියතෙන
සිටිපියෙන්, සිටි අඩියෙන්
සිත්තරුන්, සිතියම් කරන්නන්

සිත්තම්, චිත්‍රකර්මාන්ත; සිතියම්
සිත්කළු, සිත්ප්‍රියකරණ
සිත්නම්, නළා; හොරණෑ
සිපගෙණ, ඉඹලා
සියරැළි, සියයක් රැළි ඇති
සිරිසරින්සාරවූ ඓශ්වර්යයෙන්
සියොතුන්, පක්ෂීන් (සාරවූ
සිරිකත්, කණේ ඉහළ කොටසේ
පළඳින ආභරණයක්
සිරිමත්ද, ඓශ්වර්යය අඩුවූ
සිරියෙල් අතල, සාදිලිංගම්තලාව
සිරිහිගියයි, හිරිවැටුනේයයි
සිව්මැදුරුකවුළුව, ජනේලය
සිව්රඟ, සතර ආකාර
සිවමැලි, මොලොක්
සිවසැට, සැටසතර
සිව්පස, සතරපසය
සිවල්මුළු, හිවල් රංචුව
සිසතින්, හිස්අතින්
සිසාරා, කරකවා; පැතිරී
සිසිර, සීතල
සීනවේවයි, සිහින්කම වේවයි
සීමාපවුර, නගරයෙහි ඉම කෙළ
වරවූ ප්‍රාකාරය
සුගක්, ටිකක්
සුගත, සුන්දර ගති ඇති හෙයින්
බුදුන්ට සුගතනම්ද වේ
සුගතිය, දෙව්ලොව ආදි සැපඇති
තැනකට පැමිණීම
සුචරිත, යහපත් පැවතුම්
සුණුමැටිකවා, සුණුමැටි ඔබා
සුදම්දෙව්සබා, ශක්‍රයාගේ දිව්‍යස
භාව
සුධර්මා, ශක්‍රයාගේ දිව්‍යසභාව
සුධාධවල, හුණුවලින් සුදුකළ
සුන්වත්අය, බද්දේ ආදායම
සුන්බුන්, කැඩිබිඳී ගිය
සුන්සාලින්, හුණුසාලින්
සුන්තෙන්, කුඩුවලින්
සුනුහිඳයි, සිනාසුනිදයි
සුපපතිඨිත, මනාකොට පිහිටි

සුපක්ව, මනාකොට පැසුණ
සුපුෂ්පිත, මනාව පිපුනාවූ
සුපර්ණ, ගුරුළු
සුප්‍රතිෂ්ඨිත, මනාකොට පිහිටි
සුභාෂිතය, යහපත් වචනය
සුරක්ත, අතිශයින් රතු
සුරක්ෂිතකොට, ප්‍රවේසම් සහිතව
සුවඳකවම්, සුවඳ ගල්වම්
සුවපෝතකයා, ගිරාපැටියා
සුවිනීත, හොඳට හික්මුණු
සුවිනිශ්චිත, යහපත්ව විනිශ්චය
කරගත්
සුශික්ෂිත, මනාසේ හික්මුණු
සුසිරය, නළාව
සුහුරුබඩුනුවෝ, නැන්දගේ බඩ
උපන්නා; මස්සිනා
සුංසුමාර, කිඹුල්ලු
සූක්ෂමවූ, සියුම්වූ
සූකර, ඌරූ
සූර්යග්‍රහණය, ඉර මුවාවීම; ඉර
රාහු ඇල්ලීම
සූර්යබිම්බය, ඉරමඩල
සූරවීර, දැඩි බල
සූසැට, හැටහතර
සෞදාමිනීලුව, මිදුල; රජමිදුල
සෙන්නාහුද, සිනාසෙන්නාහුද
සෙනෙදසය, කරුණාව දයා සිත
සෙනෙවිරත් සේනාපති
සෙස්සෝන්, ඉතිරි අයත්
සෙස්ස, ඉතිරිය
සෙසු, අවශේෂ; ඉතිරි
සේවාව, අවනතව
සෛන්ධවකුලය, දිවීමට දක්ෂඋතුම්
අශ්වකුලය
සොඳුර, සුන්දරිය; යහපත් ස්ත්‍රිය
සොම්නස, සතුට
සොම්මර, සම් වැඩකරන්නෝ
සොළස, දහසය
සෝන, සොහොන; මිනිපිට්ටනිය
සෝලුලීය, සැරයටිය

සෞභාග්‍යය, පින්වත්බව; සුභග බව

සංයමයක්, සංසිඳීමක්; හික්මීමක්

සංවිධානකොට, යහපත්ලෙස; නියමකොට

සංසන්දනය, එකටෙක ගැලපීම

සංසර්ගය, එක්වීම

---

### හ.

හදවත, හෘදයවස්තුව

හදුලි, ඉගණගත්තාවූ

හත්කඩ, ඇඳිවස්ත්‍රය

හත්දුරුවා, ස්වාමිදරුවා

හත්පලින්, ඇඳපු පැළඳපු

හඹුඹරුව, දියඹරුව

හමුවේ, ඉදිරියේ

හයාලූයේද, ඇද්දේද

හර, මුඛනාහරය

හරණාහ, අත් අරින්නාහ

හරණයකෙරෙයි, අත්අරියි; නැති කෙරෙයි

හරඇති, අරප්පු ඇත්තාවූ

හළුවාද, අත්ඇරියාද ?

හස්තමුද්‍රාව, අතින් සලකුණු කිරීමෙන් අදහස් ඇඟවීමට උගන්වන ශාස්ත්‍රය

හස්තවිකාර, අතින් කරණ විහිළු

හස්තප්‍රාප්ත, අතටපත්; අල්ලාගත්

හස්ත්‍යශ්වාදි, ඇත් අස් ආදි

හස්තිකාන්ත, ඇතුන්ට අනිනා උල්වගීයක්

හස්සුණු, පැනියෙන් තැවරූ බැදපු ධාන්‍ය කුඩු

හස්ලොම, අශ්වරෝම

හස්ස, අස්ස

හසු, අශ්වයා

හ්‍රස්ව, කොට

හාත්පස, වටේ

හානියක්, අඩුකමක්

හැලලීගිය, කැලඹීගිය

හැලි, සුදු

හැවිරිදි, ඇවුරුදු

හැවිලිඅවන්නී, අඬනා කියන්නී; සෝකකරන්නී

හිණඉතිනම්, ඉතිමග වැටුනිනම්

හිණිඉස, ඉණිමගේ මුදුන

හිතකාමී, යහපතට කැමතිවූ

හිතයන්, හිතඇත්තන්; ලැදිකම ඇත්තන්

හිදෙළුව, පල්ලැක්කිය

හියවුරු, ඊකොපුව

හිපියා, වැටී

හිමුණ, ඊයේ මුණත

හුදක්, තනිකර

හුනු, වැටුණාවූ

හුයින්, නූල්වලින්

හුළු, බත් ඇට

හූයෙහි, නූල්ලනුවෙහි

හූවට, නූල්වැටිය; නූල් රෝදය

හෙද, වහාම

හේමන්තකාලය, පිනීවැටෙන කාලය; උඳුවප්, දුරුතු දෙමස

හෙළඟිතෙල්, එළඟිතෙල්

හේෂාරවය, අශ්වයාගේ නාදය

හෙළාදක්කේයයි, සුළුකොට සිතුවේයයි; පහත්කොට සිතුවේයයි

හෙළිය, දැමිය

හොත්තාවූ වැටුණාවූ

හොබනේය, ඔබින්නේය

හොබනා අවයව, ඔබින්නාවූ අංගප්‍රත්‍යංග

හොවාගෙණ, සතප්පාගෙණ; හේත්තුකරගෙණ

හෝනට නිදගැනීමට

හෝපලු, අශෝකගස්

නිමි.

---

ROBERT BATUVANTUDAVE, "LANKABHINAWA VISSRUTA PRESS," COLOMBO, CEYLON.

# ශුද්ධි පත්‍රය.

| පිට | පේළි | අශුද්ධ | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 29 | නුවන a | නුවණ |
| 3 | 2 | වීවරය | චීවරය |
| ,, | 20 | මුහුන a | මුහුණ |
| 4 | 15 | රාජ්ජය a | රාජ්‍යය |
| ,, | 23 | ගිනිපුපුරක් | ගිනි පුපුරක් |
| 5 | 38 | ඖධය | ඖෂධය |
| 6 | 7 | පිණැත්තවු විසින් දුත් | පිණැත්තවු දුත් විසින් |
| ,, | 21 | වණණනා | වණ්ණනා |
| ,, | 40 | භිජ්ජංති | භිජ්ජති |
| 7 | 5 | දන | දණ |
| 8 | 8 | කරවූසේක | උයනකරවූසේක |
| 9 | 38 | අනෙම් | ආනෙම් |
| 11 | 9 | බලව පෑ | බලවයි පෑ |
| 14 | 5 | † පණ්ඩිතයන්වහන්ස | පණ්ඩිතයන්වහන්ස |
| 14 | 6 | මේ දරුසෙර | † මේ දරුසෙර |
| 17 | 29 | විචාලභ | වීවාලභ |
| 17 | 31 | පරීක්ෂතොකොට | පරීක්ෂාකොට |
| 24 | 37 | පියාතන් | පියානෝ |
| 26 | 28 | සිටතන් | සිටාතන් |
| 28 | 36 | රජ්ජුවන් | රජ්ජුරුවන් |
| 31 | 30 | ගැඹුරුවක් | ගැඹුරුවතක් |
| 36 | 21 | භාග්‍යවන්තේයයි | භාගිවන්තේයයි |
| 46 | 2 | සත්‍ර | සත්‍රි |
| ,, | 14 | තොපි | තෙපි |
| 48 | 3 | ගෙණගෙණ | ගෙණාගෙණ |
| 49 | 16 | වදල | වදළ |
| 50 | 11 | කැළිබවන් යන තැනට | එළලිබවන් යනු අඩුයි |
| 51 | 26 | සේනකචාරිහු | සේනකාචාරිහු |
| 53 | 18 | ඉසිපයි | ඉස්පයි |
| 54 | 5 | දෙදන | දෙදණ |
| 55 | 24 | එක්කෙණෙකුත් | එක්කෙනෙකුත් |
| 59 | 21 | සනාපියා | සනහාපියා |
| 60 | 5 | අනතාංච | අනතාංච |
| 64 | 4 | තුන්දෙනා | තුන්දෙනා |
| ,, | ,, | තොපි | තෙපි |
| ,, | 5 | තොපි | තොප |
| 76 | 12 | කියන්නා | කියන්නාහ |
| 78 | 23 | අක්ෂොභිණිය a | අක්ෂෞභිණිය |

a තවත් කීප තැනක.

| පිට | පෙළ | අශුඩ. | ශුඩ. |
|---|---|---|---|
| 80 | 5 | සඵනයෙහි | සඵානයෙහි |
| ,, | 30 | සිහයෙකු | සිංහයෙකු |
| 85 | 19 | සහාසිකව | සාහසිකව |
| 87 | 22 | ඇස්වූ වියෙන් වි පිකක් | † අසනිබූ වියෙන් වී මිටක් |
| 87 | 32 | ඇරගනුම්හ | නුවර ඇරගනුම්හ |
| 88 | 38 | සමවූ ධර්‍මයෙන් | දැහැමින් සෙමින් |
| 90 | 9 | කිලිපෙත්නාවූ | කිලිපොළන්නාවූ |
| 92 | 28 | උකල්ව | උකටලිව |
| 97 | 36 | පිපක්‍ෂිතුං | පිඬිංපක්‍ෂිතුං |
| ,, | ,, | භවිස්සාමිමිති | භවිස්සාමිති |
| 100 | 34 | සිතත | සිතත් |
| ,, | 39 | පණ්ඩියන් | පණ්ඩිතයන් |
| 111 | 14 | තාපය | තාපසයා |
| ,, | 18 | දරුවන් | දූදරුවන් |
| 121 | 11 | සැටදගසක් | සදගසක් |
| ,, | 34 | තුබනාකං | තුමහාකං |
| 127 | 18 | තිතම් | සිතම් |
| 136 | 18 | අගිගුණ්ඨිකයා | අගිගුණ්ඨිකයා |
| ,, | 24 | පාදුති | පදුති |
| 146 | ,, | අභිමානාපිය | අභිමතානීය |
| 149 | 31 | කණිණ | කණ්ණ |
| 151 | 34 | සඵානායෙහි | සඵානයෙහි |
| 156 | 12 | පැලවයි | පැලවයි |
| 158 | 38 | මලහයි | මලම්හයි |
| 160 | 36 | වජෙන | වජෙත |
| 161 | 31 | පම්පන්නාවූ | සම්පන්නාවූ |
| 170 | 31 | ධර්‍මිෂඨවූ | ධර්‍මිෂ්ටවූ |
| 171 | 38 | නසක්කා | නසක්කා |
| 175 | 18 | පිරිමස | පිරිමසා |
| 176 | 37 | සිතාසිතා | සිතා |
| 178 | 10 | අපිළන්ධිය | අපිළන්ධියං |

**ගැටපදයෙහි**


| | |
|---|---|
| විස්සේ අඩිය | බිස්සේ අඩිය |
| ගවරපිර | ගවරපිරි |
| ජනහිතරහිතවූ | ජනහිතනිරතවූ |
| භාජනයක් | භාජනයක් කමණ්ඩලුව |
| ඝහදියකමණ්ඩලුව | ඝහදිය |

---

අකුරු අඩුවැඩිවීමෙන් හෝ ඉස්පිලි ඇලපිලි අඩුවැඩිවීමෙන් සුළු වරද මෙහි තිබුනත් ඒ ශුඩකර ගන්නාමෙන් ඉල්ලමු.

† පාකාරපසෙසවිහිරාසිතොවිහිං භගෙවනගහෙනවා.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු